පටුන

මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ
භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා
http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# මජ්ඣිම නිකාය

# 4

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය්‍ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

# අනුශාසක මණ්ඩලය

පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පෙ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

පින්වත්තේ සද්ධර්මාකර පරිවෙණාධිපති ශ්‍රී විසුද්ධාචාර්ය ධර්මකීර්ති ශ්‍රී පෝහද්දරමුල්ලේ ඤාණානන්දාභිධාන අමරපුර සිරි සද්ධම්මවංස නිකායේ මහා නායක ස්ථවිරයන්වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ සංඝරාජ විහාරස්ථ ශික්ෂාලංකාර පරිවෙණාධිපති බලපිටියේ පණ්ඩිත විසුධාලොක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්‍ය්‍ය ආයර්‍ය්‍යරත්න රේරුකාන මහතා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පටුන



# මජ්ඣිම නිකාය

# 4

ධර්මවිනය උගත් පණ්ඩිත

**මහාස්ථවිරයන් වහන්සේලාගේ**

ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**

## ඒ. පී. ද සොයිසා මහතා

**විසින්**

**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**

**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.

http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1954
දෙවැනි මුද්‍රණය - 2012

**ත්‍රිපිටකය**
**මජ්ඣිම නිකාය 4**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත්

යොමු කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඥාණවිමල මහානායක ස්ථවිර**

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මග පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඤාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මඟ පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2012 සැප්තැම්බර්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.　http://pitaka.lk

# සංඥාපනය

සිංහල ත්‍රිපිටක ධර්ම පොත් පෙළේ හත්වෙනිවූ මේ පොතට මජ්ඣිම නිකායෙන් සූත්‍ර විසි අටක් පිළිවෙළට අන්තර්ගත කළෙමි. මහ සඟි පහ අතුරෙන් මෙම නිකාය එක සඟියකි. සඟියේ සූත්‍ර මධ්‍යම ප්‍රමාණවූ බැවින් ඊට මජ්ඣිම නිකාය යන නාමය යෙදේ. එහි ඇති සූත්‍ර එකසිය පනස් දෙක මූල පණ්ණාසකය, මජ්ඣිම පණ්ණාසකය, උපරි පණ්ණාසකයයි පණ්ණාසක තුනකට බෙදා තිබේ.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම් වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, තමන්ට වැඩි සනීපයක්ද නැතුව සිටින නමුත් ඒ හිරිහැර ගැන කිසිසේත් නොසලකා ශාසන ආලයෙන් ආචාර්ය ආයසීරත්න රේරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයසීරත්න රේරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, අහුන්ගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේද, බලපිටියේ පණ්ඩිත විසුද්ධාලොක ස්ථවිරයන් වහන්සේද, පින්කන්දේ පණ්ඩිත පඤ්ඤාවාස ස්ථවිරයන් වහන්සේද තල්පාවිල රත්නසිරි ස්ථවිරයන් වහන්සේද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

7 - 5 - 54

# සූත්‍ර ගැන දැනගත යුතු කරුණු ස්වල්පයක්

**බණවර** - 'අකුරු' අටක් එක පදයක් වේ. පද සතරක් ග්‍රන්ථයක් වේ. එනම් අකුරු තිස්දෙකක් ග්‍රන්ථයක් වේ. අකුරු 32 කින් යුත් ග්‍රන්ථ දෙසිය පණහක් බණ වරෙක් වේ. එබැවින් බණ වරක අකුරු අටදහසක් ඇත්තේය.

**නිදානය** - ඒ ඒ සූත්‍රවල උත්පත්ති ස්ථානයයි - සැවැත් නුවර, රජගහ නුවර ආදි ස්ථානයි.

**පුද්ගල තෙම** - ඒ ඒ සූත්‍ර ධර්මයන් දේශනා කිරීමට කාරණ වූ පුද්ගලයායි.

**උද්දේශය** - තේරුම්කර සිහිකරවන කරුණ - හෝ සූත්‍රයේ මාතෘකාව.

**නිර්දේශය** - විස්තර සහිත තේරුම් කිරීම.

**සූත්‍රනාමය** - සූත්‍රනාම නොයෙක් ආකාරයෙන් යෙදී තිබෙන බව පෙනේ - (1) මාතෘකාව අනුව යෙදෙන නාම - මහාසතිපට්ඨාන සූත්‍රය,

(2) දෙශනා කරනු ලැබූ පුද්ගලයා අනුව දෙන නාම - සිගාලෝවාද සූත්‍රය.

(3) සිදුවූ කරුණක් අනුව දෙන නාමය - මහාපරිනිබ්බාණ සූත්‍රය.

(4) බුදුරජාණන් වහන්සේ විසින් අනුමත කරන නාමය අනුව ලැබෙන නාමය - සීහනාද සූත්‍රය

(5) බුදුරජාණන් වහන්සේගෙන් අසන ලද ප්‍රශ්නවලට උත්තර වශයෙන් දෙශනා කරන ලද සූත්‍ර - සක්කපඤ්හ සූත්‍රය.

(6) ඒ ඒ කරුණු මාතෘකා කරගෙන විස්තර කර දීමට දෙශනා කරනලද සූත්‍රවලට දී තිබෙන නාම - සාමඤ්ඤඵල සූත්‍රය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන


| නො. | නම | පිටුව |
|---|---|---|
| 49 | සුභ සූත්‍රය | 1413 |
| 50 | සඞ්ගාරව සූත්‍රය | 1430 |
| 1 | දේවදහ සූත්‍රය | 1451 |
| 2 | පඤ්චත්තය සූත්‍රය | 1475 |
| 3 | කින්ති සූත්‍රය | 1493 |
| 4 | සාමගාම සූත්‍රය | 1501 |
| 5 | සුනක්ඛත්ත සූත්‍රය | 1516 |
| 6 | ආනෙඤ්ජසප්පාය සූත්‍රය | 1529 |
| 7 | ගණක මොග්ගල්ලාන සූත්‍රය | 1536 |
| 8 | ගොපක මොග්ගල්ලාන සූත්‍රය | 1545 |
| 9 | මහා පුණ්ණමා සූත්‍රය | 1557 |
| 10 | චූල පුණ්ණමා සූත්‍රය | 1568 |
| 11 | අනුපද සූත්‍රය | 1574 |
| 12 | ඡබ්බිසොධන සූත්‍රය | 1582 |
| 13 | සප්පුරිස සූත්‍රය | 1597 |
| 14 | සෙවිතබ්බාසෙවිතබ්බ සූත්‍රය | 1612 |
| 15 | බහුධාතුක සූත්‍රය | 1646 |
| 16 | ඉසිගිලි සූත්‍රය | 1656 |
| 17 | මහා චත්තාරිසක සූත්‍රය | 1660 |
| 18 | ආනාපාන සති සූත්‍රය | 1672 |
| 19 | කායගතා සති සූත්‍රය | 1687 |
| 20 | සංඛාරුප්පත්ති සූත්‍රය | 1702 |
| 21 | චූල සුඤ්ඤත්ත සූත්‍රය | 1717 |

| | | |
|---|---|---|
| 22 | මහා සුඤ්ඤත්ත සූත්‍රය | 1724 |
| 23 | ආශ්චර්‍ය ධර්ම සූත්‍රය | 1737 |
| 24 | බක්කුල සූත්‍රය | 1748 |
| 25 | දන්තභූමි සූත්‍රය | 1757 |
| 26 | භූමිජ සූත්‍රය | 1774 |

# මජ්ඣිම නිකාය.
## (මජ්ඣිම පණ්ණාසකය)

### 49. සුභ සූත්‍රය.

1. **මා** විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේ පිඩු සිටුහු විසින් කරවූ දෙව්රම් වෙහෙර වැඩ වාසය කරණ සේක. එකල්හි වනාහි තොදෙය්‍ය පුත්‍රවූ සුභමානවකයා එක්තරා ගෘහපතියෙකුගේ ගෙදර කිසියම් කටයුත්තක් සඳහා සැවැත් නුවර වාසය කරයි. එකල්හි තොදෙය්‍ය පුත්‍රවූ සුභ තරුණයා යම් ගෘහපතියෙකුගේ ගෙදර වසයිද, ඒ ගෘහපතියාට මෙසේ කීය. "ගෘහපතිය, සැවැත් නුවර රහතුන්ගෙන් හිස් නුවූයේයයි මා විසින් අසනලදී. අද කිනම් ශ්‍රමණයෙකු හෝ බ්‍රාහමණයෙකු හෝ ඇසුරු කරන්නෙමුදැයි"ඇසීය.

2. "ස්වාමිනි, මේ භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඩු සිටුහු විසින් කරවූ දෙවුරම් වෙහෙර වාසය කරණ සේක. ස්වාමිනි, ඒ භාග්‍යවතුන් වහන්සේ ඇසුරුකරනු මැනව" ඉක්බිති තොදෙය්‍ය පුත්‍රවූ සුභ තරුණයා ඒ ගෘහපතියාට පිළිතුරුදී භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුට විය යුතුවූ සිහි කටයුතුවු කථාව කොට නිමවා එක් පැත්තක උන්නේය. එක් පැත්තක හුන් තොදෙය්‍ය පුත්‍රවූ සුභ තරුණයා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

"භවත් ගෞතමයන් වහන්ස, බමුණෝ මෙසේ කීහ. 'ගිහියා නිරවද්‍යවූ කුශලමාර්ගය සම්පූර්ණ කරන්නේ වෙයි. පැවිද්දා නිරවද්‍යවූ කුශලමාර්ගය සම්පූර්ණ නොකරන්නේවේ යනුයි.' මේ කරුණෙහිදී භවත් ගෞතමයන් වහන්සේ කුමක් කියන සේක්ද?"

3. "මානවකය, මම මේ කරුණෙහිදී විභජ්ජවාදියෙක් (කරුණු බෙදා කියන්නෙක්) වෙමි. මම එක් පැත්තක් බලා කියන්නෙක් නොවෙමි. මානවකය, මම ගිහියෙකුගේ හෝ පැවිද්දෙකුගේ හෝ වැරදි පිළිපැදීම වර්ණනා නොකරමි. මානවකය, වැරදි මාර්ගයෙහි පිළිපන් ගිහියා හෝ පැවිද්දා හෝ වැරදි මාර්ගයෙහි පිළිපැදීම හෙතුකොට ගෙන නිවැරදි කුශල මාර්ගය සම්පූර්ණ කරන්නෙක් නොවේ. මානවකය, මම ගිහියාගේ හෝ පැවිද්දාගේ හෝ යහපත් පිළිපැදීම වර්ණනා කරමි. මානවකය, හරි මාර්ගයෙහි පිළිපන් ගිහියා හෝ පැවිද්දා හෝ හරිමාර්ගයෙහි පිළිපැදීම හෙතු කොට ගෙන නිවැරදි කුශල මාර්ගය සම්පූර්ණ කරන්නෙක්වේ".

4. "භවත් ගෞතමයන් වහන්ස, බ්‍රහමණයෝ මෙසේ කීහ. "වතාවත් කිරීම් උපකරණ රැස්කිරීම්, ආදී බොහෝ කටයුතු ඇති නම් තබන මඞ්ගලයාදී මහත් කටයුතු ඇති මෙය අද කළ යුතුය, සෙට කළයුතුයයි මෙසේ අධික කටයුතු ඇති බොහෝ දෙනා කර්මාන්තයන්හි යෙදීම් යෙදවීම් ආදී බොහෝ කරදර ඇති, ගිහිගෙයි කටයුතු මහත් ඵල ඇත්තේ වෙයි. ස්වල්ප කටයුතු ඇති ස්වල්ප වැඩ ඇති ස්වල්ප යෙදවීම් ඇති අඩු කරුණු ඇති පැවිදිකම අල්ප ඵල ඇත්තේය'කියාය. භවත් ගෞතමයන් වහන්සේ මෙකරුණෙහිදී කුමක් කියන සේක්ද?"

5. "මානවකය, මම මෙහිද කරුණු බෙදා කියන්නෙක්මි. එක් පැත්තක් බලා කරුණු කියන්නෙක් නොවෙමි. මානවකය, මහත් කටයුතු ඇති බොහෝ වැඩපල ඇති අධික කටයුතු ඇති බොහෝ යෙදවීම් ඇති කර්මාන්තද වරදවා කරන ලද්දේ ස්වල්ප ඵල ඇත්තේ වෙයි. මානවකය, මහත් කටයුතු ඇති බොහෝ වැඩපල ඇති අධික කටයුතු ඇති බොහෝ යෙදවීම් ඇති කර්මාන්තද, යහපත්කොට කරන ලද්දේ, මහත් ඵල ඇත්තේ වෙයි. මානවකය, මද කටයුතු ඇති, ස්වල්ප කෘත්‍ය ඇති අඩු වැඩපල ඇති අඩු යෙදවීම් ඇති, කර්මාන්තද වරදවා කරන ලද්දේ අල්ප ඵල ඇත්තේ වෙයි. මඳ කටයුතු ඇති ස්වල්ප කෘත්‍ය ඇති අඩුවැඩපල ඇති අඩුයෙදවීම් ඇති කර්මාන්තද යහපත් කොට කරන ලද්දේ මහත්ඵල ඇත්තේ වෙයි.

"මානවකය, මහත් කටයුතු ඇති බොහෝ වැඩපල ඇති අධික කටයුතු ඇති බොහෝ යෙදවීම් ඇති වරදවා කරන ලද අල්ප ඵල ඇති කර්මාන්තය නම් කුමක්ද? මානවකය, කෘෂිකර්මය (ගොවිතැන) මහත් කටයුතු ඇති බොහෝ වැඩපල ඇති අධික කටයුතු ඇති බොහෝ යෙදවීම් ඇති වරදවා කළ කල්හි ස්වල්ප ඵල ඇති කර්මාන්තය වේ.

**6.** මානවකය, යහපත් කොට කරනලද කල්හි මහත්ඵල ඇති, මහත් කටයුතු ඇති, බොහෝ වැඩපල ඇති, අධික කටයුතු ඇති, බොහෝ යෙදවීම් ඇති කර්මාන්තය කුමක්ද?

"මානවකය, කෘෂිකර්මය (ගොවිතැන) යහපත් කොට කළ කල්හි මහත්ඵල ඇති, මහත් කටයුතු ඇති, බොහෝ වැඩපල ඇති, අධික කටයුතු ඇති, බොහෝ යෙදවීම් ඇති කර්මාන්තය වේ.

**7.** "මානවකය, ස්වල්ප කටයුතු ඇති, ස්වල්ප වැඩපල ඇති, අඩු කටයුතු ඇති, අඩු මෙහෙයීම් ඇති, වරදවා කළ කල්හි අල්ප ඵල ඇති, කර්මාන්තය නම් කුමක්ද?

"මානවකය, වෙළඳාම අඩුකටයුතු ඇති, අඩු වැඩපල ඇති, අඩු යෙදවීම් ඇති වරදවා කළ කල්හි අල්ප ඵල ඇති කර්මාන්තය වෙයි.

**8.** "මානවකය, යහපත් කොට කරනලද කල්හි මහත් ඵල ඇති, අඩු කටයුතු ඇති, අඩු වැඩපල ඇති, අඩුයෙදවීම් ඇති කර්මාන්තය නම් කුමක්ද?

"මානවකය, වෙළඳාම යහපත් කොට කරනලද කල්හි මහත්ඵල ඇති, අඩුකටයුතු ඇති, අඩුවැඩපල ඇති, අඩු යෙදවීම් ඇති කර්මාන්තය වෙයි.

**9.** "මානවකය, මහත් කටයුතු ඇති, බොහෝ වැඩපල ඇති, අධික කටයුතු ඇති, බොහෝ යෙදවීම් ඇති කෘෂිකර්මය වරදවා කරනලද්දේ ස්වල්ප ඵල ඇත්තේ වෙයිද, මානවකය, එසේම මහත් කටයුතු ඇති, බොහෝ වැඩපල ඇති, අධික කටයුතු

ඇති බොහෝ යෙදවීම් ඇති, ගිහිකමද වරදවා කරන ලද්දේ ස්වල්ප ඵල ඇත්තේ වෙයි.

මානවකය, යම්සේ මහත් කටයුතු ඇති, බොහෝ වැඩපල ඇති, අධික කටයුතු ඇති බොහෝ යෙදවීම් ඇති කෘෂිකර්මයම යහපත් කොට කරන ලද්දේ මහත්ඵල ඇත්තේ වෙයිද, එසේම මහත් කටයුතු බොහෝ වැඩපල ඇති, අධික කටයුතු ඇති, බොහෝ යෙදවීම් ඇති, ගිහි කමද යහපත් කොට කරන ලද්දේ මහත් ඵල ඇත්තේ වෙයි.

**10.** "මානවකය, යම්සේ ස්වල්ප කටයුතු ඇති ස්වල්ප වැඩ පල ඇති, අඩු කටයුතු, අඩු යෙදවීම් ඇති, වෙළඳාම වරදවා කරන ලද්දේ ස්වල්ප ඵල ඇත්තේද? එමෙන් ස්වල්ප කටයුතු ඇති ස්වල්ප වැඩපල ඇති, අඩු කටයුතු ඇති, අඩු යෙදවීම් ඇති, මහණකමද වරදවා කරන ලද්දේ, ස්වල්ප ඵල ඇත්තේ වෙයි. මානවකය, යම්සේ ස්වල්ප කටයුතු ඇති, ස්වල්ප වැඩපල ඇති, අඩු කටයුතු ඇති, අඩු යෙදවීම් ඇති, වෙළඳාම යහපත් කොට කරන ලද්දේ මහත්ඵල ඇත්තේ වේද, එමෙන් ස්වල්ප කටයුතු ඇති, ස්වල්ප වැඩපල ඇති, අඩු කටයුතු ඇති, අඩු යෙදවීම් ඇති, මහණකමද යහපත්කොට කරන ලද්දේ මහත් ඵල ඇත්තේ වෙයි"

**11.** "භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයෝ වනාහි කුසල් කිරීම පිණිස, කුසල් පිරීම පිණිස, ධර්ම පසක් පනවත්."

"මානවකය, බ්‍රාහ්මණයෝ කුසල් කරනු පිණිස, කුසල් පුරනු පිණිස, යම් ඒ ධර්ම පසක් පනවත්ද, ඉදින් තොපට බරක් නොවේ නම් ඒ ධර්ම පස මේ පිරිසෙහි කියව." "භවත් ගෞතමයන් වහන්ස, පින්වතුන් වහන්සේ හෝ පින්වතුන් වහන්සේට සමාන වූවෝ හෝ යම් තෙනක සිටිත් නම් එහිදී ප්‍රකාශ කිරීම මට බරක් නොවේ." "මානවකය, එසේ නම් කියව."

**12.** "භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයෝ සත්‍යය කුසල් කරනු පිණිස, කුසල් පුරනු පිණිස, පළමුවැනි ධර්මය කොට පනවත්. භවත් ගෞතමයන් වහන්ස,

බ්‍රාහ්මණයෝ තපස කුසල් කරනු පිණිස කුසල් පුරනු පිණිස දෙවැනි ධර්මය කොට පණවත්. භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයෝ බ්‍රහ්මචර්‍ය්‍යාව කුසල් කරනු පිණිස කුසල් පුරනු පිණිස තුන්වැනි ධර්මය කොට පණවත්. භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයෝ සජ්ඣායනා කිරීම කුසල් කරනු පිණිස කුසල් පුරනු පිණිස සතර වැනි ධර්මය කොට පණවත්. භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයෝ කුසල් කරනු පිණිස කුසල් පුරනු පිණිස ත්‍යාගය (දීම) පස්වැනි ධර්මය කොට පණවත්. භවත් ගෞතමයන් වහන්සේ මේ කාරණය ගැන කුමක් කියන සේක්ද?"

13. "මානවකය, කිමෙක්ද? බමුණන් අතුරෙන් එක් බ්‍රාහ්මණයෙක්වත් 'මම මේ ධර්ම පස තෙමේම ප්‍රත්‍යක්ෂ කොට නුවණින් දැන විපාක ප්‍රකාශ කරමියි' කියන්නේද?" "භවත් ගෞතමයන් වහන්ස, එසේ නොවේය". "මානවකය, කිමෙක්ද? බ්‍රාහ්මණයන්ගේ එක් ගුරුවරයෙක් හෝ ගුරුවරයන්ගේ ගුරුවරයෙක් හෝ සත්වැනි පරම්පරාව දක්වා 'මම මේ ධර්ම පස තෙමේම ප්‍රත්‍යක්ෂ කොට නුවණින් දැන විපාක ප්‍රකාශ කරමියි' කියන්නේද?" "භවත් ගෞතමයන් වහන්ස, එය එසේ නොවේය." "මානවකය, කිමෙක්ද? මන්ත්‍ර කර්තෘවූ මන්ත්‍ර පවත්වන්නාවූ බමුණන්ගේ පූර්වවූ යම් ඒ ඍෂිහු වෙත්ද? ඔවුන් විසින් ගායනා කරනලද කියනලද, යහපත්සේ එක්කොට තැබූ පුරාණවූ මන්ත්‍රවිදි මෙකල බමුණෝ අනුව ගායනාකරත්ද? ඒ අනුව කියත්ද, කියූදෙය අනුව කියත්ද, ඔවුහු කවරේද? අට්ටකය, වාමකය, වාමදෙවය, වෙස්සාමිත්තය, යමතග්ගිය, අඞ්ගීරසය, භාරද්වාජය, වාසෙට්ඨය, කස්සපය, භගුය (යන මොවුහුය) ඔවුහුද අපි මේ ධර්ම පස තෙමේම ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන විපාක ප්‍රකාශ කරමුයි කීවාහුද?" "භවත් ගෞතමයන් වහන්ස, මෙය එසේ නොවේ".

14. "මානවකය, මෙසේ වනාහි බමුණන් අතුරෙන් 'මම මේ ධර්ම පස ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන විපාක ප්‍රකාශ කෙළෙමියි' කී එකද බ්‍රාහ්මණයෙක් නැත. බමුණන්ගේ සත්වැනි ඇදුරු පරපුර දක්වා 'මම මේ ධර්ම පස ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන

විපාක ප්‍රකාශ කරමියි' කී එක් ගුරුවරයෙක් හෝ ගුරුවරයන්ගේ ගුරුවරයෙක් හෝ නැත. බමුණන්ගේ මන්ත්‍ර කරන්නාවූ මන්ත්‍ර පවත්වන්නාවූ යම් ඒ පූර්ව ඍෂිහු වෙත්ද, ඔවුන් විසින් ගායනා කරණලද, කියන ලද, යහපත්සේ එක්කොට තැබූ පුරාණවූ මන්ත්‍ර පද අනුව ගයත්ද, ඒ අනුව කියත්ද, කියූ දෙය අනුව කියත්ද, ඔවුහු කවරේද? අට්ටකය, වාමකය, වාමදෙවය, වෙස්සාමිත්තය, යමතග්ගීය, අඞ්ගීරසය, භාරද්වාජය, වාසෙට්ඨය, කස්සපය, භගුය, (යන මොවුහුය) ඔවුහුද අපි මේ පඤ්චධර්මයන් තෙමේම ප්‍රත්‍යක්ෂ වශයෙන් දැන විපාක ප්‍රකාශ කරමුයයි නොකීහ.

"මානවකය, යම්සේ උරෙන් උරය සම්බන්ධවී සිටින අන්ධ සමූහයක පළමුවැනියාද නොදකියි. මැදසිටින්නාද නොදකියි. අන්තිමයාද නොදකියි. මානවකය, එපරිද්දෙන් බ්‍රාහ්මණයන්ගේ කීම මේ අන්ධ උපමාව හා සමාන බවට පැමිණෙයි. පළමුවැනියාද නොදකියි. මධ්‍යමයාද නොදකියි. අන්තිමයාද නොදකියි."

**15.** මෙසේ කී කල්හි තොදෙය්‍යපුත්‍රවූ සුභමානවකයා භාග්‍යවතුන් විසින් කියනු ලැබූ අන්ධ උපමාව නිසා කුපිතව නොසතුටු සිත් ඇතිව භාග්‍යවතුන් වහන්සේටම ගටා බණමින් භාග්‍යවතුන් වහන්සේටම පහත්කොට කථා කරමින් භාග්‍යවතුන් වහන්සේටම උපවාද කියමින් "ශ්‍රමණ ගෞතමතෙමේ පාපියෙක් වන්නේයයි" කියා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "භවත් ගෞතමය, උපමඤ්ඤගොත්‍රයෙහිවූ සුභග වනයට අධිපතිවූ පොක්ඛරසාති බ්‍රාහ්මණ තෙමේ මෙසේ කීය. 'ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් මනුෂ්‍ය ධර්මයට වඩා උසස්වූ ආර්‍ය්‍යවූ විශෙෂ ඥානයෙන් දැකීමක් ප්‍රකාශ කරත්. ඔවුන්ගේ ඒ කීම සිනාවක් බවට පැමිණේ. නාම මාත්‍රයක් බවට පැමිණේ. හිස්බවට පැමිණේ. බොරු බවට පැමිණේ. මනුෂ්‍යයෙක් කෙසේ නම් මනුෂ්‍ය ධර්මයට වඩා උසස්වූ ආර්‍ය්‍යවූ විශෙෂ ඥානයක් දැන ගන්නේද දක්නේද ප්‍රත්‍යක්ෂ කරන්නේද? ඊට කරුණු නැත, කියායි". "කිමෙක්ද? මානවකය, උපමඤ්ඤගොත්‍රයෙහිවූ සුභග වනයට

අධිපතිවූ පොක්ඛරසාති බ්‍රාහ්මණතෙමේ සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ සිත තම සිතින් පිරිසිඳ දනීද?" "භවත් ගෞතමය, උපමඤ්ඤගොත්‍රයෙහිවූ සුභග වනයට අධිපතිවූ පොක්ඛරසාති බමුණුතෙම ස්වකීය පුණ්ණක නම් දාසියගේ සිතද තම සිතින් පිරිසිඳ නොදනියි. කෙසේ නම් සියලුම ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ සිත තම සිතින් පිරිසිඳ දැනගන්නේද?"

**16.** "මානවකය, යම්සේ උත්පත්තියෙන් අන්ධ පුරුෂයා කළු සුදු රූපයන් නොදක්නේද, නිල් රූප නොදක්නේද, රන්වන් රූප නොදක්නේද, ලෙහෙවන් රූප නොදක්නේද, මදටිය පැහැති රූප නොදක්නේද, සම විසම දෙක නොදක්නේද, තරු නොදක්නේද, සඳ හිරු නොදක්නේද, හෙතෙම මෙසේ කියන්නේය. 'කළු සුදු රූපයෝ නැත. කළු සුදු රූපයන් දකින්නෙක් නැත. නිල් රූප නැත. නිල් රූපයන් දක්නෙක් නැත. රන්වන් රූප නැත. රන්වන් රූප දක්නෙක් නැත. ලෙහෙවන් රූප නැත. ලෙහෙවන් රූප දක්නෙක් නැත. මදටිය පැහැති රූප නැත. මදටිය වන් රූපයන් දක්නෙක් නැත. සම විසම දෙකක් නැත. සම විසම දෙක දක්නෙක් නැත. තරු නැත. තරු දක්නෙක් නැත. සඳ හිරු නැත. සඳ හිරු දක්නෙක් නැත. මම මෙය නොදනිමි. මම මෙය නොදකිමි. එහෙයින් ඒ දේ නැතැයි කියමි, යනුයි". "මානවකය, හෙතෙම මනාකොට කියනු ලබන්නෙක් වන්නේද?

"භවත් ගෞතමයන් වහන්ස, එය එසේ නොවේය. කළු සුදු රූප ඇත. කළු සුදු රූපයන් දක්නෙක් ඇත. නිල් රූප ඇත. නිල් රූප දක්නෙක් ඇත. රන්වන් රූප ඇත. රන්වන් රූප දක්නෙක් ඇත. ලෙහෙවන් රූප ඇත. ලෙහෙවන් රූප දක්නෙක් ඇත. මදටිය පැහැති රූප ඇත. මදටිය පැහැති රූප දක්නෙක් ඇත. සම විසම ඇත. සම විසම දක්නෙක් ඇත. තරු ඇත. තරු දක්නෙක් ඇත. සඳ හිරු ඇත. සඳහිරු දක්නෙක් ඇත. 'මම මෙය නොදනිමි. මම මෙය නොදකිමි. එහෙයින් නැතැයි කියන්නේ නම්' භවත් ගෞතමයන් වහන්ස, හෙතෙම යහපත්කොට කියනු ලබන්නෙක් නොවේ". 'මානවකය, එසේම

ඕපමඤ්ඤගොත්‍රයෙහි සුභග වනයට අධිපතිවූ පොක්ඛරසාති බ්‍රාහ්මණ තෙමේ අන්ධයෙකි. ඇස් නැත්තෙකි. හෙතෙම ඒකාන්තයෙන් මනුෂ්‍ය ධර්මයට වඩා උසස් ආර්‍යයවූ ඥානදර්ශනය දැනගන්නේය, දක්නේය, ප්‍රත්‍යක්ෂ කරන්නේය, යන බවට හේතුවක් කරුණක් නැත්තේය.

17. "මානවකය, ඒ කිමැයි සිතන්නෙහිද, කොසල ජනපදයෙහි යම් ඒ මහාසාර බ්‍රාහ්මණයෝ වෙත්ද, ඔවුහු කවරහුද? චඞ්කී බ්‍රාහ්මණය, තාරුක්ඛ බ්‍රාහ්මණය, පොක්ඛරසාතී බ්‍රාහ්මණය, ජානුස්සොනි බ්‍රාහ්මණය, තොපගේ පියාවූ තොදෙය්‍ය බ්‍රාහ්මණය යන මොහුය". "ඔව්හු ලොක ව්‍යවහාරයට අනුකූල වචනයක් කියත්ද, අනුකූල නොවූ වචනයක් කියත්ද, එදෙකින් කවරක් උතුම් වේද?"

"භවත් ගෞතමයන් වහන්ස, ලොක ව්‍යවහාරයට අනුව කියන වචනය උතුම්ය". "ඔව්හු යම් වචනයක් විමසා බලා කියත්ද, යම් වචනයක් විමසා නොබලා කියත්ද, ඒ දෙකින් කවරක් උතුම්ද,?" "භවත් ගෞතමයන් වහන්ස, විමසා බලා කියන වචනය උතුම්ය". "ඔව්හු යම් වචනයක් දැනගෙන කියත්ද, යම් වචනයක් නොදැන කියත්ද, ඒ දෙකින් කවරක් උතුම්ද?" "භවත් ගෞතමයන් වහන්ස, දැනගෙන කීම උතුම්". "ඔව්හු අර්ථයෙන් යුක්තවූ යම් වචනයක් කියත්ද, අර්ථ රහිතවූ යම් වචනයක් කියත්ද, ඒ දෙකින් කවරක් උතුම්ද?" "භවත් ගෞතමයන් වහන්ස, අර්ථයෙන් යුක්ත කොට කියන වචනය උතුම්ය".

"මානවකය, ඒ කිමැයි සිතන්නෙහිද? "ඉදින් මෙසේ ඇතිකල්හි ඕපමඤ්ඤාවූ සුභගවනික නම්වූ පොක්ඛරසාති බමුණා විසින් ලොක ව්‍යවහාරයට අනුකූල වචනයක් කියන ලද්දේද? අනුකූල නොවූවක් කියන ලද්දේද?" "භවත් ගෞතමයන් වහන්ස, අනුකූල නොවූවක් කියන ලදී, "විමසා බලා කියන ලද්දේද? විමසා නොබලා කියන ලද්දේද?" "භවත් ගෞතමයන් වහන්ස, විමසා නොබලා කියන ලද්දේය". "දැන ගෙන කියන ලද්දේද? නොදැන කියන ලද්දේද?" "භවත් ගෞතමයන් වහන්ස,

නොදැන කියන ලද්දේය". "අර්ථ සහිතව කියන ලද්දේද, අර්ථ රහිතව කියන ලද්දේද?" "භවත් ගෞතමයන් වහන්ස, අර්ථ රහිතව කියන ලද්දේය".

18. "මානවකය, මේ නීවරණයෝ පස් දෙනෙකි, කවරපසෙක්ද? කාමච්ඡන්ද නීවරණය, ව්‍යාපාද නීවරණය, ථීනමිද්ධ නීවරණය, උද්ධච්චකුක්කුච්ච නීවරණය, විචිකිච්ඡා නීවරණය යනුයි. මානවකය, මේ පඤ්චනීවරණයෝය. මානවකය, ඕපමඤ්ඤවූ සුභගවනික නම්වූ පොක්ඛරසාති බමුණා මේ පඤ්චනීවරණයන්ගෙන් වැසුනේය, වටකරගන්නා ලද්දේය. වෙලුණේය. විශෙෂයෙන් වෙලුණේය. හෙතෙම ඒකාන්තයෙන් මනුෂ්‍ය ධර්මයට වඩා උසස්වූ අයඹිවූ ඥාන දර්ශනය දන්නේය, දකින්නේය, ප්‍රත්‍යක්ෂ කරන්නේය, යන බවට කරුණු නැත්තේය.

19. "මානවකය, මේ කාම ගුණයෝ පසෙකි. කවර පසෙක්ද, ඇසින් දතයුතුවූ, ඉෂ්ටවූ කැමතිවූ , මනවඩන්නාවූ ඇලීම පිණිස පවත්නාවූ රූපයෝවෙත්, කණින් දතයුතුවූ ඉෂ්ටවූ, කැමතිවූ, මනවඩන්නාවූ ඇලීම පිණිස පවත්නාවූ, ශබ්දයෝ වෙත්. නාසයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කැමතිවූ, මනවඩන්නාවූ, ඇලීම පිණිස පවත්නාවූ, ඇලිය යුතුවූ ගන්ධයෝ වෙත්. දිවෙන් දතයුතු වූ ඉෂ්ටවූ, කැමතිවූ, මනවඩන්නාවූ, ඇලීම පිණිස පවත්නාවූ, රසයෝ වෙත්. කයින් දතයුතුවූ ඉෂ්ටවූ, කැමතිවූ, මනවඩන්නාවූ ඇලීම පිණිස පවත්නාවූ, ස්පර්ශයෝ වෙත්. මාණවකය, මේ පඤ්චකාම ගුණයෝය. මාණවකය, මේ පඤ්චකාම ගුණයන්හි ඕපඤ්ඤ සුභගවනික නම්වූ පොක්ඛරසාති බමුණා ගැළුනේ, මුසපත් වූයේ මුලාවට පැමිණියේ, ආදිනව නොදක්නේ නික්මෙන ප්‍රඥාවක් නැතිව එම පස්කම් සැප අනුභව කරයි. ඒකාන්තයෙන් හෙතෙම මනුෂ්‍ය ධර්මයට වඩා උසස්වූ, ආයඹිවූ ඥාන දර්ශන විශෙෂයක් දැන ගන්නේය කියා හෝ දක්නේය කියා හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේය කියා හෝ යන මීට හේතු නැත.

20. "මාණවකය, ඒ කිමැයි සිතන්නෙහිද, තෘණ දර නිසා යම් ගින්නක් දල්වන්නේද, තණ දර නැතිව යම් ගින්නක්

දල්වන්නේද, මේ දෙකින් කිනම් ගින්නක් රශ්මිය ඇත්තේද? වර්ණවත්ද? ආලොකවත්ද?"

"භවත් ගෞතමයන් වහන්ස, ඉදින් තණ දර නැතිව ගිනි දැල්විය හැකි නම්, ඒ ගිනි රශ්මි ඇත්තේය. වර්ණවත්ය. ආලොකවත්ය". "මානවකය, තෘණ දර නැතිව ගිනි දැල්වීමට ඍද්ධිමතෙකුට හැර අනිකෙකුට නුපුළුවන. මානවකය, යම්සේ තණ දර නිසා ගිනි දල්වයිද, මානවකය, එමෙන් පස්කම් ගුණයන් නිසා යම් ප්‍රීතියක් වේද, මම ඒ ප්‍රීතිය ඒ ගින්න හා උපමා කොට කියමි. මානවකය, යම්සේ තෘණ දර නැතිව ගිනි දල්වයිද, කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව යම් ප්‍රීතියක් ලබයිද, ඒ ප්‍රීතිය මම ඒ තෘණ දර නැතිව උපද වන ගින්නට උපමාකර කියමි.

**21.** "මානවකය, කාමයන්ගෙන් වෙන්වූ, අකුසල ධර්මයන්ගෙන් වෙන්වූ ප්‍රීතිය කවරේද? මානවකය, මෙහි භික්ෂු තෙම කාමයන්ගෙන් වෙන්ව, අකුශලයන්ගෙන් වෙන්ව, විතක්ක විචාර සහිතවූ විවේකයෙන් උපන් ප්‍රීතිය සහ සැපයෙන් යුක්ත ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කෙරේද, මානවකය, මේ ප්‍රීතිය කාමයන්ගෙන් වෙන්වූ අකුසල ධර්මයන්ගෙන් වෙන්වූ ප්‍රීතියයි. නැවතද මානවකය, භික්ෂු තෙම විතර්ක විචාරයන්ගේ සන්සිඳීමෙන්, අභ්‍යන්තරය පහදවන්නා වූ, සිතේ එකඟකම ඇතිකරන්නාවූ, විතර්ක විචාර රහිතවූ සමාධියෙන් ඇතිවූ ප්‍රීතිය සහ සැපය ඇති, ද්විතීයධ්‍යානයට පැමිණ වාසය කරයිද, මානවකය, මෙයද කාමයන්ගෙන් වෙන්වූ අකුශල ධර්මයන්ගෙන් වෙන්වූ ප්‍රීතියයි.

**22.** "මානවකය, යම් ඒ බ්‍රාහ්මණයෙක් පින්කිරීමට කුසල් කිරීමට ධර්ම පසක් පනවත්ද, මොවුන් අතුරෙන් බ්‍රාහ්මණයෝ කිනම් ධර්මයක් පින කිරීමට කුසල් කිරීමට වඩා මහත්ඵලකොට පනවත්ද?" "භවත් ගෞතමයන්වහන්ස, කුසල් කිරීමට යම් ඒ ධර්මයක් පනවත්ද, බමුණෝ පින් කිරීමට ඔවුන් අතුරෙන් දන්දීම පින් කිරීම පිණිස කුසල් කිරීම පිණිස වඩා මහත්ඵල කොට පනවත්" "මානවකය, ඒ කිමැයි සිතන්නෙහිද? මෙහි එක්තරා

බමුණෙකුගේ මහා දානයක්වූ අවස්ථාවක් පැමිණෙන්නේය. එකල්හි බමුණෝ දෙදෙනෙක් මෙනම් බමුණාගේ මහා යාගය අනුභව කරන්නෙමුයි එන්නාහුය. එහි එක් බමුණෙකුට මෙබඳු සිතක් වන්නේය. 'දානයෙහි අග්‍ර ආසනය, අග්‍රජලය, අග්‍ර ආහාරය ඒකාන්තයෙන් මම ලබන්නෙම් නම් අනික් බ්‍රාහ්මණයා දානයෙහි අග්‍ර ආසනය, අග්‍ර ජලය අග්‍ර ආහාරය නොලබන්නේ නම් හොඳය' කියාය. මානවකය, ඉදින් අනික් බ්‍රාහ්මණයා දානයෙහි අග්‍ර ආසනය, අග්‍ර ජලය, අග්‍ර ආහාරය ලබන්නේද, ඒ බ්‍රාහ්මණයා දානයෙහි අග්‍ර ආසනය, අග්‍ර ජලය, අග්‍ර ආහාරය නොලබන්නේද 'අනික් බ්‍රාහ්මණයා දානයෙහි අග්‍ර ආසනය, අග්‍ර ජලය, අග්‍ර ආහාරය ලබයි. මම දානයෙහි අග්‍ර ආසනය, අග්‍ර ජලය, අග්‍ර ආහාරය නොලබමියි". මෙසේ හෙතෙම කිපුණෙක් නොසතුටු වූවෙක් විය හැකි වන්නේය. මානවකය, මොහුට බමුණෝ කුමන විපාකයක් පනවත්ද?" "භවත් ගෞතමයන් වහන්ස, මෙහි බමුණෝ මේ නිසා අනිකෙක් කුපිතවේවා නොසතුටු සිතැත්තේ වේවායි සිතා මෙසේ දන් නොදෙත්. එහෙත් බමුණෝ අනුකම්පා ස්වභාවයෙන්ම දන් දෙත්. මානවකය, මෙසේ ඇති කල්හි බමුණන්ගේ යම් මේ අනුකම්පා ස්වභාවවූ සයවැනි පුණ්‍යක්‍රියා වස්තුවක්ද වේද?". "භවත් ගෞතමයන් වහන්ස, මෙසේ ඇති කල්හි බමුණන්ගේ යම් මේ අනුකම්පා ස්වභාවවූ සය වැනි පුණ්‍යක්‍රියා වස්තුවක් ද වෙයි".

23. "මානවකය, බමුණෝ පින්කිරීමට කුසල් කිරීමට යම් මේ පඤ්ච ධර්මයක් පනවත්ද, නුඹ මේ පඤ්ච ධර්මයන් ගිහියන් අතර හෝ පැවිද්දන් අතර හෝ කවුරුන් අතර බහුලව දක්නේද?" "භවත් ගෞතමයන්වහන්ස, බමුණෝ පින් කිරීමට කුසල් කිරීමට යම් මේ පඤ්ච ධර්මයක් පනවත්ද, මේ පඤ්ච පැවිද්දන් අතර බහුලව දකිමි. ගිහියන් අතර අල්පය. භවත් ගෞතමයන් වහන්ස, ගෘහස්ථයා වනාහි මහත් කටයුතු ඇත්තේය. බොහෝ වැඩපල ඇත්තේය. අධික කටයුතු ඇත්තේය. බොහෝ යෙදවීම් ඇත්තේය. එහෙයින් නිතර සත්‍යවාදී නොවෙයි. භවත් ගෞතමයන් වහන්ස, ප්‍රව්‍රජිතයා වනාහි අඩු කටයුතු ඇත්තේය. අඩු වැඩපල ඇත්තේය. අඩු යෙදවීම් ඇත්තේය. එහෙයින් නිතර

සත්‍යවාදී වෙයි. භවත් ගෞතමයන් වහන්ස, ගෘහස්ථයා වනාහි මහත් කටයුතු ඇත්තේය. බොහෝ වැඩපල අධික කටයුතු ඇත්තේය. බොහෝ යෙදවීම් ඇත්තේය. එහෙයින් නිතර තපස් කම් නොකරයි. බ්‍රහ්මචාරි නොවේ. සජ්ඣායනා බහුල නොවේ. දන්දීම් බහුල නොවේ. භවත් ගෞතමයන් වහන්ස, ප්‍රව්‍රජිතයා වනාහි ස්වල්ප කටයුතු ඇත්තේය. ස්වල්ප යෙදවීම් ඇත්තේය. එහෙයින් නිතර තපස් කම් කරයි. බ්‍රහ්මචාරී වෙයි. සජ්ඣායනා බහුල වෙයි. දන්දීම් බහුල වෙයි. භවත් ගෞතමයන් වහන්ස, බමුණෝ පින් කිරීමට කුසල් කිරීමට යම් මේ පඤ්චධර්මයන් පනවත්ද, මම මේ පඤ්ච ධර්මයන් පැවිද්දන් කෙරෙහි බහුලව දකිමි. ගෘහස්ථයන් කෙරෙහි ස්වල්පය".

**24.** "මානවකය, බ්‍රාහ්මණයෝ පින් කිරීමට කුසල් කිරීමට යම් ඒ ධර්ම පසක් පනවත්ද, මම ඒ ධර්ම චිත්තයාගේ පිරිවර ධර්මයයි කියමි. වෛර නැත්තාවූ, ක්‍රොධ නැත්තාවූ යම් ඒ සිතක් වේද ඒ චිත්තයාගේ වැඩීම පිණිස වෙයි. මානවකය, මෙහි භික්ෂු තෙම සත්‍යවාදී වෙමියි අර්ථය දැනීමෙන් සතුට ලබයි. පාළිය දැනීමෙන් සතුට ලබයි. ධර්මයෙන් යුක්තවූ සතුට ලබයි. කුසලයෙන් යුක්තවූ යම් ඒ ප්‍රීතියක් වේද, ඒ ප්‍රීතිය චිත්තයාගේ පිරිවරයයි කියමි. වෛර නැත්තාවූ ක්‍රොධ නැත්තාවූ, යම් ඒ සිතක් වේද, ඒ සිත වැඩීම පිණිස වෙයි. මානවකය, මෙහි භික්ෂුතෙම තපස් රක්නේද හෙතෙම 'මම තපස් කරන්නෙක් වෙමියි' අර්ථය දැනීමෙන් ප්‍රීතිය ලබයි. ධර්මය දැනීමෙන් ප්‍රීතිය ලබයි. ධර්මයෙන් යුක්තවූ ප්‍රීතිය ලබයි. කුශලයෙන් යුක්තවූ යම් ඒ ප්‍රීතියක් වේද, යම් ඒ වෛර නැත්තාවූ සිතක් වේද, 'මම ඒ වැඩීම සඳහා තපස් රැකීම ඒ චිත්තයාගේ පිරිවර යයි' කියමි. හෙතෙම 'මම බ්‍රහ්මචාරී වෙමියි' අර්ථය දැනීමෙන් ප්‍රීතිය ලබයි ධර්මයෙන් යුක්තවූ ප්‍රීතිය ලබයි. යම් මේ වෛර නැත්තාවූ ක්‍රොධ නැත්තාවූ සිතක් වේද, හෙතෙම 'මම සජ්ඣායන බහුල වෙමියි' අර්ථය දැනීමෙන් ප්‍රීතිය ලබයි. ධර්මයද දැනීමෙන් ප්‍රීතිය ලබයි. ධර්මය දැනීමෙන් ප්‍රීතිය ලබයි. ධර්මයෙන් යුක්තවූ ප්‍රීතිය ලබයි.

"යම් මේ වෛර නැත්තාවූ ක්‍රොධ නැත්තාවූ සිතක් වේද, මම එය ඒ චිත්තයාගේ වැඩීම පිණිස පිරිවරයයි කියමි. මානවකය, මෙහි භික්ෂුතෙම දන්දීම බහුල කොට ඇත්තේද හෙතෙම ත්‍යාග බහුල වූයෙමියි අර්ථයෙන් සතුට ලබයි. ධර්මයෙන් සතුට ලබයි. ධර්මයෙන් යුක්තවූ ප්‍රීතිය ලබයි. කුසලයෙන් යුක්තවූ යම් ඒ ප්‍රීතියක් වෙයිද එය ලබයි. මම එය චිත්තයාගේ පිරිවරයයි කියමි. වෛර නැත්තාවූ, ක්‍රොධ නැත්තාවූ, යම් සිතක් වේද ඒ චිත්තයාගේ වැඩීම පිණිසය.

"මානවකය, බ්‍රාහ්මණයෙක් පින් කිරීමට කුසල් කිරීමට ධර්ම පසක් පනවත්ද, මම ඒ, ධර්ම වෛර නැත්තාවූ ක්‍රොධ නැත්තාවූ යම් සිතක් වේද, චිත්තයාගේ වැඩීම පිණිස පිරිවර යයි කියමි."

**25.** මෙසේ කීකල්හි තොදෙයිය පුත්‍රවූ සුභ තරුණයා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "භවත් ගෞතමයන් වහන්ස, ශ්‍රමණ ගෞතමයෝ බ්‍රහ්මයා හා එක්වීමට පැමිණෙන මාර්ගය දනීයයි මා විසින් අසනලදී."

"මානවකය, මේ කුමකැයි සිතන්නෙහිද? මෙතැන්සිට නළකාරගම ළඟද ඉතා නුදුරෙහිද?" "එසේය, පින්වත, නළකාර ගම ආසන්නය. මෙයින් නළකාර ගම ඉතා දුර නොවේ." "මානවකය, ඒ කුමකැයි සිතන්නෙහිද, මෙහි පුරුෂයෙක් නළකාර ගමෙහි ඉපදී එහිම වැඩුනේ වේද, නළකාර ගමින් එකෙණෙහි නික්මුණු ඒ පුරුෂයාගෙන් නළකාර ගමට යන මාර්ගය අසන්නාහුද, මානවකය, නළකාර ගමෙහි ඉපදී වැඩුනු නළකාර ගමට යන මාර්ගය අසනලද ඔහුගේ ඒ මාර්ගය කීමෙහි පමාවීමක් හෝ ගල ගැසුනක්මෙන් සිටීමක් හෝ ඇත්තේද?" "භවත් ගෞතමයන් වහන්ස, එසේ නොවේ. ඊට හේතු කවරේද? භවත් ගෞතමයන් වහන්ස, ඒ පුරුෂයා නළකාර ගමෙහි ඉපදී එහිම වැඩුනෙකු වන හෙයින් ඔහු විසින් නළකාර ගමේ සියලුම පාරවල් මනාකොට දන්නා ලදී."

"මානවකය,නළකාරගමෙහි ඉපදී වැඩුණාවූ ඒ පුරුෂයාට නළකාර ගමට යන මාර්ගය කීමට පමාවීමක් හෝ ගල් ගැසුණාක් මෙන් සිටීමක් හෝ වෙතත් බඹලොව හෝ බඹලොවට

පැමිණෙන ප්‍රතිපදාව හෝ අසනලද තථාගතයන්ගේ පමාවීමක් හෝ ගල් ගැසුණක් මෙන් සිටීමක් හෝ නොවේමය. මානවකය, මම බ්‍රහ්මයන්ද දනිමි. බඹලොවද දනිමි. බඹලොව උපන්නේද, ඔහුද දනිමියි” වදාලේය.

**26.** “භවත් ගෞතමයන් වහන්ස, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ බ්‍රහ්මයන් හා එක්වීමට පැමිණෙන මාර්ගය දෙසනා කරත්යයි මා විසින් අසනලදී. භවත් ගෞතමයන් වහන්ස, ශ්‍රමණ ගෞතමයන් වහන්සේ බ්‍රහ්මයන් හා එක්වීමට පැමිණෙන මර්ගය දෙශනා කරන්නේ නම් මැනවි.” “එසේ නම් මානවකය, අසව මනාව සිත්හි කරව. කියන්නෙමි.” “එසේය පින්වතුන් වහන්සැයි”තොදෙයයපුත්‍රවූ සුභ මානවකයා භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.“මානවකය, බ්‍රහ්මයන් හා එක්වීමට පැමිණෙන මාර්ගය කවරේද? මානවකය, මේ ශාසනයෙහි භික්ෂුව මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරන්නේය. එසේ දෙවැනි දිසාවද, තුන් වැනි දිසාවද, සතරවැනි දිසාවද, මෙසේ උඩ යට සරස සියලු දෙය කෙරෙහි සියලු ආකාරයෙන් සියල්ල සහිත ලොකය මහත්වූ උසස් බවට පැමිණියාවූ, අප්‍රමාණවූ, වෛර නැත්තාවූ, ව්‍යාපාද නැත්තාවූ, මෛත්‍රී සහගත සිතින් පතුරුවා වාසය කරන්නේය.

**27.** “මානවකය, මෙසේ මෛත්‍රී සහගත සමාධිය වැඩූ කල්හි යම් ප්‍රමාණ කළ හැකි කාමාවචර කර්මයක් වෙයිද, ඒ කාමාවචර කර්මය තෙමේ ප්‍රමාණ නොකළ හැකි ඒ රූපාවචර කර්මය මැඩගෙන නොපවත්නේය, නොසිටින්නේය. මානවකය, යම්සේ බලවත් සක්පිඹින්නෙක් පහසුවෙන්ම සතර දිශාවට අඟවන්නේද, මානවකය, එසේම මඩනලද මෛත්‍රී සහගත සමාධිය ඇති කල්හි ප්‍රමාණ කළ හැකි යම් කාමාවචර කර්මයක් ඇත්තේද, එම කාමාවචර කර්මය තෙමේ එම රූපාවචර කර්මය මැඩගෙන නොපවත්නේය, නොසිටින්නේය. මානවකය, මෙයද බ්‍රහ්මයන් හා එක්වීමට මාර්ගයවේ.

**28.** “මානවකය, නැවතද භික්ෂුව කරුණා සහගත සිතින් එක් දිසාවක පතුරුවා වසයිද, දෙවෙනි, තෙවෙනි, සතරවැනි

දිසාවන්හිද, මෙසේ උඩ, යට, සරස සියලු දෙය කෙරෙහි සියලු ආකාරයෙන් සියලු ලොකය කරුණා සහගතවූ මහත්වූ මහග්ගතවූ, අප්‍රමාණවූ, අවෛරීවූ, අව්‍යාපාදවූ, සිතින් පතුරුවා වසයිද, මානවකය, මෙසේ කරුණා සහගත සමාධිය වැඩුකල්හි යම් ප්‍රමාණ කළහැකි කාමාවචර කර්මයක් වෙයිද, ඒ ප්‍රමාණ කළහැකි කාමාවචර කර්මය තෙමේ ප්‍රමාණ නොකළ හැකි රූපාවචර කර්මය මැඩගෙන නොපවත්නේය. නොසිටින්නේය. මානවකය, යම්සේ බලවත් සක් පිඹින්නෙක් පහසුවෙන් සිව් දිසාවනට හඟවන්නේද, මානවකය, මෙපරිද්දෙන් මෙසේ මඩන ලද, කරුණා සහගත සමාධිය වැඩූ කල්හි යම් ප්‍රමාණ කළහැකි කාමාවචර කර්මයක් වෙයිද, ඒ ප්‍රමාණ කළ හැකි කාමාවචර කර්මය තෙමේ ප්‍රමාණ නොකළ හැකි රූපාවචර කර්මය මැඩගෙන නොපවත්නේය. නොසිටින්නේය. මානවකය, මෙයද බ්‍රහ්මයන් හා එක්වීමට මාර්ගයයි.

**29.** "මානවකය, නැවතද භික්ෂුව මුදිතා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වසයිද, දෙවෙනි, තෙවෙනි, සතරවැනි දිසාවන්හිද මෙසේ උඩ, යට, සරස සියලු දෙය කෙරෙහි සියලු ආකාරයෙන්, සියලු ලොකය මුදිතා සහගතවූ, මහත්වූ, මහග්ගතවූ අප්‍රමාණවූ, අවෛරීවූ, අව්‍යාපාදවූ සිතින් පතුරුවා වසයිද, මානවකය, මෙසේ වඩනලද, මුදිතා සහගත සමාධිය ඇති කල්හි යම් ප්‍රමාණ කළහැකි කාමාවචර කර්මයක් වෙයිද, ඒ ප්‍රමාණ කළ හැකි කාමාවචර කර්මය තෙමේ ප්‍රමාණ නොකළ හැකි රූපාවචර කර්මය මැඩගෙන නොපවත්නේය. නොසිටින්නේය. මානවකය, යම්සේ බලවත් සක් පිඹින්නෙක් පහසු සිව් දිසාවනට හඟවන්නේද, මානවකය, මෙපරිද්දෙන් මෙසේ වඩනලද, මුදිතා සහගත සමාධිය ඇති කල්හී යම් ප්‍රමාණ කළහැකි කාමාවචර කර්මයක් වෙයිද, ඒ ප්‍රමාණ කළ හැකි කාමාවචර කර්මය තෙමේ ප්‍රමාණ නොකළ හැකි රූපාවචර කර්මය මැඩගෙන නොපවත්නේය. නොසිටින්නේය. මානවකය, මෙයද බ්‍රාහ්මයන් හා එක්වීමට මාර්ගයයි.

**30.** "මානවකය, නැවතද භික්ෂුව උපෙක්ඛා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වසයිද, දෙවැනි දිසාවද, තුන්වැනි දිසාවද,

සතරවැනි දිසාවද, මෙසේ උඩ යට සරස සියලු තැන සියලු ආකාරයෙන් සියලු ලොකය උපෙක්ඛා සහගතවූ, මහත්වූ, මහත් බවට පැමිණියාවූ, අප්‍රමාණවූ, වෛර නැත්තාවූ, ව්‍යාපාද නැත්තාවූ සිතින් පතුරුවා වාසය කරන්නේය. මානවකය, මෙසේ උපෙක්ඛා සහගත සමාධිය වැඩූ කල්හි යම් ප්‍රමාණ කළ හැකි කාමාවචර කර්මයක් වෙයිද, ඒ ප්‍රමාණ කළ හැකි කාමාවචර කර්මය තෙමේ ප්‍රමාණ නොකළ හැකි රූපාවචර කර්මය මැඩගෙන නොපවත්නේය. නොසිටින්නේය. ශක්තිමත් සක් පිඹින්නෙක් පහසුවෙන් සතර දිසාවට හඟවන්නේද, මානවකය, එපරිද්දෙන් උපෙක්ඛා සහගත සමාධිය වැඩූ කල්හි යම් කාමාවචර කර්මයක් ඇත්තේද, ඒ කාමාවචර කර්මය තෙම ඒ රූපාවචර කර්මය මැඩගෙන නොපවත්නේය. නොසිටින්නේය. මානවකය, මෙයද බ්‍රහ්මයන් හා එක්වීමට පැමිණෙන මාර්ගය වේ".

31. මෙසේ කී කල්හි තොදෙය්‍ය පුත්‍රවූ සුභ තරුණයා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේද, වැසූ දෙයක් වැහුම් අරින්නේද, මංමුළාවූවෙකුට මාර්ගය කියන්නේද, ඇස් ඇත්තෝ තෙල් පහනක් දරන්නේද, 'අඳුරෙහි දකිත්වායි' එපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය. මම භවත් ගෞතමයන් වහන්සේද, ධර්මයද, සඞ්ඝයාද සරණ කොට යමි. භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිම් කොට සරණ ගිය උපාසකයකු කොට දරන සේක්වා. භවත් ගෞතමයන් වහන්ස, අපි බොහෝ කටයුතු ඇත්තෝ වෙමු. බොහෝ වැඩපල ඇත්තෝ වෙමු. එබැවින් දැන් අපි යන්නෙමු." "මානවකය, නුඹ යමක් කැමති නම් ඊට කාලය දැනගනුවයි" වදාළේය.

32. එකල්හි ජානුස්සොණි බ්‍රාහ්මණ තෙමේ සියල්ල සුදු අශ්වරථයෙන් දවල් කාලයෙහි සැවැත් නුවරෙහි ගමන්

කරන්නේය. ජානුස්සොණී බ්‍රාහ්මණතෙමේ එන්නාවූ තොදෙය්‍යපුත්‍ර සුභමානවකයා දුරදීම දුටුයේය. දැක තොදෙය්‍යපුත්‍ර සුභ මානවකයා ගෙන් "පින්වත් භාරද්වාජ තෙමේ මේ දවල් කාලයෙහි කොහිසිට එන්නේදැයි" ඇසීය. "පින්වත, මම මේ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේගේ සමීපයෙහි සිට එන්නෙමැයි" කීය. "පින්වත් භාරද්වාජ තෙමේ ශ්‍රමණ ගෞතමයන්ගේ ප්‍රඥාවේ දක්ෂභාවය ගැන කුමක් සිතන්නෙහිද? පණ්ඩිතයෙකැයි සිතන්නෙහිද?" "පින්වත, මම කවරෙක්ද? කවරෙක්වූ මම ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ප්‍රඥාවේ දක්ෂභාවය දැනගන්නෙම්ද, යමෙක් ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ප්‍රඥාමහිමය දනීනම් හෙතෙමේද ඒකාන්තයෙන් උන්වහන්සේ, හා සමානයෙක් විය යුත්තේය".

'පින්වත් නි, භාරද්වාජතෙමේ ශ්‍රමණ ගෞතමයන්ට මහත් ප්‍රශංසාවක් කරන්නේය".

'පින්වත, මම කවරෙක් වෙම්ද, කවරෙක්වූ මම ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේට ප්‍රශංසා කෙරෙම්ද? ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි පසසන ලද්දන් විසින් පසසන ලද්දෙකි. දිව්‍යමනුෂ්‍යයන්ට ශ්‍රෙෂ්ඨයෙකි".

"පින්වත් බ්‍රාහ්මණය, යම් කෙනෙක් පින් කිරීම සඳහා කුශල් කිරීම සඳහා ධර්ම පසක් පනවත්ද, ඒ ධර්ම පස ශ්‍රමණ ගෞතමයන් වහන්සේ වෛර නැත්තාවූ, ව්‍යාපාද නැත්තාවූ, සිතවැඩීම පිණිස පවත්නා සිතේ පිරිවර ධර්මයෝයයි කියන්නාහ". මෙසේ කී කල්හි ජානුස්සොණී බ්‍රාහ්මණ තෙමේ සියල්ල සුදුවූ අශ්වරථයෙන් බැස උතුරුසළුව එක් අංශයක කොට පොරවා භාග්‍යවතුන් වහන්සේ දෙසට ඇඳිලි බැඳ නමස්කාර කොට, "යම් රජෙකුගේ රටෙහි අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ තථාගතයන් වහන්සේ වාසය කෙරෙද්ද, ඒ පසෙනදි කොසොල් රජහට ලාභයකි. ඒ පසෙනදි කොසොල් රජහට මහත් ලාභයෙකැයි" ප්‍රීති වාක්‍ය පහළ කෙළේය.

**සුභ සූත්‍රය. නිමි. (5 - 9)**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 50. සඞ්ගාරව සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසල ජනපදයෙහි මහත්වූ භික්ෂු සඞ්ඝයා සමග චාරිකාවෙහි හැසිරෙයි. එසමයෙහි වනාහි ධානඤ්ජානී නම් බැමිණිය බුදුන් කෙරෙහිද, ධර්මය කෙරෙහිද, සඞ්ඝයා කෙරෙහිද, ප්‍රසන්න වූවා මණ්ඩල කප්ප නම් ගමෙහි වාසය කරයි. එකල්හි ධානඤ්ජානි බැමිණිය ඇඳිරෙදි කොණේ පැටලී වැටෙන්නී 'ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර කරමි. ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර කරමි. ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර කරමියි' තුන්වරක් ප්‍රීතිවාක්‍ය ප්‍රකාශ කළාය.

**2.** එකල්හි වනාහි නිඝණ්ඩු ශාස්ත්‍රය කෙටුභ ශාස්ත්‍රය ශික්ෂා නිරුක්ති යන ප්‍රභේදයන් ඇති ඉතිහාසය පස්වැනි කොට ඇති වෙදත්‍රයයේ කෙළවරට ගියාවූ පද හා ව්‍යාකරණ හදාරන්නාවූ, ලොකායත ශාස්ත්‍රයේත් මහා පුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයේත් සම්පූර්ණවූ සඞ්ගාරව නම් තරුණයෙක් මණ්ඩල කප්ප නම් ගමෙහි වාසය කරයි. සඞ්ගාරව මානවකයා ධානඤ්ජානි බැමිණිය විසින් මෙසේ කියනු ලැබූ වචනය ඇසීය. අසා ධානඤ්ජානි බැමිණියට මෙසේ කීය. 'බ්‍රාහ්මණයන් සිටිද්දී මේ ධානඤ්ජානි පිරිහුනීය. මේ ධානඤ්ජානි බැමිණිය විනාශයට පැමිණියාය. එසේ වුවත් ඒ මුඩු ශ්‍රමණයාගේ ගුණ කියයි" යනුයි.

"යහපත් මුහුණක් ඇති පුත්‍රය, නුඹ වනාහි භාග්‍යවත්හුගේ සීලයත් ප්‍රඥාවත් නොදන්නෙහිය. ඉදින් යහපත් මුහුණක් ඇති දරුව, ඒ භාග්‍යවතුන් වහන්සේගේ සීලයත්, ප්‍රඥාවත්, දන්නෙහි නම්, යහපත් මුහුණක් ඇති දරුව, නුඹ ඒ භාග්‍යවතුන් වහන්සේට ආක්‍රොශ කළයුතුයයි, නින්දා කළයුතු යයි නොහඟින්නෙහිය". "එසේ නම් පින්වතිය, යම් කලෙක ශ්‍රමණ ගෞතමයෝ මණ්ඩල කප්ප ගමට පැමිණෙත්ද, එකල මට කියවයි" කීය. "යහපත් මුහුණක් ඇත්ත, එසේයයි" ධානඤ්ජානි බැමිණිය සඞ්ගාරව මානවකයාට පිළිතුරු දින.

3. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පිළිවෙළින් චාරිකාවෙහි හැසිරෙන සේක් මණ්ඩල කප්ප ගම යම් තැනකද, එහි පැමිණියහ. එහි භාග්‍යවතුන් වහන්සේ මණ්ඩල කප්ප ගමෙහි තොදය්‍ය බ්‍රාහ්මණයාගේ අඹවනයෙහි වාසය කරන සේක. භාග්‍යවතුන් වහන්සේ වනාහි මණ්ඩල කප්ප ගමට පැමිණ තොදෙය්‍ය බමුණන්ගේ අඹ වනයෙහි වසන සේකැයි ධානඤ්ජානි බැමිණිය ඇසීය. එකල්හි ධානඤ්ජානි බැමිණිය සඞ්ගාරව මානවකයා යම්තැනකද, එතැනට පැමිණියේය. පැමිණ සඞ්ගාරව මානවකයාට මෙසේ කීය.

"යහපත් මුහුණක් ඇති දරුව, ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මණ්ඩල කප්ප ගමට පැමිණ මණ්ඩල කප්ප ගමෙහි තොදෙය්‍ය බ්‍රාහ්මණයාගේ අඹ වනයෙහි වාසය කරන සේක. යහපත් මුහුණක් ඇති දරුව, ඊට දැන් නුඹ කල් දනුවයි" කීය.

4. "එසේය, පින්වතියයි" සඞ්ගාරව තරුණයා ධානඤ්ජානි බැමිනියට පිළිතුරු දී භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු වියයුතුවූත්, සිහිකටවූත් කථාවකොට නිමවා එක් පසෙක උන්නේය. එක් පසෙක උන්නාවූ සඞ්ගාරව මානවකයා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

"භවත් ගෞතමයන් වහන්ස, මේ ආත්මයෙහිම දැනීමේ කෙළවරට පැමිණ නිවන් පැමිණියාහුයයි, බ්‍රහ්මචර්යාවේ, ආදි කර්තෘවරයෝයයි කියන ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ සිටිත්.

"භවත් ගෞතමයන් වහන්ස, ඒ මේ ආත්මයෙහි දැනීමේ කෙළවරට ගොස් නිවන් පැමිණියාහුයයි, බ්‍රහ්මචර්යාවේ, ආදි කර්තෘවරයෝයයි කියන ඔවුන් අතුරෙන් භවත් ගෞතමයන් වහන්සේ කවරෙක්ද?" "භාරද්වාජය, මම වනාහි මේ ආත්මයෙහි දැනීමේ කෙළවරට ගොස් නිවන් පැමිණියාහුයයි බ්‍රහ්මචර්යාවේ ආදී කර්තෘවරයෝයයි කියන ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේද වෙනස කියමි. භාරද්වාජය, අසන්නාවූ සමහර මහණ බමුණෝ වෙති. ඔවුහු ඇසීමෙන් ඉහාත්මයෙහි දැනීමේ කෙළවරට ගොස් නිවන්

පැමිණියාහුයයි බ්‍රහ්මචර්යාවේ ආදී කර්තෘවරයෝයයි ප්‍රකාශ කරත්. ඔව්හු නම් ත්‍රිවිද්‍යා දත් බ්‍රාහ්මණයන් වැනි වූවෝය.

"භාරද්වාජය, තනිකර ඇදහීමෙන් පමණක් මේ ආත්මයෙහි දැනීමේ කෙළවරට ගොස් නිවන් පැමිණියාහුයයි බ්‍රහ්මචර්යාවේ ආදි කර්තෘවරයෝයයි ප්‍රකාශ කරන ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත්. එනම් තර්කයෙන් විමසීමෙන් දැන ගන්නාවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝය. භාරද්වාජය, පෙර නොඅසනලද ධර්මයන් තමන්ම ප්‍රත්‍යක්ෂ කොට දැන මේ ආත්මයෙහි දැනීමේ කෙළවරට ගොස් නිවන් පැමිණියාහුයයි, භාරද්වාජය, බ්‍රහ්මචර්යාවේ ආදි කර්තෘවරයෝ යයි ප්‍රකාශ කරන්නාවූ, ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඇත්තාහ.

"භාරද්වාජය, පෙර නොඇසූ ධර්මයන් තමන්ම ප්‍රත්‍යක්ෂ කොට දැන ගනී. කෙළවරට ගොස් නිවන් පැමිණියාහුයයි බ්‍රහ්මචර්යාවේ ආදී කර්තෘවරයෝයයි ප්‍රකාශ කරන යම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත්ද, මම ඔවුන් අතුරෙන් කෙනෙක් වෙමි.

"භාරද්වාජය, යම් ආකාරයකින් පෙර නොඇසූ ධර්මයන් තමන්ම ප්‍රත්‍යක්ෂව දැන මේ ආත්මයෙහි දැනීමේ කෙළවරට ගොස් නිවන් පැමිණියාහුයයි බ්‍රහ්මචරියාවේ ආදි කර්තෘවරයෝයයි කියත්ද, මම ඔවුන් අතුරෙන් කෙනෙක් වෙම්ද, භාරද්වාජය, ඒ කාරණය මේ ආකාරයෙන් දැනගත යුතුය.

5. "භාරද්වාජය, බුද්ධත්වයට පළමුමෙන්ම බුදුනොවූ බෝසත්වූම මට මෙබඳු අදහසක් විය. ගිහිගෙයි විසීම අවහිර සහිතය, කෙලෙස් රජස් උපදින මාර්ගයයි. මහණකම අවකාශය මෙන් නිදහස්ය. ගිහිගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් පිරිසිදුවූ සියලු ආකාරයෙන් සම්පූර්ණවූ ලියවන ලද සකක් බඳුවූ මේ බ්‍රහ්මචර්යාවෙහි හැසිරීම පහසු නොවෙයි. මම හිසකේ දැළි රැවුලු කපා හැර, කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වන්නෙම් නම් ඉතා යෙහෙකැයි (කියාය). භාරද්වාජය, ඒ මම එයින් ටික කලකට පසු තරුණ වයස් ඇත්තේම, කළුවූ හිසකෙස් ඇත්තේම, පළමුවෙනි වයසෙහි යහපත් තරුණභාවයෙන් යුක්තවූයේම නොකැමතිවූ මවුපියන් අඬත්දී,

හිසකෙස් දැළිරැවුල් කපාහැර කසා වත් හැඳ ගෙන ගිහිගෙන් නික්ම අනගාරිකව පැවිදිවීමි.

**6.** "මෙසේ පැවිදිවූ මම කුසල් කුමක්දැයි සොයන්නේ නිරුත්තර උතුම් නිර්වාණය සොයන්නේ, ආළාරකාලාම නම් තවුස්තෙම යම් තැනක්හිද එතැනට ගියෙමි. ගොස්, ආළාරකාලාම තාපසයාට මෙසේ කීවෙමි.

"ඇවැත්නි, කාලාමයෙනි, තොපගේ මේ ශාසනයෙහි බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්ට මම කැමැත්තෙමි"යි (කීවෙමි) භාරද්වාජය, මම මෙසේ කී කල්හි ආළාරකාලාම තෙම මට මෙය කීවේය. 'යම් තැනක නුවණ ඇත්තාවූ පුරුෂයෙක් නොබෝ කලකින් තමන්ගේ ආචාර්යයන්ගේ ධර්මය තමාම නුවණින් දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කරන්නේද, මේ ධර්මයද එබඳුය. එහෙයින් ආයුෂ්මත්තෙම වාසය කෙරේවා' (කියායි.)

"භාරද්වාජය, ඒ මම ටික කලකින් වහාම ඔවුන්ගේ ඒ ධර්මය අසාම ඉගෙන ගත්තෙමි. භාරද්වාජය, ඒ මම (කියන්ට) තොල පෙරලු පමණින් (ඔහු) කියනදේ නැවත කී පමණින් මෙබඳු ස්වල්ප කාලයකින් ඥාණවාදයද, (දනිමියයි කීමද) කියමි. ථෙරවාදයද (එහි ස්ථිරයයි කීමද) දනිමියිද, දකිමියිද පිළිගනිමි. මා පමණක් නොව අන්‍යයෝද (මා ගැන) එසේ කියති. භාරද්වාජය, ඒ මට මේ සිත විය. 'ආළාරකාලාම තෙම මේ ධර්මය ඇදහීම් පමණකින් තමාම උසස් නුවණින් අවබොධ කොට ඊට පැමිණ වාසය කරමියි' නොකියයි.

'ආළාරකාලාම තෙම මේ ධර්මය දැන දැක වාසය කරයි' (කියායි). භාරද්වාජය, ඉන්පසු මම ආළාරකාලාම යම් තැනකද එහි ගියෙමි. ගොස් ආළාරකාලාමහට මෙසේ කීවෙමි. 'ඇවැත්නි, කාලාමයෙනි, කොපමණකින් මේ ධර්මය තමාම දැන අවබොධ කොට ඊට පැමිණ ප්‍රකාශ කෙරේදැ'යි (කියායි.)

"භාරද්වාජය, මෙසේ කී කල්හි ආළාරකාලාම තෙම ආකිඤ්චඤ්ඤායතනය කෙළවරකොට ඇති සමාපත්තිය

දැක්වූයේය. භාරද්වාජය, ඒමට මේ සිත විය. 'ආළාරකාලාමහට පමණක් ශ්‍රද්ධාව ඇත්තේ නොවෙයි. මටද ශ්‍රද්ධාව ඇත. ආළාරකාලාමහට පමණක් වීර්යය ඇත්තේ නොවෙයි, මටද වීර්යය ඇත. ආළාරකාලාමහට පමණක් සිහිය ඇත්තේ නොවෙයි. මටද සිහිය ඇත, ආළාරකාලාමහට පමණක් සමාධිය ඇත්තේ නොවෙයි, මටද සමාධිය ඇත, ආළාරකාලාමහට පමණක් ප්‍රඥාව ඇත්තේ නොවෙයි, මටද ප්‍රඥාව ඇත. යම් හේතුවකින් ආළාරකාලාම තෙම යම් ධර්මයක් තමාම නුවණින් දැන ඊට පැමිණ වාසය කරමියි, කියයි නම් ඒ ධර්මය අත්කර ගැණීම පිණිස මම උත්සාහ කරන්නෙම් නම් හොඳය' (කියායි.)

7. "භාරද්වාජය, ඒ මම ටික කලකින් වහාම ඒ ධර්මය තමාම නුවණින් දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කෙළෙමි භාරද්වාජය, ඉන්පසු මම ආළාරකාලාම තෙම යම් තැනකද, එතැනට ගියෙමි. ගොස්, ඇවැත්නි, කාලාමයෙනි, ඒ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ ප්‍රකාශ කරන්නේ මෙපමණකින්දැ'යි (ඇසීමි) 'ඇවැත්නි, මේ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ ප්‍රකාශ කරන්නෙම් මෙපමණකින්ය'යි (ආළාරකාලාම තෙම) කීය. 'ඇවැත්නි, මමද මෙපමණකින් මේ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ වාසය කරමියි (කීවෙමි) 'ඇවැත්නි, යම් බඳුවූ අපි ආයුෂ්මත්වූ ඔබ වැනිවූ සමාන බ්‍රහ්මචර්යා ඇත්තෙකු දකින්නෙමුද, ඒ අපට ලාභයකි. උතුම් ලාභයකි. මෙසේ මම යම් ධර්මයක් දැන අවබොධකොට ඊට පැමිණ ප්‍රකාශ කරම්ද, ඔබ ඒ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ වාසය කරන්නෙහිය. ඔබ යම් යම් ධර්මයක් දැන අවබොධකොට ඊට පැමිණ වාසය කරන්නෙහිද, මමද ඒ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ ප්‍රකාශ කරන්නෙමි. මෙසේ මම යම් ධර්මයක් දන්නෙම්ද ඔබද ඒ ධර්මය දන්නෙහිය, යම් හේතුවකින් ඔබ යම් ධර්මයක් දන්නේද, මමද ඒ ධර්මය දන්නෙමි, මෙසේ මම යම් බඳුද ඔබත් එබඳුය. ඔබ යම් බඳුද මාත් එබඳුය. ඇවැත්නි, එනු මැනව, දෙදෙනම එක්ව මේ පිරිස පාලනය කරමු'යි (කීවේය) භාරද්වාජය, මෙසේ

මාගේ ආචාර්යවූම ආළාරකාලාම තෙම අතවැසි (ශිෂ්‍ය) වූ ඔහු හා සම සම ස්ථානයෙහි තැබීය. උත්තමවූ පූජාවෙන් මා පිදුවේය.

"භාරද්වාජය, ඒ මට මෙසේ සිතුනේය. මේ (තාපස) ධර්මය සසර කලකිරීම පිණිස නොපවතියි. සසර නො ඇල්ම පිණිස නො පවතියි. කෙලෙස් නැති කිරීම පිණිස නොපවතියි (දත යුතු ධර්මයන්) දැනීම පිණිස නොපවතියි. (චතුරාර්ය සත්‍යය) අවබොධය පිණිස නොපවතියි. නිර්වාණය පිණිස නොපවතියි. ආකිඤ්චාඤ්ඤායතන බ්‍රහ්මලොකයෙහි ඉපදීම පිණිස පමණක් පවතියි. භාරද්වාජය, ඒ මම ඒ ධර්මය ප්‍රමාණ නොවේයයි සිතා ඒ ධර්මයෙහි කලකිරී ඉවත්ව ගියෙමි.

8. "භාරද්වාජය, ඒ මම කුසල් කුමක්දැයි සොයන්නේ, නිරුත්තරවූ උතුම් නිර්වාණය සොයන්නේ උද්දකරාම පුත්ත තෙම යම් තැනකද එතැනට පැමිණියෙමි. පැමිණ, උද්දකරාමපුත්තහට මෙසේ කීවෙමි. 'ඇවැත්නි, රාමයෙනි, මේ ධර්ම විනයෙහි බ්‍රහ්මචර්යාව රකින්ට මම කැමැත්තෙමි (කීවෙමි.) භාරද්වාජය, මෙසේ කී කල්හි උද්දකරාම පුත්ත තෙම මට මෙසේ කීවේය. "යම් තැනක නුවණ ඇත්තාවූ පුරුෂයෙක් නොබෝ කලකින් තමන්ගේ ආචාර්යයන්ගේ ධර්මය තමාම නුවණින් දැන අවබොධකොට ඊට පැමිණ වාසය කරන්නේද මේ ධර්මය එබඳුය. එහෙයින් ආයුෂ්මත්තෙම වාසය කෙරේවා"(කියායි)

9. 'භාරද්වාජය, ඒ මම ටික කලකින් වහාම ඔවුන්ගේ ඒ ධර්මය ඉගෙනගත්තෙමි. භාරද්වාජය, ඒ මම කීමට තොල සෙලවූ පමණින්, වචනයක් කී පමණින් දනිමි යන වචනයද, දැනීම ස්ථිරය යන වචනයද ප්‍රකාශ කරමි. මම දනිමි, දකිමියයි කියමි. මා පමණක් නොව අන්‍යයෝද (මා ගැන) එසේ කියති. භාරද්වාජය, ඒ මට මේ සිත විය. උද්දකරාමපුත්ත තෙම මේ ධර්මය ඇදහීම් පමණකින් තමාම උසස් නුවණින් දැන අවබොධකොට ඊට පැමිණ වාසයකරමියි නොකියයි. උද්දකරාම පුත්ත තෙම මේ ධර්මය දැන, දැක වාසය කළේයයි (මට කල්පනා විය.) භාරද්වාජය, ඉන්පසු මම උද්දකාරාමපුත්ත යම්තැනකද, එතැනට ගියෙමි. ගොස් උද්දකාරාම පුත්තහට

මෙසේ කීවෙමි. 'ඇවැත්නි, රාමයෙනි, කොපමණකින් මේ ධර්මය තමාම දැන අවබොධ කොට ඊට පැමිණ ප්‍රකාශ කෙරෙදැයි, (කියායි.)

"භාරද්වාජය, මෙසේ කී කල්හි උද්දකරාමපුත්ත නෙවසඤ්ඤානාසඤ්ඤායතනය, කෙළවර කොට ඇති සමාපත්තිය දැන්වූයේය. භාරද්වාජය, ඒ මට මේ සිත විය. රාමහට පමණක් ශ්‍රද්ධාව ඇත්තේ නොවෙයි. මටද ශ්‍රද්ධාව ඇත. රාමහට පමණක් වීර්යය ඇත්තේ නොවෙයි. මටද වීර්යය ඇත. රාමහට පමණක් සිහිය ඇත්තේ නොවෙයි. මටද සිහිය ඇත. රාමහට පමණක් සමාධිය ඇත්තේ නොවෙයි. මටද සමාධිය ඇත. රාමහට පමණක් ප්‍රඥාව ඇත්තේ නොවෙයි. මටද ප්‍රඥාව ඇත. යම් හේතුවකින් රාමපුත්ත තෙම යම් ධර්මයක් තමාම නුවණින් දැන ඊට පැමිණ වාසය කරමියි කියයිනම් ඒ ධර්මය තමන්ම ප්‍රත්‍යක්ෂ කර ගැණීම පිණිස වීර්යය කරන්නෙම් නම් යහපත්ය, (කියායි.)

"භාරද්වාජය, ඒ මම ටික කලකින් වහාම ඒ ධර්මය තමාම නුවණින් දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කෙළෙමි. භාරද්වාජය, ඉන් පසු මම උද්දකරාමපුත්ත යම් තැනකද එතැනට ගියෙමි. ගොස්, උද්දකරාමපුත්තහට මෙසේ කීවෙමි.

'ඇවැත්නි, රාමයෙනි, මේ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ ප්‍රකාශ කරන්නේ මෙපමණකින්දැ"යි ඇසීමි. 'ඇවැත්නි, මේ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ ප්‍රකාශ කරන්නෙමි මෙපමණකින්ය'යි (උද්දකරාමතෙම) කීය. ඇවැත්නි, මමද මෙපමණකින් මේ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ වාසය කරමි"යි (කීවෙමි)

"ඇවැත්නි, යම්බඳුවූ අපි ආයුෂ්මත්වූ ඔබ වැනිවූ සමාන බ්‍රහ්මචරියා ඇත්තෙකු දකින්නෙමුද, ඒ අපට ලාභයකි. මහත් ලාභයකි. මෙසේ මම යම් ධර්මයක් දැන අවබොධ කොට ඊට පැමිණ ප්‍රකාශ කරම්ද, ඔබ ඒ ධර්මය නුවණින් දැන අවබොධකොට ඊට පැමිණ වාසය කරන්නෙහිය. ඔබ යම්

ධර්මයක් දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කරන්නෙහිද, මමද ඒ ධර්මය දැන අවබොධ කොට ඊට පැමිණ ප්‍රකාශ කරන්නෙමි. මෙසේ මම යම් ධර්මයක් දන්නේද, ඔබද ඒ ධර්මය දන්නෙහිය. ඔබ යම් ධර්මය දන්නේද, මමද ඒ ධර්මය දන්නෙමි. මෙසේ මම යම්බඳු ද ඔබත් එබඳුය. ඔබ මේ බඳුද මමත් එබඳුය. ඇවැත්නි, එව දෙදෙනම එක්ව මේ පිරිස පාලනය කරමුයි, (කීවේය). භාරද්වාජය, මෙසේ මාගේ ආචාර්යවූම උද්දකරාමපුත්ත තෙම අතවැසි (ශිෂ්‍ය) වූ මා ඔහු හා සම සම ස්ථානයෙහි තැබිය. උතුම්වූ පූජාවෙන් මට පිදුවේය.

10. "භාරද්වාජය, ඒ මට මෙසේ සිතුනේය. මේ (තාපස) ධර්මය සසර කලකිරීම පිණිස නොපවතී. සසර නොඇල්ම පිණිස නොපවති. කෙලෙස් නැතිකිරීම පිණිස නොපවතී. (දතයුතුධර්මයන්) දැනීම පිණිස නොපවතී. (චතුරාර්ය සත්‍යය) අවබොධය පිණිස නොපවතී. නිර්වාණය පිණිස නොපවතී. යම්තාක් නෙවසඤ්ඤානාසඤ්ඤායතන බ්‍රහ්ම ලොකයෙහි ඉපදීම පිණිස පමණක් පවතියි. භාරද්වාජය, ඒ මම ඒ ධර්මය ප්‍රමාණ නොකොට කලකිරී ඒ ධර්මයෙන් ඉවත්ව ගියෙමි.

11. "භාරද්වාජය, ඒ මම කුසල් කුමක්දැයි සොයමින් නිරුත්තරවූ නිර්වාණය සොයමින් මගධ ජනපදයෙහි පිළිවෙලින් ගමන් කරන්නේ. උරුවෙල් දනව්වෙහි සේනානී නම් නියම්ගම යම් තැනකද, එහි පැමිණියෙමී. එහි සුදුවැලි තලා ඇත්තාවූද, යහපත් තොටවල් ඇත්තාවූද, ගලායන ගඟ ඇත්තාවූද, අවට ගොදුරු ගම් ඇත්තාවූද, ප්‍රසාදය ඇති කරන්නාවූද, සිත් සතුටු කරන්නාවූද වනලැහැබක් ඇති බිම් පෙදෙසක් දුටිමි. භාරද්වාජය, ඒ මට මේ සිත පහළවිය. ඒකාන්තයෙන් භූමි ප්‍රදෙශය සිත් අලවන්නේය. වනලැහැබ සතුට උපදවන්නේය, සුදු වැලිතලා ඇති හොඳ තොටුපලවල් ඇති ගංගාවද සිත් අලවන්නීය. හාත්පස ගොදුරු ගමද වෙයි. වීර්යය කරන කුලපුත්‍රයෙකුට වීර්යය කිරීමට මෙය ඒකාන්තයෙන් සුදුසුයි. භාරද්වාජය, ඒ මම මේ ස්ථානය වීර්යය කිරීමට සුදුසුයයි සිතා වීර්යය වැඩීම පිණිස එහිම උන්නෙමි.

"භාරද්වාජය, මට ආශ්චර්යවූ, පෙර නොඇසූ විරූ උපමා තුනක් වැටහුනාහුය, භාරද්වාජය, යම්සේ කිරි සහිතවූ අමු දියේ දමනලද තෙත්වූ (දිඹුල්) ලී කැබැල්ලක් වේද, ඉක්බිති පුරුෂයෙක් තෙම ගිනිගානා දණ්ඩක් ගෙන ගිනි නිපදවන්නෙමියි, ගින්දර ඇතිකරන්නෙමියි, කියා එන්නේය. භාරද්වාජය, ඒ පුරුෂතෙම ජලයෙහි බහාලනලද ඒ කිරි සහිත අමු (දිඹුල්) ලී කැබෙල්ල ගිනි ගානා දණ්ඩෙන් මැදීමෙන් ගිනි නිපදවන්නේද? ගිනි පහළ කරන්නේද?" "භවත් ගෞතමයෙනි, එය සිදු නොවන්නේය. ඊට හේතු කවරේද යත් :- භවත් ගෞතමයෙනි, දිඹුල් ලී කඩ වනාහි අමුය, කිරි සහිතය, එපමණක් නොව ජලයෙහිද බහාලන ලද්දේය. (එහෙයිනි) (ඒ ලීයෙන් ගිනි උපදවනු කැමැති) ඒ පුරුෂ තෙම ක්ලාන්තයටද, වෙහෙසටද පැමිණීම පමණක් සිදු වන්නේය". "භාරද්වාජය, එපරිද්දෙන්ම යම්කිසි ශ්‍රමණයෝ හෝ කයින් වස්තු කාමයන්ගෙන් වෙන්ව වාසය නොකරත්ද, කාම වස්තු කෙරෙහි ඔවුන්ගේ යම්කිසි ඇල්මක් වේද, කාම ආසාවක් වේද, කාම මූර්ඡාවක් වේද, කාම පිපාසයක් වේද, කාම දැවිල්ලක් වේද, ඒ ක්ලේශ කාමය තමා තුල මනාව නැති නොවූයේ වේද, මනාව මැඩපවත්වන ලද්දේ නොවේද, ඒ පින්වත් මහණ බමුණෝ උපක්‍රමයෙන් හටගත්තාවූ, දුක්වූ, තියුණුවූ, කටුකවූ වේදනාවන් විඳිත්. ඔවුහු ආර්ය මාර්ගඥාන දර්ශනයටද, නිරුත්තරවූ අවබොධයටද නුසුදුස්සෝමය. භාරද්වාජය, ආශ්චර්යවූ පෙර නොඇසුවිරූ මේ පළමුවන උපමාව මට වැටහුණි.

**12.** 'භාරද්වාජය, ආශ්චර්යවූ පෙර නොඇසූවිරූ අන්‍යවූ දෙවෙනි උපමාවක්ද මට වැටහිණි. භාරද්වාජය යම්සේ කිරි සහිතවූ අමු (දිඹුල්) ලීයක් දියෙන් ඈත්කොට ගොඩබිමෙහි බහා තබන ලද්දේ වේද, ඉක්බිති පුරුෂයෙක් තෙම ගිනිගානා දණ්ඩ ගෙන ගිනි නිපදවන්නෙමි. ගින්න පහළ කරන්නෙමියි, කියා එන්නේය. භාරද්වාජය, ඒ පුරුෂතෙම කිරි සහිතවූ, දියෙන් ගෙන ගොඩ තබන ලද්දාවූ, ඒ අමු ලීය ගිනි ගානා දණ්ඩෙන් මැදීමෙන් ගිනි උපදවන්නේද? ගින්දර පහළ කරන්නේද?"

"භවත් ගෞතමයෙනි, එය සිදුනොවන්නේය. ඊට හේතු කවරේද යත්:- භවත් ගෞතමයෙනි, ඒ ලී කඩ ජලයෙන් බැහැර කර ගොඩබිමෙහි දමා තිබුණත් කිරි සහිතය (අමුය) එහෙයිනි. ඒ පුරුෂයා ක්ලාන්තයටද, වෙහෙසටද පත්වීම පමණක් නම් සිදුවන්නේය". භාරද්වාජය, එපරිද්දෙන්ම යම්කිසි ශ්‍රමණයෝ හෝ කයින් කාමයන්ගෙන් වෙන්ව වාසය කරත්ද, (එහෙත්) කාම වස්තු කෙරෙහි ඔවුන්ගේ ඇල්මක් වේද, කාම ආශාවක් වේද, කාම මූර්ඡාවක් වේද, කාම පිපාසයක් වේද, කාම දැවිල්ලක් වේද, එය අභ්‍යන්තරයෙහි මනාව නැති නොවූයේ වේද, මනාව මැඩ නොපවත්වන ලද්දේ වේද, ඒ පින්වත් මහණ බමුණෝ උපක්‍රමයෙන් හටගත්තාවූ, දුක්වූ තියුණුවූ, කටුකවූ වේදනාවන් විඳිත්. ඔවුහු ආර්යඥාන දර්ශනයටද, නිරුත්තර අවබොධයටද නුසුදුස්සෝමය.

ඒ පින්වත් මහණ බමුණෝ උපක්‍රමයෙන් හටගත්තාවූ, දුක්වූ, තියුණුව, කටුකවූ වෙදනාවන් ඉදින් නොවිඳින්නා හූද, ඥානදර්ශනය ලැබීමටද, නිරුත්තරවූ අවබොධයටද නුසුදුස්සෝමය. භාරද්වාජය, මේ වනාහි මට වැටහුනු පුදුමවූ, පෙර නොඇසුවාවූ දෙවෙනි උපමාවය.

13. "භාරද්වාජය, පුදුමවූ පෙර නොඇසුවාවූ තුන් වෙනිවූ අන්‍ය උපමාවක්ද මට වැටහුනේය. භාරද්වාජය, වියලුනාවූ, කිරි සිඳුනාවූ, දියෙන් ඈත්කොට ගොඩබිමෙහි තබනලද වියලි දරලීයක් වේද, එකල්හි පුරුෂයෙක් ගිනිගානා දණ්ඩ ගෙන ගිනි උපදවන්නෙමි. ගින්න ඇති කරන්නෙමියි එන්නේය. භාරද්වාජය, ඒ පුරුෂතෙම වියලුනාවූ, කිරි සිඳුනාවූ, දියෙන් ඈත්කොට ගොඩ තබන ලද ඒ ලීය ඒ ගිනි ගානා දණ්ඩ ගෙන මැදීමෙන් ගිනි උපදවන්නේද? ගින්න ඇති කරන්නේද?" "භවත් ගෞතමයෙනි, එසේය ඊට හේතු කවරේද? භවත් ගෞතමයෙනි, ඒ ලීය වියලුනේ වෙයි, කිරි සිඳුනේ වෙයි. දියෙන් ගෙන ගොඩ තබන ලද්දේත් වෙයි". භාරද්වාජය, එපරිද්දෙන්ම යම් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ කයින් කාමයන්ගෙන් වෙන්ව වාසය කරත්ද, ඔවුන්ගේ කාම වස්තූන් කෙරෙහි යම් ඇල්මක් වෙද, කාම ආසාවක්වේද කාම මූර්ඡාවක් වේද, කාම

දැවිල්ලක් වේද, ඒ කාම ආසාව අධ්‍යාත්මයෙහි (ඇතුලත) හොඳින් ප්‍රහීන වූයේ වෙද, හොඳින් මැඩ පැවතියේද, ඒ පින්වත් මහණ බමුණෝ උපක්‍රමයෙන් හටගත්තාවූ, තියුණුවූ, කටුකවූ, වේදනාවන් නොවිඳිත්. ඔවුහු මාර්ගඥානදර්ශනය පිණිස, නිරුත්තරවූ අවබොධය පිණිස සුදුස්සෝමැයි.

"භාරද්වාජය, ආශ්චර්යවූ පෙර නොඇසූ විරූ මේ උපමා තුන මට වැටහුනාහුය.

14. භාරද්වාජය, එ මට මේ සිත පහළ විය. යම් හෙයකින් මම යටි දත් පෙළෙහි උඩු දත් පෙළ තදකරගෙන (දත් මිටි කාගෙන,) දිව උඩුතල්ලෙහි තදකරගෙන, කුසල් සිතින් අකුසල් සිත යටපත් කරන්නෙම් නම්, පෙළෙන්නෙම් නම් යෙහෙක (කියායි.) භාරද්වාජය, ඒ මම දත් මිටි කාගෙන දිව උඩුතල්ලෙහි තදකරගෙන, කුසල් සිතින් අකුසල් සිත යටපත් කරමි, පෙළමි, තවමි. භාරද්වාජය, දත්මිටි කාගෙන, දිව උඩුතල්ලෙහි තද කරගෙන, කුසල් සිතින් අකුසල් සිත යටපත් කරන්නාවූ, පෙළන්නාවූ, තවන්නාවූ ඒ මාගේ කිහිලිවලින් ඩාදිය වැගිරෙන්නේය.

"භාරද්වාජය, යම්සේ බලවත් පුරුෂයෙක්තෙම වඩා දුර්වල පුරුෂයෙකු හිසින් හෝ අල්වාගෙන. බෙල්ලෙන් හෝ අල්වාගෙන තදකරන්නේද, පෙළන්නේද, තවන්නේද, භාරද්වාජය, එපරිද්දෙන්ම දත් මිටිකාගෙන, දිව උඩු තල්ලෙහි තදකරගෙන කුසල් සිතින් අකුසල් සිත යටපත් කරන්නාවූ, පෙළන්නාවූ, තවන්නාවූ, ඒ මාගේ කිහිලිවලින් ඩාදිය වැගිරෙයි.

භාරද්වාජය, මා විසින් නොහැකුළුණු වීර්යය පටන් ගන්නා ලද්දේය. සිහිය එළඹ සිටියාය. එහෙයින්ම නුමුළා විය. ප්‍රධාන වීර්යයෙන්ම මඬන ලද්දාවූ මාගේ ශරීරය දාහ සහිත විය. නොසන්සිඳුනේ විය. භාරද්වාජය, මට උපන්නාවූ මෙබඳුවූද, දුක් වේදනාව කුසල් සිත විනාශ නොකරයි.

15. "භාරද්වාජය, ඒ මට මේ සිත පහළ විය. යම් හෙයකින් මම ආශ්වාස කිරීම් රහිත ධ්‍යානය වඩන්නෙම් නම් යෙහෙක

(කියාය.) භාරද්වාජය, ඒ මම කටින්ද, නාසයෙන්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූයෙමි. භාරද්වාජය, කටින්ද, නාසයෙන්ද ආශ්වාස වැළැක්වූ කල්හි කන් සිදුරුවලින් පිටවන වාතයෙහි අධික ශබ්දය ඇතිවෙයි. මයිනහමක් පිඹින කල්හි යම්සේ අධික ශබ්දයක් ඇතිවේද, එපරිද්දෙන්ම භාරද්වාජය, මාගේ මුඛයෙන්ද, නාසයෙන්ද, ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි කන් සිදුර වලින් පිටවන වාතයෙහි අධික ශබ්දය ඇතිවෙයි.

'භාරද්වාජය, මා විසින් නොහැකුළුණු වීර්යය පටන් ගන්නා ලදී. සිහිය එළඹ සිටියාය. (එහෙයින්ම) මුළා නොවීය. ප්‍රධාන වීර්යයෙන් වීර්යය වඩන්නාවූ මාගේ ශරීරය දාහ සහිත වෙයි. නොසන්සිඳුනේ වෙයි. භාරද්වාජය, මට උපන්නාවූ මෙබඳුවූද, දුක් වේදනාව කුසල් සිත විනාශ නොකරයි.

**16.** භාරද්වාජය, ඒ මට මෙසේ කල්පනා විය. යම් හෙයකින් මම ආශ්වාස රහිත ධ්‍යානයම වඩන්නෙම් නම් යෙහෙක (කියායි) භාරද්වාජය, ඒ මම මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූයෙමි. භාරද්වාජය, මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද, ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි අධික වාතය හිස්මුදුන පලන්නාක් මෙන් වෙයි. භාරද්වාජය යම්සේ බලවත් පුරුෂයෙක් තියුණු කඩුවකින් හිස් මුදුන විදින්නේද, එපරිද්දෙන්ම භාරද්වාජය, මගේ මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ, කල්හි අධික වාතය හිස් මුදුන පලන්නාසේ වෙයි.

"භාරද්වාජය, මා විසින් නොහැකුළුණු වීර්යය පටන් ගන්නා ලද්දේමය, සිහිය එළඹ සිටියාය. (එහෙයින්ම) මුළාව නොවීය. ප්‍රධාන වීර්යයෙන් වීර්යය වඩන්නාවූ මාගේ ශරීරය දාහ සහිත විය. නොසංසිඳුනේ වෙයි. භාරද්වාජය, මට උපන්නාවූ මෙබඳුවූද, දුක් වේදනාව කුසල් සිත විනාශ නොකරයි.

**17.** "භාරද්වාජය, ඒ මට මෙසේ කල්පනා විය. 'යම් හෙයකින් මම ආශ්වාස රහිත ධ්‍යානයම වඩන්නෙම් නම් යෙහෙක' (කියායි.) භාරද්වාජය, ඒ මම මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද

ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූයෙමි. භාරද්වාජය, මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද, ආශ්වාස ප්‍රාශ්වාස වැළැක්වූ කල්හි හිසෙහි අධික වේදනාව ඇති වෙයි. භාරද්වාජය, යම් සේ බලවත් පුරුෂයෙක් දැඩි වරපට බැම්මකින් හිස වෙළයිද, එපරිද්දෙන්ම භාරද්වාජය, මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද, ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි මගේ හිසෙහි වේදනාව ඇතිවෙයි".

"භාරද්වාජය, මා විසින් නොහැකුළුණු වීර්යය පටන් ගන්නා ලද්දේමය, සිහිය එළඹ සිටියාය. (එහෙයින්ම) මුළාව නොවීය. ප්‍රධාන වීර්යයෙන් වීර්ය වඩන්නාවූ මාගේ ශරීරය දාහ සහිත විය. නොසංසිඳුනේ වෙයි. භාරද්වාජය, මට උපන්නාවූ මෙබඳුවූද දුක් වේදනාව කුසල් සිත විනාශ නොකරයි.

18. "භාරද්වාජය, ඒ මට මෙසේ කල්පනා විය. යම් හෙයකින් මම ආශ්වාස ප්‍රශ්වාස රහිත ධ්‍යානය වඩන්නෙම් නම් යෙහෙක' (කියායි.) භාරද්වාජය, ඒ මම මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද, ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූයෙමි. භාරද්වාජය, මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද, ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි අධිකවූ වාතයෝ කුස සිඳිත්.

"භාරද්වාජය, දක්ෂවූ ගවයන් මරන්නෙක් හෝ ගවයන් මරන්නෙකුගේ අතවැසියෙක් හෝ ගෙරින් කපන තියුණු ආයුධයකින් බඩ කපන්නේ යම්සේද, එපරිද්දෙන්ම මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි අධික වාතය උදරය කපන්නාසේ වෙයි.

"භාරද්වාජය, මා විසින් නොහැකුළුණු වීර්යය පටන් ගන්නා ලද්දේමය, සිහිය එළඹ සිටියාය. (එහෙයින්ම) මුළාව නොවිය. ප්‍රධාන වීර්යයෙන් වීර්ය කරන්නාවූ මාගේ ශරීරය දාහ සහිත වෙයි. නොසංසිඳුනේ වෙයි. භාරද්වාජය, මට උපන්නාවූ මෙබඳුවූද දුක් වේදනාව කුසල් සිත විනාස නොකරයි.

19. භාරද්වාජය, ඒ මට මෙසේ කල්පනා විය. ආශ්වාස රහිතවූ ධ්‍යානය වඩන්නෙම් නම් යෙහෙක' (කියායි.) භාරද්වාජය, ඒ මම මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද, ආශ්වාස ප්‍රශ්වාස

වැළැක්වූයෙමි. භාරද්වාජය, මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළක්වූ කල්හි ශරීරයෙහි අධික දැවිල්ලක් වෙයි. භාරද්වාජය, යම්සේ බලවත් පුරුෂයෝ දෙදෙනෙක් දුර්වල පුරුෂයෙකු අත්දෙකෙන් අල්ලා ගෙන අඟුරු වළකට අල්ලා තවන්නාහුද, අතිශයින් තවන්නාහුද, භාරද්වාජය, එපරිද්දෙන්ම මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි මගේ ශරීරයේ අධික දැවිල්ලක් වෙයි.

"භාරද්වාජය, මා විසින් වීර්යය පටන්ගන්නා ලද්දේමය. සිහිය එළඹ සිටියාය. (එහෙයින්ම) මුළාව නොවීය. ප්‍රධාන වීර්යයෙන් වීර්යකරන්නාවූ මාගේ ශරීරය දාහ සහිත වීර්යයෙන්ම විඩා සහිත වෙයි. නොසංසිඳුනේ වෙයි. භාරද්වාජය, මට උපන්නාවූ මෙබඳුවූද දුක් වෙදනාව කුසල් සිත විනාශ නොකරයි.

"එකල්හි දේවතාවෝ මා දැක මෙසේ කීහ. 'ශ්‍රමණ ගෞතම තෙම කළුරිය කළේය' (කියායි). අතැම් දේවතා කෙනෙක් මෙසේ කීහ. 'ශ්‍රමණ ගෞතමතෙම කළුරිය නොකෙළේය. එහෙත් කළුරිය කරන්නේය' (කියායි) ඇතැම් දේවතා කෙනෙක් 'ශ්‍රමණ ගෞතම තෙම කලුරිය කළේත් නොවේ. කලුරිය කරන්නේත් නොවෙයි. ශ්‍රමණ ගෞතම තෙම රහත්ය. රහතුන්ගේ වාසය කිරීමකැ'යි (කීහ.)

**20.** "භාරද්වාජය, ඒ මට මෙසේ කල්පනාවිය. යම් හෙයකින් මම මුළුමනින් ආහාර නොවැළඳීම පිණිස පිළිපදින්නෙම් නම් ඉතා යෙහෙක' (කියායි.) භාරද්වාජය, එවිට දේවතාවෝ මා වෙත පැමිණ මෙසේ කීහ. 'නිදුකාණෙනි, ඔබ මුළුමනින් ආහාර නොගෙන සිටින්නට නොසිතුව මැනවි. යම් හෙයකින් ඔබ මුළුමනින් ආහාර නොගෙන සිටිය හොත් අපි ඔබගේ ලෝම සිදුරුවලින් දිව්‍ය ඕජස් ශරීරගත කරන්නෙමු. ඔබ එයින් යැපෙන්නෙහිය.' භාරද්වාජය ඒ මට මෙසේ කල්පනා විය. 'මම වනාහි මුළුමනින් නිරාහාරව සිටීමට සිතින් එකඟ වුනෙමි. එහෙත් මේ දේවතාවෝ මාගේ ලොම් සිදුරුවලින් දිව්‍ය ඕජස ගිල්වන්නාහු නම් එයින් මම යැපෙන්නෙමි. එය මාගේ මුසාවක් වන්නේය'. (කියායි.) භාරද්වාජය, ඒ මම ඒ දෙවියන් වැළැක්වූයෙමි. වුවමනා නැතැයි කීයෙමි.

"භාරද්වාජය, ඒ මට මේ සිත පහළ විය. 'යම් හෙයකින් මම පතක් පතක් පමණවූ මුංතැම්බූ දිය හෝ කොල්ලු තැම්බූ දිය හෝ කඩල තැම්බූ දිය හෝ කලතණ තැම්බූ දිය හෝ ඉතා ස්වල්පවූ ආහාරයක් වළඳන්නෙම් නම් යෙහෙකි' (කියායි.)

"භාරද්වාජය, ඒ මම පතක් පමණවූ, මුංතැම්බූ දිය හෝ කොල්ලු තැම්බූ දිය හෝ කඩල තැම්බූ දිය හෝ කලතණ තැම්බූ දිය හෝ ඉතා ස්වල්ප වශයෙන් ආහාරය වැළඳුවෙමි. භාරද්වාජය, ඒ මම පතක් පතක් පමණවූ මුං තැම්බූ දිය හෝ කොල්ලු තැම්බූ දිය හෝ කඩල තැම්බූ දිය හෝ කලතණ තැම්බූ දිය හෝ ඉතා ස්වල්ප වශයෙන් ආහාර ගන්නාවූ ඒ මාගේ ශරීරය ඉතා කෙට්ටු බවට පැමිණියේ වෙයි. අසූ වසක් ගිය වැලක පුරුක් හෝ කලුවැල් නම් වැලක පුරුක් හෝ යම්සේද මාගේ අඟපසඟ ඒ නිරාහාර භාවය නිසාම එබඳුවිය. ඔටු පියවර යම්සේ මැද ගැඹුරුවේද, එපරිද්දෙන්ම ඒ නිරාහාර භාවයෙන් මාගේ නිසීදනමාංසය (තට්ටම) මැදින් ගැඹුරු විය. රැහැනක ඇවුණු දැව වැටිය යම්සේ අතරතුර උස් මිටි වේද, එපරිද්දෙන් ඒ නිරාහාර භාවයෙන් මාගේ කොඳු ඇටය උස් මිටිවෙයි. යම්සේ දිරූ ශාලාවක පරාල උඩු යටි වශයෙන් නැමුනාහු වෙද්ද, එපරිද්දෙන් මාගේ ඉළඇට උඩුයටි වශයෙන් නැමුනාහු වෙත්. ගැඹුරුවූ ළිඳෙක දියයට පෙණෙන තරු ගැඹුරට ගියාහු යට බැස්සාහු දක්නා ලැබෙත්ද, එපරිද්දෙන්ම ඒ ස්වල්ප ආහාරය නිසා මාගේ ඇස්වල නෙත් තරු වල ගැඹුරට ගියාහු යට බැස්සාහු දක්නා ලැබෙත්. යම්සේ නම් තිත්ත ලබු ගෙඩියක් අමුවෙන් කපන ලද්දේ අව්සුළඟින් හැකුලුනේද, මැලවුනේද එපරිද්දෙන්ම ඒ ස්වල්ප ආහාරය නිසා මාගේ හිසේ සම හැකුලුණේ මැලවුනේ වෙයි.

"භාරද්වාජය, ඒ මම බඩේ සම අතගාන්නෙමියි පිටකටුවම අතගාන්නෙමි. පිට කටුව අල්වමියි බඩේ සම අල්ලමි. භාරද්වාජය, ඒ ස්වල්ප ආහාරය නිසා එපමණට මාගේ බඩේ සම කොඳු ඇටයෙහි ඇලුනේ වෙයි. ඒ මම වර්චස් හෝ මුත්‍ර හෝ කරන්නෙමියි, හුන්නේ ඒ ස්වල්ප ආහාරය නිසාම එහිම යටිකුරුව වැටෙමි. මම මේ ශරීරය අස්වසමියි අතින් ශරීරාවයව

පිරිමදිමි. භාරද්වාජය, එසේ ශරීරයේ අවයව අත ගානවිට, ඒ ස්වල්ප ආහාරය නිසාම මුල්කුණුවූ ලොම් ශරීරයෙන් වැටෙත්.

"භාරද්වාජය, සමහර මිනිස්සු මා දැක මෙසේ කීවාහුය. 'ශ්‍රමණ ගෞතමතෙම කලුය.' ඇතැම් මිනිස්සු මෙසේ කීවාහුය. 'ශ්‍රමණ ගෞතමතෙම කලු නොවෙයි පලාවන් පාටය.' ඇතැම් මනුෂ්‍යයෝ මෙසේ කීවාහුය. 'ශ්‍රමණ ගෞතමතෙම කලුත් නොවෙයි, පලාවන් පාටත් නොවෙයි, ශ්‍රමණ ගෞතමතෙම රන් වන් සිවි ඇත්තේයි.' භාරද්වාජය, මෙසේ කීමට තරමටම මාගේ පිරිසිදුවූ හාත්පසින් බබලන්නාවූ ශරීරවර්ණය ඒ නිරාහාරභාවය නිසාම නැසුනේ වෙයි.

**21.** "භාරද්වාජය, ඒ මට මෙසේ සිතුනේය. අතීත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ උපක්‍රමයෙන් උපන්නාවූ, දුක්වූ, තියුණුවූ, කටුකවූ වේදනා වින්දාහු නම් ඒ මේ තරම්ම වෙයි. මීට වඩා වැඩි නොවෙයි අනාගත කාලයෙහි යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ උපක්‍රමයෙන් උපන්නාවූ, දුක්වූ තියුණුවූ, කටුකවූ වේදනා විඳින්නාහු නම් ඒ මේ තරම්ම වෙයි. මීට වඩා වැඩි නොවෙයි. මේ වර්තමාන කාලයෙහි යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ උපක්‍රමයෙන් උපන්නාවූ දුක්වූ, තියුණුවූ වේදනාවන් විඳිත් නම් ඒ මේ තරම්ම වෙයි. මීට වඩා වැඩි නොවෙයි. මම වනාහි මේ කටුකවූ, දුෂ්කර ක්‍රියාවෙන් මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්යභාවය ඇති කිරීමට සමර්ථවූ ඥානදර්ශන විශෙෂයක් නොලබමි. මාර්ගාවබොධය පිණිස අන්‍ය මාර්ගයෙක් ඇත්තේදැයි (කල්පනා විය)

**22.** "භාරද්වාජය, ඒ මට මේ අදහස විය. 'මම පියවූ ශුද්ධොදන ශාක්‍ය රාජයාගේ වප්මගුල් දිනයෙහි සිහිල්වූ දඹ රුක් සෙවනෙහි හුන්නේ කාමයන් ගෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කළබව දනිමි. ඒ මාර්ගය මාර්ග ඥාන අවබොධය පිණිස වන්නේයි' (අදහස් විය.) භාරද්වාජය, ඒ මට අවබොධය

පිණිස මේ මාර්ගයමයැයි සිහිය අනුව පැවති විඥ්ඥාණය පහළවිය. භාරද්වාජය, ඒ මට මේ අදහස විය. 'කාමයන්ගෙන් වෙන්වූ අකුසල ධර්මයන්ගෙන් වෙන්වූ යම් ඒ සැපයක්වේද, මම ඒ සැපයට භය වෙම්ද' (කියාය.) භාරද්වාජය ඒ මම මේ කල්පනාව ඇතිවිය. කාමයන්ගෙන් වෙන්වූ අකුසල ධර්මයන්ගෙන් වෙන්වූ යම් ඒ සැපයක්වේද, මම ඒ සැපයට භය නොවෙමියි' (කියාය). භාරද්වාජය, ඒ මම මේ කල්පනාව ඇති විය. 'මෙතරම් දුර්වලවූ ශරීරයකින් යුක්තව ඒ (ප්‍රථමධ්‍යාන) සැපය ලබන්නට බැරිය. යම්හෙයකින් මම බත් හා කොම පිඩු ආදි ඖදාරික ආහාරයක් ගන්නෙම්නම් හොඳය' (කියාය.)

"භාරද්වාජය, ඒ මම බත්, කොමපිඩුයැයි කියන ඔළාරික ආහාරයක් ගත්තෙමි. භාරද්වාජය, ඒ කාලයෙහි 'ශ්‍රමණ ගෞතමතෙම යම් ලොවුතුරා දහමක් ලැබුයේ නම් එය අපට කියන්නේය' යන අදහසින් භික්ෂූන් පස් දෙනෙක් මට උපස්ථාන කරමින් සිටියහ. භාරද්වාජය, යම් කලක පටන් මම බත් හා කොමපිඩු ආහාර ගන්නට වූයෙම්ද, එකල්හි ඒ භික්ෂූහු ශ්‍රමණ ගෞතමතෙම ප්‍රත්‍යය බහුලකොට ඇත්තේය. රසයෙහි ගිජුව ප්‍රණීත පිණ්ඩපාතාදිය වැළඳීමට හැරුණේය. වීර්යය කිරීමෙන් පිරුහුණේයැ'යි කියා කලකිරී බැහැර ගියාහුය.

"භාරද්වාජය, ඒ මම ඕලාරික ආහාරගෙන ශරීර ශක්තිය ලැබ කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීති සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි. භාරද්වාජය, උපන්නාවූ, මෙබඳුවූද, සැප වේදනාව මගේ කුසල් සිත විනාශ නොකරයි.

23. "විතක්ක විචාර සංසිඳීමෙන් අභ්‍යන්තර පැහැදීම ඇති හිතේ එකග බව ඇති, විතර්ක රහිතවූ, විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීති සැපය ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි. භාරද්වාජය, උපන්නාවූ මෙබඳුවූද සැප වේදනාවද මගේ කුසල්සිත විනාශ නොකරයි. මැඩගෙන නොසිටියි. ප්‍රීතිය ඉක්මවීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කෙළෙමි. සිහියෙන් හා මනා නුවණින් යුක්තවූයේ කයින්ද සැපය වින්දෙමි. යමක්

උපෙක්ෂා ඇත්තේ සිහියෙන් යුක්තවූයේ, සැප විහරණ ඇත්තේයැයි ආර්යයෝ කියත්ද, ඒ තුන්වැනි ධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි. භාරද්වාජය, උපන්නාවූ මෙබඳුවූ සැප වේදනාවද, මෙගේ කුසල් හිත විනාශ නොකරයි. සැපය නැති කිරීමෙන්, දුක නැති කිරීමෙන් කල් ඇතිවම සොම්නස් දොම්නස් දෙක අතුරුදන් කිරීමෙන්, දුක් නැත්තාවූ, සැප නැත්තාවූ, උපෙක්ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදු බව ඇති සතරවැනි ධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි. භාරද්වාජය, උපන්නාවූ මෙබඳුවූ සැප වේදනාවද මෙගේ කුසල් හිත විනාශ නොකරයි.

**24.** "ඒ මම මෙසේ හිත සමාධියෙන් එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි (පිරිසිදු හෙයින්ම) දීප්තිමත්වූ කල්හි අඞ්ගන (රාගාදී කෙලෙස්) රහිතවූ කල්හි, පහවූ උවදුරු ඇති කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, සිත ස්ථිරවූ කල්හි පෙර ජාති දැනීමේ ඤාණය පිණිස සිත නැමූයෙමි. ඒ මම නොයෙක් ආකාරවූ පූර්වෙනිවාසය (පෙර උපන් ජාති,) සිහි කරමි. එනම් එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දශයක්ද, ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාතිසතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත (විනාශවන) කල්පයන්ද, නොයෙක් විවර්ත (හැදෙන) කල්පයන්ද, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද, අසුවල් තැන උපන්නෙමි. එහිදී මේ නම් ඇත්තේ වීමි, මෙබඳු ගොත්‍ර ඇත්තේ වීමි. මෙබඳු වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තේ වීමි. මෙබඳු දුක් සැප වින්දෙමි. ඒ මම එයින් චුතව අසුවල් තැන උපන්නෙමි. එතැන්හිද මෙසේ නම් ඇත්තේ වීමි. මෙබඳු ගොත්‍ර ඇත්තේ වීමි. මෙබඳු ශරීර වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තේ වීමි. මෙබඳු සැප දුක් වින්දේ වීමි. මෙබඳු ආයුෂ ඇත්තේ වීමි. ඒ මම එතැනින් චුතව මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිතවූ දැක්වීම් සහිතවූ, නොයෙක් ආකාරවූ, පෙර විසූ කඳ පිළිවෙළ සිහිකරමි.

"භාරද්වාජය, මා විසින් රාත්‍රියේ පළමුවෙනි යාමයෙහි මේ පළමුවන විද්‍යාව (පෙර විසූ තැන් දන්නා නුවණ) ලබන ලදී. (එය වසන) අවිද්‍යාව නසන ලදී. විද්‍යාව උපන්නීය. අඳුර

(මොහය) නසන ලද්දේය. ආලෝකය උපන්නේය. අප්‍රමාදව කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව වාසය කරන්නෙකුට යම්සේ සිදුවිය යුතු නම් එසේ විය. භාරද්වාජය, උපන්නාවූ මෙබඳුවූ සැප වේදනාවද මගේ කුසල් හිත විනාශ නොකරයි.

**25.** "ඒ මම මෙසේ (හිත සාමාධියෙන්) එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, (පිරිසිදු හෙයින්) දීප්තිමත්වූ කල්හි, අඞ්ගණ (රාගාදී කෙලෙස්) රහිතවූ කල්හි, කෙලෙස් පහව ගිය කල්හි, සිත මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, සත්ත්වයන්ගේ චුති උත්පත්ති දෙක දැකීම පිණිස සිත නැමීමි. ඒ මම පිරිසිදුවූ, මිනිස් බව ඉක්මවා සිටි දිව ඇසින්, චුත වන්නාවූද, උපදින්නාවූ ද, ලාමකවූ ද, ප්‍රණීතවූ ද, මනා වර්ණ ඇත්තාවූ ද, මනා වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද, කර්මය පරිදි මිය ගියාවූ, සත්වයන් දකිමි.

"ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්ත වුවාහු, වාක් දුශ්චරිතයෙන් යුක්ත වුවාහු, මනො දුශ්චරිතයෙන් යුක්ත වූවාහු, ආර්යයන්ට දොස් කීවාහු මිථ්‍යාදෘෂ්ටි ගත්තාහු, මිථ්‍යාදෘෂ්ටි ක්‍රියා අනුමත කළාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරු ගති ඇති, යටිකුරුව වැටෙන, නරකයෙහි උපන්නාහුයයිද, මේ පින්වත් සත්වයෝ වනාහි කාය සුචරිතයෙන් යුක්ත වූවාහු, වාක් සුචරිතයෙන් යුක්තවූවාහු, මනො සුචරිතයෙන් යුක්ත වූවාහු, ආර්යයන්ට මෙසේ නොකීවාහු සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු සම්‍යක්දෘෂ්ටි කර්ම සමාදන් වූවාහුය (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු ස්වර්ග ලොකයෙහි උපන්නාහුයයි මෙසේ පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවා සිටි දිවැසින්, චුත වන්නාවූද, උපදින්නාවූද, ලාමකවූද, ප්‍රණීතවූද, මනා වර්ණ ඇත්තාවූද, මනා වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද, කර්මය පරිදි මිය ගියාවූ සත්වයන් දනිමි.

"භාරද්වාජය, මා විසින් රාත්‍රියෙහි මැද යාමයෙහි මේ දෙවන විද්‍යාව (චුතවීම්, ඉපදීම්, දක්නා නුවණ) ලබනලදී. (එය වසන) අවිද්‍යාව නසන ලදී. විද්‍යාව උපන්නීය. අඳුර (මොහය) නසන

ලද්දේය. ආලොකය උපන්නේය. අප්‍රමාදව කෙලෙස් තවන වීර්‍යයෙන් යුක්තව වාසය කරන්නෙකුට යම්සේ සිදුවිය යුතු නම් එසේ විය. භාරද්වාජය, උපන්නාවූ මෙබඳුවූද සැප වේදනාව මගේ කුසල් සිත විනාශ නොකරයි.

**26.** "ඒ මම මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, කෙලෙස් පහව ගිය කල්හි, සිත මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, ආශ්‍රව ක්ෂයකර ඥානය (කෙලෙස් නැති කරන නුවණ) පිණිස සිත නැමුයෙමි. ඒ මම, මෙය දුකය'යි තතුසේ දත්තෙමි. මේ දුක් ඉපදීමට හේතුවය'යි තතුසේ දත්තෙමි. 'මේ දුක නැති කිරීමේ මාර්ග'යයි. තතුසේ දත්තෙමි. මේ දුක නැති කිරීම තතුසේ දත්තෙමි. 'මොහු ආශ්‍රවයෝය'යි තතුසේ දැනගතිමි. 'මේ ආශ්‍රවයන්ගේ හටගැන්මය'යි තතුසේ දැනගතිමි. 'මේ 'ආශ්‍රවයන්ගේ නැතිකිරීමය'යයි තතුසේ දැනගතිමි. 'මේ ආශ්‍රවයන් නැතිකිරීමේ මාර්ගය'යි තතුසේ දැන ගතිමි. මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ඒ මාගේ සිත කාමාශ්‍රවයන්ගෙන් මිදුනේය. භවාශ්‍රවයන් ගෙන්ද මිදුනේය. අවිද්‍යාශ්‍රවයන්ගෙන්ද මිදුනේය. මිදුන කල්හි මිදුනේයයි දැනීම පහළවිය. උත්පත්තිය කෙළවර විය. මාර්ග බ්‍රහ්මචර්‍යාව වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී. කළයුතු අනිකක් නැත්තේයයි දැනගතිමි.

**27.** "භාරද්වාජය, රාත්‍රියෙහි අන්තිම යාමයෙහි මේ තුන්වෙනිවිද්‍යාව (ආශ්‍රවක්ෂයකරඥාන නම්වූ අර්හත් මාර්ගය) මා විසින් ලබනලදී. (එය වසන) අවිද්‍යාව නසනලදි. විද්‍යාව උපන්නේය. අප්‍රමාදව, කෙලෙස් තවන වීර්‍යයෙන් යුක්තව වාසය කරන්නෙකුට යම්සේ සිදුවිය යුතු නම් එසේ විය".

**28.** "මෙසේ කීකල්හි සඞ්ගාරව මානවකතෙමේ භාග්‍යවතුන් වහන්සේට "අර්හත් සම්‍යක්සම්බුදු කෙනෙකුගේ වීර්‍ය යම්සේද භවත් ගෞතමයන් වහන්සේගේ වීර්‍ය එසේ නොනවත්වා වීර්‍යයක් විය. භවත් ගෞතමයන් වහන්සේගේ වීර්‍ය උත්තම පුරුෂයන්ගේ වීර්‍යයක් වීයයි" කීය.

**29.** "භවත් ගෞතමයන් වහන්ස, දෙවියෝ ඇත්තාහුද? භාරද්වාජය, මා විසින් දෙවියන් ඇද්දැයි කාරණයන්ට අනුව දැනගන්නා ලදී".

"භවත් ගෞතමයන් වහන්ස, දෙවියන් නැද්දැයි අසන ලද්දේ, 'භාරද්වාජය, මා විසින් දෙවියන් ඇද්දැයි කාරණයන්ට අනුව දැනගන්නා ලදැයි කීයෙහිය'. භවත් ගෞතමයන් වහන්ස, මෙසේ ඇති කල්හි ඒ කීම හිස්වූ බොරු කථාවක් නො වන්නේ ද?"

"භාරද්වාජය, දෙවියෝ ඇද්දැයි අසන ලද්දේ, දෙවියෝ ඇතැයි යමෙක් කියන්නේ ද දෙවියෝ ඇතැයි කාරණයන්ට අනුව මා විසින් දැනගන්නා ලදැයි යමෙක් කියන්නේ ද, එකල්හි නුවණැති පුරුෂයා විසින් දෙවියෝ ඇතැයි ඒකාන්තයෙන් විනිශ්චයට පැමිණිය යුතුයි". 'භවත් ගෞතමයන් වහන්සේ පළමුකොටම මට එසේ නොකීයේ මන්ද?" "භාරද්වාජය, දෙවියෝ ඇත යනු ලොකයෙහි ඉතා ප්‍රකට වශයෙන් සම්මතව පවත්නා දෙයකියි වදාළේය". මෙසේ වදාළ කල්හි සංගාරව මානවක තෙමේ භාග්‍යවතුන් වහන්සේට භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපති, භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේද, වැසූ දෙයක් වැසුම් අරින්නේ ද, මං මුළා වූවෙකුට මාර්ගය කියන්නේ ද, ඇස් ඇත්තෝ රූපයන් දකිත්වායි අඳුරෙහි තෙල් පහනක් හෝ දරන්නේ ද, එපරිද්දෙන් භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය ප්‍රකාශ කරන ලදී. මම භවත් ගෞතමයන් ද ධර්මය ද සඞ්ඝයා ද සරණ යමි. භවත් ගෞතමයන් වහන්සේ අද පටන් මා දිවිහිම්ව සරණගිය උපාසකයකු කොට දරණසේක්වා"

දසවැනිවූ සඞ්ගාරව සූත්‍රය නිමි. (5 - 10)

(බ්‍රහ්මායු සූත්‍රය, සේල සූත්‍රය, අස්සලායන සූත්‍රය, ඝෝටමුඛ සූත්‍රය, චංකි සූත්‍රය, එසුකාරි සූත්‍රය, ධානඤ්ජානි සූත්‍රය, සුභ සූත්‍රය, සඞ්ගාර සූත්‍රය යන සූත්‍ර දසයවූ)

**පස්වැනිවූ බ්‍රහ්මණ වර්ගයයි**

---

# උපරි පණ්ණාසය.

## 1. දේවදහ සූත්‍රය.

1. **මා** විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයන්හි දෙවදහ නම් ශාක්‍ය රජුන්ගේ නියම් ගමෙහි වාසය කරති. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට 'මහණෙනියි' කථාකළහ. 'පින්වතුන් වහන්සැයි' ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය. "මහණෙනි, මේ පුරුෂ පුද්ගලතෙම සැපක් හෝ දුකක් හෝ දුක් සැප දෙකින් තොරවූවක් හෝ යම් කිසිවෙක් විඳියිද, ඒ සියල්ල පෙරකළ කර්ම හේතුවෙන්ම විඳින්නාහුය. මෙසේ පුරාණවූ කර්මයන් තපසින් කෙළවර වීමෙන්ද, අළුත්වූ කර්මයන් නොකිරීමෙන්ද, මත්තෙහි නැවත නොඉපදීමවේ. මත්තෙහි නොඉපදී මෙන් කර්මයන්ගේ නැසීමවේ. කර්මනැසීමෙන් දුක් නැසීමවේ.

2. "දුක් නැසීමෙන් වේදනා නැසීමවේ. වේදනා නැසීමෙන් සියළු දුක් දිරා යන්නේය, යන මෙබඳු වාද ඇත්තාවූ මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ, සමහර මහණ බමුණෙක් ඇත්තාහ. මහණෙනි, නිගණ්ඨයෝ මෙබඳු වාද ඇත්තාහුය. මහණෙනි, මම මෙබඳු වාද ඇති නිගණ්ඨයන් වෙත පැමිණ මෙසේ කියමි. 'ඇවැත් නිගණ්ඨයිනි, තෙපි මේ පුරුෂ පුද්ගලතෙම යම්කිසි සැපක් හෝ දුකක් හෝ, දුක් සැප දෙකින් තොරවූවක් හෝ විඳියිද,ඒ සියල්ල පෙරකළ කර්මහේතුවෙන්ම විඳින්නේය. මෙසේ පැරණි කර්මයන් තපසින් කෙළවර කිරීමෙන්ද, අළුත්වූ කර්මයන් නොකිරීමෙන්ද, මත්තෙහි කර්ම හට නොගන්නේය. මත්තෙහි කර්ම නොහට ගැණීමෙන් කර්මයන්ගේ නැසීමවේ. කර්ම නැසීමෙන් දුක් නැසීමවේ. දුක් නැසීමෙන් වේදනා නැසීමවේ. වේදනා නැසීමෙන් සියළු දුක දිරා යන්නේය, යන මෙබඳු වාද ඇත්තාහුය. මෙබඳු දෘෂ්ටි ඇත්තාහුය යනු සැබෑදැයි අසමි.

මහණෙනි, ඉදින් මා විසින් මෙසේ අසන ලද්දාවූ ඒ නිගණ්ඨයෝ 'එසේයයි ප්‍රකාශ කෙරෙත්ද' මම ඔවුන්ගෙන් ඇවැත් නිගණ්ඨයිනි, කිමෙක්ද, තෙපි 'අපි, පෙර වූවාහුමයයි දනිව්ද, නොවූවාහුමයයි දනිව්දැයි' අසමි. 'ඇවැත්නි, එය නොදනිමුයයි' කියත්. 'ඇවැත් නිගණ්ඨයිනි කිමෙක්ද තෙපි පෙර අපි පාපකර්ම කෙළෙමුයයි දනිව්ද? නොකෙළෙමුයයි දනිව්දැයි, අසමි. 'ඇවැත්නි එය නොදනිමුයයි' කියත් 'ඇවැත් නිගණ්ඨයිනි, කිමෙක්ද? තෙපි මෙබඳුවූ හෝ, මෙබඳුවූ හෝ පාපකර්ම කෙළෙමුයි දනිව්ද?' 'ඇවැත්නි, එය නොදනිමුයයි' කියත්. 'ඇවැත් නිගණ්ඨයිනි, කිමෙක්ද? තෙපි මෙපමණවූ දුක් දිරවන ලද්දේය. මෙපමණවූ දුක් දිරවිය යුතුය. මෙපමණවූ දුක් දිරවූ කල්හි සියලු දුක් දිරවන ලද්දේ වන්නේයයි දනිව්ද?' 'ඇවැත්නි, එය නොදනිමුයි' කියත්. 'ඇවැත් නිගණ්ඨයිනි, කිමෙක්ද? තෙපි මේ ආත්මයෙහිම අකුශල ධර්මයන්ගේ දුරු කිරීමත් කුශල ධර්මයන්ගේ වැඩීමත් දනිව්දැයි, අසමි. 'ඇවැත්නි එය නොදනිමුයි' කියත්.

3. "ඇවැත් නිගණ්ඨයිනි, මෙසේ වනාහි, තෙපි පෙර අපිවීමු යයිද නොදන්නාහුය. නොවීමුයයි නොදන්නාහුය. පෙර අපි පාපකර්මය කෙළෙමුයයිද නොදන්නහුය. නොකෙළෙමුයයිද නොදන්නාහුය. මෙබඳුවූ මෙබඳුවූ පාපකර්ම කෙළෙමුයයිද නොදන්නාහුය. මෙපමණවූ දුක් දිරවන ලද්දේය. මෙපමණවූ දුක් දිරවිය යුතුය. මෙපමණවූ දුක් දිරවූ කල්හි සියලු දුක් දිරවන ලද්දේ වන්නේයයිද නොදන්නාහුය. මේ ආත්මයෙහිම අකුශල ධර්මයන්ගේ දුරු කිරීමත් කුසල ධර්මයන්ගේ වැඩීමත් නොදන්නාහුය. මෙසේ ඇති කල්හි ආයුෂ්මත් නිගණ්ඨයන්ට මේ පුරුෂ පුද්ගලතෙම යම්කිසි සැපක් හෝ, දුකක් හෝ, දුක් නොවූ සැප නොවූවක් හෝ, විඳීයිද, ඒ සියල්ල පෙරකළ කර්ම හේතුවෙන්ම විඳින්නේය. පැරණිවූ කර්මයන් තපසින් කෙළවර කිරීමෙන් අලුත්වූ කර්මයන් නොකිරීමෙන් මත්තෙහි කර්ම හට නොගැණීමවේ. මත්තෙහි හටනොගැණීමෙන් කර්මයන්ගේ නැසීමවේ. කර්මයන්ගේ නැසීමෙන් දුක් නැසීමවේ. දුක්

නැසීමෙන් වේදනා නැසීමවේ. වේදනා නැසීමෙන් සියලු දුක් දිරායාම වන්නේ යයි ප්‍රකාශ කිරීමට සුදුසු නොවන්නේය.

4. "ආයුෂ්මත් නිගණ්ඨයිනි, ඉදින් තෙපි පෙර අපි වීමුයයි දන්නාහුද, නොවීමුයයි දන්නාහුද, පෙර අපි පාපකර්ම කෙළෙමුයයි දන්නාහුද, නොකෙළෙමුයයි දන්නාහුද, මෙබඳු මෙබඳුවූ පාපකර්ම කෙළෙමුයයි දන්නාහුද, මෙපමණවූ දුක් දිරවන ලද්දේය. මෙපමණවූ දුක් දිරවිය යුතුය. මෙපමණවූ දුක් දිරවූ කල්හි සියලු දුක් දිරවන ලද්දේ වන්නේයයි දන්නාහුද මේ ආත්මයෙහිම අකුසල ධර්මයන්ගේ දුරු කිරීමත් කුසල ධර්මයන්ගේ වැඩීමත් දන්නාහුද, මෙසේ ඇති කල්හි ආයුෂ්මත් නිගණ්ඨයන්ට මේ පුරුෂ පුද්ගලතෙම යම් කිසි සැපයක් හෝ දුකක් හෝ, දුක්නොවූ සැප නොවූවක් හෝ විඳියිද, ඒ සියල්ල පෙරකළ කර්ම හේතුවෙන්ම විඳිත්. මෙසේ පැරණිවූ කර්මයන් තපසින් කෙළවර කිරීමෙන්, අලුත්වූ කර්මයන් නොකිරීමෙන්, මත්තෙහි කර්ම නොහට ගැණීමවේ. මත්තෙහි කර්ම නොහට ගැණීමෙන් කර්මයන්ගේ නැසීමවේ. කර්මයන්ගේ නැසීමෙන් දුක් නැසීමවේ. දුක් නැසීමෙන් වේදනා නැසීම් වේ. වේදනා නැසීමෙන් සියලු දුක් දිරායාම වන්නේය"යි ප්‍රකාශ කිරීමට සුදුසු වන්නේය'.

'ආයුෂ්මත් නිගණ්ඨයිනි, යම්සේ පුරුෂයෙක් තෙම දැඩි කොට විස පොවනලද විෂ සහිතවූ හුලකින් විදින ලද්දේ වන්නේද හෙතෙම ඒ හුල ඇනීමේ වේදනාව හේතුකොටගෙණ දුක්වූ තියුණුවූ කටුකවූ වේදනාව විඳින්නේය. ඔහුගේ අසල් වැස්සෝද, නෑ සහ ලේනෑයෝද ශල්‍යකර්ම කරන්නාවූ වෙදෙකු කැඳවන්නාහුය. ශල්‍යකර්ම කරණ ඒ වෙද තෙම ආයුධයකින් ඔහුගේ වණ මුඛය කපන්නේය. හෙතෙම ආයුධයකින් වණ මුඛය කැපීම හේතුකොට ගෙනද, දුක්වූ, තියුණුවූ, කටුකවූ, වේදනාව විඳින්නේය. ශල්‍ය වෙදතෙම සැත් කටුවකින් ඔහුගේ හුල සොයන්නේය. හෙතෙම සැත් කටුවෙන් හුල සෙවීම හේතුකොට ගෙනද, තියුණුවූ කටුකවූ වේදනාව විඳින්නේය. ශල්‍ය වෙදතෙම ඔහුගේ ඒ හුල ඇද දමන්නේය. හෙතෙම හුල

ඇද දැමීම හේතුකොටගෙනද, දුක්වූ තියුණුවූද කටුකවූ වේදනාව විඳින්නේය. ඒ ශල්‍ය වෙද තෙම ඔහුගේ වණ මුඛයෙහි බෙහෙත් සුණු දමන්නේය. හෙතෙම බෙහෙත් කුඩු වණ මුඛයෙහි දැමීම හේතුකොට ගෙනද දුක්වූ තියුණුවූ කටුකවූ වේදනාව විඳින්නේය. හෙතෙම මෑත කලෙක්හි නැංගාවූ යහපත් සිවිය ඇති වණයෙන් සුව ඇත්තේ තනිව හැසිරෙන්නේ තමාගේ වසඟයෙහි වූයේ කැමති තැනක යාහැකි වන්නේය. ඔහුට මෙබඳු සිතක් වන්නේය. මම වනාහි පෙර දැඩිකොට පොවනලද ඇති විෂ සහිතවූ හුලකින් විදින ලද්දෙක් වීමි. ඒ මම හුල ඇනීමෙන්වූ වේදනාව හේතුකොට දුක්වූ, තියුණුවූ කටුකවූ, වේදනාව වින්දෙමි. ඒ මට අසල් වැස්සෝද, නෑ සහ ලේනෑයෝද, ශල්‍යකර්ම කරන්නාවූ වෙදෙකු කැඳෙව්වාහුය. ශල්‍ය වෙදතෙම ආයුධයකින් ඒ මගේ වණ මුඛය කැපුවේය. ඒ මම ආයුධයෙන්ද වණ මුඛය කැපීම හේතුකොට දුක්වූ, තියුණුවූ, කටුකවූ, වේදනාව වින්දෙමි. ඒ ශල්‍ය වෙදතෙම සැත් කටුවෙන් ඒ මගේ හුල සෙව්වේය'.

'ඒ මම සැත් කටුවෙන් හුල සෙවීම හේතුකොට දුක්වූ තියුණුවූ, කටුකවූ, වේදනාව වින්දෙමි. ඒ ශල්‍ය වෙදතෙම ඒ මාගේ හුල ඇද දැම්මේය. ඒ මම හුල ඇදීම හේතුකොටද දුක්වූ, තියුණුවූ, කටුකවූ, වේදනාව වින්දෙමි. ඒ ශල්‍ය වෙදතෙම බෙහෙත් ඒ මාගේ වණ මුඛයෙහි බෙහෙත් සුණු ගැල්වූයේය. ඒ මම බෙහෙත් සුණු වණ මුඛයෙහි ගැල්වීම හේතුකොටද, දුක්වූ, තියුණුවූ, කටුකවූ වේදනාව වින්දෙමි. ඒ මම දැන් නැංගාවූ මනා සිවිය ඇති වණය ඇත්තේ, නිරෝගවූයේ, සුවපත්වූයේ, එකලාව හැසිරෙන්නේ තෙමේ තමහට වසඟවූයේ කැමති පරිදි යාහැක්කේ වෙමියි' කියායි.

'ඇවැත් නිගණ්ඨයිනි, එපරිද්දෙන්ම ඉදින් තෙපි පෙර අපි වීමුයි දන්නහු නම්, නොවීමුයි දන්නහු නම්, පෙර අපි පාපකර්ම කෙළෙමුයි දන්නහු නම්, නොකෙළෙමුයි දන්නහු නම් මෙබඳුවූ මෙබඳුවූ පාපකර්ම කෙළෙමුයි දන්නහු නම් මෙපමණ දුක් දිරා ගිය කල්හි සියලු දුක් දිරා ගියේ වන්නේයයි දන්නහු නම් මේ ආත්මයෙහිම අකුසලයන්ගේ දුරු කිරීමත් කුසලයන්ගේ වැඩීමත්

දන්නහු නම්, මෙසේ ඇති කල්හි ආයුෂ්මත් නිගණ්ඨයන්ට මේ පුරුෂ පුද්ගලතෙම යම්කිසි සැපක් හෝ දුකක් හෝ, දුක් නොවූ සැප නොවූවක් හෝ, විඳියිද ඒ සියල්ල පෙරකළ කර්ම හේතුවෙන්ම විඳින්නේය. මෙසේ පැරණිවූ කර්මයන් තපසින් කෙළවර වීමෙන් අලුත්වූ කර්මයන් නොකිරීමෙන් මත්තෙහි කර්ම නොහට ගැණීමවේ. මත්තෙහි කර්ම නොහට ගැනීමෙන් කර්ම නැසීමවේ. කර්ම නැසීමෙන් දුක් නැසීමවේ. දුක් නැසීමෙන් වේදනා නැසීම වේ. වේදනා නැසීමෙන් සියළු දුක් දිරායාම වන්නේයයි ප්‍රකාශ කිරීමට සුදුසු වන්නේය. ඇවැත් නිගණ්ඨයිනි, යම් හෙයකිනුත් තෙපි පෙර අපි වීමුයයි නොදන්නාහු නම් නොවීමුයයි නොදන්නහු නම්, පෙර අපි පාප කර්මය කෙළෙමු යයි නොදන්නාහු නම්, නොකෙළෙමුයයි නොදන්නාහු නම්, මෙබඳුවූ මෙබඳුවූ පාප කර්ම කෙළෙමුයි නොදන්නාහු නම්, මෙපමණ දුක් දිරා ගියේය. මෙපමණ දුක් දිරවිය යුතුය. මෙපමණ දුක් දිරා ගිය කල්හි සියලු දුක් දිරා ගියේ වන්නේ යයි නොදන්නාහු නම්, ඉහාත්මයෙහිම අකුසලයන්ගේ දුරු කිරීම කුසල ධර්මයන්ගේ වැඩීම නොදන්නාහු නම්, එසේ ඇති කල්හි ආයුෂ්මත් නිගණ්ඨයන්ට මේ පුරුෂ පුද්ගලතෙම යම්කිසි සැපක් හෝ දුකක් දුක් නොවූ සැප නොවූවක් හෝ විඳියිද, ඒ සියල්ල පෙරකළ කර්ම හේතුවෙන් විඳින්නේය. මෙසේ පැරණිවූ කර්මයන් තපසින් කෙළවර වීමෙන් අලුත්වූ කර්මයන් නොකිරීමෙන්, මත්තෙහි කර්ම නොහටගැනීමවේ. මත්තෙහි කර්ම නොහට ගැනීමෙන් කර්ම නැසිමවේ. කර්ම නැසීමෙන් දුක් නැසීමවේ. දුක් නැසීමෙන් වෙදනා නැසීම වේ. වේදනා නැසීමෙන් සියලු දුක් දිරායාම වන්නේයයි ප්‍රකාශ කිරීමට සුදුසු නොවන්නේය'.

**5.** "මහණෙනි, මෙසේ කී කල්හි ඒ නිගණ්ඨයෝ මට මෙසේ කීවාහුය. 'ඇවැත්නි, සර්වඥවූ සියල්ල දක්නාවූ නිගණ්ඨනාථ පුත්‍රතෙම සියල්ල දක්නා ඥානය ඇති බව ප්‍රකාශ කරයි යන්නාවූද, සිටින්නාවූද, නිදන්නාවූද, නිදි දුරුකරන්නාවූද, මට නිරන්තරයෙන් සියල්ල නුවණින් දැකීම එළඹ සිටියේය, කියායි.

හෙතෙම මෙසේ කීය. 'ඇවැත් නිගණ්ඨයිනි'. තොප විසින් පෙර කරණලද පාපකර්ම ඇත්තේමය. එය මේ කටුකවූ දුෂ්කර පැවැතුමෙන් දිරවව්. යම් හෙයකින් දැන්, කයින් සංවරවූවාහුද, වචනයෙන් සංවර වූවාහුද, සිතින් සංවර වූවාහුද, එය මත්තෙහි පාප කර්මයාගේ නොකිරීමවේ. මෙසේ පුරාණවූ කර්මයන් තපසින් කෙළවරවීමෙන් අලුත්වූ කර්මයන් නොකිරීමෙන් මත්තෙහි කර්ම නොහට ගැනීමවේ. මත්තෙහි කර්ම නොහට ගැනීමෙන් කර්මයන්ගේ නැසීමවේ. කර්ම නැසීමෙන් දුක් නැසීමවේ. දුක් නැසීමෙන් වේදනා නැසීමවේ. වේදනා නැසීමෙන් සියලු දුක් දිරායාම වන්නේය කියායි. එය වනාහි අපට රුචිදවේ. කැමතිදවේ. එයින්ද සතුටු සිත් ඇත්තෝවීමුය, යනුයි. මහණෙනි, මෙසේ කීකල්හි මම ඒ නිගණ්ඨයන්ට මෙසේ කීවෙමි. ඇවැත් නිගණ්ඨයිනි, මේ ආත්මයෙහිම දෙපරිද්දෙකින් විපාක ඇත්තාවූ, මේ ධර්ම පසක් වෙත්. කවර පසක්දයත්? අනුන්ගේ කීම් ඇදහීම, තමාගේ කැමැත්ත, ඇසීම ආකාර කල්පනා කිරිම, මෙසේමයයි නිශ්චය කිරීම යන මේ පසයි.

'ඇවැත් නිගණ්ඨයිනි, මේ ධර්ම පස මේ ආත්මයෙහිම දෙපරිද්දකින් විපාක ඇත්තාවූ, ධර්ම පස වෙත්. ඔවුන් අතුරෙන් ආයුෂ්මත් නිගණ්ඨයන්ගේ ශාස්තෘහු කෙරෙහි අතීතය පිළිබඳව ඇදහීම කුමක්ද? කැමැත්ත කුමක්ද? ඇසීම කුමක්ද? ආකාර කල්පනා කිරීම කුමක්ද? විනිශ්චය කුමක්දැයි අසමි'. මහණෙනි, මෙසේ කියන්නාවූ මම වනාහි නිගණ්ඨයන් කෙරෙහි කිසියම් කරුණු සහිතවූ උත්තර දීමක් නොදකිමි.

**6.** "මහණෙනි, නැවතද නිගණ්ඨයන්ට මම මෙසේ කියමි. නිගණ්ඨයිනි, ඒ කුමකැයි හඟිව්ද?' යම් කලෙක්හි තොපගේ දැඩිවූ උපක්‍රමයක් වේද? දැඩිවූ වීර්යයක් වේද? එකල්හි උපක්‍රමයෙන් හටගත්තාවූ, දැඩිවූ, දුක්වූ, තියුණුවූ කටුකවූ වේදනාවන් විඳින්නාහුද? යම් කලෙක වනාහි තොපගේ දෘඪවූ උපක්‍රමයෙක් නොවේද, දැඩිවූ වීර්යයක් නොවේද, එකල්හි උපක්‍රමයෙන් හටගත්තාවූ දැඩිවූ, දුක්වූ, තියුණුවූ, කටුකවූ වේදනාවන් නොවිඳින්නාහුද?

'ඇවැත්නි, යම් කලෙක්හි අපගේ දැඩිවූ උපක්‍රමයෙක් වේද, දැඩිවූ වීර්යයක් වේද, එකල්හි උපක්‍රමයෙන් හට ගත්තාවූ දැඩිවූ, දුක්වූ, තියුණුවූ, කටුකවූ වේදනාවන් විඳිමු. යම් කලෙක්හි වනාහී අපගේ දැඩිවූ උපක්‍රමයක් නොවේද, දැඩිවූ වීර්යයක් නොවේද, එකල්හි උපක්‍රමයෙන් හටගත්තාවූ දැඩිවූ දුක්වූ, තියුණුවූ, කටුකවූ, වේදනාවන් නොවිඳිමුයි' කීහ.

'ඇවැත් නිගණ්ඨයිනි, මෙසේ වනාහි යම් කලෙක්හි තොපගේ දැඩිවූ උපක්‍රමය වේද, දැඩිවූ වීර්යය වේද, එකල්හි දැඩිවූ උපක්‍රමයෙන් හටගත්තාවූ, දුක්වූ, තියුණුවූ, කටුකවූ වේදනාවන් විඳින්නාහුනම් යම් කලෙක්හි වනාහි තොපගේ දැඩිවූ උපක්‍රමයක් නොවේද, දැඩිවූ, වීර්යයක් නොවේද, එකල්හි දැඩිවූ උපක්‍රමයෙන් හටගත්තාවූ දුක්වූ තියුණුවූ කටුකවූ වේදනාවන් නොවිඳින්නහුනම් මෙසේ ඇතිකල්හි ආයුෂ්මත් නිගණ්ඨයන්ට මේ පුරුෂ පුද්ගලතෙම යම් කිසි සැපක් හෝ දුකක් දුක්නොවූ සැප නොවූවක් හෝ විඳියිද, ඒ සියල්ල පෙරකළ කර්ම හේතුවෙන් විඳින්නේය. මෙසේ පැරණිවූ කර්මයන් තපසින් කෙළවර වීමෙන් අළුත්වූ කර්මයන් නොකිරීමෙන් මත්තෙහි කර්ම නොහට ගැණීමවේ. මත්තෙහි කර්ම නොහට ගැණීමෙන් කර්මයන්ගේ නැසීම වේ. කර්ම නැසීමෙන් දුක් නැසීමවේ. දුක් නැසීමෙන් වේදනා නැසීමවේ. වේදනා නැසීමෙන් සියලු දුක් දිරවීම වන්නේයයි ප්‍රකාශ කිරීමට සුදුසු නොවන්නේය'.

'ආයුෂ්මත් නිගණ්ඨයිනි, ඉදින් යම් කලෙක තොපගේ දැඩිවූ උපක්‍රමයවේද, දැඩිවූ වීර්යය වේද, එකල්හි උපක්‍රමයෙන් හටගත්තාවූ දුක්වූ තියුණුවූ කටුකවූ වේදනාව නවතින්නේ නම් යම් කලෙක වනාහි තොපගේ දැඩිවූ උපක්‍රමය නොවේද දැඩිවූ වීර්යය නොවේද එකල්හි උපක්‍රමයෙන් හටගත්තාවූ දුක්වූ තියුණුවූ කටුකවූ වේදනාව නොනවතින්නේ නම් එසේ ඇතිකල්හි ආයුෂ්මත් නිගණ්ඨයන්ට මේ පුරුෂ පුද්ගලතෙම යම්කිසි සැපක් දුකක් දුක් නොවූ සැපනොවූවක් විඳියිද ඒ සියල්ල පෙරකළ කර්ම හෙතුවෙන්ම විඳින්නේය. මෙසේ පැරණිවූ කර්මයන් තපසින් කෙළවරවීමෙන් අලුත්වූ කර්මයන්

නොකිරීමෙන් මත්තෙහි නොහට ගැණීමවේ. මත්තෙහි නොහට ගැණීමෙන් කර්මයන්ගේ නැසීමවේ. කර්මයන් නැසීමෙන් දුක් නැසීමවේ. දුක් නැසීමෙන් වේදනා නැසීම වේ. වේදනා නැසීමෙන් සියලු දුක දිරවීම වන්නේයයි ප්‍රකාශ කිරීමට සුදුසු වන්නේය.

'ආයුෂ්මත්වූ නිගණ්ඨයිනි, යම් හෙයකිනුත් යම් කලෙක වනාහි තොපගේ දැඩිවූ උපක්‍රමය වේද දැඩිවූ වීර්යය වේද, එකල්හි දැඩිවූ උපක්‍රමයෙන් හටගත්තාවූ තියුණුවූ කටුකවූ වේදනා විඳින්නහුය. යම් කලෙක්හි වනාහි තොපගේ දැඩිවූ උපක්‍රමය නොවේද දැඩිවූ වීර්යය නොවේද එකල්හි දැඩිවූ උපක්‍රමයෙන් හටගත්තාවූ දුක්වූ තියුණුවූ කටුකවූ වේදනා නොවිඳින්නහුය. ඒ තෙපි තුමූම උපක්‍රමයෙන් හටගත්තාවූ දුක්වූ තියුණුවූ කටුකවූ ඒ වේදනාවන් විඳිනු ලබන්නාහු අවිද්‍යාවෙන් නොදැනීමෙන් මුලාවෙන් මේ පුරුෂ පුද්ගලතෙම යම්කිසි සැපක් හෝ දුකක් හෝ දුක්නොවූ සැප නොවූවක් හෝ විඳියිද ඒ සියල්ල පෙරකළ කර්ම හේතුවෙන් විඳින්නේය. මෙසේ පැරණිවූ කර්මයන් තපසින් කෙළවර වීමෙන් අළුත්වූ කර්මයන් නොකිරීමෙන් මත්තෙහි කර්ම නොහට ගැණීමවේ. මත්තෙහි කර්ම නොහට ගැණීමෙන් කර්මයන්ගේ නැසීමවේ. කර්ම නැසීමෙන් දුක්නැසීමවේ. දුක් නැසීමෙන් වේදනා නැසීමවේ. වේදනා නැසීමෙන් සියළු දුක දිරවීම වන්නේයයි විපරිත වශයෙන් අදහන්නහුය'. මහණෙනි, මෙසේ කියන්නාවූ මම නිගණ්ඨයන්ගේ කරුණු සහිතවූ කිසියම් පිළිතුරක් නොදකිමි.

7. "මහණෙනි, නැවතද මම ඒ නිගණ්ඨයින්ට මෙසේ කියමි. 'ඇවැත් නිගණ්ඨයිනි, ඒ කුමකැයි හඟිව්ද? මේ ආත්මයෙහි විපාකදෙන යම් මේ කර්මයක් වෙයිද එය උපක්‍රමයෙන් හෝ වීර්යයෙන් හෝ පරලොව විපාක දෙන කර්මයක් වේවායි එසේ ලැබිය හැකිදැයි' අසමි. 'ඇවැත්නි, එසේ නොලැබිය හැකියයි කියත්.' 'පරලොව විපාක දෙන යම් මේ කර්මයක් වෙයිද, එය උපක්‍රමයෙන් හෝ වීර්යයෙන් හෝ මේ ආත්මයෙහි විපාක දෙන කර්මයක් වේවායි එසේ ලැබිය හැක්කේදැයි අසමි.' 'ඇවැත්නි එසේ නොලැබිය හැකියයි' කියති.

'ඇවැත් නිගණ්ඨයිනි, ඒ කුමකැයි හඟිව්ද? සැප විපාක දෙන්නාවූ යම් මේ කර්මයක් වෙයිද, එය උපක්‍රමයෙන් හෝ වීර්යයෙන් හෝ දුක් විපාක දෙන්නාවූ කර්මයක් වේවායි එසේ ලැබිය හැක්කේදැයි අසමි.' 'ඇවැත්නි, එසේ නොලැබිය හැක්කේයයි කියත්.'

'ඇවැත්නි, දුක් විපාක දෙන්නාවූ යම් මේ කර්මයක් වෙයිද එය උපක්‍රමයෙන් හෝ වීර්යයෙන් හෝ සැප විපාක දෙන්නාවූ කර්මයක් වේවායි එසේ ලැබිය හැක්කේ දැයි අසමි.' 'ඇවැත්නි එසේ නොලැබිය හැකියයි' කියත්."

'ඇවැත් නිගණ්ඨයිනි, ඒ කුමකැයි හඟිව්ද? මුහුකුරාගිය කල්හි විපාක දෙන්නාවූ යම් කර්මයක් වෙයිද එය උපක්‍රමයෙන් හෝ වීර්යයෙන් හෝ මුහුකුරා නොගිය කල්හි විපාක දෙන කර්මයක් වේවායි එසේ ලැබිය හැකිදැයි අසමි.' 'ඇවැත්නි, එසේ නොලැබිය හැකියයි' කියත්. 'මුහුකුරා නොගිය කල්හි විපාක දෙන්නාවූ යම් මේ කර්මයක් වෙයිද එය උපක්‍රමයෙන් හෝ වීර්යයෙන් හෝ මුහුකුරාගිය කල්හි විපාක දෙන කර්මයක් වේවායි එසේ ලැබිය හැකිදැයි අසමි.' 'ඇවැත්නි, එසේ නොලැබිය හැකියයි' කියත්.

'ඇවැත් නිගණ්ඨයිනි, එය කුමකැයි හඟිව්ද? බොහෝ විපාක දෙන්නාවූ යම් මේ කර්මයක් වෙයිද, එය උපක්‍රමයෙන් හෝ වීර්යයෙන් හෝ ස්වල්ප විපාක ඇත්තාවූ කර්මයක් වේවායි එසේ ලැබිය හැකිදැයි අසමි.' 'ඇවැත්නි, එසේ නොලැබිය හැකියයි' කියත්. 'ස්වල්ප විපාක ඇත්තාවූ යම් ඒ කර්මයක් වෙයිද, එය උපක්‍රමයෙන් හෝ වීර්යයෙන් හෝ බොහෝ විපාක ඇත්තාවූ කර්මයක් වේවායි එසේ ලැබිය හැකිදැයි අසමි.' ඇවැත්නි, එසේ නොහැකියයි කියත්.

'ඇවැත් නිගණ්ඨයිනි, ඒ කුමකැයි හඟිව්ද? විපාක විඳිය යුතුවූ යම් මේ කර්මයක් වෙයිද, එය උපක්‍රමයෙන් හෝ වීර්යයෙන් හෝ විපාක නොවිඳිය යුතුවූ කර්මයක් වේවායි එසේ ලැබිය හැකිදැයි අසමි.' 'ඇවැත්නි, එසේ නොලැබිය හැකියයි'

කියත්. 'විපාක නොවිඳියි යුතුවූ යම් ඒ කර්මයක් වෙයිද, එය උපක්‍රමයෙන් හෝ වීර්යයෙන් හෝ විපාක විඳියයුතු කර්මයක් වේවායි එසේ ලැබිය හැකිදැයි අසමි.' 'ඇවැත්නි, එසේ නොලැබිය හැකියයි' කියත්.

'ඇවැත් නිගණ්ඨයිනි, මෙසේ වනාහි මේ ආත්මයෙහි විඳිය යුතුවූ යම් මේ කර්මයක් වෙයිද, එය උපක්‍රමයන්ගේ හෝ වීර්යයෙන් හෝ පරලොව විපාක විඳිය යුතු කර්මයක් වේවායි මෙය නොලැබෙන්නේද පරලොව විපාක විඳිය යුතුවූ යම් මේ කර්මයක් වෙයිද, එය උපක්‍රමයෙන් හෝ වීර්යයෙන් හෝ මේ ආත්මයෙහි විපාක විඳිය යුතු කර්මයක් වේවායි මෙය නොලැබෙන්නේය. සැප විපාක විඳිය යුතුවූ යම් මේ කර්මයක් වෙයිද, උපක්‍රමයෙන් හෝ වීර්යයෙන් හෝ දුක් විපාක විඳිය යුතුකර්මයක් වේවායි මෙය නොලැබෙන්නේද, දුක් විපාක විඳිය යුතු යම් මේ කර්මයක් වේද එය උපක්‍රමයෙන් හෝ, වීර්යයෙන් හෝ, සැප විපාක විඳිය යුතු කර්මයක් වේවායි, මෙය නොලැබෙන්නේද, මුහුකුරා ගිය කල්හි විපාක විඳිය යුතුවූ යම් මේ කර්මයක් වේද, එය උපක්‍රමයෙන් හෝ වීර්යයෙන් හෝ මුහුකුරා නොගිය කල්හි විපාක විඳිය යුතු කර්මයක් වේවායි මෙය නොලැබෙන්නේය. මුහුකුරා ගිය නොගිය කල්හි විපාක විඳිය යුතු යම් මේ කර්මයක් වේද, එය උපක්‍රමයෙන් හෝ වීර්යයෙන් හෝ මුහුකුරා ගිය කල්හි විපාක විඳිය යුතු කර්මයක් වේවායි මෙය නොලැබෙන්නේය. බොහෝ විපාක විඳිය යුතු යම් කර්මයක් වේද, එය මේ උපක්‍රමයෙන් හෝ වීර්යයෙන් හෝ ස්වල්පවූ විපාක විඳිය යුතු කර්මයක් වේවායි මෙය නොලැබෙන්නේද, ස්වල්පවූ විපාක විඳියයුතු යම් මේ කර්මයක් වේද, එය උපක්‍රමයෙන් හෝ වීර්යයෙන් හෝ බොහෝ විපාක විඳිය යුතු කර්මයක් වේවායි, මෙය නොලැබෙන්නේද, විපාක විඳිය යුතු යම් මේ කර්මයක් වේද එය උපක්‍රමයෙන් හෝ වීර්යයන්ගේ හෝ විපාක නොවිඳිය යුතු කර්මයක් වේවායි මෙය නොලැබෙන්නේද, විපාක නොවිඳිය යුතු යම් මේ කර්මයක් වේද එය උපක්‍රමයෙන් හෝ වීර්යයෙන් හෝ විපාක විඳිය යුතු කර්මයක් වේවායි, මෙය නොලැබෙන්නේද, මෙසේ ඇති කල්හි

ආයුෂ්මත් නිගණ්ඨයන්ගේ උපක්‍රමය නිෂ්ඵලවේ. වීර්යය නිෂ්ඵල වේ.’

8. “මහණෙනි, නිගණ්ඨයෝ මෙබඳු වාද ඇත්තාහුය, මහණෙනි මෙබඳුවාද ඇත්තාවූ නිගණ්ඨයන්ගේ වාද අනුවාද දසයක් කරුණු සහිතය ගැරහිය යුතු තැනට පැමිණෙත්. මහණෙනි, ඉදින් සත්වයෝ පෙරකළ කර්මහේතුවෙන් සැප දුක් විඳිත් නම් මහණෙනි, යම්හෙයකින් දැන් මෙබඳුවූ දුක්වූ තියුණුවූ කටුකවූ වේදනා විඳින්නාවූ නිගණ්ඨයෝ එකාන්තයෙන් පෙර නපුරු කොටකරන ලද ධර්ම ඇත්තාහු වෙත්. මහණෙනි ඉදින් සත්වයෝ ඊශ්වරාදීන් විසින් මැවීම හේතු කොට ගෙණ සැපදුක් විඳිත් නම්, මහණෙනි, යම් හෙයකින් මේකාලයෙහි මෙබඳු දුක්වූ තියුණුවූ කටුකවූ වේදනා විඳින්නාවූ නිගණ්ඨයෝ එකාන්තයෙන් පවිටුවූ ඊශ්වරාදියකු විසින් මවන ලද්දාහු වෙත්.

9. “මහණෙනි, ඉදින් සත්වයෝ නියමය හේතුකොට ගෙන සැප දුක් විඳිත් නම් මහණෙනි, යම් හෙයකින් මෙකල්හි මෙබඳු දුක්වූ තියුණුවූ කටුකවූ වේදනා විඳින්නාවූ නිගණ්ඨයෝ එකාන්තයෙන් පාප නියමයක් ඇත්තෝ වෙත්. මහණෙනි, ඉදින් සත්වයෝ සවැදැරුම් උත්පත්ති හේතු හේතු කොට ගෙන සැප දුක් විඳිත් නම්, මහණෙනි, යම් හෙයකින් මෙකල්හි මෙබඳුවූ දුක්වූ තියුණුවූ කටුකවූ වේදනා විඳින්නාවූ නිඝණ්ඨයෝ එකාන්තයෙන් පවිටුවූ උත්පත්ති ඇත්තෝ වෙත්. මහණෙනි, ඉදින් සත්වයෝ ඉහාත්මයෙහිවූ උපක්‍රම හේතුවෙන් සැප දුක් විඳිත් නම් මහණෙනි, යම් හෙයකින් මෙ කල්හි මෙ බඳු දුක්වූ තියුණුවූ කටුක වූ වේදනා විඳින්නා වූ නිඝණ්ඨයෝ එකාන්තයෙන් ඉහාත්මයෙහි පවිටු වූ උපක්‍රම ඇත්තෝ වෙත්.

10. “මහණෙනි, ඉදින් සත්වයෝ පෙර කළ කර්ම හේතු වෙන් සැප දුක් විඳිත් නම් එයින් ද නිගණ්ඨයෝ ගැරහිය යුත්තාහු වෙත්. ඉදින් සත්වයෝ පෙර කළ කර්ම හේතුවෙන් සැප දුක් නොවිඳිත් නම් එයින්ද, නිගණ්ඨයෝ ගැරහිය යුතු වෙත්. මහණෙනි, ඉදින් සත්වයෝ ඊශ්වරාදීන්ගේ මැවීම් හේතුවෙන් සැප දුක් විඳිත් නම් එයින්ද නිගණ්ඨයෝ ගැරහිය යුතු වෙත්.

ඉදින් සත්වයෝ ඊශ්වරාදීන්ගේ මැවීම් හේතුවෙන් සැප දුක් නොවිඳිත් නම් එයින්ද නිගණ්ඨයෝ ගැරහිය යුතු වෙත්. මහණෙනි, ඉදින් සත්වයෝ නියම හේතුවෙන් සැප දුක් විඳිත් නම් එයින්ද නිගණ්ඨයෝ ගැරහිය යුතු වෙත්. ඉදින් සත්වයෝ නියම හේතුවෙන් සැප දුක් නොවිඳිත් නම් එයින් ද නිගණ්ඨයෝ ගැරහිය යුත්තාහු වෙත්. මහණෙනි, ඉදින් සත්වයෝ සවැදෑරුම් උත්පත්ති හේතුවෙන් සැප දුක් විඳිත් නම් එයින්ද නිගණ්ඨයෝ ගැරහිය යුත්තාහු වෙත්. ඉදින් සත්වයෝ සවැදෑරුම් උත්පත්ති හේතුවෙන් සැප දුක් නොවිඳිත් නම් එයින්ද නිගණ්ඨයෝ ගැරහිය යුත්තාහු වෙත්. මහණෙනි, ඉදින් සත්වයෝ මේ ආත්මයෙහිවූ උපක්‍රම හේතුවෙන් සැප දුක් විඳිත් නම් එයින්ද නිගණ්ඨයෝ ගැරහිය යුත්තෝ වෙත්. ඉදින් සත්වයෝ ඉහාත්මයෙහිවූ උපක්‍රම හේතුවෙන් සැප දුක් නොවිඳිත් නම් එයින් නිගණ්ඨයෝ ගැරහිය යුත්තාහු වෙත්. මහණෙනි, නිගණ්ඨයෝ මෙ බඳු වාද ඇත්තාහුය. මහණෙනි, මෙබඳු වාද ඇත්තාවූ නිගණ්ඨයන්ගේ වාදානුවාද දසය කරුණු සහිතව මෙසේ ගැරහිය යුතු තැනට පැමිණෙත්. මහණෙනි, මෙසේ වනාහි උපක්‍රමය නිෂ්ඵල වේ. වීර්යය නිශ්ඵල වේ. මහණෙනි, කෙසේ නම් උපක්‍රමය සඵලවේද? වීර්යය සඵලවේ ද? මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම දුකින් පීඩිත නොවූ තමා දුකින් පීඩිත කෙරෙයිද, ධාර්මිකවූ සැපය අත් නොහරියිද ඒ සැපයෙහි මුසපත් නොවෙයිද හෙතෙම මෙසේ දැනගණියි. මෙසේ වීර්ය කරන්නාවූ මාගේ දුකට හේතු වූ තෘෂ්ණාව වීර්ය කිරීම හේතුකොට ගෙන දුරුවෙයි. මන්ද ජාති වශයෙන් බලන්නාවූ උපෙක්ෂාව වඩන්නාවූ මගේ දුකට හේතුවූ තෘෂ්ණාව දුරුවේයයි කියයි.

වීර්ය කරන්නාගේ වීර්ය කිරීම් හේතුකොටගෙන දුකට හේතුවූ යම් තෘෂ්ණාවක්හුගේ දුරුකිරීම වෙයිද එහි මාර්ග වීර්යයෙන් වීර්ය කරන්නේය.

'එහි උපෙක්ෂාව වඩයි. වීර්ය කරන්නාවූ ඒ පුද්ගලයාහට වීර්ය කිරීම හේතුකොටගෙන දුක් උපදවන හේතුව වන තෘෂ්ණාවගේ දුරුවීම වෙයි.

මෙසේද ඔහුගේ ඒ දුක දිරා යන්නේ වෙයි. මධ්‍යස්ථ වන්නාවූ ඒ පුද්ගලයාහට මධ්‍යස්ථවීම හේතුකොටගෙන දුක් උපදවන හේතුව වන තෘෂ්ණාවගේ දුරුවීම වෙයි. මෙසේද ඔහුගේ ඒ දුක දිරාගියේ නම් වෙයි.

11. "මහණෙනි, යම්සේ පුරුෂයෙක් තෙම ස්ත්‍රියක් කෙරෙහි ඇළුම් සහිත වූයේ, පිළිබඳ සිත් ඇත්තේ, දැඩිවූ ආලය ඇත්තේ, දැඩිවූ බලාපොරොත්තු ඇත්තේවේද, හෙතෙම අන් පුරුෂයෙකු සමග එක්ව සිටින්නාවූ, එක්ව කථා කරන්නාවූ, එක්ව සෙල්ලම් කරන්නාවූ, එක්ව සිනාසෙන්නාවූ, ඒ ස්ත්‍රිය දක්නේය. මහණෙනි, ඒ කුමකැයි හඟිව්ද? කිමෙක්ද? ඒ පුරුෂයා හට අන් පුරුෂයෙකු සමග සිටින්නා වූ කථා කරන්නාවූ මහත්සේ සිනාසෙන්නාවූ මේ ස්ත්‍රිය දැක ශොකය, වැලපීමය, දුකය, දොම්නසය, උපායාස යන මොහු උපදින්නාහුද?" "ස්වාමීනි, එසේය," "ඊට හේතු කවරේද?" "ස්වාමීනි, මේ පුරුෂ තෙම වනාහි මේ ස්ත්‍රිය කෙරෙහි ඇළුම් සහිත වූයේ, පිළිබඳ සිත් ඇත්තේ, දැඩි ආලය ඇත්තේ, දැඩි බලාපොරොත්තු ඇත්තේ වෙයි. එහෙයින් අන් පුරුෂයෙකු සමග සිටින්නාවූ, කථා කරන්නාවූ, මහත්සේ සිනාසෙන්නාවූ, සිනාසෙන්නාවූ ඒ ස්ත්‍රිය දැක ශොකය, පරිදෙවය, දුකය, දොම්නසය, උපායාසය යන මොහු උපදිත්."

"මහණෙනි, ඉක්බිති ඒ පුරුෂයාට මෙබඳු සිතක් වන්නේය. මම වනාහි මේ ස්ත්‍රිය කෙරෙහි ඇළුම් සහිත වූයේ, පිළිබඳ සිත් ඇත්තේ, දැඩි ආලය ඇත්තේ, දැඩි වූ බලාපොරොත්තු ඇත්තේ වෙමි. ඒ මට අන් පුරුෂයෙකු සමග සිටින්නාවූ කථාකරන්නාවූ මහත්සේ සිනාසෙන්නාවූ, සිනාසෙන්නාවූ මේ ස්ත්‍රිය දැක ශොකය, පරිදෙවය, දුකය, දොම්නසය, උපායාසය යන මොහු උපදිත්. 'මම මේ ස්ත්‍රිය කෙරෙහි මගේ යම් ඡන්ද රාගයක් (ඇල්මක්) වේද, එය දුරු කරන්නෙම් නම්, ඉතා යෙහෙකැයි' කියා යි. හෙතෙම මේ ස්ත්‍රිය කෙරෙහි යම් තද ඇල්මක් වේද, එය දුරු කරන්නේය. හෙතෙම පසු කලෙක අන් පුරුෂයෙකු සමග සිටින්නාවූ, කථා කරන්නාවූ, මහත් සේ සිනාසෙන්නාවූ, සිනාසෙන්නාවූ ඒ ස්ත්‍රිය දක්නේය. මහණෙනි, ඒ කුමකැයි හඟිව්ද, කිම? ඒ පුරුෂයාට අන් පුරුෂයකු සමග සිටින්නා වූ,

කථාකරන්නා වූ, මහත්සේ සිනාසෙන්නාවූ, සිනාසෙන්නාවූ, මේ ස්ත්‍රිය දැක ශොකය, පරිදෙවය, දුකය, දොම්නසය, උපායාසය යන මොහු උපදින්නාහුද?" "ස්වාමීනි, මෙය නොවේමැයි, ඊට හේතු කවරේද? ස්වාමීනි, මේ පුරුෂතෙම වනාහි මේ ස්ත්‍රිය කෙරෙහි පහවූ ඇළුම් ඇත්තේ වෙයි. එහෙයින් අන් පුරුෂයකු සමග සිටින්නාවූ, කථාකරන්නාවූ, මහ සිනාවෙන් සිනාසෙන්නාවූ, ඒ ස්ත්‍රීය දැක ශොක පරිදෙව දුක් දොම්නස් උපායාසයෝ නූපදින්යයි" කීහ.

12. "මහණෙනි, එපරිද්දෙන්ම මහණතෙම දුකින් නොමඩනා ලද මේ මනුෂ්‍යාත්මය දුකින් නොමඩියි. දැහැමිවූ සැපයද, අත් නො හරියි. ඒ සැපයෙහි මුසපත් නොවූයේද වෙයි. හෙතෙම වීර්ය කරන්නාවූ 'මගේ වීර්ය කිරීම හේතු කොටගෙන දුකට හේතුවූ තෘෂ්ණාවගේ දුරුවීම වෙයි. උපෙක්ෂාව වඩන්නාවූ මගේ උපෙක්ෂාව වැස්ම හේතු කොට ගෙන දුකට හේතුවූ තෘෂ්ණාවගේ දුරුවීම වේයයි' දැනගනී. හෙතෙම වීර්ය කරන්නාහට වීර්ය කිරීම හේතුකොට ගෙන දුකට හේතුවූ යම් තෘෂ්ණාවක්හුගේ දුරුවීම වෙයිද, එහි වීර්ය කරයි. උපෙක්ෂාව වැඩීම හේතුකොට ගෙන දුකට හේතුවූ තෘෂ්ණාවගේ දුරුවීමක්වේ නම් හෙතෙම එහි උපෙක්ෂා වඩයි. වීර්ය කරන්නාවූ ඔහුගේ වීර්ය කිරීම හේතුකොටගෙන ඒ දුක් උපදවන හේතුව වූ තෘෂ්ණාවගේ දුරුවීමක් වේ. එසේ ද ඔහුගේ දුක් දිරා යාම වෙයි. උපෙක්ෂාව වඩන්නා වූ ඔහුට උපෙක්ෂාව වැඩීම හේතුකොටගෙන ඒ දුක් උපදවන හේතුවවූ තෘෂ්ණාවගේ දුරුවීමක් වේද, එසේද ඔහුගේ දුක් දිරා ගියේ වෙයි.

13. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම මෙසේ සලකයි. සැපසේ වාසය කරන්නා වූ මාගේ අකුසල ධර්මයෝ වැඩෙත්. කුසල ධර්මයෝ පිරිහෙත්. ශරීරයට දුක් ඇතිවනසේ උත්සාහ කරන්නා වූ මාගේ අකුසල ධර්මයෝ පිරිහෙත්. කුසල ධර්මයෝ වැඩෙත්.

"ශරීරයට දුක් ඇති වනසේ උත්සාහ කරන්නෙහි නම් ඉතා යෙහෙකි කියායි. හෙතෙම ශරීරයට දුක් ඇති වනසේ වීර්ය

කරයි. ශරීරයට දුක් ඇති වනසේ වීර්ය කරන්නාවූ ඔහුගේ අකුසල ධර්මයෝ පිරිහෙත්. කුසල ධර්මයෝ වැඩෙත්. හෙතෙම පසු කාලයෙහි ශරීරයට දුක් ඇති වනසේ වීර්ය නොකරයි. ඊට හේතුව කවරේද? මහණෙනි, යමක් සඳහා ඒ මහණ තෙම ශරීරයට දුක්වනසේ වීර්ය කරන්නේද, ඒ අර්ථය ඔහුට සම්පූර්ණවූයේ වෙයි. එහෙයින් පසු කාලයෙහි ශරීරයට දුක් උපදිනසේ වීර්ය නොකරයි.

14. "මහණෙනි, යම්සේ හී වඩුවෙක් හීය ගිනි පෙනෙලි දෙකෙකින් තවාද, නැවත නැවත තවාද, ඇද හරියිද කර්මන්‍ය කරයිද, මහණෙනි, යම් හෙයකින් වනාහී හී වඩුවා විසින් ඊය ගිනි පෙනෙලි දෙකකින් තවන ලද්දේවේද, අතිශයින් තවන ලද්දේ වේද, ඇද හරින ලද්දේද, කර්මන්‍ය කරන ලද්දේ වේද, ඒ හී වඩු තෙම පසු කාලයෙහි ඒ ඊය ගිනි පෙණෙලි දෙකෙකින් නොතවයි. අතිශයින් නොතවයි. ඇද නොහරියි. කර්මන්‍ය නොකරයි. ඊට හේතු කවරේද? මහණෙනි, ඒ හී වඩු තෙම යමක් සඳහා ඊය ගිනි පෙණෙලි දෙකකින් තවන්නේද? අතිශයින් තවන්නේද, ඇද හරියිද, කර්මන්‍ය කරන්නේද, ඒ අර්ථය ඔහුට සම්පූර්ණ වූයේ වෙයි. එහෙයින් ඊ වඩු තෙම පසු කාලයෙහි ඊය ගිනි පෙණෙලි දෙකකින් නොතවයි. අතිශයින් නොතවයි. ඇද නොහරියි. කර්මන්‍ය නොකරයි. මහණෙනි, එපරිද්දෙන්ම මහණ තෙම මෙසේ සලකයි. සැපසේ වාසය කරන්නාවූ මාගේ අකුසල ධර්මයෝ වැඩෙත්. කුසල ධර්මයෝ පිරිහෙත්. ශරීරයට දුක් ඇති වනසේ වීර්‍ය්‍ය කරන්නාවූ මාගේ අකුසල ධර්මයෝ පිරිහෙත්. කුසල ධර්මයෝ වැඩෙත්. මම ශරීරයට දුක් ඇති වනසේ වීර්‍ය්‍ය කරන්නෙම් නම් ඉතා යෙහෙකැයි කියායි. හෙතෙම ශරීරයට දුක් ඇති වනසේ වීර්‍ය්‍ය කරයි. ශරීරයට දුක් ඇති වනසේ වීර්‍ය්‍ය කරන්නාවූ ඔහුගේ අකුසල ධර්මයෝ පිරිහෙත්. කුසල ධර්මයෝ වැඩෙත්. හෙතෙම පසු කලෙක්හි ශරීරයට දුක් නැති වනසේ වීර්‍ය්‍ය නොකරයි. ඊට හේතු කවරේද? මහණෙනි, ඒ මහණ තෙම යම් අර්ථයක් සඳහා ශරීරයට දුක් ඇති වනසේ වීර්‍ය්‍ය කරන්නේද, ඒ අර්ථය ඔහුට සම්පූර්ණවූයේ වෙයි. එහෙයින් පසු කලෙක්හි ශරීරයට දුක් උපදිනසේ වීර්‍ය්‍ය නොකරයි.

මහණෙනි, මෙසේද උපක්‍රමය ඵල සහිත වෙයි. උත්සාහය ඵල සහිත වෙයි.

15. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මේ ලොකයෙහි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ අෂ්ටවිද්‍යා පසලොස් චරණ ධර්මයන්ගෙන් යුක්තවූ ශොභන ගමන් ඇත්තාවූ ලොකය දන්නාවූ නිරුත්තරවූ දමනය කළනොහැකි පුරුෂයන් දමනය කිරීමෙහි සාර්ථ වාහකයෙකු බඳුවූ දෙවිමිනිසුන්ට අනුශාසනා කරන්නාවූ චතුස්සත්‍යයන් අවබොධකළාවූ රාගාදී කෙලෙසුන් විනාශ කළාවූ තථාගතයන් වහන්සේ පහල වෙත්. ඒ තථාගතතෙම දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ මහණ බමුණන් සහිතවූ දෙවිමිනිසුන් සහිතවූ සත්ව ප්‍රජාව සහිතවූ මේ ලොකය විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට දැන ගනියි. ඒ තථාගතතෙම මුල යහපත්වූ මැද යහපත්වූ කෙළවර යහපත්වූ අර්ථ සහිතවූ ව්‍යඤ්ජන සහිතවූ සියල්ල සම්පූර්ණවූ ධර්මය දෙශනා කරයි. පිරිසිදුවූ මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරයි. ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ එක්තරා කුලයක උපන්නෙක් හෝ අසයි. හෙතෙම ඒ ධර්මය අසා තථාගතයන් කෙරෙහි ශ්‍රද්ධාව ලබයි. හෙතෙම ඒ ශ්‍රද්ධාව ලැබීමෙන් යුක්තවූයේ මෙසේ සලකයි. ගිහිගෙයි විසීම අවහිරය. රාගාදී කෙලෙස් ඉපදීමට මාර්ගයයි. පැවිදිවීම අවකාශ ස්ථානයයි. ගිහිගෙයි වසන්නහු විසින් ඒකාන්තයෙන් සම්පූර්ණවූ ඒකාන්තයෙන් පිරිසිදුවූ ලියනලද සකක් වැනිවූ මේ බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන්ට පහසු නොවෙයි. මම හිසකේ රැවුල් කපා කසට වත් හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වන්නෙම් නම් ඉතා යහපති කියායි.

16. "හෙතෙම මෑත කලෙක්හි ස්වල්පවූ සම්පත් රාශිය හෝ හැර මහත්වූ සම්පත් රාශිය හෝ හැර ස්වල්පවූ නෑ පිරිවර හෝ හැර මහත්වූ නෑ පිරිවර හෝ හැර හිසකේ රැවුල් කපා කසට වස්ත්‍ර හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙයි. හෙතෙම මෙසේ පැවිදි වූයේම භික්ෂූන්ගේ අධිශීල ශික්ෂාවට හා සමාන දිවි පැවැත්මට පැමිණියේ, ප්‍රාණ ඝාතය හැර ප්‍රාණ ඝාතයෙන්

වැලකුණේ වෙයි. බහා තබනලද දඬු ඇත්තේ බහා තබනලද ආයුධ ඇත්තේ, ලැජ්ජා ඇත්තේ, කරුණාවට පැමිණියේ, සියළු සතුන් කෙරෙහි හිතානු කම්පා ඇත්තේ වාසය කරයි, අදත්තාදානය හැර අදත්තාදානයෙන් වැලකුණේ වෙයි. දුන්දෙය ගන්නා සුළුවූයේ, දුන්දෙය කැමති වන්නේ සොරනොවූ පවිත්‍රවූ ආත්මයෙන් යුක්තව වාසය කරයි. අබ්‍රහ්මචර්‍ය්‍යාව හැර ශ්‍රෙෂ්ඨවූ හැසුරුම් ඇත්තේ ග්‍රාම ධර්මයක්වූ මෛථූන සේවනයෙන් දුරු වූයේ වැළකුණේ වෙයි. මුසාවාදය හැර බොරුකීමෙන් වැළකුණේ සත්‍යය කියන සුළු වූයේ, සත්‍යයෙන් සත්‍යය ගැලපීම ඇත්තේ, ස්ථිර වචන ඇත්තේ, ඇදහිය යුතු වචනයෙන් ලොකයා නොරවටන්නෙක්වේ. පිසුනු වචනය හැර කේලාම් කීමෙන් වැළකුණේ වෙයි. මෙතැනින් අසා මොවුන්ගේ බිඳීම පිණිස එතැන්හි නොකියන්නේ වෙයි. එතැනින් අසා ඔවුන්ගේ බිඳීම පිණිස මෙතන්හි නොකියන්නේ වෙයි.

17. "මෙසේ බිඳුනවුන් ගලපන්නේ හෝ, සමගි වූවන්ට අනුබල දෙන්නේ හෝ, සමගියට කැමැත්තේ, සමගියෙහි ඇළුනේ සමගියට සතුටු වන්නේ, සමගි කරන වචන කියන්නේ, වෙයි. ඵරුෂ වචනය හැර රළු බස් කීමෙන් වැළකුණේ වෙයි යම් ඒ වචනයක් නිදොස්ද, කණට සැපද, ප්‍රෙමණීයද, සිත සතුටු කරන්නේද, පුරවැසිභාවයට සුදුසුද, බොහෝ දෙනා කැමතිද, බොහෝ දෙනාගේ මනවඩන්නීද, එබඳු වචනය කියන්නේ වෙයි. සම්ඵප්‍රලාපය හැර හිස්වූ කථා කීමෙන් වැළකුණේ වෙයි. කලට සුදුසු වචන ඇත්තේ, සත්‍යවූ වචන ඇත්තේ, අර්ථයෙන් යුත් වචන ඇත්තේ, ධර්මයෙන් යුත් වචන ඇත්තේ, විනය සම්බන්ධවූ වචන ඇත්තේ, සුදුසු කල්හි කරුණු දැක්වීම් සහිතවූ ප්‍රමාණවත්වූ, අර්ථයෙන් යුක්තවූ, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේ.

18. හෙතෙම තෘණ ගස්, වැල්, සිඳීම්, බිඳීම්, ආදියෙන් වැලකුණේ වෙයි. එක වේලේ වළඳනා ආහාර ඇත්තේ රාත්‍රි භොජනයෙන් වැලකුණේ නොකල්හි වැලඳීමෙන් වැලකුණේ වෙයි. නැටුම්, ගීකීම්, වීණා ආදිය වැයීම්, විසුළු දැකීම් යන

මෙයින් වැලකුණේ වෙයි. මල් ගඳ විලවුන් දැරීම එයින් සැරසීම අඩුතැන් පිරවීමෙන් අලංකාර කිරීම යන මෙයින් වැලකුණේ වෙයි. උසසුන් මහ අස්නෙන් වැලකුණේ වෙයි. රන්රිදී මසු කහවනු පිළිගැන්මෙන් වැලකුණේ වෙයි. අමු ධාන්‍ය වර්ග පිළිගැන්මෙන් වැලකුණේ වෙයි. අමු මස් වර්ග පිළිගැන්මෙන් වැලකුණේ වෙයි. ස්ත්‍රීන් හා ළදැරියන් පිළිගැන්මෙන් වැලකුණේ වෙයි. දාසීන් හා දාසයන් පිළිගැන්මෙන් වැලකුණේ වෙයි. එළුවන් තිරෙළුවන් පිළිගැන්මෙන් වැලකුණේ වෙයි. කුකුළන් හූරන් පිළිගැන්මෙන් වැලකුණේ වෙයි. ඇතුන්, ගවයන්, අසුන්, වෙළඹුන් පිළිගැන්මෙන් වැලකුණේ වෙයි. කෙත්, වත් පිළිගැන්මෙන් වැලකුණේ වෙයි. දූත මෙහෙවරය, පණිවුඩ පණත්වල යෙදීමය යන මෙයින් වැලකුණේ වෙයි, වෙළඳාම පිණිස ගණුදෙනු කිරීමෙන් වැලකුණේ වෙයි. තරාදි ආදියෙන් වංචා කිරීමය, රන් හා නොරන් මිශ්‍ර වංචා කිරීමය, වී ආදිය මැනීමෙන් වංචා කිරීමය යන මෙයින් වැලකුණේ වෙයි, අල්ලස් ගැනීමය, වංචා කිරීමය, උපායෙන් අනුන් රැවටීමය, කපටිකමය යන මෙයින් වැලකුණේ වෙයි. සිඳීමය, මැරීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැර ගැන්මය, ගම් පැහැරීමය, බලාත්කාරකම් කිරීමය යන මෙයින් වැලකුණේ වෙයි. හෙතෙම කය පරිහරණයට සුදුසුවූ සිවුරෙන් හා කුස පරිහරණයට සුදුසු පිණ්ඩපාතයෙන් සතුටු වූයේ වෙයි. යම් යම් තැනෙක්හිම යයිද, අටපිරිකර හැර ගෙණමයයි. යම්සේ නම් පියාපත් ඇති පක්ෂියෙක් යම් යම් තැනෙක්හිම පියාඹයිද, පියාපත් බරසහිතව පියාඹයිද, එමෙන්ම මහණතෙම කය පරිහරණයට සුදුසුවූ සිවුරෙන් හා කුස පරිහරණයට සුදුසු පිණ්ඩපාතයෙන් සතුටුවූයේ වෙයි. යම් යම් තැනෙක්හිම යේද පිරිකර හැරගෙණමයයි. හෙතෙම මේ ආර්‍ය්‍යවූ ශීල රාශියෙන් යුක්තවූයේ ආධ්‍යාත්මිකවූ නිරවද්‍ය වූ සුවය විඳියි.

19. හෙතෙම ඇසින් රූපය දැක නිමිති වශයෙන් නොගන්නේ කුඩා සලකුණු වශයෙන් නොගන්නේ වෙයි. යම් හේතුවකින් මේ චක්ෂුරින්ද්‍රියෙහි අසංවරව වාසය කරන්නහුට

විෂම ලොභය හා දොම්නසය යන ලාමකවූ අකුසල ධර්මයෝ අනුව උපදිත්ද, ඔවුන්ගේ සංවරය පිණිස පිළිපදියි, චක්ෂුරින්ද්‍රිය රකියි. චක්ෂුරින්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි, කණින් ශබ්දය අසා තපසින් කෙළවර වීමෙන් අලුත්වූ කර්මයන් නොකිරීමෙන් මත්තෙහි නොහට ගැණීමවේ. මත්තෙහි නොහට ගැණීමෙන් කර්මයන්ගේ නැසීමවේ. කර්මයන් නැසීමෙන් දුක්නැසීමවේ. දුක් නැසීමෙන් වේදනා නැසීමවේ. වේදනානැසීමෙන් නාසයෙන් සුවඳ ආඝ්‍රාණය කොට නිමිති වශයෙන් නොගන්නේ, කුඩා සලකුණු වශයෙන් නොගන්නේ වෙයි. යම් හේතුවකින් මේ ශ්‍රොතෙන්ද්‍රියයෙහි අසංවරව වාසය කරන්නහුට විෂම ලොභය හා දොම්නස යන ලාමකවූ අකුසල ධර්මයෝ අනුව වහනය වෙත්ද ඔවුන්ගේ සංවරය පිණිස පිළිපදියි ශ්‍රොතෙන්ද්‍රිය රකියි. ශ්‍රොතෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි.

20. "දිවෙන් රසය විඳ නිමිති වශයෙන් නොගන්නේ, කුඩා සලකුණු වශයෙන් නොගන්නේ වෙයි. යම් හේතුවකින් මේ ඝ්‍රාණෙන්ද්‍රියයෙහි අසංවරව වාසය කරන්නහුට විෂම ලොභය හා දොම්නස යන ලාමකවූ අකුසල ධර්මයෝ වහනය වෙත්ද ඔවුන්ගේ සංවරය පිණිස පිළිපදියි. ඝ්‍රාණෙන්ද්‍රිය රකියි. ඝ්‍රාණෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. කයින් ස්පර්ෂ කළයුත්ත ස්පර්ෂ කොට නිමිති වශයෙන් නොගන්නේ, කුඩා සලකුණු වශයෙන් නොගන්නේ වෙයි. යම් හේතුවකින් මේ ජිව්හේන්ද්‍රියයෙහි අසංවරව වාසය කරන්නහුට විෂම ලොභය හා දොම්නස යන ලාමකවූ අකුසල ධර්මයෝ අනුව වහනය වෙත්ද, ඔවුන්ගේ සංවරය පිණිස පිළිපදියි. ජිව්හේන්ද්‍රිය රකියි. ජිව්හේන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. සිතින් ධර්මය දැන නිමිති වශයෙන් නොගන්නේ කුඩා ලකුණු වශයෙන් නොගන්නේ වෙයි. යම් හේතුවකින් මේ මනින්ද්‍රියෙහි අසංවරව වසන්නහුට විෂම ලොභ දොම්නස් යන ලාමකවූ අකුශල ධර්මයෝ අනුව උපදිත්ද, ඔවුන්ගේ සංවරය පිණිස පිළිපදියි. මනින්ද්‍රිය රකියි, මනින්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි. හෙතෙම මේ ආර්‍ය්‍යවූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූයේ, ආධ්‍යාත්මිකවූ ආධ්‍යාත්මිකවූ සැපද විඳියි.

21. "හෙතෙම ඉදිරියට යෑමෙහි හැරී යෑමෙහි මනාව දැන කරන්නේ වෙයි. ඉදිරියට බැලීමෙහි, වටපිට බැලීමෙහි, මනාව දැන කරන්නේ වෙයි. (අත් පා) ඇකිලීමෙහි, දිගහැරීමෙහි මනාව දැන කරන්නේ වෙයි. සඟල සිවුර හා පාත්‍රා සිවුරු දැරීමෙහි මනාව දැන කරන්නේ වෙයි. අනුභව කිරීමෙහි පානය කිරීමෙහි, කඩා කෑමෙහි, රස විඳීමෙහි, මනාව දැන කරන්නේ වෙයි. මළ මුත්‍ර කිරීමෙහි මනාව දැන කරන්නේ වෙයි. යාමෙහි, සිටීමෙහි, හිඳීමෙහි, සයනයෙහි නිදි දුරුකිරීමෙහි, කථාවෙහි නිශ්ශබ්ද වීමෙහි මනාව දැන කරන්නේ වෙයි. හෙතෙම මේ ආර්‍ය්‍යවූ ශීල රාශියෙන්ද යුක්තවූයේ, මේ ආර්‍ය්‍යවූ ඉන්ද්‍රිය සංවරයෙන්ද, යුක්තවූයේ, මේ ආර්‍ය්‍ය වූ සිහි නුවණ දෙකින් යුක්තවූයේ, වනය, රුක්මුලය පර්වතය, කඳුරැළිය, පර්වතගුහාය, සොහොනය, ඉතා දුරවන සෙනසුනය, හිස් තැනය, පිදුරුගොඩය, යන විවෙක සෙනාසනයන් භජනය කරයි.

22. "හෙතෙම බතින් පසු කල්හි පිණ්ඩපාතයෙන් වැලකුණේ පර්‍ය්‍යංකය බැඳගෙණ ඍජුකොට කය පිහිටුවා සිහිය ඉදිරිපත් කොට තබා හිඳගණියි. හෙතෙම ස්කන්ධ ලොකයෙහි දැඩි ලොභය දුරුකොට දැඩි ලොභය පහව ගියාවූ, සිතින් යුක්තව වාසයකරයි. දැඩි ලොභයෙන් සිත පිරිසිදු කරයි. ද්වෙෂයෙන් දූෂිතවූ සිත දුරුකොට ක්‍රොධ රහිත සිත් ඇත්තේ, සියළු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේ, වාසය කරයි. ව්‍යාපාද ප්‍රදොෂයෙන් සිත පිරිසිදු කරයි.

"ථිනමිද්ධය හැර පහවූ ථිනමිද්ධය ඇත්තේ, ආලෝක සංඥා ඇත්තේ, සිහි නුවණ ඇත්තේ වාසය කරයි. ථිනමිද්ධයෙන් සිත පිරිසිදු කරයි. නොසන්සුන් බව හා පසුතැවීම හැර නොසන්සුන්නොවී ඇතුලත සංසුන් සිත් ඇතිව වාසය කරයි. උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කරයි, සැකකිරීම හැර එතර කළාවූ සැක ඇත්තේ, කුශල ධර්මයන්හි සැක රහිතවූයේ වාසය කරයි, විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කරයි.

19. "හෙතෙම මේ චිත්තයාගේ කෙළෙසීම ඇත්තාවූ, ප්‍රඥාව දුර්වලකරන්නාවූ, නීවරණ පස හැර කාමයන්ගෙන් වෙන්වම

අකුසල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ, විචාර සහිතවූ විවෙකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයි. මහණෙනි, මෙසේද උපක්‍රමය සඵල වූයේ වෙයි. වීය්‍ර්‍ය සඵලවූයේ වෙයි. මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් ඇතුළත පැහැදීම ඇත්තාවූ, චිත්තයාගේ එකඟ බැව් ඇත්තාවූ, විතර්ක රහිතවූ, විචාර රහිතවූ, සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. මහණෙනි, මෙසේද උපක්‍රමය සඵලවූයේ වෙයි. වීය්‍ර්‍යය සඵල වූයේ වෙයි.

**20.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණතෙම ප්‍රීතියගේද, නොඇල්මෙන් උපෙක්ෂා ඇත්තේද, සිහි නුවණ ඇත්තේද, වාසය කරයි. සැපයද නාමකයින් විඳියි. ආය්‍ර්‍යයෝ යම් ධ්‍යානයක් උපෙක්ෂා ඇත්තේ, සිහි ඇත්තේ සැපවිහරණ ඇත්තේයයි කියත්ද, ඒ තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරයි. මහණෙනි, මෙසේද උපක්‍රමය සඵලවූයේ වෙයි. වීය්‍ර්‍යය කිරීම සඵලවූයේ වෙයි.

**21.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. මහණ තෙම සැපයද දුරු කිරීමෙන්, දුකද දුරු කිරීමෙන් පළමු කොටම සොම්නස්, දොම්නස්, දෙදෙනාගේ නැසීමෙන් දුක් නැත්තාවූ සැප නැත්තාවූ, උපෙක්ෂා ස්මෘති දෙදෙනාගේ පිරිසිදු බැව් ඇති චතුර්ථ ධ්‍යානයට පැමිණ වාසය කරයි.

මහණෙනි, මෙසේද උපක්‍රමය සඵලවූයේ වෙයි. වීය්‍ර්‍යය සඵලවූයේ වෙයි.

**22.** හෙතෙම මෙසේ සිත එකඟවූ කල්හි පිරිසිදුවූ කල්හි නිර්මලවූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, පහවගිය උපක්ලේශ ඇති කල්හි, මෘදුවූ කල්හි, කර්මක්ෂමවූ කල්හි ස්ථිරවූ කල්හි කම්පා නොවන බවට පැමිණි කල්හි, පෙර විසූකඳ පිළිවෙල සිහිකරණ නුවණ පිණිස සිත එලවයි. හෙතෙම නොයෙක් ප්‍රකාරවූ පෙරවිසූ කඳ පිළිවෙළ සිහි කරයි. එනම් ජාති එකක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති හතරක්ද, ජාති පහක්ද, ජාති

දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතලිහක්ද, ජාති පණහක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත කල්පයන්ද, නොයෙක් විවර්ත කල්පයන්ද, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද, අසවල් තන්හි මෙබඳු නම් ඇත්තෙක්, මෙබඳු ගොත්‍ර ඇත්තෙක්, මෙබඳු වර්ණ ඇත්තෙක් මෙබඳු ආහාර ඇත්තෙක් මෙබඳු සැපදුක් විඳින්නෙක්, මෙබඳු ආයුෂය කෙළවර කොට ඇත්තෙක් වීමි. ඒ මම එයින් චුතවූයේ අසවල් තන්හි ඉපදුනෙමි. එහිදු මෙබඳු නම් ඇත්තෙක්, මෙබඳු ගොත්‍ර ඇත්තෙක්, මෙබඳු වර්ණ ඇත්තෙක්, මෙබඳු ආහාර ඇත්තෙක්, මෙබඳු සැපදුක් විඳින්නෙක්, මෙබඳු ආයුෂය කෙළවර කොට ඇත්තෙක්, වීමි. ඒ මම එයින් චුතවූයේ මෙහි උපන්නේ වෙමියි. මෙසේ ආකාර සහිතවූ උදෙසීම් සහිතවූ අනෙක ප්‍රකාරවූ, පෙරවිසූ කඳ පිළිවෙල සිහි කරයි. මහණෙනි, මෙසේද උපක්‍රමය සඵලවූයේ වෙයි. වීර්‍ය්‍යය සඵලවූයේ වෙයි.

23. "හෙතෙම මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, නිර්මලවූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, පහවගිය උපක්ලේශ ඇති කල්හි, මෘදුවූ කල්හි, කර්මක්ෂමවූ කල්හි, සිටි කල්හි කම්පා නොවන බවට පැමිණි කල්හි සත්වයන්ගේ චුත වීම හෝ ඉපදීම දැන ගැණීම පිණිස සිත එලවයි. හෙතෙම දිව්‍යවූ පිරිසිදුවූ මිනිසැස ඉක්ම පැවැත්තාවූ ඇසින් චුතවන්නාවූද උපදින්නාවූද, හීනවූ, ප්‍රණීතවූ, සුවර්ණවූ, දුර්වර්ණයවූ, යහපත් ගතිවලට ගියාවූද, අයහපත් ගතිවලට ගියාවූද, සත්වයන් දකියි. කම්වූ පරිද්දෙන් පරලොව ගියාවූ සත්වයන් දැන ගණියි. ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහුය. වාක් දුශ්චරිතයෙන් යුක්තවූවාහුය. මනො දුශ්චරිතයෙන් යුක්තවූවාහුය. ආර්‍ය්‍යයන්ට උපවාද කියන්නාහුය. මිථ්‍යා දෘෂ්ටි ඇත්තාහුය. මිථ්‍යා දෘෂ්ටීන්ගේ කර්ම සමාදන්වූවාහුය. ඔව්හු ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ දුකට පිළිසරණවූ විවසව පතිතවන්නාවූ නරකයෙහි උපන්නාහුය. මේ පින්වත් සත්වයෝ වනාහී කාය සුචරිතයෙන් යුක්තවූවාහුය. වාග් සුචරිතයෙන් යුක්තවූවාහුය. මනො සුචරිතයෙන්

යුක්තවූවාහුය. ආර්‍ය්‍යයන්ට උපවාද නොකියන්නාහුය. සම්‍යක් දෘෂ්ටි ඇත්තාහුය. සම්‍යක් දෘෂ්ටීන්ගේ කර්ම සමාදන්වූවාහුය. ඔව්හු ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇත්තාවූ, ස්වර්ගලොකයෙහි උපන්නාහුයයි, මෙසේ දිව්‍යවූ, පිරිසිදුවූ, මිනිසැස ඉක්ම පැවැත්තාවූ, ඇසින් චුතවන්නාවූද, උපදින්නාවූද, හීනවූ ප්‍රණීතවූ, සුවර්ණවූ, දුර්වර්ණවූ, සුගතවූ දුර්ගතවූ සත්වයන් දකියි. කම්වූ පරිද්දෙන් පරලොවගියාවූ සත්වයන් දැනගණියි. මහණෙනි, මෙසේද උපක්‍රමය සඵලවූයේ වෙයි. වීර්‍ය්‍ය සඵලවේ.

**24.** හෙතෙම මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, නිර්මලවූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, පහව ගිය උපක්ලේශ ඇති කල්හි, මෘදුවූ කල්හි, කර්මක්ෂමවූ කල්හි, ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, ආශ්‍රවයන්ගේ ක්ෂයවීම දැනගැණීම පිණිස සිත එලවයි. හෙතෙම මෙය දුකය තත්වූ පරිද්දෙන් දැනගණියි. මේ දුක ඉපදීමට හේතුවයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. මේ දුක් නැති කිරීමයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. මේ දුක් නැති කිරීමට පිළිපදින්නාවූ මාර්ගයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. මේ ආශ්‍රවයෝයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. මේ ආශ්‍රවයන්ගේ ඇති වීමට හේතුවයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. මේ ආශ්‍රවයන්ගේ නිරොධයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. මේ ආශ්‍රවයන් නිරුද්ධ කිරීමට පිළිපදින මාර්ගයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ, ඔහුගේ කාමාශ්‍රව කෙරෙන්ද, සිත මිදේ භවාශ්‍රව කෙරෙන්ද සිත මිදේ. අවිද්‍යාශ්‍රව කෙරෙන් සිතමිදේ. මිදුනු කල්හි මිදුනේය යන දැනීම වේ. ජාතිය ක්ෂය කරන ලද්දීය. බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලද්දේය, (සතරමගින්) කටයුතු දෙය කරන ලද්දේය. මේ ආත්මභාවය පිණිස අනිකක් නැතැයි දැනගණියි. මහණෙනි, මෙසේද උපක්‍රමය සඵලවූයේ වෙයි. වීර්‍ය්‍යය සඵලවූයේ වෙයි.

**25.** "මහණෙනි, තථාගතතෙම මෙබඳුවාද ඇත්තේ වෙයි. මහණෙනි, මෙබඳු වාද ඇත්තාවූ තථාගතයන්ට කරුණු සහිතවූ පැසසිය යුතු කරුණු දසයක් පැමිණෙත්. මහණෙනි, ඉදින්

සත්වයෝ පෙර කළ කර්මහේතුවෙන් සැපදුක් විඳිත්නම් මහණෙනි, ඒකාන්තයෙන් තථාගත තෙම යම් හෙයකින් මෙකල්හි මෙබඳුවූ ආශ්‍රව රහිතවූ, සැපවේදනා විඳියිද? එහෙයින් පෙර මනාව කරනලද කර්ම කිරීම ඇත්තේ වේ. මහණෙනි, ඉදින් සත්වයෝ ඊශ්වරයෙකුගේ මැවීම් හේතුවෙන් සැපදුක් විඳත්නම් මහණෙනි, එකාන්තයෙන් තථාගත තෙම යම් හෙයකින් මෙකල්හි මෙබඳු ආශ්‍රව රහිතවූ සැපවූ වේදනා විඳියිද, එහෙයින් යහපත්වූ, ඊශ්වරයෙකු විසින් මවන ලද්දේ වෙයි. මහණෙනි, ඉදින් සත්වයෝ ප්‍රකෘතිය හේතුවෙන් සැපදුක් විඳිත්නම් මහණෙනි, එකාන්තයෙන් තථාගතතෙම යම් හෙයකින් මෙකල්හි මෙබඳුවූ ආශ්‍රව රහිතවූ සැපවූ වේදනා විඳියිද? එහෙයින් යහපත් ප්‍රකෘතියක් ඇත්තෙක් වේ. මහණෙනි, ඉදින් සත්වයෝ ඉපදීම හේතුවෙන් සැපදුක් විඳිත් නම් මහණෙනි, එකාන්තයෙන් තථාගත තෙම යම් හෙයකින් මෙකල්හි මෙබඳුවූ ආශ්‍රව රහිතවූ සැපවූ වේදනා විඳියිද, එහෙයින් යහපත්වූ ඉපදීම් ඇත්තෙක් වේ. මහණෙනි, ඉදින් සත්වයෝ මේ ආත්මයෙහි උපක්‍රම හේතුවෙන් සැපදුක් විඳිත්නම් මහණෙනි, එකාන්තයෙන් තථාගත තෙම යම් හෙයකින් මෙකල්හි මෙබඳුවූ, ආශ්‍රව රහිතවූ, සැපවූ, වේදනා විඳියිද, එහෙයින් යහපත්වූ, මේ ආත්මයෙහි උපක්‍රම ඇත්තේ වෙයි.

"මහණෙනි, ඉදින් සත්වයෝ පෙර කළ කර්ම හේතුවෙන් සැප දුක් විඳිත් නම් එයින් ද තථාගත තෙම පැසසිය යුතු වේ. ඉදින් සත්වයෝ පෙර කළ කර්ම හේතුවෙන් සැප දුක් නො විඳිත් නම් එයින්ද, තථාගත තෙම පැසසිය යුතුවේ. මහණෙනි, ඉදින් සත්වයෝ ඊශ්වරයෙකුගේ මැවීම් හේතුවෙන් සැප දුක් නොවිඳිත් නම් එයින් තථාගත තෙම පැසසිය යුතු වේ. ඉදින් සත්වයෝ ඊශ්වරයකුගේ මැවීම් හේතුවෙන් සැප දුක් නො විඳිත් නම් එයින් ද තථාගත තෙම පැසසිය යුතු වේ. මහණෙනි, ඉදින් සත්වයෝ ප්‍රකෘති භාව හේතුවෙන් සැප දුක් විඳිත් නම් එයින් ද තථාගත තෙම පැසසිය යුතු වේ. ඉදින් සත්වයෝ ප්‍රකෘතිභාව හේතුවෙන් සැප දුක් නො විඳිත් නම් එයින් ද,

තථාගත තෙම පැසසිය යුතු වේ. මහණෙනි, ඉදින් සත්වයෝ ඉපදීම් හේතුවෙන් සැප දුක් විඳිත් නම් එයින් තථාගත තෙම පැසසිය යුතු වේ. ඉදින් සත්වයෝ ඉපදීම් හේතුවෙන් සැප දුක් නොවිඳිත් නම් එයින්ද, තථාගත තෙම පැසසිය යුතු වේ. මහණෙනි, ඉදින් සත්වයෝ ඉහාත්මයෙහි උපක්‍රම හේතුවෙන් සැප දුක් විඳිත් නම් එයින් ද තථාගත තෙම පැසසිය යුතුවේ. ඉදින් සත්වයෝ ඉහාත්මයෙහි උපක්‍රම හේතුවෙන් සැප දුක් නො විඳිත් නම් එයින් ද තථාගත තෙම පැසසිය යුතු වේ. මහණෙනි, තථාගත තෙම මෙ බඳු වාද ඇත්තේ වෙයි මහණෙනි, මෙ බඳු වාද ඇත්තා වූ තථාගතයන්ට හේතු යුක්ති සහගත වූ මේ පැසසිය යුතු කරුණු දසය පැමිණෙත්" යනු මෙය භාග්‍යවතුන් වහන්සේ වදාළේය. සතුටු සිත් ඇත්තා වූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තාහුය.

**දෙවදහ සූත්‍රය. නිමි. (1-2)**

---

## 2. පඤ්චත්තය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ අනේ පිඬු සිටුහු විසින් කරවන ලද, ජේතවනාරාමයෙහි වාසය කරන සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි,' කියා භික්ෂූන්ට කථා කළහ. 'පින්වතුන් වහන්සැයි' ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ අනාගතය කල්පනා කරන්නා වූ අනාගතය අනුව ගිය දෘෂ්ටි ඇත්තාවූ ඇතැම් මහණ බමුණන් ඇත්තාහ. (ඔව්හු) අනාගතය අරභයා නොයෙක් ආකාර දෘෂ්ටි දෘෂ්ටි දක්වන්නාවූ වචන ප්‍රකාශ කෙරෙත්. සංඥාවෙන් යුක්තවූ මරණින් පසු නිත්‍යවූ ආත්මයක් ඇතැයි, මෙසේ සමහරු ප්‍රකාශ කරත්. මරණින් මත්තෙහි සංඥාවෙන් යුක්ත නොවූ මරණින් පසු නිත්‍යවූ ආත්මයක් ඇතැයි සමහරු ප්‍රකාශ කරත්. මරණින් පසු සංඥාවක් ඇත්තේද නොවූ, නැත්තේද නොවූ, මරණින්

මතු නිත්‍යවූ ආත්මයක් ඇතැයි මෙසේ සමහරු කියත්. ඇත්තාවූ සත්වයාගේ මරණින් පසු සිදීම, ගැසීම, නොහට ගැණීම, හෝ පණවත්. මේ ආත්මයෙහි නිවණ හෝ සමහරු ප්‍රකාශ කරත්. මෙසේ මරණින් මතු නිත්‍යව පවත්නා ආත්මය හෝ පණවත්. ඇත්තාවූ සත්වයාගේ මරණින් පසු සිදීම, නැසීම, නො හට ගැණීම හෝ පණවත්. මේ ආත්මයෙහි නිවණ හෝ සමහරු ප්‍රකාශ කරත්. මෙසේ මේ කරුණු පසක්ව තුනක්වෙත්. තුනක්ව පසක් වෙත්. මේ පඤ්චත්තය පිළිබඳව සංක්ෂෙපයෙන් දැක්වීමයි.

2. "මහණෙනි, ඔවුන් අතුරෙහි යම් මේ මහණ බමුණු කෙනෙක් සංඥාවෙන් යුක්තවූ, මරණින් මතු නිත්‍යවූ, ආත්මය පණවත් ද? ඒ පින්වත් මහණ බමුණෝ මරණින් මතු රූප ඇත්තාවූ, නිත්‍යවූ, සංඥාවෙන් යුක්තවූ, ආත්මයක් හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ රූපය නැත්තාවූ මරණින් මතු නිත්‍යවූ, සංඥාවෙන් යුක්තවූ, ආත්මයක් හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ රූප ඇත්තාවූද, රූප නැත්තාවූද, මරණින් මතු නිත්‍යවූ සංඥාවෙන් යුක්තවූ, ආත්මයක් හෝ පණවත්ද, ඒ පින්වත් මහණ බමුණෝ රූප ඇත්තේත් නොවන්නාවූද, නැත්තේත් නොවන්නාවූද, මරණින් මතු නිත්‍යවූ සංඥාවෙන් යුක්තවූ ආත්මයක් හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ එක් සංඥාවක් ඇත්තාවූ මරණින් මතු නිත්‍යවූ සංඥාවෙන් යුක්තවූ ආත්මය හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ නොයෙක් සංඥා ඇත්තාවූ මරණින් මතු නිත්‍යවූ සංඥාවෙන් යුත් ආත්මයක් හෝ පණවත්ද, ඒ පින්වත් මහණ බමුණෝ හීන සංඥා ඇත්තාවූ මරණින් මතු නිත්‍යවූ සංඥාවෙන් යුත් ආත්මයක් හෝ පණවත්, ඒ පින්වත් මහණ බමුණෝ අප්‍රමාණ සංඥා ඇත්තාවූ මරණින් මතු නිත්‍යවූ සංඥාවෙන් යුක්ත ආත්මයක් හෝ පණවත්. මේ කියනලද සංඥා සත ඉක්මවන්ට හැකිවූ සමහරු මේ විඤ්ඤාණඤ්චායතනය හෝ අප්‍රමාණයයි කම්පා නො කළ හැකි යයි සමහරු කියත් මහණෙනි, ඒ මේ කාරණය තථාගතයන් වහන්සේ ඒ දෘෂ්ටීන්, දෘෂ්ටීන්ගේ හේතූන්, දෘෂ්ටීන්ගේ අරමුණුත් දන්නාහ.

3. යම් ඒ පින්වත් මහණ බමුණෝ මරණින් මතු නිත්‍යවූ සංඥාවෙන් යුක්තවූ ආත්මය පණවත්ද, ඒ පින්වත් මහණ බමුණෝ රූපය ඇත්තාවූ, මරණින් මතු නිත්‍යවූ, පින්වත් මහණ බමුණෝ රූප නැත්තාවූ, මරණින් මතු නිත්‍යවූ සංඥාවෙන් යුක්තවූ ආත්මය හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ රූප ඇත්තාවූද, අරූපි නැත්තාවූද, මරණින් මතු නිත්‍යවූ සංඥාවෙන් යුක්තවූ ආත්මය හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ රූප ඇත්තේත් නොවන්නාවූද, රූප නැත්තේත් නොවන්නාවූද, මරණින් මතු නිත්‍යවූ සංඥාවෙන් යුක්තවූ ආත්මය හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ එක් සංඥාවක් ඇත්තාවූ මරණින් මතු නිත්‍යවූ සංඥාවෙන් යුත් ආත්මය හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ නොයෙක් සංඥා ඇත්තාවූ මරණින් මතු නිත්‍යවූ සංඥාවෙන් යුත් ආත්මය හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ හීන සංඥා ඇත්තාවූ මරණින් මතු නිත්‍යවූ සංඥාවෙන් යුත් ආත්මය හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ අප්‍රමාණ සංඥා ඇත්තාවූ මරණින් මතු නිත්‍යවූ සංඥාවෙන් යුත් ආත්මය හෝ පණවත්. මේ රූප සහිත සංඥා අතුරෙන්ද, රූප නැති සංඥා අතුරෙන්ද, එකත්ත සංඥා අතුරෙන්ද නානත්ත සංඥා අතුරෙන්ද, යම් සංඥාවක් පිරිසිදුය, උතුම්ය, අග්‍රය, සියල්ලට වඩා උතුම් යයි කියනු ලැබේද, එය නාස්තිභාවප්‍රඥප්තිය අරමුණු කොට ඇති ආකිඤ්චඤ්ඤායතන සංඥාව අප්‍රමාණ වෙයි. කම්පා නො වේය යී සමහරු කියත්. එය ප්‍රත්‍යයෙන් හටගන්නා ලද්දකි. එහෙයින් ඖදාරික වේ. සංස්කාරයන්ගේ නිරොධයවූ නිවන ඇත්තේම ය. ඒ නිවන ඇත්තේය යි එසේ දැන ඒ සංස්කාරයන්ගේ නික්මීම දක්නා තථාගත තෙමේ ඒ සංස්කාරයන් ඉක්මීය.

4. "මහණෙනි, ඒ වාද අතුරෙන් යම් මේ මහණ බමුණ කෙනෙක් මරණින් මතු නිත්‍යවූ සංඥා නැත්තාවූ ආත්මය පණවත්ද, ඒ පින්වත් මහණ බමුණෝ, රූපය ඇත්තාවූ මරණින් මතු නිත්‍යවූ සංඥාවෙන් තොරවූ ආත්මයක් හෝ පණවත් ද, ඒ පින්වත් මහණ බමුණෝ රූපය නැත්තාවූ මරණින් මතු නිත්‍යවූ

සංඥාවෙන් තොරවූ ආත්මයක් හෝ පණවත්, ඒ පින්වත් මහණ බමුණෝ රූප ඇත්තාවූ ද රූප නැත්තාවූද, මරණින් මතු නිත්‍යවූ සංඥාවෙන් තොරවූ ආත්මයක් හෝ පණවත්ද, ඒ පින්වත් මහණ බමුණෝ රූප ඇත්තේත් නොවන්නාවූද සංඥාවෙන් තොරවූ ආත්මයක් හෝ පණවත්. මහණෙනි, ඒ වාද අතුරෙහි යම් ඒ මහණ බමුණෝ මරණින් මතු නිත්‍යවූ සංඥාවෙන් යුක්තවූ ආත්මයක් පණවත්ද, සමහරු ඔවුන් බැහැර කෙරෙත්. ඊට හේතු කවරේද? සංඥාව රෝගයකි, සංඥාව ගඩයකි, සංඥාව හුලකි යම් මේ සංඥා රහිත බවක් වේද, එය ශාන්තය, එය ප්‍රණීතය යි ඔව්හු සිතත්. මහණෙනි, තථාගත තෙමේ ඒ අසඥ භවයත් දන්නේය.

**5.** "යම් ඒ පින්වත් මහණ බමුණෝ මරණින් මතු නිත්‍යවූ සංඥාව නැත්තාවූ ආත්මය, පණවත්ද, ඒ පින්වත් මහණ බමුණෝ රූප ඇත්තාවූ මරණින් මතු නිත්‍යවූ සංඥා නැති ආත්මය හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ රූපය නැති මරණින් මත්තෙහි නිත්‍යවූ සංඥා නැති ආත්මය හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ රූප ඇත්තාවූද රූප නැත්තාවූද, මරණින් මතු නිත්‍යවූ සංඥා නැති ආත්මය හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ රූප ඇත්තේත් නොවන්නාවූද, නැත්තේත් නොවන්නාවූද, මතු නිත්‍යවූ සංඥා නැති ආත්මය හෝ පණවත්. මහණෙනි, යම් කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'මම රූපයෙන් වෙන්ව වේදනාවෙන් වෙන්ව, සංඥාවෙන් වෙන්ව, සංස්කාරයන්ගෙන් වෙන්ව, විඤ්ඤාණයාගේ (ප්‍රතිසන්ධි වශයෙන්) ඊම හෝ යාම හෝ චුතවීම හෝ ඉපදීම හෝ වැඩීම හෝ නැගීම හෝ මහත්වීම හෝ පණවන්නෙමියි.' මෙසේ කියන්නේද එසේ වීමට හේතු නැත්තේය. ඒ විඥානයද ප්‍රත්‍යයෙන් උපදින ලද්දකි. ඖදාරිකය සංස්කාරයන්ගේ නිරොධයෙක් ඇත්තේ මය. මෙය ඇතැයි මෙසේ දැන එයින් මිදීම දක්නා තථාගත තෙම එය ඉක්ම වූයේ වෙයි.

**6.** "මහණෙනි, ඔවුන් අතරෙහි යම් මේ මහණ බමුණෝ සංඥා ඇත්තෙත් නොවන්නාවූද නැත්තේත් නොවන්නාවූද

මරණින් මතු නිත්‍යවූ ආත්මය පණවත්ද, ඒ පින්වත් මහණ බමුණෝ රූපය ඇත්තාවූ මරණින් මතු නිත්‍යවූ සංඥා ඇත්තේත් නොවන්නාවූද නැත්තේත් නොවන්නාවූද ආත්මය හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ රූප නැත්තාවූ මරණින් මතු නිත්‍යවූ සංඥා ඇත්තේත් නොවන්නාවූද නැත්තේත් නොවන්නාවූද ආත්මය හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ රූප ඇත්තාවූද, රූප නැත්තාවූද මරණින් මතු නිත්‍යවූ සංඥා ඇත්තේත් නොවන්නාවූද නැත්තේත් නොවන්නාවූද, සංඥා ඇති ආත්මය හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ රූප ඇත්තේත් නොවූ රූප නැත්තේත් නොවූද, මරණින් මතු නිත්‍යවූ සංඥා ඇත්තේත් නොවූද සංඥා නැත්තේත් නොවූද ආත්මය හෝ පණවත්. මහණෙනි, ඔවුන් අතරෙහි යම් ඒ මහණ බමුණෝ මරණින් මතු නිත්‍යවූ සංඥා ඇති ආත්මය පණවත්ද, සමහරු ඔවුන් බැහැර යම් ඒ පින්වත් මහණ බමුණෝ මරණින් මතු නිත්‍යවූ සංඥා නැත්තාවූ ආත්මය පණවත්ද, සමහරු ඔවුන් බැහැරකරත්. ඊට හේතු කවරේද? 'සංඥාව රෝගයකි, සංඥාව ගඩයකි, සංඥාව හුලකි, අසංඥාව මුළාවකි. යම් මේ සංඥාව ඇත්තේත් නැති නැත්තේත් නැති බවක්වේ නම් එය ශාන්තය, එය ප්‍රණීතයයි' කියායි මහණෙනි, ඒ දෘෂ්ටියද තථාගත තෙම දන්නේය.

7. යම් ඒ පින්වත් මහණ බමුණෝ මරණින් මතු නිත්‍යවූ නොම සංඥා ඇත්තේත් නොවූ නැත්තේත් නොවූ ආත්මය පනවත්ද, ඒ පින්වත් මහණ බමුණෝ රූපය ඇත්තාවූ මරණින් මතු නිත්‍යවූ සංඥා ඇත්තේත් නැත්තේත් නොවූ ආත්මය හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ රූපය නැත්තාවූ මරණින් මතු නිත්‍යවූ සංඥාව ඇත්තේත් නොවූ නැත්තේත් නොවූ ආත්මය හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ රූපය ඇත්තාවූද, රූපය නැත්තාවූද, මරණින් මතු නිත්‍යවූ සංඥා ඇත්තේත් නොවූ නැත්තේත් නොවූ ආත්මය හෝ පණවත්. ඒ පින්වත් මහණ බමුණෝ රූපය ඇත්තේත් රූපය නැත්තේත් නොවූ මරණින් මතු නිත්‍යවූ සංඥා ඇත්තේත් නොවූ නැත්තේත් නොවූ ආත්මය හෝ පණවත්.

8. "මහණෙනි, යම් කිසි මහණ බමුණු කෙණෙක් ඇසින් දැකීමය, කණින් ඇසීමය, නාසයෙන්, දිවෙන්, කයෙන් දැනීමය යන මෙයින් දතයුතුවූ (දොරටු පසෙහි සංඥාවගේ පැතීම් මාත්‍රයෙන්) ඖදාරික සංස්කාරයන්ගේ පැවැත්මෙන් මේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනයාගේ ලැබීම පණවත්. මහණෙනි, 'සමාපත්තියෙන් නැගිටීම වන හෙයින් විනාශයක්ම මේ ආයතනයාගේ ලැබීම පිණිස කියයි. මහණෙනි, මේ නෙවසංඤ්ඤානාසංඤ්ඤායතනයට පැමිණීම ඖදාරික සංස්කාරයන්ගේ පැවැත්මෙන් පැමිණිය යුතුයයි' කියනු නොලැබේ. මහණෙනි, මෙය සංස්කාර විශෙෂයක් සහිත සමාපත්තියෙන් පැමිණිය යුතු ආයතනයයි කියනු ලැබේ. එයද ප්‍රත්‍යයෙන් උපදවන ලද්දකි. ඖදාරිකද වේ. සංස්කාරයන්ගේ නිරොධයෙක් ඇත්තේමය. එය ඇතැයි, මෙසේ දැන ඔහුගේ මිදීම දක්නා තථාගත තෙමේ එය ඉක්මවන ලද්දේ වෙයි.

9. "මහණෙනි, ඒ වාදයන් අතර යම් ඒ මහණ බමුණෝ ඇත්තාවූ සත්වයාගේ උච්ඡේදය, විනාසය, නොවීම පණවත්ද, මහණෙනි, එහි යම් ඒ මහණ බමුණෝ මරණින් මතු නිත්‍යවූ සංඥා ඇති ආත්මය පණවත්ද, සමහරු ඔවුන් බැහැර කරත්. යම් ඒ පින්වත් මහණ බමුණෝ මරණින් මතු නිත්‍යවූ සංඥා නැත්තාවූ ආත්මය පණවත්ද, සමහරු බැහැර කරත්. යම් ඒ පින්වත් මහණ බමුණෝ මරණින් මතු නිත්‍යවූ සංඥා ඇත්තේත් නැති නැත්තේත් නැති ආත්මය පණවත්ද, සමහරු ඔවුන් බැහැර කරත්. ඊට හෙතු කවරේද? ඒ සියළුම පින්වත් මහණ බමුණෝ 'අනාගතයෙහි සැරිසරන්නාවූ මෙසේ පරලොව වන්නෙමු. මෙසේ පරලොව වන්නෙමුයි' ඇලීමම කියන්නාහු වෙති. යම්සේ නම් වෙළඳාමට යන්නාවූ වෙළෙන්දාට 'මෙයින් මට මෙය වන්නේය, මෙයින් මෙය එපරිද්දෙන්ම පරලොව මෙසේ වන්නෙමු. පරලොව මෙසේ වන්නෙමුයි,' සිතන්නාවූ මේ පින්වත් මහණ බමුණෝ වෙළඳුන්ට බඳු උපමා ඇත්තාහුයයි වැටහෙත්. මහණෙනි, මෙයද තථාගත තෙමේ දන්නේය.

10. "යම් ඒ පින්වත් මහණ බමුණෝ ඇත්තාවූ සත්වයාගේ උච්ඡේදය, විනාශය, හට නොගැණීම, පණවත්ද, ඔව්හු ත්‍රිවිධ

භවයට භය වන්නාහු, ත්‍රිවිධ භවය පිළිකුල් කරන්නාහු ත්‍රිවිධ භවය අනුවමම දුවත්. ත්‍රිවිධ භවය අනුව පෙරළෙත්. යම්සේ සුනඛයෙක් බලුදමින් බඳනා ලද්දේ, දැඩිවූ කණුවක හෝ හුලක හෝ බඳින ලද්දේ, එම වැලත් සමග හෝ හුලත් සමඟ හෝ දුවන්නේද, ගමන් කරන්නේද, එමෙන් එපරිද්දෙන්ම මේ පින්වත් මහණ බමුණෝ සත්වයාගේ පැවැත්මට භය ඇත්තාහු සත්වයාගේ පැවැත්මට පිළිකුල් කරන්නාහු සත්වයාගේ පැවැත්ම අනුවමම දුවත්, අනුවමම පෙරළෙත්. ඒ එයද ප්‍රත්‍යයෙන් කරණ ලද්දක් වේ. එහෙයින්ම ඖදාරිකවේ. සංස්කාරයන්ගේ නිරොධයෙක් ඇත්තේමය. ඒ නිරොධය ඇතැයි මෙසේ දැන සංස්කාරයන් ගෙන් මිදීම දක්නා තථාගත තෙමේ එය ඉක්මවූයේ වෙයි.

11. "මහණෙනි, සත්වයන්ගේ අනාගතය කල්පනා කරන්නාවූ අනාගතය අනුව ගිය දෘෂ්ටි ඇත්තාවූ යම්කිසි මහණ කෙනෙක් හෝ බමුණු කෙනෙක් හෝ වෙත්ද, ඔව්හු අනාගතය අරබයා අනෙක ප්‍රකාරවූ දෘෂ්ටි දක්වන්නාවූ, වචන කියත්ද? ඒ සියල්ලෙන් මේ කරුණු පසම කියත්. එයින් එක්තරා කරුණක් හෝ කියත්.

12. "මහණෙනි, සත්වයන්ගේ අතීතය කල්පනා කරන්නාවූ අතීතය අනුව ගිය දෘෂ්ටි ඇත්තාවූ ඇතැම් මහණ බමුණෝ වෙත්. ඔව්හු අතීතය අරබයා අනෙකප්‍රකාරවූ දෘෂ්ටි දක්වන්නාවූ වචන කියත්. 'ආත්මයද, ලොකයද සදා කාලිකය මෙයම සත්‍යය, මෙයින් අන්‍ය කියුම් හිස්යයි' මෙසේ සමහරු කියත්. 'ආත්මයද ලොකයද සදාකාලික නොවේ. මෙයම සත්‍යය, මෙයින් අන්‍ය කියුම් හිස්යයි,' මෙසේ සමහරු කියත්. 'ආත්මයද ලොකයද, සදාකාලිකද වේ. සදාකාලික නොවන්නේද වේ. මෙයම සත්‍යයයි. මෙයින් අන්‍ය කියුම් සිස්යයි,' මෙසේ සමහරු කියත්. 'ආත්මයද ලොකයද, සදාකාලික වන්නේද නොවේ. සදාකාලික නොවන්නේද නොවේ. මෙයම සත්‍යයයි මෙයින් අන්‍යය හිස්යයි.' මෙසේ සමහරු කියත්. 'ආත්මයද ලොකයද කෙළවරක් ඇත්තේය. මෙයම සත්‍යය, අන්‍යය සිස්යයි,' මෙසේ සමහරු

කියත්. 'ආත්මයද ලොකයද, කෙළවරක් නැත්තේය, මෙයම සත්‍යය අන්‍යය සිස්යයි.' මෙසේ සමහරු කියත්. 'ආත්මයද ලොකයද කෙළවරක් ඇත්තේද නොවේ. කෙළවරක් නැත්තේද වේ, මෙයම සත්‍යය අන්‍යය සිස්යයි' මෙසේ සමහරු කියත්. 'ආත්මයද ලොකයද කෙළවරක් ඇත්තේද නොවේ. කෙළවරක් නැත්තේද වේ. මෙයම සත්‍යය අන්‍යය සිස්යයි' මෙසේ සමහරු කියත්. 'ආත්මයද ලොකයද නොයෙක් සංඥා ඇත්තේ වෙයි. මෙයම සත්‍යය අන්‍යය සිස්යයි' මෙසේ සමහරු කියත් 'ආත්මයද ලොකයද නොයෙක් සංඥා ඇත්තේවේ. මෙයම සත්‍යය අන්‍යය සිස්යයි' මෙසේ සමහරු කියත්. 'ආත්මයද ලොකයද හීන සංඥා ඇත්තේවේ. මෙයම සත්‍යය අන්‍යය සිස්යයි' මෙසේ සමහරු කියත්. 'ආත්මයද ලොකයද අප්‍රමාණ සංඥා ඇත්තේවේ. මෙයම සත්‍යය අන්‍යය සිස් යයි' මෙසේ සමහරු කියත්. 'ආත්මයද ලොකයද ඒකාන්ත සැප ඇත්තේ වේ. මෙයම සත්‍යය අන්‍යය සිස් යයි' මෙසේ සමහරු කියත්. 'ආත්මයද ලොකයද ඒකාන්ත දුක් ඇත්තේවේ. මෙයම සත්‍යය අන්‍යය සිස් යයි' මෙසේ සමහරු කියත්. 'ආත්මයද ලොකයද දුක සැප දෙකම ඇත්තේවේ. මෙයම සත්‍යය අන්‍යය සිස් යයි' මෙසේ සමහරු කියත්. 'ආත්මයද ලොකයද දුක් ඇත්තේත් නොවේ. සැප ඇත්තේත් නොවේ. මෙයම සත්‍යය අන්‍යය සිස් යයි' මෙසේ සමහරු කියත්.

13. "මහණෙනි, ඔවුන් අතර යම් ඒ මහණ බමුණෝ මෙබඳුවාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, ඒකාන්තයෙන් ඔවුන්ට ආත්මයද, ලොකයද, ශාස්වතය, මෙයම සත්‍යය අනික සිස්ය යන ඇදහීමෙන් තොරව කැමැත්තෙන් තොරව ඇසීමෙන් තොරව ආකාර කල්පනා කිරීමෙන් තොරව සිතින් බැසගැනීමෙන් තොරව පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම ඥාණය වන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම නුවණ නැති කල්හි ඒ පින්වත් මහණ බමුණෝ යම් ඥාණ කොටස් මාත්‍රයක්ම පිරිසිදු කෙරෙත්ද, එයම මේ පින්වත් මහණ බමුණන්ගේ දැඩි කොටගත් දෘෂ්ටියයි කියනු ලැබේ. ඒ මේ දැඩිව ගත් දෘෂ්ටිය ප්‍රත්‍යයෙන් කරණ ලද්දකි. එහෙයින් ඖදාරිකවේ.

සංස්කාරයන්ගේ නිරෝධයෙක් ඇත්තේමය. මෙය ඇත්තේයයි මෙසේ දැන ඒ සංස්කාරයන්ගේ මිදීම දක්නා තථාගතතෙමේ එය ඉක්මවූයේවේ.

14. "මහණෙනි, ඔවුන් අතර යම් ඒ මහණ බමුණෝ මෙබඳුවාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, 'ආත්මයද ලොකයද සදාකාලික නොවේ. මෙයම සත්‍යය අනික හිස් යයි' ඒකාන්තයෙන් ඔවුන්ගේ ශ්‍රද්ධාවෙන් තොරවම කැමැත්තෙන් තොරව අනුශ්‍රවණයෙන් තොරව ආකාර පරිවිතර්කයෙන් තොරව පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම ඥානය වන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම නුවණ නැති කල්හි, ඒ පින්වත් මහණ බමුණෝ යම් ඤාණභාග මාත්‍රයක්ම පිරිසිදු කෙරෙත්ද, එයම ඒ පින්වත් මහණ බමුණන්ගේ දෘෂ්ටි උපාදානයයි කියනු ලැබේ. ඒ මේ දෘෂ්ටි උපාදානය සංස්කරණය කරණ ලද්දේය. එහෙයින් ඖදාරික වේ. සංස්කාරයන්ගේ නිරොධයෙක් ඇත්තේමය. මෙය ඇත්තේ යයි මෙසේ දැන, ඔහුගේ නිවණ දක්නා සුළුවූ තථාගත තෙමේ එය ඉක්මවූයේ වේ.

15. "මහණෙනි, ඔවුන් අතර යම් ඒ මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, 'ආත්මයද ලොකයද සදාකාලිකද වේ. සදාකාලික නොවන්නේද මෙයම සත්‍යය. අනික හිස්යයි' ඒකාන්තයෙන් ඔවුන්ගේ ශ්‍රද්ධාවෙන් තොරවම, කැමැත්තෙන් තොරවම, අනුශ්‍රවණයෙන් තොරව, ආකාර පරිවිතර්කයෙන් තොරව පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම ඥානය වන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම නුවණ නැති කල්හි, ඒ පින්වත් මහණ බමුණෝ යම් ඤාණභාග මාත්‍රයක්ම පිරිසිදු කෙරෙත්ද, එයම ඒ පින්වත් මහණ බමුණන්ගේ දෘෂ්ටි උපාදානයයි කියනු ලැබේ. ඒ මේ දෘෂ්ටි උපාදානය සංස්කරණය කරණ ලද්දේය. එහෙයින් ඖදාරික වේ. සංස්කාරයන්ගේ නිරොධයක් ඇත්තේමය මෙය ඇත්තේයයි මෙසේ දැන, ඔහුගේ නිවණ දක්නාසුළුවූ තථාගත තෙමේ එය ඉක්මවූයේ වේ.

16. "මහණෙනි, ඔවුන් අතර යම් ඒ මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහුවෙත්ද ආත්මයද ලොකයද නොමසදාකාලික නොවන්නේද, සදාකාලික නොවන්නේද නොවේ. මෙයම සත්‍යය අනික හිස්යයි ඒකාන්තයෙන් ඔවුන්ගේ ශ්‍රද්ධාවෙන් තොරවම කැමැත්තෙන් තොරව අනුශ්‍රවණයෙන් තොරව ආකාර පරිවිතර්කයෙන් තොරව පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම ඥානය වන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම නුවණ නැති කල්හි, ඒ පින්වත් මහණ බමුණෝ යම් ඥාණභාග මාත්‍රයක්ම පිරිසිදු කෙරෙත්ද එයම ඒ පින්වත් මහණ බමුණන්ගේ දෘෂ්ටි උපාදානයයි කියනු ලැබේ. ඒ මේ දෘෂ්ටි උපාදානය සංස්කරණය කරණ ලද්දේය. එහෙයින් ඖදාරික වේ. සංස්කාරයන්ගේ නිරොධයක් ඇත්තේමය. මෙය ඇත්තේයයි මෙසේ දැන, ඔහුගේ නිවණ දක්නාසුළුවූ තථාගත තෙමේ එය ඉක්මවූයේ වේ.

17. "මහණෙනි, ඔවුන් අතර යම් ඒ මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, 'ආත්මයද ලොකයද කෙළවර ඇත්තේ වේ. මෙයම සත්‍යය. අනික හිස්යයි, ඒකාන්තයෙන් ඔවුන්ගේ ශ්‍රද්ධාවෙන් තොරවම කැමැත්තෙන් තොරව අනුශ්‍රවණයෙන් තොරව ආකාර පරිවිතර්කයෙන් තොරව පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම ඥානය වන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම නුවණ නැති කල්හි ඒ පින්වත් මහණ බමුණෝ යම් ඥාණභාග මාත්‍රයක්ම පිරිසිදු කෙරෙත්ද එයම ඒ පින්වත් මහණ බමුණන්ගේ දෘෂ්ටි උපාදානයයි කියනු ලැබේ. ඒ මේ දෘෂ්ටි උපාදානය සංස්කරණය කරණ ලද්දේය. එහෙයින් ඖදාරික වේ. සංස්කාරයන්ගේ නිරොධයෙක් ඇත්තේමය. මෙය ඇත්තේයයි මෙසේ දැන ඔහුගේ නිවණ දක්නාසුළුවූ තථාගත තෙමේ එය ඉක්මවූයේ වේ.

18. "මහණෙනි, ඔවුන් අතර යම් ඒ මහණබමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, ආත්මයද ලොකයද

කෙළවර නැත්තේ වේ. මෙයම සත්‍යය අනික හිස්යයි ඒකාන්තයෙන් ඔවුන්ගේ ශ්‍රද්ධාවෙන් තොරවම කැමැත්තෙන් තොරව අනුශ්‍රවණයෙන් තොරව ආකාර පරිවිතර්කයෙන් තොරව පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම ඥානය වන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම නුවණ නැති කල්හි, ඒ පින්වත් මහණබමුණෝ යම් ඤාණභාග මාත්‍රයක්ම පිරිසිදු කෙරෙත්ද එයම ඒ පින්වත් මහණ බමුණන්ගේ දෘෂ්ටි උපාදානයයි කියනු ලැබේ. ඒ මේ දෘෂ්ටි උපාදානය සංස්කරණය කරණ ලද්දේය. එහෙයින් ඖදාරික වේ. සංස්කාරයන්ගේ නිරොධයෙක් ඇත්තේමය. මෙය ඇත්තේයයි මෙසේ දැන, ඔහුගේ නිවණ දක්නාසුළුවූ තථාගත තෙමේ එය ඉක්මවූයේ වේ.

**19** "මහණෙනි, ඔවුන් අතර යම් ඒ මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, ආත්මයද ලොකයද කෙළවර ඇත්තේද කෙළවර නැත්තේ දවේ. මෙයම සත්‍යය අනික හිස්යයි ඒකාන්තයෙන් ඔවුන්ගේ ශ්‍රද්ධාවෙන් තොරවම කැමැත්තෙන් තොරව අනුශ්‍රවණයෙන් තොරව ආකාර පරිවිතර්කයෙන් තොරව පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම ඥානය වන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ මහණෙනි, පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම නුවණ නැති කල්හි, ඒ පින්වත් මහණ බමුණෝ යම් ඤාණභාග මාත්‍රයක්ම පිරිසිදු කෙරෙත්ද, එයම ඒ පින්වත් මහණ බමුණන්ගේ දෘෂ්ටි උපාදානයයි කියනු ලැබේ. ඒ මේ දෘෂ්ටි උපාදානය සංස්කරණය කරණ ලද්දේය. එහෙයින් ඖදාරික වේ. සංස්කාරයන්ගේ නිරොධයෙක් ඇත්තේමය. මෙය ඇත්තේයයි මෙසේ දැන, ඔහුගේ නිවණ දක්නාසුළුවූ තථාගත තෙමේ එය ඉක්මවූයේ වේ.

**20** "මහණෙනි, ඔවුන් අතර යම් ඒ මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, 'ආත්මයද ලොකයද නොමකෙළවර ඇත්තේද නොමකෙළවර නැත්තේද වේ. මෙයම සත්‍යය අනික හිස්යයි' ඒකාන්තයෙන් ඔවුන්ගේ ශ්‍රද්ධාවෙන් තොරවම කැමැත්තෙන් තොරව අනුශ්‍රවණයෙන්

තොරව ආකාර පරිවිතර්කයෙන් තොරව පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම ඥානය වන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම නුවණ නැති කල්හි, ඒ පින්වත් මහණ බමුණෝ යම් ඤාණභාග මාත්‍රයක්ම පිරිසිදු කෙරෙත්ද, එයම ඒ පින්වත් මහණ බමුණන්ගේ දෘෂ්ටි උපාදානයයි කියනු ලැබේ. ඒ මේ දෘෂ්ටි උපාදානය සංස්කරණය කරණ ලද්දේය. එහෙයින් ඖදාරික වේ. සංස්කාරයන්ගේ නිරොධයෙක් ඇත්තේමය. මෙය ඇත්තේයයි මෙසේ දැන, ඔහුගේ නිවණ දක්නාසුළුවූ තථාගත තෙමේ එය ඉක්මවූයේ වේ.

21. "මහණෙනි, ඔවුන් අතර යම් ඒමහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, 'ආත්මයද ලොකයද එක් සංඥා ඇත්තේ වේ. මෙයම සත්‍යය, අනික හිස්යයි' එකාන්තයෙන් ඔවුන්ගේ ශ්‍රද්ධාවෙන් තොරවම කැමැත්තෙන් තොරව අනුශ්‍රවණයෙන් තොරව ආකාර පරිවිතර්කයෙන් තොරව පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම ඥානය වන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, පිරිසිදුවූ නිමලවූ ප්‍රත්‍යක්ෂවූම නුවණ නැති කල්හි, ඒ පින්වත් මහණ බමුණෝ යම් ඤාණභාග මාත්‍රයක්ම පිරිසිදු කෙරෙත්ද එයම ඒ පින්වත් මහණ බමුණන්ගේ දෘෂ්ටි උපාදානයයි කියනු ලැබේ ඒ මේ දෘෂ්ටි උපාදානය සංස්කරණය කරණ ලද්දේය. එහෙයින් ඖදාරික වේ. සංස්කාරයන්ගේ නිරොධයෙක් ඇත්තේමය. මෙය ඇත්තේයයි මෙසේ දැන, ඔහුගේ නිවණ දක්නාසුළුවූ තථාගත තෙමේ එය ඉක්මවූයේ වේ.

22 "මහණෙනි, ඔවුන් අතර යම් ඒ මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, 'ආත්මයද ලොකයද නොයෙක් සංඥා ඇත්තේ වේ. මෙයම සත්‍යය, අනික හිස්යයි' එකාන්තයෙන් ඔවුන්ගේ ශ්‍රද්ධාවෙන් තොරවම කැමැත්තෙන් තොරව අනුශ්‍රවණයෙන් තොරව ආකාර පරිවිතර්කයෙන් තොරව පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම ඥානය වන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි,

පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම නුවණ නැති කල්හි ඒ පින්වත් මහණ බමුණෝ යම් ඥාණභාග මාත්‍රයක්ම පිරිසිදු කෙරෙත්ද, එයම ඒ පින්වත් මහණ බමුණගේ දෘෂ්ටි උපාදානයයි කියනු ලැබේ. ඒ මේ දෘෂ්ටි උපාදානය සංස්කරණය කරණ ලද්දේය. එහෙයින් ඖදාරික වේ සංස්කාරයන්ගේ නිරොධයෙක් ඇත් මෙය ඇත්තේයයි මෙසේ දැන, ඔහුගේ නිවණ දක්නාසුළුවූ තථාගත තෙමේ එය ඉක්මවූයේ වේ.

23. 'මහණෙනි, ඔවුන් අතර යම් ඒ මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහුද වෙත්ද 'ආත්මයද ලොකයද හීන සංඥා ඇත්තේ වේ. මෙයම සත්‍යය, අනික හිස්යයි, ඒකාන්තයෙන් ඔවුන්ගේ ශ්‍රද්ධාවෙන් තොරවම කැමැත්තෙන් තොරව අනුශ්‍රවණයෙන් තොරව ආකාර පරිවිතර්කයෙන් තොරව පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම ඥානය වන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම නුවණ නැති කල්හි, ඒ පින්වත් මහණ බමුණෝ යම් ඥාණභාග මාත්‍රයක්ම පිරිසිදු කෙරෙත්ද, එයම ඒ පින්වත් මහණ බමුණන්ගේ දෘෂ්ටි උපාදානයයි කියනු ලැබේ. ඒ මේ දෘෂ්ටි උපාදානය සංස්කරණය කරණ ලද්දේය. එහෙයින් ඖදාරික වේ. සංස්කාරයන්ගේ නිරොධයෙක් ඇත්තේමය. මෙය ඇත්තේයයි මෙසේ දැන ඔහුගේ නිවණ දක්නාසුළුවූ තථාගත තෙමේ එය ඉක්මවූයේ වේ.

24. "මහණෙනි, ඔවුන් අතර යම් ඒ මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, 'ආත්මයද ලොකයද අප්‍රමාණ සංඥා ඇත්තේ වේ. මෙයම සත්‍යය, අනික හිස්යයි' ඒකාන්තයෙන් ඔවුන්ගේ ශ්‍රද්ධාවෙන් තොරවම කැමැත්තෙන් තොරව, අනුශ්‍රවණයෙන් තොරව, ආකාර පරිවිතර්කයෙන් තොරව, පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම ඥානය වන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම නුවණ නැති කල්හි, ඒ පින්වත් මහණ බමුණෝ යම් ඥාණභාග මාත්‍රයක්ම පිරිසිදු කෙරෙත්ද, එයම ඒ පින්වත් මහණ බමුණන්ගේ දෘෂ්ටි උපාදානයයි කියනු

ලැබේ. ඒ මේ දෘෂ්ටි උපාදානය සංස්කරණය කරණ ලද්දේය. එහෙයින් ඖදාරික වේ. සංස්කාරයන්ගේ නිරොධයෙක් ඇත්තේමය. මෙය ඇත්තේයයි මෙසේ දැන, ඔහුගේ නිවණ දක්නාසුළුවූ තථාගත තෙමේ එය ඉක්මවූයේ වේ.

**25** "මහණෙනි, ඔවුන් අතර යම් ඒ මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, 'ආත්මයද ලොකයද ඒකාන්ත සැප ඇත්තේ වේ. මෙයම සත්‍යය, අනික හිස්යයි' ඒකාන්තයෙන් ඔවුන්ගේ ශ්‍රද්ධාවෙන් තොරවම කැමැත්තෙන් තොරව, අනුශ්‍රවණයෙන් තොරව, ආකාර පරිවිතර්කයෙන් තොරව, පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම ඥානය වන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම නුවණ නැති කල්හි, ඒ පින්වත් මහණ බමුණෝ යම් ඥාණභාග මාත්‍රයක්ම පිරිසිදු කෙරෙත්ද, එයම ඒ පින්වත් මහණ බමුණන්ගේ දෘෂ්ටි උපාදානයයි කියනු ලැබේ. ඒ මේ දෘෂ්ටි උපාදානය සංස්කරණය කරණ ලද්දේය. එහෙයින් ඖදාරිකවේ. සංස්කාරයන්ගේ නිරොධයෙක් ඇත්තේමය. මෙය ඇත්තේයයි මෙසේ දැන, ඔහුගේ නිවණ දක්නාසුළුවූ තථාගත තෙමේ එය ඉක්මවූයේ වේ.

**26.** "මහණෙනි, ඔවුන් අතර යම් ඒ මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, 'ආත්මයද ලොකයද ඒකාන්ත දුක් ඇත්තේ වේ. මෙයම සත්‍යය, අනික හිස්යයි' ඒකාන්තයෙන් ඔවුන්ගේ ශ්‍රද්ධාවෙන් තොරවම කැමැත්තෙන් තොරව අනුශ්‍රවණයෙන් තොරව ආකාර පරිවිතර්කයෙන් තොරව පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම ඥානය වන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම නුවණ නැති කල්හි, ඒ පින්වත් මහණ බමුණෝ යම් ඥාණභාග මාත්‍රයක්ම පිරිසිදු කෙරෙත්ද, එයම ඒ පින්වත් මහණ බමුණන්ගේ දෘෂ්ටි උපාදානයයි කියනු ලැබේ. ඒ මේ දෘෂ්ටි උපාදානය සංස්කරණය කරණ ලද්දේය. එහෙයින් ඖදාරික වේ. සංස්කාරයන්ගේ නිරොධයෙක් ඇත්තේමය. මෙය ඇත්තේයයි මෙසේ දැන ඔහුගේ නිවණ දක්නාසුළුවූ තථාගත තෙමේ එය ඉක්මවූයේ වේ.

27. "මහණෙනි, ඔවුන් අතර යම් ඒ මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, 'ආත්මයද ලොකයද සැප දුක් ඇත්තේ වේ. මෙයම සත්‍යය, අනික හිස්යයි' ඒකාන්තයෙන් ඔවුන්ගේ ශ්‍රද්ධාවෙන් තොරවම කැමැත්තෙන් තොරව අනුශ්‍රවණයෙන් තොරව ආකාර පරිවිතර්කයෙන් තොරව පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම ඥානය වන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම නුවණ නැති කල්හි, ඒ පින්වත් මහණ බමුණෝ යම් ඤාණභාග මාත්‍රයක්ම පිරිසිදු කෙරෙත්ද, එයම ඒ පින්වත් මහණ බමුණන්ගේ දෘෂ්ටි උපාදානයයි කියනු ලැබේ. ඒ මේ දෘෂ්ටි උපාදානය සංස්කරණය කරණ කරණ ලද්දේය. එහෙයින් ඖදාරික වේ. සංස්කාරයන්ගේ නිරොධයෙක් ඇත්තේමය. මෙය ඇත්තේයයි මෙසේ දැන ඔහුගේ නිවණ දක්නාසුළුවූ තථාගත තෙමේ එයඉක්ම වූයේවේ.

28. "මහණෙනි, ඔවුන් අතර යම් ඒ මහණ බමුණෝ මෙබඳු වාද ඇත්තාහු මෙබඳු දෘෂ්ටි ඇත්තාහු වෙත්ද, 'ආත්මයද ලොකයද දුකද නැත්තේ සැපද නැත්තේ වේ. මෙයම සත්‍යය, අන්‍ය සිස්යයි' ඒකාන්තයෙන් ඔවුන්ට ශ්‍රද්ධාවෙන් වෙන්ව, කැමැත්තෙන් වෙන්ව, ඇසීමෙන් වෙන්ව, ආකාර කල්පනාවෙන් වෙන්ව, සිතින් බැසගැනීමෙන් වෙන්ව, පිරිසිදුවූ නිර්මලවූ ප්‍රත්‍යක්ෂවූම ඥානය වන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේ. මහණෙනි, ප්‍රත්‍යක්ෂයෙන්ම පිරිසිදුවූ නිර්මලවූ ඥානය නැති කල්හි ඒ පින්වත් මහණ බමුණෝ එහි යම් ඥාන කොට්ඨාශ මාත්‍රයක්ම පිරිසිදු කෙරෙත්ද, එයම ඒ පින්වත් මහණ බමුණන්ගේ දැඩිව ගත් දෘෂ්ටියයි කියනු ලැබේ. ඒ මේ දැඩිව ගත් දෘෂ්ටිය ප්‍රත්‍යයෙන් කරණ ලද්දකි. එහෙයින් ඖදාරිකවේ සංස්කාරයන්ගේ නිරොධයෙක් ඇත්තේමය. එය ඇතැයි මෙසේ දැන ඒ සංස්කාරයන්ගේ මිදීම දක්නා තථාගත තෙමේ එය ඉක්මවූයේ වේ.

29 'මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ අතීතය අනුව ගියාවූ දෘෂ්ටි දුරලීමෙන්ද,

අනාගතය අනුව ගියාවූ දෘෂ්ටින් දුරලීමෙන්ද, සියලු ආකාරයෙන් කාම සංයොජනයන්ගේ නොසිටීමෙන්ද, මේ ධ්‍යාන ප්‍රීතියට පැමිණ වාසය කරමි' යන යමක් වේද, මෙය ශාන්තය, මෙය ප්‍රණීතයයි, ධ්‍යාන ප්‍රීතියට පැමිණ වාසය කරයි ඔහුගේ ඒ ධ්‍යාන ප්‍රීතිය නිරුද්ධවේ. ධ්‍යාන ප්‍රීතිය නිරුද්ධවීමෙන් දොම්නස උපදියි. දොම්නස නිරුද්ධවීමෙන් ධ්‍යාන ප්‍රීතිය උපදියි.

30. "මහණෙනි, යම්සේ ඡායාව යමක් අත්හරීද, එහි අව්ව පැතිරෙයිද, අව්ව යමක් අත්හරීද, එහි ඡායාව පැතිරේද, මහණෙනි, එමෙන්ම ධ්‍යාන ප්‍රීතියගේ නිරුද්ධවීමෙන් දොම්නස උපදියි. දොම්නස නිරුද්ධවීමෙන් ධ්‍යාන ප්‍රීතිය උපදියි.

"මහණෙනි, මේ පින්වත් මහණ තෙමේ හෝ බ්‍රාහ්මණ තෙමේ හෝ අතීතය අනුව ගියාවූ දෘෂ්ටි දුරලීමෙන්ද, අනාගතය අනුව ගියාවූ දෘෂ්ටි දුරලීමෙන්ද, සියලු ආකාරයෙන් කාම තෘෂ්ණාවන්ගේ නොපිහිටීමෙන් මේ ධ්‍යාන ප්‍රීතියට පැමිණ වාසය කරමියි, යන යමක්වේද, මෙය ශාන්තය. මෙය ප්‍රණීතයයි ධ්‍යාන ප්‍රීතියට පැමිණ වාසය කරයි. ඔහුගේ ඒ ධ්‍යාන ප්‍රීතිය නිරුද්ධ වේ. ධ්‍යාන ප්‍රීතිය නිරුද්ධවීමෙන් දොම්නස උපදියි. දොම්නස නිරුද්ධ වීමෙන් ධ්‍යාන ප්‍රීතිය උපදියි ඒ මේ ප්‍රීතිය ප්‍රත්‍යයෙන් උපදින ලද්දක්වේ. එහෙයින් ඖදාරිකවේ. සංස්කාරයන්ගේ නිරොධය ඇත්තේ යයි තථාගත තෙම දන්නේය. මෙසේ දැන ඒ දෘෂ්ටියෙන් මිදීම දක්නා තථාගත තෙමේ එය ඉක්ම වූයේ වේ.

31. "මහණෙනි, මේ ලොකයෙහි වනාහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ අතීතය අනුව ගියාවූ දෘෂ්ටි දුරලීමෙන්ද, අනාගතය අනුව ගියාවූ දෘෂ්ටි දුරලීමෙන්ද, සියලු ආකාරයෙන් කාම තෘෂ්ණාවන්ගේ නොපිහිටීමෙන් ධ්‍යාන ප්‍රීතිය ඉක්මවීමෙන් නිරාමිස (ලෞකික ආශා නැති) ප්‍රීතියට පැමිණ වාසය කරමි යන යමක්වේද, එය ශාන්තය, එය ප්‍රණීතයයි නිරාමිෂවූ සැපයට පැමිණ වාසය කරයි. ඔහුගේ ඒ නිරාමිෂ සැපය නිරුද්ධවේ. නිරාමිෂ සැපය නිරුද්ධ වීමෙන් ධ්‍යාන ප්‍රීතිය උපදියි. ධ්‍යාන ප්‍රීතිය නිරුද්ධ වීමෙන් නිරාමිෂවූ සැපය උපදියි.

"මහණෙනි, යම්සේ ඡායාව යමක් අත්හරීද, එහි අව්ව පැතිරෙයිද, අව්ව යමක් අත්හරීද, එහි ඡායාව පැතිරේද, මහණෙනි, එපරිද්දෙන්ම නිරාමිෂවූ සැපය නිරුද්ධ වීමෙන් ධ්‍යාන ප්‍රීතිය උපදියි. ධ්‍යාන ප්‍රීතිය නිරුද්ධ වීමෙන් නිරාමිෂවූ සැපය උපදියි. මහණෙනි, මේ පින්වත් මහණතෙමේ හෝ බමුණුතෙමේ හෝ අතීතය අනුව ගියාවූ දෘෂ්ටි දුරලීමෙන්ද, අනාගතය අනුව ගියාවූ දෘෂ්ටි දුරලීමෙන්ද, සියලු ආකාරයෙන් කාමතෘෂ්ණාවන්ගේ පිහිටීම දුරලීමෙන්ද, ධ්‍යාන ප්‍රීතිය ඉක්ම වීමෙන් නිරාමිෂවූ සැපයට පැමිණ වාසය කරමි. යන මේ යමක් වේද, එය ශාන්තය, එය ප්‍රණීතයයි, නිරාමිෂ සැපයට පැමිණ වාසය කරයි. ඔහුගේ ඒ නිරාමිෂ සැපය නිරුද්ධවේ. නිරාමිෂ සැපය නිරුද්ධ වීමෙන් ධ්‍යාන ප්‍රීතිය උපදියි. ධ්‍යාන ප්‍රීතිය නිරුද්ධ වීමෙන් නිරාමිෂ සැපය උපදියි ඒ මේ සැපය ප්‍රත්‍යයෙන් උපදින ලද්දකි. එහෙයින් ඖදාරිකවේ. සංස්කාරයන්ගේ නිරෝධයෙක් ඇත්තේය. යන මේ කාරණය තථාගත තෙමේ දන්නේය.

"මෙසේ දැන ඒ දෘෂ්ටියෙන් මිදීම දන්නා තථාගත තෙමේ එය ඉක්මවූයේ වෙයි.

32. "මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ අතීතය අනුව ගියාවූ දෘෂ්ටි දුරලීමෙන්ද, අනාගතය අනුව ගියාවූ දෘෂ්ටි දුරලීමෙන්ද, සියලු ආකාරයෙන් කාම තෘෂ්ණාවන්ගේ පිහිටීම නැති කිරීමෙන්ද, ධ්‍යාන ප්‍රීතිය ඉක්මවීමෙන්ද, නිරාමිස සැපය ඉක්මවීමෙන්ද, උපෙක්ෂා වේදනාවට පැමිණ වාසය කරමි' යන මේ යමක් වේද, එය ශාන්තය, එය ප්‍රණීතයයි, උපෙක්ෂා වෙදනාවට පැමිණ වාසය කරයි. ඔහුගේ ඒ උපෙක්ෂා වෙදනාව නිරුද්ධවේ. උපෙක්ෂා වෙදනාව නිරුද්ධ වීමෙන් නිරාමිස සැපය උපදියි. නිරාමිස සැපය නිරුද්ධවීමෙන් උපෙක්ෂා වෙදනාව උපදියි.

"මහණෙනි, යම්සේ ඡායාව යමක් අත්හරීද, එහි අව්ව පැතිරේද අව්ව යමක් අත්හරීද, එහි ඡායාව පැතිරේද මහණෙනි, එපරිද්දෙන්ම උපෙක්ෂා වෙදනාව නිරුද්ධවීමෙන් නිරාමිස සැපය උපදියි. නිරාමිස සැපය නිරුද්ධ වීමෙන් උපෙක්ෂා

වෙදනාව උපදියි. මහණෙනි, මේ පින්වත් මහණ තෙමේ හෝ බමුණු තෙමේ හෝ අතීතය අනුව ගියාවූ දෘෂ්ටි දුරලීමෙන්ද, අනාගතය අනුව ගියාවූ දෘෂ්ටි දුරලීමෙන්ද, සියලු ආකාරයෙන් කාම තෘෂ්ණාවන්ගේ පිහිටීම නැති කිරීමෙන්ද, ධ්‍යාන ප්‍රීතිය ඉක්මීමෙන්ද, නිරාමිස සැපය ඉක්මීමෙන්ද උපෙක්ෂා වෙදනාවට පැමිණ වාසය කරමි' යන මේ යමක් වේද, එය ශාන්තය, එය ප්‍රණීතයයි, උපෙක්ෂා වෙදනාවට පැමිණ වාසය කරයි, ඔහුගේ ඒ උපෙක්ෂා වෙදනාව නිරුද්ධවේ. උපෙක්ෂා වෙදනාව නිරුද්ධවීමෙන් නිරාමිස සැපය උපදියි. නිරාමිස සැපය නිරුද්ධ වීමෙන් උපෙක්ෂා වේදනාව උපදියි. ඒ මේ උපෙක්ෂා වේදනාව ප්‍රත්‍යයෙන් උපදින ලද්දක්ය. එහෙයින් ඖදාරිකවේ. සංස්කාරයන්ගේ නිරොධයෙක් ඇත්තේමය යන මේ කාරණය තථාගත තෙමේ දන්නේය. මෙසේ දැන ඒ දෘෂ්ටියගේ මිදීම දක්නා තථාගත තෙමේ එය ඉක්මවූයේ වෙයි.

33. "මහණෙනි, මේ ලොකයෙහි වනාහි ඇතැම් මහණෙක් හෝ බමුණෙක් හෝ අතීතය අනුව ගියාවූ දෘෂ්ටි දුරලීමෙන්ද, අනාගතය අනුව ගියාවූ දෘෂ්ටි දුරලීමෙන්ද සියලු ආකාරයෙන් කාම සංයොජනයන්ගේ පිහිටීම නැතිකිරීමෙන්ද, ධ්‍යානය ඉක්මවීමෙන්ද, නිරාමිස සැපය ඉක්මවීමෙන්ද, උපෙක්ෂා වෙදනාව ඉක්මවීමෙන්ද, 'මම සංසිඳුනෙමි. මම නිවුනෙමි. මම තෘෂ්ණාවෙන් අල්වා නොගත්තෙක් වෙමියි දකියි. මහණෙනි, මේ පින්වත් මහණ තෙමේ හෝ බමුණු තෙමේ හෝ අතීතය අනුව ගියාවූ දෘෂ්ටි දුරලීමෙන්ද, අනාගතය අනුව ගියාවූ දෘෂ්ටි දුරලීමෙන්ද, සියලු ආකාරයෙන් කාම සංයොජනයන්ගේ පිහිටීම නැතිකිරීමෙන්ද, ධ්‍යාන ප්‍රීතිය ඉක්මවීමෙන්ද, නිරාමිස සැපය ඉක්මවීමෙන්ද, උපෙක්ෂා වේදනාව ඉක්මවීමෙන්ද, 'මම සංසිඳුනෙමි මම නිවුණෙමි. මම තෘෂ්ණාවෙන් අල්වා නොගත්තෙක් වෙමියි, දකියි. මේ ආයුෂ්මත් තෙමේ මෙය නිවණට උපකාරවූ ප්‍රතිපදාවකැයි කියයි. එතකුදු වුවත් මේ පින්වත් මහණ තෙමේ හෝ බමුණු තෙමේ හෝ අතීතය අනුව ගියාවූ දෘෂ්ටිය හෝ දැඩිව අල්වාගනියි. අනාගතය අනුව ගියාවූ දෘෂ්ටිය දැඩිව අල්වා ගනියි. කාම සංයොජනයන් හෝ දැඩිව

අල්වා ගනියි. ධ්‍යාන ප්‍රීතිය හෝ දැඩිව අල්වා ගනියි. නිරාමිස සැපය හෝ දැඩිව අල්වා ගනියි. උපෙක්ෂා වේදනාව හෝ දැඩිව අල්වා ගනියි. මේ ආයුෂ්මත් තෙමේ 'මම සංසිඳුනෙමි. මම නිවුනෙමි. මම දැඩිකොට අල්වාගැනීමෙන් මිදුනෙමියි' දකීද, එයද මේ පින්වත් මහණ බමුණන්ගේ දෘෂ්ටි උපාදාන යයි කියනු ලැබේ. ඒ දෘෂ්ටිය ප්‍රත්‍යයෙන් උපදින ලද්දකි. එහෙයින් ඖදාරික වේ. සංස්කාරයන්ගේ නිරොධයෙක් ඇත්තේය යන මේ කාරණය තථාගත තෙමේ දන්නේය. මෙසේ දැන ඒ දෘෂ්ටියගේ මිදීම දක්නා තථාගත තෙමේ එය ඉක්මවූයේ වෙයි.

34 "මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් මේ නිරුත්තරවූ ශාන්තවූ උතුම් පදය වනාහි මොනවට අවබොධ කරණලදී. යම් මේ සවැදෑරුම්වූ ස්පර්ශයන්ට හෙතුවූ චක්ෂුරාදි ආයතනයන්ගේ හටගැනීමද, විනාශයද, ආශ්වාදයද, ආදීනවයද, මිදීමද තත්වූ පරිද්දෙන් දැන උපාදානයන් කෙරෙන් මිදීමෙන් ලබන යම් අර්හත් ඵලයෙක් වේද, මහණෙනි, ඒ සවැදෑරුම් ස්පර්ශයන්ට හෙතුවූ චක්ෂුරාදි ආයතනයන්ගේ හටගැනීමද, විනාසයද, ආශ්වාදයද, ආදීනවයද, මිදීමද තත්වූ පරිද්දෙන් දැන උපාදානයන් කෙරෙන් මිදීමෙන් ලබන අර්හත්ඵලයවූ" මේ උත්තම ශාන්ති පදය තථාගතයන් වහන්සේ විසින් අවබොධ කරනලදී. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තාහුය.

දෙවැනිවූ පඤ්චත්තය සූත්‍රය නිමි. (1-2)

## 3. කින්ති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කුසිනාරා නුවර "බලිහරණ" නම් වන ලැහැබෙහි වැඩවසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ, 'මහණෙනි,' කියා භික්ෂූන්ට කථා කළසේක. 'පින්වතුන්

වහන්සැයි' ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

"මහණෙනි, තොපට මා කෙරෙහි කිම, මෙබඳු සිතක් වේද? 'ශ්‍රමණ ගෞතම තෙම සිවුරු කරුණු කොටගෙන හෝ ධර්මය දෙශනා කෙරේද, ශ්‍රමණ ගෞතම තෙම පිණ්ඩපාතය කරුණු කොටගෙණ ධර්මය දෙශනා කෙරේද? ශ්‍රමණ ගෞතම තෙම සෙනසුන් කරුණු කොටගෙණ හෝ ධර්මය දෙශනා කෙරේද, ශ්‍රමණ ගෞතම තෙමේ ඒ ඒ භව සැප ලැබීම කරුණු කොටගෙන හෝ ධර්මය දෙශනා කෙරේද?' කියායි.

"ස්වාමීනි, 'භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සිවුරු හේතු කොටගෙන හෝ ධර්මය දෙශනා කෙරෙයි. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පිණ්ඩපාතය හේතු කොටගෙණ හෝ ධර්මය දෙශනා කෙරෙයි. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සෙනාසන හේතු කොටගෙණ හෝ ධර්මය දෙශනා කෙරෙයි. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ඒ ඒ භවයෙහි සැප විඳීම හේතු කොටගෙන හෝ ධර්මය දෙශනා කරයි, යන මෙබඳු සිතක් අපට ඇති නොවෙයි."

2. "මහණෙනි, තොපට වනාහි 'මා කෙරෙහි සිවුරු හේතු කොටගෙණ හෝ ශ්‍රමණ ගෞතම තෙම ධර්මය දෙශනා කරයි. පිණ්ඩපාතය හේතු කොටගෙණ හෝ ශ්‍රමණ ගෞතම තෙම ධර්මය දෙශනා කරයි. සේනාසන හේතු කොට ගෙණ හෝ ශ්‍රමණ ගෞතම තෙම ධර්මය දෙශනා කරයි. ඒ ඒ භව සැප විඳීම හේතු කොට ගෙණ හෝ ශ්‍රමණ ගෞතම තෙම ධර්මය දෙශනා කෙරේය' යන මෙබඳු සිතක් තොපට ඇති නොවේ නම් මහණෙනි, මා කෙරෙහි තොපට කෙබඳු සිතක් වේද?"

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අපට භාග්‍යවතුන් වහන්සේ අනුකම්පා ඇත්තේය. වැඩ කැමැත්තේ වේ. අනුකම්පා පිණිස ධර්මය දෙශනා කෙරේය යන මෙබඳු සිතක් වන්නේය" "මහණෙනි, තොපට මා කෙරෙහි භාග්‍යවත් තෙම අනුකම්පා ඇත්තේය. වැඩ කැමැත්තේය. අනුකම්පාව නිසා ධර්මය දෙශනා කෙරේය යන අදහස ඇත්තේය.

3. "මහණෙනි, එහෙයින් මේ ශාසනයෙහි මා විසින් තොපට යම් ධර්මයක් දෙශනා කරණ ලද්දාහුද; එනම්, සතර සතිපට්ඨානයෝය, සතර සම්‍යක් ප්‍රධානයෝය, සතර ඍද්ධි පාදයෝය, පඤ්චෙන්ද්‍රියෝය, පඤ්චබලයෝය, සප්ත බෞද්ධ්‍යංගයෝය, ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයෝය යන මොහුයි. එහි සියල්ලන් විසින්ම සමගිව සතුටුව විවාද නොකරමින් හික්මිය යුතුයි.

4. "මහණෙනි, සමගිව සතුටුව විවාද නොකරමින් හික්මෙන්නාවූ ඒ තොප අතුරෙන් අභිධර්මයෙහි වෙනස් වාද ඇති භික්ෂූහු දෙදෙනෙක් වන්නාහුද, එහි ඉදින් තොපට 'මේ ආයුෂ්මත්වරුන්ගේ කීම අර්ථවශයෙන්ද වෙනස්ය, ව්‍යඤ්ජන වශයෙන්ද වෙනස්යයි, මෙසේ අදහස් වන්නේ, නම් එහි යම් භික්ෂුවක් ඉතා සුවචයයි හඟින්නහුද? ඔහු වෙත පැමිණ ආයුෂ්මත් වරුන්ගේ කීම අර්ථ වශයෙන්ද වෙනස්ය. ව්‍යඤ්ජන වශයෙන්ද වෙනස්ය. ආයුෂ්මත් වරුන්ගේ කීම යම්සේ අර්ථ වශයෙන්ද, ව්‍යඤ්ජන වශයෙන්ද වෙනස්ද, ආයුෂ්මත්හු ඒ ආකාරයෙන් දැනගනිව්. ආයුෂ්මත්හු විවාදයට නොපැමිණෙත් වායි කියයුතු වන්නේය. ඉක්බිති අනික් පක්ෂයෙහි වූ භික්ෂූන් ගෙන් යම් භික්ෂුවක් ඉතා සුවචයයි හඟින්නහුද; ඔහු වෙත පැමිණ 'ආයුෂ්මතුන්ගේ කීම අර්ථ වශයෙන්ද වෙනස්ය. ව්‍යඤ්ජන වශයෙන්ද වෙනස්ය. ආයුෂ්මත්හු ආයුෂ්මත්වරුන් ගේ කීම යම්සේ අර්ථ වශයෙනුත් වෙනස්ද, ව්‍යඤ්ජන වශයෙනුත් වෙනස්ද එසේ දැනගනිව්. ආයුෂ්මත්හු විවාද නොකෙරෙත්වායි කියයුතු වන්නේය. මෙසේ වරදවා ගන්වා ලද්ද වරදවා ගන්නා ලද්දක් වශයෙන් දැරිය යුතුයි. වරදවා ගන්නා ලද්ද, වරදවා ගන්නා ලද්දක් වශයෙන් දරා යමක් ධර්මයවේද, යමක් විනය වේද, එය කිය යුත්තේය."

5. "ඉදින් එහි තොපට මේ ආයුෂ්මත් වරුන්ගේ කීම අර්ථවශයෙන් වෙනස් වේ. ව්‍යඤ්ජන වශයෙන් සම වේයයි සිතෙන්නේද, එහි යම් භික්ෂුවක් ඉතා සුවචයයි හඟින්නහුද, ඔහු කරා පැමිණ 'ආයුෂ්මත් වරුන්ගේ කීම අර්ථ වශයෙන්ම

වෙනස්ය. ව්‍යඤ්ජන වශයෙන් සමාන වෙයි. ඒ කීම යම්සේ අර්ථවශයෙන්ම වෙනස්ද, ව්‍යඤ්ජන වශයෙන් සමාන වේද, ආයුෂ්මත්හු ඒ ආකාරයෙන් දැනගනිව්. විවාදයට නොපැමිණෙත්වායි කියයුතු වන්නේය. ඉක්බිති අනික් පක්ෂයෙහි වූ භික්ෂූන්ගෙන් යම් භික්ෂුවක් ඉතා සුවචයයි හඟින්නහුද, ඔහු කරා පැමිණ 'ආයුෂ්මත් වරුන්ගේ කීම වනාහි අර්ථ වශයෙන්ම වෙනස්ය. ව්‍යඤ්ජන වශයෙන් සමානවේ. ආයුෂ්මත්වරුන්ගේ කීම යම්සේ අර්ථ වශයෙන්ම වෙනස්ද, ව්‍යඤ්ජන වශයෙන් වේද, ආයුෂ්මත්හු ඒ ආකාරයෙන් දැනගනිව්. ආයුෂ්මත්හු විවාදයට නොපැමිණෙත්වායි, කියයුතු වන්නේය. මෙසේ වරදවා ගන්නා ලද්ද වරදවා ගන්නා ලද්දක් වශයෙන් දැරිය යුතුයි. නිවරදකොට ගන්නා ලද්ද නිවරද කොට ගන්නා ලද්දක් වශයෙන් දැරිය යුතුයි. වරදව ගන්නා ලද්ද වරදවා ගන්නා ලද්ද වශයෙන් දරා, නිවරද කොට ගන්නා ලද්ද නිවරද කොට ගන්නා ලද්ද වශයෙන් දරා යමක් ධර්මය වේද, යමක් විනය වේද, එය කිය යුතුයි."

**6.** "ඉදින් එහි තොපට මේ ආයුෂ්මත්වරුන්ගේ කීම අර්ථවශයෙන්ම සමවෙයි. ව්‍යඤ්ජන වශයෙන් වෙනස්වේයයි සිතයි නම් එහි යම් භික්ෂුවක් ඉතා සුවචයයි හඟින්නාහුද, ඔහු කරා පැමිණ 'ආයුෂ්මත් වරුන්ගේ කීම වනාහි අර්ථ වශයෙන් සමාන වේ. ව්‍යඤ්ජන වශයෙන් වෙනස් වේ. එය යම්සේ අර්ථවශයෙන්ම සමවේද, ව්‍යඤ්ජන වශයෙන් වෙනස් වේද, ආයුෂ්මත්හු ඒ ආකාරයෙන් දැනගනිව්. යම් මේ ව්‍යඤ්ජනයක්වේද, එය වනාහි සුළු කරුණකි. ආයුෂ්මත්හු ස්වල්ප කාරණයකින් විවාදයට නොපැමිණෙත්වායි කියයුතු වන්නේය. අනික් පක්ෂයෙහිවූ භික්ෂූන්ගෙන් යම් භික්ෂුවක් ඉතා සුවචයයි හඟින්නාහුද, ඔහු කරා පැමිණ 'ආයුෂ්මතුන්ලාගේ කීම වනාහි අර්ථවශයෙන් සමාන වේ. ව්‍යඤ්ජන වශයෙන් වෙනස් වේ. ආයුෂ්මත්හු එය යම්සේ අර්ථවශයෙන් සමාන වේද, ව්‍යඤ්ජන වශයෙන් වෙනස් වේද, එය ඒ ආකාරයෙන් ආයුෂ්මත්හු දැනගනිව්. යම් ඒ ව්‍යඤ්ජනයක් වේද, එය ස්වල්ප කාරණයකි. ආයුෂ්මත්හු ස්වල්ප කාරණයකින් විවාදයට

නොපැමිණෙත්වායි කියයුතු වන්නේය. මෙසේ නිවරද කොට ගන්නා ලද්ද නිවරද කොට ගන්නා ලද්ද වශයෙන් දැරිය යුතුයි. වරදවා ගන්නා ලද්ද වරදවා ගන්නා ලද්ද වශයෙන් දැරිය යුතුයි. නිවරද කොට ගන්නා ලද්ද නිවරද කොට ගන්නා ලද්ද වශයෙන් දරා වරදවා ගන්නා ලද්ද වරදවා ගන්නා ලද්ද වශයෙන් දරා, යමක් ධර්මයවේද, යමක් විනය වේද, එය කිය යුතුයි.

7. "එහි ඉදින් තොපට මේ ආයුෂ්මතුන්ලාගේ කීම අර්ථවශයෙන්ද සමාන වේ. ව්‍යඤ්ජන වශයෙන්ද සමානවේයයි සිතක් වන්නේනම් එහි යම් භික්ෂුවක් ඉතා සුවචයයි හඟින්නාහුද, ඔහු කරා පැමිණ 'ආයුෂ්මතුන්ලාගේ කීම වනාහි අර්ථ වශයෙන්ද, සමානවේ. ව්‍යඤ්ජන වශයෙන්ද සමානවේ. එය යම්සේ අර්ථයෙනුත් සමානවේද, ව්‍යඤ්ජනයෙනුත් සමාන වේද, ආයුෂ්මත්හු ඒ ආකාරයෙන් දැනගනිව්. ආයුෂ්මත්හු විවාදයට නොපැමිණෙත්වායි,' කියයුතු වන්නේය. ඉක්බිති අනික් පක්ෂයෙක්හි වූ භික්ෂූන්ගෙන් යම් භික්ෂුවක් ඉතා සුවචයයි හඟින්නාහුද, ඔහු කරා පැමිණ ආයුෂ්මතුන්ලාගේ කීම වනාහි අර්ථ වශයෙන්ද සමාන වේ. ව්‍යඤ්ජන වශයෙන්ද සමාන වේ. එය යම්සේ අර්ථයෙනුත් සමානවේද.' ව්‍යඤ්ජනයෙනුත් සමානවේද, ආයුෂ්මත්හු ඒ ආකාරයෙන් දැනගනිව්. ආයුෂ්මත්හු විවාදයට නොපැමිණෙත්වායි, කියයුතු වන්නේය. මෙසේ නිවරද කොට ගන්නා ලද්ද නිවරද කොට ගන්නා ලද්ද වශයෙන් දැරිය යුතුයි. නිවරද කොට ගන්නා ලද්ද නිවරද කොට ගන්නා ලද්ද වශයෙන් දරා යමක් ධර්මය වේද, යමක් විනය වේද එය කිය යුතුයි.

8. "මහණෙනි, සමගිව සතුටු වෙමින් විවාද නොකරමින් හික්මෙන්නාවූ ඒ තොප අතුරෙන් එක්තරා භික්ෂුවක්හට ඇවතක් වන්නේද, වරද කිරීමක් වන්නේද, මහණෙනි, එහි චෝදනාව පිණිස නොයා යුතුයි. අනික් පුද්ගලතෙම වනාහි ක්‍රොධ නොකරන්නෙක් වෛර නොකරන්නෙක් තම මතය අත් නොහරින සේ තදින් නොගන්නෙකි, තම මතය පහසුවෙන් දුරලිය හැක්කෙක් වේනම් 'මටද වෙහෙස නොවන්නේය.

අනිකාටද දුකට පැමිණීමක් නොවන්නේය. මට ඒ පුද්ගලයා අකුසලයෙන් නැගිටුවා කුසලයෙහි පිහිටුවන්ට හැක්කේයයි' පුද්ගලයා පරීක්ෂා කළ යුතුය. ඉදින් මහණෙනි, කීමට සුදුසු වන්නේය. මහණෙනි, ඉදින් වනාහි මෙසේ වන්නේනම් 'මටද වෙහෙසක් නොවන්නේය. අන්‍ය පුද්ගලයාටද දුකක් වන්නේය. අනික් පුද්ගලයා වනාහි කිපෙන්නෙක, වෛර කරන්නෙක මතය දැඩිකොට ගන්නෙකි. මතය පහසුවෙන් දුරලිය නොහැක්කේ වෙයි. මම මේ පුද්ගලයා අකුසලයෙන් නගාසිටුවා කුසලයෙහි පිහිටුවන්ට හැක්කේද වෙමියි' මෙසේ වන්නේනම් යම් මේ අනික් පුද්ගලයාගේ දුකට පැමිණීමක් වේද, මෙය වනාහි සුලු දෙයකි. ඒ මම මේ පුද්ගලයා අකුසලයෙන් නැගිටුවා කුසලයෙහි පිහිටුවන්ට හැකිවෙයි නම් එයම මහත් වන්නේය. මහණෙනි, ඉදින් මෙසේ වන්නේ නම් කීමට සුදුසු වේ.

**9.** "මහණෙනි, ඉදින් වනාහි 'මට වනාහි වෙහෙස වන්නේය. අනික් පුද්ගලයාට දුකක් නොවන්නේය. අනික් පුද්ගල තෙම වනාහි ක්‍රොධ නොකරන්නෙක් වෛර නොකරන්නෙක් මතය තරයේ ගන්නෙක් මතය පහසුවෙන් අත්නොහරින්නෙක් වන්නෙම් මම මේ පුද්ගලයා අකුසලයෙන් නැගිටුවා කුසලයෙහි පිහිටුවන්ට හැක්කේද, වෙමි. මාහට යම් වෙහෙසක් වේද, එය වනාහි සුලු වූවකි. ඒ මම මේ පුද්ගලයා අකුසලයෙන් නැගිටුවා කුසලයෙහි පිහිටුවන්ට හැකිවෙම් නම් එයම මහත් වන්නේය. 'මහණෙනි, ඉදින් එසේ වන්නේ නම් කීමට සුදුසුයි.

**10.** "මහණෙනි, ඉදින් වනාහි මටද වෙහෙස වන්නේය. අනික් පුද්ගලයාටද දුක් වන්නේය. අන් පුද්ගල තෙමේ වනාහි කිපෙන්නෙක්, බද්ධ වෛර කරන්නෙක්, මතය තරයේ ගන්නෙක්, මතය පහසුවෙන් දුරලිය නොහැක්කෙක් වන්නේද 'මම මේ පුද්ගලයා අකුසලයෙන් නැගිටුවා කුසලයෙහි පිහිටුවන්ට හැක්කේද, වෙම් නම් මට යම් වෙහෙසීමක් වේද, අන්‍ය පුද්ගලයාට යම් දුකක් වේද, මෙය වනාහි සුලු වූවකි. ඒ මම මේ පුද්ගලයා අකුසලයෙන් නැගිටුවා කුසලයෙහි පිහිටුවන්ට හැකිවෙම් නම් එයම මහත් වන්නේය.' මහණෙනි, ඉදින් මෙසේ වන්නේ නම් කීමට සුදුසුය.

11. "මහණෙනි, ඉදින් වනාහි මටද වෙහෙස වන්නේය. අන් පුද්ගලයාටද දුක් වන්නේය. අනික් පුද්ගල තෙමේ වනාහි කිපෙන්නක, වෛර කරන්නෙක, මතය තරයේ ගන්නෙක, මතය පහසුවෙන් දුරලිය නොහැක්කෙක. මමද මේ පුද්ගලයා අකුසලයෙන් නැගිටුවා කුසලයෙහි පිහිටුවන්ට නොහැකි වෙමියි, මෙසේ වන්නේද, මහණෙනි, මෙබඳු පුද්ගලයා කෙරෙහි උපෙක්ෂාව නොයික්මවිය යුතුය.

12. "මහණෙනි, සමගිව සතුටුවෙමින්, විවාද නොකරමින් හික්මෙන්නාවූ, ඒ තොප අතරෙහිද සිත් දූෂ්‍ය කරන්නාවූ අමනාපය ඇති කරන්නාවූ, නොසතුට නොඇල්ම ඇති කරන්නාවූ, ඕපාදූප වචන උපදින්නේය. ඒ එක් පක්ෂයක භික්ෂූන් අතුරෙන් යම් භික්ෂුවක් ඉතා සුවචයයි හඟින්නහුද, ඔහු කරා පැමිණ, 'ඇවැත්නි, සමගිව සතුටුවෙමින් විවාද නොකරමින් හික්මෙන්නාවූ, අප අතරෙහි සිත් දූෂ්‍ය කරන්නාවූ, අමනාප ඇතිකරන්නාවූ, නොසතුට ඇතිකරන්නාවූ, ඔවුනොවුන්ගේ ඕපාදූප වචන උපන්නේය යන යමක් ඇද්ද, එය ශාස්තෘන් වහන්සේ දන්නේ නම් ගර්හා කරන්නේදැයි කිය යුතුය.

13. "මහණෙනි, මනාකොට ප්‍රකාශ කරන්නාවූ භික්ෂු තෙම මෙසේ ප්‍රකාශ කරන්නේය. 'ඇවැත්නි, සමගිව සතුටු වෙමින් විවාද නොකරමින් හික්මෙන්නාවූ අප අතරෙහි සිත දූෂ්‍ය කරන්නාවූද, අමනාප ඇතිකරන්නාවූද, නොසතුට ඇතිකරන්නාවූද, ඔවුනොවුන්ගේ ඕපාදූප වචන උපදින්නේය යන යමක් ඇද්ද, එය ශාස්තෘන් වහන්සේ දන්නේ නම් ගරහන්නේය. 'ඇවැත්නි, මේ කොලාහල කිරීම දුරු නොකොට නිවණ ප්‍රත්‍යක්ෂ කරන්නේදැයි ඇසිය යුතුය. මහණෙනි, මනාකොට ප්‍රකාශ කරන්නාවූ භික්ෂුතෙම මෙසේ ප්‍රකාශ කරන්නේය. 'ඇවැත්නි, මේ කොලාහල කිරීම දුරු නොකොට නිවණ ප්‍රත්‍යක්ෂ නොකරන්නේය.' තව ද, අනික් පක්ෂයෙහිවූ භික්ෂූන්ගෙන් යම් භික්ෂුවක් ඉතා සුවචයයි හඟින්නාහුද, ඔහු කරා පැමිණ 'ඇවැත්නි, සමගිව සතුටු වෙමින්, විවාද නොකරමින්, හික්මෙන්නාවූ අප අතරෙහි සිත දූෂ්‍ය කරන්නාවූ, අමනාපය ඇතිකරන්නාවූ, නොසතුට ඇතිකරන්නාවූ

ඔවුනොවුන්ගේ ඕපාදූප වචන උපදින්නේය යන යමක් ඇද්ද, එය ශාස්තෘන් වහන්සේ දන්නේ නම් ගර්හා කරන්නේදැයි' කියයුතු වන්නේය. මහණෙනි මනාකොට ප්‍රකාශ කරන්නාවූ භික්ෂුතෙම මෙසේ ප්‍රකාශ කරන්නේය. 'ඇවැත්නි, සමගිව සතුටුවෙමින් විවාද නොකරමින් හික්මෙන්නාවූ අප අතරෙහි සිත දූෂ්‍ය කරන්නාවූ, අමනාපය ඇතිකරන්නාවූ, නොසතුට ඇතිකරන්නාවූ යම් ඒ ඔවුනොවුන්ගේ ඕපාදූප වචන උපදින්නේය යන යමක් ඇද්ද, එය ශාස්තෘන් වහන්සේ දන්නේ නම් ගර්හා කරන්නේය කියායි. ඇවැත්නි, මේ කොලාහල කිරීම වනාහි දුරු නොකොට නිවණ ප්‍රත්‍යක්ෂ නොකරන්නේදැයි ඇසිය යුතුය' මහණෙනි, මනාකොට ප්‍රකාශ කරන්නාවූ භික්ෂුතෙම මෙසේ 'ඇවැත්නි, මේ කොලාහල කිරීම දුරු නොකොට නිවණ ප්‍රත්‍යක්ෂ නොකරන්නේයයි, කියන්නේය.

14. "මහණෙනි, ඉදින් ඒ භික්ෂුවගෙන් අනික් භික්ෂුවක් ආයුෂ්මතුන් විසින් අපගේ මේ භික්ෂූහු අකුසලයෙන් නැගිටුවා කුසලයෙහි පිහිටුවන ලද්දාහුදැයි අසන්නේ නම්, මහණෙනි, මනාකොට ප්‍රකාශ කරන්නාවූ භික්ෂුතෙම මෙසේ ප්‍රකාශ කරන්නේය. 'ඇවැත්නි, මෙහි මම භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට පැමිණියෙමි. ඒ මට භාග්‍යවතුන් වහන්සේ ධර්මය දෙශනා කළසේක.' මම ඒ ධර්මය අසා ඒ භික්ෂූන්ට කීවෙමි. ඒ භික්ෂූහු ඒ ධර්මය අසා අකුසලයෙන් නැගී සිටියාහුය. කුසලයෙහි පිහිටියාහුය, යනුවෙනි.

"මහණෙනි, මෙසේ ප්‍රකාශ කරන්නාවූ භික්ෂුතෙම තමාද නොම උසස් කෙරෙයි. අනුන් නොම පහත් කෙරෙයි. ධර්මයට අනුකූල වූවක් ප්‍රකාශ කරයි. කරුණු සහිතවූ අනික් කිසිවාදයක් හෝ අනුවාදයක් හෝ (මේ පුද්ගලයාට) ගැරහිය යුතු තැනට නොපැමිණෙන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තාහුය.

**තුන්වැනිවූ කින්තී සූත්‍රය නිමි. (1-3)**

---

# 4. සාමගාම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහිවූ "සාම" නම් ගමෙහි වැඩවසනසේක. එකල්හි වනාහි "නිගණ්ඨනාත" පුත්‍රතෙම චාපා නම් නුවර නොබෝ දින මැරුණේවෙයි. ඔහුගේ මරණින් පසු බිඳී ගියාවූ නිගණ්ඨයෝ දෙකොටසක්ව හටගත් දබර ඇත්තාහු හටගත් කලහ ඇත්තාහු විවාදයට පැමිණියාහු ඔවුනොවුන්ට මුඛ නැමැති ආයුධ වලින් අනිමින් වාසය කෙරෙත්. 'නුඹ මේ ධර්ම විනය නොදන්නෙහිය, මම මේ ධර්ම විනය දනිමි. කිම නුඹ මේ ධර්ම විනය දන්නෙහිද, නුඹ වරදවා පිළිපන්නෙහිය. මම මනාකොට පිළිපන්නේ වෙමි. මට වැඩ සහිතය. නුඹට වැඩ සහිත නොවේ. පළමු කිය යුත්ත පසුව කීයෙහිය. පසුව කිය යුත්ත පළමු කීයෙහිය. තා විසින් පුරුදු නොකරණ ලද්ද, විවාදයට පැමිණ නැවතුනේය. තට වාදය නගන ලද්දේය. නිග්‍රහ කරණ ලද්දේවෙහිය. වාදයෙන් මිදීම පිණිස හැසිරෙව්, ඉදින් හැකි වන්නෙහි නම් අවුල් හරවයි.' කියමින් එකම වධයක් මෙන් නිගණ්ඨනාත පුත්‍රයාගේ අතවැස්සන් කෙරෙහි පවතියි. නිගණ්ඨනාත පුත්‍රයාගේ සුදුවත් හඳනාවූ යම් ගිහි ශ්‍රාවක කෙනෙක් වෙත්ද, ඔව්හුද නිගණ්ඨනාත පුත්‍රයාගේ අත වැස්සන් කෙරෙහි කළකිරුණු ස්වභාව ඇත්තාහු නොඇළුනු ස්වභාව ඇත්තාහු, පසුබස්නා ස්වභාව ඇත්තාහු වෙත්. නපුරුකොට කියන ලද්දාවූ නපුරුකොට දන්නා ලද්දාවූ නෛර්‍ය්‍යාණික නොවූ සංසිඳීම පිණිස නොපවත්නාවූ, සම්‍යක් සම්බුද්ධ නොවූවකු විසින් කියන ලද්දාවූ බිඳුනු පිහිට ඇත්තාවූ පිළිසරණ නැත්තාවූ ධර්ම විනයක යම්සේද එමෙනි.

2. ඉක්බිති "චුන්ද" සමණුද්දෙස තෙම පාවා නම් නුවර වස් වසන ලද්දේ සාම නම් ගම යම් තැනෙක්හිද ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට වැඳ එක් පසෙක උන්නේය. එක් පසෙක උන්නාවූ චුන්ද සමණුද්දෙස තෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙය කීයේය. "ස්වාමීනි

නිගණ්ඨනාත පුත්‍රතෙම පාවා නම් නුවර නොබෝ දින මැරෙන ලද්දේ වෙයි. ඔහුගේ මැරීමෙන් පසු බිඳී ගියාවූ නිගණ්ඨයෝ දෙකොටසක්ව හටගත් දබර ඇත්තාහු හටගත් කලහ ඇත්තාහු විවාදයට පැමිණියාහු ඔවුනොවුන්ට මුඛ නමැති ආයුධ වලින් අනිමින් වාසය කෙරෙත්. 'නුඹ මේ ධර්ම විනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දනිමි. කිම, මේ ධර්ම විනය දන්නෙහිද? නුඹ වරදවා පිළිපන්නෙහිය මම මනාකොට පිළිපන්නේ වෙමි. මට වැඩ සහිතය. නුඹට වැඩ සහිත නොවේ. පළමු කිය යුත්ත පසුව කීයෙහිය. පසුව කිය යුත්ත පළමු කීයෙහිය. තා විසින් පුරුදු නොකරණ ලද්ද විවාදයට පැමිණ, නැවතුනේය. තට වාදය නගන ලද්දේය. නිග්‍රහ කරණ ලද්දේ වෙහිය. වාදයෙන් මිදීම පිණිස හැසිරෙව. ඉදින් හැකිවන්නෙහි නම් අවුල් හරවයි' එකම වධයක් මෙන් නිගණ්ඨනාත පුත්‍රයාගේ අතවැස්සන් කෙරෙහි පවතියි. යම් නිගණ්ඨනාත පුත්‍රයාගේ සුදුවත් හඳනාවූ ගිහි ශ්‍රාවක කෙනෙක් වෙත්ද, ඔවුහුද නිගණ්ඨනාථ පුත්‍රයාගේ අතවැස්සන් කෙරෙහි කළකිරුණු ස්වභාව ඇත්තාහු, නොඇළුණු ස්වභාව ඇත්තාහු, පසුබස්නා ස්වභාව ඇත්තාහු වෙත්. නපුරුකොට දන්නා ලද්දාවූ, නෛර්‍යාණික නොවූ, සංසිඳීම පිණිස නොපවත්නාවූ, සම්‍යක් සම්බුද්ධ නොවූවෙකු විසින් වදාරණ ලද්දාවූ, බිඳුනාවූ පිහිට ඇති පිළිසරණ නැත්තාවූ (සස්නෙහි යම්සේද එමෙනි)"

3. මෙසේ කී කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම චුන්ද සමණුද්දෙසයන්ට "ඇවැත් චුන්දය, මේ කථා පඬුර භාග්‍යවතුන් වහන්සේ දක්නා පිණිස ඇත්තේමය. ඇවැත් චුන්දය, යමු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණෙන්නෙමු පැමිණ මේ කාරණය භාග්‍යවතුන් වහන්සේට කියන්නෙමුයි" කීය. "ස්වාමීනි, එසේය" කියා චුන්ද නම් සමණුද්දෙස තෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට උත්තර දුන්නේය.

4. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේද, චුන්ද සමණුද්දෙස තෙමේද, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ

එක්පසක උන්නාහුය. එකත්පසක උන්නාවූම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, මේ චුන්ද සමණුද්දෙස තෙම මෙසේ කීය. ස්වාමීනි, නිගණ්ඨනාතපුත්‍ර තෙම පාවා නම් නුවර නොබෝදින මැරුනේය. ඔහුගේ මරණයෙන් පසු බිඳුනාවූ නිගණ්ඨයෝ දෙකොටසක්ව හටගත් දබර ඇත්තාහු, හටගත් කලහ ඇත්තාහු, විවාදයට පැමිණියාහු ඔවුනොවුන්ට මුඛ නමැති ආයුධවලින් අනින්නාහු වාසය කෙරෙත්. 'නුඹ මේ ධර්මවිනය නොදන්නෙහිය. මම මේ ධර්මවිනය දනිමි. කිම, නුඹ මේ ධර්මවිනය දන්නෙහිද? නුඹ වරදවා පිළිපන්නෙහිය. මම මනාකොට පිළිපන්නේ වෙමි. මට වැඩ සහිතය. නුඹට වැඩ සහිත නොවේ. පළමු කිය යුත්ත පසුව කීයෙහිය. පසුව කිය යුත්ත පළමු කීයෙහිය. තා විසින් පුරුදු නොකරණ ලද්ද විවාදයට පැමිණ, නැවතුනේය. තට වාදය නඟන ලද්දේය. නිග්‍රහ කරණ ලද්දේ වෙහිය. වාදයෙන් මිදීම පිණිස හැසිරෙව. ඉදින් හැකිවන්නෙහි නම් අවුල්හරවයි, එකම වධයක් මෙන් "නිගණ්ඨනාතපුත්‍රයාගේ අතවැස්සන් කෙරෙහි පවතියි. යම් නිගණ්ඨනාතපුත්‍රයාගේ සුදුවත් හඳනාවූ ගිහි ශ්‍රාවක කෙනෙක් වෙත්ද, ඔවුහුද නිගණ්ඨනාතපුත්‍රයාගේ අත වැස්සන් කෙරෙහි කළකිරුණු ස්වභාව ඇත්තාහු, නොඇළුනු ස්වභාව ඇත්තාහු, පසුබස්නා ස්වභාව ඇත්තාහු වෙත්. නපුරු කොට දන්නා ලද්දාවූ, නෛර්‍යාණික නොවූ, සංසිඳීම පිණිස නොපවත්නාවූ, සම්‍යක් සම්බුද්ධ නොවූවෙකු විසින් වදාරණ ලද්දාවූ, බිඳුනාවූ පිහිට ඇති පිළිසරණ නැත්තාවූ (සස්නෙහි යම්සේද එමෙනි) "ස්වාමීනි, ඒ මට මෙබඳු අදහසක් වෙයි. භාග්‍යවතුන් වහන්සේගේ ඇවෑමෙන් සංඝයා කෙරෙහි විවාදයෙක් නොම උපදීවා ඒ විවාදය බොහෝදෙනාට අවැඩ පිණිස බොහෝ දෙනාට නොසැප පිණිස බොහෝ දෙනාට අනර්ථ පිණිස දෙව් මිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස වන්නේය" කියායි.

5. "ආනන්දය, ඒ කුමකැයි හඟින්නෙහිද, මා විසින් තොපට යම් ධර්ම කෙනෙක් නුවණින් අවබොධකොට දෙශනා කරණ

ලද්දාහුද, එනම්, සතර සතිපට්ඨානයෝය, සතර සම්‍යක් ප්‍රධානයෝය, සතර ඍද්ධි පාදයෝය, පඤ්චෙන්ද්‍රියයෝය, පඤ්ච බලයෝය, සප්ත බොධ්‍යංගයෝය, ආය්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය යන මොහුයි. ආනන්දය, නුඹ මේ ධර්මයන්හි වෙන් වෙන් වාද ඇත්තාවූ භික්ෂූන් දෙදෙනකු දක්නෙහිද?" "ස්වාමීනි, යම් මේ ධර්මකෙනෙක් භාග්‍යවතුන් වහන්සේ විසින් නුවණින් අවබොධකොට දැන දෙශනා කරන ලද්දාහුද, එනම්; සතර සතිට්ඨානයෝය, සතර සම්‍යක් ප්‍රධානයෝය, සතර ඍද්ධිපාදයෝය, පඤ්චෙන්ද්‍රියයෝය, පඤ්චබලයෝය, සප්ත බොධ්‍යංගයෝය, ආය්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයෝය, (යන මොහුයි.) මේ ධර්මයන්හි වෙනස් වාද ඇත්තාවූ භික්ෂූන් දෙදෙනකුදු මම නොදකිමි.

"ස්වාමීනි, යම් ඒ පුද්ගල කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ ඇසුරුකොට වාසය කෙරෙත්ද, ඔව්හු භාග්‍යවතුන් වහන්සේ ඇවෑමෙන් සංඝයා කෙරෙහි ආජීවය හෙතුකොටගෙන හෝ ප්‍රාතිමොක්ෂය හෙතුකොටගෙන හෝ විවාද උපදවන්නාහුද, ඒ විවාදය බොහෝදෙනාට අවැඩ පිණිස බොහෝදෙනාට නොසැප පිණිස බොහෝදෙනාට අනර්ථ පිණිස දෙවි මිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස වන්නේයයි" ආනන්ද ස්ථවිර තෙමේ කීය.

**6.** "ආනන්දය, යම් මේ ආජීවය හෙතුකොටගෙන හෝ ප්‍රාතිමොක්ෂය හෙතුකොටගෙන හෝ විවාදයෙක් වේද, ඒ ස්වල්පමාත්‍ර ඇත්තක් වේ. ආනන්දය, මාර්ගයෙහි හෝ ප්‍රතිපදාවෙහි හෝ සංඝයා කෙරෙහි විවාදයෙන් උපදිනු ලබන්නේ උපදින්නේද, ඒ විවාදය බොහෝදෙනාට අවැඩ පිණිස බොහෝදෙනාට නොසැප පිණිස බොහෝදෙනාට අනර්ථ පිණිස දෙවි මිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස වන්නේයයි" වදාළේය.

"ආනන්දය, මේ විවාදයට මුල් කරුණු සයක් වෙත්. කවර සයක්ද යත්? ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම ක්‍රොධ කරන්නෙක්, වෛර බැඳගන්නෙක් වේද, ආනන්දය, යම් ඒ මහණෙක් තෙම ක්‍රොධ කරන්නෙක් වෛර බැඳගන්නෙක් වේද,

හෙතෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නොකරන්නෙක්, යටහත් පැවතුම් නැත්තෙක්ව වාසය කරයි. ධර්මය කෙරෙහිද ගෞරව නොකරන්නෙක්, යටහත් පැවතුම් නැත්තෙක්ව වාසය කරයි. සංඝයා කෙරෙහිද ගෞරව නොකරන්නෙක්, යටහත් පැවතුම් නැත්තෙක්ව වාසය කරයි. ශීලයද සම්පූර්ණ නොකරන්නෙක් වෙයි. ආනන්දය, යම් ඒ මහණෙක් තෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නොකරන්නේ, යටහත් පැවතුම් නැත්තෙක්ව වාසය කෙරේද, ධර්මය කෙරෙහි ගෞරව නැත්තේ යටත් පැවතුම් නැත්තේ වාසය කෙරේද, සංඝයා කෙරෙහි ගෞරව නොකරන්නෙක්, යටහත් පැවතුම් නැත්තෙක්ව වාසය කෙරේද, ශීලය සම්පූර්ණ නොකරන්නෙක් වේද, හෙතෙම සංඝයා කෙරෙහි විවාද උපදවයි. ඒ විවාදය බොහෝදෙනාට අවැඩ පිණිස, බොහෝදෙනාට නොසැප පිණිස, බොහෝදෙනාට අනර්ථ පිණිස, දෙවි මිනිසුන්ට අහිත පිණිස, දුක් පිණිස පවතියි. ආනන්දය, ඉදින් තෙපි මේ විවාදයට මුල් කරුණු තමා කෙරෙහි හෝ පිටත්හි හෝ දකින්නාහුද, ආනන්දය, එහි තෙපි ඒ ලාමකවූ විවාද මූලයාගේ පහකිරීම පිණිස උත්සාහ දරන්නහුය. ආනන්දය, ඉදින් තෙපි මේ විවාදමූලය තමා කෙරෙහි හෝ පිටත්හි හෝ නොදක්නහු නම්, ආනන්දය, එහි තෙපි ඒ ලාමකවූ විවාද මූලයාගේම මත්තෙහි හටනොගැණීම පිණිස පිළිපදින්නහුය. මෙසේ මේ ලාමකවූ විවාද මූලයාගේ දුරුකිරීම වේ. මෙසේ මේ ලාමකවූ විවාද මූලයාගේ මත්තෙහි නොහටගැනීම වේ.

7. "ආනන්දය, නැවත අනිකක්ද කියමි. මහණතෙම ගුණමකු වූයේ එකටඑක කරන්නේ වේ. හෙතෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැත්තේ වාසය කරයි. ධර්මය කෙරෙහිද ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැත්තේ වාසය කරයි. සංඝයා කෙරෙහිද ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැත්තේ වාසය කරයි. ශික්ෂාවෙහිද සම්පූර්ණ කිරීම ඇත්තේ නොවෙයි. ආනන්දය, යම් ඒ මහණෙක් තෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැත්තේ යටත් පැවතුම් නැත්තේ වාසය කෙරේද, ධර්මය කෙරෙහි ගෞරව නැත්තේ,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යටත් පැවතුම් නැත්තේ වාසය කෙරේද, සංඝයා කෙරෙහි ගෞරව නැත්තේ යටත් පැවතුම් නැත්තේ වාසය කෙරේද, ශික්ෂාවෙහි සම්පූර්ණ කිරීම ඇත්තේ නොවේද, හෙතෙම සංඝයා කෙරෙහි යම් විවාදයක් බොහෝදෙනාට අවැඩ පිණිස, බොහෝ දෙනාට නොසැප පිණිස බොහෝදෙනාට අනර්ථ පිණිස, දෙව්මිනිසුන්ට අහිත පිණිස, දුක් පිණිස වේද, එබඳු විවාද උපදවයි. ආනන්දය, ඉදින් තෙපි මෙබඳු විවාදයට මුල් කරුණු තමා කෙරෙහි හෝ පිටත්හි හෝ දකින්නහුද, ආනන්දය, එහි තොපි ඒ ලාමකවූ විවාදමූලයාගේම දුරුකිරීමට උත්සාහ කරන්නහුය. ආනන්දය, ඉදින් තෙපි මෙබඳු විවාදමූලය තමා කෙරෙහි හෝ පිටත්හි හෝ නොදක්නාහු නම්, ආනන්දය, එහි තෙපි ඒ ලාමකවූ විවාද මූලයාගේම මත්තෙහි නොහටගැනීම පිණිස පිළිපදින්නාහුය. මෙසේ මේ ලාමකවූ විවාදමූලයාගේ දුරුකිරීම වේ. මෙසේ මේ ලාමක විවාදමූලයාගේ මත්තෙහි නොහටගැනීම වේ.

8. "ආනන්දය, නැවත අනිකක්ද කියමි. මහණතෙම ඊර්ෂ්‍යා කරන්නේ මසුරුවූයේ වෙයි. හෙතෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැත්තේ වාසය කරයි. ධර්මය කෙරෙහිද ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැත්තේ වාසය කරයි. සංඝයා කෙරෙහිද ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැත්තේ වාසය කරයි. ශික්ෂාවෙහිද සම්පූර්ණ කිරීම ඇත්තේ නොවෙයි. ආනන්දය, යම් ඒ මහණෙක් තෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැත්තේ යටත් පැවතුම් නැත්තේ වාසය කෙරේද ධර්මය කෙරෙහි ගෞරව නැත්තේ යටත් පැවතුම් නැත්තේ වාසය කෙරේද, සංඝයා කෙරෙහි ගෞරව නැත්තේ යටත් පැවතුම් නැත්තේ වාසය කෙරේද, ශික්ෂාවෙහි සම්පූර්ණ කිරීම ඇත්තේ නොවේද, හෙතෙම සංඝයා කෙරෙහි යම් විවාදයක් බොහෝදෙනාට අවැඩ පිණිස, බොහෝදෙනාට නොසැප පිණිස, බොහෝදෙනාට අනර්ථ පිණිස දෙව් මිනිසුන්ට අහිත පිණිස, දුක් පිණිස වේද, එබඳු විවාද උපදවයි. ආනන්දය, ඉදින් තෙපි මෙබඳු විවාදයට මුල් කරුණු තමා කෙරෙහි හෝ පිටත්හි හෝ දකින්නාහුද, ආනන්දය,

එහි තෙපි ඒ ලාමකවූ විවාද මූලයාගේම දුරු කිරීමට උත්සාහ කරන්නාහුය. ආනන්දය, ඉදින් තෙපි මෙබඳු විවාදමූලය තමා කෙරෙහි හෝ පිටත්හි හෝ නොදක්නාහු නම් ආනන්දය, එහි තෙපි ඒ ලාමකවූ විවාද මූලයාගේම මත්තෙහි නොහටගැනීම පිණිස පිළිපදින්නාහුය. මෙසේ මේ ලාමකවූ විවාදමූලයාගේ දුරුකිරීම වේ. මෙසේ මේ ලාමක විවාද මූලයාගේ මත්තෙහි නොහටගැනීම වේ.

9. "ආනන්දය, නැවත අනිකක්ද කියමි. මහණතෙම කෛරාටිකවූයේ මායා ඇත්තේ වේ. හෙතෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැත්තේ වාසය කරයි. ධර්මය කෙරෙහිද ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැත්තේ වාසය කරයි. සංඝයා කෙරෙහිද ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැත්තේ වාසය කරයි. ශික්ෂාවෙහිද සම්පූර්ණ කිරීම ඇත්තේ නොවෙයි. ආනන්දය, යම් ඒ මහණෙක් තෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නැත්තේ යටත් පැවතුම් නැත්තේ වාසය කෙරේද, ධර්මය කෙරෙහි ගෞරව නැත්තේ, යටත් පැවතුම් නැත්තේ වාසය කෙරේද, සංඝයා කෙරෙහි ගෞරව නැත්තේ යටත් පැවතුම් නැත්තේ වාසය කෙරේද, ශික්ෂාවෙහි සම්පූර්ණකිරීම ඇත්තේ නොවේද, හෙතෙම සංඝයා කෙරෙහි යම් විවාදයක් බොහෝදෙනාට අවැඩ පිණිස, බොහෝදෙනාට නොසැප පිණිස, බොහෝදෙනාට අනර්ථ පිණිස, දෙවිමිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස වේද, එබඳු විවාද උපදවයි. ආනන්දය, ඉදින් තෙපි මෙබඳු විවාදයට මුල් කරුණු තමා කෙරෙහි හෝ පිටත්හි හෝ දක්නාහුද, ආනන්දය, එහි තෙපි ඒ ලාමකවූ විවාද මූලයාගේම දුරුකිරීමට උත්සාහ කරන්නහුය. ආනන්දය, ඉදින් තෙපි මෙබඳු විවාදමූලය තමා කෙරෙහි හෝ පිටත්හි හෝ නොදක්නහු නම්, ආනන්දය, එහි තෙපි ඒ ලාමකවූ විවාදමූලයාගේම මත්තෙහි නොහටගැනීම පිණිස පිළිපදින්නාහුය. මෙසේ ලාමකවූ විවාද මූලයාගේ දුරුකිරීම වේ. මෙසේ මේ ලාමක විවාද මූලයාගේ මත්තෙහි නොහට ගැනීම වේ.

10. "ආනන්දය, නැවත අනිකක්ද කියමි. මහණතෙම ලාමක ආසා ඇත්තේ මිථ්‍යාදෘෂ්ටිවූයේ වෙයි. හෙතෙම ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැත්තේ වාසය කරයි. ධර්මය කෙරෙහිද ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැත්තේ වාසය කරයි. සංඝයා කෙරෙහිද ගෞරව නැත්තේ යටහත් පැවතුම් නැත්තේ වාසය කරයි. ශික්ෂාවෙහිද සම්පූර්ණ කිරීම ඇත්තේ නොවෙයි. ආනන්දය, යම් ඒ මහණෙක් තෙම ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරව නැත්තේ යටත් පැවතුම් නැත්තේ වාසය කෙරේද, ධර්මය කෙරෙහි ගෞරව නැත්තේ යටත් පැවතුම් නැත්තේ වාසය කෙරේද, සංඝයා කෙරෙහි ගෞරව නැත්තේ යටත් පැවතුම් නැත්තේ වාසය කෙරේද, ශික්ෂාවෙහි සම්පූර්ණ කිරීම ඇත්තේ නොවේද, හෙතෙම සංඝයා කෙරෙහි යම් විවාදයක් බොහෝදෙනාට අවැඩ පිණිස, බොහෝදෙනාට නොසැප පිණිස, බොහෝදෙනාට අනර්ථ පිණිස, දෙවි මිනිසුන්ට අහිත පිණිස, දුක් පිණිස වේද, එබඳු විවාද උපදවයි. ආනන්දය, ඉදින් තෙපි මෙබඳු විවාදයට මුල් කරුණු තමා කෙරෙහි හෝ පිටත්හි හෝ දකින්නාහුද, ආනන්දය, එහි තෙපි ඒ ලාමකවූ විවාදමූලයාගේම දුරුකිරීමට උත්සාහ කරන්නාහුය. ආනන්දය, ඉදින් තෙපි මෙබඳු විවාද මූලය තමා කෙරෙහි හෝ පිටත්හි හෝ නොදක්නාහු නම් ආනන්දය, එහි තෙපි ඒ ලාමකවූ විවාදමූලයාගේම මත්තෙහි නොහටගැනීම පිණිස පිළිපදින්නාහුය. මෙසේ මේ ලාමකවූ විවාද මූලයාගේ දුරුකිරීම වේ. මෙසේ මේ ලාමක විවාද මූලයාගේ මත්තෙහි නොහටගැනීම වේ.

"ස්වකීය දෘෂ්ටිය අල්වාගැනීම ඇත්තේ දැඩිව ගැනීම ඇත්තේ දුරලිය නොහැක්කේ වේ.

11 "ආනන්දය, හෙතෙම ශාස්තෘන්වහන්සේ කෙරෙහිද, ගෞරව නොකරන්නේ යටත් පැවතුම් නැත්තෙක්ව වාසය කරයි. ධර්මය කෙරෙහිද ගෞරව නොකරන්නේ යටත් පැවැතුම් නැත්තෙක්ව වාසය කරයි. සංඝයා කෙරෙහිද ගෞරව නොකරන්නේ යටහත් පැවතුම් නැත්තේ වාසය කරයි. සීලයද

සම්පූර්ණ නොකරන්නේ වෙයි. ආනන්දය, යම් ඒ මහණෙක් තෙම ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව නොකරන්නේ යටත් පැවතුම් නැත්තෙක්ව වාසය කෙරේද, ධර්මය කෙරෙහි ගෞරව නොකරන්නේ යටත් පැවතුම් නැත්තෙක්ව වාසය කෙරේද, සංඝයා කෙරෙහි ගෞරව නොකරන්නේ යටත් පැවතුම් නැත්තෙක්ව වාසය කෙරේද, ශීලය සම්පූර්ණ නොකරන්නෙක් වේද හෙතෙම සංඝයා කෙරෙහි විවාද උපදවයි. යම් විවාදයෙක් බොහෝ දෙනාට අවැඩ පිණිස බොහෝ දෙනාට නොසැප පිණිස බොහෝදෙනාට අනර්ථ පිණිස දෙවිමිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස වන්නේද (එබඳු විවාදයෙකි)

12. "ආනන්දය, ඉදින් තෙපි මෙබඳු විවාදයට මුල් කරුණ තමන් කෙරෙහි හෝ පිටත්හි හෝ දක්නහු නම්; ආනන්දය, එහි තෙපි එම ලාමකවූ විවාද මූලයාගේ දුරුකිරීම පිණිස උත්සාහ කරව්. ආනන්දය, ඉදින් තෙපි මෙබඳු විවාද මූලය තමන් කෙරෙහි හෝ පිටත්හි හෝ නොදක්නහු නම්, ආනන්දය එහි තෙපි එම ලාමකවූ විවාද මූලයාගේ නොවැඩීම පිණිස පිළිපදිව්. මෙසේ මේ ලාමකවූ විවාදමූලයාගේ පහ කිරීමවේ. මෙසේ මේ ලාමකවූ විවාදමූළයාගේ මත්තෙහි නොහට ගැණීමවේ. ආනන්දය, මොහු වනාහි විවාදයට මුල් කරුණු සය වෙත්.

13. 'ආනන්දය, මේ අධිකරණ සතරක් වෙත්. විවාදය පිළිබඳ අධිකරණය, සීල විපත්ති ආදීන් චොදනා කිරීම් පිළිබඳ අධිකරණය, සප්ත ආපත්ති ස්කන්ධයන් පිළිබඳවූ අධිකරණය, අවලොකන ආදී කටයුතු පිළිබඳ අධිකරණය, ආනන්දය, මොහු වනාහි අධිකරණ සතර වෙත්.

14. "ආනන්දය, උපනුපන් අධිකරණයන්ගේ සමථය පිණිස සංසිඳීම පිණිස අධිකරණ සමථ සතක් වෙත්. සම්මුඛාවිනය දිය යුත්තේය. සති විනය දියයුත්තේය. අමූළ්හ විනය දියයුත්තේය. ප්‍රතිඥාවෙන් කරවිය යුතුයි. යෙභුය්‍යසිකාවය, තස්සපාපියය්‍යසිකාය, තිණවත්ථාරකය, යන සතයි.

15. "ආනන්දය, කෙසේ නම් සම්මුඛාවිනය වේද? ආනන්දය, මේ ශාසනයෙහි භික්ෂූහු අධර්මය ධර්මයයි කියමින් හෝ ධර්මය

අධර්මයයි කියමින් හෝ අවිනය විනයයි කියමින් හෝ විනය අවිනයයි කියමින් කලහ කෙරෙත්ද, ආනන්දය, ඒ සියලුම භික්ෂූන් විසින් සමගිව රැස්විය යුතුයි. රැස්ව ධර්ම නීතිය පරීක්ෂාකර බැලියයුතුයි. ධර්ම නීතිය පරීක්ෂාකොට බලා යම් ආකාරයකින් ධර්ම නීතිය හා සමවේද, ඒ ආකාරයෙන් ඒ අධිකරණය, කලහය, සංසිඳවිය යුතුයි. ආනන්දය, මෙසේ සංසිඳුවීම සම්මුඛාවිනය නම් සංසිඳුවීමවේ. මෙසේ වනාහි මේ ශාසනයෙහි සමහර අධිකරණයන්ගේ සංසිඳීමවේ. එනම්, සම්මුඛා විනයයෙනි.

**16.** "ආනන්දය, කෙසේනම් යෙභුයාසිකා නම් සංසිඳ වීමවේද, ආනන්දය, ඉදින් ඒ භික්ෂූහු ඒ අධිකරණය ඒ ආවාසයෙහි සංසිඳවන්ට නොහැකිවෙත් නම්, ආනන්දය, ඒ භික්ෂූන්ට වඩා යම් ආවාසයක භික්ෂූහු ඉතා බොහෝ වෙත් නම් ඒ ආවාසයට යායුත්තේය. එහි සියල්ලන්ම සමගිව රැස්විය යුතුයි.

රැස්ව ධර්ම නීතිය පරීක්ෂාකර බැලිය යුතුයි. ධර්ම නීතිය පරීක්ෂාකර බලා යම් ආකාරයකින් ධර්ම නීතිය හා සමවේද, ඒ ආකාරයෙන් ඒ අධිකරණය සංසිඳවිය යුතුයි. ආනන්දය, මෙසේ වනාහි යෙභුයාසිකා නම් සංසිඳවීමවේ. මෙසේද වනාහි මේ ශාසනයෙහි ඇතැම් අධිකරණයන්ගේ සංසිඳීමවේ. එනම්, යෙභුයාසිකාවෙනි.

**17.** "ආනන්දය, කෙසේ නම් සතිවිනය නම් සංසිඳවීම වේද, ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම මහණෙකුට පාරාජිකාවකින් හෝ පාරාජිකාවට ලංවූ ඇවතකින් හෝ මෙබඳු ගරු ඇවතකින් 'ආයුෂ්මත් තෙමේ පාරාජිකාවකට හෝ පාරාජිකාවට ලංවූ ඇවතකට හෝ මෙබඳු ගරු ඇවතකට පැමිණි බව මතකදැයි' චෝදනා කරන්නේය. හෙතෙම ඇවැත්නි, මම පාරාජිකාවකට හෝ පාරාජිකාව ලංවූ ඇවතකට හෝ මෙබඳු ගරු ඇවතකට පැමිණි බව සිහි නොවෙමියි' කියන්නේද, ආනන්දය, ඒ භික්ෂූහුහට වනාහි සතිවිනය නම් සංසිඳවීම දිය යුත්තේය. ආනන්දය, මෙසේ වනාහි සතිවිනය නම් සංසිඳවීමවේ.

මෙසේද වනාහි මේ සස්නෙහි ඇතැම් අධිකරණයන්ගේ සංසිඳීමවේ. එනම්, සතිවිනයයෙනි.

18. "ආනන්දය, කෙසේ නම් අමූළ්හ විනය නම් සංසිඳවීම වේද, ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම මහණෙකුට පාරාජිකාවකින් හෝ පාරාජිකාවට ලංවූ ඇවතකින් හෝ මෙබඳුවූ ගරු ඇවතකින් 'ආයුෂ්මත් තෙමේ පාරාජිකාවකට හෝ පාරාජිකාව ලංවූ ඇවතකට හෝ මෙබඳු ගරු ඇවතකට පැමිණි බව මතකදැයි චොදනා කරන්නේය. හෙතෙම 'ඇවැත්නි, මම පාරාජිකාවකට හෝ පැමිණියේ පාරාජිකාව ලංවූ ඇවතකට හෝ මෙබඳු ගරු ඇවතකට පැමිණිබව මතක නැතැයි කියන්නේය. හෙතෙම ඔහුට අවුල් හැරීම වැඩියක් අවුල් කෙරෙයි. 'ආයුෂ්මත් තෙමේ යහපත්වම දැන ගනු මැනව. ඉදින් පාරාජිකාවකට හෝ පාරාජිකාවට ලංවූ ඇවතකට හෝ මෙබඳු ගරු ඇවතකට පැමිණි බව සිහි කෙරෙහිදැයි' කියායි හෙතෙම මෙසේ කියයි. 'ඇවැත්නි, මම වනාහි උමතු බවට චිත්තයාගේ පෙරළීමට පැමිණියෙමි. ඒ උමතුවූ මා විසින් ශ්‍රමණයන්ට නුසුදුසුවූ බොහෝ දේ කරන ලදී. නුසුදුසු වචන කියනලදී. නුසුදුසු ක්‍රියා කරනලදී. මට එය මතක නැත. මුලාවූ මා විසින් එය කරණලදැයි' කියන්නේය ආනන්දය, ඒ භික්ෂුහට වනාහි අමූළ්හ විනය නම් සංසිඳුවීම දිය යුතුයි. ආනන්දය, මෙසේ වනාහි අමූළ්හ විනය නම් සංසිඳවීම වේ. මෙසේද වනාහී මේ ශාසනයෙහි ඇතැම් අධිකරණයන්ගේ සංසිඳීම වේ. එනම්; අමූළ්හ විනයයෙනි.

19. "ආනන්දය, කෙසේ නම්, පටිඤ්ඤාතකරණය සංසිඳවීම වේද, ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම චොදනා කරණ ලද්දේ හෝ චෝදනා නොකරණ ලද්දේ හෝ ඇවත සිහි කරයිද, ප්‍රකාශ කරයිද, ප්‍රකට කෙරේද, ආනන්දය, ඒ භික්ෂුව විසින් වැඩිමහලු භික්ෂුවක් කරා පැමිණ සිවුර එකාංශ කොට පොරවා පා වැඳ උක්කුටුකයෙන් ඉඳ ඇඳිලි බැඳගෙණ 'ස්වාමීනි, මම මෙනම් ඇවතකට පැමිණියෙමි. එය දෙශනා කරමියි' මෙසේ කියයුතු වන්නේය. වැඩි මහලු භික්ෂුව 'ඇවත දක්නෙහිදැයි

අසයි.' හෙතෙම දක්නෙමියි කියන්නේය. 'මත්තෙහි සංවරයට පැමිණෙන්නෙහිදැයි' වැඩිමහල් තෙරුන් වහන්සේ අසයි. 'සංවරයට පැමිණෙන්නෙමියි' හෙතෙම කියන්නේය. ආනන්දය, මෙසේ වනාහි පටිඤ්ඤාතකරණය නම් සංසිඳවීම වේ. මෙසේද වනාහි මෙහි ඇතැම් අධිකරණයන්ගේ සංසිඳීමවේ. එනම්, පටිඤ්ඤාතකරණයෙනි.

**20.** "ආනන්දය, කෙසේ නම්, තස්සපාපියාසිකා නම් සංසිඳවීම වේද? ආනන්දය, මේ ශාසනයෙහි මහණෙක් මහණෙකුට 'පාරාජිකාවකින් හෝ පාරාජිකාවට ලංවූ ඇවතකින් හෝ මෙබඳුවූ ගරු ඇවතකින් ආයුෂ්මත් තෙමේ පාරාජිකාවකට හෝ පාරාජිකාවකට ලංවූ ඇවතකට හෝ මෙබඳු ගරු ඇවතකට පැමිණියා මතකදැයි' චොදනා කරන්නේය. හෙතෙම මෙසේ කියයි. 'ඇවැත්නි, මම පාරාජිකාවකට හෝ පාරාජිකාවට ලංවූ ඇවතකට හෝ මෙබඳු ගරු ඇවතකට පැමිණියා මතක නැතැයි' කියන්නේය.

හෙතෙම ඔහුට අවුල් හරින්නහු වැඩියක් අවුල් කෙරෙයි. 'ආයුෂ්මත් තෙමේ, ඉදින් පාරාජිකාවකට හෝ, පාරාජිකාවට ලංවූ ඇවතකට හෝ මෙබඳු ගරු ඇවතකට පැමිණිබව මතක් වෙහිදැයි මනාකොටම දැනගනුවයි' කියයි. 'ඇවැත්නි, මට පාරාජිකාවකට හෝ පාරාජිකාවට ලංවූ ඇවතකට හෝ මෙබඳු ගරු ඇවතකට පැමිණි බව මතක නැත. ඇවැත්නි, මෙබඳු කුඩා ඇවතකට පැමිණිබව මතකයයි' කියායි. හෙතෙම අවුල් හරින්නහු වඩාත් අවුල් කෙරෙයි. 'ආයුෂ්මත් තෙමේ ඉදින් පාරාජිකාවකට හෝ පාරාජිකාවට ලංවූ ඇවතකට හෝ මෙබඳු ගරු ඇවතකට පැමිණි බව මතකදැයි' මනාකොට දැන ගනුවයි' කියායි. හෙතෙම මෙසේ කියයි. 'ඇවැත්නි, මම වනාහි මෙනම් සුලු ඇවතකට පැමිණ නොඅසනලදුවම ප්‍රකාශ කරන්නෙමි. කිමෙක්ද? මම පාරාජිකාවකට හෝ පාරාජිකාවට ලංවූ ඇවතකට හෝ මෙබඳු ගරු ඇවතකට පැමිණ අසන ලදුව ප්‍රකාශ නොකරන්නෙම්දැ'යි කියන්නේය. හෙතෙම මෙසේ කියමි. 'ඇවැත්නි, නුඹ වනාහි මෙනම් සුලු ඇවතකට පැමිණ නො

අසන ලදුව ප්‍රකාශ නොකරන්නෙහිය, කිමෙක්ද, ඔබ පාරාජිකාවකට හෝ පාරාජිකාවට ලංවූ ඇවතකට හෝ මෙබඳු ගරු ඇවතට පැමිණ අසන ලදුව ප්‍රකාශ කරන්නෙහිද? ආයුෂ්මත් තෙමේ ඉදින් පාරාජිකාවකට හෝ පාරාජිකාවට ලංවූ ඇවතකට හෝ මෙබඳු ගරු ඇවතකට පැමිණි බව සිහි වන්නෙහිදැයි මනාකොටම දැනගනුවයි' කියන්නේය. ඒ භික්ෂු තෙමේ 'ඇවැත්නි, මට පාරාජිකාවකට හෝ පාරාජිකාවට ලංවූ ඇවතකට හෝ මෙබඳු ගරු ඇවතට පැමිණි බව මතකය, ඉක්මන් කම නිසා හෝ අනිකක් කියනු කැමතිව මා විසින් මෙසේ අනිකක් කීම නිසා හෝ මට පාරාජිකාවකට හෝ පාරාජිකාවට ලංවූ ඇවතකට හෝ මෙබඳු ගරු ඇවතට පැමිණි බව මතක නැතැයි' කියනලදී. ආනන්දය, මෙසේ වනාහි තස්සපාපියාසිකා නම් සංසිඳවීම වේ. මෙසේද වනාහි මෙහි ඇතැම් අධිකරණයන්ගේ සංසිඳීම වේ. එනම්, තස්ස පාපියාසිකාවෙනි.

21. "ආනන්දය, කෙසේ නම් තිණවත්ථාරක නම් සංසිඳවීම වේද? ආනන්දය, මේ ශාසනයෙහි හටගත් දබර ඇති හටගත් කලහ ඇති විවාදයට පැමිණ වාසය කරන්නාවූ භික්ෂූන්ගේ බොහෝවූ ශ්‍රමණයන්ට නුසුදුසුවූ කියන ලද දෙය හා කරණලද දෙය පුරුදු කරණ ලද්දේ වෙයි. ආනන්දය, ඒ සියලුම භික්ෂූන් විසින් සමගිව රැස්විය යුතුයි. රැස්ව එක්පක්ෂයෙහිවූ භික්ෂූන්ගෙන් ඉතා දක්ෂවූ භික්ෂුවක් විසින් හුනස්නෙන් නැගිට සිව්රු ඒකාංස කොට ඇඳිලි බැඳගෙන සංඝයාහට දැන්විය යුත්තේය. 'ස්වාමීනි, සංඝතෙම මා කියන්නක් අසාවා. හටගත් දබර ඇත්තාවූ හටගත් කලහ ඇත්තාවූ විවාදයට පැමිණ වාසය කරන්නාවූ අපගේ මේ බොහෝවූ ශ්‍රමණයන්ට නුසුදුසුවූ කියන ලද්දාවූද, කරන ලද්දාවූද, පුරුදු කරණ ලද්දාවූද දේවෙයි.

'ඉදින් සංඝයාට පැමිණි කල් ඇත්තේ නම්, මම මේ ආයුෂ්මතුන්ලාගේ යම් ඇවතකුත් වේද, තමන්ගේ යම් ඇවතකුත්වේද, මහත් වරද සහ ගිහියන් පිළිබඳ වරද හැර යම් සෙසු සියලු ඇවැත් මේ ආයුෂ්මතුන්ලාගේ ප්‍රයෝජනය පිණිසද, තමන්ගේ ප්‍රයෝජනය පිණිසද, සංඝයා මධ්‍යයෙහි තිණවත්ථාරක කර්මයෙන් දෙශනා කරන්නෙමියි.' (කියයුතුය)

"ඉක්බිති අනික් පක්ෂයෙක්හිවූ භික්ෂූන්ගෙන් ඉතා දක්ෂවූ භික්ෂුවක් විසින් හුනස්නෙන් නැගිට සිවුර එකාංශ කොට පොරවා ඇඳිළි බැඳගෙණ සංඝයාහට දැන්විය යුත්තේය. 'ස්වාමීනි, සංඝතෙමේ මා කියන්නක් අසන සේක්වා. හටගත් දබර ඇත්තාවූ හටගත් කලහ ඇත්තාවූ විවාදයට පැමිණ වාසය කරන්නාවූ අපගේ ඒ බොහෝ වූ ශ්‍රමණයන්ට නුසුදුසුවූ කියන ලද්දාවූද, කරණ ලද්දාවූද, පුරුදු කරණ ලද්දාවූද දේවෙයි. ඉදින් සංඝයාට පැමිණි කල් ඇත්තේ නම්, මම මේ ආයුෂ්මතුන්ලාගේ යම් ඇවතකුත් වේද, තමාගේ යම් ඇවතකුත් වේද, මහත් වරද සහ ගිහියන් පිළිබඳ වරද හැර සෙසු සියලු වරද මේ ආයුෂ්මතුන්ලාගේ ප්‍රයෝජනය පිණිසද, තමාගේ ප්‍රයෝජනය පිණිසද, සංඝයා මධ්‍යයෙහි තිණවත්ථාරක කර්මයෙන් දෙසන්නෙමියි' (කිය යුතුය).

"ආනන්දය, මෙසේ වනාහි තිණවත්ථාරක නම් සංසිඳවීමවේ. මෙසේද වනාහි මේ ශාසනයෙහි ඇතැම් අධිකරණයන්ගේ සංසිඳීමවේ. එනම්, තිණවත්ථාරකයෙනි.

22. "ආනන්දය, ප්‍රියබව ඇතිකරන්නාවූ ගරුබව ඇති කරන්නාවූ රැස්වීම පිණිස විවාද නොකිරීම පිණිස සමගිය පිණිස එක්වීම පිණිස මේ සිහිකටයුතු ධර්ම සයක් පවතිත්. එක්ව මහණදම් පුරන්නවුන් කෙරෙහි ඉදිරියෙහිද නොඉදිරියෙහිද කවර සයක්දයත්? ආනන්දය, මේ ශාසනයෙහි මහණහුගේ මෛත්‍රී කාය කර්මය එළඹ සිටියේ වෙයිද. ප්‍රියබව ඇති කරන්නාවූ ගරුබව ඇතිකරන්නාවූ මේ සිහිකටයුතු ධර්මයද රැස්වීම පිණිස විවාද නොකිරීම පිණිස සමගිය පිණිස එක් වීම පිණිස පවතියි.

23 "ආනන්දය, නැවතද අනිකක් කියමි එකට මහණදම් පුරන භික්ෂූන් කෙරෙහි ඉදිරියෙහිද නොඉදිරියෙහි භික්ෂුහුගේ මෛත්‍රී වාග් කර්මය එළඹ සිටියේ වෙයි. ප්‍රිය කරන්නාවූ, ගරුකරන්නාවූ, මේ සිහිකටයුතු ධර්මයද සංග්‍රහය පිණිස විවාද නොකිරීම පිණිස සමගිය පිණිස එකඟ බව පිණිස පවතියි.

"ආනන්දය, නැවත අනිකක් කියමි. සබ්‍රම්සරුන් අභිමුඛයෙහිද අනභිමුඛයෙහිද භික්ෂුවගේ මෛත්‍රී මනොකර්මය

එළඹ සිටියේ වෙයි. ප්‍රියබව කරන්නාවූ ගරුබව කරන්නාවූ මේ සිහි කටයුතු ධර්මයද, රැස්වීම පිණිස විවාද නොකිරීම පිණිස සමගිය පිණිස එක්වීම පිණිස පවතියි.

**24.** "ආනන්දය, නැවත අනිකක්ද කියමි. මහණතෙම යම් ඒ ධාර්මිකවූ දැහැමින් ලබනලද්දාවූ යටත් පිරිසෙයින් පාත්‍රයෙහි ඇතුළත් වූවක් පමණවූද ලාබයෝ වෙත්ද, එබඳුවූ ලාභ සිල්වත්වූ සබ්‍රම්සරුන් හා බෙදා හදා නොවළඳන්නෙක් නොවේද සමව බෙදා වළඳන්නෙක් වේද, ප්‍රියබව ඇති කරන්නාවූ ගරු බව ඇති කරන්නාවූ මේ සිහි කටයුතුවූ ධර්මයද, රැස්වීම පිණිස අවිවාද පිණිස සමගිය පිණිස එක්වීම පිණිස පවතියි.

**25.** "ආනන්දය, නැවතද අනිකක්ද කියමි. මහණ තෙම කඩනොවූ සිදුරු නොවූ කබර නොවූ කැළල් නොවූ දාසකමින් මිදුනාවූ නුවණැත්තන් විසින් පසස්නා ලද්දාවූ තෘෂ්ණා දෘෂ්ටි දෙකින් අල්වා නොගන්නා ලද්දාවූ සමාධිය පිණිස පවත්නාවූ යම් ඒ සීලයෝ වෙත්ද, එබඳු සීලයන්හි සබ්‍රම්සරුන් හා ඉදිරියෙහිද නොඉදිරියෙහිද සීලයෙන් සමාන බවට පැමිණ වාසය කරයිද ප්‍රියබව ඇතිකරන්නාවූ ගරුබව ඇතිකරන්නාවූ මේ සිහි කටයුතුවූ ධර්මයද රැස්වීම පිණිස අවිවාදය පිණිස සමගිය පිණිස එක්වීම පිණිස පවතියි.

**26.** "ආනන්දය, නැවත අනිකක්ද කියමි. මහණ තෙම යම් මේ ආර්‍ය්‍යවූ නෛර්‍ය්‍යාණිකවූ එය පිළිපදින්නාහුගේ දුක් මනාව නැසීම පිණිස පවත්නාවූ යම් ඒ ප්‍රඥාවක් වෙයිද එබඳු ප්‍රඥාවෙන් සබ්‍රම්සරුන් හා ඉදිරියෙහිද නොඉදිරියෙහිද සමාන බවට පැමිණ වාසය කරයිද, ප්‍රියබව ඇතිකරන්නාවූ ගරුබව ඇතිකරන්නාවූ මේ සිහිකටයුතු ධර්මයද රැස්වීම පිණිස අවිවාදය පිණිස එක්වීම පිණිස පවතියි. ආනන්දය, ප්‍රියබව ඇතිකරන්නාවූ ගරුබව ඇතිකරන්නාවූ මේ සිහි කටයුතු ධර්ම සය රැස්වීම පිණිස අවිවාදය පිණිස සමගිය පිණිස එක්වීම පිණිස පවතිත්. ආනන්දය, ඉදින් තෙපි මේ සිහිකටයුතු ධර්ම සය සමාදන්ව පවත්නාහු නම්, ආනන්දය, තෙපි නොඉවසන්නාවූ කුඩා වරද

ඇත්තාවූ හෝ මහත් වරද ඇත්තාවූ යම් වචනයක් දකිව්ද?" "ස්වාමීනි නැත"

"ආනන්දය, එහෙයින් මේ සිහි කටයුතු ධර්ම සය සමාදන්ව පවතිව්. එය තොපට බොහෝ කලක් හිත පිණිස සැප පිණිස වන්නේය."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සතුටු සිත් ඇත්තාවූ ආයුෂ්මත් ආනන්දස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තේය.

**සාමගාම සූත්‍රය නිමි (1-4)**

---

## 5. සුනක්ඛත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසාලා මහනුවර මහවනයෙහිවූ කූටාගාර ශාලාවෙහි වැඩ වසන සේක. එකල්හි වනාහි බොහෝවූ භික්ෂූන් විසින් භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි ජාතිය ක්ෂය කරන ලද්දීය. මාර්ග බ්‍රහ්මචය්‍ර්‍යාව වැස නිමවන ලදී. සතර මාර්ගයෙන් කටයුතු දෙය කරණලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතයි දනිමුයයි රහත්බව ප්‍රකාශ කරණ ලද්දේ වෙයි. සුනක්ඛත්ත නම් ලිච්ඡවි පුත්‍රතෙම 'බොහෝවූ භික්ෂූන් විසින් භාග්‍යවතුන් වහන්සේ සමීපයෙහි; ජාතිය ක්ෂය කරණ ලද්දීය. මාර්ග බ්‍රහ්මචය්‍ර්‍යාව වැස නිමවන ලදී. සතර මාර්ගයෙන් කටයුතු දෙය කරණලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දනිමු, කියා අර්හත්වය ප්‍රකාශ කරණ ලදැයි' ඇසුවේමය.

2. ඉක්බිති සුනක්ඛත්ත නම් ලිච්ඡවි පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට ගියේය. ගොස් භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පැත්තක උන්නේය. එක් පැත්තක උන්නාවූ සුනක්ඛත්ත නම් ලිච්ඡවි පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, බොහෝ වූ භික්ෂූන් විසින් වනාහි භාග්‍යවතුන්

වහන්සේගේ සමීපයෙහි "ජාතිය ක්ෂය කරණ ලදී. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදී. සතර මාර්ගයෙන් කටයුතු දෙය කරණ ලදි. මේ ආත්ම භාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දනිමු" කියා අර්හත්වය ප්‍රකාශ කරණ ලදැයි, මෙය මා විසින් අසන ලදී. ස්වාමීනි, යම් මේ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි ජාතිය ක්ෂය කරණ ලද්දීය. මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලද්දේය. සතර මාර්ගයෙන් කටයුතු දෙය කරණ ලදී. මේ ආත්මභාවය පිණිස කටයුතු අනිකක් නැතැයි, දනිමුයි; රහත්බව ප්‍රකාශ කරණ ලද්දාහුද,? ස්වාමීනි, කිමෙක්ද, ඒ භික්ෂූහු මනාකොටම රහත්බව ප්‍රකාශ කළාහුද නොහොත් මෙහි සමහර භික්ෂූහු අධිමානයෙන් (රහත්ය යන හැඟීමෙන්) ප්‍රකාශ කළාහුදැ?"යි ඇසීය.

3. "සුනක්ඛත්තය, යම් ඒ භික්ෂූහු මා සමීපයෙහි ජාතිය ක්ෂය කරණ ලද්දීය, මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලද්දේය. සතර මාර්ගයෙන් කටයුතු දෙය කරණ ලද්දේය. මේ ආත්ම භාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දනිමුයි, රහත්බව ප්‍රකාශ කළාහුද, මෙහි ඇතැම් භික්ෂුහු මනාකොටම රහත්බව ප්‍රකාශ කළාහු වෙත්. මෙහි ඇතැම් භික්ෂූහු අධිමානයෙන්ද රහත්බව ප්‍රකාශ කළාහු වෙත්මැයි. සුනක්ඛත්තය, එහි යම් ඒ භික්ෂූහු මනාකොටම රහත්බව ප්‍රකාශ කළාහුද, ඔවුන්ගේ එය එසේම වෙයි යම් ඒ භික්ෂූහු වනාහි අධිමානයෙන් රහත්බව ප්‍රකාශ කළාහුද, සුනක්ඛත්තය, එහි තථාගතයන්ට ඔවුන්ට ධර්මය දෙශනා කරන්නෙමියි, මෙබඳු අදහසක් වෙයි. සුනක්ඛත්තය, මෙහි තථාගතයන්ට ඔවුන්ට ධර්මය දෙශනා කරන්නෙමියි, මෙබඳු අදහසක් වෙයි. එතකුදු වුවත් මෙහි ඇතැම් හිස් පුරුෂයෝ ප්‍රශ්න සදාගෙන තථාගතයන් කරා පැමිණ අසත්. සුනක්ඛත්තය, එහි තථාගතයන්ට ඔවුන්ට ධර්මය දෙශනා කරන්නෙමි, යන මෙබඳු අදහසක් වෙයි. එයිනුදු ඔහුගේ සිත වෙනස් වේය කියායි"

4. "භාග්‍යවතුන් වහන්ස, මෙයට මේ සුදුසු කාලය වේ. සුගතයන් වහන්ස, මෙයට සුදුසු කාලය වේ, භාග්‍යවතුන් වහන්සේ යම් ධර්මයක් දෙශනා කරන්නේද, භාග්‍යවතුන්

වහන්සේගෙන් අසා භික්ෂූහු දරන්නාහුයයි” කීය. සුනක්ඛත්තය, එසේ වීනම් අසව, මනාකොට මෙනෙහි කරව, කියන්නෙමියි” වදාළේය. ස්වාමීනියි” සුනක්ඛත්ත නම් ලිච්ඡවි පුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

**5.** “සුනක්ඛත්තය, මේ කාමගුණයෝ පසක් වෙත්. කවර පසක්ද යත්, ඉෂ්ටවූ කැමති වන්නාවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමය පිණිස පවත්නාවූ ඇළුම් උපදවන්නාවූ ඇසින් දතයුතු රූපයෝය. ඉෂ්ට වූ කැමතිවන්නාවූ මනවඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇළුම් උපදවන්නාවූ, කණින් දතයුතු ශබ්දයෝය. ඉෂ්ටවූ, කැමති වන්නාවූ, මනවඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇළුම් උපදවන්නාවූ, නැහැයෙන් දතයුතු ගන්ධයෝය. ඉෂ්ටවූ, කැමති වන්නාවූ, මනවඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇළුම් උපදවන්නාවූ, දිවෙන් දතයුතු රසයෝය. ඉෂ්ටවූ, කැමති වන්නාවූ, මනවඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමය පිණිස පවත්නාවූ, ඇළුම් ඇතිකරන්නාවූ, ශරීරයෙන් දැනගතයුතුවූ ස්පර්ශයෝය. සුනක්ඛත්තය, මොහු වනාහි කාමගුණ පස වෙත්.

**6.** “සුනක්ඛත්තය, මේ ලොකයෙහි ඇතැම් පුරුෂ පුද්ගලයෙක්තෙම පඤ්චකාම ගුණයන්හි ඇලුණ පුද්ගලයෙක් වන්නේය යන යමක් වේද, ඊට හෙතු ඇත්තේය. සුනක්ඛත්තය, පඤ්චකාම ගුණයෙහි ඇලුණු පුරුෂ පුද්ගලයා වනාහි ඊට සුදුසුවූ කථා ඇත්තේ වෙයි. ඊට අනුකූලවූ කරුණුම නැවත නැවත සිතන්නේ වෙයි. නැවත නැවත කල්පනා කරන්නේ වෙයි. එබඳු පුරුෂයන්ම සේවනය කරයි. ඔහු සමගම සතුටට පැමිණෙයි. කම්පානොවන යට ධ්‍යාන සය පිළිබඳ කථාවක් කියනු ලබන කල්හි ඇහුන්කන් නොදෙයි. කණ යොමු නොකරයි. දැනගැනීම පිණිස සිත නොඑලවයි. එබඳු පුරුෂයාද සේවනය නොකරයි. ඔහු සමග සතුටටද නොපැමිණෙයි.

7. "සුනක්ඛත්තය, යම්සේ පුරුෂයෙක් තමන්ගේ ගමින් හෝ නියම් ගමින් හෝ පිටවී බොහෝ කලක් වාසය කරණ ලද්දේ වේද, හෙතෙම ඒ ගමින් හෝ නියම් ගමින් හෝ බැහැර ගිය නොබෝකල් ඇති එක්තරා පුරුෂයෙකු දක්නේද, හෙතෙම ඒ පුරුෂයාගෙන් ඒ ගමේ හෝ නියම් ගමේ හෝ නිර්භය බවද, සුභික්ෂ බවද, නීරෝග බවද අසන්නේය. ඔහුට ඒ පුරුෂතෙම ඒ ගමේ හෝ නියම් ගමේ නිර්භය බවද, සුභික්ෂ බවද, නිරොග බවද කියන්නේය. සුනක්ඛත්තය, ඒ කුමකැයි හඟින්නෙහිද? ඒ පුරුෂතෙම ඒ පුරුෂයාගේ කීම අසනු කැමැති වන්නේද? කන් යොමු කරන්නේද? දැනගැනීමට සිත එලවන්නේද? ඒ පුරුෂයාත් සේවනය කරන්නේද? ඔහු සමග සතුටටත් පැමිණෙන්නේද?"

"ස්වාමීනි, එසේය."

8. "සුනක්ඛත්තය, එපරිද්දෙන්ම මෙහි ඇතැම් පුරුෂ පුද්ගලයෙක් පඤ්චකාම ගුණයෙහි ඇලුණු අදහස් ඇත්තෙක් වන්නේය යන යමක් ඇද්ද, ඊට හේතු ඇත්තේය. සුනක්ඛත්තය, පඤ්චකාම ගුණයෙහි ඇලුණු අදහස් ඇත්තාවූ පුරුෂ පුද්ගලයා ඊට සුදුසුවූම කථා ඇත්තේ වෙයි. ඊට අනුකූලවූම කරුණු නැවත නැවත කල්පනා කරයි. නැවත නැවත සලකයි. ඒ පුරුෂයාද සේවනය කරයි. ඔහු සමග සතුටටද පැමිණෙයි. කම්පා නොවන යට ධ්‍යාන සය පිළිබඳවූ කථා කියනු ලබන කල්හි අසන්ට කැමැති නොවෙයි. කන් යොමු නොකරයි. දැනගැනීමට සිත නොඑලවයි. ඒ පුරුෂයාද සේවනය නොකරයි. ඔහු සමග සතුටටද නොපැමිණෙයි. හෙතෙම (ලොකාමිසයෙහි) පඤ්චකාම ගුණයෙහි ඇලුණු අදහස් ඇති පුරුෂ පුද්ගලයායයි දතයුතු වන්නේය.

9. "සුනක්ඛත්තය, මෙහි ඇතැම් පුරුෂ පුද්ගලයෙක් කම්පා නොවන යට ධ්‍යාන සයෙහි ඇලුණු පුද්ගලයෙක් වන්නේය යන යමක් ඇද්ද ඊට හේතු ඇත්තේය. සුනක්ඛත්තය, යට ධ්‍යානයෙහි ඇලුණු පුරුෂ පුද්ගලයා ඊට සුදුසුවූ කථාම කරයි. ඊට අනුකූලවූ කරුණුම සිතයි. කල්පනා කරයි. එ වැනි පුරුෂයාම

සේවනය කරයි. ඔහු සමග සතුටටද පැමිණෙයි. පඤ්චකාම ගුණයන් පිළිබඳ කථා කරනු ලබන කල්හි එය අසන්ට කැමැති නොවෙයි. කන් යොමු නොකරයි. දැනගැනීම පිණිස සිත නොඑලවයි. එවැනි පුරුෂයාද සේවනය නොකරයි. ඔහු සමග සතුටටද නොපැමිණෙයි.

10. "සුනක්ඛත්තය, යම්සේ නටුවෙන් ගිලිහුණාවූ ඉදුනු කොළය නටුවෙන් නැවත තිල්වන් වීමට සුදුසු නොවේද, සුනක්ඛත්තය, එපරිද්දෙන්ම යට ධ්‍යාන සයෙහි ඇලුණු පුරුෂ පුද්ගලයා යම් ඒ පඤ්චකාම ගුණයක් වේද, එයින් මිදුනේය. හෙතෙම පඤ්චකාම ගුණයන්හි නොඇලුණාවූ කම්පානොවන යට ධ්‍යාන සයෙහි ඇලුණු පුද්ගලයායයි දතයුතු වන්නේය.

11. "සුනක්ඛත්තය, මෙහි ඇතැම් පුරුෂ පුද්ගලයෙක් ආකිඤ්චඤ්ඤායතන සමාධියෙහි ඇලුණු පුද්ගලයෙක් වන්නේය යන යමක් වේද, ඊට හේතු ඇත්තේය. සුනක්ඛත්තය, ආකිඤ්චඤ්ඤායතන සමාධියෙහි ඇලුණු පුරුෂ පුද්ගලයා ඊට සුදුසුවූම කථාකරයි. ඊට අනුකූලවූම කරුණු සිතයි. කල්පනා කරයි. ඒ පුරුෂයා සේවනයද කරයි. ඔහු සමග සතුටටද පැමිණෙයි. යට ධ්‍යාන සය පිළිබඳ කථා කියනු ලබන කල්හි අසන්ට කැමැති නොවෙයි. කන් යොමු නොකරයි. දැන ගැනීමට සිත නොඑලවයි. ඒ පුරුෂයාද සේවනය නොකරයි. ඔහු සමගද සතුටටද නොපැමිණෙයි. සුනක්ඛත්තය, යම්සේ දෙකට බිඳුනාවූ මහ ගලක් හාකළ නොහැක්කේද, සුනක්ඛත්තය, එපරිද්දෙන්ම ආකිඤ්චඤ්ඤායතන සමාධියෙහි ඇලුණු පුරුෂ පුද්ගලයාගේ යම් යට ධ්‍යානයන් පිළිබඳ ඇලීමක් වේද, එය බිඳුනේ වෙයි. හෙතෙම යට ධ්‍යානසයෙහි නොඇලුණු ආකිඤ්චඤ්ඤායතනයෙහි ඇලුණු පුරුෂ පුද්ගලයායයි දතයුතු වන්නේය.

12. "සුනක්ඛත්තය, මෙහි ඇතැම් පුරුෂ පුද්ගලයෙක් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාධියෙහි ඇලුණු ඇත්තෙක් වන්නේය යන යමක් වේද, ඊට හේතු අදහස් ඇත්තේය. සුනක්ඛත්තය, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාධියෙහි

ඇලුණු අදහස් ඇත්තාවූ පුරුෂ පුද්ගලයා ඊට සුදුසුවූ කථාවක්ම කරයි. ඊට අනුකූල කරුණුම සිතයි. කල්පනා කරයි. ඒ පුරුෂයාද සේවනය කරයි. ඔහු සමග සතුටටද පැමිණෙයි. ආකිඤ්චඤ්ඤායතන සමාධිය කථා කියනු ලබන කල්හි අසන්ට කැමැති නොවෙයි. කන් යොමු නොකරයි. දැන ගැනීමට සිත නොඑලවයි. ඒ පුරුෂයාද සේවනය නොකරයි. ඔහු සමග සතුටටද නොපැමිණෙයි. සුනක්ඛත්තය, යම්සේ පුරුෂයෙක් රසවත් ආහාරයක් වළඳා නිමවූ කල හැර දමන්නේද, සුනක්ඛත්තය, ඒ කුමකැයි හඟින්නෙහිද, ඒ පුරුෂයාහට ඒ අනුභව කළ භොජනය වමනය කළ කල්හි එය නැවත අනුභව කරන්ට කැමැත්තක් වන්නේද?"

"ස්වාමීනි, එසේ නොවන්නේමැයි. ඊට හෙතු කවරේද? ස්වාමීනි, ඒ වමනය කළ ආහාරය වනාහි පිළිකුල්යයි සම්මත හෙයිනි."

13. "සුනක්ඛත්තය, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාධියෙහි ඇලුණු අදහස් ඇති පුරුෂ පුද්ගලයා ආකිඤ්චඤ්ඤායතන සංයොජනය වමනය කල්හිද එසේමය. හෙතෙම ආකිඤ්චඤ්ඤායතන සංයොජනයෙන් නොබැඳුණු නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාධියෙහි ඇලුණු පුරුෂ පුද්ගලයා යයි දතයුතු වන්නේය.

"සුනක්ඛත්තය, මෙහි ඇතැම් පුරුෂ පුද්ගලයෙක් මනාකොට නිවණෙහි කැමති අදහස් ඇත්තෙක් වන්නේය යන යමක් වේද, ඊට හේතු ඇත්තේය. සුනක්ඛත්තය, මනාව නිවණෙහි කැමැති අදහස් ඇති පුරුෂ පුද්ගලයා ඊට සුදුසුවූ වචනම කථා කරයි. ඊට අනුකූල කරුණුම සිතයි. කල්පනා කරයි. ඒ පුරුෂයාද සේවනය කරයි. ඔහු සමග සතුටටද පැමිණෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාධිය පිළිබඳ කථා කියනු ලබන කල්හි අසන්ට නොකැමැති වෙයි. දැන ගැනීම පිණිස සිත නොඑළවයි. පුරුෂයාද සේවනය නොකරයි. ඔහු සමග සතුටටද නොපැමිණෙයි. සුනක්ඛත්තය, යම්සේ තල්ගස මස්තකය සිඳින ලද්දේ නැවත හටගැනීමට නුසුදුසු වේද,

සුනක්ඛත්තය, එපරිද්දෙන්ම මනාව නිවණෙහි කැමතිවූ අදහස් ඇති පුරුෂ පුද්ගලයා විසින් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාධියෙහි යම් බැඳීමක් වේද, එය සිඳින ලදී. සිඳිනලද මුල් ඇති තල්ගසක් මෙන් කරණලදී. විනාශ කරන ලදී. මතු නූපදින බවට පමුණුවන ලදී. හෙතෙම නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංයෝජනයෙන් වෙන්වූ මනාව නිවණෙහි නැමුණු අදහස් ඇති පුරුෂ පුද්ගලයායයි දතයුතු වන්නේය.

14. "සුනක්ඛත්තය, මේ සස්නෙහි ඇතැම් භික්ෂුවක්හට තෘෂ්ණාව වනාහි හුලකැයි බුද්ධශ්‍රමණයන් වහන්සේ විසින් වදාරණලදී. අවිද්‍යාව නමැති විෂදොෂය, ඡන්දරාගය, ව්‍යාපාදය කරණකොටගෙන කිපෙයි. 'මා විසින් තෘෂ්ණා නමැති හුල පහකරන ලදී. අවිද්‍යා නමැති විෂදොෂය ඉවත්කරණ ලද්දේය. මම වනාහි නිවණෙහි නැමුණු අදහස් ඇත්තෙක් වෙමියි, අර්ථයට සමානවූ මෙබඳු හැඟීම් ඇත්තෙක් වන්නේය, යන යමක් වේද ඊට හේතු ඇත්තේය. හෙතෙම වනාහි නිවණෙහි කැමැතිවූ සිත් ඇති පුද්ගලයාට නුසුදුසුවූ යම් අරමුණු වේද, ඒ අරමුණුවල බැඳෙන්නේය. ඇසින් නුසුදුසු රූපයක් දැක බැඳෙන්නේය. කණින් නුසුදුසු ශබ්දයක් අසා බැඳෙන්නේය. නාසයෙන් නුසුදුසු ගන්ධය දැන බැඳෙන්නේය. දිවෙන් නුසුදුසු රසය දැන බැඳෙන්නේය. කයෙන් නුසුදුසු ස්පර්ශය ස්පර්ශකොට බැඳෙන්නේය. සිතින් නුසුදුසුවූ ධර්මාරම්මණ දැන බැඳෙන්නේය. ඇසින් නුසුදුසු රූපයෙහි බැඳුනාවූ, කණින් නුසුදුසු ශබ්දයෙහි බැඳුණාවූ, නාසයෙන් නුසුදුසු ගන්ධයෙහි බැඳුනාවූ, දිවෙන් නුසුදුසු රසයෙහි බැඳුණාවූ, කයින් නුසුදුසු ස්පර්ශයෙහි බැඳුණාවූ, සිතින් නුසුදුසු ධර්මාරම්මණයෙහි බැඳුනාවූ, ඔහුගේ රාගය තෙම සිත වියලන්නේය (නසන්නේය) හෙතෙම රාගයෙන් වියලනලද සිතින් යුක්තව මරණයට හෝ මරණය හා සමාන දුකට හෝ පැමිණෙන්නේය.

15. "සුනක්ඛත්තය, යම්සේ පුරුෂතෙම විෂ සහිතවූ දැඩිකොට විෂ පොවනලද හුලකින් විදින ලද්දේ වන්නේද, ඔහුගේ අසල් වැසියෝ නෑ සහ ලේ නෑයෝ ශල්‍යකර්ම

කරන්නාවූ වෙදෙකු කැඳවන්නාහුය. ඔහුගේ ඒ ශල්‍යකර්මය කරන්නාවූ වෙදතෙම ආයුධයෙන් වණ මුඛය හාත්පස කපන්නේය. ආයුධයෙන් වණමුඛය හාත්පස කපා සොයන කටුවෙන් හුල සොයන්නේය. සොයන කටුවෙන් හුල සොයා හුල ඇද දමන්නේය. ඉතිරිවූ විෂ දොෂය ඉතිරිවූ විෂදොසක් නැතැයි හඟිමින් ඉවත් කරන්නේය.

"හෙතෙම මෙසේ කියන්නේය. 'පින්වත් පුරුෂය, නුඹගේ හුල උදුරා දමනලදී. විෂදොෂය ඉතිරි නොකොට ඉවත් කරනලදී. ඔබට මෙය අනතුරක් පිණිස නොවේ. පථ්‍යවූ ආහාර අනුභව කරව, අපථ්‍යවූ ආහාර අනුභව නො කරව, අපථ්‍ය ආහාර ගන්නේ වණය වැගිරීම් සහිත වන්නේය. කලින් කල වණය සේදුව මැනවි. කලින් කල වණ මුඛයෙහි බෙහෙත් ගැල්වුව මැනව, කලින් කල වණය නොසේදීමෙන් කලින් කල වණයෙහි බෙහෙත් නොගැල්වීමෙන් වණයෙහි සැරව හා ලේ බැඳ නොගනීවා. සුලං ඇති තන්හි හා අව්වෙහි නොඇවිදිනු. සුලං ඇති තන්හි හා අව්වෙහි ඇවිදීමෙන් වණයෙහි දූවිලි හා නණ්ඩු වැදීමට ඉඩ නොදේවා. පින්වත් පුරුෂය, වණය රකිමින් වණයෙහි මස් ලියලන අන්දමින් වාසය කරවයයි,' කියන්නේය. 'මෙසේ හෙතෙම මාගේ හුල උදුරා දමනලදී. විෂදොෂය ඉතිරි නොකොට ඉවත් කරණලදී. මට මෙයින් අනතුරක් නොවන්නේයයි,' සිතන්නේය. හෙතෙම අපථ්‍යවූ ආහාර අනුභව කරන්නේය. අපථ්‍ය ආහාර අනුභව කරන්නාවූ ඔහුගේ වණය වැගිරීම ඇත්තක් වන්නේය. කලින් කල වණය නොසෝදන්නේය. කලින් කල වණයෙහි බෙහෙත් නොගල් වන්නේය. කලින් කල වණය නොසෝදන්නාවූ කලින් කල වණයෙහි බෙහෙත් නොගල්වන්නාවූ ඔහුගේ වණය ලේ සැරව දෙකින් බැඳ ගන්නේය. අව්සුලං ඇතිතන්හි ඇවිදින්නේය. අව්සුලං දෙකෙහි ඇවිදින ඔහුගේ වණයට දූවිලි හා වීනණ්ඩු ආදිය ඇතුල් වන්නේය. වණය රැක ගනිමින් වාසය නොකරන්නේය. මස්ලියලන සේ වාසය නොකරන්නේය. ඔහුගේ මේ අපථ්‍ය කටයුතු කිරීමෙන් අපවිත්‍ර විෂදොෂය ඉතිරිව ඉවත්වන ලද්දේය. කරුණු දෙකින් වණය මහත් බවට

පැමිණෙන්නේය. හෙතෙම මහත් බවට පැමිණියාවූ වණයෙන් මරණයට හෝ මරණය සමාන දුකට හෝ පැමිණෙන්නේය.

16. "සුනක්ඛත්තය, එපරිද්දෙන්ම මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක්හට මෙබඳු අදහසක් වන්නේය, යන යමක්වේද, 'තෘෂ්ණාව වනාහි හුලකැයි බුද්ධශ්‍රමණයන් විසින් වදාරණ ලදී. අවිද්‍යා නැමැති විෂදොෂය ඡන්දරාගය හා ව්‍යාපාදය කරණකොට කිපේ. මා විසින් ඒ තෘෂ්ණා නමැති හුල පහ කරනලදී. අවිද්‍යා නමැති විෂදොෂය දුරුකරනලදී. මම නිවණෙහි නැමුනු අදහස් ඇත්තෙක් වෙයි, අර්ථයට සමානවූ මෙබඳු හැඟීමක් ඇත්තෙක් වන්නේය.'

"හෙතෙම මනාව නිවණෙහි නැමුණු අදහස් ඇත්තහුට නුසුදුසුවූ යම් ඒ කරුණු වෙත්ද, ඒ කරුණුවල යෙදෙන්නේය. ඇසින් නුසුදුසුවූ රූපයක් දැක එහි බැඳෙන්නේය. කණින් නුසුදුසුවූ ශබ්දයක් අසා එහි බැඳෙන්නේය. නාසයෙන් නුසුදුසුවූ ගන්ධයක් ආඝ්‍රානය කොට එහි බැඳෙන්නේය. දිවෙන් නුසුදුසුවූ රසයක් විඳ එහි බැඳෙන්නේය. කයින් නුසුදුසුවූ ස්පර්ශයක් ලබා එහි බැඳෙන්නේය. සිතින් නුසුදුසුවූ ධර්මාරම්මණයන් දැන එහි බැඳෙන්නේය. නුසුදුසුවූ රූපයක් දැක එහි බැඳුනාවූ කණින් නුසුදුසුවූ ශබ්දයක් අසා එහි බැඳුනාවූ නාසයෙන් නුසුදුසුවූ ගඳෙක් ආඝ්‍රානය කොට එහි බැඳුනාවූ දිවෙන් නුසුදුසුවූ රසයක් විඳ එහි බැඳුනාවූ කයින් නුසුදුසුවූ ස්පර්ශයක් ලබා එහි බැඳුනාවූ සිතින් නුසුදුසුවූ ධර්මාරම්මණයක් දැක එහි බැඳුනාවූ ඔහුගේ රාගය තෙම සිත නසන්නේය. හෙතෙම රාගයෙන් නසනලද සිතින් මරණයට හෝ මරණය තරම් දුකට හෝ පැමිණෙන්නේය. සුනක්ඛත්තය, ආයර්‍ය්‍යවිනයෙහි යමෙක් මහණකම අතහැර හීනවූ ගිහි බවට පෙරළේද, මේ වනාහි මරණයවේ. සුනක්ඛත්තය, යමෙක් කෙලෙසුන්ගෙන් කිලිටිවූ එක්තරා ඇවතකට පැමිණේද, මේ වනාහි මරණය හා සමාන දුකවේ.

17. "සුනක්ඛත්තය, මේ ශාසනයෙහි ඇතැම් භික්ෂුවක්හට 'තෘෂ්ණාව වනාහි හුලකැයි බුද්ධ ශ්‍රමණයන් විසින් වදාරණලදී. අවිද්‍යා නමැති විෂ දොෂය ඡන්දරාගය හා ව්‍යාපාදය

කරණකොටගෙන කිපෙයි. මා විසින් තෘෂ්ණා නැමැති හුල පහකරණලදී. අවිද්‍යා නැමැති විෂ දොෂය ඉවත් කරණ ලදී. මම නිවණෙහි නැමුණු අදහස් ඇත්තෙක් වෙමි,' යන අදහස උපදින්නේය යන යමක්වේද, ඊට ඇත්තේය. මනාකොටම නිවණෙහි නැමුණු අදහස් ඇත්තාවූ ඔහුට නුසුදුසුවූ යම් ඒකරුණු වෙත්ද, ඒ කරුණුවල නොයෙදෙන්නේය ඇසින් නුසුදුසුවූ රූපයක් දැක එහි නොබැඳෙන්නේය. කණින් නුසුදුසුවූ ශබ්දයක් අසා එහි නොබැඳෙන්නේය. නාසයෙන් නුසුදුසුවූ ගන්ධයක් ආඝ්‍රාණයකොට එහි නොබැඳෙන්නේය. දිවෙන් නුසුදුසුවූ රසයක් විඳ එහි නොබැඳෙන්නේය. කයින් නුසුදුසුවූ ස්පර්ශයක් ලබා එහි නොබැඳෙන්නේය. සිතින් නුසුදුසුවූ ධර්මාරම්මණයක් දැන එහි නොබැඳෙන්නේය. ඇසින් නුසුදුසු රූපයක් දැක එහි නොබැඳෙන්නාවූ කණින් නුසුදුසු ශබ්දයක් අසා එහි නොබැඳෙන්නාවූ නාසයෙන් නුසුදුසු ගන්ධයක් ආඝ්‍රාණකොට එහි නොබැඳෙන්නාවූ දිවෙන් නුසුදුසු රසක් විඳ එහි නොබැඳෙන්නාවූ කයින් නුසුදුසු ස්පර්ශයක් ලබා එහි නොබැඳෙන්නාවූ සිතින් නුසුදුසු ධර්මාරම්මණයක් දැන එහි නොබැඳෙන්නාවූ ඔහුගේ රාගයතෙම සිත නොනසන්නේය. හෙතෙම රාගයෙන් නොනැසූ සිතින් මරණයට හෝ නොම පැමිණෙන්නේය, මරණය හා සමාන දුකට හෝ නොපැමිණෙන්නේය.

18. "සුනක්ඛත්තය, යම්සේ පුරුෂයෙක් විෂ සහිතවූ දැඩිව විෂ පොවන ලද හුලෙන් විදින ලද්දේ වන්නේද, ඔහුගේ අසල්වැසියෝ නෑ සහලේ නෑයෝ ශල්‍යකර්ම කරන්නාවූ වෙදෙකු කැඳවන්නාහුය. ඔහුගේ ඒ ශල්‍යකර්ම කරන්නාවූ වෙදතෙම ආයුධයෙන් වණ මුඛය පිරිසිදු කරන්නේය. ආයුධයෙන් වණ මුඛය පිරිසිදුකොට සොයන කටුවෙන් හුල සොයන්නේය. සොයන කටුවෙන් හුල සොයා හුල ඇද දමන්නේය. ඉතිරිවූ දෙයක් නැත්තේයයි දනිමින් ඉතිරි දෙයක් නැතිවම විෂ දොෂය බැහැර කරන්නේය. හෙතෙම මෙසේ කියන්නේය. 'පින්වත් පුරුෂය, නුඹගේ හුල උදුරා දමනලදී. ඉතිරි නැතිවම විෂ දොෂය බැහැර කරන ලද්දේය. නුඹට

අන්තරායක්ද නොවේ. පථ්‍යවූ ආහාර අනුභව කරව. අපථ්‍යවූ ආහාර අනුභව කිරීමෙන් තොපගේ ව්‍රණය වැගිරෙන ස්වභාවය ඇත්තක් කර නොගනුව. කලින් කල ව්‍රණය සේදුව මැනව. කලින් කල ව්‍රණ මුඛයෙහි බෙහෙත් ආලෙප කරව. කලින් කල ව්‍රණය නොසේදීමෙන් කලින් කල ව්‍රණ මුඛයෙහි බෙහෙත් නොගැල්වීමෙන් නුඹගේ ව්‍රණ මුඛය සැරවෙන් හා ලෙයින් බැඳ නොගනුව, අවු සුලං දෙකෙහි ගමන් නොකරනු, අවු සුලං දෙකට අසුවෙමින් ගමන්කොට නුඹගේ ව්‍රණයෙහි දූවිලි හා වීනණ්ඩු ආදිය ඇතුල්කර නොගනුව. පින්වත් පුරුෂය, ව්‍රණය රැක ගන්නෙක්ව ව්‍රණයෙහි මස් ලියලවා ගන්නෙක්ව වාසය කරවයි' කියන්නේය. ඔහුට වනාහි 'මාගේ හුල වනාහි උදුරා දමනලදී. විෂ දොෂය ඉතිරි නොකොටම බැහැර කරණ ලදී. මාගේ අන්තරායට හෙතුවක් නැතැයි' සිතන්නේය. හෙතෙම පථ්‍යවූ ආහාරද අනුභව කරන්නේය. පථ්‍යවූ ආහාර අනුභව කරන්නාවූ ඔහුගේ ව්‍රණය වැගිරෙන්නක් නොවන්නේය. කලින් කල ව්‍රණය සෝදන්නේය. කලින් කල ව්‍රණයෙහි බෙහෙත් ගල් වන්නේය. කලින් කල ව්‍රණය සෝදන්නාවූ, කලින් කල ව්‍රණයෙහි බෙහෙත් ගල්වන්නාවූ ඔහුගේ ව්‍රණ මුඛය සැරවෙන් හා ලෙයින් බැඳ නොගන්නේය. අවු සුලං දෙකෙහි ගමන් නොකරන්නේය. අවු සුලං දෙකෙහි ගමන් නොකරන්නාවූ ඔහුගේ ව්‍රණයෙහි දූවිලි හා වීනණ්ඩු ඇතුල් නොවන්නේය. ව්‍රණය රක්ෂා කරන්නෙක්ව ව්‍රණයෙහි මස් ලියලවන්නෙක්ව වාසය කරන්නේය. ඔහුගේ මේ පථ්‍ය ක්‍රියා කිරීමෙන්ද අපවිත්‍රවූ විෂදොෂය ඉතිරි නැතිවම බැහැරවූයේ වෙයි. ඒ කරුණු දෙක නිසා ව්‍රණයෙහි මස් වැඩෙන්නේය. හෙතෙම ව්‍රණය ගොඩවී සිවිය හොඳින් ඇතිවීම නිසා මරණයට හෝ නොපැමිණෙන්නේය. මරණය හා සමාන දුකට හෝ නොපැමිණෙන්නේය.

19. "සුනක්ඛත්තය, මෙපරිද්දෙන්ම මේ සස්නෙහි ඇතැම් මහණෙකුට තෘෂ්ණාව වනාහි හුලයයි බුද්ධශ්‍රමණයන් විසින් වදාරණ ලදී. අවිද්‍යා නමැති විෂදොෂය ඡන්දරාගය හා ව්‍යාපාද

කරණකොට කිපෙයි. 'මා විසින් ඒ තෘෂ්ණා නමැති හුල උදුරා දමන ලදී. අවිද්‍යා නමැති විෂදොෂය ඉවත් කරන ලදී. මම නිවණෙහි නැමුණු අදහස් ඇත්තෙක් වෙමියි' යන මෙබඳු අදහසක් වන්නේය යන යමක් වේද, ඊට හේතු ඇත්තේය. නිවණෙහි නැමුණු අදහස් ඇත්තාවූ ඔහුට නුසුදුසු යම් ඒ කරුණු වෙත්ද, හෙතෙම ඒ කරුණුවල නොබැඳෙන්නේය. ඇසින් නුසුදුසු රූපයක් දැක එහි නොබැඳෙන්නේය. කණින් නුසුදුසු ශබ්දයක් අසා එහි නොබැඳෙන්නේය. නාසයෙන් නුසුදුසුවූ ගන්ධයක් ආඝ්‍රානය කොට එහි නොබැඳෙන්නේය. දිවෙන් නුසුදුසුවූ රසක් විඳ එහි නොබැඳෙන්නේය. කයින් නුසුදුසුවූ ස්පර්ශයක් ස්පර්ශකොට එහි නොබැදෙන්නේය. සිතින් නුසුදුසුවූ ධර්මාරම්මණයක් දැන එහි නොබැඳෙන්නේය. ඇසින් නුසුදුසු රූප දැක එහි නොබැඳුනාවූ, කණින් නුසුදුවූ ශබ්ද අසා එහි නොබැඳුනාවූ, නාසයෙන් නුසුදුසුවූ ගඳ ආඝ්‍රානය කොට එහි නොබැඳුනාවූ, දිවෙන් නුසුදුසුවූ රස විඳ එහි නොබැඳුනාවූ, කයින් නුසුදුසුවූ ස්පර්ශ ස්පර්ශකොට එහි නොබැඳුනාවූ, සිතින් නුසුදුසුවූ ධර්මාරම්මණ දැන එහි නොබැඳුනාවූ ඔහුගේ රාගය තෙම සිත නොනසන්නේය. හෙතෙම රාගයෙන් නොනසනලද සිතින් මරණයට නොපැමිණෙන්නේය. මරණය හා සමාන දුකට හෝ නොපැමිණෙන්නේය.

**20.** "සුනක්ඛත්තය, මා විසින් අර්ථය හැඟවීම සඳහා මේ උපමාවක් කරණ ලදී. මෙයම මෙහි අර්ථය වේ. සුනක්ඛත්තය, වණය යනු සවැදෑරුම්වූ ආධ්‍යාත්මිකවූ ආයතනයන්ට නමකි. සුනක්ඛත්තය, විෂදොෂය යනු අවිද්‍යාවට නමකි. සුනක්ඛත්තය, හුල යනු තෘෂ්ණාවට නමකි. සුනක්ඛත්තය, සොයන කටුව යනු සිහියට නමකි. සුනක්ඛත්තය, ආයුධය යනු ආර්‍ය්‍යවූ ප්‍රඥාවට නමකි. සුනක්ඛත්තය, ශල්‍ය කර්‍තෘවූ වෛද්‍යවරයා යනු අර්හත් සම්‍යක් සම්බුද්ධවූ තථාගතයන් වහන්සේට නමකි. සුනක්ඛත්තය, ඒ මහණ තෙම ඒකාන්තයෙන් සවැදෑරුම්වූ ඵස්සායතනයන්හි සංවර වූයේ ක්ලෙශයෝ දුකට මුලයයි මෙසේ දැන කෙලෙස් රහිතවූයේ කෙලෙස් නැසීමවූ නිවණෙන් මිදුනේ වේද හෙතෙම

ක්ලෙශයන්හි කය හෝ එලවන්නේය. සිත හෝ උපදවන්නේය යන මේ කරුණට හේතු නැත. යම්සේ පානය කටයුතුවූ පැන් භාජනයක් වර්ණයෙන් යුක්ත වූයේ ගන්ධයෙන් යුක්තවූයේ වේද, හෙද වනාහි විෂයෙන් මිශ්‍රවූයේ වේ. ඉක්බිති ජීවත්වනු කැමැති නොමැරෙනු කැමැති සැප කැමැති දුක් පිළිකුල් කරන්නාවූ පුරුෂයෙක් එන්නේය. සුනක්ඛත්තය, ඒ කුමකැයි හඟින්නෙහිද? 'මෙය බීමෙන් මරණයට හෝ පැමිණෙන්නේය. මරණය හා සමාන දුකට හෝ පැමිණෙන්නෙමි' යන කාරණය යම් හෙයකින් දන්නාවූ ඒ පුරුෂතෙම මේ පැන් භාජනය බොන්නේද?"

"ස්වාමීනි, එය නොවේමැයි."

21. "සුනක්ඛත්තය, එපරිද්දෙන්ම ඒ මහණතෙම ඒකාන්තයෙන් සවැදෑරුම්වූ ඵස්සායතනයන්හි සංවරවූයේ කෙලෙස් දුකට මුලයයි දැන කෙලෙස් රහිතවූයේ කෙලෙසුන්ගේ නිවණෙන් මිදුනේ වේද, හෙතෙම ඒ ක්ලෙශයන්හි කය හෝ එලවන්නේය. සිත හෝ උපදවන්නේය යන මේ කාරණයට හේතු නැත. සුනක්ඛත්තය, යම්සේ දරුණු විෂ ඇත්තාවූ සර්පයෙක් වේද, ඉක්බිති ජීවත්වනු කැමැත්තාවූ නොමැරෙනු කැමැත්තාවූ සැප කැමැත්තාවූ දුක් පිළිකුල් කරන්නාවූ පුරුෂයෙක් එන්නේය. සුනක්ඛත්තය. ඒ කුමකැයි හඟින්නෙහිද? මොහු විසින් දෂ්ට කළාවූ 'මම මරණයට හෝ මරණය තරම් දුකට හෝ පැමිණෙන්නෙමියි' දන්නාවූ ඒ පුරුෂතෙම මේ දරුණු විෂ ඇත්තාවූ සර්පයාට අත හෝ ඇඟිල්ලක් හෝ දෙන්නේද?"

"ස්වාමීනි, එය නොවේමැයි."

"සුනක්ඛත්තය, මෙපරිද්දෙන්ම ඒ මහණතෙම ඒකාන්තයෙන් සවැදෑරුම් ඵස්සායතනයන්හි සංවරවූයේ කෙලෙස් දුකට මුලයයි දැන, උපධි රහිත වූයේ කෙලෙස් නැසීමවූ නිවණෙන් මිදුනේ, ක්ලෙශයන්හි කය හෝ එලවන්නේය. සිත හෝ උපදවන්නේය යන මේ කාරණයට හේතු නැත."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සතුටු සිත් ඇති සුනක්ඛත්ත නම් ලිච්ඡවි පුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තේයි.

**පස්වෙනිවූ සුනක්ඛත්ත සූත්‍රය නිමි. (1-5)**

---

## 6. ආනෙඤ්ජ සප්පාය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ කුරුරට කම්මස්සදම්ම නම්වූ කුරුරට වැස්සන්ගේ නියම් ගමක් වේද, එහි වැඩ වසන සේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට 'මහණෙනි' යි කථා කළසේක. 'පින්වතුන් වහන්සැයි' ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

2. "මහණෙනි; වස්තුකාම ක්ලේශ කාමයෝ ඇතිව නැතිවන හෙයින් අනිත්‍ය යන සාරයක් නැති හෙයින් හිස්ය. විනාශ වන්නාහුය. විනාශවන ස්වභාවය ඇත්තාහුය. මහණෙනි, මෙය මායාවකින් කරණ ලද්දක් වැනිය. අඥානයන් විසින් මගේය මගේය කියනු ලබන්නාහුය. මෙලොව ඇත්තාවූ යම් මනුෂ්‍ය කාම ගුණයෝ වෙත්ද, පරලොව ඇත්තාවූ යම් දිව්‍යකාම ගුණයෝ වෙත්ද, මෙලොව ඇත්තාවූ යම් මනුෂ්‍ය කාම සංඥාවෝ වෙත්ද, පරලොව ඇත්තාවූ යම් දිව්‍යකාම සංඥාවෝ වෙත්ද, මේ දෙකොටස මාරයාට යටත් වේ. මෙය මාරයාගේ ස්ථානයවේ. මාරයා දමන කෑම වෙයි. මාරයාගේ කොටු (ගාල්) වෙයි. මේ කාමයන් අරමුණු කොට සිත්හි හටගන්නාවූ දැඩි ලොභයද, ක්‍රොධයද, අන්‍යයන්ට වැඩියෙන් කිරීමයයි කියනලද සාරම්භයද යන අකුසලයෝ පවතිත්. ඒ අකුසලයෝ මේ ශාසනයෙහි හික්මෙන්නාවූ ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ අන්තරාය පිණිස හටගනිත්.

3. "මහණෙනි, එහි ආර්‍ය්‍යශ්‍රාවක තෙම මෙසේ සලකයි. 'මේ ආත්මයෙහි ඇත්තාවූ යම් කාමගුණයෝ වෙත්ද, පරලෙව්හි

ඇත්තාවූ යම් කාම ගුණයෝත් වෙත්ද, මේ ආත්මයෙහි ඇත්තාවූ යම් කාමසංඥාවෝත් වෙත්ද, පරලෙව්හි ඇත්තාවූ යම් කාම සංඥාවෝත් වෙත්ද මේ දෙකොටසම මාරයාට යටත්ය. මේ මාරයාගේම ස්ථානයවේ. මේ මාරයා විසින් දමනලද කෑමවේ. මේ මාරයාගේ කොටුව වේ. මේ කාමය අරමුණුකොට මේ සිතෙහි හටගන්නාවූ පවිටුවූ අකුසල්වූ දැඩි ලෝභයෝද, ක්‍රොධයෝද අන්‍යයන්ට වැඩියෙන් කිරීම යයි කියනලද සාරම්භයද පවතිත්. ඔව්හුද මේ ශාසනයෙහි හික්මෙන්නාවූ ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ අන්තරාය පිණිස හටගනිත්. මම වනාහි විපුලවූ මහග්ගතවූ සිතින් කාමගුණ ලොකය මැඩ පවත්නා සිතින් ධ්‍යාන අරමුණු අධිෂ්ඨාන කොට වාසය කරන්නෙම් නම් ඉතා යෙහෙක, මම විපුලවූ මහත් ගතවූ සිතින් කාමගුණ ලොකය මැඩ පවත්වා සිතින් ධ්‍යාන අරමුණු අධිෂ්ඨාන කොට වාසය කරන්නාවූ මාගේ යම් සිතෙහි හටගන්නාවූ පවිටුවූ අකුසල්වූ අභිධ්‍යාවෝද, ව්‍යපාදයෝද සාරම්භයෝත් වෙත්ද, ඔව්හු නොවන්නාහ. ඔවුන්ගේ දුරු කිරීමෙන් මාගේ සිත කාමාවචර නොවූ අප්‍රමාණවූ මොනවට වඩනා ලද්දාවූ සිතක් වන්නේයයි,' සිතන්නේය. මෙසේ පිළිපන්නාවූ එය බහුලකොට වාසයකරන්නාවූ, ඔහුගේ සිත රහත් බවට හෙතුවූ විදර්ශනාවෙහි හෝ ධ්‍යානයට හේතුවූ උපචාර සමාධියෙහි හෝ පහදියි. මනා පැහැදීම ඇති කල්හි ඉහාත්මයෙහි හෝ කම්පා නොවන ධ්‍යාන සමාධියට හෝ පැමිණෙයි. ප්‍රඥාවෙන් හෝ මිදෙයි. (රහත් වෙයි) නොහොත් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යම් කාරණයකින් ඒ භික්ෂුව උපදින්නාවූ විපාක විඥ්ඥාණයක් වේද, එය කුසල චතුර්ථධ්‍යානයට සමානවූවක් වන්නේය යන මේ කාරණය ඇත්තේය. මහණෙනි, මේ පළමුවන කම්පා කෙලෙසුන්ගෙන් කම්පා නොවන ධ්‍යාන සමාධියට හිතවූ ප්‍රතිපදාවයයි කියනු ලැබේ.

4. "මහණෙනි, නැවතද අනිකක් කියමි. ආර්‍ය්‍යශ්‍රාවක තෙම මෙසේ කල්පනා කරයි. 'මේආත්මයෙහිවූ යම් කාමයෝත් වෙත්ද, පරලෙව්හිවූ යම් කාමයෝත් වෙත්ද, මේ ආත්මයෙහිවූ යම්

කාම සංඥාවෝත් වෙත්ද, පරලෙව්හිවූ යම් කාම සංඥාවෝ වෙත්ද, සතරමහා භූතයෝද සතර මහා භූතයන් නිසා පවත්නා උපාදාය රූපයයි යම්කිසි රූපයක් වේද, මෙසේ පිළිපන්නාවූ එය බහුල කොට වාසය කරන්නාවූ ඔහුගේ සිත ආකාසානඤ්චායතනයට පැමිණෙන හේතුවෙහි පහදියි. පැහැදීම ඇතිකල්හි මේආත්මයෙහි ආකාසානඤ්චායතනයට හෝ පැමිණෙයි. ප්‍රඥාවෙන් හෝ මිදෙයි, (රහත් වෙයි.) ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යම් කාරණයකින් ඒ භික්ෂුව උපදින්නාවූ විපාක විඤ්ඤාණයක් වේද එය ආකාසානඤ්චායතන කුසල චිත්තයට සමාන වන්නේය යන මේ කාරණය ඇත්තේය.

"මහණෙනි, මේ දෙවෙනිවූ කෙලෙසුන්ගෙන් කම්පානොවන ධ්‍යාන සමාධියට හිතවූ ප්‍රතිපදාවයයි කියනු ලැබේ.

5. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ සලකයි. මෙලොවවූ යම් කාමයෝත් වෙත්ද, පරලොවවූ යම් කාමයෝත් වෙත්ද, යම් මෙලොවවූ කාම සංඥාවෝත් වෙත්ද, යම් පරලොවවූ කාම සංඥාවෝත් වෙත්ද, යම් මෙලොවවූ රූපයෝත් වෙත්ද, යම් පරලොවවූ රූපයෝත් වෙත්ද, යම් මෙලොවවූ රූපසංඥාවෝත් වෙත්ද, යම් පරලොවවූ රූප සංඥාවෝත් වෙත්ද, මේ දෙකොටස අනිත්‍යය, යමක් අනිත්‍යයද, එයට එය සතුටුවන්නට නුසුදුසුය. මමය මාගේයයි කීමට නුසුදුසුය, තෘෂ්ණාවෙන් ඇතුළත් කර ගැනීමට නුසුදුසුයයි මෙසේ පිළිපන්නාවූ එය බහුල කොට වාසය කරන්නාවූ ඔහුගේ සිත විඤ්ඤාණඤ්චායතන හෙතුවෙහි පහදියි. පැහැදීම ඇතිකල්හි හෝ විඤ්ඤාණඤ්චායතන සමාධියට පැමිණෙයි. ප්‍රඥාවෙන් හෝ මිදෙයි. (රහත් වෙයි) ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු යම් කාරණයකින් ඔහු උපදින්නාවූ විපකවිඤ්ඤාණය කුසල විඤ්ඤානඤ්චායතනයට සමාන වෙයි යන කාරණය ඇත්තේය. මේ තුන්වන කෙළෙසුන්ගෙන් කම්පා නොවන ධ්‍යාන සමාධියට හිතවූ ප්‍රතිපදාවයයි කියනු ලැබේ.

**6.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ කල්පනා කරයි. 'මෙලොවවූ යම් කාමයෝත් වෙත්ද, පරලොවවූ යම් කාමයෝත් වෙත්ද මෙලොවවූ යම් කාම සංඥාවෝත් වෙත්ද, පරලොවවූ යම් කාම සංඥාවෝත් වෙත්ද, මෙලොවවූ යම් රූපයෝත් වෙත්ද, පරලොවවූ යම් රූපයෝත් වෙත්ද, මෙලොවවූ යම් රූප සංඥාවෝත් වෙත්ද, පරලොවවූ යම් රූපසංඥාවෝත් වෙත්ද, යම් කම්පා නොවන ධ්‍යාන සංඥාවෝත් වෙත්ද, යම් තැනක ඒ සියලු සංඥාවෝ ඉතිරි නොවී නිරුද්ධ වෙත්ද, යම් ඒ ආකිඤ්චඤ්ඤායතන සමාධියක් වේද, එය ශාන්තය එය ප්‍රණීත යයි, මෙසේ පිළිපන්නාවූ එය බහුල කොට වාසය කරන්නාවූ ඔහුගේ සිත ආකිඤ්චඤ්ඤායතන සමාධි හේතුවෙයි සිත පහදියි. පැහැදීම ඇතිකල්හි මේ ආත්මයෙහි හෝ ආකිඤ්චඤ්ඤායතන සමාධියට හෝ පැමිණෙයි. ප්‍රඥාවෙන් හෝ මිදෙයි. (රහත්වෙයි) ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යම් කාරණයකින් ඔහුගේ උත්පත්තිය ගෙන දෙන්නාවූ විපාක විපාකවිඤ්ඤාණය ආකිඤ්චඤ්ඤායතන කුසල විඤ්ඤාණයට සමාන වෙයි යන මේ කාරණය ඇත්තේය. මහණෙනි, මේ පළමුවැනි ආකිඤ්චඤ්ඤායතන සමාධියට හිතවූ ප්‍රතිපදාවයයි කියනු ලැබේ

**7.** "මහණෙනි, නැවත අනිකක්ද කියමි. ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම ආරණ්‍යයට පැමිණියේ හෝ වෘක්ෂමූලයට පැමිණියේ හෝ ශූන්‍යාගාරයට පැමිණියේ හෝ මෙසේ කල්පනා කරයි. මෙය මමය යන දෙයකින් හෝ මගේය යන දෙයකින් හෝ ශූන්‍ය වේයයි, මෙසේ පිළිපන්නාවූ එය බහුලකොට වාසය කරන්නාවූ ඔහුගේ සිත ආකිඤ්චඤ්ඤායතන සමාධි හේතුවෙහි පහදියි. පැහැදීම ඇති කල්හි, මේ ආත්මයෙහි හෝ ආකිඤ්චඤ්ඤායතන සමාධියට හෝ පැමිණෙයි. ප්‍රඥාවෙන් හෝ මිදෙයි. (රහත් වෙයි) ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යම් කාරණයකින් ඔහුගේ උත්පත්තිය සිදුවන විපාක විඤ්ඤාණය කුසල විඤ්ඤාණයට සමාන වෙයි යන මේ කාරණය ඇත්තේය. මහණෙනි, මේ

දෙවෙනි අකිඤ්චඤ්ඤායතන සමාධියට හිතවූ ප්‍රතිපදාවයයි කියනු ලැබේ.

8. මහණෙනි, නැවත අනිකක්ද කියමි. ආය්‍ය්‍යශ්‍රාවක තෙම මෙසේ කල්පනා කරයි. 'කිසි තැනක මමයයි කිසිවෙක් නැත. කිසිවෙකුගේ මම යන කිසිවෙක්ද නැත. නුඹ යන කිසිවෙක්ද නුඹගේ මම යන කිසිවෙක්ද නැතැයි.' මෙසේ පිළිපන්නාවූ එය බහුලකොට වාසය කරන්නාවූ ඔහුගේ සිත ආකිඤ්චඤ්ඤායතන සමාධි හේතුවෙහි පහදියි. පැහැදීම ඇති කල්හි මේ ආත්මයෙහි හෝ ආකිඤ්චඤ්ඤායතන සමාධියට පැමිණෙයි. ප්‍රඥාවෙන් හෝ මිදෙයි. (රහත් වෙයි.) ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යම් කාරණයකින් ඔහුගේ ඉපදීම සිදුවන්නාවූ විපාක විඤ්ඤාණය කුසල විඤ්ඤාණයට සමානවේ. යන මේ කාරණය ඇත්තේය.

මහණෙනි, මේ තුන්වෙනි ආකිඤ්චඤ්ඤායතන සමාධියට හිතවූ ප්‍රතිපදාවයයි කියනුලැබේ.

9. "මහණෙනි, නැවත අනිකක්ද කියමි. ආය්‍ය්‍ය ශ්‍රාවක තෙම මෙසේ කල්පනා කරයි. 'මෙලොවවූ යම් කාමයෝත් වෙත්ද, පරලොවවූ යම් කාමයෝත් වෙත්ද, මෙලොවවූ යම් කාමසංඥාවෝත් වෙත්ද, පරලොවවූ යම් කාම සංඥාවෝත් වෙත්ද, මෙලොවවූ යම් රූපයෝත් වෙත්ද, පරලොවවූ යම් රූපයෝත් වෙත්ද, මෙලොවවූ යම් රූප සංඥාවෝත් වෙත්ද, පරලොවවූ යම් රූප සංඥාවෝත් වෙත්ද, යම් කම්පා නොවන ධ්‍යාන සංඥාවෝත් වෙත්ද, යම් ආකිඤ්චඤ්ඤායතන ධ්‍යාන සංඥාවෝත් වෙත්ද, මේ සියලු සංඥාවෝ ඉතිරි නැතිව නිරුද්ධ වෙත්ද, යම් ඒ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාධියක් වේ නම් එය ශාන්තය එය ප්‍රණීතයයි' මෙසේ පිළිපන්නාවූ එය බහුල කොට වාසය කරන්නාවූ ඔහුගේ සිත නෙවසඤ්ඤානාසඤ්ඤායතන හේතුවෙහි පහදියි. මේ ආත්මයෙහි පැහැදීම ඇති කල්හි මේ ආත්මයෙහි නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාධියට හෝ පැමිණෙයි. ප්‍රඥාවෙන් හෝ මිදෙයි. (රහත් වෙයි) ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යම් කාරණයකින් ඔහුගේ උත්පත්තිය සිදුවන්නාවූ විපාක විඤ්ඤාණය කුසල

විඥ්ඥාණයට සමාන වන්නේය යන මේ කාරණය ඇත්තේය. මහණෙනි, මේ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාධියට හිතවූ ප්‍රතිපදාවයයි කියනු ලැබේ."

**10.** මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, මේ ශාසනයෙහි මහණතෙම මෙසේ පිළිපන්නේ වෙයි. ඉදින් මා විසින් පෙර කර්ම රැස් නොකරණ ලද්දේ නම් මාගේ මේ විපාක භවය නොපවත්නේය. ඉදින් දැන් කර්ම රැස් නොකරන්නේ නම් මතු විපාක භවය නොපවත්නේය. දැන් යම් පඤ්චස්කන්ධයක් ඇත්තේද, එය දුරු කරමියි මෙසේ විදර්ශනා උපෙක්ෂාව ලබයි. ස්වාමීනි, මේ මහණතෙම පිරිනිවියේද?"

"ආනන්දය, මෙහි ඇතැම් මහණෙක් පිරිනිවන් පාන්නේය. මෙහි ඇතැම් මහණෙක් පිරිනිවන් නොපාන්නේයයි" වදාළේය. "ස්වාමීනි, යම්හෙයකින් මෙහි ඇතැම් මහණෙක් පිරිනිවන් පාන්නේද, මෙහි ඇතැම් මහණෙක් පිරිනිවන් නොපාන්නේද, ඊට හේතු කවරේද? ප්‍රත්‍ය කවරේද?" "ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම මෙසේ පිළිපන්නේවේ. මා විසින් පෙර කර්ම රැස් නොකරණ ලද්දේ නම් මාගේ දැන් විපාක භවය නොපවතින්නේය. ඉදින් දැන් කර්ම රැස් නොකරන්නේ නම් මාගේ මතු විපාක භවය නොවන්නේය. දැන් යම් පඤ්චස්කන්ධයක් ඇත්තේද, එය දුරු කරමියි, මෙසේ විදර්ශනා උපේක්ෂාව ලබයි. හෙතෙම ඒ උපෙක්ෂාවට මමය මාගේයයි සතුටු වෙයි. මමය මාගේයයි කියායි. මමය මාගේයයි තෘෂ්ණාවෙන් බැස ගනියි. ඒ උපෙක්ෂාවට සතුටුවන්නාවූ මමය යනාදීන් කියන්නාවූ තෘෂ්ණාවෙන් බැස ගත්තාවූ උපේක්ෂාව විඥ්ඥාණය ඇසුරු කරනලද්දේ වෙයි. එය දැඩිකොට අල්වා ගැනීමයි. ආනන්දය, දැඩිකොට අල්වා ගැනීම සහිතවූ මහණතෙම පිරිනිවන් පාන්නේ නොවෙයි." "ස්වාමීනි, දැඩිකොට අල්වාගන්නාවූ ඒ මහණතෙමේ කුමක් දැඩිසේ අල්වා ගනීද?" "නෙවසඤ්ඤානාසඤ්ඤායතනයයි" වදාළේය. "ස්වාමීනි, ඒ මහණතෙම වනාහි දැඩිකොට අල්වාගනු ලබන ශ්‍රෙෂ්ඨවූ භවය

අල්වා ගනියි.” “ආනන්දය, ඒ මහණතෙම දැඩි කොට අල්වා ගනු ලබන ශ්‍රෙෂ්ඨවූ භවය අල්වා ගන්නේය. ආනන්දය, යම් මේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනයක්වේද, මෙය වනාහි දැඩිව අල්වාගනු ලබන ශ්‍රෙෂ්ඨ භවයයි.

11. “ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙම මෙසේ පිළිපන්නේවෙයි. ‘පෙර මා විසින් කර්ම රැස් නොකරන ලද්දේ නම් දැන් මාගේ විපාක භවය නොවන්නේය. දැන් කර්ම රැස් නොකෙළේ නම් මතු මාගේ විපාක භවය නොවන්නේය. දැන් යම් පඤ්චස්කන්ධයක්වේද, එය දුරුකරමියි මෙසේ’ විදර්ශනානොපෙක්ෂාව ලබයිද හෙතෙම ඒ උපෙක්ෂාවට මමය මාගේයයි සතුටු නොවෙයි. මමය මාගේයයි නොකියයි. එහි තෘෂ්ණාවෙන් බැසගෙන නොසිටියි. ඒ උපෙක්ෂාවට සතුටු නොවන්නාවූ මමය මාගේයයි නොකියන්නාවූ එහි බැසගෙන නොසිටින්නාවූ ඔහුගේ එය ඇසුරු කළාවූ විඤ්ඤාණය නොවෙයි. එය දැඩිකොට අල්වාගැනීම නොවෙයි. ආනන්දය, දැඩිව අල්වාගැනීම නැත්තාවූ පිරිනිවන් පාන්නේ යයි” වදාළසේක.

12. “ස්වාමීනි, ආශ්චර්‍ය්‍යය. ස්වාමීනි, අද්භූතය, ස්වාමීනි. ඒ ඒ සමාපත්තිය, ඇසුරුකොට භාග්‍යවතුන් වහන්සේ විසින් ඕඝයන්ගේ එතර කිරීම වදාරණලදී. ස්වාමීනි, ආර්‍ය්‍යවූ විමොක්ෂය කවරේද?”

“ආනන්දය, මේ ශාසනයෙහි ආර්‍ය්‍යශ්‍රාවකතෙම මෙසේ කල්පනා කරයි. මෙලොවවූ යම් කාමයෝත් වෙත්ද, පරලොවවූ යම් කාමයෝත් වෙත්ද, මෙලොවවූ යම් කාම සංඥාවෝත් වෙත්ද, පරලොවවූ යම් කාම සාඥාවෝත් වෙත්ද, මෙලොවවූ යම් රූපයෝත් වෙත්ද, පරලොවවූ යම් රූපයෝත් වෙත්ද, මෙලොවවූ යම් රූප සංඥාවෝත් වෙත්ද, පරලොවවූ යම් රූප සංඥාවෝත් වෙත්ද, යම් කම්පා නොවන ධ්‍යාන සංඥාවෝත් වෙත්ද, යම් ආකිඤ්චඤ්ඤායතන සංඥාවෝත් වෙත්ද, යම් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥාවෝත්, වෙත්ද, මේ සියල්ල සක්කාය නම්වේ. ඒ සක්කාය නම්වූ ත්‍රෛභූමික

සංස්කාරයන් කෙරෙන් දැඩිසේ අල්වා ගැනීමක් නැතිව චිත්තයාගේ යම් මිදීමක් වේද, එය අමෘතය නම්වේ.

13. "ආනන්දය, මෙසේ වනාහි මා විසින් කම්පා නොවන ධ්‍යාන සමාධියට හිතවූ ප්‍රතිපදාව දෙශනා කරණලදී. ආකිඤ්චඤ්ඤායතන සමාධියට හිතවූ ප්‍රතිපදාව දෙශනා කරණ ලදී. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාධියට හිතවූ ප්‍රතිපදාව දෙශනා කරණලදී. ඒ ඒ සමාධි ඇසුරුකොට ඔඝයන්ගේ එතර කිරීම දෙශනා කරණලදී. ආර්‍ය්‍යවූ විමොක්ෂය දෙශනා කරණලදී. ආනන්දය, ශ්‍රාවකයනට වැඩකැමතිවූ අනුකම්පා ඇත්තාවූ ශාස්තෘහු විසින් අනුකම්පා උපදවා කටයුතු යමක් වේද, මා විසින් එය තොපට කරණලදී. ආනන්දය, මේ වෘක්ෂමූල වෙත්, මේ සූන්‍යාගාර වෙත්, ආනන්දය, ධ්‍යාන කරව්. (සමාධි උපදවව්.) ප්‍රමාද නොවව්. පසුව පසුතැවිලි නොවව්. මේ තොපට අපගේ අනුශාසනාව වේයයි" වදාළේය.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සතුටු සිත් ඇති ආනන්ද ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තේය.

**ආනෙඤ්ජ සප්පාය සූත්‍රය නිමි. (1-6)**

## 7. ගණක මොග්ගල්ලාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි මිගාරමාතු පාසාද නම්වූ පූර්වාරාමයෙහි වැඩ වසනසේක. එකල්හි 'ගණක මොග්ගල්ලාන' නම් බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටු විය යුතු සිහි කටයුතු කථා කොට නිමවා, එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ ගණක මොග්ගල්ලාන නම් බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

2. "භවත් ගෞතමයන් වහන්ස, යම්සේ මේ මිගාරමාතු පාසාදයාගේ අන්තිම හිණිපෙත්ත දක්වා පිළිවෙළින් හික්මීමක්, පිළිවෙළින් කිරීමක්, පිළිවෙළින් පිළිපැදීමක් දක්නා ලැබේද, භවත් ගෞතමයන් වහන්ස, එමෙන් මේ බ්‍රාහ්මණයන්ගේ මන්ත්‍ර ඉගෙණීමෙහිද, පිළිවෙළින් හික්මීම, පිළිවෙළින් කිරීම, පිළිවෙළින් පිළිපැදීම, දක්නා ලැබේ. භවත් ගෞතමයන් වහන්ස, මේ දුනු ශිල්පයෙහිද, පිළිවෙළින් හික්මීම, පිළිවෙළින් කිරීම, පිළිවෙළින් පිළිපැදීම දක්නා ලැබේ. භවත් ගෞතමයන් වහන්ස, ගණන් ශාස්ත්‍රයෙන් ජීවත්වන්නාවූ අපගේ ගණන් ශාස්ත්‍රයෙහිද පිළිවෙළින් හික්මීම, පිළිවෙළින් කිරීම, පිළිවෙළින් පිළිපැදීම, දක්නා ලැබේ. භවත් ගෞතමයන් වහන්ස, අපි වනාහි ගෝලයන් ලැබ පළමුකොට මෙසේ ගණන් කරවමු. එක, එකය. දෙක, දෙකය. තුන, තුනය. හතර, හතරය. පහ, පහය. හය, හයය. හත, හතය. අට, අටය. නවය, නවයය. දසය, දසයය. මෙසේ භවත් ගෞතමයන් වහන්ස, අපි සියයටද ගණන් කරවමු. භවත් ගෞතමයන් වහන්ස, මේ ධර්ම විනයෙහිද, එසේ පිළිවෙළින් හික්මීමක්, පිළිවෙළින් කිරීමක්, පිළිවෙළින් පිළිපැදීමක් පෙන්විය හැක්කේද?"

3. "බ්‍රාහ්මණය, මේ ධර්ම විනයෙහි පිළිවෙළින් හික්මීම, පිළිවෙළින් කිරීම, පිළිවෙළින් පිළිපැදීම, පෙන්විය හැක්කේය. බ්‍රාහ්මණය, යම්සේ දක්ෂවූ අශ්වයන් හික්මවන්නෙක් යහපත්වූ අජානීය අශ්වයෙකු ලැබ පළමුකොටම කටකලියාවට පුරුදු කරවයිද, ඉක්බිති මත්තෙහි කටයුතු පුරුදු කරවයිද, බ්‍රාහ්මණය, එපරිද්දෙන්ම තථාගත තෙම දමනය කිරීමට සුදුසු පුරුෂයෙකු ලැබ, පළමුකොටම මෙසේ හික්මවන්නේය. 'මහණ එව. නුඹ සිල්වත් වෙව. ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරව ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තව, කුඩා වරදෙහි පවා භය දක්නෙක්ව වාසය කරව. සමාදන්ව ශික්ෂාපදයන්හි හික්මෙවයි' යනුවෙනි.

4. "බ්‍රාහ්මණය, භික්ෂුතෙම යම් තැනක පටන් සිල්වත්වේද, ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරව, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තව, කුඩා වරදෙහි පවා භය දක්නෙක්ව වාසය කෙරේද,

සමාදන්ව ශික්ෂාපදයන්හි හික්මේද, තථාගත තෙම ඔහු මත්තෙහි හික්මවයි. 'මහණ, එව නුඹ ඉන්ද්‍රියයන්හි රක්නාලද දොරටු ඇත්තෙක් වෙව. ඇසින් රූපය දැක නිමිති ගන්නෙක්, කුඩා සලකුණු ගන්නෙක් නොවෙව. යම් හෙයකින් මේ චක්ෂුරින්ද්‍රියයෙහි (ඇසෙහි) සංවර නැතුව වාසය කරන්නහු ලොභය, ද්වෙෂය යන ලාමකවූ අකුසල ධර්මයෝ අනුව වහනය වෙත්ද, ඔහුගේ සංවරය පිණිස පිළිපදුව. චක්ෂුරින්ද්‍රිය රකුව. චක්ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව.

"කණින් ශබ්දය අසා නිමිති ගන්නෙක්, කුඩා සලකුණු ගන්නෙක් නොවෙව. යම් හෙයකින් මේ සොතෙන්ද්‍රියයෙහි සංවර නැතිව වාසය කරන්නවූ මොහුට විෂම ලොභය, දොම්නස යන ලාමකවූ අකුසල ධර්මයෝ අනුව වහනය වෙත්ද ඔහුගේ සංවරය පිණිස පිළිපදුව. සොතෙන්ද්‍රිය රකුව. සොතෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව.

"නාසයෙන් ගන්ධය ආඝ්‍රාණය කොට නිමිති ගන්නෙක්, කුඩා සලකුණු ගන්නෙක් නොවෙව. යම් හෙයකින් මේ ඝාණෙන්ද්‍රියයෙහි සංවර නැතිව වාසය කරන්නවූ මොහුට විෂම ලොභය, දොම්නස යන ලාමකවූ අකුසල ධර්මයෝ අනුව වහනය වෙත්ද, ඔහුගේ සංවරය පිණිස පිළිපදුව. ඝාණෙන්ද්‍රිය රකුව. ඝාණෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව.

"දිවෙන් රසය දැන නිමිතිගන්නෙක් කුඩා සලකුණු ගන්නෙක් නොවෙව. යම් හෙයකින් ජිහ්ව ඉන්ද්‍රියයෙහි සංවර නැතිව වාසය කරන්නවූ මොහුට විෂම ලොභය, දොම්නස යන ලාමකවූ අකුසල ධර්මයෝ අනුව වහනය වෙත්ද, ඔහුගේ සංවරය පිණිස පිළිපදුව. ජිහ්වෙන්ද්‍රිය රකුව. ජිහ්ව ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව.

කයින් ප්‍රශ්වව්‍යයන් ස්පර්ශකොට නිමිති ගන්නෙක් කුඩා සලකුණු ගන්නෙක් නොවෙව. යම් හෙයකින් ස්පර්ශෙන්ද්‍රියයෙහි සංවර නැතිව වාසය කරන්නවූ මොහුට විෂම ලොභය, දොම්නස යන ලාමකවූ අකුශල ධර්මයෝ අනුව වහනය වෙත්ද ඔහුගේ

සංවරය පිණිස පිළිපදුව. ස්පර්ශෙන්ද්‍රිය රකුව. ස්පර්ශෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව.

සිතින් ධර්මය දැන නිමිති ගන්නෙක් කුඩා සලකුණු ගන්නෙක් නොවෙව. යමක් හේතුකොටගෙන මනින්ද්‍රියයෙහි සංවර රහිතව වාසය කරන්නහුට ලොභය, ද්වෙෂය, යන ලාමකවූ අකුසල ධර්මයෝ අනුව වැහෙන්නාහුද, ඔහුගේ සංවරය පිණිස පිළිපදුව. මනින්ද්‍රිය රකුව. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව'යි යනුවෙනි.

**5.** "බ්‍රාහ්මණය, යම් තැනක පටන් මහණතෙම ඉඳුරන්හි රක්නාලද දොරටු ඇත්තේ වේද, ඔහු තථාගත තෙම මත්තෙහි හික්මවයි. 'මහණ, එව. නුඹ භොජනයෙහි පමණ දක්නෙක් වෙව. නුවණින් සලකා ආහාරය ගණුව. ක්‍රීඩා පිණිස නොවේ. මද වැඩීම පිණිස නොවේ. සැරසීම පිණිස නොවේ. අලංකාර කිරීම පිණිස නොවේ. යම්තාක්ම මේ ශරීරයාගේ පැවැත්ම පිණිස යැපීම පිණිස විහිංසා වැලැක්ම පිණිස බ්‍රහ්මචර්‍ය්‍යාවට අනුග්‍රහ පිණිස වේ. මෙසේ පැරණිවූ වේදනාවද නසමි. අළුත් වෙදනාවද නූපද වන්නෙමි. මාගේ ජීවිත යාත්‍රාවද නිරවද්‍ය භාවයද පහසු විහරණයද වන්නේයයි (ආහාර ගනුව යනුවෙනි)

**6.** "බ්‍රාහ්මණය, යම් තැනෙක පටන් මහණතෙම වැළඳීමෙහි පමණ දන්නේ වේද, ඔහු තථාගතතෙම මත්තෙහි හික්මවයි. 'මහණ එව. නුඹ නිදි දුරු කිරීමෙහි යෙදී වාසය කරව. දාවල් දවස සක්මනින්ද, හිඳීමෙන්ද, සිත වසන්නාවූ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරව. රාත්‍රියගේ ප්‍රථම යාමයෙහි සක්මනින්ද, හිඳීමෙන්ද, සිත වසන්නාවූ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරව. රාත්‍රියගේ මධ්‍යම යාමය දකුණු පසින් දකුණු පයෙහි වම්පය මඳක් ඉක්මවා තබා සිහි ඇත්තේ නුවණ ඇත්තේ නැගිටිමි යන සංඥාව මෙනෙහි කොට සිංහ සෙය්‍යාවෙන් සයනය කරව. රාත්‍රියගේ පශ්චිම යාමයෙහි නින්දෙන් නැගිට සක්මනින්ද, හිඳීමෙන්ද, සිත වසන්නාවූ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරවයි' (යනුවෙනි.)

7. "බ්‍රාහ්මණය, යම් තැනක පටන් මහණතෙම නිදි දුරු කිරීමෙහි යෙදුනේ වේද, ඔහු තථාගත තෙම මත්තෙහි හික්මවයි. 'මහණ, එව. නුඹ සිහි නුවණින් යුක්තවූවෙක් වෙව ඉදිරියට ගමන් කිරීමෙහිද, ආපසු ගමන් කිරීමෙහිද, නුවණින් යුක්තව කරන්නෙක් ඉදිරිපස බැලීමෙහිද, හැරී බැලීමෙහිද නුවණින් යුක්තවූවෙක්, අත් පා හැකිලීමෙහිද, දිගුකිරීමෙහිද, නුවණින් යුක්තවූවෙක්, දෙපට සිව්ර හා පා සිව්රු දැරීමෙහි නුවණින් යුක්තවූවෙක්, අනුභව කිරීමෙහි පානය කිරීමෙහි, කඩා කෑමෙහි, රස විඳීමෙහි නුවණින්, යුක්තවූවෙක්, මලමුත්‍ර පහකිරීමෙහි නුවණින් යුක්තවූවෙක්, ගමනෙහි, සිටීමෙහි, හිඳීමෙහි, නිදි දුරුකිරීමෙහි, කීමෙහි, කතා නොකිරීමෙහි නුවණින් යුක්තවූවෙක් වේවයි (යනුවෙනි.)

8. "බ්‍රාහ්මණය, යම් තැනක පටන් මහණතෙම සිහි නුවණින් යුක්තවූයේ වේද, ඒ පුද්ගලයා තථාගත තෙම මත්තෙහි හික්මවයි. 'මහණ, එව නුඹ විවේක ඇත්තාවූ සේනාසනයක් භජනය කරව. එනම්: අරණ්‍යය, වෘක්ෂමූලය, පර්වතය, කඳුරැළිය, පර්වත ගුහාවය, සොහොනය, අභ්‍යවකාශය, පිදුරු බිස්නය යන මොහුයි. හෙතෙම විවෙක ඇති සෙනසුනක් භජනය කරයි. අරණ්‍යය, වෘක්ෂමූලය, පර්වතය, කඳුරැළිය, පර්වත ගුහාය, සොහොනය, වනසෙනසුනය, අභ්‍යවකාශය, පිදුරු බිස්නය යන මොහුයි.

හෙතෙම සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුණේ පළඟ බැඳගෙන ඍජුව කය පිහිටුවා අරමුණට ඉදිරිපත් කොට සිහිය පිහිටුවා හිඳියි. හෙතෙම ලොකයෙහි ලොභය දුරුකොට පහව ගියාවූ 'විෂම ලොභය ඇති සිතින් යුක්තව වාසය කරයි. ලොභයෙන් සිත පිරිසිදු කරයි. ද්වෙෂය දුරුකොට ද්වෙෂ රහිත සිත් ඇත්තේ, සියලු සත්වයන් කෙරෙහි හිතානුකම්පා ඇතිව වාසය කරයි. ව්‍යාපාද දොෂයෙන් සිත පිරිසිදු කරයි. ථිනමිද්ධය හැර පහව ගියාවූ ථිනමිද්ධය ඇතිව ආලොක සංඥා ඇතිව සිහි නුවණ දෙකින් යුක්තව වාසය කරයි. ථිනමිද්ධයෙන් සිත පිරිසිදු කරයි. උද්ධච්චකුක්කුච්චය (නොසන්සුන් කම හා පසු තැවීම) දුරුකොට සන්සුන්ව තමා කෙරෙහි සංසිඳුනු සිත් ඇතිව

වාසය කරයි. උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කරයි. විචිකිච්ඡාව හැර දුරුකළ සැක ඇත්තේ කුසල ධර්මයන්හි කෙසේ කෙසේදැයි යන සැක නැතිව වාසය කරයි. විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කරයි.

**9.** "හෙතෙම මේ සිත කිලුටු කරන්නාවූ ප්‍රඥාව දුර්වල කරන්නාවූ පඤ්චනීවරණයන් හැර කාමයන්ගෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයි. විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් තමා කෙරෙහි පැහැදීම ඇති චිත්තයාගේ එකඟබව ඇති විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. ප්‍රීතියෙහිද නොඇල්මෙන් උපෙක්ෂාවෙන්ද, සිහි නුවණ දෙකින්ද, යුක්තව වාසය කරයි. සැපයද නාම කයින් විඳියි. යම් ධ්‍යානයකට පැමිණීම නිසා ආර්‍ය්‍යයෝ උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සැප විහරණ ඇත්තේයයි, කියත්ද ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. සැපයාගේද දුරු කිරීමෙන් දුක්ඛයාගේද දුරු කිරීමෙන් පළමු උපචාර කාලයේම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැසීමෙන් දුක් නැත්තාවූ සැප නැත්තාවූ උපෙක්ෂා ස්මෘති දෙදෙනාගේ පිරිසිදු කම ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයි.

**10.** "බ්‍රාහ්මණය, යම් ඒ භික්ෂූහු ශෛක්ෂවූවාහු නොපැමිණි අර්හත්වය ඇත්තාහු උතුම්වූ නිවණ පතමින් වාසය කරත්ද, ඔවුන් කෙරෙහි මාගේ මෙබඳුවූ මේ අනුශාසනාව වෙයි. යම් ඒ භික්ෂූහු රහත්වූවාහු ක්ෂය කළ ආශ්‍රව ඇත්තාහු වැස නිමවනලද බඹසර (උතුම් හැසිරීම) ඇත්තාහු සතර මගින් කරණලද කටයුතු ඇත්තාහු බහා තබන ලද කෙලෙස් බර ඇත්තාහු පිළිවෙළින් පැමිණි අර්හත්වය ඇත්තාහු ක්ෂයකළ භවසංයොජන ඇත්තාහු මනාව නුවණින් දැන කෙලෙසුන් කෙරෙන් මිදුනාහු වෙත්ද, ඔවුන්ට මේ ධර්මයෝ මේ ආත්මයෙහි සැප විහරණය පිණිසද සිහි නුවණ දෙකින් යුක්තවීම පිණිසද පවතිත්යයි" වදාළේය.

11. මෙසේ වදාළ කල්හි ගණක මොග්ගල්ලාන නම් බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "කිමෙක්ද? භවත් ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකයෝ භවත් ගෞතමයන් වහන්සේ විසින් මෙසේ අවවාද කරණු ලබන්නාහු මෙසේ අනුශාසනා කරණු ලබන්නාහු සියල්ලෝම ඒකාන්ත නිෂ්ටාවවූ නිවණට පැමිණෙත්ද, නොහොත් ඇතැමෙක් නොපැමිණෙත්ද?"

12. "බ්‍රාහ්මණය, ඇතැම් මාගේ ශ්‍රාවකයෝ මෙසේ අවවාද කරණු ලබන්නාහු, මෙසේ අනුශාසනා කරණු ලබන්නාහු, ඒකාන්ත නිෂ්ටාවවූ නිවණට පැමිණෙත්. ඇතැම්හු නොපැමිණෙත්යයි" (වදාළේය.) "භවත් ගෞතමයන් වහන්ස, නිවණද ඇත්තේද, නිවණට පැමිණෙන මාර්ගයද ඇත්තේය. එහි යොදවන්නාවූ භවත් ගෞතමයන් වහන්සේද ඇත්තාහ. එතකුදු වුවත් භවත් ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකයෝ භවත් ගෞතමයන් වහන්සේ විසින් මෙසේ අවවාද කරණු ලබන්නාහු, මෙසේ අනුශාසනා කරණු ලබන්නාහු, සමහරු ඒකාන්ත නිෂ්ටාවවූ නිවණට පැමිණෙත්. සමහරු නොපැමිණෙත් යන යමක් වේද, ඊට හේතුව කවරේද, ප්‍රත්‍යය කවරේද?"

13. "බ්‍රාහ්මණය, එසේවී නම්, තොපගෙන්ම මෙය අසන්නෙමි. යම්සේ තොපට වැටහෙන්නේද, එසේ එය ප්‍රකාශ කරව. බ්‍රාහ්මණය, ඒ කුමකැයි හඟින්නෙහිද? නුඹ රජගහ නුවරට යන්නාවූ මාර්ගය පිළිබඳව දක්ෂයෙක් වෙහිද?" "එසේය. පින්වතුන් වහන්ස, මම රජගහනුවරට යන්නාවූ මග පිළිබඳව දක්ෂයෙක්මි"යි කීයේය.

"බ්‍රාහ්මණය, ඒ කුමකැයි හඟින්නෙහිද? මෙහි රජගහ නුවරට යනු කැමැත්තාවූ පුරුෂයෙක් එන්නේය. හෙතෙම නුඹ වෙත පැමිණ 'ස්වාමීනි, මම රජගහනුවරට යනු කැමැත්තෙමි. ඒ මට රජගහනුවරට යන මග දක්වනු මැනවැයි' කියන්නේය. ඔහුට නුඹ මෙසේ කියන්නෙහිය. 'පින්වත් පුරුෂය, මෙසේ මේ මාර්ගය රජගනුවරට යයි. ඒ මගින් ටික දුරක් යව. ඒ මගින් ටික දුරක් ගිය කල අසවල් නම් ගම දක්නෙහිය. එයින් ටික දුරක් යව.

එයින් ටික දුරක් ගිය කල අසවල් නම් නියම් ගම දක්නෙහිය. එයින් ටික දුරක් යව. එයින් ටික දුරක් ගිය කල ආරාමයන්ගෙන් අලංකාරවූ, උයන්වලින් අලංකාරවූ, භූමියෙන් අලංකාරවූ, පොකුණුවලින් අලංකාරවූ, රජගහනුවර දක්නෙහිය,' කියායි. නුඹ විසින් මෙසේ අවවාද කරනු ලැබූ, මෙසේ අනුශාසනා කරනු ලැබූ හෙතෙම වැරදි මගක් ගෙණ ආපසු හැරී යන්නේය.

ඉක්බිති රජගහනුවරට යනු කැමැත්තාවූ දෙවෙනි පුරුෂයෙක් එන්නේය. හෙතෙම නුඹ වෙත පැමිණ 'ස්වාමීනි, මම රජගහනුවරට යන්ට කැමැත්තෙමි. ඒ මට රජගහනුවරට මග දක්වනු මැනවැයි' කියන්නේය. ඔහුට නුඹ මෙසේ කියන්නෙහිය. 'පින්වත් පුරුෂය, මෙසේ මේ මග රජගහ නුවරට යයි. ඒ මගින් ටික දුරක් යව. ඒ මගින් ටික දුරක් ගිය කල අසවල් නම් ගම දක්නෙහිය. එයින් ටික දුරක් යව. එයින් ටික දුරක් ගිය කල අසවල් නම් නියම් ගම දක්නෙහිය. එයින් ටික දුරක් යව එයින් ටික දුරක් ගිය කල ආරාමයන් ගෙන් අලංකාරවූ, වනයන්ගෙන් අලංකාරවූ, භූමින්ගෙන් අලංකාරවූ, පොකුණුවලින් අලංකාරවූ, රජගහනුවර දක්නෙහිය' යනුවෙනි. නුඹ විසින් මෙසේ අවවාද කරනු ලැබූ මෙසේ අනුශාසනා කරණු ලැබූ හෙතෙම සුවසේ රජගහ නුවරට යන්නේය.

"බ්‍රාහ්මණය, රජගහනුවරද ඇත. රජගහනුවරට යන මගද ඇත. යොදවන්නාවූ නුඹ ඇත. එතකුදු වුවත් නුඹ විසින් මෙසේ අවවාද කරනු ලැබූ, මෙසේ අනුශාසනා කරනු ලැබූ එක් පුරුෂයෙක් නොමග ගෙන ආපසු හැරී යන්නේය. එක් පුරුෂයෙක් සුවසේ රජගහනුවරට යන්නේය යන මීට හේතුව කුමක්ද?" "භවත් ගෞතමයන් වහන්ස, කාරණය කුමක්ද? මෙහි මම කුමක් කෙරෙම්ද? භවත් ගෞතමයන් වහන්ස, මම මග කියන්නේ වෙමියි කීය.

14. "බ්‍රාහ්මණය, එපරිද්දෙන්ම නිවණ ඇත්තේමය. නිවණට යන මග ඇත්තේමය. යොදවන්නාවූ මමද සිටිමි. එතකුදු වුවත් මාගේ ශ්‍රාවකයෝ මා විසින් මෙසේ අවවාද කරනු ලබන්නාහු, මෙසේ අනුශාසනා කරනු ලබන්නාහු සමහරු ඒකාන්තයෙන්

නිෂ්ටාවවූ නිවණට පැමිණෙත්. සමහරු නොපැමිණෙත්. බ්‍රාහ්මණය, මෙහි මම කුමක් කෙරෙම්ද? බ්‍රාහ්මණය, තථාගතතෙම මග කියන්නේ වේයයි" වදාළේය.

15. මෙසේ වදාළ කල්හි ගණක මොග්ගල්ලාන නම් බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "භවත් ගෞතමයන් වහන්ස, ශ්‍රද්ධාව නැත්තාවූ, ජීවිකාව ප්‍රයොජන කොට ඇත්තාවූ, ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි නොවූ, කෛරාටිකවූ, මායා ඇත්තාවූ, කෙටුභ ශාස්ත්‍ර දන්නාවූ, උඩඟුවූ, මානය ඇත්තාවූ, චපලවූ, දොඩමලුවූ, විසුරුණු වචන ඇත්තාවූ, ඉන්ද්‍රියයන්හි නොරක්නාලද දොරටු ඇත්තාවූ, වැළඳීමෙහි පමණ නොදන්නාවූ, නිදි දුරුකිරීමෙහි නොයෙදුනාවූ, ශ්‍රමණ බැව්හි බලාපොරොත්තුවක් නැත්තාවූ ශික්ෂාවෙහි තියුණු ගෞරවයක් නැත්තාවූ, ප්‍රත්‍ය බහුලකොට ඇත්තාවූ, සස්න ලිහිල්කොට ගත්තාවූ, පසුබැස්මෙහි පෙරටුව ගමන් කරන්නාවූ, විවේකයෙහි බහා තබනලද බර ඇත්තාවූ, කම්මැලිවූ, හීන වීයර්‍ය ඇත්තාවූ, සිහි මුළාවූ, නුවණ නැත්තාවූ, සිත එකග නොවූ, කැළඹුණු සිත් ඇත්තාවූ, ප්‍රඥා නැත්තාවූ, කෙලතොලුවූ, යම් පුද්ගලයෝ වෙත්ද, භවත් ගෞතම තෙමේ ඔවුන් සමග වාසය නොකරයි.

"ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූ කෛරාටික නොවූ, මායා නැත්තාවූ කෙටුභ ශාස්ත්‍ර නොකියන්නාවූ, උඩඟු නොවූ, උස්වූ මාන නළ නැත්තාවූ, චපල නොවූ, දොඩමලු නොවූ, විසුරුණු වචන නැත්තාවූ, ඉන්ද්‍රියයන්හි රක්නාලද දොරටු ඇත්තාවූ, වැළඳීමෙහි පමණ දන්නාවූ, නිදි දුරු කිරීමෙහි යෙදුනාවූ, ශ්‍රමණ බැව්හි බලාපොරොත්තු ඇත්තාවූ, ශික්ෂායෙහි තියුණුගෞරව ඇත්තාවූ, ප්‍රත්‍ය බහුලකොට නැත්තාවූ, සස්න ලිහිල්කොට නොගන්නාවූ, පසුබැස්මෙහි බහා තබනලද බරඇත්තාවූ, විවේකයෙහි පෙරටුව ගමන් කරන්නාවූ, පටන් ගන්නාලද වීයර්‍ය ඇත්තාවූ, හරනලද ආත්ම ආශාව ඇත්තාවූ, එළඹ සිටි සිහි ඇත්තාවූ, මනා නුවණ ඇත්තාවූ, සමාධියට පැමිණියාවූ, එකගවූ සිත් ඇත්තාවූ, ප්‍රඥාව ඇත්තාවූ,

කෙලතොලු නොවූ යම් ඒ පුද්ගලයෝ වෙත්ද, භවත් ගෞතමතෙමේ ඔවුන් සමග වාසය කරයි.

"භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යම්කිසි සුවඳ මුල් වර්ග වෙත්ද, කලුවැල් ඔවුන්ගෙන් අග්‍රයයි කියනු ලැබේ. යම්කිසි සුවඳ හර වර්ග වෙත්ද, රත්සඳුන් ඔවුන්ගෙන් අග්‍රයයි කියනු ලැබේ. යම්කිසි සුවඳ මල් වර්ග වෙත්ද, දෑසමන් ඔවුන්ගෙන් අග්‍රයයි කියනු ලැබේ. එපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේගේ අවවාදය තෙම මෙකල්හි පවත්නා ධර්ම අතුරෙන් අතිශයින් අග්‍රවන්නේය.

16. "භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරුකොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වේද, වසා තබන ලද්දක් වැසුම් හරින්නේ හෝ වේද, මංමුළා වූවෙකුට මග කියන්නේ හෝ වේද, අන්ධකාරයෙහි ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේ හෝ වේද, මෙපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේ විසින් අනෙක ප්‍රකාරයෙන් ධර්ම ප්‍රකාශ කරනලදී. ඒ මම භවත් ගෞතමයන් වහන්සේ සරණකොට යමි. ධර්මයද භික්ෂු සංඝයාද, (සරණකොට යමි.) භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිමි කොට සරණ ගියාවූ උපාසකයෙකැයි දරණසේක්වායි" කීය.

හත්වෙනිවූ ගණක මොග්ගල්ලාන සූත්‍රය නිමි. (1-7)

---

## 8. ගොපක මොග්ගල්ලාන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ පිරිනිවී නොබෝ කල්හි රජගහනුවර කලන්දක නිවාපනම්වූ වෙළුවනාරාමයෙහි වාසය කරති. එකල්හි වනාහි වෛදෙහි පුත්‍රවූ මගධ රටට අධිපතිවූ අජාත ශත්‍රු නම් රජ තෙම පජ්ජොත

රජගැන සැක කොට රජගහ නුවර ප්‍රතිසංස්කරණය කරවයි. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම උදය කාලයෙහි හැඳ පොරවා පාත්‍රසිවුරු ගෙණ රජගහ නුවරට පිඩු පිණිස වැඩියේය. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට තවම රජගහ නුවර පිඩුපිණිස හැසිරීමට කල්වැඩිය. මම ගොපක මොග්ගල්ලාන නම් බ්‍රාහ්මණයාගේ කර්මාන්තය (වැඩපොල) යම් තැනෙක් හිද, ගොපක මොග්ගල්ලාන නම් බ්‍රාහ්මණයා යම් තැනෙක් හිද, එතැනට යන්නෙම් නම් හොඳයයි අදහස්විය.

2. 'ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම ගොපක මොග්ගල්ලාන නම් බ්‍රාහ්මණයාගේ වැඩපොල යම් තැනෙක්හිද, ගොපක මොග්ගල්ලාන නම් බ්‍රාහ්මණ තෙම යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. ගොපක මොග්ගල්ලාන නම් බ්‍රාහ්මණ තෙමේ එන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ දුරදීම දුටුයේය. දැක ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට පින්වත් ආනන්ද ස්ථවිර තෙමේ මෙහි එත්වා, පින්වත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ පැමිණීම යහපත්ය. පින්වත් ආනන්ද ස්ථවිර තෙමේ බොහෝ කලකින් මෙහි පැමිණියේය. පින්වත් ආනන්ද ස්ථවිර තෙමේ වැඩ හිඳිනු මැනව. මේ ආසනය පනවනලදැයි" කීය. ආයුෂ්මත් ආනන්දස්ථවිර තෙම පනවන ද ආසනයෙහි වැඩ උන්නේය. ගොපක මොග්ගල්ලාන නම් බ්‍රාහ්මණ තෙමේද, එක්තරා මිටි ආසනයක් ගෙණ එක් පසක උන්නේය. එක්පසක උන්නාවූ ගොපක මොග්ගල්ලාන නම් බ්‍රාහ්මණ තෙම ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේගෙන් "ඒ භවත් ගෞතමයන් වහන්සේ යම් ධර්මයන්ගෙන් යුක්ත වූයේ අර්හත් සම්‍යක්සම්බුද්ධවූයේද, සියලු ආකාරයෙන් ඒ ධර්මයන්ගෙන් යුක්තවූ එක භික්ෂුවක්වත් ඇත්තේ දැයි" ඇසීය.

3. "බ්‍රාහ්මණය, ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ යම් ධර්මයන්ගෙන් යුක්තවූ සේක්ද, සියලු ආකාරයෙන් ඒ ධර්මයන්ගෙන් යුක්තවූ එක භික්ෂුවකුත් නැත්තේමය. බ්‍රාහ්මණය, ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි නූපන් මාර්ගය උපදවන්නෙකි. නොහටගත් මාර්ගය හටගන්වන්නෙකි.

නොකියනලද මාර්ගය කියන්නෙකි. මාර්ගය දන්නෙක. මාර්ගයෙහි දක්ෂයෙක, පසුව ධර්මයෙන් යුක්තවූ මාර්ගයට අනුව ගමන් කරන්නාවූ ශ්‍රාවකයෝ මෙකල වාසය කෙරෙත්යයි” කීය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේත් මොග්ගල්ලාන බ්‍රාහ්මණයාත් අතර පැවති මේ කථාව කොට නිමවන ලද්දී වේ”

4. “එකල්හි මගධ මහාමාත්‍යවූ වස්සකාර නම් බ්‍රාහ්මණ තෙම රජගහ නුවර කර්මාන්තයන් පරීක්ෂාකර බලමින් යන්නේ, ගොපක මොග්ගල්ලාන නම් බ්‍රාහ්මණයාගේ වැඩපොල යම් තැනෙක්හිද, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටු වියයුතුවූ, සිහිකටයුතුවූ, කථාකොට නිමවා එකත් පසක හුන්නේය. එකත් පසක හුන්නාවූ මගධ මහාමාත්‍යවූ වස්සකාර නම් බ්‍රාහ්මණ තෙම ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේගෙන් “භවත් ආනන්දස්ථවිරයන් වහන්ස, දැන් කිනම් කථාවකින් යුක්තව හුන්නාහුද? නුඹවහන්සේලා අතර කිනම් කථාවක් කොට නිම කරණ ලද්දීදැයි” ඇසීය.

“බ්‍රාහ්මණය, මෙහි මාගෙන් ගොපක මොග්ගල්ලාන නම් බ්‍රාහ්මණ තෙම ‘භවත් ආනන්දස්ථවිරයන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භවත් ගෞතමයන් වහන්සේ යම් ධර්මයන්ගෙන් යුක්තවූ සේක්ද සියලු ආකාරයෙන් ඒ ධර්මයන්ගෙන් යුක්තවූ එක් භික්ෂුවක්වත් ඇත්තේ දැයි ඇසීය.”

“බ්‍රාහ්මණය, මෙසේ කී කල්හි මම ගොපක මොග්ගල්ලාන බ්‍රාහ්මණයාට මෙය කීවෙමි. “බ්‍රාහ්මණය, ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ යම් ධර්මයන් යුක්තවූ සේක්ද, සියලු ආකාරයෙන් ධර්මයන්ගෙන් යුක්තවූ එක භික්ෂුවකුත් නැත්තේමය, බ්‍රාහ්මණය, ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි නූපන්නාවූ මාර්ගය උපද වන්නෙකි. නොහට ගත්තාවූ මාර්ගය හටගන්වන්නෙකි. නොකියන ලද්දාවූ මාර්ගය කියන්නෙකි. මාර්ගය දන්නෙක, මාර්ගයෙහි දක්ෂයෙකි. පසුව ධර්මයෙන්

යුක්තවූ මාර්ගය අනුව ගමන් කරන්නාවූද, ශ්‍රාවකයෝ මෙකල්හි වාසය කෙරෙත්යයි,' කීවෙමි. බ්‍රාහ්මණය අපත් ගොපක මොග්ගල්ලාන බ්‍රාහ්මණයාත් අතර මේ කථාව කොට නිමවනලදී. එකල්හි ඔබ පැමිණියෙහියයි," කීය.

**5.** "භවත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, මෙතෙම තොපට පිළිසරණ වන්නේයයි ඒ භවත් ගෞතමයන් වහන්සේ විසින් තබනලද දැන් නුඹවහන්සේලා අනුගමනය කරන්නාවූ එක් භික්ෂුවක්වත් ඇත්තේද?" ගෞතමයන් වහන්සේ විසින් තබනලද එබඳු එක භික්ෂු නමකුත් ඇත්තේද?"

'බ්‍රාහ්මණය, මෙතෙම තොපට මාගේ ඇවෑමෙන් පිළිසරණ වන්නේයයි, ඒ දන්නාවූ දක්නාවූ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ විසින් තබන ලද්දාවූ, දැන් අප අනුගමනය කරන්නාවූ, එබඳුවූ එක භික්ෂුවකුත් නැත්තේ මැයි."

"භවත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, මෙතෙම අපට භාග්‍යවතුන් වහන්සේගේ ඇවෑමෙන් පිළිසරණ වන්නේයයි සංඝයා විසින් සම්මත කරණ ලද්දාවූ බොහෝ ස්ථවිර භික්ෂූන් විසින් තබන ලද්දාවූ දැන් නුඹවහන්සේලා අනුව ගමන් කරන්නාවූ එක භික්ෂුවක්වත් ඇත්දැයි," (ඇසූයේය,)

"බ්‍රාහ්මණය, මෙතෙම අපට භාග්‍යවතුන් වහන්සේගේ, ඇවෑමෙන් පිළිසරණ වන්නේයයි. සංඝයා විසින් සම්මත කරණ ලද්දාවූ බොහෝවූ ස්ථවිර භික්ෂූන් විසින් තබන ලද්දාවූ, දැන් අප යමකු අනුව ගමන් කරන්නාවූ එක භික්ෂූ නමකුත් නැත්තේමය."

**6.** "භවත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, මෙසේ පිළිසරණක් නැති කල්හි සමගියට හේතු කවරේද?" "බ්‍රාහ්මණය අපි පිළිසරණ නැත්තෝ නොවෙමු. බ්‍රාහ්මණය, අපි පිළිසරණ ඇත්තෝ වෙමු. ධර්මය පිළිසරණකොට ඇත්තෝ වෙමුයි," කීය.

"භවත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, මෙතෙම තොපට මාගේ ඇවෑමෙන් පිළිසරණ වන්නේයයි" ඒ භවත් ගෞතමයන්

වහන්සේ විසින් තබනලද දැන් නුඹ වහන්සේලා අනුව ගමන් කරන්නාවූ එක භික්ෂුවකුත් ඇත්තේදැයි, මෙසේ අසන ලද්දේම "බ්‍රාහ්මණය, මෙතෙම තොපට මාගේ ඇවෑමෙන් පිළිසරණ වන්නේයයි ඒ දන්නාවූ දක්නාවූ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ විසින් තබනලද දැන් අප අනුව යන්නාවූ එබඳුවූ එක භික්ෂුවකුත් නැතැයි" කීයෙහිය. 'භවත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, මෙතෙම අපට භාග්‍යවතුන් වහන්සේගේ ඇවෑමෙන් පිළිසරණ වන්නේ යයි, සංඝයා විසින් සම්මත කරණලද බොහෝවූ ස්ථවිර භික්ෂූන් විසින් තබනලද දැන් නුඹ වහන්සේලා අනුව යන එබඳු එක භික්ෂුවකුත් ඇත්තේදැයි' මෙසේ අසන ලද්දේ 'බ්‍රාහ්මණය, මෙතෙම අපට භාග්‍යවතුන් වහන්සේගේ ඇවෑමෙන් පිළිසරණ වන්නේයයි, සංඝයා විසින් සම්මත කරණලද. බොහෝවූ ස්ථවිර භික්ෂූන් විසින් තබන ලද දැන් අප අනුගමනය කරණ එක භික්ෂුවකුත් නැතැයි' කීයෙහිය. 'භවත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, මෙසේ පිළිසරණක් නැති කල්හි සමගියට හේතු කවරේදැයි,' මෙසේ අසන ලද්දේ 'බ්‍රාහ්මණය. අපි පිළිසරණ නැත්තෝ නොවෙමු. බ්‍රාහ්මණය, අපි පිළිසරණ ඇත්තෝ වෙමු. ධර්මය පිළිසරණ කොට ඇත්තෝ වෙමුයි.' කීයෙහිය. භවත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, මේ කීමේ අර්ථය කෙසේ දතයුත්තේදැයි" ඇසීය.

7, "බ්‍රාහ්මණය, සර්වඥතාඥානයෙන් දන්නාවූ බුදු ඇසින් දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට පණවන ලද ශික්ෂාපද. උදෙසා දෙසනලද ප්‍රාතිමොක්ෂය ඇත්තේය. ඒ අපි එදවස්හිවූ පොහොයෙහි යම්තාක් භික්ෂූහු එක ගමක් ඇසුරුකොට වාසය කරමුද, ඒ සියල්ලෝ එක තැනකට රැස්වෙමු. රැස්ව යමෙකුට එය කට පාඩම් තිබේද, එය කීම සඳහා ඔහුට ආරාධනාකරමු. එය කියනු ලබන කල්හි භික්ෂුවක්හට ඇවතක් වේද, ශික්ෂාපද කඩකිරීමක් වේද, එය අපි ධර්මයවූ පරිද්දෙන් අනුශාසනාවවූ පරිද්දෙන් කරවමු. පින්වත්හු වනාහි එය නොකරවත්. ධර්මයම එය කරවායයි" කීය.

8. "භවත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, නුඹවහන්සේලා මේ කාලයෙහි යම් භික්ෂුවකට සත්කාර කරන්නාහුද, ගෞරව කරන්නාහුද, බුහුමන් කරන්නාහුද, පුදන්නහුද, සත්කාර කොට ගෞරව කොට ඇසුරු කරගෙන වාසය කරන්නහුද, එබඳු එක භික්ෂුවකුත් ඇත්තේද?"

"බ්‍රාහ්මණය, අපි මේ කාලයෙහි යමෙකුට සත්කාර කරමුද, ගෞරව කරමුද, බුහුමන් කරමුද, පුදමුද, සත්කාර කොට ගෞරව කොට, ඇසුරු කොටගෙණ වාසය කරමුද, එබඳු එක භික්ෂුවක් ඇත්තේය."

9. "භවත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, මෙතෙම තොපට මාගේ ඇවෑමෙන් පිළිසරණ වන්නේයයි ඒ භවත් ගෞතමයන් වහන්සේ විසින් තබනලද මෙකල්හි නුඹ වහන්සේලා යමෙකු අනුව පිළිපදින්නාවූ එබඳු එක භික්ෂුවකුත් ඇත්තේදැයි' මෙසේ අසන ලද්දේ 'බ්‍රාහ්මණය, මෙතෙම තොපට මාගේ ඇවෑමෙන් පිළිසරණ වන්නේයයි ඒ දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් තබනලද අපි මේ කාලයෙහි යම් භික්ෂුවක් අනුව පිළිපදින්නෙමුද, එබඳු එක භික්ෂුවකුත් නැත්තේයයි' කීයෙහිය. භවත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, 'මෙතෙම අපට භාග්‍යවතුන් වහන්සේගේ ඇවෑමෙන් පිළිසරණ වන්නේයයි සංඝයා විසින් සම්මත කරණලද බොහෝවූ ස්ථවිර භික්ෂූන් විසින් තබනලද මෙකල්හි නුඹවහන්සේලා යම් භික්ෂුවක් අනුව පිළිපදින්නාවූ එබඳු එක භික්ෂුවකුත් ඇත්තේදැයි' මෙසේ අසන ලද්දේද, 'බ්‍රාහ්මණය, මෙතෙම අපට භාග්‍යවතුන් වහන්සේගේ ඇවෑමෙන් පිළිසරණ වන්නේයයි සංඝයා විසින් සම්මත කරණලද බොහෝවූ ස්ථවිර භික්ෂූන් විසින් තබනලද මෙකල්හි අපි යම් භික්ෂුවක් අනුව පිළිපදින්නෙමුද, එබඳු එක භික්ෂුවකුත් නැත්තේය'යි කීයෙහිය. භවත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, මේ කාලයෙහි නුඹ වහන්සේලා යමෙකුට සත්කාර කරන්නහුද, ගෞරව කරන්නහුද, බුහුමන් කරන්නහුද, පුදන්නහුද, සත්කාර කොට, ගෞරවකොට, ඇසුරුකොට ගෙණ වාසය කරන්නහුද, එබඳු එක භික්ෂුවකුත් ඇත්තේදැ'යි මෙසේ අසන

ලද්දේද, 'බ්‍රාහ්මණය, මේ කාලයෙහි අපි යමෙකුට සත්කාර කරමුද, ගෞරව කරමුද, බුහුමන් කරමුද, පුදමුද, සත්කාර කොට, ගෞරවකොට, ඇසුරුකොටගෙණ, වාසය කරමුද, එබඳු එක භික්ෂුවක් ඇත්තේයයි, කීයෙහිය.' භවත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, මේ කීමේ අර්ථය කෙසේ දතයුත්තේදැයි" ඇසීය.

10. "බ්‍රාහ්මණය, සර්වඥතාඥානයෙන් දන්නාවූ බුදු ඇසින් දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණලද පැහැදිය යුතු ධර්ම දසයක් ඇත්තේය. යමෙකු කෙරෙහි මේ ධර්මයෝ ඇත්තාහුද ඔහුට අපි මේ කාලයෙහි සත්කාර කරමු. ගෞරව කරමු. බුහුමන් කරමු. පුදමු. සත්කාර කොට, ගෞරව කොට, ඔහු ඇසුරු කොට ගෙණ වාසය කරමු. කවර දසයක්දයත්?

11. "බ්‍රාහ්මණය, මේ ශාසනයෙහි මහණතෙම සිල්වත් වේද, ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවරව, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්තව සුළු වරදෙහිද බය දක්නෙක්ව ශික්ෂාපදයන්හි සමාදන්ව හික්මෙයිද, බොහෝකොට අසන ලද්දෙක් ඇසූ දේ දරන්නෙක්, අසනලද දේ රැස්කර ගන්නෙක් වෙයිද, මුල යහපත්වූද, මැද යහපත්වූද, කෙළවර යහපත්වූද, අර්ථ සහිතවූද, ව්‍යඤ්ජන සහිතවූද, යම් ඒ ධර්මයෝ සියල්ලෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කෙරෙත්ද, එබඳු ධර්මයෝ මොහු විසින් බොහෝකොට අසන ලද්දාහු වෙත්ද, දරණ ලද්දාහුද, වචනයෙන් පුරුදු කරණ ලද්දාහු, සිතින් සලකා බලන ලද්දාහු, දෘෂ්ටියෙන් මොනවට අවබොධ කරන ලද්දාහු වෙත්ද,

"චීවරය, පිණ්ඩපාතය, සෙනාසනය, ගිලනුන්ට ප්‍රත්‍යවූ බෙහෙත් පිරිකරය යන මෙයින් සතුටුවූයේ වෙයිද, විශෙෂයෙන් සිතෙහි හටගන්නාවූ මේ ආත්මයෙහි සැප විහරණ ඇත්තාවූ සතර ධ්‍යානයන් කැමැති පරිදි ලබන්නේ දුක් රහිතව ලබන්නේ පහසුවෙන් ලබන්නේ වේද,

12. "අනෙක ප්‍රකාරවූ ඍද්ධි දක්වන්නේ වෙයිද, එකෙක්ද වී, බොහෝදෙනෙක් වෙත්. බොහෝදෙනෙක් වී එකෙක් වෙයි.

ප්‍රකට බවට, මුවහවීමට, බිත්තියෙන් පිටතට, ප්‍රාකාරයෙන් පිටතට, පර්වතයෙන් පිටතට, නොගැටෙමින් අහසෙහි මෙන් ගමන් කරයි. පොළොවෙහිද මතුවීම ගිලීම දියෙහි මෙන් කරයි දියෙහිද දිය බිඳීමක් නැතිව පොළොවෙහි මෙන් ගමන් කරයි. අහසෙහිද පියාපත් ඇති පක්ෂියකු මෙන් පයඞංක බැඳ ගමන් කරයි. මෙසේ මහත් ඍද්ධි ඇති මෙසේ මහත් ආනුභාව ඇති මේ චන්ද්‍ර සූර්‍ය්‍යයන්ද අතින් අල්වයි, පිරිමදියි, බ්‍රහ්ම ලොකය දක්වාද කයින් වසඟයෙහි පවත්වයිද,

'පිරිසිදුවූ මිනිසැ'ස ඉක්ම පවත්නාවූ දිව්‍යවූ ශ්‍රොත්‍ර ඥානයෙන් දිව්‍යවූද, මනුෂ්‍යවූද, දුරවූද, ලඟවූද, යම් ශබ්ද ඇත්ද, ඒ ශබ්ද දෙකොටස අසයිද,

13. "අන්‍ය සත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත තමන්ගේ සිතින් පිරිසිඳ දනියි. රාග සහිතවූ හෝ සිත රාග සහිතවූ සිතයයි දැනගනියි. පහවූ රාගය ඇති සිත හෝ පහවූ රාගය ඇති සිතයයි දැනගනියි. ද්වෙෂ සහිතවූ සිත හෝ ද්වෙෂ සහිතවූ සිතයයි දැනගනියි. පහවූ ද්වෙෂ ඇති සිත හෝ පහවූ ද්වෙෂ ඇති සිතයයි දැනගනියි. මොහ සහිතවූ සිත හෝ මොහ සහිතවූ සිතයයි දැනගනියි. පහවූ මොහය ඇති සිත හෝ පහවූ මොහය ඇති සිතයයි දැනගනියි. හැකුළුණාවූ සිත හෝ හැකුළුණු සිතයයි දැනගනියි. විසිර ගියාවූ සිත හෝ විසිර ගියාවූ සිතයයි දැනගනියි. මහද්ගතවූ සිත හෝ මහද්ගත සිතයයි දැනගනියි. මහද්ගත නොවූ සිත හෝ මහද්ගත නොවූ සිතයයි දැනගනියි. උත්තර සහිතවූ සිත හෝ උත්තර සහිත සිතයයි දැනගනියි. නිරුත්තරවූ සිත හෝ නිරුත්තර සිතයයි දැනගනියි. එකඟවූ සිත හෝ එකඟවූ සිතයයි දැනගනියි එකඟ නොවූ සිත හෝ එකඟ නොවූ සිතයයි දැනගනියි. මිදුනාවූ සිත හෝ මිදුනාවූ සිතයයි දැනගනියි. නොමිදුනාවූ සිත හෝ නොමිදුනාවූ සිතයයි දැනගනියිද,

14. "නොයෙක් ආකාරවූ පෙරවිසූ ස්කන්ධ පිළිවෙළ සිහි කරයි. කෙසේදයත්? එක ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දශයක්ද, ජාති විස්සක්ද ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති

දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත කල්පයන්ද, නොයෙක් විවර්ත කල්පයන්ද, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද, අසුවල් තැන්හි මෙනම් ඇත්තෙක් මෙබඳු ගොත්‍ර ඇත්තෙක් මෙබඳු වර්ණ ඇත්තෙක් මෙබඳු ආහාරය ඇත්තෙක් මෙබඳු සුව දුක් විඳින්නෙක් මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙක් වීමි. ඒ මම එයින් චුතවූයේ අසුවල් තන්හි ඉපදුනෙමි. එහිදු මෙනම් ඇත්තෙක් මෙබඳු ගොත්‍ර ඇත්තෙක් මෙබඳු වර්ණ ඇත්තෙක් මෙබඳු ආහාරය ඇත්තෙක් මෙබඳු සුව දුක් විඳින්නෙක් මෙබඳු ආයුෂය කෙළවර කොට ඇත්තෙක් වීමි. ඒ මම එයින් චුතවූයේ මෙහි උපන්නේ වෙමියි මෙසේ ආකාර සහිතවූ කොටස් සහිතවූ, නොයෙක් ආකාරවූ, පෙර විසීම් සිහි කරයිද,

15. "පිරිසිදුවූ මිනිස් ඇස ඉක්ම පවත්නාවූ දිව්‍යවූ ඇසින් චුත වන්නාවූද, උපදින්නාවූද, හීනවූද, ප්‍රණීතවූද, යහපත් වර්ණ ඇත්තාවූද, අයහපත් වර්ණ ඇත්තාවූද, හොඳ ලොව ගියාවූද, නරක ලොව ගියාවූද, සත්වයන් දකියි. කම්වූ පරිද්දෙන් පරලොව ගියාවූ සත්වයන් දැනගනියිද,

"ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත් ඵල සමාධියටද අර්හත්ඵල ප්‍රඥාවටද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට පැමිණ වාසය කරයිද,

"බ්‍රාහ්මණය, සර්වඥතාඥානයෙන් දන්නාවූ බුදු ඇසින් දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද්දාවූ මේ පැහැදිය යුතු ධර්ම දසය වෙත්. යමෙකු කෙරෙහි මේ ධර්ම දසය ඇත්තාහුද, මේ කාලයෙහි අපි ඔහුට සත්කාර කරමු. ගෞරව කරමු. බුහුමන් කරමු පුදමු. සත්කාරකොට, ගෞරවකොට, ඔහු ඇසුරු කොට ගෙණ වාසය කරමුයි කීය."

16. මෙසේ කී කල්හි මගධ මහාමාත්‍යවූ වස්සකාර නම් බ්‍රාහ්මණ තෙමේ උපනන්ද නම් සේනාපතියාට කථාකෙළේය. "සේනාපතිය, ඒ කුමකැයි හඟින්නෙහිද? ඉදින් මේ පින්වත්හු

මෙසේ සත්කාර කළයුත්තෙකුට සත්කාර කරද්ද? ගෞරව කළයුත්තාට ගෞරව කරද්ද? බුහුමන් කළ යුත්තාට බුහුමන් කරද්ද? පිදිය යුත්තාට පුදත්ද? ඒකාන්තයෙන් මේ පින්වත්හු, සත්කාර කළයුත්තාට සත්කාර කෙරෙත්. ගෞරව කළයුත්තාට ගෞරව කෙරෙත්. බුහුමන් කළ යුත්තාට බුහුමන් කෙරෙත්. පිදිය යුත්තාට පුදත්. ඒ පින්වත්හු වනාහි මෙකී තැනැත්තාටද සත්කාර නොකරන්නාහු නම්, ගෞරව නොකරන්නාහු නම්, බුහුමන් නොකරන්නාහු නම් නොපුදන්නාහු නම් එසේ ඇති කල්හි කවරෙකුට ඒ පින්වත්හු සත්කාර කරන්නාහුද? ගෞරව කරන්නාහුද, බුහුමන් කරන්නාහුද, පුදන්නාහුද, සත්කාර කොට, ගෞරව කොට, ඇසුරු කොටගෙණ වාසය කරන්නහුදැයි" (උපනන්ද සෙනාපති තෙමේ කීය.)

17. "ඉක්බිති මගධ මහාමාත්‍යවූ වස්සකාර නම් බ්‍රාහ්මණතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගෙන් "භවත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ මේ කාලයෙහි කොහි වාසය කරත්දැයි" ඇසීය.

"බ්‍රාහ්මණය, මම වනාහි මෙකල්හි වෙළුවනාරාමයෙහි වාසය කරමියි" (කීයේය.) "භවත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, කිමෙක්ද? වෙළුවනාරාමය සිත් අලවන්නේද? ස්වල්ප ශබ්ද ඇත්තේද? මඳවූ ඝොෂා ඇත්තේද? ජනවාතයෙන් තොරවූයේද? මිනිසුන්ගේ රහස් කුමන්ත්‍රණවලට සුදුසුද, තනිව විසීමට සුදුසුදැයි" (ඇසීය.)

18. "බ්‍රාහ්මණය, තොප වැනි ආරක්ෂකයන් පාලකයන් නිසා ඒකාන්තයෙන් වෙළුවනාරාමය සිත් අලවන්නේද, නිශ්ශබ්ද වූයේද, මඳවූ ඝොෂා ඇත්තේද, මිනිසුන්ගේ රහස් කීම සුදුසු වූයේද, තනිව වාසයට සුදුසු වූයේද වෙයි."

"භවත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, ධ්‍යාන වඩන ස්වභාව ඇති ධ්‍යාන වඩන්නාවූ පින්වතුන් වහන්සේලා නිසා ඒකාන්තයෙන් වෙළුවනාරාමය සිත් අලවන්නේද, නිශ්ශබ්ද වූයේද, මඳ ඝොෂා ඇත්තේද, පහවූ ජනවාතය ඇත්තේද,

මිනිසුන්ගේ රහස් කීමට සුදුසු වූයේද, තනිව වාසයට සුදුසු වූයේද වෙයි. පින්වත්හු ධ්‍යාන ඇත්තාහු, ධ්‍යාන වඩනසුළු වූවාහු වෙත්. භවත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, එක් කලෙක ඒ භවත් ගෞතමයන් වහන්සේ විසාලාමහනුවර මහවනයෙහිවූ කූටාගාර ශාලාවෙහි වැඩ වසනසේක. භවත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, එකල්හි මම මහාවනයෙහි කූටාගාර ශාලාව යම්තැනකද ඒ භවත් ගෞතමයන්වහන්සේ යම් තැනකද එතැනට පැමිණියෙමි. එහිද ඒ භවත් ගෞතමයන්වහන්සේ නොයෙක් ආකාරයෙන් ධ්‍යානය පිළිබඳ කථාව වදාළහ. ඒ භවත් ගෞතමයන් වහන්සේ සියලුම ධ්‍යානය වර්ණනා කළසේකැයි" (කීයේය)

**19.** "බ්‍රාහ්මණය, ඒ භාග්‍යවතුන් වහන්සේ සියලු ධ්‍යානය වර්ණනා නොකළහ. ඒ භාග්‍යවතුන් වහන්සේ සියලු ධ්‍යානය වර්ණනා නොකෙළේද නොවේ. බ්‍රාහ්මණය, ඒ භාග්‍යවතුන් වහන්සේ කෙබඳුවූ ධ්‍යානයක් වර්ණනා නොකෙළේද? බ්‍රාහ්මණය, මේ ලොකයෙහි ඇතැමෙක් කාම රාගය පැන නැඟී, කාම රාගයෙන් මඩනාලද සිතින් යුක්තව වාසය කරයි. උපන්නාවූ කාම රාගයාගේ දුරු කිරීමද, තත්වූ පරිද්දෙන් නොදනියි. හෙතෙම කාම රාගයම ඇතුළුකොට ධ්‍යාන කරයි (අරමුණු බලයි.) ප්‍රකාරයෙන් බලයෙන් නිතර බලයි. නැවත නැවත බලයි. ව්‍යාපාද පැනනැඟී ව්‍යාපාදයෙන් මඩනා ලද සිතින් වාසය කරයි. උපන්නාවූද ව්‍යාපාදයෙන් දුරුකිරීමද, තත්වූ පරිද්දෙන් දැන නොගනියි. හෙතෙම ව්‍යාපාදයම ඇතුළුකොට අරමුණු බලයි, ප්‍රකාරයෙන් බලයි. නිතර බලයි. නැවත නැවත බලයි. ථිනමිද්ධය පැන නැඟී ථිනමිද්ධයෙන් මඩනාලද සිතින් වාසයකරයි. උපන්නාවූද ථිනමිද්ධයාගේ දුරු කිරීමද තත්වූ පරිද්දෙන් දැන නොගනියි. හෙතෙම ථිනමිද්ධයම අරමුණු බලයි. ප්‍රකාරයෙන් බලයි, අතර කොට බලයි. නිතර බලයි, නැවත නැවත බලයි. උද්ධච්චකුක්කුච්චය පැනැනැඟී උද්ධච්චකුක්කුච්චයෙන් මඩනාලද සිතින් වාසය කරයි. උපන්නාවූද උද්ධච්චකුක්කුච්චයාගේ දුරුකිරීමද තත්වූ පරිද්දෙන් නොදනියි. හෙතෙම උද්ධච්චකුක්කුච්චයම ඇතුළු කොට අරමුණු

බලයි. ප්‍රකාරයෙන් බලයි. නිතර බලයි, නැවත නැවත බලයි. විචිකිච්ඡාව පැනනැගී විචිකිච්ඡාවෙන් මඩනාලද සිතින් වාසය කරයි. උපන්නාවූ විචිකිච්ඡාවගේ දුරු කිරීමද තත්වූ පරිද්දෙන් නොදනියි හෙතෙම විචිකිච්ඡාවම ඇතුළු කොට අරමුණු බලයි. ප්‍රකාරයෙන් බලයි. නිතර බලයි. නැවත නැවත බලයි. බ්‍රාහ්මණය, ඒ භාග්‍යවතුන් වහන්සේ මෙබඳුවූ ධ්‍යාන වර්ණනා නොකෙළේය.

**20.** "බ්‍රාහ්මණය, ඒ භාග්‍යවතුන් වහන්සේ කෙබඳුවූ ධ්‍යානයක් වර්ණනා කෙළේද? බ්‍රාහ්මණය, මේ ශාසනයෙහි භික්ෂු තෙම කාමයන්ගෙන් වෙන්වම අකුසල ධර්මයන් ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයිද, විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් තමා කෙරෙහි පැහැදීම ඇති චිත්තයාගේ එකඟ බව ඇති විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයිද, ප්‍රීතියගේද නොඇල්මෙන් උපෙක්ෂා ඇත්තේද, සිහි ඇත්තේද, නුවණ ඇත්තේද, වාසය කරයි. සැපයද කයින් විඳියි. ඒ යම් ධ්‍යානයක් ආර්‍යයෝ උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සැප විහරණ ඇත්තේයයි වර්ණනා කරත් ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයිද, සැපය දුරුකිරීමෙන්ද, දුක්ඛය දුරු කිරීමෙන්ද, පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැසීමෙන් දුක් නැත්තාවූද, සැප නැත්තාවූද, උපෙක්ෂා ස්මෘති දෙදෙනාගේ පිරිසිදුබැව් ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයිද, බ්‍රාහ්මණය, ඒ භාග්‍යවතුන් වහන්සේ මෙබඳුවූ ධ්‍යානය වර්ණනා කළ සේකැයි" (කීයේය).

**21.** "භවත් ආනන්දස්ථවිරයන් වහන්ස, භවත් ගෞතමයන් වහන්සේ ගැරහිය යුතුවූ ධ්‍යානයට ගැරහූ සේක. පැසසිය යුතු ධ්‍යානයට පැසසූ සේක. භවත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, දැන් අපි යන්නෙමු. අපි බොහෝ වැඩපල ඇත්තෝ බොහෝ කටයුතු ඇත්තෝ වෙමුයි" "බ්‍රාහ්මණය, නුඹ ඊට කල් දනුවයි." (කීයේය.)

ඉක්බිති මගධ මහාමාත්‍යවූ වස්සකාර නම් බ්‍රාහ්මණතෙම ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේගේ කීම සතුටින් පිළිගෙණ අනුමෝදන්ව හුනස්නෙන් නැගිට ගියේය.

22. ඉක්බිති ගොපක මොග්ගල්ලාන බ්‍රාහ්මණ තෙම මගධමහාමාත්‍යවූ වස්සකාර නම් බ්‍රාහ්මණයා ගිය නොබෝ කල්හි ආයුෂ්මත් ආනන්දස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. "අපි භවත් ආනන්දස්ථවිරයන් වහන්සේගෙන් යමක් ඇසූවෙමුද, එය අපට භවත් ආනන්දස්ථවිරයන් වහන්සේ ප්‍රකාශ නොකෙළේයයි" කීය.

"බ්‍රාහ්මණය, ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ යම් ධර්මයන්ගෙන් යුක්තවූවා හුද, ඒ ධර්මවලින් සියලු ආකාරයෙන් යුක්තවූ, එක භික්ෂුවකුත් නැත්තේය. බ්‍රාහ්මණය, ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි නූපන් මාර්ගය උපදවන්නෙකි. නොහටගත් මාර්ගය හටගන්වන්නෙකි. නොකියන ලද මාර්ගය කියන්නෙකි, මාර්ගය දන්නේය. මාර්ගයෙහි දක්ෂයෙකි. මෙකල වාසය කරන්නාවූ ශ්‍රාවකයෝ පසුව ඒ ධර්මයන්ගෙන් යුක්තවූ මාර්ගය අනුව ගමන් කරන්නෝ වෙත්යයි බ්‍රාහ්මණ, තොපට කීවමෝ නොවෙමුද?"

අටවෙනිවූ ගොපක මොග්ගල්ලාන සූත්‍රය නිමි. (1-8)

## 9. මහා පුණ්ණමා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ මිගාරමාතා ප්‍රාසාද නම්වූ පූර්වාරාමයෙහි වැඩ වාසය කරණසේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ එදවස්හිවූ පොහොය ඇති පසළොස්වක්හි පූර්ණ චන්ද්‍රයාගෙන් යුක්තවූ රාත්‍රියෙහි භික්ෂු සංඝයා විසින් පිරිවරණ ලද්දේ අභ්‍යවකාශයෙහි (එළිමහනෙහි) වැඩඋන්නේ වෙයි. එකල්හි වනාහි එක්තරා භික්ෂුනමක් හුනස්නෙන් නැගිට සිවුර එකාංශ කොට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද

එතැනට ඇදිළි බැඳගෙන භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය. "ස්වාමීනි, ඉදින් භාග්‍යවතුන් වහන්සේ ප්‍රශ්නයක් ප්‍රකාශ කිරීමට අවකාශ කෙරේ නම්, මම කිසියම් කාරණයක් භාග්‍යවතුන් වහන්සේගෙන් අසන්නෙමි" යනුයි.

"එසේවී නම් මහණ, යමක් කැමැත්තෙහිද, එය ස්වකීය ආසනයෙහිම හිඳ අසවයි වදාළේය. එකල්හි වනාහි ඒ භික්ෂු තෙම ස්වකීය ආසනයෙහි හිඳගෙණ භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය.

2. "ස්වාමීනි, මොහු වනාහි පඤ්ච උපාදාන ස්කන්ධයෝ වෙත්ද? එනම්ඃ රූප උපාදාන ස්කන්ධය, වෙදනා උපාදාන ස්කන්ධය, සංඥා උපාදාන ස්කන්ධය, සංස්කාර උපාදාන ස්කන්ධය විඤ්ඤාණ උපාදානස්කන්ධය යන මොහුයි.

"මහණ, රූප උපාදාන ස්කන්ධය, වෙදනා උපාදාන ස්කන්ධය, සංඥා උපාදාන ස්කන්ධය, සංස්කාර උපාදාන ස්කන්ධය විඥාන උපාදාන ස්කන්ධය යන මොහු පඤ්ච උපාදාන ස්කන්ධයෝ වෙත්."

3. "ස්වාමීනි, යහපතැයි" කියා ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙණ අනුමෝදන්ව භාග්‍යවතුන් වහන්සේගෙන් තවත් ප්‍රශ්නයක් ඇසිය "ස්වාමීනි, මේ පඤ්ච උපාදාන ස්කන්ධයෝ වනාහි කුමක් මුල් කොට ඇත්තාහුද?" "මහණ, මේ පඤ්ච උපාදාන ස්කන්ධයෝ තෘෂ්ණාව මුල්කොට ඇත්තාහුය." "ස්වාමීනි, ඒ පඤ්ච උපාදාන ස්කන්ධයෝම වෙත්ද? උපාදානයෝ වෙත්ද? ඔව්හුම පඤ්ච උපාදාන ස්කන්ධයෝ නොහොත් පඤ්ච උපාදාන ස්කන්ධයන්ගෙන් අනිකක් උපාදානයක් වේද?" "මහණ, එයම උපාදානයත්, එයම පඤ්ච උපාදාන ස්කන්ධයෝත් නොවෙත්. පඤ්ච උපාදාන ස්කන්ධයන් හැර අනිකක් උපාදානද නොවෙයි" "මහණ, පඤ්ච උපාදාන ස්කන්ධයන් කෙරෙහි යම් තෘෂ්ණාවක්වේද, එය එහි උපාදාන යයි, (දැඩිකොට අල්වා ගැනීමයි.)"

4. "ස්වාමීනි, පඤ්ච උපාදාන ස්කන්ධයන් කෙරෙහි තෘෂ්ණාවගේ වෙනස් බවක් වන්නේද?"

"මහණ, වන්නේයයි," භාග්‍යවතුන් වහන්සේ වදාළේය. "මහණ, මේ ලොකයෙහි ඇතමෙකුහට මෙබඳු සිතක් වෙයි. 'මතු කාලයෙහි මෙබඳු රූප ඇත්තෙක් වන්නෙමි. මතු කාලයෙහි මෙබඳු වෙදනා ඇත්තෙක් වන්නෙමි. මතු කාලයෙහි මෙබඳු සංඥා ඇත්තෙක් වන්නෙමි. මතු කාලයෙහි මෙබඳු සංස්කාර ඇත්තෙක් වන්නෙමි. මතු කාලයෙහි මෙබඳු විඥානය ඇත්තෙක් වන්නෙමි යනුවෙනි. මහණ, මෙසේ වනාහි පඤ්ච උපාදාන ස්කන්ධයන් කෙරෙහි තෘෂ්ණාවගේ වෙනස් බව වන්නේයයි" වදාළේය.

5. "ස්වාමීනි, කොපමණකින් වනාහි ස්කන්ධයන්ට ස්කන්ධ යන නම වන්නේදැයි"යි ඇසීය. "මහණ, අතීතවූද අනාගතවූද වර්තමානවූද තමා කෙරෙහිවූ හෝ පිටත්හිවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ ලාමකවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ලඟවූ හෝ යම්කිසි රූපයක් වේද, මෙය රූපස්කන්ධය නම් වේ. අතීත, අනාගත, වර්තමාන යන කාලත්‍රයෙහිවූ තමා කෙරෙහිවූ හෝ පිටත්හිවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ ලාමකවූ හෝ ප්‍රණීතවූ හෝ යම් දුරවූ හෝ ලඟවූ හෝ යම්කිසි වෙදනාවක් වේද, මෙය වෙදනා ස්කන්ධ නම් වේ. අතීත, අනාගත, වර්තමාන යන කාලත්‍රයෙහිවූ තමා කෙරෙහිවූ හෝ පිටත්හිවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ ලාමකවූ හෝ ප්‍රනීත වූ හෝ දුරවූ හෝ ලඟවූ හෝ යම්කිසි සංඥාවෝ වෙත්ද, මේ සංඥාස්කන්ධය නම් වේ. අතීත, අනාගත, වර්තමාන යන කාලත්‍රයෙහිවූ තමා කෙරෙහිවූ හෝ පිටත්හිවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ ලාමකවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ලඟවූ හෝ යම්කිසි සංස්කාර කෙණෙක් වෙත්ද, මේ සංස්කාර ස්කන්ධය නම් වේ. අතීත, අනාගත, වර්තමාන යන කාලත්‍රයෙහිවූ තමා කෙරෙහිවූ හෝ පිටත්හිවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ ලාමකවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ලඟවූ හෝ යම්කිසි විඥානයක් වේද, මේ විඥාන

ස්කන්ධය වේ. මහණ, මෙතෙකින් වනාහි ස්කන්ධයන්ට ස්කන්ධය යන නම වේයයි" වදාළේය.

**6.** "ස්වාමීනි, රූපස්කන්ධයාගේ පැනවීමට හෙතුව කවරේද? ප්‍රත්‍යය කවරේද? වෙදනා ස්කන්ධයාගේ පැනවීමට හෙතුව කවරේද? ප්‍රත්‍යය කවරේද? සංඥා ස්කන්ධයාගේ පැනවීමට හෙතුව කවරේද? ප්‍රත්‍යය කවරේද? සංස්කාර ස්කන්ධයාගේ පැනවීමට හෙතුව කවරේද? ප්‍රත්‍යය කවරේද? විඥාන ස්කන්ධයාගේ පැනවීමට හෙතුව කවරේද? ප්‍රත්‍යය කවරේදැයි" (ඇසූයේය.)

"මහණ, සතර මහාභූතයෝ වනාහි රූප ස්කන්ධයාගේ පැනවීමට හෙතු වේ. ප්‍රත්‍යය වේ. වෙදනා ස්කන්ධයාගේ පැනවීමට ස්පර්ශය හෙතු වේ. ස්පර්ශය ප්‍රත්‍යය වේ. සංඥා ස්කන්ධයාගේ පැනවීමට ස්පර්ශය හෙතු වේ. ස්පර්ශය ප්‍රත්‍යය වේ මහණ, විඥාන ස්කන්ධයාගේ පැනවීමට නාම රූපය වනාහි හෙතු වේ. නාම රූපය ප්‍රත්‍යය වේයයි" (වදාළේය.)

**7.** "ස්වාමීනි, කෙසේ නම් සත්කායදෘෂ්ටිය වේදැයි" ඇසීය.

"මහණ, මේ ලොකයෙහි ඇසූ පිරූ තැන් නැති ආය්‍ර්‍යයන් නොදක්නාවූ, ආය්‍ර්‍ය ධර්මයෙහි අදක්ෂවූ, ආය්‍ර්‍ය ධර්මයෙහි නොහික්මුනාවූ, සත්පුරුෂයන් නොදක්නාවූ, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂවූ, සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුනාවූ, පෘථග්ජනතෙම රූපය තමායයි හෝ දකියි. තමා රූපය ඇත්තෙකැයි කියා හෝ දකියි. තමා කෙරෙහි රූපය ඇත්තේයයි කියා හෝ දකියි. රූපයෙහි තමා ඇත්තේයයි කියා හෝ දකියි. වෙදනාව තමායයි කියා හෝ දකියි. තමා වෙදනාව ඇත්තෙකැයි කියා හෝ දකියි. තමා කෙරෙහි වෙදනාව ඇත්තේයයි කියා හෝ දකියි. වෙදනාව කෙරෙහි තමා ඇත්තේයයි කියා හෝ දකියි. සංඥාව තමායයි කියා හෝ තමා සංඥාව ඇත්තෙක කියා හෝ තමා කෙරෙහි සංඥාව ඇත්තේය කියා හෝ සංඥාව කෙරෙහි තමා ඇත්තේය කියා හෝ දකියි. සංස්කාරය තමායයි කියා හෝ දකියි. තමා සංස්කාර ඇත්තෙක කියා හෝ සංස්කාර

කෙරෙහි තමා ඇත්තේය කියා හෝ තමා කෙරෙහි සංස්කාර ඇත්තේය කියා හෝ දකියි. විඤ්ඤාණය තමා කියා හෝ දකියි. තමා විඤ්ඤාණය ඇත්තෙක කියා හෝ විඤ්ඤාණය කෙරෙහි තමා ඇත්තේය කියා හෝ තමා කෙරෙහි විඤ්ඤාණය ඇත්තේය කියා හෝ දකියි. මහණ, මෙසේ වනාහි සත්කායදෘෂ්ටිය වේයයි" වදාළේය.

8. "ස්වාමීනි, කෙසේ නම් සත්කායදෘෂ්ටිය නොවේද?"

"මහණ, මේ ශාසනයෙහි ආර්‍යයන් දක්නාවූ, ආර්‍ය ධර්මයෙහි දක්ෂවූ, ආර්‍ය ධර්මයෙහි මනාව හික්මුනාවූ සත්පුරුෂයන් දක්නාවූ, සත්පුරුෂ ධර්මයෙහි දක්ෂවූ, සත්පුරුෂ ධර්මයෙහි මනාව හික්මුනාවූ, බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්‍යශ්‍රාවක තෙම රූපය තමායයි නොදකියි. තමා රූපය ඇත්තෙකැයි කියා හෝ නොදකියි. තමා කෙරෙහි රූපය ඇත්තේයයි හෝ නොදකියි. රූපය කෙරෙහි තමා ඇත්තේයයි හෝ නොදකියි. වෙදනාව තමායයි නොදකියි. තමා වෙදනාව ඇත්තෙකැයි හෝ නොදකියි. තමා කෙරෙහි වෙදනාව ඇත්තේයයි හෝ නොදකියි. වෙදනාව කෙරෙහි තමා ඇත්තේයයි හෝ නොදකියි. සංඥාව තමායයි නොදකියි. තමා සංඥාව ඇත්තෙකැයි හෝ නොදකියි. තමා කෙරෙහි සංඥාව ඇත්තේයයි හෝ නොදකියි. සංඥාව කෙරෙහි තමා ඇත්තේයයි හෝ නොදකියි. සංස්කාරයන් තමායයි නොදකියි. තමා සංස්කාරයන් ඇත්තෙකැයි හෝ නොදකියි. තමා කෙරෙහි සංස්කාරයන් ඇත්තේයයි හෝ නොදකියි. සංස්කාරයන් කෙරෙහි තමා ඇත්තේයයි හෝ නොදකියි. විඥානය තමායයි නොදකියි. තමා විඤ්ඤාණය ඇත්තෙකැයි හෝ නොදකියි. තමා කෙරෙහි විඥානය ඇත්තේයයි හෝ නොදකියි. විඥානය කෙරෙහි තමා ඇත්තේයයි හෝ නොදකියි. මහණ, මෙසේ වනාහි සත්කායදෘෂ්ටිය නොවේයයි" වදාළේය.

9. "ස්වාමීනි, රූපයෙහි ආශ්වාදය (රසවිඳීම) කවරේද? ආදීනවය (දොෂය) කවරේද? නිස්සරණය (නික්මීම) කවරේද? වෙදනාවෙහි ආශ්වාදය කවරේද? ආදීනවය කවරේද?

නිස්සරණය කවරේද? සංඥාවෙහි ආශ්වාදය කවරේද? ආදීනවය කවරේද? නිස්සරණය කවරේද? සංස්කාරයන්හි ආශ්වාදය කවරේද? ආදීනවය කවරේද? නිස්සරණය කවරේද? විඥානයෙහි ආශ්වාදය කවරේද? ආදීනවය කවරේද? නිස්සරණය කවරේද? "මහණ, රූපය නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මේ රූපයෙහි ආශ්වාදය වේ. (රසවිඳීම වේ.) යම් රූපයක් අනිත්‍යද, දුක් ඇත්තේද, පෙරළෙන ස්වභාව ඇත්තේද, මේ රූපයෙහි ආදීනවය වේ. රූපයෙහි යම් ඇලීම නැති කිරීමෙක් ඇලීම දුරුකිරීමෙක් වේද, මේ රූපයෙහි නිස්සරණය වේ. මහණ, වෙදනාව නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මේ වේදනාවෙහි ආශ්වාදය වේ. (රස විඳගැන්ම වේ.) යම් වේදනාවක් අනිත්‍යද, දුක් ඇත්තේද, පෙරළෙන ස්වභාව ඇත්තේද, මේ වේදනාවෙහි ආදීනවය වේ. වේදනාවෙහි යම් ඡන්දරාගයෙන් ඇලීම නැතිකිරීමෙක්, ඡන්ද රාගය දුරුකිරීමෙක් වේද, මේ වේදනාවෙහි නිස්සරණය වේ. සංඥාව නිසා යම් සැපයක්, සොම්නසක් උපදීද, මේ සංඥාවෙහි යම් සැපයක් සොම්නසක් උපදීද, මේ සංඥාවෙහි ආශ්වාදය වේ. යම් සංඥාවක් අනිත්‍යද, දුක් ඇත්තේද, පෙරළෙන ස්වභාව ඇත්තේද, මේ සංඥාවෙහි ආදීනවය වේ. සංඥාවෙහි යම් ඡන්දරාගයෙන් ඇලීම නැතිකිරීමෙක් ඡන්ද රාගය දුරු කිරීමෙක් වේද, මේ සංඥාවෙහි නිස්සරණය වේ. සංස්කාරයන් නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මේ සංස්කාරයෙහි ආශ්වාදය වේ. යම් සංස්කාරයක් අනිත්‍යද, දුක් ඇත්තේද, පෙරළෙන ස්වභාව ඇත්තේද, මේ සංස්කාරයෙහි ආදීනවය වේ. සංස්කාරයෙහි යම් ඡන්දරාගයෙන් ඇලීම නැති කිරීමෙක්, ඡන්දරාගය දුරු කිරීමෙක් වේද, මේ සංස්කාරයෙහි නිස්සරණය වේ. විඥානය නිසා යම් සැපයක් සොම්නසක් උපදීද, මේ විඥානයෙහි ආශ්වාදය වේ. යම් විඥානයක් අනිත්‍යද, දුක් ඇත්තේද, පෙරළෙන ස්වභාව ඇත්තේද, මේ විඥානයෙහි ආදීනවයයි. විඥානයෙහි යම් ඇලීමක් නැතිකිරීමක් ඇලීම දුරු කිරීමක් වේද, මේ විඥානයෙහි නිශ්ශරණය වේයයි (වදාළේය)

10. "ස්වාමීනි, කෙසේ දන්නාවූ, කෙසේ දක්නාවූ පුද්ගලයාහට මේ විඥානය සහිත කයෙහි (ශරීරයෙහි) ද පිටත්හි සියලු අරමුණුවලද මමය, මාගේයයි ගන්නා මානානුසයයෝ නොවෙත්ද?"

"මහණ, අතීත, අනාගත, වර්තමාන යන කාලත්‍රයෙහිවූ අධ්‍යාත්මයෙහිවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ ලාමකවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ලඟවූ හෝ යම්කිසි රූපයක් වේද, මේ සියලු රූපය මාගේ නොවෙයි. මේ රූපය තෙම මම නොවෙමි. මේ රූපය මාගේ ආත්මය නොවේයයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දකීද, අතීත, අනාගත, වර්තමාන යන කාලත්‍රයෙහිවූ අද්ධ්‍යාත්මයෙහිවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ ලාමකවූ හෝ ප්‍රණීතවූ හෝ යම් දුරවූ හෝ ලඟවූ හෝ යම්කිසි වේදනාවක් වේද, මේ සියලු වේදනාව මාගේ නොවෙයි, මේ වේදනාවතෙම මම නොවෙමියි, මේ වේදනාව මාගේ ආත්මය නොවේයයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දකීද, අතීත, අනාගත, වර්තමාන යන කාලත්‍රයෙහිවූ අධ්‍යාත්මයෙහිවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ ලාමකවූ හෝ, ප්‍රණීතවූ හෝ යම් දුරවූ හෝ ලඟවූ හෝ යම්කිසි සංඥාවක් වේද, මේ සියලු සංඥාව මාගේ නොවෙයි, මේ සංඥාවතෙම මම නොවෙමියි, මේ සංඥාව මාගේ ආත්මය නොවේයයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දකීද, අතීත, අනාගත වර්තමාන යන කාලත්‍රයෙහිවූ අධ්‍යාත්මයෙහිවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ ලාමකවූ හෝ, ප්‍රණීතවූ හෝ යම් දුරවූ හෝ ලඟවූ හෝ යම්කිසි සංස්කාරයක් වෙත්ද, මේ සියලු සංස්කාරය මාගේ නොවෙයි, මේ සංස්කාරය තෙම මම නොවෙමියි, මේ සංස්කාරය මාගේ ආත්මය නොවේයයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දකීද, අතීත අනාගත වර්තමාන යන කාලත්‍රයෙහිවූ අධ්‍යාත්මයෙහිවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ ලාමකවූ හෝ ප්‍රණීතවූ හෝ යම් දුරවූ හෝ ලඟවූ හෝ යම්කිසි විඥානයක් වේද, මේ සියලු විඥානය මාගේ

නොවෙයි, මේ විඥානයතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මය නොවේයයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දකියිද මහණ, මෙසේ වනාහි දන්නහුගේ මෙසේ දක්නහුගේ මේ විඥානය සහිතවූ ශරීරයෙහිද, පිටත්හිවූ සියලු නිමිතිවලද, (අහංකාර මමංකාරයයි කියනලද) මමය මාගේයයි ගන්නාලද මානානුසයෝ නොවෙත්යයි" වදාළේය.

11. ඉක්බිති එක්තරා භික්ෂුවක්හට මෙබඳු සිත පිළිබඳ පරිවිතර්කයක් (කල්පනාවක්) පහළ විය. 'පින්වත, මෙසේ වනාහි රූපය අනාත්මයයි (තමා නොවෙයි) වේදනාවෝ අනාත්මයයි (තමා නොවෙත්) සංඥාවෝ අනාත්මයයි (තමා නොවෙත්) සංස්කාරයෝ අනාත්මයි, විඥානය අනාත්මයි, අනාත්මයෙහි සිට කරණ ලද කර්මයෝ කවර ආත්මයෙහි සිට විපාක දෙත්ද කියයි.

එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන් වහන්සේගේ සිත්හි උපන් අදහස සිතින් දැන භික්ෂූන්ට කථාකළ සේක. "මහණෙනි, මේ ශාසනයෙහි ඇතැම් හිස් පුරුෂයෙක් නොදන්නේ අවිද්‍යාවෙන් යුක්තවූයේ තෘෂ්ණාව අධිපතිකොට ඇත්තාවූ සිතින් ශාස්තෘ ශාසනය ඉක්මවා යා යුතුයයි හඟින්නේය, යන යමක් වේද, මේ කාරණය විද්‍යමාන වේමය. 'පින්වත මෙසේ වනාහි රූපය අනාත්මය, වේදනාවෝ අනාත්මය, සංඥාවෝ අනාත්මය, සංස්කාරයෝ අනාත්මය, විඥානය අනාත්මය අනාත්මයෙහි සිට කරණ ලද කර්මයෝ කවර ආත්මයෙක්හි සිට විපාක දෙන්නාහුද' කියායි. මහණෙනි, තෙපි මාගේ ධර්මය නිසා ඒ ඒ තන්හි ඒ ඒ ධර්මයන්හි හික්මුනාහුය. මහණෙනි, ඒ කුමකැයි හඟිව්ද? රූපය හෝ වේද, අනිත්‍යය හෝ වේද?" "ස්වාමීනි, අනිත්‍යය." "යමක් වනාහි අනිත්‍යද, ඒ දුක් හෝ වේද. සැප හෝ වේදැයි" "ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද දුකද, පෙරලෙන ස්වභාව ඇත්තේද, 'ඒ මගේය මෙතෙම මම වෙමියි. මෙතෙම මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?" "ස්වාමීනි, ඔය නුසුදුසුමැයි"

"මහණෙනි, ඒ කුමකැයි හඟිව්ද? වේදනාවෝ නිත්‍ය හෝ වෙත්ද? අනිත්‍ය හෝ වෙත්ද?"

"ස්වාමීනි, අනිත්‍යය,"

"යමක් වනාහි අනිත්‍යද, ඒ දුක් හෝ වේද? සැප හෝ වේද?"

"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද, පෙරළෙන ස්වභාව ඇත්තේද, මෙය මගේය. මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි එය කල්පනා කරන්නට සුදුසුද?"

"ස්වාමීනි, මෙය නුසුදුසුමය."

"මහණෙනි, ඒ කුමකැයි හඟිව්ද? සංඥාවෝ නිත්‍ය හෝ වෙත්ද? අනිත්‍ය හෝ වෙත්ද?"

"ස්වාමීනි අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද. ඒ දුක් හෝ වේද? සැප හෝ වේද?"

"ස්වාමීනි. දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුකද; පෙරළෙන ස්වභාව ඇත්තේද මෙය මගේය, මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි එය කල්පනා කරන්නට සුදුසුද?"

"ස්වාමීනි, මෙය, නුසුදුසුමය."

"මහණෙනි, ඒ කුමකැයි හඟීව්ද? සංස්කාරයෝ නිත්‍ය හෝ වෙත්ද? අනිත්‍ය හෝ වෙත්ද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද, ඒ දුක් හෝ වේද? සැප හෝ වේද?"

"ස්වාමීනි, දුක්ය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"යමක් වනාහි අනිත්‍යද දුකද, පෙරළෙන ස්වභාව ඇත්තේද, මෙය මගේය. මෙතෙම මම වෙමි. මෙතෙම මාගේ ආත්මයයි එය කල්පනා කරන්නට සුදුසුද?"

"ස්වාමීනි, මෙය නුසුදුසුමය."

"මහණෙනි, ඒ කුමකැයි හඟිව්ද? විඥානය නිත්‍ය හෝ අනිත්‍යය හෝ වේද?"

"ස්වාමීනි, අනිත්‍යය."

"යමක් වනාහි අනිත්‍යද. ඒ දුක් හෝ සැප හෝ වේද?"

"ස්වාමීනි, දුක්ය."

"යමක් වනාහි අනිත්‍යද, දුක්ද. පෙරළෙන ස්වභාව ඇත්තේද ඒ මාගේය, මෙතෙම මම වෙමි. මෙය මාගේ ආත්මයයි දැකීමට සුදුසුද?" "ස්වාමීනි, සුදුසු නොවේමැයි."

12. "මහණෙනි, එහෙයින් මේ ලොකයෙහි අතීත අනාගත වර්තමාන යන කාලත්‍රයෙහිවූ අධ්‍යාත්මයෙහිවූ හෝ (තමා කෙරෙහිවූ හෝ) පිටත්හිවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ හීනවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ලඟවූ හෝ යම් කිසි රූපයක් වේද, මේ සියලු රූපය මාගේ නොවෙයි. මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මය නොවේ යයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දැක්ක යුතුයි. අතීත, අනාගත වර්තමාන, යන කාලත්‍රයෙහිවූ අද්ධ්‍යාත්මයෙහිවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ ලාමකවූ හෝ ප්‍රණීතවූ හෝ යම් දුරවූ හෝ ලඟවූ හෝ යම්කිසි වේදනාවක් වේද, මේ සියලු වේදනාව මාගේ නොවෙයි. මේ වේදනාව තෙම මම නොවෙමියි, මේ වේදනාව මාගේ ආත්මය නොවේයයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දකීද, අතීත, අනාගත, වර්තමාන යන කාලත්‍රයෙහිවූ අද්ධ්‍යාත්මයෙහිවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ ලාමකවූ හෝ ප්‍රණීතවූ හෝ යම් දුරවූ හෝ ලඟවූ හෝ යම්කිසි සංඥාවක් වේද මේ සියලු සංඥාව මාගේ නොවෙයි. මේ සංඥාව තෙම මම නොවෙමියි, මේ සංඥාව

මාගේ ආත්මය නොවේ යයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දකීද, අතීත, අනාගත, වර්තමාන යනා කාලත්‍රයෙහිවූ අද්ධ්‍යාත්මයෙහිවූ හෝ බාහිරවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ ලාමකවූ හෝ ප්‍රණීතවූ හෝ යම් දුරවූ හෝ ලඟවූ හෝ යම්කිසි සංස්කාර කෙනෙක් වෙත්ද මේ සියලු සංස්කාරය මාගේ නොවෙයි, මේ සංස්කාරය තෙම මම නොවෙමියි, මේ සංස්කාරය මාගේ ආත්මය නොවේයයි මෙසේ මෙය තත්වූ පරිද්දෙන් මනා නුවණින් දකීද, අතීතානාගත වර්තමාන යන කාලත්‍රයෙහිවූ තමා කෙරෙහිවූ හෝ පිටත්හිවූ හෝ මහත්වූ හෝ සියුම්වූ හෝ ලාමකවූ හෝ ප්‍රණීතවූ හෝ දුරවූ හෝ ලඟවූ හෝ යම්කිසි විඥානයක්වේද, මේ සියලු විඥානය මාගේ නොවෙයි. මෙතෙම මම නොවෙමි. මෙතෙම මාගේ ආත්මය නොවේයයි, මෙසේ මෙය තත්වූ පරිද්දෙන් යහපත් ප්‍රඥාවෙන් දැක්ක යුතුයි.

13, "මහණෙනි, මෙසේ දක්නාවූ බොහෝ ඇසූ පිරූ තැන් ඇති ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම රූපයෙහි කලකිරෙයි. වෙදනාවෙහි කලකිරෙයි. සංඥාවෙහි කලකිරෙයි. සංස්කාරයන්හි කලකිරෙයි. විඥානයෙහි කලකිරෙයි. කලකිරෙමින් නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේයයි දැනීමවේ. ජාතිය ක්ෂය කරණ ලද්දීය. බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලද්දේය. සතර මගින් කටයුතු දෙය කරණ ලද්දේය මේ ආත්මභාවය පිණිස අනිකක් නැතැයි දැන ගනීයයි" වදාළේය.

14. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තාහුය. මේ දෙශනාව දෙශනාකරණ කල්හි සැටක් පමණවූ භික්ෂූන්ගේ චිත්තයෝ උපාදාන රහිතව ආශ්‍රවයන්ගෙන් මිදුනාහුයි.

**නවවැනිවූ මහාපුණ්ණමා සූත්‍රය නිමි. (1-9)**

---

## 10. චූල පුණ්ණමා සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහි මිගාරමාතුපාසාද නම්වූ පූර්වාරාමයෙහි වාසය කරණසේක. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ එදවස්හිවූ පොහොය ඇති පසළොස්වක්හි පිරුණාවූ සඳ ඇති රාත්‍රියෙහි භික්ෂුසංඝයා විසින් පිරිවරණ ලද්දේ හිස්වූ එළිමහණෙහි වැඩහුන්නේ වෙයි. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දවූ භික්ෂු සංඝයා දෙස බලා භික්ෂූන්ට කථාකළ සේක.

"මහණෙනි, අසත්පුරුෂතෙම මේ පින්වත් තෙමේ අසත්පුරුෂයායයි, අසත්පුරුෂයා දන්නේදැයි?" ඇසූහ.

"ස්වාමීනි, මෙය නොවේමැයි."

2. "මහණෙනි යහපත, මහණෙනි, අසත්පුරුෂතෙම මේ පින්වත්තෙම අසත්පුරුෂායයි, අසත්පුරුෂයා දැන ගන්නේය, යන යමක් ඇද්ද? මීට කරුණු නැත්තේය. අවකාශයක් නැත්තේය. මහණෙනි, අසත්පුරුෂතෙම මේ පින්වතා සත්පුරුෂයෙකැයි, සත්පුරුෂයා දැනගන්නේද?"

"ස්වාමීනි, මෙය නොවේමැයි."

"මහණෙනි, මැනව. මහණෙනි, අසත්පුරුෂතෙම මේ පින්වතා සත්පුරුෂයෙකැයි සත්පුරුෂයා දැනගන්නේය යන යමක් ඇද්ද, මෙයටද කරුණු නැත්තේය. අවකාශ නැත්තේය. මහණෙනි, අසත්පුරුෂතෙම පාපි ධර්මයන්ගෙන් යුක්තවූයේ වෙයි. අසත්පුරුෂයන් සේවනය කරන්නේ වෙයි. අසත්පුරුෂ සිතිවිලි සිතන්නේ වෙයි. අසත්පුරුෂ කථා ඇත්තේ වෙයි. අසත්පුරුෂ වචන ඇත්තේ වෙයි. අසත්පුරුෂ කර්මාන්ත ඇත්තේ වෙයි. අසත්පුරුෂ දෘෂ්ටි ඇත්තේ වෙයි. අසත්පුරුෂයන් විසින් දියයුතු දානය දෙයි.

3. "මහණෙනි, කෙසේනම්, අසත්පුරුෂතෙම පාප ධර්මයන්ගෙන් යුක්තවූයේ වේද, මහණෙනි, මේ ලොකයෙහි

අසත්පුරුෂතෙම ශ්‍රද්ධාව නැත්තේ වෙයි. පවට ලජ්ජා නැත්තේ වෙයි. පවට භය නැත්තේ වෙයි. ඇසූ පිරූ තැන් නැත්තේ වෙයි. කුසීත වෙයි, මුලා සිහි ඇත්තේ වෙයි, ප්‍රඥාව නැත්තේ වෙයි. මහණෙනි, මෙසේ වනාහි අසත්පුරුෂ තෙම පාපධර්මයන්ගෙන් යුක්තවූයේ වෙයි.

4. "මහණෙනි, කෙසේ නම් අසත්පුරුෂතෙම, අසත්පුරුෂයන් සේවනය කරන්නේ වේද, මහණෙනි, මේ ලොකයෙහි යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ශ්‍රද්ධාව නැත්තාහු පවට ලජ්ජා නැත්තාහු, පවට භය නැත්තාහු, අල්පශ්‍රැතවූවාහු කුසීතවූවාහු, මුලා සිහි ඇත්තාහු, ප්‍රඥා නැත්තාහු වෙත්ද, ඔව්හු මොහුගේ මිත්‍රයෝ වෙත්. ඔව්හු යහලුවෝ වෙත්. මහණෙනි, මෙසේ වනාහි අසත්පුරුෂතෙම අසත්පුරුෂයන් සේවනය කරන්නේ වෙයි.

5. "මහණෙනි, කෙසේ නම්, අසත්පුරුෂ තෙම අසත්පුරුෂ සිතිවිලි ඇත්තේ වේද, මහණෙනි, මේ ලොකයෙහි අසත්පුරුෂ තෙම තමහට දුක් පිණිසද සිතයි. අනුන්හට දුක් පිණිසද සිතයි. තමන්ටත් අනුන්ටත් දුක් පිණිසද සිතයි. මහණෙනි, මෙසේ වනාහි අසත්පුරුෂ තෙම අසත්පුරුෂ සිතිවිලි ඇත්තේ වෙයි.

6. "මහණෙනි, කෙසේ නම් අසත්පුරුෂ තෙම අසත් පුරුෂ කථා ඇත්තේ වේද, මහණෙනි, මේ ලොකයෙහි අසත් පුරුෂ තෙම තමහට දුක් පිණිසද කථා කරයි. අනුන්හට දුක් පිණිසද කථා කරයි. තමන්ට හා අනුන්ට දුක් පිණිසද කථා කරයි. මහණෙනි, මෙසේ වනාහි අසත්පුරුෂ තෙම අසත්පුරුෂ කථා ඇත්තේ වෙයි.

7. "මහණෙනි, කෙසේ නම් අසත්පුරුෂ තෙම අසත්පුරුෂ වචන ඇත්තේ වේද, මහණෙනි, මේ ලොකයෙහි අසත්පුරුෂ තෙම බොරු කියන්නේ වෙයි. කේලාම් කියන්නේ වෙයි. ඵරුෂ වචන කියන්නේ වෙයි. ප්‍රලාප කියන්නේ වෙයි. මහණෙනි, මෙසේ වනාහි අසත්පුරුෂ තෙම අසත්පුරුෂ වචන ඇත්තේ වෙයි.

8. "මහණෙනි, කෙසේ නම් අසත්පුරුෂ තෙම අසත්පුරුෂ කර්මාන්ත ඇත්තේ වේද, මහණෙනි, මේ ලොකයෙහි අසත්පුරුෂ තෙම සතුන් මරන්නේ වෙයි. සොරකම් කරන්නේ වෙයි. කාමයන්හි වරදවා හැසිරෙන්නේ වෙයි. මහණෙනි, මෙසේ වනාහි අසත්පුරුෂ තෙම අසත්පුරුෂ කර්මාන්ත ඇත්තේ වෙයි.

9. "මහණෙනි, කෙසේ නම් අසත්පුරුෂ තෙම අසත්පුරුෂ දෘෂ්ටි ඇත්තේ වේද, මහණෙනි, මේ ලොකයෙහි අසත්පුරුෂ තෙම මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි. 'දුන් දානයෙහි විපාක නැත. රැකි ශීලයෙහි විපාක නැත. කළ පූජාවෙහි විපාක නැත. යහපත්ව කරන ලද අයහපත්ව කරන ලද කර්මයන්ගේ ඵලයක් විපාකයක් නැත්තේය. මෙලොවක් නැත. පරලොවක් නැත. මවට කරන ලද හොඳ නරකවල විපාක නැත. පියාට කරන ලද හොඳ නරකවල විපාක නැත. මැරී පරලොව උපදින සත්වයන් නැත. යමෙක් තුමූ මෙලොව ද, පරලොවද, තෙමේ විශිෂ්ටඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත්ද, එබඳු වූ යහපත් බවට පැමිණියාවූ මනාව පිළිපන්නා වූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ලොකයෙහි නැත' යන දෘෂ්ටි ඇත්තේ වෙයි. මහණෙනි, මෙසේ වනාහි අසත්පුරුෂ තෙම අසත්පුරුෂ දෘෂ්ටි ඇත්තේ වෙයි.

10. "මහණෙනි, කෙසේ නම් අසත්පුරුෂ තෙම අසත්පුරුෂ දානය දේද? මහණෙනි, මේ ලොකයෙහි අසත්පුරුෂ තෙම සකස් නොකොට දානය දෙයි. සිය අතින් දානය නො දෙයි. සිතින් ආදර නොකොට දානය දෙයි. දමා ගැසූ දෙයක් මෙන් දානය දෙයි. මතු අනුසස් නො දක්නේ දානය දෙයි. මහණෙනි, මෙසේ වනාහි අසත්පුරුෂ තෙම අසත්පුරුෂ දානය දෙයි.

11. "මහණෙනි, ඒ මේ අසත්පුරුෂ තෙම වනාහි මෙසේ පාපධර්මයන්ගෙන් යුක්තවූයේ මෙසේ අසත්පුරුෂ සේවනය ඇත්තේ මෙසේ අසත්පුරුෂ සිතිවිලි ඇත්තේ මෙසේ අසත්පුරුෂ කථා ඇත්තේ, මෙසේ අසත්පුරුෂ වචන ඇත්තේ මෙසේ අසත්පුරුෂ කර්මාන්ත ඇත්තේ මෙසේ අසත්පුරුෂ දෘෂ්ටි ඇත්තේ, මෙසේ අසත්පුරුෂ දානාදී ශරීරයාගේ භේදයෙන් මරණින් මතු අසත්පුරුෂයන්ගේ යම් ගතියක් වේද, එහි උපදියි.

මහණෙනි, අසත්පුරුෂයන් ගේ ගතිය කවරීද? නරකය හෝ තිරිසන් යෝනිය හෝ වේ.

12. "මහණෙනි, සත්පුරුෂ තෙම මේ පින්වතා සත්පුරුෂයෙකැයි, සත්පුරුෂයා දැන ගන්නේද? "ස්වාමීනි, එසේය."

"මහණෙනි, යහපත. මහණෙනි, සත්පුරුෂ තෙම මේ පින්වතා සත් පුරුෂයෙකැයි සත් පුරුෂයා දැන ගන්නේය යන යමක් වේද, ඊට කරුණු ඇත්තේය.

"මහණෙනි, සත්පුරුෂ තෙම මේ පින්වතා අසත්පුරුෂයෙකැයි අසත්පුරුෂයා දැනගන්නේද?" "එසේය ස්වාමීනි"

"මහණෙනි, යහපත. මහණෙනි, සත්පුරුෂ තෙම මේ පින්වතා අසත්පුරුෂයෙකැයි අසත්පුරුෂයා දැනගන්නේය යන යමක් වේද, ඊටද කරුණු ඇත්තේය.

13. "මහණෙනි, සත්පුරුෂතෙම කුසල ධර්මයන්ගෙන් යුක්තවූයේ වෙයි. සත්පුරුෂයන් සේවනය ඇත්තේ වෙයි. සත්පුරුෂ සිතිවිලි ඇත්තේ වෙයි. සත්පුරුෂ කථා ඇත්තේ වෙයි. සත්පුරුෂ වචන ඇත්තේ වෙයි. සත්පුරුෂ කර්මාන්ත ඇත්තේ වෙයි. සත්පුරුෂ දෘෂ්ටි ඇත්තේ වෙයි. සත්පුරුෂ දාන දෙන්නේ වෙයි.

14. "මහණෙනි, කෙසේ නම් සත්පුරුෂතෙම කුශල ධර්මයන්ගෙන් යුක්තවූයේ වේද, මහණෙනි, මේ ලොකයෙහි සත්පුරුෂතෙම ශ්‍රද්ධාව ඇත්තේ වෙයි. පවට ලජ්ජා ඇත්තේ වෙයි. පවට බිය ඇත්තේ වෙයි. බහුශ්‍රැත වෙයි. පටන් ගන්නාලද වීර්‍ය්‍යය ඇත්තේ වෙයි. එළඹසිටි සිහි ඇත්තේ වෙයි. ප්‍රඥා ඇත්තේ වෙයි. මහණෙනි, මෙසේ වනාහි සත් පුරුෂතෙම කුශල ධර්මයන්ගෙන් යුක්තවූයේ වෙයි.

15. "මහණෙනි, කෙසේ නම් සත්පුරුෂතෙම සත්පුරුෂයන් සේවනය ඇත්තේ වේද? මහණෙනි, මේ ලොකයෙහි යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ශ්‍රද්ධාව ඇත්තාහු, පවට ලජ්ජා ඇත්තාහු,

පවට භය ඇත්තාහු, බහුශ්‍රැත වූවාහු, පටන්ගන්නා ලද වීර්‍ය්‍ය ඇත්තාහු, එළඹසිටි සිහි ඇත්තාහු, ප්‍රඥාව ඇත්තාහු වෙත්ද, ඔව්හු ඔහුගේ මිත්‍රයෝ වෙත්. ඔව්හු යහලුවෝ වෙත්. මහණෙනි, මෙසේ වනාහි සත්පුරුෂතෙම සත්පුරුෂ සේවනය ඇත්තේ වෙයි.

16. "මහණෙනි, කෙසේ නම් සත්පුරුෂතෙම සත්පුරුෂ සිතිවිලි ඇත්තේ වේද? මහණෙනි, මේ ලොකයෙහි සත්පුරුෂ තෙම තමහට දුක් පිණිස නොසිතයි. අන්‍යයන්හට දුක් පිණිස නොසිතයි. තමන්ටත් අනුන්ටත් දුක් පිණිස නොසිතයි. මහණෙනි, මෙසේ වනාහි සත්පුරුෂ තෙම සත්පුරුෂ සිතිවිලි ඇත්තේ වෙයි.

17. "මහණෙනි, කෙසේ නම් සත්පුරුෂතෙම සත්පුරුෂ කථා ඇත්තේ වේද? මහණෙනි, මේ ලොකයෙහි සත්පුරුෂ තෙම තමහට දුක් පිණිස කථා නොකරයි. අන්‍යයාහට දුක් පිණිස කථා නොකරයි. තමහට හා අනුන්ට දුක් පිණිස කථා නොකරයි. මහණෙනි, මෙසේ වනාහි සත්පුරුෂ තෙම සත්පුරුෂ කථා ඇත්තේ වෙයි.

18. "මහණෙනි, කෙසේ නම් සත්පුරුෂතෙම සත්පුරුෂ වචන ඇත්තේ වේද? මහණෙනි, මේ ලොකයෙහි සත්පුරුෂ තෙම බොරු කීමෙන් වැළකුනේ වෙයි. කේලාම් කීමෙන් වැළකුනේ වෙයි. රළු වචන කීමෙන් වැළකුනේ වෙයි. ප්‍රලාප කීමෙන් වැළකුනේ වෙයි. මහණෙනි, මෙසේ වනාහි සත්පුරුෂ තෙම සත්පුරුෂ වචන ඇත්තේ වෙයි.

19. "මහණෙනි, කෙසේ නම් සත්පුරුෂතෙම සත්පුරුෂ කර්මාන්ත ඇත්තේ වේද? මහණෙනි, මේ ලොකයෙහි සත්පුරුෂතෙම සතුන් මැරීමෙන් වැළකුනේ වෙයි. සොරකම් කිරීමෙන් වැළකුනේ වෙයි. කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුනේ වෙයි. මහණෙනි, මෙසේ වනාහි සත්පුරුෂ තෙම සත්පුරුෂ කර්මාන්ත ඇත්තේ වෙයි.

20. "මහණෙනි, කෙසේ නම් සත්පුරුෂතෙම සත්පුරුෂ දෘෂ්ටි ඇත්තේ වේද? මහණෙනි, මේ ලොකයෙහි සත්පුරුෂ

තෙම මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි. දුන් දෙයෙහි විපාක ඇත්තේය. රැකී සිල්හි විපාක ඇත්තේය. කළ පූජායෙහි විපාක ඇත්තේය. කරනලද හොඳ කරන කර්මයන්හි ඵල විපාක ඇත්තේය. මෙලොව ඇත. පරලොව ඇත. මවට කළ හොඳ නරක දෙකෙහි, පියාට කළ හොඳ නරක දෙකෙහි විපාක ඇත. පරලොව උපදින සත්වයෝ ඇත. යම් කෙනෙක් මේ ලොකයද පරලොකයද තෙමේ විශිෂ්ට ඥානයෙන් (මනා නුවණින්) දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත්ද? එබඳුවූ යහපත් බවට පැමිණියාවූ, මනාව පිළිපන්නාවූ මහණ බමුණෝ ලොකයෙහි ඇත්තාහයි ගනියි. මහණෙනි, මෙසේ වනාහි සත්පුරුෂතෙම සත්පුරුෂ දෘෂ්ටි ඇත්තේ වෙයි.

21. "මහණෙනි, කෙසේ නම් සත්පුරුෂතෙම සත්පුරුෂ දාන දේද? මහණෙනි, මේ ලොකයෙහි සත්පුරුෂතෙම සකස් කොට දන් දෙයි. සියතින් දන් දෙයි. සිතින් ආදරකොට දන් දෙයි. පිරිසිදුව දන් දෙයි. විපාක සලකමින් දානය දෙයි. මහණෙනි, මෙසේ වනාහි සත්පුරුෂ තෙම සත්පුරුෂ දාන දෙයි.

22. "මහණෙනි, ඒ මේ සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ කුසල ධර්මයන්ගෙන් යුක්තවූයේ මෙසේ සත්පුරුෂ සේවනය ඇත්තේ, මෙසේ සත්පුරුෂ සිතිවිලි ඇත්තේ, මෙසේ සත්පුරුෂ කථා ඇත්තේ, මෙසේ සත්පුරුෂ වචන ඇත්තේ, මෙසේ සත්පුරුෂ කර්මාන්ත ඇත්තේ, මෙසේ සත්පුරුෂ දෘෂ්ටි ඇත්තේ, මෙසේ සත්පුරුෂ දන් දී, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සත්පුරුෂයන්ගේ යම් ගතියෙක් වේද, එහි උපදියි. මහණෙනි, සත්පුරුෂයන්ගේ ගතිය කවරීද? උසස් දෙවියන් බවට හෝ උසස් මනුෂ්‍යයන් බවට හෝ පැමිණෙන්නේයයි" වදාළේය.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තාහුය.

**දසවැනි චූලපුණ්ණම සූත්‍රය නිමි.**

---

(දේවදහ සූත්‍රය, පඤ්චත්තය සූත්‍රය, කින්ති සූත්‍රය, සාමගාම සූත්‍රය, සුනක්ඛත්ත සූත්‍රය, ආනෙඤ්ජ සප්පාය සූත්‍රය, ගණක මොග්ගල්ලාන සූත්‍රය, ගොපක සූත්‍රය, මහාපුණ්ණමා සූත්‍රය, චූලපුණ්ණම සූත්‍රය යන සූත්‍ර දසයවූ

පළමුවන දෙවදහ වර්ගයයි.

---

## 11. අනුපද සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජෙත නම් රජකුමරහුගේ උයනෙහි අනේපිඬු සිටුතුමා විසින් කරවනලද ආරාමයෙහි (ජේතවනාරාමයෙහි) වැඩ වසන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' කියා භික්ෂූන්ට කථාකළසේක. ඒ භික්ෂූහු 'ස්වාමීනි,'යි භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, ශාරීපුත්‍ර තෙමේ (ධාතු-ආයතන-පටිච්චසමුප්පාද-ඨානාඨාන යන මේ සතර කරුණෙහි දක්ෂ බැවින්) පණ්ඩිතයෙක මහණෙනි, ශාරීපුත්‍ර තෙමේ (මහත්වූ සීල ස්කන්ධාදිය පිරිසිඳ දන්නා බැවින්) මහත් නුවණ ඇත්තෙක. මහණෙනි, ශාරිපුත්‍ර තෙමේ වෙන් වෙන්වූ ස්කන්ධාදිය දන්නා නුවණ ඇත්තෙකි. මහණෙනි, ශාරිපුත්‍ර තෙමේ බොහෝ සතුටින් ශීලාදිය සම්පූර්ණ කරන නුවණ ඇත්තෙකි. මහණෙනි, ශාරිපුත්‍ර තෙමේ වහා අවබොධ කරන නුවණ ඇත්තෙකි. මහණෙනි, ශාරිපුත්‍ර තෙමේ වහා කෙලෙසුන් සිඳදමන ප්‍රඥාව ඇත්තෙකි. මහණෙනි, ශාරීපුත්‍ර තෙමේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීම් බහුල ප්‍රඥාව ඇත්තෙකි.

"මහණෙනි, ශාරිපුත්‍ර තෙමේ අඩමසක් මුළුල්ලෙහි (සමාපත්ති වශයෙන්ද ධ්‍යානාංග වශයෙන්ද) අනුපිළිවෙළින් ධර්මයන් ත්‍රිලක්ෂණයට නගා බැලීය. මහණෙනි, ශාරිපුත්‍රයන්ගේ ඒ අනුපිළිවෙළින් ධර්මයන් බැලීම මේ ආකාරයෙන් වෙයි.

3 "මහණෙනි, ශාරීපුත්‍ර තෙමේ කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිසුඛය ඇති පළමුවෙනි ධ්‍යානයට පැමිණ වෙසෙයි. ඒ ප්‍රථම ධ්‍යානයෙහි විතර්කය, විචාරය, ප්‍රීතිය, සුඛය, එකාග්‍රතාය, ස්පර්ශය, වෙදනාය, සංඥාය, චෙතනාය, චිත්තය, ඡන්දය, අධිමොක්ෂය වීර්‍ය්‍යය, ස්මෘතිය, උපෙක්ෂාය, මනසිකාරය යන යම් ධර්ම කෙණෙක් වෙද්ද; ඒ ධර්මයෝ ඔහු විසින් පිළිවෙළින් පිරිසිඳ දැනගන්නා ලද්දාහුය. ඒ ධර්මයෝ ප්‍රකටවම උපදිත්. ප්‍රකටවම පවතිත්. ප්‍රකටවම නිරුද්ධ වෙති.

4. "හෙතෙම මෙසේ දැනගනී. මේ ධර්මයෝ වනාහි මෙසේ (පළමු) නොපැවත (අලුතෙන්) ඇතිවෙත්. ඇතිවී නැතිවෙත් කියායි.

"හෙතෙම ඒ ධර්මයන් කෙරෙහි රාග වශයෙන් නොපැමිණෙන්නේ (ද්වෙෂ වශයෙන්) ඉවත් නොවන්නේ, (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) නොඇලෙන්නේ, (ඡන්ද රාගයෙන්) නොබැඳුනේ, (කාම රාගයෙන්) මිදුනේ, (සියලු කෙලෙසුන් ගෙන්) වෙන් වූයේ, (කෙලෙස් වශයෙන් හෝ අරමුණු වශයෙන් හෝ) සීමාවක් නොකරනලද සිතින් යුක්තව වෙසේ. හෙතෙම මෙයට වඩා උසස් අනතුරුව පැමිණෙන අධිගම ඇතැයි දැනගනී. ඒ දැනුම බහුල වශයෙන් කිරීමෙන් ඒ විශෙෂ අධිගමය ඇත්තේයයි ඔහුට දැඩිව අදහස් වේ.

5. "තවද මහණෙනි, ශාරිපුත්‍ර තෙමේ විතක්ක විචාරයන්ගේ සන්සිඳීමෙන් සිතේ පැහැදීම ඇත්තාවූ, සිතේ එකඟ බව ඇත්තාවූ, විතර්ක විචාර නැත්තාවූ, සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වෙසේ.

"ඒ ද්විතීය ධ්‍යානයෙහි සිතේ පැහැදීමය, ප්‍රීතියය, සුඛයය, සිතෙහි එකඟ බවය, ස්පර්ශය, වේදනාවය, සංඥාවය, චෙතනාය, චිත්තය, ඡන්දය, අධිමොක්ෂය, වීර්‍ය්‍යය, ස්මෘතිය, උපෙක්ෂාවය, මනසිකාරය යන යම් ධර්ම කෙනෙක් වෙද්ද, ඒ ධර්මයෝ ඔහු විසින් අනුපිළිවෙළින් පිරිසිඳ දැනගන්නා ලද්දාහුය. ඒ ධර්මයෝ

ඔහුට ප්‍රකටව උපදිත්. ප්‍රකටව පවතිත්. ප්‍රකටව නිරුද්ධ වෙති. හෙතෙම මෙසේ දැනගනී. 'මේ ධර්මයෝ වනාහි මෙසේ (පළමු) ඇති නොවී (අලුතෙන්) ඇතිවෙත්. ඇතිවී නැතිවෙත්' කියායි.

6. "හෙතෙම ඒ ධර්මයන් කෙරෙහි (රාග වශයෙන්) ගෙන නොපැමිණෙන්නේ, (ද්වෙෂ වශයෙන්) ඉවත් නොවන්නේ, (තෘෂ්ණා, දෘෂ්ටි වශයෙන්) නොඇලෙන්නේ, (ඡන්ද රාගයෙන්) නොබැඳුනේ, (කාම රාගයෙන්) මිදුනේ, (සියළු කෙලෙසුන්ගෙන්) වෙන් වූයේ, (කෙලෙස් වශයෙන් හෝ අරමුණු වශයෙන් හෝ) සීමාවක් නොකරනලද සිතින් යුක්තව වෙසේ. හෙතෙම මෙයට වඩා උසස් අනතුරුව පැමිණෙන විශෙෂාධිගමයක් ඇතැයි දැනගනී. ඒ දැනුම බහුල වශයෙන් කිරීමෙන් ඒ විශෙෂාධිගම ඇත්තේමය යන සිත ඔහුට දැඩිව ඇති වෙයි

"තවද මහණෙනි, ශාරීපුත්‍ර තෙම ප්‍රීතියෙනුදු වෙන් වීමෙන් උපෙක්ෂා සහිත වූයේ වෙසෙයි. සිහි ඇත්තේ යහපත් ප්‍රඥාවෙන් යුක්තවූයේ ඒ සැපය කයින්ද විඳී. ආර්‍ය්‍යයෝ යම් ධ්‍යානයක් උපෙක්ෂා සහිතවූ සිහියෙන් යුත් සැප විහරණයයි කියත්ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වෙසේ.

'ඒ තෘතීය ධ්‍යානයෙහිවූ සුඛය, සතිය, ප්‍රඥාවය, සිතේ එකඟ බවය, ස්පර්ශය, වේදනාවය, සංඥාවය, චෙතනාවය, චිත්තය, ඡන්දය, අධිමොක්ෂය, වීර්‍ය්‍යය, සතිය, උපෙක්ෂාවය, මනසිකාරය යන යම් ධර්මකෙනෙක් වෙද්ද, ඒ ධර්මයෝ ඔහු විසින් පිළිවෙළින් පිරිසිඳ දැනගන්නා ලද්දාහුය. ඒ ධර්මයෝ ඔහුට ප්‍රකටව උපදිත්. ප්‍රකටව පවතිත්. ප්‍රකටව නිරුද්ධ වෙත්. හෙතෙම මෙසේ දැනගනී. 'මේ ධර්මයෝ වනාහි මෙසේ (පළමු) ඇති නොවී, (අළුතෙන්) ඇතිවෙත්ය. ඇතිවී නැතිවෙත්ය.' කියායි.

7. "හෙතෙම ඒ ධර්මයන් කෙරෙහි (රාග වශයෙන්) නොපැමිණෙන්නේ, (ද්වෙෂ වශයෙන්) ඉවත් නොවන්නේ, (තෘෂ්ණා, දෘෂ්ටි වශයෙන්) නොඇලෙන්නේ, (ඡන්ද රාගයෙන්) නොබැඳුනේ, (කාම රාගයෙන්) මිදුනේ, සියලු කෙලෙසුන් ගෙන් වෙන් වූයේ, (කෙලෙස් වශයෙන් හෝ අරමුණු වශයෙන් හෝ)

සීමාවක් නොකරනලද සිතින් යුක්තව වෙසේ. හෙතෙම මීට වඩා උසස් අනතුරුව පැමිණෙන විශෙෂාධිගම ඇතැයි දැනගනී. ඒ දැනුම බහුල වශයෙන් කිරීමෙන් අනතුරුව පැමිණෙන විශෙෂාධිගම ඇත්තේමයයි ඔහුට දැඩිව අදහස් වේ.

8. "තවද මහණෙනි, ශාරිපුත්‍ර තෙමේ සුඛයද පහකිරීමෙන්, දුඃඛයද පහකිරීමෙන්, සොම්නස් දොම්නස් දෙදෙනාගේ පළමුකොටම නැති කිරීමෙන්, දුක්ද නොවූ සැපද නොවූ උපෙක්ෂාවෙන් යුත් සිහියෙන් පිරිසිදුවූ චතුර්ථ ධ්‍යානයට පැමිණ වෙසෙයි. ඒ චතුර්ථ ධ්‍යානයෙහි උපෙක්ෂාවයයි කියන ලද දුක්ද නොවූ සුවද නොවූ වේදනාවය. සිතේ පැහැදීම ඇති හෙයින් සිතින් තෘතීය ධ්‍යානයෙහිවූ සැපය මෙනෙහි නොකරන බවද, ස්පර්ශයද, වෙදනාවද, සංඥාවද, චෙතනාවද, චිත්තයද, ඡන්දයද, අධිමොක්ෂයද, වීය්‍ය්‍යයද, ස්මෘතියද, උපෙක්ෂාවද, මනසිකාරයද යන යම් ධර්මකෙනෙක් වෙත්ද, ඒ ධර්මයෝ ඔහු විසින් පිළිවෙළින් පිරිසිඳ දැනගන්නා ලද්දාහුය. ඒ ධර්මයෝ ඔහුට ප්‍රකටව උපදිත්. ප්‍රකටව පවතිත්. ප්‍රකටව නිරුද්ධ වෙත්. හෙතෙම මෙසේ දැනගනී. 'මේ ධර්මයෝ වනාහි මෙසේ (පළමු) ඇති නොවී (අළුතෙන්) ඇති වෙති. ඇතිවී නැති වෙති.' කියායි.

9. "හෙතෙම ඒ ධර්මයන් කෙරෙහි (රාග වශයෙන්) නොපැමිණෙන්නේ, (ද්වෙෂ වශයෙන්) ඉවත් නොවන්නේ, (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) නොඇලෙන්නේ, (ඡන්ද රාගයෙන්) නොබැඳුනේ, (කාම රාගයෙන්) මිදුනේ, (සියලු කෙලෙසුන්ගෙන්) වෙන් වූයේ, (කෙලෙස් වශයෙන් හෝ අරමුණු වශයෙන් හෝ) සීමාවක් නොකරනලද සිතින් යුක්තව වෙසේ. හෙතෙම මීට වඩා උසස් අනතුරුව පැමිණෙන විශෙෂාධිගමයක් ඇතැයි දැනගනී. ඒ දැනීම බහුල වශයෙන් කිරීමෙන් අනතුරුව පැමිණෙන විශෙෂාධිගමයක් ඇත්තේමයයි ඔහුට දැඩිව අදහස් වේ.

10. "තවද මහණෙනි, ශාරිපුත්‍ර තෙමේ සියලු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්මවීමෙන්, ගැටීම් ස්වභාවය ඇති රූප ධාතු සංඥාවන් දුරු කිරීමෙන්, නොයෙක් සංඥා මෙනෙහි

නොකිරීමෙන්, ආකාශය අනන්තයයි ආකාසානඤ්චායතන සමාපත්තියට පැමිණ වෙසෙයි. ඒ ආකාසානඤ්චායතනයෙහි ආකාසානඤ්චායතන සංඥාවද, චිත්තෛකාග්‍රතාවද, ස්පර්ශයද, වෙදනාවද, සංඥාවද, චෙතනාවද, චිත්තයද, ඡන්දයද, අධිමොක්ෂයද, වීර්‍ය්‍යයද, ස්මෘතියද, උපෙක්ෂාවද, මනසිකාරයද යන මේ ධර්මකෙනෙක් වෙද්ද, ඒ ධර්මයෝ ඔහු විසින් පිළිවෙළින් පිරිසිඳ දැනගන්නා ලද්දාහුය. ඒ ධර්මයෝ ඔහුට ප්‍රකටව උපදිත්. ප්‍රකටව සිටිත්. ප්‍රකටව නිරුද්ධ වෙත්. හෙතෙම මෙසේ දැනගනී. මේ ධර්මයෝ වනාහි මෙසේ (පළමු) ඇති නොවී, අළුතෙන් ඇති වෙති. ඇතිවී නැති වෙති කියායි. හෙතෙම ඒ ධර්මයන් කෙරෙහි (රාග වශයෙන්) නොපැමිණෙන්නේ, (ද්වෙෂ වශයෙන්) ඉවත් නොවන්නේ, (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) නොඇලෙන්නේ, (ඡන්ද රාගයෙන්) නොබැඳුනේ, (කාම රාගයෙන්) මිදුනේ, (සියලු කෙලෙසුන්ගෙන්) වෙන් වූයේ, කෙලෙස් වශයෙන් හෝ අරමුණු වශයෙන් හෝ) සීමාවක් නොකරනලද සිතින් යුක්තව වෙසේ. හෙතෙම අනතුරුව පැමිණෙන මීට වඩා උසස් අධිගම ඇතැයි දැනගනී. ඒ දැනුම බහුල වශයෙන් කිරීමෙන් ඒ විශේෂාධිගම ඇත්තේමයයි ඔහුට දැඩිව අදහස් වේ.

11. "තවද මහණෙනි, ශාරීපුත්‍ර තෙමේ සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වෙසේ. ඒ විඤ්ඤාණඤ්චායතනයෙහි විඤ්ඤාණඤ්චායතන සංඥාවද, චිත්තෛකාග්‍රතාවද, ස්පර්ශයද, වෙදනාවද, සංඥාවද, චෙතනාවද, චිත්තයද, ඡන්දයද, අධිමොක්ෂයද, වීර්‍ය්‍යයද, ස්මෘතියද, උපෙක්ෂාවද, මනසිකාරයද යන යම් ධර්මකෙනෙක් වෙද්ද, ඒ ධර්මයෝ ඔහු විසින් පිළිවෙළින් පිරිසිඳ දැනගන්නා ලද්දාහුය. ඒ ධර්මයෝ ඔහුට ප්‍රකටව උපදිති. ප්‍රකටව සිටිති. ප්‍රකටව නිරුද්ධ වෙති. හෙතෙම මෙසේ දැනගනී. 'මේ ධර්මයෝ වනාහි මෙසේ (පළමු) ඇති නොවී, (අළුතෙන්) ඇති වෙත්ය, ඇතිවී නැතිවෙත්ය' කියායි.

"හෙතෙම ඒ ධර්මයන් කෙරෙහි (රාග වශයෙන්) නොපැමිණෙන්නේ, (ද්වෙෂ වශයෙන්) ඉවත් නොවන්නේ, තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) නොඇලෙන්නේ, (ඡන්ද රාගයෙන්) නොබැඳුණේ, (කාම රාගයෙන්) මිදුනේ, (සියලු කෙලෙසුන්ගෙන්) වෙන් වූයේ, (කෙලෙස් වශයෙන් හෝ අරමුණු වශයෙන්) හෝ සීමාවක් නොකරනලද සිතින් යුක්තව වෙසේ. හෙතෙම අනතුරුව පැමිණෙන මීට වඩා උසස් අධිගමයක් ඇතැයි දැනගනී. ඒ දැනීම බහුල වශයෙන් කරන්නාවූ ඒ අධිගමය ඇත්තේමයයි ඔහුට අදහස් වේ.

12. "තවද මහණෙනි, ශාරීපුත්‍ර තෙමේ සියලු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසේ. ඒ ආකිඤ්චඤ්ඤායතන සංඥාවද, චිත්තෙකාග්‍රතාවද, ස්පර්ශයද, වෙදනාවද, චිත්තයද, ඡන්දයද, අධිමොක්ෂයද, වීර්‍ය්‍යයද, ස්මෘතියද, උපෙක්ෂාවද, මනසිකාරයද යන යම් ධර්මකෙනෙක් වෙද්ද, ඒ ධර්මයෝ ඔහු විසින් පිළිවෙළින් පිරිසිඳ දැනගන්නා ලද්දාහුය. ඒ ධර්මයන් උන්වහන්සේට ප්‍රකටව උපදිත්. ප්‍රකටව සිටිත්. ප්‍රකටව නිරුද්ධ වෙත්. හෙතෙම මෙසේ දැනගනී. 'මේ ධර්මයෝ වනාහි මෙසේ (පළමු) ඇති නොවී, (අළුතෙන්) ඇති වෙත්ය. කියායි.

"හෙතෙම ඒ ධර්මයන් කෙරෙහි (රාග වශයෙන්) නොපැමිණෙන්නේ, (ද්වෙෂ වශයෙන්) ඉවත් නොවන්නේ, (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) නොඇලෙන්නේ, (ඡන්දරාගයෙන්) නොබැඳුනේ, (කාම රාගයෙන්) මිදුනේ, (සියලු කෙලෙසුන් ගෙන්) වෙන් වූයේ, කෙලෙස් වශයෙන් හෝ අරමුණු වශයෙන් හෝ සීමාවක් නොකරනලද සිතින් යුක්තව වෙසේ. හෙතෙම අනතුරුව පැමිණෙන මීට වඩා උසස් අධිගමයක් ඇතැයි දැනගනී. ඒ දැනීම බහුල වශයෙන් කිරීමෙන් ඒ අධිගමය ඇත්තේමයයි ඔහුට දැඩිව ඇදහස්වේ.

13. "තවද මහණෙනි, ශාරිපුත්‍රතෙමේ සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤා

නාසඤ්ඤායතනයට පැමිණ වෙසේ. හෙතෙම මේ සමාපත්තියෙන් සිහියෙන් යුක්තව නැගී සිටී. හෙතෙම ඒ සමාපත්තියෙන් සිහියෙන් යුක්තවූයේ නැගීසිට යම් ඒ ධර්ම කෙනෙක් ඉතාම ඉක්ම ගියාහුද, නිරුද්ධවූවාහුද, වෙනස් වූවාහුද, ඒ ධර්මයන් මැනවින් බලයි. 'මේ ධර්මයෝ වනාහි මෙසේ (පළමු) ඇති නොවී (අළුතෙන්) ඇතිවෙත්ය. ඇතිවී නැතිවෙත්ය' කියායි.

හෙතෙම ඒ ධර්මයන් කෙරෙහි (රාග වශයෙන්) පැමිණෙන්නේ (ද්වෙෂ වශයෙන්) ඉවත් නොවන්නේ, තෘෂ්ණා, දෘෂ්ටි වශයෙන් නොඇලෙන්නේ (ඡන්ද රාගයෙන්) නොබැඳුනේ (කාම රාගයෙන්) මිදුනේ, (සියලු කෙලෙසුන්ගෙන්) වෙන් වූයේ, කෙලෙස් වශයෙන් හෝ (අරමුණු වශයෙන්) හෝ) සීමාවක් නොකරනලද සිතින් යුක්තව වෙසේ. හෙතෙම අනතුරුව පැමිණෙන මීට වඩා උසස් අධිගමයක් ඇතැයි දැනගනී. ඒ දැනීම බහුල වශයෙන් කිරීමෙන් ඒ අධිගමය ඇත්තේමයයි, ඔහුට දැඩිව අදහස්වේ.

14. "තවද මහණෙනි, ශාරීපුත්‍රතෙමේ සියලු ආකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වෙසෙයි, මාර්ග ප්‍රඥාවෙන් චතුරාර්‍ය්‍යසත්‍යයන් දැක ආශ්‍රවයෝ පහවූවාහු වෙත්. හෙතෙම ඒ සමාපත්තියෙන් සිහියෙන් යුක්තව නැගි සිටී. හෙතෙම ඒ සමාපත්තියෙන් සිහියෙන් යුක්තව නැගීසිට යම් ඒ ධර්ම කෙනෙක් ඉක්ම ගියාහුද, නිරුද්ධවූවාහුද, වෙනස් වූවාහුද, ඒ ධර්මයන් මැනවින් බලයි. 'මේ ධර්මයෝ වනාහි මෙසේ (පළමු) ඇතිනොවී (අළුතෙන්) ඇතිවෙත්ය. ඇතිවී නැති වෙත්ය,' කියායි.

හෙතෙම ඒ ධර්මයන් කෙරෙහි (රාග වශයෙන්) නොපැමිණෙන්නේ, (ද්වෙෂවශයෙන්) ඉවත්නොවන්නේ, (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) නොඇලෙන්නේ (ඡන්ද රාගයෙන්) නොබැඳුනේ, (කාම රාගයෙන්) මිදුනේ, (සියලු කෙලෙසුන්ගෙන් වෙන්වූයේ, (කෙලෙස් වශයෙන් හෝ අරමුණු වශයෙන් හෝ) සීමාවක් නොකරණලද සිතින් යුක්තව වෙසේ. හෙතෙම

අනතුරුව පැමිණෙන මීට වඩා උසස් අධිගමයක් නැතැයි දැනගනී. ඒ දැනීම බහුල වශයෙන් කිරීමෙන් අනතුරුව පැමිණෙන ඊට වඩා උසස් අධිගමයක් නැත්තේමයයි,' ඔහුට දැඩිව අදහස්වේ.

15. "මහණෙනි, ඒ යමෙකුට වනාහි ආයර්‍ය ශීලයෙහි වශීප්‍රාප්ත වූයේය. පරතෙරට පැමිණියේයයිද, ආයර්‍යසමාධියෙහි වශීප්‍රාප්ත වූයේය. පරතෙරට පැමිණියේයයිද, ආයර්‍ය ප්‍රඥාවෙහි වශී ප්‍රාප්ත වූයේය. පරතෙරට පැමිණියේයයිද, ආයර්‍ය විමුක්තියෙහි වශී ප්‍රාප්තවූයේය. පරතෙරට පැමිණියේයයිද මැනවින් කියනු ලබන්නේනම් සැරියුත්තෙරුන්ටම ආයර්‍ය ශීලයෙහි වශීප්‍රාප්ත වූයේය. පරතෙරට පැමිණියේය. ආයර්‍ය සමාධියෙහි වශීප්‍රාප්ත වූයේය. පරතෙරට පැමිණියේය. ආයර්‍ය ප්‍රඥාවෙහි වශීප්‍රාප්ත වූයේය. පරතෙරට පැමිණියේය. ආයර්‍ය විමුක්තියෙහි වශීප්‍රාප්ත වූයේය. පරතෙරට පැමිණියේය. කියයුතු වන්නේය.

16. "මහණෙනි, ඒ යමෙකුට වනාහි භාග්‍යවතුන් වහන්සේගේ ඖරස පුත්‍රයෙක. මුඛයෙන් උපන් පුත්‍රයෙක ධර්මයෙන් හටගත් කෙනෙක, ධර්මයෙන් මැවුණු කෙනෙක, ධර්ම දායාදය ගන්නා කෙනෙක, ආමිෂ දායාදය නොගන්නා කෙනෙකැයි මැනවින් කියනු ලබන්නේ නම් සැරියුත් තෙරුන්ටම භාග්‍යවතුන් වහන්සේගේ ඖරස පුත්‍රයෙක, මුඛයෙන් උපන් පුත්‍රයෙක, ධර්මයෙන් හටගත් කෙනෙක, ධර්මයෙන් මැවුණු කෙනෙක, ධර්ම දායාදය ගන්නා කෙනෙක. ආමිෂ දායාදය නොගන්නා කෙනෙකැයි කියයුතු වන්නේය.

"මහණෙනි, ශාරිපුත්‍රතෙමේ තථාගතයන් විසින් පවත්වනලද නිරුත්තරවූ ධර්මචක්‍රය මැනවින් ඒ අනුවම පවත්වයි," භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනාකළසේක. සතුටුවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ කීමට සතුටු වූවාහුය.

**පළමුවැනිවූ අනුපද සූත්‍රය නිමි. (2-1)**

## 12. ඡබ්බ සොධන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතනම් රජකුමරුගේ උයනෙහි අනේපිඬු සිටුතුමා විසින් කරවන ලද ආරාමයෙහි (ජේතවනාරාමයෙහි) වැඩවසන සේක.

එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' කියා භික්ෂූන්ට කථාකළ සේක. ඒ භික්ෂූහු 'ස්වාමීනි' යි. භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

2. "මහණෙනි, මේ ශාසනයෙහි භික්ෂුවක් තෙම නැවත නැවත ඉපදීම ක්ෂය විය. බ්‍රාහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලද්දේය. කටයුතු දෑ කොට අවසානය, මත්තෙහි කළයුතු අනිකක් නැතැයි, දනිමි කියා රහත් බව ප්‍රකාශ කෙරේද, මහණෙනි, ඔහුගේ කීමට භික්ෂූහු නොම සතුටු විය යුතුය, ප්‍රතික්ෂෙපද නොකළ යුතුය. සතුටු නොවී බැහැරද නොකොට ප්‍රශ්නයක් ඇසිය යුතුය.

3. "ඇවැත්නි, භාග්‍යවත්වූ සියල්ල දන්නාවූ, සියල්ල නුවණැසින් දක්නාවූ, අර්හත්වූ ඒ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ මැනවින් ප්‍රකාශ කරණලද මේ ව්‍යවහාරයෝ සතර දෙනෙකි. ඒ සතර කුමක්ද? දක්නාලද දෙය දක්නාලද පරිදි කීමය, අසනලද දෙය අසනලද පරිදි කීමය, (නාසය, දිව, ශරීරය යන මෙයින්) දැන ගන්නාලද දෙය දැන ගන්නා ලද පරිදි කීමය, (මනසින්) දැනගන්නාලද දෙය දැනගන්නා ලද පරිදි කීමය යනුයි.

4. "ඇවැත්නි, සියල්ල දන්නාවූ, සියල්ල නුවණින් දක්නාවූ, භාග්‍යවත්වූ, අර්හත්වූ, ඒ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ විසින් මැනවින් ප්‍රකාශ කරණලද මේ ව්‍යවහාරයෝ සතර වෙති. මේ සතර ව්‍යවහාරයන්හි කෙසේ දන්නාවූ කෙසේ දක්නාවූ ආයුෂ්මතුන්ගේ සිත තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් නොගෙණ ආශ්‍රවයන්ගෙන් මිදුනේද? කියායි.

"මහණෙනි, ආශ්‍රවයන් ක්ෂය කළාවූ වැසනිමවනලද බ්‍රහ්මචර්‍ය්‍යාව ඇති කටයුතු දෑ කොට අවසන්වූ බහා තබනලද

බර ඇති, පැමිණි ස්වකීයාර්ථ ඇති ක්ෂය කළ භව බැඳුම් ඇති මැනවින් දැන මිදුනාවූ භික්ෂුවගේ විසඳීමෙහි මේ ආකාරවෙයි.

ඇවැත්නි, මම දක්නාලද දෙයෙහි වනාහි (රාගවශයෙන්) නොපැමින්නේ, (ද්වෙෂවශයෙන්) ඉවත් නොවන්නේ (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) නොඇලුනේ (ඡන්දරාගයෙන්) නොබැඳුනේ (කාම රාගයෙන්) මිදුනේ සියළු කෙලසුන්ගෙන් වෙන්වූයේ (කෙලෙස් වශයෙන් හෝ අරමුණු වශයෙන් හෝ) සීමාවක් නොකරණලද සිතින් යුක්තව වසමි. ඇවැත්නි, මම අසනලද දෙයෙහිද ඇලීම් වශයෙන් නොපැමිණෙන්නේ කිපීම් වශයෙන් ඉවත් නොවන්නේ, තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ඇසුරු නොකෙළේ, කාම රාගයෙන් නොබැඳුනේ ඡන්දරාගයෙන් මිදුනේ, කෙලෙසුන්ගෙන් වෙන්වූයේ, කෙලෙසුන්ගෙන් හෝ ආරම්මණයන්ගේ සීමාවක් නොකරණලද සිතින් යුක්තව වසමි.

ඇවැත්නි, මම නාසය, දිව, සිරුර යන මේ දොරටු වලින් දැනගන්නාලද දෙයෙහිද ඇලීම් වශයෙන් නොපැමිණෙන්නේ කිපීම් වශයෙන් ඉවත් නොවන්නේ, තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් ඇසුරු නොකෙළේ කාමරාගයෙන් ඡන්දරාගයෙන් නොබැඳුනේ මිදුනේ, කෙලෙසුන්ගෙන් වෙන්වූයේ, කෙලෙසුන්ගෙන් හෝ ආරම්මණයන්ගේ සීමාවක් නොකරණ ලද සිතින් යුක්තව වසමි. ඇවැත්නි, මම සිතින් දැන ගන්නාලද දෙයෙහිද (රාගවශයෙන්) නොඑළඹෙන්නේ (ද්වෙෂයෙන්) ඉවත් නොවන්නේ (තෘෂ්ණා දෘෂ්ටි වශයෙන්) නොඇලෙන්නේ, (ඡන්දරාගයෙන්) නොබැඳුනේ (කාමරාගයෙන්) මිදුනේ, (සියළු කෙලෙසුන්ගෙන්) වෙන්වූයේ (කෙලෙස් වශයෙන් හෝ අරමුණු වශයෙන් හෝ) සීමාවක් නොකරණලද සිතින් යුක්තව වසමි. ඇවැත්නි, මේ සතර ව්‍යවහාරයන්හි මෙසේ දන්නාවූ, මෙසේ දක්නාවූ මාගේ සිත තෘෂ්ණා දෘෂ්ටිවශයෙන් නොගෙණ ආශ්‍රවයන් කෙරෙන් මිදුනේ වෙයි කියායි.

5. "මහණෙනි, ඒ භික්ෂුවගේ කීම යහපතැයි කියා පිළිගත යුතුයි. ඒ අනුව සතුටු වියයුතුයි. යහපතැයි එම කීම පිළිගෙණ ඒ අනුව සතුටුව (මුල් ප්‍රශ්නයෙන් සෑහීමට පත්නොවේ නම්)

මතුද ප්‍රශ්නයක්, ඇසිය යුතුයි. ඇවැත්නි, භාග්‍යවත්වූ, සියල්ල දන්නාවූ, සියල්ල නුවණැසින් දක්නාවූ අර්හත්වූ ඒ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ විසින් මැනවින් ප්‍රකාශ කරණලද මේ උපාදානස්කන්ධ පසෙකි. ඒ කවර පසෙක්දයත්? රූපඋපාදානස්කන්ධය, වෙදනාඋපාදානස්කන්ධය, සංඥා උපාදානස්කන්ධය, සංස්කාරඋපාදාන ස්කන්ධ විඥාන උපාදානස්කන්ධය යන මේ පසයි.

ඇවැත්නි, මේ පඤ්ච උපාදානස්කන්ධයෝ භාග්‍යවත්වූ සියල්ල දන්නාවූ, සියල්ල දක්නාවූ, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධ රජාණන් වහන්සේ විසින් මැනැවින් ප්‍රකාශ කරණ ලදහ.

6. "මේ පඤ්ච උපාදානස්කන්ධයන් කෙරෙහි කෙසේ දන්නාවූ කෙසේ දක්නාවූ ආයුෂ්මතුන්ගේ සිත තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් නොගෙන ආශ්‍රවයන්ගෙන් මිදුනේද කියායි.

"මහණෙනි, ක්ෂීණාශ්‍රවවූ, වැස නිමවනලද බ්‍රහ්මචර්‍ය්‍යා ඇති කටයුතු දැ කොට අවසන්වූ, බහා තබනලද බර ඇති පැමිණි තමන්ගේ අර්ථය ඇති, ක්ෂය කළ භව බැඳුම් ඇති, මැනවින් දැන මිදුනාවූ භික්ෂුවගේ විසඳීම මේ ආකාර වෙයි.

7. "ඇවැත්නි, මම වනාහි රූපය දුර්වලය නො ඇලිය යුත්තක අස්වැසිලි රහිතවූවකැයි දැන රූපයෙහි මමය මාගේ යයි ගන්නා චිත්තයාගේ සිටීමය, බැසගැනීමය, අනුසය වශයෙන් පැවැත්මයි කියනලද මේ තෘෂ්ණා දෘෂ්ටීහු වෙත්ද, ඔවුන්ගේ ක්ෂය වීමෙන්, නොඇලීමෙන්, වැලැක්වීමෙන්, හැරලීමෙන් අතහැර දැමීමෙන් මාගේ සිත මිදුනේයයි දනිමි. ඇවැත්නි, මම වනාහි වෙදනාව දුර්වලය, නොඇලිය යුත්තක, අස්වැසිලි රහිතවූ වෙකැයි දැන වෙදනාවෙහි මමය මාගේයයි සිත පිහිටන්නාවූ බැසගන්නාවූ අනුසය වශයෙන් පවත්නාවූ යම් තෘෂ්ණා දෘෂ්ටීහු වෙත්ද, ඔවුන්ගේ ක්ෂය වීමෙන්, නොඇලීමෙන්, වැලැක්මෙන්, හැරලීමෙන් අතහැර දැමීමෙන් මාගේ සිත මිදුනේයයි දනිමි. ඇවැත්නි, මම වනාහි සංඥාව දුර්වලය, නොඇලිය යුත්තක, අස්වැසිලි රහිත වූවෙකැයි දැන, සංඥාවෙහි මමය මගේයයි

සිත පිහිටන්නාවූ බැසගන්නාවූ, අනුසය වශයෙන් පවත්නාවූ යම් තෘෂ්ණා දෘෂ්ටීහු වෙත්ද, ඔවුන්ගේ ක්ෂය වීමෙන්, නොඇලීමෙන්, වැලැක්වීමෙන්, හැරලීමෙන්, අතහැර දැමීමෙන් මාගේ සිත මිදුනේයයි දනිමි. ඇවැත්නි, මම වනාහි සංස්කාරයන් දුර්වලය, නොඇලිය යුත්තක, අස්වැසිලි රහිතවූයෙකැයි දැන සංස්කාරයන්හි මමය මාගේයයි සිත පිහිටන්නාවූ බැස ගන්නාවූ, අනුසය වශයෙන් පවත්නාවූ, යම් තෘෂ්ණා දෘෂ්ටීහු වෙත්ද, ඔවුන්ගේ ක්ෂය වීමෙන්, නොඇලීමෙන්, වැලැක්වීමෙන් හැරලීමෙන්, අතහැර දැමීමෙන් මාගේ සිත මිදුනේ යයි දනිමි. ඇවැත්නි, මම වනාහි විඤ්ඤාණය දුර්වලය, නො ඇලිය යුත්තක, අස්වැසිලි රහිත වූවකැයි දැන විඤ්ඤාණයෙහි මමය මාගේයයි ගන්නා චිත්තයාගේ සිටීමය, ඇතුළත්වීමය අනුශය වශයෙන් පැවැත්මයයි කියනලද යම් තෘෂ්ණා දෘෂ්ටීහු වෙත්ද, ඔවුන්ගේ ක්ෂය වීමෙන් නොඇලීමෙන් වැලැක්වීමෙන් හැරලීමෙන්, අතහැර දැමීමෙන් මාගේ සිත මිදුනේයයි දනිමි.

"ඇවැත්නි, මෙසේ වනාහි පඤ්චඋපාදානස්කන්ධයන් කෙරෙහි දන්නාවූ මෙසේ දක්නාවූ මාගේ සිත තෘෂ්ණා දෘෂ්ටිවශයෙන් නොගෙණ ආශ්‍රවයන් කෙරෙන් මිදුනේය. කියායි.

"ඇවැත්නි, ඒ භික්ෂුවගේ කීම යහපතැයි කියා පිළිගත යුතුයි. ඒ අනුව සතුටු විය යුතුයි. යහපතැයි එම කීම පිළිගෙණ ඒ අනුව සතුටුව (එම ප්‍රශ්නයෙන්ද සෑහීමට පත් නොවේ නම්) මතුද ප්‍රශ්නයක් ඇසිය යුතුයි.

8. "ඇවැත්නි, භාග්‍යවත්වූ, සියල්ල දන්නාවූ, සියල්ල නුවණැසින් දක්නාවූ, අර්හත්වූ ඒ සම්‍යක් සම්බුදුරජානන් වහන්සේ විසින් මෙම ධාතු සය මැනවින් ප්‍රකාශ කරණලදී. කවර නම් සයක්ද යත්? පඨවි ධාතුය, ආපො ධාතුය, තෙජෝ ධාතුය, වායො ධාතුය ආකාස ධාතුය, විඤ්ඤාණ ධාතුය යන සයයි.

ඇවැත්නි, භාග්‍යවත්වූ සියල්ල දන්නාවූ සියල්ල නුවණැසින් දක්නාවූ අර්හත් වූ, ඒ සම්‍යක් සම්බුදුරාජාණන් වහන්සේ විසින් මෙම ධාතු සය මැනවින් ප්‍රකාශ කරණලදහ.

**9.** "මේ ධාතු සයෙහි කෙසේ දන්නාවූ කෙසේ දක්නාවූ ආයුෂ්මතුන්ගේ සිත තාෂ්ණා දෘෂ්ටි වශයෙන් නොගෙණ ආශ්‍රවයන්ගෙන් මිදුනේද කියායි.

"මහණෙනි ක්ෂීණාශ්‍රවවූ වැස නිමවනලද බ්‍රහ්මචය්‍ර්‍යා ඇති කටයුතු දැ කොට අවසන්වූ බහා තබනලද බර ඇති පැමිණි තමාගේ අර්ථය ඇති ක්ෂය කළ භව බැඳුම් ඇති මැනවින් දැන මිදුනාවූ භික්ෂුවගේ විසඳීම මේ ආකාරවේ.

'ඇවැත්නි, මම වනාහි පඨවි ධාතුව තමා නොවේයයි නුවණින් බැස ගතිමි. පඨවි ධාතුව ඇසුරුකොටද තමා නැත්තේය. පඨවි ධාතුව ඇසුරු කොට පවත්නා මමය මාගේ යයි ගන්නාවූ චිත්තයාගේ සිටීමය, ඇතුළත් වීමය, අනුශය වශයෙන් පැවැත්මයයි කියනලද යම් ඒ තෘෂ්ණා දෘෂ්ටීහු වෙත්ද ඔවුන්ගේ ක්ෂය වීමෙන් නොඇලීමෙන් වැළැක්මෙන්, හැරලීමෙන්, අතහැර දැමීමෙන් මාගේ සිත මිදුණේ යයි දනිමි.

**10.** "ඇවැත්නි, මම වනාහි ආපෝධාතුව ආත්මයයි නො ගනිමි. ආපෝධාතුව ඇසුරුකොටද ආත්මයක් ඇතැයි නොගනිමි. ආපෝ ධාතුව ඇසුරුකොට මමය මාගේයයි සිත පිහිටන්නාවූ, බැසගන්නාවූ, අනුශය වශයෙන් පවත්නාවූ යම් ඒ තෘෂ්ණා දෘෂ්ටීහු වෙත්ද, ඔවුන්ගේ ක්ෂය වීමෙන් නොඇලීමෙන් වැලැක්මෙන්, හැරවීමෙන්, අතහැර දැමීමෙන් මාගේ සිත 'මිදුනේයයි දනිමි.

ඇවැත්නි, මම වනාහි තෙජෝධාතුව ආත්මයයි නොගතිමි තෙජො ධාතුව ඇසුරුකොටද, ආත්මයක් ඇතැයි නොගතිමි. තේජෝධාතුව ඇසුරුකොට ආත්මයයි නොගතිමි. ආපෝධාතුව ඇසුරුකොටද ආත්මයක් ඇතැයි නොගතිමි. ආපෝධාතුව ඇසුරුකොට මමය මාගේයයි සිත පිහිටුවන්නාවූ බැසගන්නාවූ අනුශය වශයෙන් පවත්නාවූ යම් ඒ තෘෂ්ණා දෘෂ්ටීහු වෙත්ද, ඔවුන්ගේ ක්ෂය වීමෙන් නොඇලීමෙන් වැලැක්මෙන්, හැරවීමෙන් අතහැර දැමීමෙන් මාගේ සිත මිදුණේ යයි දනිමි.

ඇවැත්නි, මම වනාහි වායෝධාතුව ආත්මයයි නොගනිමි. වයෝධාතුව ඇසුරුකොටද, ආත්මයක් ඇතැයි නොගතිමි. වායෝධාතුව ඇසුරුකොට ආත්මයයි නොගතිමි. ආපෝධාතුව ඇසුරුකොටද ආත්මයක් ඇතැයි නොගතිමි. ආපෝධාතුව ඇසුරුකොට මමය මාගේ යයි සිත පිහිටන්නාවූ බැසගන්නා වූ අනුශය වශයෙන් පවත්නාවූ, යම් ඒ තෘෂ්ණා දෘෂ්ටීහු වෙත්ද, ඔවුන්ගේ ක්ෂය වීමෙන් නොඇලීමෙන්, වැලැක්මෙන් හැරවීමෙන්, අතහැර දැමීමෙන් මාගේ සිත මිදුනේයයි දනිමි. ඇවැත්නි, මම වනාහි ආකාස ධාතුව ආත්මයයි නොගතිමි. ආකාස ධාතුව ඇසුරුකොටද, ආත්මයක් ඇතැයි නොගතිමි. ආකාස ධාතුව ඇසුරුකොට ආත්මයයි නොගතිමි. ආපෝ ධාතුව ඇසුරුකොටද ආත්මයක් ඇතැයි නොගනිමි. ආපෝ ධාතුව ඇසුරුකොට මමය මාගේයයි සිත පිහිටුවන්නාවූ බැස ගන්නාවූ අනුශය වශයෙන් පවත්නාවූ යම් ඒ තෘෂ්ණා දෘෂ්ටීහු වෙත්ද, ඔවුන්ගේ ක්ෂය වීමෙන් නොඇලීමෙන්, වැලැක්මෙන් හැරවීමෙන්, අතහැර දැමීමෙන් මාගේ සිත මිදුනේයයි දනිමි.

"ඇවැත්නි, මම වනාහි විඤ්ඤාණධාතුව තමා නොවේයයි නුවණින් බැසගතිමි. විඤ්ඤාණධාතුව ඇසුරුකොටද තමා නැත්තේය. විඤ්ඤාණධාතුව ඇසුරුකොට පවත්නා මමය මාගේයයි ගන්නා චිත්තයාගේ ඇතුළත්වීමය අනුශය වශයෙන් පැවැත්මයයි කියනලද යම් ඒ තෘෂ්ණා දෘෂ්ටීහු වෙත්ද, ඔවුන්ගේ ක්ෂය වීමෙන් නොඇලීමෙන්, වැලැක්මෙන්, හැරලීමෙන්, අත්හැර දැමීමෙන් මාගේ සිත මිදුණේයයි දනිමි.

"ඇවැත්නි, මෙසේ වනාහි මේ ධාතු සයෙහි දන්නාවූ මෙසේ දක්නාවූ මාගේ සිත තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නොගෙණ ආශ්‍රවයන් කෙරෙන් සිත මිදුනේය කියායි.

"ඇවැත්නි, ඒ භික්ෂුවගේ කීම යහපතැයි කියා පිළිගත යුතුයි. ඒ අනුව සතුටුවිය යුතුයි. යහපතැයි ඒ කීම පිළිගෙණ ඒ අනුව සතුටුව (එම ප්‍රශ්නයෙන්ද, සෑහීමට පත් නොවේ නම්) මතුද ප්‍රශ්නයක් ඇසිය යුතුයි.

11. "ඇවැත්නි, භාග්‍යවත්වූ, සියල්ල දන්නාවූ, සියල්ල නුවණැසින් දක්නාවූ අර්හත්වූ ඒ සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ විසින් මේ සය වැදෑරුම්වූ අධ්‍යාත්මික බාහිර ආයතනයෝ මැනවින් ප්‍රකාශ කරණ ලදහ. කවර නම් සයක්ද යත්? ඇසද රූපයෝද, කණද ශබ්දයෝද, නාසයද ගන්ධයෝද, දිවද රසයෝද, කයද ස්පර්ශයෝද, සිතද ධර්මයෝද යන මේ සයයි.

"ඇවැත්නි, භාග්‍යවත්වූ සියල්ල දන්නාවූ සියල්ල නුවණැසින් දක්නාවූ අර්හත්වූ ඒ සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ විසින් මේ සය වැදෑරුම්වූ ආධ්‍යාත්මික බාහිර ආයතනයෝ මැනවින් ප්‍රකාශ කරණ ලදහ.

මේ සය වැදෑරුම්වූ ආධ්‍යාත්මික බාහිර ආයතනයන් කෙරෙහි කෙසේ දන්නාවූ, කෙසේ දක්නාවූ ආයුෂ්මතුන්ගේ සිත විසින් තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නොගෙණ ආශ්‍රවයන් ගෙන් මිදුණේද කියායි.

'මහණෙනි, ක්ෂීණාශ්‍රවවූ, වැස නිමවනලද බ්‍රහ්මචර්‍ය්‍යා ඇති කටයුතු දෑ කොට අවසන්වූ බහා තබනලද බර ඇති පැමිණි තමාගේ අර්ථය ඇති ක්ෂය කළ බව බැඳුම් ඇති මැනවින් දැන මිදුනාවූ භික්ෂුවගේ විසඳීම මේ ආකාරවේ.

12. "ඇවැත්නි, ඇසෙහිද, රූපයෙහිද, චක්ඛුවිඤ්ඤාණයෙහිද, චක්ඛුවිඤ්ඤාණයෙන් දැනගතයුතු ධර්මයන් කෙරෙහිද, යම් කැමැත්තෙක් වේද, යම් ඇලීමක් වේද, යම් සතුටු වීමක් වේද, යම් තණ්හාවක් වේද, මමය මාගේයයි ගන්නා චිත්තයාගේ සිටීමය, බැස ගැනීමය. අනුශය වශයෙන් පැවැත්මයි කියනලද යම් තෘෂ්ණාදෘෂ්ටීහු වෙත්ද ඔවුන්ගේ ක්ෂයවීමෙන්, නොඇලීමෙන්, වැළැක්වීමෙන්, හැරලීමෙන්, අතහැර දැමීමෙන් මාගේ සිත මිදුනේ වේයයි දනිමි.

"ඇවැත්නි, කණෙහිද, ශබ්දයෙහිද, සොත විඤ්ඤානයෙහිද, ශ්‍රොත විඥානයෙන් දතයුතුවූ ධර්මයන්හිද, යම් තෘෂ්ණා ඡන්දයක් වේද, යම් ඇලීමෙක් වේද, යම් සතුටුවීමක් වේද, යම් තෘෂ්ණාවක්

වේද මමය මාගේ යයි ගන්නා සිත පිහිටන්නාවූ බැස ගන්නාවූ අනුශය වශයෙන් පවත්නාවූ යම් තෘෂ්ණාදෘෂ්ටීහු වෙත්ද, ඔවුන්ගේ ක්ෂයවීමෙන් නොඇලීමෙන්, වැලැක්මෙන්, හැරලීමෙන්, අතහැර දැමීමෙන් මාගේ සිත මිදුනේයයි දනිමි. ඇවැත්නි, නැහැයෙහිද, ගන්ධයෙහිද, ඝාණ විඤ්ඤාණයෙහිද, ඝාණ විඤ්ඤාණයෙන් දත යුතු දෙයෙහිද, සොත විඤ්ඤාණයෙන් දතයුතු දෙයෙහිද, ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ ධර්මයන්හිද, යම් තෘෂ්ණා ඡන්දයක් වේද, යම් ඇලීමක් වේද, යම් සතුටුවීමක් වේද, යම් තෘෂ්ණාවක් වේද, මමය මාගේයයි ගන්නා සිත පිහිටන්නාවූ බැස ගන්නාවූ අනුශය වශයෙන් පවත්නාවූ යම් තෘෂ්ණා දෘෂ්ටීහු වෙත්ද, ඔවුන්ගේ ක්ෂයවීමෙන් නොඇලීමෙන්, වැලැක්මෙන්, හැරලීමෙන් අතහැර දැමීමෙන් මාගේ සිත මිදුනේයයි දනිමි. ඇවැත්නි, දිවෙහිද, රසයෙහිද, ජිව්හා විඤ්ඤාණයෙහිද, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතු දෙයෙහිද ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ ධර්මයන්හිද, යම් තෘෂ්ණා ඡන්දයක් වේද, යම් ඇලීමක් වේද, යම් සතුටුවීමක් වේද, යම් තෘෂ්ණාවක් වේද මමය මාගේයයි ගන්නා සිත පිහිටන්නාවූ බැසගන්නාවූ අනුශය වශයෙන් පවත්නාවූ යම් තෘෂ්ණාදෘෂ්ටීහු වෙත්ද, ඔවුන්ගේ ක්ෂයවීමෙන් නොඇලීමෙන්, වැලැක්මෙන්, හැරලීමෙන් අතහැර දැමීමෙන් මාගේ සිත මිදුනේයයි දනිමි. ඇවැත්නි, කයෙහිද, ස්පර්ශයෙහිද, කාය විඤ්ඤාණයෙහි ද, කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ දෙයෙහිද, කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ ධර්මයන්හි ද, යම් තෘෂ්ණා ඡන්දයක් වේද, යම් ඇලීමක් වේද, යම් සතුටුවීමක් වේද, යම් තෘෂ්ණාවක් වේද, මමය මාගේයයි ගන්නා සිත පිහිටන්නාවූ බැස ගන්නාවූ අනුශය වශයෙන් පවත්නාවූ යම් තෘෂ්ණාදෘෂ්ටීහු වෙත් ද, ඔවුන්ගේ ක්ෂයවීමෙන් නොඇලීමෙන්, වැලැක්මෙන්, හැරලීමෙන්, අතහැර දැමීමෙන් මාගේ සිත මිදුනේයයි දනිමි. ඇවැත්නි, සිතෙහිද, ධර්මයෙහිද, මනොවිඤ්ඤාණයෙහිද, මනොවිඤ්ඤාණයෙන් දතයුතුවූ ධර්මයන්හිද, යම් කැමැත්තක් වේද, යම් ඇලීමෙක් වේද, යම් සතුටක් වේද, යම් තෘෂ්ණාවක්

වේද, මමය මාගේයයි ගන්නා චිත්තයාගේ සිටීමය බැස ගැණීමය, අනුශය වශයෙන් පැවැත්මයයි කියනලද යම් තෘෂ්ණා දෘෂ්ටීහු වෙත්ද, ඔවුන්ගේ ක්ෂය වීමෙන්, නොඇලීමෙන්, වැලැක්මෙන්, හැරලීමෙන් අතහැර දැමීමෙන් මාගේ සිත මිදුණේයයි දනිමි.

13. "ඇවැත්නි, මේ සය වැදෑරුම් ආධ්‍යාත්මික බාහිර ආයතනයන් කෙරෙහි මෙසේ දන්නාවූ, මෙසේ දක්නාවූ මාගේ සිත තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් නො ගෙණ ආශ්‍රවයන් කෙරෙන් සිත මිදුනේය කියායි.

"ඇවැත්නි, ඒ භික්ෂුවගේ කීම යහපතැයි කියා පිළිගත යුතුයි. ඒ අනුව සතුටුවිය යුතුයි. යහපතැයි ඒ කීම පිළිගෙණ ඒ අනුව සතුටුව (එම ප්‍රශ්නයෙන්ද සෑහීමට පත් නොවේනම්) මතුද ප්‍රශ්නයක් ඇසිය යුතුයි.

"මේ විඥ්ඥාණ සහිත වූ කයෙහිද, බාහිරවූ සියළු ආරම්මණයන්හිද, කෙසේ දන්නාවූ කෙසේ දක්නාවූ ආයුෂ්මතුන්ගේ මමය මාගේ යයි ගන්නාවූ මානානුශයයෝ මැනවින් උදුරා දමන ලද්දාහුද? කියායි.

14, "මහණෙනි, ක්ෂීණාශ්‍රව වූ වැස නිමවන ලද බ්‍රහ්මචර්‍ය්‍යාව ඇති කටයුතු දෑ කොට අවසන් වූ බහා තබන ලද බර ඇති පැමිණි තමාගේ අර්ථය ඇති ක්ෂය කළ භව බැඳුම් ඇති, මැනවින් දැන මිදුනාවූ භික්ෂුවගේ විසඳීම් මේ ආකාර වෙයි.

"ඇවැත්නි, 'මම වනාහි පෙර ගිහිව වසන්නේ නො දන්නෙක් වීමි. ඒ මට තථාගතයන් වහන්සේ හෝ තථාගත ශ්‍රාවක කෙනෙක් හෝ දහම් දෙසූහ. මම ඒ ධර්මය අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ලැබුවෙමි. ඒ ශ්‍රද්ධා ලාභයෙන් යුක්තවූ ඒ මම මෙසේ සිතිමි. කෙලෙස් දූවිලි වැදෙන මගවූ, ගිහිගෙයි විසීම අවහිරයකි. පැවිද්ද (නිදහස්වූ) අවකාශ ඇතියෙයි ගිහිගෙයි වසන්නහු විසින් එකාන්තයෙන් සම්පූර්ණවූ, එකාන්තයෙන් පිරිසිදුවූ, ලියවන ලද හක්ගෙඩියක් මෙන් පිරිසිදුවූ බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන්ට පහසු නොවේ. මම කෙස් රැවුල්

බා කසාවත් හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවන්නෙම් නම් ඉතා යහපත්ය කියායි.

"ඇවැත්නි, 'ඒ මම පසු කාලයෙහි ස්වල්පවූ හෝ මහත්වූ හෝ වස්තු හැර, ස්වල්පවූ හෝ මහත්වූ හෝ නෑ සමූහයා හැර, කෙස් රැවුල් බා කසාවත් හැඳ ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදිවීමි.

15. 'මෙසේ පැවිදිවූ ඒ මම භික්ෂූන්ගේ ශික්ෂාවෙන් හා ආජීවයෙන් යුක්තවූයේ ප්‍රාණඝාතය හැර ප්‍රාණඝාතයෙන් වෙන්වූයේ වීමි. බහා තබනලද දඬු ඇත්තේ, බහා තබන ලද අවි ඇත්තේ, ලජ්ජාවෙන් යුක්තවූයේ දයා සහිත වූයේ සියළු ප්‍රාණීන් කෙරෙහි හිතානු කම්පා ඇතිව විසීමි.

'නුදුන්දෙය ගැනුම හැර නුදුන් දෙය ගැණුමෙන් වෙන් වීමි. දුන්දෙය ගන්නේ දුන්දෙය බලාපොරොත්තු වන්නේ සොරසිත් රහිතවූ පිරිසිදු වූවෙක්ව විසීමි.

'මෛථුන සෙවනය දුරුකොට, මෛථුන නම්වූ ග්‍රාම ධර්මයෙන් වෙන්වූයේ බ්‍රහ්මචාරී වීමි. මුසාවාදය හැර මුසාවාදයෙන් වෙන්වූයේ වීමි. සත්‍යය කියන්නෙක්, සත්‍යයෙන් සත්‍යය ගලපන්නෙක්, ස්ථිර කථා ඇත්තෙක් ඇදහියයුතු කථා ඇත්තෙක්, ලෝකයාට බොරු කියන්නෙක්, වීමි. කේළාම් වචනය හැර කේළාම් වචනයෙන් වෙන්වූයේ වීමි. මොවුන්ගේ භෙදය පිණිස මෙතනින් අසා එතැන නොකියන්නෙක් ඔවුන්ගේ භෙදය පිණිස එතනින් අසා මෙතැන නොකියන්නෙක් මෙසේ වෙන්වූවන්ගේ සමගිය ඇතිකරන්නෙක්, සමගි වූවන්ගේ සමගිය තව තවත් දියුණු කරන්නෙක් සමගියෙහි ඇළුනෙක් සමගියෙහි යෙදුනෙක් සමගියෙහි සතුටු වූවෙක් සමගිය ඇතිකරන්නාවූ වචනය කියන්නෙක් වීමි.

'පරුෂ වචනය හැර පරුෂ වචනයෙන් වෙන්වූයේ වීමි. යම් ඒ වචනයක් ප්‍රියවේද, කණට මිහිරිවේද, ප්‍රෙම කළයුතුද, හදපතුළටම යන සුළුද, පුරවැසියන් විසින් ව්‍යවහාර කරන්නේද,

බොහෝ දෙනා කැමතිවන්නහුද, බොහෝ දෙනාගේ මන වඩන්නේද, එබඳුවූ වචනය කියන්නෙක්වීමි.

'හිස් වචන කීමහැර හිස් වචන කීමෙන් වෙන්වූයේ වීමි. සුදුසු කාලයෙහි කියන සුළුවූ, සිදුවූ දෙය කියන සුළුවූ, අර්ථවත් දෙය කියන සුළුවූ, ධර්මයෙන් යුත් දෙය කියන සුළුවූ, විනයෙන් යුත් දෙය කියන සුළුවූ විනයෙන් යුත් දෙය කියන සුළුවූ නිධානයක් මෙන්වූ, සිතේ තබාගැනීමට සුදුසුවූ, සුදුසු කල්හි කරුණු සහිතව අර්ථවත්වූ, ප්‍රමාණවත් වචන කියන්නෙක් වීමි.

**16.** ඒ මම පැලවෙන්නාවූ නිල් තණ පැලෑටි යනාදිය කැඩීමෙන් බිඳීමෙන් වෙන්වූයේ වීමි. රාත්‍රි භෝජනයෙන් වැළකුණේ ඒක භක්තික වීමි. නැටීම්, ගැයීම්, වැයීම් විසුළු දැකීමෙන් වෙන්වූයේ වීමි. සැරසීමට හා අලංකාරයට කරුණුවූ මල් ගඳ විලවුන් දැරීමෙන් වෙන්වූයේ වීමි. උස් ආසන මහ ආසනවලින් වෙන් වූයේ වීමි. රන් රිදී (මසු කහවණු) පිළිගැන්වීමෙන් වෙන්වූයේ වීමි. අමු ධාන්‍ය පිළිගැණීමෙන් වෙන්වූයේ වීමි. අමු මස් පිළිගැණීමෙන් වෙන්වූයේ වීමි. ස්ත්‍රීන් හා කන්‍යාවන් පිළිගැණීමෙන් වෙන්වූයේ වීමි. දාසි දාසයන් පිළිගැණීමෙන් වෙන්වූයේ වීමි. එළු බැටළුවන් පිළිගැණීමෙන් වෙන්වූයේ වීමි. කුකුළන් හූරන් පිළිගැණීමෙන් වෙන්වූයේ වීමි. ඇත් ගව අස් වෙළඹුන් පිළිගැණීමෙන් වෙන්වූයේ වීමි. කෙත් වත් පිළිගැණීමෙන් වෙන් වූයේ වීමි. දූතයන් විසින් කරණු ලබන පණිවුඩ පණත් ගෙණ යාමෙන් වෙන්වූයේ වීමි. තරාදි ලොහො සේරු ආදියෙන් කරණ සොර වෙළඳාමෙන් වෙන්වූයේ වීමි'

අල්ලස් ගැණීම්, රැවටුම්, රන්වැනි දෙය රන්ය යනාදීන් කරණ වඤ්චා යන මේ වංකකම්වලින් වෙන්වූයේවීමි.

'අත් පා කැපීම්, මැරීම්, බැඳීම්, සැඟවී මුළාකිරීම්, ගම් පැහැරීම්, බලයෙන් ගැනීම් ආදියෙන් වෙන්වූයේ වෙමි.

**17.** 'ඒ මම කයට පොහොනා තරම්වූ සිවුරෙන්ද කුසට පොහොනා තරමවූ පිණ්ඩපාතයෙන්ද සතුටු වූයේ වීමි. යම් යම් තැනකට ගියෙම්ද (සිවුරු පිරිකර) රැගෙණම ගියෙමි. යම්සේ

පක්ෂියෙක්, තෙම යම් යම් තැනකට පියාඹායේද, පියාපත් බර සහිතවම පියාඹායේ. ඇවැත්නි, එපරිද්දෙන්ම මම කය පොහොනා සිවුරින් කුස පොහොනා පිණ්ඩපාතයෙන් සතුටුවූයේ වීමි. යම් යම් තැනකට ගියෙමි. (ඒ ඒ තැනට සිවුරු පිරිකර) රැගෙනම ගියෙමි.

18. 'ඒ මම මේ ආයඹ්වූ ශීලස්කන්ධයෙන් සමන්විත වූයේ අධ්‍යාත්මිකවූ නිවැරදි සුවය වින්දෙමි.

ඒ මම ඇසින් රූප දැක නිමිති වශයෙන් නොගන්නේ, අනු ව්‍යඤ්ජන වශයෙන් නොගන්නේ වීමි. යම් හෙයකින් ඒ නිමිති ගැණීම හේතුකොටගෙණ චක්ඛුන්ද්‍රිය අසංවර කළවුන් අනුව ලොභය හා දොම්නස් නම්වූ පව්ටු අකුසල ධර්මයෝ වහනය වෙත්ද, එහෙයින් ඇසේ සංවරය පිණිස, පිළිපැද්දෙමි. ඇස රැක්කෙමි ඇසෙහි සංවරයට පැමිණියෙමි. කණින් ශබ්දය අසා ලකුණු වශයෙන් නොගන්නේ, කුඩා ලකුණු වශයෙන් නොගන්නේවීමි යම් හෙයකින් ඒ නිමිති ගැණීම හේතුකොටගෙණ සෝතෙන්ද්‍රිය අසංවර කළවුන් අනුව ලෝභ දොස යන පව්ටු අකුශල ධර්මයන් වහනය වෙත්ද, එහෙයින් ඔහුගේ සංවරය පිණිස පිළිපැද්දෙමි. නාසයෙන් ගන්ධය දැන ලකුණු වශයෙන් කුඩා ලකුණු වශයෙන් නොගන්නේ වීමි. යම් හෙයකින් ඒ ලකුණු වශයෙන් කුඩා ලකුණු වශයෙන් ගැනීම හේතුකොටගෙණ ඝාණෙන්ද්‍රිය ලකුණු වශයෙන් නොගන්නේ, කුඩා ලකුණු වශයෙන් නොගන්නේ, වීමි. යම් හෙයකින් ඒ නිමිති ගැණීම හේතුකොටගෙණ සොතෙන්ද්‍රිය සංවර කළවුන් අනුව ලෝභ දොස යන පව්ටු අකුශල ධර්මයන් වහනය වෙත්ද, එහෙයින් ඔහුගේ සංවරය පිණිස පිළිපැද්දෙමි. දිවෙන්ද රස විඳ ලකුණු වශයෙන් නොගන්නේ. කුඩා ලකුණු වශයෙන් නොගන්නේ වීමි. යම් හෙයකින් ඒ ලකුණු වශයෙන් ගැනීම කුඩා ලකුණු වශයෙන් ගැනීම හේතුකොටගෙණ ජිව්හෙන්ද්‍රිය ලකුණු වශයෙන් නොගන්නේ කුඩා ලකුණු වශයෙන් නොගන්නේ වීමි. යම් හෙයකින් ඒ නිමිති ගැනීම හේතුකොටගෙණ සොතෙන්ද්‍රිය සංවර කළවුන් අනුව ලොභ දොස යන පව්ටු අකුසල ධර්මයන් වහනය වෙත්ද, එහෙයින්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ඔහුගේ සංවරය පිණිස පිළිපැද්දෙමි. කයින් ස්පර්ශය ස්පර්ශකොට ලකුණු වශයෙන් නොගන්නේ, කුඩා ලකුණු වශයෙන් නොගන්නේ, වීමි. යම් හෙයකින් ඒ නිමිති ගැනීම හේතුකොටගෙණ කායෙන්ද්‍රිය ලකුණු වශයෙන් නොගන්නේ, කුඩා ලකුණු වශයෙන් නොගන්නේ වීමි. යම් හෙයකින් ඒ නිමිති ගැනීම හේතු කොටගෙණ සොතෙන්ද්‍රිය සංවර කළවුන් අනුව ලොභ දොස යන පවිටු අකුශල ධර්මයන් වහනය වෙත්ද, එහෙයින් ඔහුගේ සංවරය පිණිස පිළිපැද්දෙමි. මනසින් ධර්මය (ධර්මා ලම්බනය) දැන නිමිති වශයෙන් නොගන්නේ අනු ව්‍යඤ්ජන වශයෙන් නොගන්නේ වීමි. යම් හෙයකින් ඒ නිමිති ගැනීම හේතුකොට මනින්ද්‍රිය අසංවර කළ වුන් අනුව ලොභය හා දොම්නස නම් පවිටු අකුශල ධර්මයෝ වහනය වෙත්ද එහෙයින් සිතේසංවරය පිණිස පිළිපැද්දෙමි. මනින්ද්‍රිය රැක්කෙමි. මනින්ද්‍රියෙහි සංවරයට පැමිණියෙමි. ඒ මම මේ ආර්‍ය්‍යවූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූයේ අධ්‍යාත්මිකවූ කෙලෙස් හා අමිශ්‍රවූ සුවය වින්දෙමි.

19. 'ඒ මම ඉදිරියට යාමෙහිද, ආපසු ඊමෙහිද, නුවණින් යුක්තවූයේවීමි. ඉදිරිපස බැලීමෙහිද හැරී බැලීමෙහිද නුවණින් යුක්තවීමි. (අත්පා) දිගු කිරීමෙහිද, හැකිලීමෙහිද, නුවණින් යුක්තවීමි. සඟලසිවුර පාත්‍රසිවුරු දැරීමෙහිද නුවණින් යුක්ත වීමි. අනුභව කිරීමෙහි, පීමෙහි, කෑමෙහි රසවිඳ ගැන්මෙහි නුවණින් යුක්තවීමි. මලමුත්‍ර කිරීමෙහි නුවණින් යුක්තවීමි. යාමෙහි සිටීමෙහි හිඳීමෙහි නිදීමෙහි නිදිමැරීමෙහි කීමෙහි, නිශ්ශබ්දවීමෙහි නුවණින් යුක්තවීමි.

'ඒ මම මේ ආර්‍ය්‍ය වූ සීලස්කන්ධයෙන්ද සමන්විත වූයේ මේ ආර්‍ය්‍යවූ ඉන්ද්‍රිය සංවරයෙන්ද සමන්විත වූයේ මේ ආර්‍ය්‍යවූ සිහිනුවණින්ද යුක්ත වූයේ අරණ්‍යය, වෘක්ෂ මූලය, පර්වතයක කඳුරැළිය, ගිරිගුහාවය, සොහොනය, කැලෑවෙහිය, දුරසෙනසුනය (අභ්‍යවකාසය) එළිමහනය පිදුරුගොඩය යන විවේක සෙනසුනක් භජනය කෙළෙමි.

20. 'ඒ මම සවස් කල පිණ්ඩපාතයෙන් පෙරළා අවුත් අරමිනිය ගොතා හිඳ කය කෙළින් තබා සිහිය පෙරටුකොට එලවා හුන්නෙමි. ඒ මම ස්කන්ධ ලෝකයෙහි ආශාව දුරු කොට පහවූ ආශාවෙන් යුත් සිතින් විසීමි. ආශාවෙන් සිත පිරිසිදු කෙළෙමි. ක්‍රොධය හැර ක්‍රොධයෙන් තොරවූ සිත් ඇත්තේ සියළු සත්වයන් කෙරෙහි අනුකම්පා කරණ සුළුව විසීමි. ව්‍යාපාද දොෂයෙන් සිත පිරිසිදු කෙළෙමි. ථීනමිද්ධය හැර පහවූ ථීනමිද්ධය ඇත්තේ ආලොක සඥාවෙන් යුක්තවූයේ සිහියෙන් හා ප්‍රඥාවෙන් යුක්තවූයේ විසීමි. ථීනමිද්ධයෙන් සිත පිරිසිදු කෙළෙමි. උද්ධච්චකුක්කුච්චය හැර ඇතුළත සංසිඳවූ සිත් ඇත්තේ උද්ධච්චකුක්කුච්ච රහිතව විසීමි. උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙළෙමි. විචිකිච්ඡාව හැර එතර කළ විචිකිච්ඡා ඇත්තේ සැක රහිත වූයේ විසීමි. කුශල ධර්මයන්හි වූ සැකයෙන් සිත පිරිසිදු කෙළෙමි.

21. 'ඒ මම මේ ප්‍රඥාව දුර්වල කරන්නාවූ සිත කිලිටි කරන්නාවූ පඤ්ච නීවරණයන් හැර කාමයන්ගෙන් වෙන්ව, අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීති සුඛ ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ විසීමි. විතර්ක විචාරයන්ගෙන් සංසිඳීමෙන් ඇතුළත පහද වන්නාවූ සිත එකඟ කරන්නාවූ විතර්ක රහිතවූ විචාර රහිත වූ සමාධියෙන් හටගත් ප්‍රීති සුඛය ඇති දුතියධ්‍යානයට පැමිණ විසීමි. ප්‍රීතියෙන්ද වෙන්වීමෙන් උපෙක්ෂා සහිතවූයේ විසීමි. සිහියෙන් යුක්ත වූයේ ප්‍රඥාවෙන් යුක්ත වූයේ සුඛයද, කයින් වින්දෙමි. උපේකෂා සහිත වූයේ සිහියෙන් යුක්තවූයේ සුවසේ වෙසේයයි ඒ යම් ධ්‍යානයකට ආර්‍ය්‍යයෝ කියත්ද, ඒ තෘතියධ්‍යානයට පැමිණ විසීමි. සුඛයද පහ කිරීමෙන් දුක්ඛයද පහ කිරීමෙන් පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනාගේ දුරු කිරීමෙන් දුක්ද නොවූ සැපද නොවූ උපෙක්ෂාවෙන් හා සිහියෙන් පිරිසිදුවූ චතුර්ථ ධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි.

22. 'ඒ මම මෙසේ සිත සමාධිගතවූ කල්හි පිරිසිදුවූ කල්හි කෙලෙස් රහිත වූ කල්හි උපක්ලේෂ රහිතවූ කල්හි මෘදුවූ කල්හි,

කර්මණ්‍ය වූ කල්හි නිශ්චල වූ කල්හි නොසැලෙන බවට පැමිණියාවූ කල්හි ආශ්‍රවයන්ගේ ක්ෂය පිණිස සිත නැමීමි.

'ඒ මම මේ දුකයයි තත්වූ පරිදි දැනගත්තෙමි මේ දුක්ඛ සමුදය (දුක් ඉපදීමේ හේතුව) යයි තත්වූ පරිදි දැනගත්තෙමි. මේ දුක්ඛ නිරොධය (දුක් නැතිවීම) යයි තත්වූ පරිදි දැන ගත්තෙමි. මේ දුක්ඛ නිරොධ ගාමිණී ප්‍රතිපදාව (දුක් නැති කිරීමේ ප්‍රතිපත්තිය) යයි තත්වූ පරිදි දැන ගත්තෙමි. මේ ආශ්‍රවයෝ යයි තත්වූ පරිදි දැන ගත්තෙමි. මේ ආශ්‍රව ඉපදීමේ හේතුව (ආසව සමුදය) යයි තත්වූ පරිදි දැන ගත්තෙමි. මේ ආශ්‍රව නැතිවීම (ආසව නිරොධ) යයි තත්වූ පරිදි දැනගත්තෙමි. මේ ආශ්‍රව නිරොධයට යන ප්‍රතිපදාව (ආසව නිරොධ ගාමිණී පටිපදා) යයි තත්වූ පරිදි දැන ගත්තෙමි.

23. 'මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ මාගේ සිත කාමාශ්‍රවයන්ගෙන්ද මිදුනේය. භවාශ්‍රවයන්ගෙන්ද මිදුනේය. අවිද්‍යාශ්‍රවයන්ගෙන්ද සිත මිදුනේය. මිදීමෙහි මිදුණේය යන නුවණ පහළ විය. නැවත නැවත ඉපදීම නැති විය. බ්‍රහ්මචර්‍ය්‍යාව වැස නිමවන ලදි, කටුයතු දෑ කරණ ලදි. මේ (දුක් නැතිකිරීම) මින්මතු කළ යුත්තක් නැතැයි දැනගතිමි.

"ඇවැත්නි, 'මේ විඤ්ඤාණ සහිත කයෙහිද බාහිරවූ සියළු නිමිතින්ද මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ මාගේ මමය මාගේයයි ගන්නා මානානුශයෝ මැනවින් උපුටා දමන ලදහ' කියායි.

24. "ඇවැත්නි, ඒ භික්ෂුවගේ කීම යහපතැයි කියා පිළිගත යුතුයි. ඒ අනුව සතුටු විය යුතුයි. යහපතැයි ඒ කීම පිළිගෙණ ඒ අනුව සතුටුව මෙසේ කියයුතු වන්නේය. යම් හෙයකින් එබඳු ආයුෂ්මත්වූ බ්‍රහ්මචාරී කෙනෙක් දකිමුද, ඇවැත්නි, එය අපට ලාභයකි. ඇවැත්නි, එය අපට මනාවූ ලාභයකි."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටුවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය පිළිගත්තාහුය.

**දෙවෙනි ඡබ්බිසොධන සූත්‍රය නිමි. (2-2)**

---

# 13. සප්පුරිස සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවසනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි," කියා භික්ෂූන්ට කථාකළසේක. "ස්වාමීනියි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. "මහණෙනි, තොපට සත්පුරුෂ ධර්මයද අසත්පුරුෂ ධර්මයද දෙශනාකරන්නෙමි. එය අසව්, මැනවින් මෙනෙහි කරව්, දෙශනා කරන්නෙමි"යි කියායි 'ස්වාමීනි, එසේයයි' ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

2. "මහණෙනි, අසත්පුරුෂ ධර්මය කුමක්ද? මහණෙනි, මේ ශාසනයෙහි අසත්පුරුෂයෙක්තෙම උසස් කුලයකින් නික්ම පැවිදිවූයේ වේද, හෙතෙම මෙසේ කල්පනා කරයි. "මම වනාහි උසස් කුලයකින් නික්ම පැවිදිවූයේ වෙමි. මේ අනික් භික්ෂූහු වනාහි උසස් කුලයෙන් නික්ම පැවිදි වූවෝ නොවෙති." හෙතෙම ඒ උසස් කුලවත්බව නිසා තමා උසස්කොට සලකයි. අනුන් පහත්කොට සලකයි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයකි.

3. "මහණෙනි, සත්පුරුෂතෙමේ වනාහි මෙසේ කල්පනා කරයි. 'උසස් කුලවත්බව කරණකොටගෙන ලොභ ස්වභාවයෝ අඩුවීමට නොයෙති. ද්වෙෂ ස්වභාවයෝ (කොපය) හෝ අඩුවීමට නොයෙති. මෝහ ස්වභාවයෝ හෝ අඩුවීමට නොයති. ඉදින් උසස් කුලයෙන් නික්ම පැවිදි නොවූ නමුදු හෙතෙම ධර්මය අනුව පිළිපදින්නේ, සුදුසු පිළිවෙතට පිළිපන්නේ, ධර්මය අනුව හැසිරෙන්නේ වේද, හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් පිළිපැදිය යුතුවේ. හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් ප්‍රශංසා කටයුතුවේය කියායි. හෙතෙම ඒ ප්‍රතිපත්තියම අභ්‍යන්තරකොට ඒ උසස් කුලවත්බව කරණකොට ගෙන තමා උසස්කොට නොසිතයි. අනුන් පහත්කොට නොසිතයි මහණෙනි, මෙය සත්පුරුෂ ධර්මයකි.

4. "තවද මහණෙනි, අසත්පුරුෂ තෙමේ මහා කුලයකින් පැවිදිවූයේ වේද, හෙතෙම මෙසේ කල්පනා කරයි. මම වනාහි මහා කුලයකින් නික්ම පැවිදි වූයේ වෙමි. මේ අනිත් භික්ෂූහු වනාහි මහා කුලයෙන් නික්ම පැවිදි වූවෝ නො වෙත්ය කියායි. හෙතෙම ඒ මහත්වූ කුලවත් බව නිසා තමා උසස් කොට සලකයි. මහණෙනි, මෙය ද අසත්පුරුෂ ධර්මයකි. මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ කල්පනා කරයි. මහත්වූ කුලවත් බව කරණකොට ගෙණ ලොභ ස්වභාවයෝ අඩුවීමට නොයෙති. ද්වෙෂස්වභාවයෝ හෝ අඩුවීමට නොයෙති. මොහ ස්වභාවයෝ හෝ අඩුවීමට නොයෙති. ඉදින් මහත් කුලයෙන් නික්ම පැවිදි නොවූ නමුදු හෙතෙම ධර්මය අනුව පිළිපදින්නේ, සුදුසු පිළිවෙතට පිළිපන්නේ, ධර්මය අනුව හැසිරෙන්නේ වේද, හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් පිදියයුතු වේ. හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් ප්‍රශංසා කළයුතු වේය කියායි. හෙතෙම ප්‍රතිපත්තියම අභ්‍යන්තරකොට ඒ මහත් කුලවත් බව කරණකොට ගෙණ තමා උසස් කොට නොසිතයි. අනුන් පහත්කොට නොසිතයි. මහණෙනි; මෙයද සත්පුරුෂ ධර්මයකි. මහත් වස්තුව ඇති කුලයකින් නික්ම පැවිදි වූයේ වේ ද, හෙතෙම මෙසේ කල්පනා කරයි. මම වනාහි මහත් වස්තුව ඇති කුලයෙන් නික්ම පැවිදි වූයේ වෙමි. මේ අනිත් භික්ෂූහු වනාහි මහත් වස්තුව ඇති කුලයෙන් නික්ම පැවිදි වූවෝ නොවෙත්ය කියායි. හෙතෙම ඒ උසස් වස්තුව ඇති කුලවත් බව නිසා තමා උසස් කොට සලකයි. අනුන් පහත් කොට සලකයි. මහණෙනි, උසස් වස්තුව ඇති කුලයෙන් නික්ම පැවිදි වූයේ වේද, හෙතෙම මෙසේ කල්පනා කරයි. 'මම වනාහි උසස් වස්තුව ඇති කුලයෙන් නික්ම පැවිදි වූයේ වෙමි. මේ අනික් භික්ෂූහු වනාහි උසස් වස්තුව ඇති කුලයෙන් නික්ම පැවිදි වූවෝ නොවෙත්ය' කියායි. හෙතෙම ඒ උසස් වස්තුව ඇති කුලවත් බව නිසා තමා උසස් කොට සලකයි. අනුන් පහත් කොට සලකයි. මහණෙනි, මෙය ද අසත්පුරුෂ ධර්මයකි.

5. "මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ කල්පනා කරයි. උසස් වස්තුව ඇති බැවින් ලොභ ස්වභාවයෝ අඩුවීමට

නොයෙත් ද්වෙෂ ස්වභාවයෝ අඩුනොවීමට නොයෙත්. මොහ ස්වභාවයෝ අඩුවීමට නොයෙති. ඉදින් උසස් වස්තුව ඇති කුලයකින් නික්ම පැවිදි නොවූයේ වේද, හෙතෙම ධර්මය අනුව පිළිපදින්නේ සුදුසු පිළිවෙතට පිළිපන්නේ ධර්මය අනුව හැසිරෙන්නේ වේද, හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් පිදිය යුතු වේ. හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් ප්‍රශංසා කටයුතු වේ කියායි. හෙතෙම ප්‍රතිපත්තියම අභ්‍යන්තරකොට ඒ උසස් වස්තුව ඇති බැවින් තමන් උසස් කොට නොසිතයි. අනුන් පහත්කොට නොසලකයි' මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

**6** "තවද මහණෙනි, අසත්පුරුෂ තෙමේ ප්‍රසිද්ධ වූයේ පිරිවර ඇත්තේ වේද, හෙතෙම මෙසේ කල්පනා කරයි. 'මම වනාහි ප්‍රසිද්ධ වූයෙම් පිරිවර ඇත්තේ වෙමි. මේ අනික් භික්ෂූහු ප්‍රසිද්ධ නොවූවෝය. යස පිරිවර ඇත්තෝද නො වෙති,යි' කියායි. හෙතෙම ඒ ප්‍රසිද්ධ බව කරණකොට ගෙන තමා උසස්කොට සිතයි. අනුන් පහත්කොට සලකයි. මහණෙනි, මෙයද අසත් පුරුෂ ධර්මයකි.

7. "මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ කල්පනා කරයි. 'ප්‍රසිද්ධ බව කරණකොටගෙන ලොභ ස්වභාවයෝ අඩුවීමට නොයෙති. ද්වෙෂ ස්වභාවයෝ අඩුවීමට නොයෙති. මොහ ස්වභාවයෝ අඩුවීමට නොයෙති. ඉදින් අප්‍රකටවූ පිරිවර නැත්තේ නමුදු හෙතෙම ධර්මය අනුව පිළිපදින්නේ සුදුසු පිළිවෙතට පිළිපන්නේ, ධර්මය අනුව හැසිරෙන්නේ වේද, හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් පිදියයුතු වේ. හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් ප්‍රශංසා කටයුතු වේ කියායි. හෙතෙම ප්‍රතිපත්තියම අභ්‍යන්තරකොට ඒ ප්‍රසිද්ධ බැවින් තමා උසස්කොට නොසිතයි, අනුන් පහත්කොට නොසලකයි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

8. "තවද මහණෙනි, අසත්පුරුෂ තෙමේ චීවර, පිණ්ඩපාත, සෙනාසන, ගිලානප්‍රත්‍යය යන සිව්පසය ලබන්නෙක් වේද, හෙතෙම මෙසේ කල්පනා කරයි. 'මම වනාහි චීවර, පිණ්ඩපාත, සේනාසන ගිලානප්‍රත්‍යය යන සිව්පසය ලබන්නෙම් වෙමි. අනික්

භික්ෂූහු එසේ චීවර, පිණ්ඩපාත, සෙනාසන, ගිලානප්‍රත්‍යය නොලබත්ය' කියායි. හෙතෙම ඒ ලාභය කරණ කොටගෙන තමා උසස්කොට සලකයි. අනුන් හෙළාදකියි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයකි.

9. "මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ කල්පනා කරයි. 'ලාභය කරණකොටගෙන ලොභ ස්වභාවයෝ අඩුවීමට නොයෙත්. ද්වෙෂ ස්වභාවයෝ අඩුවීමට නොයෙත්. මොහ ස්වභාවයෝ අඩුවීමට නොයෙත්. ඉදින් චීවර, පිණ්ඩපාත, සෙනාසන, ගිලානප්‍රත්‍යයන් නොලබන්නේ නමුදු, හෙතෙම ධර්මය අනුව පිළිපදින්නේ සුදුසු පිළිවෙතට පිළිපන්නේ ධර්මය අනුව හැසිරෙන්නේ වේද, හේ භික්ෂූන් අතුරෙන් පිදිය යුතුවේ' හේ භික්ෂූන් අතුරෙන් ප්‍රශංසා කටයුතුවේ. හෙතෙම ප්‍රතිපත්තියම අභ්‍යන්තරකොට ඒ ලාභය කරණකොටගෙන තමා උසස්කොට නොසිතයි. අනුන් පහත්කොට නොසලකයි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

10. "තවද මහණෙනි, අසත්පුරුෂ තෙමේ බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේ වේද, හෙතෙම මෙසේ කල්පනා කරයි. 'මම වනාහි බහුශ්‍රැත වෙමි. මේ අන්‍ය භික්ෂූහු බහුශ්‍රැතයෝ නොවෙතියි' කියායි. හෙතෙම ඒ බහුශ්‍රැත බැවින් තමා උසස්කොට සලකයි. අනුන් හෙළාදකියි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයකි.

11. "මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ කල්පනා කරයි. බහුශ්‍රැත බව කරණකොටගෙන ලොභ ස්වභාවයෝ හෝ පිරිහීමට නොයෙති. ද්වෙෂ ස්වභාවයෝ හෝ පිරිහීමට නොයෙති. මොහ ස්වභාවයෝ පිරිහීමට නොයෙති. ඉදින් බහුශ්‍රැත නොවූයේ නමුදු, හෙතෙම ධර්මය අනුව පිළිපදින්නේ, සුදුසු පිළිවෙතට පිළිපන්නේ, ධර්මය අනුව හැසිරෙන්නේ වේද, හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් පිදිය යුතු වේ. හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් ප්‍රශංසා කටයුතුවේ' කියායි. හෙතෙම ප්‍රතිපත්තියම අභ්‍යන්තරකොට ඒ බහුශ්‍රැත බව කරණකොටගෙන තමා උසස්කොට නොසලකයි. අනුන් පහත්කොට නොසලකයි.

අනුන් පහත්කොට නොසිතයි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

12. "තවද මහණෙනි, අසත්පුරුෂ තෙමේ විනයධරයෙක් වේද, හෙතෙම මෙසේ කල්පනා කරයි. 'මම වනාහි විනයධරයෙක් වෙමි. මේ අන්‍ය භික්ෂූහු විනයධරයෝ නොවෙති' කියාය. හෙතෙම ඒ විනයධර බැවින් තමා උසස් කොට සලකයි. අනුන් හෙළාදකියි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයකි.

13. "මහණෙනි සත්පුරුෂතෙමේ වනාහි මෙසේකල්පනා කරයි. 'විනයධර බව කරණකොට ගෙන ලොභ ස්වභාවයෝ හෝ පිරිහීමට නොයෙති. ද්වෙෂ ස්වභාවයෝ පිරිහීමටනොයෙති. මොහ ස්වභාවයෝ හෝ පිරිහීමට නොයෙකි. ඉදින් විනය ධරයෙක් නොවූයේ නමුදු හෙතෙම ධර්මය අනුව පිළිපදින්නේ, සුදුසු පිළිවෙතට පිළිපන්නේ, ධර්මය අනුව හැසිරෙන්නේ වේද, හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් පිදිය යුතු වේ. හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් ප්‍රශංසා කටයුතු වෙයි' කියායි. හෙතෙම ප්‍රතිපත්තියම අභ්‍යන්තරකොට ඒ විනයධර බව කරණකොට ගෙන තමා උසස්කොට නොසලකයි. අනුන් පහත්කොට නොසිතයි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

14. "තවද මහණෙනි, අසත්පුරුෂ තෙමේ ධර්ම කථිකයෙක්වේද, හෙතෙම මෙසේ කල්පනා කරයි. 'මම වනාහි ධර්ම කථිකයෙක් වෙමි. අනික් භික්ෂූහු ධර්ම කථිකයෝ නොවෙති'යි කියායි. හෙතෙම ඒ ධර්ම කථික බව කරණ කොට ගෙන තමා උසස්කොට සලකයි. අනුන් හෙළාදකියි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයෙකි.

15. "මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ කල්පනා කරයි. 'ධර්ම කථික බව කරණකොටගෙන ලොභ ධර්මයෝ තුනී නොවෙති. ද්වෙෂ ධර්මයෝ තුනී නොවෙති. මොහ ධර්මයෝ තුනී නොවෙති. ඉදින් ධර්ම කථිකයෙක් නොවන නමුදු හෙතෙම ධර්මය අනුව පිළිපදින්නේ, සුදුසු පිළිවෙතට

පිළිපන්නේ, ධර්මය අනුව හැසිරෙන්නේ වේද, හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් පිදිය යුතු වේ. හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් ප්‍රශංසා කටයුතු වේ' කියායි. හෙතෙම ප්‍රතිපත්තියම අභ්‍යන්තරකොට ඒ ධර්ම කථික බව කරණ කොටගෙන තමා උසස්කොට නොසිතයි. අනුන් පහත්කොට නොසලකයි මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

16. "තවද මහණෙනි, අසත්පුරුෂ තෙමේ ආරණ්‍යකයෙක් (වනයෙහි වසන්නෙක්) වේද, හෙතෙම මෙසේ කල්පනා කරයි මම වනාහි ආරණ්‍යකයෙක් වෙමි. මේ අනික් භික්ෂූහු ආරණ්‍යකයෝ නොවෙතියි' කියායි. හෙතෙම මේ ආරණ්‍යක බව කරණ කොටගෙන තමා උසස් කොට සිතයි. අනුන් හෙළා දකියි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයකි.

17. "මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ කල්පනා කරයි. 'ආරණ්‍යයක බව කරණකොට ගෙන ලොභ ධර්මයෝ අඩු නොවෙති. ද්වෙෂධර්මයෝ අඩු නොවෙති. මොහ ධර්මයෝ අඩු නොවෙති. ඉදින් ආරණ්‍යයකයෙක් නොවන නමුදු හෙතෙම ධර්මය අනුව පිළිපදින්නේ, සුදුසු පිළිවෙතට පිළිපන්නේ, ධර්මය අනුව හැසිරෙන්නේ වේද, හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් පිදිය යුතුවේ. හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් ප්‍රශංසා කටයුතු වේ. හෙතෙම ප්‍රතිපත්තියම අභ්‍යන්තර කොට ඒ ආරණ්‍ය බව කරණකොට ගෙන තමා උසස්කොට නොසිතයි. අනුන් පහත් කොට නොසලකයි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

18. 'තවද මහණෙනි, අසත්පුරුෂ තෙමේ පාංශුකූලිකයෙක් (පාංශුකූල සිවුරු දරන්නෙක්) වේද, හෙතෙම මෙසේ කල්පනා කරයි. 'මම වනාහි පාංශුකූලිකයෙක් වෙමි. මේ අනික් භික්ෂූහු පාංශුකූලිකයෝ නොවෙති' කියායි. හෙතෙම ඒ පාංශුකූලික බැවින් තමා උසස් කොට සලකයි. අනුන් හෙළා දකියි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයකි.

19. "මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ කල්පනා කරයි. 'පංශුකූලික බව කරණකොටගෙන ලෝභ ධර්මයෝ හෝ

ක්ෂයවීමට නොයෙති. ද්වෙෂ ධර්මයෝ හෝ ක්ෂය වීමට නොයෙති. මොහ ධර්මයෝ හෝ ක්ෂයවීමට නොයෙති. ඉදින් පාංශුකූලිකයෙකු නොවන නමුදු හෙතෙම ධර්මය අනුව පිළිපදින්නේ, සුදුසු පිළිවෙතට පිළිපන්නේ, ධර්මය අනුව හැසිරෙන්නේ වේද, හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් පිදිය යුතුවේ. හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් ප්‍රශංසා කළ යුතුවේ' කියායි. හෙතෙම ප්‍රතිපත්තියම අභ්‍යන්තරකොට ඒ පාංශුකූලිකත්වය කරණ කොටගෙන තමා උසස්කොට නොසිතයි. අනුන් පහත්කොට නොසලකයි මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

**20.** "තවද මහණෙනි, අසත්පුරුෂතෙම පිණ්ඩපාතිකයෙක් (පිණ්ඩපාතිකාංගය සමාදන් වූවෙක්) වේද, හෙතෙම මෙසේ සිතයි 'මේ වනාහි පිණ්ඩපාතිකයෙක් වෙමි. මේ අනික් භික්ෂූහු පිණ්ඩපාතිකයෝ නොවෙත්ය' කියායි. හෙතෙම ඒ පිණ්ඩපාතික බව කරණකොටගෙන තමා උසස්කොට සලකයි. අනුන් හෙළාදකියි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයකි.

**21.** "මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ කල්පනා කරයි. 'පිණ්ඩපාතික බව කරණකොටගෙන ලෝභ ධර්මයෝ හෝ ක්ෂයවීමට නොයෙති. ද්වෙෂ ධර්මයෝ හෝ ක්ෂය බවට නොපැමිණෙති. මෝහ ධර්මයෝ හෝ ක්ෂයබවට නොපැමිණෙති. ඉදින් පිණ්ඩපාතිකයෙක් නොවන නමුදු හෙතෙමේ ධර්මය අනුව පිළිපදින්නේ, සුදුසු පිළිවෙතට පිළිපන්නේ, ධර්මය අනුව හැසිරෙන්නේ වේද, හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් පිදිය යුතුවේ. හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් ප්‍රශංසා කටයුතු වේ' කියායි. හෙතෙම ප්‍රතිපත්තියම අභ්‍යන්තරකොට ඒ පිණ්ඩපාතික බව කරණ කොටගෙන තමා උසස්කොට නොසිතයි. අනුන් පහත්කොට නොසලකයි. මහණෙනි, මේ සත්පුරුෂ ධර්මයකි.

**22.** "තවද මහණෙනි, අසත්පුරුෂ තෙමේ (වෘක්ෂ මූලිකාංගය සමාදන්වූයේ,) රුක්ඛ මූලිකයෙක්වේද, හෙතෙම මෙසේ සිතයි. 'මම වනාහි වෘක්ෂමූලිකයෙක් වෙමි. මේ අනික් භික්ෂූහු වෘක්ෂමූලිකාංගය සමාදන්වූවෝ නොවෙත්ය' කියායි.

හෙතෙම ඒ වෘක්ෂමූලිකාංගය කරණකොටගෙන තමා උසස්කොට සිතයි. අනුන් හෙළාදකියි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයකි.

23. "මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ කල්පනා කරයි. 'වෘක්ෂමූලිකාංගය සමාදන්වූ බැවින් ලෝභ ධර්මයෝ හෝ ක්ෂයබවට නොයෙති. ද්වෙෂ ධර්මයෝ හෝ ක්ෂයබවට නොයෙති. මොහ ධර්මයෝ හෝ ක්ෂයබවට නොයෙති. ඉදින් වනාහි වෘක්ෂමූලිකයෙක් නොවූයේ නමුදු හෙතෙමේ ධර්මය අනුව පිළිපදින්නේ, සුදුසු පිළිවෙතට පිළිපන්නේ, ධර්මය අනුව හැසිරෙන්නේ වේද, හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් පිදියයුතු වේ. හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් ප්‍රශංසා කටයුතු වේ' කියායි. හෙතෙම ප්‍රතිපත්තියම අභ්‍යන්තරකොට ඒ වෘක්ෂමූලික බව කරණකොට ගෙන තමා උසස්කොට නොසිතයි. අනුන් පහත්කොට නොසලකයි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

24. "තවද මහණෙනි, අසත්පුරුෂතෙමේ සොසානිකාංගය ඇත්තෙක් වේද, හෙතෙම මෙසේ සිතයි. 'මම වනාහි සොසානිකාංගය ඇත්තෙක් වෙමි. මේ අනිත් භික්ෂූහු සොසානිකාංගය ඇත්තෝ නොවෙත්' කියායි. හෙතෙම ඒ සොසානිකාංගය කරණකොට ගෙණ, තමා උසස්කොට සිතයි. අනුන් හෙළාදකියි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයකි.

"මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ කල්පනා කරයි. 'සොසානිකාංගය ඇත්තේවී නමුත් ලොභධර්මයෝ හෝ ක්ෂයබවට නොයෙති. ද්වෙෂ ධර්මයෝ හෝ ක්ෂයබවට නොයෙති. මෝහධර්මයෝ හෝ ක්ෂයබවට නොයෙති. ඉදින් සොසානිකාංගය නැත්තේවී නමුදු හෙතෙමේ ධර්මය අනුව පිළිපදින්නේ, සුදුසු පිළිවෙතට පිළිපන්නේ, ධර්මය අනුව හැසිරෙන්නේ වේද, හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් පිදියයුතුවේ. හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් ප්‍රශංසා කළ යුතුවේ' කියායි. හෙතෙම ප්‍රතිපත්තියම අභ්‍යන්තරකොට ඒ සොසානිකාංගය කරණකොටගෙණ තමා උසස්කොට නොසිතයි. අනුන් පහත් කොට නොසලකයි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

25. "තවද මහණෙනි, අසත්පුරුෂ තෙමේ අබ්භොකාසිකාංග ඇත්තෙක් වේද, හෙතෙම මෙසේ සිතයි. 'මම වනාහි අබ්භොකාසිකාංගය සමාදන් වූයෙක් වෙමි. මේ අනිත් භික්ෂූහු අබ්භොකාසිකාංගය සමාදන් නොවූවෝය' කියායි. හෙතෙම ඒ අබ්භොකාසිකාංගය කරණකොට ගෙණ, තමා උසස්කොට සිතයි. අනුන් හෙළාදකියි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයකි.

"මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ කල්පනා කරයි. 'අබ්භොකාසිකාංගය සමාදන් වූයේ වී නමුත් ලෝභ ධර්මයෝ හෝ පිරිහීමට නොයෙති. ද්වෙෂධර්මයෝ හෝ පිරිහීමට නොයෙති. මෝහ ධර්මයෝ හෝ පිරිහීමට නොයෙති. ඉදින් අබ්භොකාසිකාංගය සමාදන් නොවූයේ වී නමුදු හෙතෙමේ ධර්මය අනුව පිළිපදින්නේ, සුදුසු පිළිවෙතට පිළිපන්නේ, ධර්මය අනුව හැසිරෙන්නේ වේද, හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් පිදිය යුතුවේ. හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් ප්‍රශංසා කළයුතු වේය යනුවෙනි. හෙතෙම ඒ ප්‍රතිපත්තියම අභ්‍යන්තරකොට ඒ අබ්භොකාසිකාංගය කරණකොටගෙණ, තමා උසස්කොට නොසිතයි. අනුන් පහත්කොට නොසලකයි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

26. "තවද මහණෙනි, අසත්පුරුෂ තෙමේ නෙසජ්ජිකාංගයෙන් යුක්ත වූයේ වෙයිද, හෙතෙම මෙසේ සිතයි. 'මම වනාහි නෙසජ්ජිකාංගයෙන් යුක්ත වූයේ වෙමි. මේ අන්‍ය භික්ෂු නෙසජ්ජිකාංගයෙන් යුක්ත වූවෝ නොවෙත්' කියායි. හෙතෙම නෙසජ්ජිකාංගය කරණකොට ගෙණ තමා උසස් කොට සිතයි. අනුන් පහත් කොට සලකයි. මහණෙනි මෙයද අසත්පුරුෂ ධර්මයෙකි.

"මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ කල්පනා කරයි. 'නෙසජ්ජිකාංගයෙන් යුක්ත වූයේ වී නමුත් ලෝභ ධර්මයෝ හෝ ක්ෂයවීමට නොපැමිණෙත්, ද්වෙෂ ධර්මයෝ හෝ නැතිවීමට නොපැමිණෙත්, මොහ ධර්මයෝ හෝ නැතිවීමට නොපැමිණෙත්. ඉදින් නෙසජ්ජිකාංගයෙන් යුක්ත නොවූයේ

නමුත් හෙතෙම ධර්මය අනුව පිළිපදින්නේ, සුදුසු පිළිවෙතෙහි පිළිපදින්නේ, ධර්මයට අනුව හැසිරෙන්නේ වේද, හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් පිදිය යුත්තෙක් වෙයි, ප්‍රශංසා කළ යුත්තෙක් වෙයි' කියායි. හෙතෙම ප්‍රතිපත්තියම අභ්‍යන්තර කොට ඒ නෙසජ්ජිකාංගය කරණ කොට ගෙන තමා උසස් කොට නොසිතයි. අනුන් පහත් කොට නොසලකයි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

27. "තවද මහණෙනි, අසත්පුරුෂ තෙමේ යථාසන්ථතිකාංග ඇත්තෙක් වෙයිද, හෙතෙම මෙසේ සිතයි,' මම වනාහි යථාසන්ථතිකාංගයෙන් යුක්ත වූයේ වෙමි. මේ අනික් භික්ෂූහු යථාසන්ථිතිකාංගයෙන් යුක්ත වූවෝ නොවෙති කියායි. හෙතෙම ඒ යථාසන්ථිතිකාංගය කරණ කොට ගෙන තමා උසස් කොට සිතයි. අනුන් පහත් කොට සලකයි. මෙයද අසත් පුරුෂ ධර්මයෙකි, මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ කල්පනා කරයි. 'යථාසන්ථිතිකාංගයෙන් යුක්ත වූයේ වී නමුත් ලෝභ ධර්මයෝ නැතිවීමට නොපැමිණෙත්. ද්වෙෂ ධර්මයෝ නැතිවීමට නොපැමිණෙත්. මෝහ ධර්මයෝ නැතිවීමට නොපැමිණෙත්. ඉදින් යථාසන්ථිතිකාංගයෙන් යුක්ත නොවූයේ වී නමුත් හෙතෙමේ ධර්මය අනුව පිළිපදින්නේ සුදුසු පිළිවෙතෙහි පිළිපදින්නේ ධර්මයට අනුව හැසිරෙන්නේ වේද, හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් පිදිය යුත්තෙක් වෙයි,' ප්‍රශංසා කළ යුත්තෙක් වෙයි, කියායි. හෙතෙම ඒ ප්‍රතිපත්තියම අභ්‍යන්තරකොට ගෙන ඒ යථාසන්ථිතිකාංගය කරණ කොට ගෙන තමා උසස් කොට නොසිතයි, අනුන් පහත් කොට නොසලකයි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

28. "තවද මහණෙනි, අසත්පුරුෂ තෙමේ ඒකාසනිකාංග ඇත්තෙක්වේද, හෙතෙම මෙසේ කල්පනා කරයි. 'මම වනාහි ඒකාසනිකාංග ඇත්තේ වෙමි. මේ අනික් භික්ෂූහු ඒකාසනිකාංග ඇත්තෝ නොවෙත්ය' කියායි. හෙතෙම ඒ ඒකාසනිකාංග ඇති බැවින් තමා උසස් කොට සලකයි. අනුන් හෙළාදකියි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයකි.

"මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ සිතයි. 'ඒකාසනිකාංගයෙන් යුක්ත වූයේ වී නමුත් ලෝභධර්මයෝ නැතිවීමට නොයෙති. ද්වෙෂ ධර්මයෝ නැති වීමට නොයෙති. මොහධර්මයෝ නැති වීමට නොයෙති. ඒකාසනිකාංග ඇත්තේ නොවූයේ වී නමුදු හෙතෙමේ ධර්මය අනුව පිළිපදින්නේ, සුදුසු පිළිවෙතට පිළිපන්නේ, ධර්මය අනුව හැසිරෙන්නේ වේද, හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් පිදිය යුතුවේ. හෙතෙම ඒ භික්ෂූන් අතුරෙන් ප්‍රශංසා කටයුතු වේ, කියායි. හෙතෙම ප්‍රතිපත්තියම අභ්‍යන්තරකොට එම ඒකාසනික බව කරණ කොට ගෙණ තමා උසස් කොට නොසිතයි. අනුන් පහත්කොට නොසලකයි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

29. "තවද මහණෙනි, අසත්පුරුෂතෙම කාමයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ, විචාර සහිතවූ, විවේකයෙන් හටගත්තාවූ ප්‍රීතිසැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි. හෙතෙම මෙසේ කල්පනා කරයි. 'මම වනාහි ප්‍රථමධ්‍යාන සමාපත්තිය ලාභියෙක් වෙමි. මේ අනික් භික්ෂුහු ප්‍රථමධ්‍යාන සමාපත්ති ලාභීහු නොවෙත්ය' කියායි. හෙතෙම ඒ ප්‍රථම ධ්‍යාන සමාපත්තිය කරණකොටගෙන තමා උසස්කොට සලකයි. අනුන් හෙළාදකියි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයකි.

"මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ සිතයි. 'මහණෙනි, ප්‍රථමධ්‍යාන සමාපත්තියෙනුදු තෘෂ්ණා රහිත වන බව භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලදී. යම් යම් ආකාරයකින් තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් හඟිත්ද, එය එයින් අන් අයුරකින්ම වේ.' හෙතෙම තෘෂ්ණා රහිත බවම කරුණු කොට ඒ ප්‍රථමධ්‍යාන සමාපත්තියෙන් තමා උසස් කොට නොසිතයි. අනුන් පහත්කොට නොසලකයි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

30. "තවද මහණෙනි, අසත්පුරුෂ තෙමේ විතර්ක විචාරයන්ගේ සංසිඳුවීමෙන් සිත පහදවන්නාවූ සිත එකඟ කරන්නාවූ විතර්ක රහිතවූ විචාර රහිතවූ ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම මෙසේ කල්පනා කරයි. 'මම වනාහි

ද්විතීය ධ්‍යාන ලාභියෙක් වෙමි. මේ අනික් භික්ෂූහු ද්විතීය ධ්‍යාන ලාභීහු නොවෙත්" කියායි. හෙතෙම මේ ද්විතීය ධ්‍යාන සමාපත්තිය කරණ කොට ගෙන තමා උසස් කොට සලකයි. අනුන් පහත් කොට සලකයි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයකි.

"මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ සිතයි, 'මහණෙනි, ද්විතීය ධ්‍යාන සමාපත්තියෙනුදු තෘෂ්ණා රහිත වන බව භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරනලදී, යම් යම් ආකාරයකින් තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් හඟිද්ද, එය එයින් අන් අයුරකින්මවේ.' හෙතෙම ඒ තෘෂ්ණා රහිත බව කරුණු කොට තමා උසස් කොට නො සිතයි. අනුන් පහත් කොට නොසිතයි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

31. "තවද මහණෙනි, අසත් පුරුෂ තෙමේ ප්‍රීතියද දුරු කිරීමෙන් උපෙක්ෂාවෙන් යුක්තව වාසය කරයි. සිහි නුවණ දෙකින් යුක්තව කයින්ද සැපය විඳියි. යම් ධ්‍යානයක් උපේක්ෂාවෙන් යුක්ත වූයේ සිහියෙන් යුක්ත වූයෙන් සැපයෙන් යුක්තව වාසය කෙරේයයි, ආර්‍යයෝ කියත්ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම මෙසේ සිතයි. 'මම වනාහි තෘතීය ධ්‍යාන ලාභියෙක් වෙමි. මේ අනික් භික්ෂූහු තෘතීය ධ්‍යාන ලාභීහු නොවෙත්' කියායි. හෙතෙම ඒ තෘතීය ධ්‍යාන සමාපත්තිය කරණ කොට ගෙන තමා උසස් කොට සලකයි. අනුන් පහත් කොට සලකයි. මහණෙනි, මෙයද අසත් පුරුෂ ධර්මයකි.

"මහණෙනි, සත්පුරුෂ තෙමේ වනාහි මෙසේ සිතයි. 'මහණෙනි, මේ තෘතීය ධ්‍යාන සමාපත්තියෙනුදු තෘෂ්ණා රහිතවන බව භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලදී. යම් යම් ආකාරයකින් තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් හඟිත්ද, එය එයින් අන්අයුරකින්ම වේ.' හෙතෙම තෘෂ්ණා රහිත බව කරුණු කොට ඒ තෘතීය ධ්‍යාන සමාපත්තියෙන් තමා උසස් කොට නොසිතයි. අනුන් පහත් කොට නොසලකයි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

32. "තවද මහණෙනි, අසත්පුරුෂ තෙමේ සැපය දුරු කිරීමෙන්ද දුක්ඛය දුරුකිරීමෙන්ද පළමුවම සොම්නස් දොම්නස් දෙක දුරුකිරීමෙන්ද, සැපයද, නැති දුකද නැති උපෙක්ෂාවෙන් හටගත් පිරිසිදු සිහිය ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම මෙසේ සිතයි. 'මම වනාහි චතුර්ථ ධ්‍යාන ලාභියෙක් වෙමි. මේ අන්‍ය භික්ෂූහු චතුර්ථ ධ්‍යාන ලාභීහු නොවෙත්, කියායි.' චතුර්ථධ්‍යාන සමාපත්තිය කරණ කොටගෙන තමා උසස්කොට සලකයි. අනුන් හෙළාදකියි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයකි.

'මහණෙනි, සත්පුරුෂතෙමේ වනාහි මෙසේ සිතයි. 'චතුර්ථධ්‍යාන සමාපත්තියෙනුදු තෘෂ්ණා රහිත බව භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. යම් යම් ආකාරයකින් තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් හඟිද්ද එය අනික් පරිද්දකින්ම වේය" යනුවෙනි. හෙතෙම තෘෂ්ණා රහිත බවම කරුණුකොට ඒ චතුර්ථධ්‍යාන සමාපත්තිය කරණ කොට ගෙන තමන් උසස්කොට නොසලකයි අනුන් පහත්කොට නොසිතයි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

33. "තවද මහණෙනි, අසත්පුරුෂතෙමේ සියලු ආකාරයෙන් රූප සංඥාවන්ගේ ඉක්මවීමෙන්, ගැටීම් සංඥාවන්ගේ දුරුකිරීමෙන්, නොයෙක්සංඥාවන්ගේ නොමෙනෙහි කිරීමෙන් ආකාශය අනන්තයයි භාවනාකොට ආකාසානඤ්චායතනයට පැමිණ වාසය කෙරෙයි. හෙතෙම මෙසේ සිතයි, 'මම වනාහි ආකාසානඤ්චායතන සමාධි ලාභියෙක් වෙමි. මේ අනික් භික්ෂූහු ආකාසානඤ්චායතන සමාපත්තිලාභීහූ නොවෙත්ය' කියායි. හෙතෙම ඒ ආකාසානඤ්චායතන සමාපත්තිය කරණකොට තමන් උසස්කොට සිතයි. අනුන් හෙළා දකියි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයකි.

"මහණෙනි, සත්පුරුෂතෙමේ වනාහි මෙසේ සිතයි. 'ආකාසානඤ්චායතන සමාපත්තියෙනුදු තෘෂ්ණා රහිතබව භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදී. යම් යම් ආකාරයකින් තෘෂ්ණාදෘෂ්ටි වශයෙන් හඟිද්ද, එය එයින් අන් අයුරකින්ම

වෙයි' කියායි. හෙතෙම තෘෂ්ණා රහිත බව කරුණුකොට එම ආකාසානඤ්චායතන සමාපත්තිය කරණ කොටගෙන තමා උසස්කොට නොසිතයි. අනුන් හෙළා නොදකියි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

34. "තවද මහණෙනි, අසත්පුරුෂතෙමේ සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තය'යි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරයි. හෙතෙම මෙසේ කල්පනා කරයි. 'මම වනාහි විඤ්ඤාණඤ්චායතන සමාපත්ති ලාභියෙක් වෙමි. මේ අනික් භික්ෂූහු විඤ්ඤාණඤ්චායතන සමාපත්ති ලාභීහු නොවෙති,' කියායි. හෙතෙම ඒ විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය කරණකොටගෙන තමන් උසස්කොට සිතයි. අනුන් හෙළාදකියි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයකි.

"මහණෙනි, සත්පුරුෂතෙමේ වනාහි මෙසේ සිතයි. 'විඤ්ඤාණඤ්චායතන සමාපත්තියෙනුදු තෘෂ්ණා රහිත බව භාග්‍යවතුන්වහන්සේ විසින් වදාරණ ලදී. යම් යම් ආකාරයකින් තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් හඟිද්ද, එය එයින් අන් අයුරකින්ම වේය' කියායි. හෙතෙම තෘෂ්ණා රහිත බවම කරුණු කොට එම විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය කරණකොට ගෙන තමා උසස්කොට නොසිතයි, අනුන් පහත්කොට නොසලකයි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

35. "තවද මහණෙනි, අසත්පුරුෂතෙමේ සියළු ආකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි භාවනා කොට ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වෙසෙයි. හෙතෙම මෙසේ සිතයි. 'මම වනාහි ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති ලාභියෙක් වෙමි. මේ අනික් භික්ෂූහු ආකිඤ්චඤ්ඤායතන සමාපත්ති ලාභීහු නොවෙති' කියායි. හෙතෙම ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය කරණකොටගෙන තමන් උසස් කොට සිතයි. අනුන් හෙළාදකියි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයකි.

"මහණෙනි, සත්පුරුෂතෙමේ වනාහි මෙසේ සිතයි. 'ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියෙනුදු තෘෂ්ණා රහිත බව භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදී. යම් යම් ආකාරයකින් තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් හඟිද්ද, එය අන් අයුරකින්ම වෙයි' කියායි. හෙතෙම තෘෂ්ණා රහිත බව කරුණුකොට එම ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය කරණකොටගෙන තමා උසස්කොට නොසිතයි. අනුන් පහත්කොට නොසලකයි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

36. "තවද මහණෙනි, අසත්පුරුෂතෙමේ සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට පැමිණ වෙසේ. හෙතෙම මෙසේ සිතයි. 'මම වනාහි නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්ති ලාභියෙක් වෙමි. මේ අනික් භික්ෂූහු නෙවසඤ්ඤානා සඤ්ඤයතන සමාපත්තිලාභීහු නොවෙති' කියායි. හෙතෙම ඒ නෙවසඤ්ඤානාසඤ්ඤයතන සමාපත්තිය කරණකොටගෙන තමන් උසස්කොට සිතයි. අනුන් හෙළා දකියි. මහණෙනි, මෙයද අසත්පුරුෂ ධර්මයකි.

"මහණෙනි, සත්පුරුෂතෙමේ වනාහි මෙසේ සිතයි. 'නෙවසඤ්ඤානාසඤ්ඤා සමාපත්තියෙනුදු තෘෂ්ණා රහිත බව භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදී. යම් යම් ආකාරයකින් තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් හඟිද්ද, එය එයින් අන් අයුරකින්ම වෙයි' කියායි. හෙතෙම තෘෂ්ණා රහිතබව කරුණුකොට එම නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය කරණකොටගෙන තමා උසස්කොට නොසිතයි, අනුන් පහත්කොට නොසලකයි. මහණෙනි, මෙයද සත්පුරුෂ ධර්මයකි.

37. "තවද මහණෙනි, සත්පුරුෂතෙමේ සියලු ආකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවේදයිත නිරෝධයට පැමිණ වෙසෙයි. නුවණින් දැක ආශ්‍රවයෝ ක්ෂය බවට පමුණුවත්. මහණෙනි, මේ මහණතෙමේද කිසිවක් තණ්හා දිට්ඨි මාන වශයෙන් නොසිතයි. කිසි තැනෙක්හි තණ්හා දිට්ඨි මාන වශයෙන් නොසිතයි. කිසිවක් කරණ කොටගෙන තණ්හා

දිට්ඨි මාන වශයෙන් නොසිතයි,” භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටුවූහ.

තුන්වෙනි සප්පුරිස සූත්‍රයයි. (2-3)

## 14. සෙවිතබ්බාසෙවිතබ්බ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඬුසිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩ වසනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි,’යි කියා භික්ෂූන්ට කථා කළසේක. ස්වාමීනි,’යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. “මහණෙනි, මම තොපට සේවනය කළ යුතුවූද, සේවනය නොකළ යුතුවූද, ධර්ම ක්‍රමයක් දෙශනා කරන්නෙමි. එය මැනවින් අසව්, මැනවින් මෙනෙහි කරව්. දෙශනා කරන්නෙමි”යි කියායි. “එසේය ස්වාමීනි”යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. “මහණෙනි, මම කායික පැවැත්මද සේවනය කළ යුත්තය. සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමි. ඒ කායික පැවැත්ම සේවනය කළයුත්ත අනිකකි. සේවනය නොකළ යුත්ත අනිකකියි කියමි. මහණෙනි, මම වචනයේ පැවැත්මද සේවනය කළයුත්තය, සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමි. ඒ වචනයේ පැවැත්මද සේවනය කළයුත්ත අනිකකි, සේවනය නොකළ යුත්ත අනිකකියි කියමි මහණෙනි, මම සිතේ පැවැත්මද සේවනය කළයුත්තය, සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමි ඒ සිතේ පැවැත්මද සේවනය කළයුත්ත අනිකකි, සේවනය නොකළ යුත්ත අනිකකියි කියමි. මහණෙනි, මම සිතද සේවනය කළ යුත්තය, සේවනය, නොකල යුත්තයයි දෙයාකාරයකින් කියමි. ඒ සිතද සේවනය

කළ යුත්ත අනිකකි, සේවනය නොකළ යුත්ත අනිකකියි, කියමි. මහණෙනි, මම සංඥාවද සේවනය කළ යුත්තය, සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමි. ඒ සංඥාවද, සේවනය කළයුත්ත අනිකකි, සේවනය නොකළ යුත්ත අනිකකියි කියමි. මහණෙනි, මම දෘෂ්ටියද සේවනය කළයුත්තය සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමි. ඒ දෘෂ්ටියද සේවනය කළ යුත්තය අනිකෙක. සේවනය නොකළ යුත්ත අනිකෙකියි කියමි.

"මහණෙනි, මම ආත්මභාවය ලැබීමද සේවනය කළ යුත්තය, සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමි. ඒ ආත්මභාවය ලැබීමද සේවනය කළයුත්ත අනිකෙක සේවනය නොකළ යුත්ත අනිකෙකැයි කියමි.

3. මෙසේ දෙශනා කළ කල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙමේ මෙය ප්‍රකාශ කළේය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ සංක්ෂේපයෙන් දෙශනා කරන ලද විස්තර වශයෙන් අර්ථ නොබෙදන ලද මේ ධර්මයාගේ අර්ථය මෙසේ විස්තර වශයෙන් දැනගතිමි"යි කියායි.

"මහණෙනි, මම කාය සමාචාරයද සේවනය කළයුත්තය සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමි. ඒ කාය සමාචාරයද සේවනය කළයුත්ත අනිකකි. සේවනය නොකළ යුත්ත අනිකකියි කියමි. මෙසේ වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලදී.

මෙය කුමක් සඳහා දෙශනා කරණ ලදද?

4. "ස්වාමීනි, යම් බඳුවූ කායසමාචාරයක් සේවනය කරන්නාහට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ කායසමාචාරය සේවනය නොකළ යුතුයි. ස්වාමීනි, යම්බඳුවූ කායසමාචාරයක් සේවනය කරන්නාහට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ කායසමාචාරය සේවනය කළ යුතුයි.

"ස්වාමීනි, කෙබඳුවූ කායසමාචාරයක් සේවනය කරන්නා හට අකුශල ධර්මයෝද වැඩෙත්ද, කුශලධර්මයෝ පිරිහෙත්ද, ස්වාමීනි, ඒ ලෙව්හි ඇතැමෙක් රළුවූයේ ලේ තැවරුණු අත් ඇත්තේ පහර දීමෙහි හා නැසීමෙහි යෙදුනේ, ප්‍රාණීන් කෙරෙහි දයා රහිතවූයේ, ප්‍රාණඝාත කරන්නෙක් වේද, ගමෙහි වූ හෝ අරණ්‍යයෙහිවූ හෝ යම් ඒ අන්සතු ධනයක් වේනම් නොදුන්නාවූ එය සොර සිතින් ගන්නේ නුදුන් දෙය ගැනීමෙහි යෙදුනෙක්වේද, යම් ඒ ස්ත්‍රියක් තොමෝ මව විසින් රක්නා ලද්දීද, පියා විසින් රක්නා ලද්දීද, සොහොයුරන් විසින් රක්නා ලද්දීද, සොහොයුරියන් විසින් රක්නා ලද්දීද, ඥාතීන් විසින් රක්නා ලද්දීද, ස්වාමියා විසින් සහිතවූවාද, වෙත නොයායුතුයයි රජුන් විසින් දඬුවම් තබන ලද්දීද, යටත් පිරිසෙයින් මල්මාලාවක් බහා වෙන්කරන ලද්දීද, යන එබඳුවූ ස්ත්‍රීන් කෙරෙහි (කාම සෙවන වශයෙන්) හැසිරීමට පැමිණියාහු කාම මිථ්‍යාචාරයෙහි යෙදෙත්ද, ස්වාමීනි, එබඳුවූ කායික පැවැත්ම සේවනය කරන්නාහට අකුශල ධර්මයෝ වැඩෙත්, කුශල ධර්මයෝ පිරිහෙත්.

5. "ස්වාමීනි, කෙබඳුවූ කායික පැවැත්මක් සේවනය කරන්නාහට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද? ස්වාමීනි, මෙලෙව්හි ඇතැමෙක් තෙම ප්‍රාණඝාතය හැර ප්‍රාණඝාතයෙන් වෙන්වූයේ වේද, බහා තබනලද දඬු ඇත්තේ, බහා තබනලද ආයුධ ඇත්තේ, ලජ්ජාඇත්තේ, දයාවෙන් යුක්තවූයේ සියළු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පා ඇතිව වාසය කෙරේද, නොදුන් දෙය ගැණීම හැර නොදුන් දෙය ගැණීමෙන් වෙන්වූයේ වේද, ගමෙහි හෝ අරණ්‍යයෙහි හෝ යම් අන්සතු වස්තුවක් උපකරණයක් වේද, එය සොරසිතින් නොගන්නේවේද, යම් ඒ ස්ත්‍රියක් තොමෝ මව විසින් රක්නා ලද්දීද, පියා විසින් රක්නා ලද්දීද, සොහොයුරන් විසින් රක්නා ලද්දීද, සොහොයුරියන් විසින් රක්නා ලද්දීද, ඥාතීන් විසින් රක්නා ලද්දීද, වෙත නොයායුතුයයි රජුන් විසින් දඬුවම් තබන ලද්දීද, යටත් පිරිසෙයින් මල්මාලාවක් බහා වෙන්කරන ලද්දීද, යන

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

මෙබඳුවූ ස්ත්‍රීන් කෙරෙහි (කාම සේවනය වශයෙන්) හැසිරීමට නොපැමිණියාහු කාම මිථ්‍යාචාරයෙහි නොයෙත්ද, ස්වාමීනි, මෙබඳුවූ කායික පැවැත්ම සේවනය කරන්නාහට අකුශල ධර්මයෝ පිරිහෙත්. කුශල ධර්මයෝ වැඩෙත්.

**6.** "මහණෙනි, මම කායික පැවැත්ම සේවනය කළ යුත්තය, සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයෙන් කියමි. ඒ කායික පැවැත්මද සේවනය කළයුත්ත අනිකකි, සේවනය නොකළ යුත්ත අනිකකි"යි භාග්‍යවතුන් වහන්සේ විසින් යමක් වදාරණ ලදනම් එය මේ සඳහා දෙශනා කරන ලදී

"මහණෙනි, මෙම වචනයේ පැවැත්මද සේවනය කළයුත්තය. සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමි. ඒ වචනයේ පැවැත්මද සේවනය කළයුත්ත අනිකකි. සේවනය නොකළ යුත්ත අනිකකයි භාග්‍යවතුන් වහන්සේ විසින් යමක් වදාරණ ලදනම් එය කුමක් සඳහා දෙශනාකරන ලදද?"

**7.** "ස්වාමීනි, යම් ආකාර වචනයේ පැවැත්මක් සේවනය කරන්නාහට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ වචනයේ පැවැත්ම සේවනය නොකළ යුතුය. ස්වාමීනි යම් ආකාර වචනයේ පැවැත්මක් සේවනය කරන්නාහට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ වචනයේ පැවැත්ම සේවනය කළයුතුයි.

"ස්වාමීනි, කෙබඳුවූ වචනයේ පැවැත්මක් සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද? ස්වාමීනි, මෙහි ඇතැමෙක් සභාවක සිටියේ හෝ පිරිසක සිටියේ හෝ නෑයන් මැද සිටියේ හෝ සමූහ මැද සිටියේ හෝ රජකුලමැද සිටියේ හෝ ඉදිරියට පැමිණවූයේ, 'පින්වත් පුරුෂය මෙහි එව. යමක් දන්නෙහිනම් එය කියවයි, සාක්ෂ්‍ය අසන ලද්දාවූ හෙතෙම නොදන්නා දෙය හෝ දනිමියි කියමි. දන්නා දෙය හෝ 'නොදනිමි'යි කියයි. නොදක්නා දෙය හෝ 'දක්මි'යි කියයි. දක්නා දෙය හෝ 'නොදක්මි'යි කියයි. මෙසේ තමා නිසා හෝ අනුන් නිසා හෝ කිසියම් සුළු ආමිෂයක්

(අල්ලසක්) නිසා හෝ දැන දැන බොරු කියන්නේ වේද, එතැනින් අසා මොවුන්ගේ භේදය පිණිස මෙහි කියන්නේද, මෙතන්හි අසා ඔවුන්ගේ භේදය පිණිස එහි කියන්නේද, මෙසේ සමගිවූවන් භේද කරන්නේ, භේදවූවන්ගේ භේදයට අනුබල දෙන්නේ, භේදයෙහි ඇළුනේ, භේදවූ අය දැක සතුටුවන්නේ, භේද කරන වචන කියන්නේ මෙසේ කේලාම් බස් ඇත්තේ වේද,

"යම් ඒ වචනයක් අනුන්ට ගැරහීම් වශයෙන් රළුද කර්කශද අනුන්ගේ සිතට කටුකද, අනුන් සිත් කටු අත්තක මෙන් ඇමිණෙන සුළුද කෝපයට ආසන්නද, සමාධියට හේතු නොවේද, එබඳු වචන කියන්නේ ඵරුෂ වචන ඇත්තේවේද, නොකල්හි කථා කරන්නේ, බොරු කියන්නේ, අවැඩ බස් කියන්නේ, අධර්ම වචන කියන්නේ, අවිනය වචන කියන්නේ සිත තබාගැනීමට නුසුදුසු නොකල්හි ආයෝගයලෙස සීමාවක් නැතිව අවැඩට හේතුවූ වචන කියන්නේ සම්ඵප්‍රලාප බස් ඇත්තේවේද,

"ස්වාමීනි, මෙබඳුවූ වචනයේ පැවැත්ම සේවනය කරන්නහුට අකුශල ධර්මයෝම වැඩෙත්. කුශල ධර්මයෝ පිරිහෙත්. ස්වාමීනි, කෙබඳුවූ වචනයේ පැවැත්මක් සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද?

8. "ස්වාමීනි, මෙලෙව්හි ඇතැමෙක්, තෙම මුසාවාදය හැර මුසාවාදයෙන් වෙන්වූයේ වේද, සභාවක සිටියේ හෝ පිරිසක සිටියේ හෝ නෑයන් මැද සිටියේ හෝ සමූහ මැද සිටියේ හෝ රජකු මැද සිටියේ හෝ ඉදිරියට පැමිණවූයේ 'පින්වත් පුරුෂය මෙහි එව, යමක් දන්නෙහි නම් එය කියව'යි සාක්ෂ්‍ය විචාරණ ලද්දාවූ හෙතෙම නොදන්නා දෙය හෝ නොදනිමි'යි කියයිද දන්නා දෙය හෝ දනිමි'යි කියයිද නොදක්නා දෙය හෝ 'නොදක්මි'යි කියයිද දක්නා දෙය හෝ 'දක්මි'යි කියයිද මෙසේ තමා නිසා හෝ අනුන් නිසා හෝ කිසියම් සුළු ආමිෂයක් (අල්ලසක්) නිසා හෝ දැන දැන බොරු නොකියන්නේ වේද,

කේලාම්කීම හැර කේලමෙන් වෙන්වූයේ එතැනින් අසා මොවුන්ගේ භේදය පිණිස මෙහි නොකියන්නේද, මෙතනින් අසා ඔවුන්ගේ භේදය පිණිස එහි නොකියන්නේද, මෙසේ වෙන්වූවන් සමගි කරන්නේ, සමගි වූවන්ගේ සමගියට අනුබල දෙන්නේ සමගියෙහි ඇළුනේ, සමගිවූ අය දැක සතුටුවන්නේ සමගිය ඇතිකරන වචන කියන්නේ වේද, ඵරුෂ වචනය හැර ඵරුෂ වචන කීමෙන් වෙන්වූයේවේ, යම් ඒ වචනයක් ප්‍රියවේද, කණට සුව එලවයිද, ප්‍රෙමය ඇති කරයිද, සිත සතුටු කරයිද, ශිෂ්ට වචන කියන්නේ වේද, බොහෝ දෙනාගේ සිත් ඇදගන්නා වචන කියන්නේ බොහෝ දෙනාගේ මනාපය වඩන වචන කියන්නේ වේද,

"සම්ඵප්‍රලාපය හැර සම්ඵප්‍රලාප කීමෙන් වෙන්වූයේ වේ. කාලෝචිත (වෙලාවට සුදුසු) වචන කියන්නේ සිදුවූවක්ම කියන්නේ, වැඩ පිණිස පවත්නා වචනයක්ම කියන්නේ, දැහැමි වචනයක්ම කියන්නේ, විනය වචනයක්ම කියන්නේ, නිධානයක් මෙන් තැන්පත් කොට තබාගත යුතු සුදුසු කල්හි යෝග්‍යලෙස සීමාවක් ඇතිව වැඩ පිණිසවූ වචන කියන්නේවේද, මහණෙනි, මෙබඳුවූ වචනයේ පැවැත්ම සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්. කුශල ධර්මයෝ වැඩෙත්.

**9.** "මහණෙනි, මම වචීසමාචාරය සේවනය කළයුත්තය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමි. ඒ වචනයේ පැවැත්මද සේවනය කළයුත්ත අනිකකි. සේවනය නොකළ යුත්ත අනිකකියි කියමියි මෙසේ ඒ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලද නම් එය මේ සඳහා දෙශනා කරණ ලදී.

"මහණෙනි, මම සිතේ පැවැත්මද සේවනය කළයුත්තය සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමි. ඒ සිතේ පැවැත්මද සේවනය කළයුත්ත අනිකකි, සේවනය නොකළ යුත්ත අනිකකියි කියමියි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලදී. මෙය කුමක් සඳහා දේශනා කරන ලදද?"

10. "ස්වාමීනි, යම්බඳුවූ සිතේ පැවැත්මක් සේවනය, කරන්නහුගේ අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ මනෝසමාචාරය සේවනය නොකළ යුතුය. ස්වාමීනි, යම්බඳුවූ මනෝසමාචාරයක් සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ මනොසමාචාරය සේවනය කළයුතුය. ස්වාමීනි කෙබඳුවූ මනොසමාචාරයක් සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුසල ධර්මයෝ පිරිහෙත්ද, 'ස්වාමීනි, මෙලෙව්හි ඇතැමෙක් දැඩි ලෝභය බහුලකොට ඇත්තේ වේද, යම් ඒ අන්සතු සම්පතක්වේ නම් එය මාහට වන්නේ නම් ඉතා යෙහෙකැයි ආශාකරන්නේවේද, විකාරයට පත් සිත් ඇත්තේ දූෂ්‍යවූ අදහස් ඇත්තේ 'මේ සත්වයෝ නැසෙත්වා, වධයට පැමිණෙත්වා, සිඳෙත්වා, විනාශවෙත්වා, නොවෙත්වා"යි අනුන්ගේ විනාශය කැමති වන්නේවේද, ස්වාමීනි, මෙබඳු මනොසමාචාරයක් සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ වැඩෙත්, කුශල ධර්මයෝ පිරිහෙත්.

11. "ස්වාමීනි, කෙබඳුවූ මනොසමාචාරයක් සේවනය කරන්නාහට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද? ස්වාමීනි, මෙලෙව්හි ඇතැමෙක් දැඩි ලොභය බහුල නොවේද, යම් ඒ අන්සතු සම්පතක් වේනම් එය මා හට වන්නේ නම් ඉතා යෙහෙකැයි නොසිතන්නේවේද, විකාරයට නොපත් සිත් ඇත්තේ දූෂ්‍යවූ අදහස් නැත්තේ මේ සත්වයෝ වෛර නැත්තෝව උවදුරු නැත්තෝව සැප ඇත්තෝව දිවි පවත්වත්වා"යි සිතන්නේවේද ස්වාමීනි, මෙබඳුවූ මනොසමාචාරයන් සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්, කුශල ධර්මයෝ වැඩෙත්.

12. "මහණෙනි, මම මනොසමාචාරය සේවනය කළ යුත්තය සේවනය නොකළයුත්තය යයි දෙයාකාරයකින් කියමි. ඒ මනොසමාචාරයද සේවනය කළයුත්ත අනිකකි, සේවනය නොකළයුත්ත අනිකකියි කියමියි. මෙසේ ඒ යමක් භාග්‍යවතුන්

වහන්සේ විසින් දෙශනා කරනලද නම් එය මේ සඳහා දෙශනා කරණලදී.

'මහණෙනි, මම සිතද සේවනය කළයුත්තය සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමි. ඒ සිතද සේවනය කළයුත්ත අනිකකි. සේවනය නොකළයුත්ත අනිකකියි, කියමියි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදී. මෙය කුමක් සඳහා වදාරණලදද?" "ස්වාමීනි, යම් බඳුවූ සිතක් සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ සිත සේවනය නොකළයුතුය. ස්වාමීනි, යම්බඳුවූ සිතක් සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද එබඳුවූ සිත සේවනය කළයුතුය.

13. "ස්වාමීනි, කෙබඳුවූ සිතක් සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද? ස්වාමීනි, මෙලෙච්හි ඇතැමෙක් තෙම දැඩි ලොභ ඇත්තේ දැඩි ලොභයෙන් යුත් සිතින් වෙසේද, ව්‍යාපාද ඇත්තේ ව්‍යාපාදයෙන් යුත් සිතින් වෙසේද, හිංසාකිරීම් ඇත්තේ හිංසා කරන සිතින් යුක්තව වෙසේද, මහණෙනි, එබඳුවූ සිත සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ වැඩෙත්. කුශල ධර්මයෝ පිරිහෙත්.

"ස්වාමීනි, කෙබඳුවූ සිතක් සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, ස්වාමීනි, මෙහි ඇතැමෙක් තෙම දැඩි ලොභ නැත්තේ, දැඩි ලොභ නැති සිතින් වෙසෙයි. ව්‍යාපාද නැත්තේ, ව්‍යාපාද රහිත සිතින් වෙසෙයි. හිංසා කරන සිත් නැත්තේ හිංසා නොකරන සිතින් යුක්තව වෙසෙයි. ස්වාමීනි, එබඳුවූ සිත් සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්."

14. "මහණෙනි, මම සිත ද සේවනය කළ යුත්තය සේවනය නොකළ යුත්තය'යි දෙයාකාරයකින් කියමි. ඒ සිත ද සෙවනය කළයුත්ත අනිකකි. සෙවනය නොකළ යුත්ත අනිකකි'යි කියමියි"

මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ යමක් වදාරණලද ද, එය මේ සඳහා දෙශනා කරණ ලදී.

"මහණෙනි, මම සංඥාවද සේවනය කළයුත්තය සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමි. ඒ සංඥාවද සෙවනය කළයුත්ත අනිකකි. සෙවනය නොකළයුත්ත අනිකකියි කියමියි" මෙසේ වනාහි භාග්‍යවතුන්වහන්සේ විසින් දෙශනා කරණලදී. මෙය කුමක් සඳහා දෙශනා කරන ලදද,

15. ස්වාමීනි, යම්බඳුවූ සංඥාවක් සේවනය කරන්නහු ගේ අකුශල ධර්මයෝ වැඩෙත් ද, කුශල ධර්මයෝ පිරිහෙත් ද, එබඳුවූ සංඥාව සේවනය නොකළ යුතුය. ස්වාමීනි, යම්බඳුවූ සංඥාවක් සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්ද? කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ සංඥාව සෙවනය කළ යුතුයි.

"ස්වාමීනි, කෙබඳුවූ සංඥාවක් සේවනය කරන්නහුගේ අකුශලධර්මයෝ වැඩෙත්ද, කුශලධර්මයෝ පිරිහෙත්ද, ස්වාමීනි, මෙහි ඇතමෙක් තෙම දැඩි ලොභ ඇත්තේ දැඩි ලොභ සහගත සංඥාවෙන් වෙසෙයිද ව්‍යාපාද ඇත්තේ ව්‍යාපාද සහගත සංඥාවෙන් වෙසෙයිද, හිංසා කරන්නේ හිංසා සහගත සංඥාවෙන් වෙසෙයිද, ස්වාමීනි, මෙබඳුවූ සංඥාව සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ වැඩෙත්. කුශලධර්මයෝ පිරිහෙත්. ස්වාමීනි, කෙබඳුවූ සංඥාවක් සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද? ස්වාමීනි, මෙහි ඇතමෙක් දැඩිලොභ නැත්තේ වේද, දැඩි ලොභය නැති සංඥාවෙන් වාසයකරයිද, ව්‍යාපාද නැත්තේ ව්‍යාපාද නැති සංඥාවෙන් වසයිද ස්වාමීනි, මෙබඳුවූ සංඥාව සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්. කුශලධර්මයෝ වැඩෙත්.

16. "මහණෙනි, මම සංඥාවද සේවනය කළ යුත්තය සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමි. ඒ සංඥාවද සේවනය කළයුත්ත අනිකකි. සේවනය නොකළ යුත්ත අනිකකි"යි කියමියි මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ

යමක් දෙශනා කරන ලද නම්, එය මේ සඳහා දෙශනාකරන ලදී.

17. "මහණෙනි, මම දෘෂ්ටි සෙවනය කළ යුත්තය සෙවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමි. ඒ දෘෂ්ටියද සෙවනය කළයුත්ත අතිකකි, සෙවනය නොකළ යුත්ත අතිකකි"යි කියමියි භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය දෙශනා කරණලදී. මෙය කුමක් සඳහා දෙශනා කරණ ලද ද? "ස්වාමීනි, යම්බඳුවූ දෘෂ්ටියක් සෙවනය කරන්නහු ගේ අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ දෘෂ්ටි සෙවනය නොකළ යුතුය. ස්වාමීනි, යම්බඳුවූ දෘෂ්ටියක් සෙවනය කරන්නහුගේ අකුශලධර්මයෝ පිරිහෙත්ද, කුශලධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ දෘෂ්ටිය සෙවනය කළ යුතුය.

18. "ස්වාමීනි, කෙබඳුවූ දෘෂ්ටියක් සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, ස්වාමීනි, මෙලෙව්හි ඇතමෙක්තෙම මෙබඳු දෘෂ්ටි ඇත්තේවේ. 'දෙන ලද්දෙහි ඵල නැත. "යිට්ඨ" නම්ලද කුඩා යාගයෙහි ඵල නැත. හුත නම් ලද මහා යාගයෙහි ඵල නැත. කළ හොඳ නොහොඳ දෙක්හි ඵල විපාක නැත. පරලොව සිටියහුට මෙලොව නැත. මෙලොව සිටියහුට පරලොව නැත. මවට කරන හොඳ නරක දෙකෙහි විපාක නැත. පියාට කරන හොඳ නරක දෙකෙහි විපාක නැත. චුතව උපදින සත්වයෝ නැත. මනා පිළිවෙතෙහි පිළිපන් මෙලොව හා පරලොව තෙමේ නුවණින් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කරන මහණ බමුණන් ලොව නැත' යනුවෙනි. ස්වාමීනි, මෙබඳුවූ දෘෂ්ටි සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ වැඩෙත්. කුශල ධර්මයෝ පිරිහෙත්.

19. "ස්වාමීනි, කෙබඳුවූ දෘෂ්ටිය සේවනය කරන්නහුගේ අකුශලධර්මයෝ පිරිහෙත්ද, කුශලධර්මයෝ වැඩෙත්ද, ස්වාමීනි මෙලෙව්හි ඇතමෙක්, තෙම මෙබඳු දෘෂ්ටි ඇත්තේවේ. 'දුන් දැයෙහි ඵල ඇත. "යිට්ඨ" නම් ලද කුඩා යාගයෙහි ඵල ඇත. හුත නම් ලද මහා යාගයෙහි ඵල ඇත. කළ හොඳ නොහොඳ දෙක්හි ඵල විපාක ඇත. පරලොව සිටියහුට මෙලොව ඇත.

මෙලොව සිටියහුට පරලොව ඇත. මවට කරන හොඳ නරක දෙකෙහි විපාක ඇත. පියාට කරන හොඳ නරක දෙකෙහි විපාක ඇත. චුතව උපදින සත්වයෝ ඇත. මනාපිළිවෙතෙහි පිළිපන් මෙලොව හා පරලොව තමා නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කරන මහණ බමුණන් ලොව ඇත.' යනුවෙනි.

"ස්වාමීනි, මෙබඳු වූ දෘෂ්ටි සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්. කුශල ධර්මයෝ වැඩෙත්.

**20.** "මහණෙනි, මම දෘෂ්ටියද සේවනය කළ යුත්තය සෙවනය නොකළ යුත්තයයි දෙපරිදිකොට කියමි. ඒ දෘෂ්ටියද සෙවනය කළයුත්ත අනිකකි. සෙවනය නොකළයුත්ත අනිකක"යි කියමියි මෙසේ ඒ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරන ලදද, මෙය ඒ සඳහා දෙශනා කරන ලදී.

**21.** මහණෙනි, මම ආත්මභාවය ලැබීමද දෙපරිදිකොට කියමි. සේවනය කළ යුත්තද, සේවනය නොකළ යුත්තද කියායි. හෙද සේවනය කළයුතු ආත්මභාවය ලැබීම අනිකකි. සේවනය නොකළයුතු ආත්මභාවය ලැබීමද අනිකකියි භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය දෙශනා කරණ ලදී. මෙය කුමක් නිසා දෙශනා කරණ ලදද?" "ස්වාමීනි, යම් බඳුවූ ආත්මභාවය ලැබීමක් සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ වැඩෙත්ද? කුශල ධර්මයෝ පිරිහෙත්ද? එබඳුවූ, ආත්මභාවය ලැබීම සේවනය නොකළ යුතුයි. ස්වාමීනි, යම්බඳුවූ, ආත්මභාවය ලැබීමක් සේවනය කරන්නහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්ද? කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ ආත්මභාවය ලැබීම සේවනය කළ යුතුයි. ස්වාමීනි, කෙබඳුවූ ආත්මභාව ලැබීමක් ඇත්තහුගේ අකුශල ධර්මයෝ වැඩෙත්ද? කුශල ධර්මයෝ පිරිහෙත්ද? ස්වාමීනි, දුක් සහිත ආත්මභාවය ලැබීම ඇත්තහුගේ උත්පත්තිය නොනිමි බැවින් අකුසල ධර්මයෝ වැඩෙත්, කුසල ධර්මයෝ පිරිහෙත්. ස්වාමීනි, කෙබඳුවූ ආත්මභාවය ලැබීමක් ඇත්තහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්ද? කුශල ධර්මයෝ වැඩෙත්ද? ස්වාමීනි, දුක් රහිත ආත්මභාවය ලැබීම ඇත්තහුගේ උත්පත්තිය නිමි බැවින් අකුශල ධර්මයෝ පිරිහෙත්. කුශල ධර්මයෝ වැඩෙත්.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

22. "මහණෙනි, මම ආත්මභාවය ලැබීමද දෙපරිදි කොට කියමි. සේවනය කළයුත්තද, සේවනය නොකළ යුත්තද, යනුවෙනි. හෙද සේවනය කළ යුතු ආත්මභාවය ලැබීම අනිකකි. සේවනය නොකළ යුතු ආත්මභාවය ලැබීමද අනිකකියි, මෙසේ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරණ ලදද? ඒ මේ සඳහා දෙශනා කරණ ලදී."

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් වදාරනලද විස්තර වශයෙන් අර්ථ නොබෙදන ලද මේ ධර්මයාගේ අර්ථය මම විස්තර වශයෙන් මෙසේ දනිමි"යි කීය.

"යහපත, යහපත ශාරිපුත්‍රය, මා විසින් සංක්ෂෙපයෙන් කියන ලද විස්තර වශයෙන් අර්ථ නොබෙදූ මේ ධර්මයාගේ අර්ථ විස්තර වශයෙන්ම තෙපි දන්නහුය.

23. "මහණෙනි, මම කායසමාචාරයද සේවනය කළ යුත්තය සේවනය නොකළ යුත්තයයි දෙපරිදි කොට කියමි. ඒකායසමාචාරයද සේවනය කළ යුත්ත අනිකකි. සේවනය නොකළයුත්ත අනිකකියි කියමියි" මෙසේ මෙය මා විසින් කියනලද නම් එය කුමක් සඳහා කියන ලදද? ශාරිපුත්‍රය, යම් බඳුවූ කායසමාචාරයක් සේවනය කරන්නාහට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ කායසමාචාරය සේවනය නොකළ යුතුය. ශාරිපුත්‍රය, යම් බඳුවූ කායසමාචාරයක් සේවනය කරන්නාහට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ කාය සමාචාරය සෙවනය නොකළ යුතුය.

24. "ශාරිපුත්‍රය, කෙබඳු වූ කාය සමාචාරයක් සේවනය කරන්නාහට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද? ශාරිපුත්‍රය, මෙලෙව්හි ඇතැමෙක් රළු වූයේ ලේ තැවැරුණු අත් ඇත්තේ, පහරදීමෙහි හා නැසීමෙහි නියැලුනේ, ප්‍රාණීන් කෙරෙහි දයාරහිත වූයේ, ප්‍රාණඝාත කරන්නෙක් වේද, ගමෙහිවූ හෝ අරණ්‍යයෙහිවූ හෝ යම් ඒ අන් සතු ධනයක්වේ නම් නොදුන්නාවූ එය සොර සිතින් ගන්නේ, හොරකම් කිරීමෙහි

යෙදුනෙක් වේද, යම් ඒ ස්ත්‍රියක් තොමෝ මව විසින් රක්නා ලද්දීද, පියා විසින් රක්නා ලද්දීද, සොහොයුරන් විසින් රක්නා ලද්දීද, සොහොයුරියන් විසින් රක්නා ලද්දීද, ඤාතීන් විසින් රක්නා ලද්දීද ස්වාමියා සහිත වූවාද, වෙත නොයා යුතුයයි රජුන් විසින් දඬුවන් තබන ලද්දියද, යටත් පිරිසෙයින් මල් මාලාවක් බහා වෙන් කරන ලද්දියද එය එබඳුවූ ස්ත්‍රීන් කෙරෙහි (කාම සෙවනය වශයෙන්) හැසිරීමට පැමිණියාහු කාම මිථ්‍යාචාරයෙහි යෙදෙත්ද ශාරිපුත්‍රය, එබඳුවූ කාය සමාචාරය සේවනය කරන්නාහට අකුශල ධර්මයෝ වැඩෙත්, කුසල ධර්මයෝ පිරිහෙත්.

**25.** "ශාරිපුත්‍රය, කෙබඳුවූ කාය සමාචාරයක් සේවනය කරන්නාහට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද,

"ශාරිපුත්‍රය, මෙලෙව්හි ඇතැමෙක් ප්‍රාණඝාතය හැර ප්‍රාණඝාතයෙන් වෙන්වූයේවේද, බහා තබනලද දඬු ඇත්තේ බහා තබන ලද අවි ඇත්තේ, ලජ්ජා ඇත්තේ, දයාවෙන් යුක්තවූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේව වාසය කෙරේද, නොදුන් දෙය ගැණීම හැර, නොදුන් දෙය ගැණීමෙන් වෙන්වූයේවේද, ගමෙහි හෝ අරණ්‍යයෙහි හෝ වූ අන්සතු වස්තුව, උපකරණ යමක් නම් එය සොර සිතින් නොගන්නේවේද, යම් ඒ ස්ත්‍රීයක් තොමෝ මව විසින් රක්නා ලද්දීද, පියා විසින් රක්නාලද්දීද, සොහොයුරන් විසින් රක්නා ලද්දීද, සොහොයුරියන් විසින් රක්නා ලද්දීද, ඥාතීන් විසින් රක්නා ලද්දීද වෙත නොයා යුතුයයි රජුන් විසින් දඬුවම් තබන ලද්දීද යටත්පිරිසෙයින් මල්මාලාවක් බහා වෙන්කරන ලද්දියද, යන මෙබඳුවූ ස්ත්‍රීන් කෙරෙහි (කාමසේවනය වශයෙන්) හැසිරීමට නොපැමිණියාහු කාමමිථ්‍යාචාරයෙහි නොයෙදෙත්ද, ශාරිපුත්‍රය, මෙබඳුවූ කායසමාචාරය සේවනය කරන්නාහට අකුශල ධර්මයෝ පිරිහෙත්. කුශල ධර්මයෝ වැඩෙත්.

"ශාරිපුත්‍රය, මම කායසමාචාරයද සේවනය කළයුත්තය, සේවනය නොකළ යුත්තයයි දෙපරිදිකොට කියමි. ඒ කාය සම

වාරයද සේවනය කළයුත්ත අනිකකි. සේවනය නොකළ යුත්ත අනිකකි"යි කියම්යි මෙසේ මා විසින් යමක් කියන ලදද, එය මේ සඳහා කියනලදී.

**26.** "ශාරිපුත්‍රය, මම වචීසමාචාරයද සේවනය කළ යුත්තය සෙවනය නොකළ යුත්තයයි දෙපරිදිකොට කියමි. ඒ වාක් සමාචාරයද සේවනය කළයුත්ත අනිකකි. සේවනය නොකළයුත්ත අනිකකියි කියමින් මෙසේ මා විසින් මෙය කියනලද නම් එය කුමක් සඳහා කියනලදද?

"ශාරිපුත්‍රය, යම්බඳුවූ වාක්සමාචාරයක් සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ වචීසමාචාරය සේවනය නොකළයුතුය. ශාරිපුත්‍රය, යම්බඳුවූ වචීසමාචාරයක් සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ වචී සමාචාරය සේවනය කළයුතුයි.

"ශාරිපුත්‍රය, කෙබඳුවූ වචීසමාචාරයක් සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, ශාරිපුත්‍රය, මෙලෙව්හි ඇතමෙක් සභාවක සිටියේ හෝ පිරිසක සිටියේ හෝ නෑයන් මැද සිටියේ හෝ සමූහ මැද සිටියේ හෝ රජකුල මැද සිටියේ හෝ ඉදිරියට පැමිණවූයේ, 'පින්වත් පුරුෂය, මෙහි එව. යමක් දන්නෙහිනම් එය කියවයි,' සාක්ෂ්‍ය විචාරණ ලදුයේ, හෙතෙම නොදන්නා දෙය හෝ දනිමියි කියයි. දන්නා දෙය හෝ නොදනිමියි කියයි. නොදක්නා දෙය හෝ දක්මියි කියයි. දක්නාදෙය හෝ නොදක්මියි කියයි. මෙසේ තමා නිසා හෝ අනුන් නිසා හෝ කිසියම් සුළු ආමිෂයක් (අල්ලසක්) නිසා හෝ දැන දැන බොරු කියන්නේ වේද, එතැනින් අසා මොවුන්ගේ භේදය පිණිස මෙහි කියන්නේද, මෙතන්හි අසා ඔවුන්ගේ භේදය පිණිස එහි කියන්නේද, මෙසේ සමගිවූවන් හෙද කරන්නේ හෙදවූවන්ගේ හෙදයට අනුබල දෙන්නේ, හෙදයෙහි ඇළුනේ, හෙදවූ අය දැක සතුටු වන්නේ, හෙදකරන වචන කියන්නේ, මෙසේ කේළාම් බස් ඇත්තේ නොවේද, යම් ඒ වචනයක් අනුන්ට ගැරහීම් වශයෙන් රළුද, කර්කශද, අනුන්ගේ

සිතට කටුකද අනුන්ගේ සිත් කටු අත්තට මෙන් ඇමිණෙන සුළුද, කෝපයට ආසන්නද, සමාධියට හෙතුනොවේද, එබඳු වචන කියන්නේ ඵරුෂ වචන ඇත්තේවේද, නොකල්හි කථාකරන සුළු බොරුකියන සුළු, අවැඩ බස් තෙපෙලෙන සුළු, සිත තබාගැනීමට නුසුදුසු, නොකල්හි අයොග්‍යලෙස සීමාවක් නැතිව අවැඩට හේතුවූ වචන කියන්නේ සම්ඵප්‍රලාප බස් ඇත්තේවේද, ශාරිපුත්‍රය, එබඳුවූ වචීසමාචාරය සෙවුනහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්. කුශල ධර්මයෝ වැඩෙත්.

27. "ශාරිපුත්‍රය, කෙබඳුවූ වචීසමාචාරයක් සෙවනය කරන්නහුට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, ශාරිපුත්‍රය, මෙලෙව්හි ඇතමෙක් බොරුකීම හැර බොරුකීමෙන් වෙන්වූයේ වේද, සභාවක සිටියේ හෝ පිරිසක සිටියේ හෝ නෑයන් මැද සිටියේ හෝ සමූහ මැද සිටියේ හෝ රජකුල මැද සිටියේ හෝ ඉදිරියට පැමිණවූයේ, 'පින්වත් පුරුෂය මෙහි එව, යමක් දන්නෙහි නම් එය කියව'යි සාක්ෂ්‍ය විචාරණ ලදුයේ හෙතෙම නොදන්නා දෙය හෝ නොදනිමියි කියයි. දන්නා දෙය හෝ දනිමියි කියයි. නොදක්නා දෙය හෝ නොදක්මියි කියයි. දක්නා දෙය හෝ දක්මියි කියයි. මෙසේ තමා නිසා හෝ අනුන් නිසා හෝ කිසියම් සුළු ආමිෂයක් (අල්ලසක්) නිසා හෝ දැන දැන බොරු නොකියන්නේවේද, කේළාම් කීම හැර කේළමෙන් වෙන්වූයේ, එතැනින් අසා මොවුන්ගේ භෙදය පිණිස මෙහි නොකියන්නේ වේද, මෙතැනින් අසා ඔවුන්ගේ භෙදය පිණිස එහි නොකියන්නේද, මෙසේ වෙන්වූවන් සමගි කරන්නේ සමගි වූවන්ගේ සමගියට අනුබල දෙන්නේ, සමගියෙහි ඇළුනේ, සමගිවූ අය දැක සතුටු වන්නේ, සමගිය ඇතිකරන වචන කියන්නේ වේද, ඵරුෂවචන හැර, ඵරුෂවචන කීමෙන් වෙන්වූයේ වේ. යම් ඒ වචනයක් නිවැරැදිවේද, කණට සුව එළවයිද, ප්‍රේමය ඇතිකරයිද, සිත සතුටු කරයිද, ශිෂ්ට වචන කියන්නේවේද, බොහෝ දෙනාගේ සිත් ඇදගන්නේ, බොහෝ දෙනාගේ මනාපය වඩන්නේ වේද, එබඳු වචන කියන්නේ වේ. සම්ඵප්‍රලාපය හැර සම්ඵප්‍රලාප

කීමෙන් වෙන්වූයේ වේ. වේලාවට සුදුසු (කාලොචිත) වචන කියන්නේ, සිදුවූවක්ම කියන්නේ, වැඩ පිණිස පවත්නා වචනයක්ම කියන්නේ, දැහැමි වචනයක්ම කියන්නේ, විනය වචනයක්ම කියන්නේ, නිධානයක් මෙන් තැන්පත් කොට තබාගතයුතු සුදුසු කල්හි යොග්‍යලෙස, සීමාවක් ඇතිව, වැඩ පිණිස වචන කියන්නේ වේද, ශාරිපුත්‍රය, මෙබඳුවූ වචීසමාචාරය සෙවුනහුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්, කුශල ධර්මයෝ වැඩෙත්.

"ශාරිපුත්‍රය, මම වචීසමාචාරයද සෙවිය යුත්තය නොසෙවිය යුත්තයයි දෙපරිදිකොට කියමි. ඒ වාක්සමාචාරයද සේවනය කළ යුත්ත අනිකකි. සේවනය නොකළ යුත්ත අනිකකියි කියමියි මෙසේ මා විසින් ඒ යමක් කියන ලදද, එය මේ සඳහා කියන ලදී.

28. "ශාරිපුත්‍රය, මම මනොසමාචාරයද සෙවිය යුත්තය සේවනය නොකළ යුත්තයයි දෙපරිදිකොට කියමි. හෙද සෙවිය යුත්ත අනිකකි සේවනය නොකළ යුත්ත අනිකකි"යි කියමියි මෙසේ මා විසින් කියන ලදනම් එය කුමක් සඳහා කියන ලදද? ශාරිපුත්‍රය, යම් බඳුවූ මනොසමාචාරයක් සේවනය කරන්නහුට අකුසල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ මනොසමාචාරය සේවනය නොකළ යුතුය. ශාරිපුත්‍රය, යම්බඳුවූ මනොසමාචාරයක් සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද එබඳුවූ මනොසමාචාරය සෙවනය කළ යුතුයි.

"ශාරිපුත්‍රය කෙබඳුවූ මනොසමාචාරයක් සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, ශාරිපුත්‍රය, මෙලෙව්හි ඇතමෙක් දැඩි ලොභයෙන් යුක්තවේද, යම් අන්සතු සම්පතක් වේනම් එය තමාහට ලබාගැනීම සඳහා මේ අන්සතු දෙය මා අයත්වන්නේ නම් ඉතා හොඳයයි සිතන්නේ වේද, විකාරයට පත් සිත් ඇත්තේ දූෂ්‍යවූ අදහස් ඇත්තේ. මේ සත්වයෝ නැසෙත්වා! කඩ කඩ වෙත්වා! විනාශ වෙත්වා! හෝ (ජීවතුන් අතර) නොවෙත් වායි'

ශාරිපුත්‍රය, එබඳුවූ මනොසමාචාරය සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ වැඩෙත්, කුශල ධර්මයෝ පිරිහෙත්. ශාරිපුත්‍රය, කෙබඳුවූ මනොසමාචාරයක් සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, ශාරිපුත්‍රය, මෙලෙව්හි ඇතමෙක් දැඩිලොභ රහිතවේද, යම් ඒ අන්සතු සම්පතක් වේනම් එය තමාහට ලබාගැණීම සඳහා අන්සතු දෙය මා අයත් වන්නේනම් ඉතා හොඳයයි නොසිතන්නේ වේද, විකාරයට නොපත් සිත් ඇත්තේ දූෂ්‍යවූ අදහස් නැත්තේ, මේ සත්වයෝ වයිර නැත්තෝව, උවදුරු නැත්තෝව, සැප ඇත්තෝව දිවි පවත්වත්වා'යි ශාරිපුත්‍රය, මෙබඳුවූ මනොසමාචාරය සෙවුනහුට අකුශලධර්මයෝ පිරිහෙත්. කුශල ධර්මයෝ වැඩෙත්.

"ශාරිපුත්‍රය, මම මනොසමාචාරයද සේවනයකළ යුත්තය සේවනය නොකළ යුත්තයයි දෙපරිදිකොට කියමි. හෙද සේවනය කළ යුත්ත අනිකෙකි. සේවනය නොකළ යුත්ත අනිකෙකියි කියමි. මෙසේ මා විසින් ඒ යමක් කියන ලදනම් මෙය ඒ සඳහා කියන ලදී.

**29.** ශාරිපුත්‍රය, මම සිතද සේවනය කළ යුත්තය සේවනය නොකළ යුත්තයයි දෙපරිදිකොට කියමි. හෙද සේවනය කළ යුත්ත අනිකකි. සේවනය නොකළ යුත්ත අනිකකි'යි මෙසේ මා විසින් මෙය යමක් සඳහා කියන ලද නම්, එය කුමක් සඳහා කියන ලදද? ශාරිපුත්‍රය, යම්බඳුවූ සිතක් සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ සිත සේවනය නොකළ යුතුයි.

"ශාරිපුත්‍රය, යම්බඳුවූ සිතක් සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශලධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ සිත සේවනය කළ යුතුයි.

"ශාරිපුත්‍රය, කෙබඳුවූ සිතක් සේවනය කරන්නහුට අකුසල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, ශාරිපුත්‍රය, මෙලෙව්හි ඇතමෙක් අභිජ්ඣා (විෂම ලොභය) ඇත්තේ අභිජ්ඣා සහිත සිතින් යුතුව වෙසේද, ව්‍යාපාද (ක්‍රොධ) ඇත්තේ

ව්‍යාපාද සහිත සිතින් යුතුව වෙසේද, හිංසාකිරීම් සහිතවූ සිතින් යුතුව වෙසේද, ශාරිපුත්‍රය, මෙබඳුවූ සිත සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ වැඩෙත්. කුශල ධර්මයෝ පිරිහෙත්. ශාරිපුත්‍රය, කෙබඳුවූ, චිත්තුප්පාදයක් සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, ශාරීපුත්‍රය, මෙලෙව්හි ඇතමෙක් අභිජ්ඣා ඇත්තේ අභිජ්ඣාරහිතවූ සිතින් යුතුව වෙසේද, ව්‍යාපාද ඇත්තේ ව්‍යාපාද රහිතවූ සිතින් යුතුව වෙසේද, හිංසා කිරීම් නැත්තේ හිංසා කිරීම් රහිතවූ සිතින් යුතුව වෙසේද, ශාරිපුත්‍රය, එබඳුවූ සිත සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ පිරිහෙත්. කුශලධර්මයෝ වැඩෙත්.

"ශාරිපුත්‍රය, මම සිතද සේවනය කළ යුතුය, සේවනය නොකළ යුත්තයයි දෙපරිදිකොට කියමි. හෙද සේවනය කළ යුත්ත අනිකකි සේවනය නොකල යුත්ත අනිකකි"යි කියමින් මෙසේ මා විසින් යමක කියනලද නම් එය මේ සඳහා කියනලදී.

"**30.** ශාරිපුත්‍රය, මම සංඥාවද සේවනය කළ යුත්තය සේවනය නොකළ යුත්තයයි දෙපරිදි කොට කියමි. හෙද සේවනය කළ යුත්ත අනිකකි සේවනය නොකළ යුත්ත අනිකකියි කියමියි මෙසේ මෙය මා විසින් කියනලද නම් එය කුමක් සඳහා කියන ලදද? ශාරිපුත්‍රය, යම් බඳුවූ සංඥාවක් සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ වැඩෙත්ද? කුශල ධර්මයෝ පිරිහෙත්ද, මෙබඳුවූ සංඥාවක් සේවනය නොකළ යුතුයි. ශාරිපුත්‍රය, මෙබඳුවූ සංඥාවක් සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ සංඥාව සේවනය කළ යුතුයි.

"ශාරිපුත්‍රය, කෙබඳුවූ සංඥාවක් සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, ශාරිපුත්‍රය, මෙලොව්හි ඇතමෙක් අභිජ්ඣා (අනුන්ගේ දෙයට ආසාව) ඇත්තේ අභිජ්ඣා සහිතවූ සංඥාවෙන් යුතුව වෙසේද, ව්‍යාපාද (ක්‍රොධ) ඇත්තේ ව්‍යාපාද සහිතවූ සංඥාවෙන් යුතුව වෙසේද, හිංසා කරන සිත් හිංසා සහිතවූ සංඥාවෙන් යුතුව වෙසේද, ශාරිපුත්‍රය, එබඳුවූ සංඥාව සේවනය කරන්නහුට

අකුශල ධර්මයෝ වැඩෙත්. කුශල ධර්මයෝ පිරිහෙත්. ශාරිපුත්‍රය, කෙබඳුවූ සංඥාව සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, ශාරිපුත්‍රය, මෙලෙව්හි ඇතැමෙක් අභිජ්ඣා නැත්තේ අභිජ්ඣා රහිතවූ සංඥාවෙන් යුතුව වෙසේද, ව්‍යාපාද නැත්තේ ව්‍යාපාද රහිතවූ සංඥාවෙන් යුතුව වෙසේද, හිංසා නැත්තේ හිංසා රහිතවූ සංඥාවෙන් යුතුව වෙසේද, ශාරිපුත්‍රය, මෙබඳුවූ සංඥාව සේවනය කරන්නහුට අකුශලධර්මයෝ පිරිහෙත්. කුශල ධර්මයෝ වැඩෙත්.

"ශාරිපුත්‍රය, මම සංඥාවද සේවනය කළ යුත්තය සේවනය නොකළ යුත්තයයි දෙපරිදි කොට කියමි. හෙද සේවනය කළ යුත්ත අනිකකි සේවනය නොකළ යුත්ත අනිකකියි කියමියි මෙසේ මා විසින් ඒ යමක් කියනලදනම් එය මේ සඳහා කියන ලදී.

31. 'ශාරිපුත්‍රය, මම දෘෂ්ටියද සේවනය කළ යුත්තය සේවනය නොකළ යුත්තයයි. දෙපරිදිකොට කියමි. හෙද සේවනය කළ යුත්ත අනිකකි, සේවනය නොකළ යුත්ත අනිකකි'යි කියමියි මෙසේ මා විසින් මෙය කියන ලද නම් එය කුමක් සඳහා කියනලදද, ශාරිපුත්‍රය, යම්බඳු දෘෂ්ටියක් සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ දෘෂ්ටිය සේවනය නොකළ යුතුය. ශාරිපුත්‍රය, යම්බඳුවූ දෘෂ්ටියක් සේවනය කරන්නහුට අකුසල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ දෘෂ්ටිය සේවනය කළ යුතුයි. ශාරිපුත්‍රය, කෙබඳුවූ දෘෂ්ටියක් සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද

32. "ශාරිපුත්‍රය, මෙලෙව්හි ඇතමෙක් මෙබඳු දෘෂ්ටි ඇත්තේවේ. එනම් දුන් දැයෙහි විපාක නැත "යිට්ඨ" නම් ලද කුඩායාගයෙහි ඵල නැත, "හුත" නම් ලද මහායාගයෙහි ඵල නැත, කළ හොඳ නොහොඳ දෙක්හි ඵල විපාක නැත, පරලොව සිටියහුට මෙලොව නැත, මෙලොව සිටියහුට පරලොව නැත, මවට කරනලද හොඳ නරක දැයෙහි විපාක නැත. පියාට කරන හොඳ නරක දැයෙහි විපාක නැත. චුතව උපදින සත්වයෝ

නැත. මනා පිළිවෙතෙහි පිළිපන්, මෙලොව හා පරලොව තෙමේ නුවණින් දැන අවබෝධකොට පවසන මහණ බමුණන් ලොව නැත යනුවෙනි. ශාරිපුත්‍රය, මෙබඳුවූ දෘෂ්ටි සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ වැඩෙත්. කුශල ධර්මයෝ පිරිහෙත්. ශාරිපුත්‍රය, කෙබඳුවූ දෘෂ්ටියක් සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ පිරිහෙත්ද කුශල ධර්මයෝ වැඩෙත්ද, ශාරිපුත්‍රය, මෙලෙව්හි ඇතමෙක් මෙබඳු දෘෂ්ටි ඇත්තේවේ. එනම් දුන්දැයෙහි විපාක ඇත. "යිට්ඨ' නම් ලද කුඩායාගයෙහි ඵලනැත, "හුත" නම් ලද මහායාගයෙහි ඵල ඇත, කළ හොඳ නරක දෙක්හි ඵලවිපාක ඇත, පරලොව සිටියහුට මෙලොව ඇත, මෙලොව සිටියහුට පරලොව ඇත, මවට කරනලද හොඳ නරක දැයෙහි විපාක ඇත, පියාට කරනලද හොඳ නරක දැයෙහි විපාක ඇත. මැරී උපදින සත්වයෝ ඇත, මනා පිළිවෙතෙහි පිළිපන්, මෙලොව හා පරලොව තෙමේ නුවණින් දැන අවබෝධ කොට පවසන මහණ බමුණෝ ලොව ඇත යනුවෙනි. ශාරිපුත්‍රය, මෙබඳුවූ දෘෂ්ටි සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ පිරිහෙත්. කුශල ධර්මයෝ වැඩෙත්.

"ශාරිපුත්‍රය, මම දෘෂ්ටි සේවනය කළ යුත්තය, සේවනය නොකළ යුත්තයයි දෙපරිදි කොට කියමි. හෙද සේවනය කළ යුත්ත අනිකකි. සේවනය නොකළ යුත්ත අනිකකි"යි කියමියි මෙසේ මා විසින් ඒ යමක් කියන ලද නම් එය මේ සඳහා කියනලදී.

33. "ශාරිපුත්‍රය, මම ආත්මභාවය ලැබීමද දෙපරිදි කොට කියමි. සෙවිය යුත්තද, නොසෙවිය යුත්තද කියායි. හෙද සෙවියයුතු ආත්මභාව ලැබීම අනිකකි. නොසෙවිය යුතු ආත්මභාවය ලැබීම අනිකකියි මෙසේ මා විසින් කියන ලද නම් එය කුමක් සඳහා කියන ලදද, ශාරිපුත්‍රය, යම්බඳුවූ ආත්මභාවය ලැබීමත් සෙවුනහුට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ ආත්මභාව ප්‍රතිලාභය නොසෙවිය යුතුයි. ශාරිපුත්‍රය, යම්බඳුවූ ආත්මභාවයක් ලැබීමක් සෙවුනහුට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ

වැඩෙත්ද, එබඳුවූ ආත්මභාවයක් ලැබීම සෙවිය යුතුයි. ශාරිපුත්‍රය, කෙබඳුවූ ආත්මභාව ලැබීමක් සෙවුනහුට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, ශාරිපුත්‍රය, දුක් සහිතවූ ආත්මභාවය ලබා උපන්නහුගේ අකුශල ධර්මයෝ, උත්පත්තිය නොනිමි බැවින් වැඩෙත්. කුශල ධර්මයෝ පිරිහෙත්. ශාරිපුත්‍රය, කෙබඳුවූ ආත්මභාව ප්‍රතිලාභයක් සෙවුනහුට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, ශාරිපුත්‍රය, දුක් රහිතවූ ආත්මභාවය ලබා උපන්නහුගේ අකුශල ධර්මයෝ උත්පත්තිය නිමි බැවින් පිරිහෙත් කුශල ධර්මයෝ වැඩෙත්. ශාරිපුත්‍රය, මම ආත්මභාවය ලැබීමද සේවනය කළයුත්තය සේවනය නොකළ යුත්තයයි දෙපරිදි කොට කියමි. මෙහෙද සේවනය කළයුත්ත අනිකකි. සේවනය නොකළ යුත්ත අනිකකියි කියමියි යන ඒ යමක් මා විසින් කියන ලදද, එය මේ සඳහා කියන ලදී.

34. "ශාරිපුත්‍රය, මා විසින් සංක්ෂෙපයෙන් කියන ලද මෙහි අර්ථය මෙසේ විස්තර වශයෙන් දතයුතුය. ශාරිපුත්‍රය, චක්ඛුවිඤ්ඤාණයෙන් දැනගතයුතු රූපයද මම සේවනය කළ යුත්තය සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමි. ශාරිපුත්‍රය, සොතවිඤ්ඤාණයෙන් දතයුතුවූ ශබ්දයද මම සේවනය කළ යුත්තය සේවනය නොකළ යුත්තය දෙයාකාරයකින් කියමි. 'ශාරිපුත්‍රය, ඝාණවිඤ්ඤාණයෙන් දැනගතයුතු ගන්ධයද මම සේවනය කළයුත්තය සේවනය නොකළ යුත්ත යයි දෙපරිදිකොට කියමි. ශාරිපුත්‍රය, මම ජිව්හාවිඤ්ඤාණයෙන් දතයුතුවූ රසයද සේවනය කළ යුත්ත සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමි. ශාරිපුත්‍රය, කායවිඥානයෙන් දැනගතයුතු ස්පර්ශයද මම සේවනය කළයුත්තය සේවනය නොකළ යුත්තයයි දෙපරිදිකොට කියමි. ශාරිපුත්‍රය, මනොවිඥානයෙන් දැනගතයුතු ධර්මාරම්මණයද මම සේවනය කළයුත්තය සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමි.

35. මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂෙපයෙන් වදාරණ ලද විස්තර වශයෙන්, අර්ථ නොබෙදන ලද මෙහි මෙසේ විස්තර වශයෙන් අර්ථය දනිමි."

'ශාරිපුත්‍රය, මම චක්ඛුවිඤ්ඤාණයෙන් දැනගතයුතු වූ රූපයද සේවනය කළ යුත්තය සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමියි මෙසේ මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. එය කුමක් සඳහා වදාරණ ලදද, ස්වාමීනි, යම්බඳුවූ චක්ඛුවිඤ්ඤාණයෙන් දැනගතයුතු රූපයක් සෙවනය කරන්නහුට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, මෙබඳුවූ චක්ඛුවිඤ්ඤාණයෙන් දැනගතයුතු රූපය නොකළ යුතුයි.' ස්වාමීනි, යම්බඳුවූ චක්ඛුවිඤ්ඤාණයෙන් දැනගතයුතු රූපයක් සෙවනය කරන්නහුට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ චක්ඛුවිඤ්ඤාණයෙන් දැනගතයුතු රූපය සේවනය කළයුතුය"

"ශාරිපුත්‍රය, මම චක්ඛුවිඤ්ඤාණයෙන් දැනගතයුතු රූපයද සේවනය කළ යුත්තය සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමියි ඒ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදනම් එය මේ සඳහා වදාරණ ලදී.

**36.** "ශාරිපුත්‍රය, මම ශ්‍රොත විඥානයෙන් දැනගතයුතු ශබ්දයද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද සේවනය නොකළ යුත්තද කියායි. මෙසේ මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙය කුමක් නිසා වදාරණ ලදද?" "ස්වාමීනි, යම් බඳුවූ ශ්‍රොතවිඤ්ඤාණයෙන් දැනගත යුතු වූ ශබ්දයක් සෙවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ ශ්‍රොතවිඤ්ඤාණයෙන් දැනගතයුතු වූ ශබ්දයක් සෙවනය නොකළ යුතුයි. "ස්වාමීනි, යම්බඳුවූ සොත විඤ්ඤාණයෙන් දතයුතු ශබ්දයක් සෙවනය කරන්නහුට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, මෙබඳුවූ සොත විඤ්ඤාණයෙන් දතයුතුවූ ශබ්දය සේවනය කළ යුතුයි. ශාරිපුත්‍රය, සොත විඤ්ඤාණයෙන් දැනගතයුතු ශබ්දයද දෙපරිදිකොට කියමි සෙවිය යුත්තද නොසෙවිය යුත්තද කියායි.

මෙසේ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද, එය මේ සඳහා වදාරණ ලදී.”

37. “ශාරිපුත්‍රය, මම ඝාණවිඤ්ඤාණයෙන් දැනගතයුතු ගන්ධයද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද සේවනය නොකළ යුත්තද කියායි. මෙසේ මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙය කුමක් නිසා වදාරණ ලදද” “ස්වාමීනි, යම් බඳුවූ, ඝාණවිඤ්ඤාණයෙන් දතයුතුවූ, ශබ්දය සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද? කුශල ධර්මයෝ පිරිහෙත්ද එබඳුවූ, ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ, ගන්ධයක් සේවනය නොකළ යුතුයි. ස්වාමීනි, යම්බඳුවූ ඝාණ විඤ්ඤාණයෙන් දැනගතයුතු ගන්ධය සේවනය කරන්නහුට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ, ගන්ධය සෙවිය යුතුයි. ශාරිපුත්‍රය, මම ඝාණ විඤ්ඤාණයෙන් දතයුතු වූ, ගන්ධය දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද, එය මේ සඳහා වදාරණ ලදී.”

38. “ශාරිපුත්‍රය, මම ජිව්හා විඤ්ඤාණයෙන් දැනගතයුතු රසය දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද සේවනය නොකළයුත්තද කියායි. මෙසේ මේ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදී. මෙය කුමක් නිසා වදාරණලදද?” “ස්වාමීනි, යම් බඳුවූ, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ, රසය සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද? කුශල ධර්මයෝ පිරිහෙත්ද? එබඳුවූ, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ, රසය සේවනය නොකළයුතුය. ස්වාමීනි, යම් බඳුවූ, ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ රසය සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද එබඳුවූ ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ රසයක් සේවනය කළයුතුයි.” “ශාරිපුත්‍රය, මම ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ රසය දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද නොසෙවිය යුත්තද කියායි.

මෙසේ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද, එය මේ සඳහා වදාරණලදී.

"ශාරිපුත්‍රය, මම කාය විඤ්ඤාණයෙන් දැනගතයුතු ස්පර්ශය දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද සේවනය නොකළයුත්තද කියායි. මෙසේ මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදි. මෙය කුමක් නිසා වදාරණලදද?" "ස්වාමීනි, යම් බඳුවූ කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ, ස්පර්ශයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ ස්පර්ශය සේවනය නොකළ යුතුයි. ස්වාමීනි, යම්බඳුවූ කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ ස්පර්ශයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ ස්පර්ශය සේවනය කළයුතුයි." "ශාරිපුත්‍රය, මම කාය විඤ්ඤාණයෙන් දතයුතුවූ ස්පර්ශය දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද? එය මේ සඳහා වදාරණ ලදී.

37. "ශාරිපුත්‍රය, මම මනො විඤ්ඤාණයෙන් දැනගතයුතු ධර්මය දෙපරිදිකොට කියමි. සේවනය කළ යුත්තද සේවනය නොකළ යුත්තද කියායි. මෙසේ මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙය කුමක් නිසා වදාරණ ලදද?" "ස්වාමීනි, යම් බඳුවූ මනො විඤ්ඤාණයෙන් දතයුතුවූ ධර්මයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ මනො විඤ්ඤාණයෙන් දතයුතුවූ ධර්මය සේවනය නොකළ යුතුයි. ස්වාමීනි, යම්බඳුවූ මනො විඤ්ඤාණයෙන් දතයුතුවූ ධර්මයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ මනො විඤ්ඤාණයෙන් දතයුතුවූ ධර්මය සේවනය කළයුතුයි. ශාරිපුත්‍රය, මම මනො විඤ්ඤාණයෙන් දතයුතුවූ ධර්මය දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක්

භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද? මෙය ඒ සඳහා වදාරණ ලදී”

“ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් සංක්ෂේපයෙන් දෙසනලද විස්තර වශයෙන්ද නොබෙදනලද මෙහි අර්ථය මෙසේ විස්තර වශයෙන් දනිමි,” කියායි.

38. “යහපත, යහපත ශාරිපුත්‍රය, ශාරිපුත්‍රය, තොපි මා විසින් සංක්ෂෙපයෙන් කියනලද විස්තර වශයෙන් අර්ථ නොබෙදූ මෙහි අර්ථය විස්තර වශයෙන් දන්නහුය. ශාරිපුත්‍රය මම චක්ඛු විඤ්ඤාණයෙන් දැනගතයුතු රූපය දෙපරිදිකොට කියමි. සේවනය කළ යුත්තද සේවනය නොකළ යුත්තද කියායි. මෙසේ මෙය මා විසින් කියන ලදී. මෙය කුමක් නිසා කියන ලදද? ශාරිපුත්‍රය, යම් බඳුවූ චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතුවූ රූපයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතුවූ රූපය සේවනය නොකළ යුතුයි. ශාරිපුත්‍රය, යම් බඳුවූ චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතුවූ රූපයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතුවූ රූපය සේවනය කළයුතුයි. ශාරිපුත්‍රය, මම චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතුවූ රූපය දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් මා විසින් කියනලදද, එය මේ සඳහා කියන ලදී.

39. “ශාරිපුත්‍රය, මම සොත විඤ්ඤාණයෙන් දැනගතයුතු ශබ්දය දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද, සේවනය නොකළ යුත්තද, කියායි. මෙසේ මෙය මා විසින් කියනලදී. මෙය කුමක් නිසා කියන ලදද? ශාරිපුත්‍රය, යම් බඳුවූ සොත විඤ්ඤාණයෙන් දතයුතුවූ ශබ්දයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ සොත විඤ්ඤාණයෙන් දතයුතුවූ ශබ්දය සේවනය නොකළයුතුයි. ශාරිපුත්‍රය, යම් බඳුවූ සොත විඤ්ඤාණයෙන් දතයුතුවූ ශබ්දයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ සොත විඤ්ඤාණයෙන් දතයුතුවූ

ශබ්දය සේවනය කළයුතුයි. ශාරිපුත්‍රය, මම සොත විඤ්ඤාණයෙන් දතයුතුවූ ශබ්දය දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් මා විසින් කියන ලදද, එය මේ සඳහා කියනලදී.

40. "ශාරිපුත්‍රය, මම ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ ගන්ධය දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද සේවනය නොකළ යුත්තද කියායි. මෙය මා විසින් කියනලදී. මෙය කුමක් නිසා කියනලදදද? ශාරිපුත්‍රය, යම්බඳුවූ ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ ගන්ධයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ ගන්ධය සේවනය නොකළයුතුයි. ශාරිපුත්‍රය, යම්බඳුවූ ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ ගන්ධය සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ ගන්ධයක් සේවනය කළයුතුයි. ශාරිපුත්‍රය, මම ඝාණ විඤ්ඤාණයෙන් දතයුතුවූ ගන්ධය දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් මා විසින් කියන ලදද, එය මේ සඳහා කියනලදී.

41. "ශාරිපුත්‍රය, මම ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතු රසය දෙපරිදිකොට කියමි. සේවනය කළ යුත්තද, සේවනය නොකළ යුත්තද කියායි. මෙසේ මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදී. මෙය කුමක් නිසා වදාරණ ලදද?" "ස්වාමීනි, යම්බඳුවූ ජිව්හා විඤ්ඤාණයෙන් රසය සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද එබඳුවූ ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ රසය සේවනය නොකළ යුතුය. ස්වාමීනි, යම්බඳුවූ ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ රසය සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතුවූ රසය සේවනය කළයුතුයි. ස්වාමීනි, මම ජිව්හා විඤ්ඤාණයෙන් දතයුතු රසය දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද නොසෙවිය

යුත්තද කියායි. මෙසේ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද, එය මේ සඳහා වදාරණලදී.”

42. “ශාරිපුත්‍රය, මම කාය විඥ්ඥාණයෙන් දැනගතයුතු ස්පර්ශය දෙපරිදිකොට කියමි. සේවනය කළ යුත්තද, සේවනය නොකළ යුත්තද කියායි. මෙසේ මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙය කුමක් නිසා වදාරණ ලදද?” “ස්වාමීනි, යම් බඳුවූ කාය විඥ්ඥාණයෙන් දතයුතුවූ ස්පර්ශයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ කාය විඥ්ඥාණයෙන් දතයුතුවූ ස්පර්ශය සෙවනය නොකළ යුතුයි. ස්වාමීනි, යම් බඳුවූ කාය විඥ්ඥාණයෙන් දතයුතුවූ ස්පර්ශය සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ කාය විඥ්ඥාණයෙන් දතයුතුවූ ස්පර්ශය සේවනය කළයුතුයි.” “ශාරිපුත්‍රය, මම කාය විඥ්ඥාණයෙන් දතයුතුවූ ස්පර්ශය දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද, එය මේ සඳහා වදාරණලදී.

43. “ශාරිපුත්‍රය, මම මනො විඥ්ඥාණයෙන් දැනගතයුතු ධර්මය දෙපරිදිකොට කියමි. සේවනය කළ යුත්තද සේවනය නොකළ යුත්තද කියායි. මෙසේ මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙය කුමක් නිසා වදාරණ ලදද?” “ස්වාමීනි, යම්බඳුවූ මනො විඥ්ඥාණයෙන් දතයුතුවූ ධර්මයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ මනො විඥ්ඥාණයෙන් දතයුතුවූ ධර්මය සේවනය නොකළ යුතුයි. ස්වාමීනි, යම් බඳුවූ මනො විඥ්ඥාණයෙන් දතයුතු ධර්මයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ මනො විඥ්ඥාණයෙන් දතයුතුවූ ධර්මය සේවනය කළයුතුයි.” “ශාරිපුත්‍රය, මනො විඥ්ඥාණයෙන් දතයුතුවූ ධර්මය දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද, නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද, එය මේ සඳහා කියන ලදී.”

"ශාරිපුත්‍රය, මා විසින් සැකෙවින් කියනලද මෙහි විස්තර වශයෙන් අරුත් මෙසේ දතයුතුය.

44. "ශාරිපුත්‍රය, මම චීවරයද, දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද සේවනය නොකළ යුත්තද කියායි.

"ශාරිපුත්‍රය, මම පිණ්ඩපාතයද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද සේවනය නොකළ යුත්තද කියායි.

"ශාරිපුත්‍රය, මම සේනාසනයද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද සේවනය නොකළ යුත්තද කියායි.

"ශාරිපුත්‍රය, මම ගමද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද සේවනය නොකළ යුත්තද කියායි.

"ශාරිපුත්‍රය, මම නිගමයද, දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද, සේවනය නොකළයුත්තද කියායි.

"ශාරිපුත්‍රය, මම නගරයද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද සේවනය නොකළ යුත්තද කියායි.

"ශාරිපුත්‍රය, මම ජනපදයද දෙපරිදිකොට කියමි. සේවනය කළ යුත්තද සේවනය නොකළ යුත්තද කියායි. පුද්ගලයා සේවනය කළයුත්තය, සේවනය නොකළ යුත්තයයි දෙයාකාරයකින් කියමි."

45. මෙසේ වදාළ කල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළකෙළේය.

"ස්වාමීනි, මම භාග්‍යවතුන්වහන්සේ විසින් සැකෙවින් වදාළ විස්තර වශයෙන් නොබෙදූ මෙහි මෙසේ විස්තර වශයෙන් අදහස දනිමි."

"ශාරිපුත්‍රය, මම චීවරයද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද, සේවනය නොකළයුත්තද කියායි. මෙසේ මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙය කුමක් නිසා වදාරණ ලදද?" "ස්වාමීනි, යම් බඳුවූ, චීවරයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ

පිරිහෙත්ද, එබඳුවූ චීවරය සේවනය නොකළ යුතුයි. "ස්වාමීනි, යම් බඳුවූ, චීවරයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ චීවරය සේවනය කළයුතුයි. ශාරීපුත්‍රය, මම චීවරය දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද? එය මේ සඳහා වදාරණලදී.

**46.** "ශාරිපුත්‍රය, මම පිණ්ඩපාතයද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද, සේවනය නොකළයුත්තද කියායි. මෙසේ මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙය කුමක් නිසා වදාරණ ලදද?" "ස්වාමීනි; යම් බඳුවූ පිණ්ඩපාතයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද? එබඳුවූ, පිණ්ඩපාතය සේවනය නොකළ යුතුයි. ස්වාමීනි, යම් බඳුවූ පිණ්ඩපාතයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ, පිණ්ඩපාතය සේවනය කළයුතුයි." "ශාරිපුත්‍රය, මම පිණ්ඩපාතයද දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද, එය මේ සඳහා වදාරණ ලදී.

**47.** "ශාරිපුත්‍රය, මම සේනාසනයද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද සේවනය නොකළයුත්තද කියායි. මෙසේ මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදී. මෙය කුමක් නිසා වදාරණ ලදද?" "ස්වාමීනි, යම් බඳුවූ සේනාසනයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ, සේනාසනය සේවනය නොකළ යුතුයි. ස්වාමීනි, යම් බඳුවූ, සේනාසනයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ, සේනාසනය සේවනය කළයුතුයි" "ශාරිපුත්‍රය, මම සේනාසනයද දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද, එය මේ සඳහා වදාරණලදී.

**48.** "ශාරිපුත්‍රය, මම ගමද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද, සේවනය නොකළයුත්තද කියායි. මෙසේ මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණලදී. මෙය කුමක් නිසා වදාරණ ලදද?" "ස්වාමීනි, යම්බඳුවූ, ගමක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ, ගම සේවනය නොකළ යුතුයි." "ස්වාමීනි; යම් බඳුවූ ගමක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද; කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ ගම සේවනය කළයුතුයි." ශාරිපුත්‍රය, මම ගමද දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද, නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද, එය මේ සඳහා වදාරණලදී.

**49.** ශාරිපුත්‍රය, මම නිගමයද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද, සේවනය නොකළයුත්තද කියායි. මෙසේ මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදි. මෙය කුමක් නිසා වදාරණ ලදද?" "ස්වාමීනි, යම් බඳුවූ නියම්ගමක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ, නියම්ගම සේවනය නොකළ යුතුයි." "ස්වාමීනි; යම් බඳුවූ, යම් බඳුවූ නියම්ගමක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ, නියම්ගම සේවනය කළයුතුයි." "ශාරිපුත්‍රය, මම නියම්ගමද දෙපරිදිකොට කියමි. සෙවියයුත්තද නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද, එය මේ සඳහා වදාරණලදී.

**50.** "ශාරිපුත්‍රය, මම නගරයද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද, සේවනය නොකළ යුත්තද කියායි. මෙසේ මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙය කුමක් නිසා වදාරණ ලදද?" "ස්වාමීනි, යම් බඳුවූ, නගරයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ, නගරය සේවනය නොකළ යුතුයි. ස්වාමීනි, යම් බඳුවූ, නගරයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ, නගරය සේවනය

කළයුතුයි." "ශාරිපුත්‍රය, මම නගරයද දෙපරිදිකොට කියමි. සෙවියයුත්තද, නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද, එය මේ සඳහා වදාරණ ලදී.

**51.** "ශාරිපුත්‍රය, මම ජනපදයද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද, සේවනය නොකළ යුත්තද කියායි. මෙසේ මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙය කුමක් නිසා වදාරණ ලදද?" "ස්වාමීනි; යම්බඳුවූ, ජනපදයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද? කුශල ධර්මයෝ පිරිහෙත්ද? එබඳුවූ, නගරය සේවනය නොකළ යුතුයි. ස්වාමීනි; යම්බඳුවූ, ජනපදයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ, ජනපදය සේවනය කළයුතුයි." "ශාරිපුත්‍රය මම ජනපදයද දෙපරිදිකොට කියමි. සෙවියයුත්තද, නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද, එය මේ සඳහා වදාරණ ලදී.

**52.** "ශාරිපුත්‍රය, මම පුද්ගලයාද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද, සේවනය නොකළ යුත්තද කියායි. මෙසේ මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදී. මෙය කුමක් නිසා වදාරණ ලදද?" "ස්වාමීනි; යම්බඳුවූ පුද්ගලයෙකු සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ, පුද්ගලයා සේවනය නොකළ යුතුයි. ස්වාමීනි, යම් බඳුවූ පුද්ගලයකු සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ, පුද්ගලයා සේවනය කළයුතුයි." "ශාරිපුත්‍රය, මම පුද්ගලයාද දෙපරිදිකොට කියමි. සෙවියයුත්තද නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලදද, එය මේ සඳහා කියනලදී."

'ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේ විසින් සැකෙවින් වදාළ විස්තර වශයෙන් අරුත් නොබෙදූ මෙහි මෙසේ විස්තර වශයෙන් අදහස් දනිමි."

53. "යහපත, යහපත ශාරිපුත්‍රය, ශාරිපුත්‍රවූ ඔබ මා විසින් සැකෙවින් ප්‍රකාශකළ විස්තර වශයෙන් අර්ථ නොබෙදූ මෙහි අර්ථය විස්තර වශයෙන් දන්නෙහිය. ශාරිපුත්‍රය, මම චීවරයද දෙපරිදිකොට කියමි. සෙවියයුත්තය නොසෙවිය යුත්තය කියායි. මෙසේ මා විසින් කියනලදි. මෙය කුමක් සඳහා කියනලදද? ශාරීපුත්‍රය, යම්බඳුවූ චීවරයක් සෙවුනහුට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද එබඳුවූ චීවරය සේවනය නොකළ යුතුයි. ශාරීපුත්‍රය, යම්බඳුවූ, චීවරයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශලධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ චීවරය සේවනය කළයුතුයි. ශාරිපුත්‍රය, මම චීවරයද දෙපරිදිකොට කියමි. සෙවියයුත්තද, නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් මා විසින් කියන ලදද, එය මේ සඳහා කියනලදී.

54. "ශාරිපුත්‍රය, මම පිණ්ඩපාතයද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද සේවනය නොකළයුත්තද කියායි. මෙසේ මෙය මා විසින් කියනලදී. මෙය කුමක් නිසා කියන ලදද? ශාරිපුත්‍රය; යම් බඳුවූ පිණ්ඩපාතයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ පිණ්ඩපාතය සේවනය නොකළයුතුයි. ශාරීපුත්‍රය, යම් බඳුවූ පිණ්ඩපාතයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ පිණ්ඩපාතය සේවනය කළයුතුයි. ශාරිපුත්‍රය, මම පිණ්ඩපාතයද දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද, නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් මා විසින් කියන ලදද, එය මේ සඳහා කියන ලදී.

55. "ශාරිපුත්‍රය, මම සෙනසුනද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද, සේවනය නොකළ යුත්තද කියායි. මෙසේ මෙය මා විසින් කියන ලදී. ශාරිපුත්‍රය, යම්බඳුවූ, සේනාසනයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ සේනාසනය සේවනය නොකළයුතුයි. ශාරිපුත්‍රය, යම් බඳුවූ, සේනාසනයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ

වැඩෙත්ද, එබඳුවූ සේනාසනය සේවනය කළයුතුයි. ශාරිපුත්‍රය, මම සේනාසනයද දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද, නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් මා විසින් කියන ලදද, එය මේ සඳහා කියන ලදී.

56. "ශාරිපුත්‍රය, මම ගමද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද, සේවනය නොකළ යුත්තද කියායි. මෙසේ මෙයා මා විසින් කියන ලදී. ශාරිපුත්‍රය, යම් බඳුවූ ගමක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ ගම සේවනය නොකළ යුතුයි. ශාරිපුත්‍රය, යම් බඳුවූ ගමක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ ගම සේවනය කළයුතුයි. ශාරීපුත්‍රය, මම ගම දෙපරිදිකොට කියමි. සෙවියයුත්තද, නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් මා විසින් කියන ලදද, එය මේ සඳහා කියන ලදී.

57. "ශාරිපුත්‍රය, මම නියම්ගමද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද, සේවනය නොකළ යුත්තද කියායි. මෙසේ මෙය මා විසින් කියන ලදී. ශාරීපුත්‍රය, යම් බඳුවූ, නියම්ගමක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ නියම්ගම සේවනය නොකළ යුතුයි. ශාරීපුත්‍රය, යම් බඳුවූ නියම්ගමක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ පිරිහෙත්ද, කුශල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ ගම සේවනය කළයුතුයි. ශාරීපුත්‍රය, මම නියම්ගමද දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද, නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් මා විසින් කියන ලදද, එය මේ සඳහා කියන ලදී.

58. 'ශාරීපුත්‍රය, මම නගරයද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද, සේවනය නොකළ යුත්තද කියායි. මෙසේ මෙය මා විසින් කියන ලදී. ශාරීපුත්‍රය, යම් බඳුවූ, නගරයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද, කුශල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ නගරය සේවනය නොකළයුතුයි. ශාරීපුත්‍රය, යම් බඳුවූ, නගරයක් සේවනය කරන්නාට අකුශල ධර්මයෝ

පිරිහෙත්ද, කුසල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ, නගරය සේවනය කළයුතුයි. ශාරීපුත්‍රය, මම නගරයද දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද, නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් මා විසින් කියන ලදද, එය මේ සඳහා කියන ලදී.

**59.** "ශාරිපුත්‍රය, මම ජනපදයද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද, සේවනය නොකළ යුත්තද කියායි. මෙසේ මෙය මා විසින් කියන ලදී. ශාරිපුත්‍රය, යම් බඳුවූ, ජනපදයක් සේවනය කරන්නාට අකුසල ධර්මයෝ වැඩෙත්ද, කුසල ධර්මයෝ පිරිහෙත්ද, එබඳුවූ, ජනපදය සේවනය නොකළ යුතුයි. ශාරිපුත්‍රය, යම් බඳුවූ, ජනපදයක් සේවනය කරන්නාට අකුසල ධර්මයෝ පිරිහෙත්ද, කුසල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ, ජනපදය සේවනය කළයුතුයි. ශාරිපුත්‍රය, මම ජනපදයද දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද, නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් මා විසින් කියන ලදද, එය මේ සඳහා කියන ලදී.

**60.** "ශාරිපුත්‍රය, මම පුද්ගලයාද දෙපරිදිකොට කියමි. සේවනය කළයුත්තද, සේවනය නොකළ යුත්තද කියායි. මෙසේ මෙය මා විසින් කියන ලදී. ශාරිපුත්‍රය, යම් බඳුවූ, පුද්ගලයෙකු සේවනය කරන්නාට අකුශල ධර්මයෝ වැඩෙත්ද? කුසල ධර්මයෝ පිරිහෙත්ද? එබඳුවූ, පුද්ගලයා සේවනය නොකළ යුතුයි. ශාරිපුත්‍රය, යම්බඳුවූ, පුද්ගලයෙකු සේවනය කරන්නාට අකුසල ධර්මයෝ පිරිහෙත්ද, කුසල ධර්මයෝ වැඩෙත්ද, එබඳුවූ පුද්ගලයා සේවනය කළයුතුයි. ශාරීපුත්‍රය, මම පුද්ගලයාද දෙපරිදිකොට කියමි. සෙවිය යුත්තද, නොසෙවිය යුත්තද කියායි. මෙසේ යමක් මා විසින් කියන ලදද එය මේ සඳහා කියන ලදී.

**61.** "ශාරිපුත්‍රය, මා විසින් සැකෙවින් වදාළ විස්තර වශයෙන් අරුත් නොබෙදූ මෙහි විස්තර වශයෙන් අර්ථය මෙසේ දතයුතු

"ශාරිපුත්‍රය, ඉදින් සියලු ක්ෂත්‍රියයෝ මා විසින් සැකෙවින් කී විස්තර වශයෙන් අර්ථ නොබෙදූ මෙහි අදහස විස්තර වශයෙන් දන්නාහුනම් ඒ සියළු ක්ෂත්‍රියයින්ට මෙය බොහෝ කාලයක් හිත සුව පිණිස වන්නේය.

"ශාරිපුත්‍රය, ඉදින් සියළු බ්‍රාහ්මණයෝ මා විසින් කෙටියෙන් කී, විස්තර වශයෙන් අර්ථය නොබෙදූ, මෙහි අදහස විස්තර වශයෙන් දන්නාහුනම් ඒ සියලු බ්‍රාහ්මණයින්ට මෙය බොහෝ කාලයක් හිත සුව පිණිස වන්නේය.

"ශාරිපුත්‍රය, ඉදින් සියලු වෛශ්‍යයෝ මා විසින් කෙටියෙන් කී, විස්තර වශයෙන් අර්ථය නොබෙදූ, මෙහි අදහස විස්තර වශයෙන් දන්නාහුනම් ඒ සියලු වෛශ්‍යයින්ට මෙය බොහෝ කාලයක් හිත සුව පිණිස වන්නේය.

"ශාරිපුත්‍රය, ඉදින් සියලු ක්ෂුද්‍රයෝ මා විසින් කෙටියෙන් කී, විස්තර වශයෙන් අර්ථය නොබෙදූ, මෙහි අදහස විස්තර වශයෙන් දන්නාහුනම් ඒ සියලු ක්ෂුද්‍රයින්ට මෙය බොහෝ කලක් හිතසුව පිණිස වන්නේය.

62. "ශාරිපුත්‍රය, ඉදින් දෙවියන් මරුන් බඹුන් මහණ බමුණන් සහිත ලොකය දෙව්මිනිසුන් සහිත සත්වයෝ මා විසින් සැකෙවින් වදාළ විස්තර වශයෙන් අර්ථ නොබෙදූ මෙහි අදහස විස්තර වශයෙන් දන්නේ නම් දෙවියන් මරුන් බඹුන් මහණ බමුණන් සහිත ලොකයට දෙව්මිනිසුන් සහිත ප්‍රජාවට බොහෝ කාලයක් හිත සුව පිණිස වන්නේය"යි වදාළේය.

භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනාකළ සේක. සතුටුවූ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ කථාවට බෙහෙවින් සතුටු වූහ.

**සතර වෙනි සෙවිතබ්බාසෙවිතබ්බ සූත්‍රය නිමි. (2-4)**

---

## 15. බහුධාතුක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඩු සිටුහු විසින් කරවනලද ජෙතවනාරාමයෙහි වැඩ වසනසේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි, කියා භික්ෂූන්ට කථා කළහ. 'ස්වාමීනි'

කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, යම්කිසි බියක් උපදීනම් ඒ සියල්ල බාලයා කෙරෙන් උපදී. පණ්ඩිතයා කෙරෙන් නූඋපදී. යම් කිසි උවදුරක් උපදීනම් ඒ සියල්ල බාලයා කෙරෙන් උපදී, පණ්ඩිතයා කෙරෙන් නූපදී. යම්කිසි විපත්තියක් වේනම් ඒ සියල්ල බාලයා කෙරෙන් උපදී, පණ්ඩිතයා කෙරෙන් නූපදී.

"මහණෙනි, යම්කිසි බටකොළ සෙවිලි කළ ගෙයක් හෝ තණකොළ සෙවිලි කළ ගෙයක් හෝ ගිනි ඇවිලුනේ යම්සේ ගේමුදුන් දවාද, සුනු පිරියම් කළ වෙසෙන තැන්ද අගුළු ගැසූ දොරවල්ද, වසනලද වාතකවුළුද යන සියල්ල අළු කෙරේද, එසේම මහණෙනි, යම්කිසි බියක් උපදීනම් ඒ සියල්ල බාලයා කෙරෙන් උපදී, පණ්ඩිතයා කෙරෙන් නූපදී. යම්කිසි උපද්‍රවයක් උපදීනම්, ඒ සියල්ල බාලයා කෙරෙන් උපදී. පණ්ඩිතයා කෙරෙන් නූපදී. යම්කිසි විපත්තියක් වේනම් ඒ සියල්ල බාලයා කෙරෙන් උපදී. පණ්ඩිතයා කෙරෙන් නූපදී.

3. "මහණෙනි, මෙසේ බාලතෙම බිය සහිතවේ. පණ්ඩිත තෙමේ බිය රහිතවේ. බාලතෙමේ උවදුරු සහිතවේ. පණ්ඩිත තෙමේ උවදුරු රහිතවේ. බාලතෙමේ විපත්ති සහිතවේ. පණ්ඩිත තෙමේ විපත්ති රහිත වේ.

"මහණෙනි, පණ්ඩිතයා කෙරෙන් (ඇතිවන) බියක් නැත. පණ්ඩිතයා කෙරෙන් (ඇතිවන) උවදුරක් නැත. පණ්ඩිතයා කෙරෙන් (ඇතිවන) විපතක් නැත. මහණෙනි, එහෙයින් මෙහිදී විමසා කටයුතු කරන පණ්ඩිතයෝ වෙමුයයි මහණෙනි, මෙසේ වනාහි තොප විසින් හික්මිය යුතුය"යි වදාළසේක.

4. මෙසේ වදාළකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැළකෙළේය. "ස්වාමීනි, කොපමණකින් වනාහි මහණතෙමේ විමසා කටයුතු කරන පණ්ඩිතයෙකැයි කීමට සුදුසුවේද?" යනුයි.

"ආනන්දය, යම්තැනක පටන් මහණතෙමේ (අටළොස්) ධාතු දැනීමෙහි දක්ෂවේද, ආයතන දැනීමෙහි දක්ෂවේද, පටිච්චසමුප්පාදය දැනීමෙහි දක්ෂවේද, කරුණු නොකරුණු දැනීමෙහි දක්ෂවේද, ආනන්දය, මෙපමණකින් භික්ෂුතෙම විමසීමෙහි කටයුතු කරන පණ්ඩිතයෙකැයි කීමට සුදුසුවේ."

5. "ස්වාමීනි, කොපමණකින් වනාහි භික්ෂුතෙමේ ධාතුන්හි දක්ෂයෙකැයි කීමට සුදුසුවේද?" "ආනන්දය, මේ ධාතූහු වනාහි මෙපමණ වෙති. චක්ඛු ධාතුය, රූප ධාතුය චක්ඛු විඤ්ඤාණ ධාතුය-සොත ධාතුය-සද්ද ධාතුය-සොත විඤ්ඤාණ ධාතුය-ඝාණ ධාතුය-ගන්ධ ධාතුය-ගන්ධ විඤ්ඤාණ ධාතුය-ජිව්හා ධාතුය රස ධාතුය-ජිව්හා විඤ්ඤාණ ධාතුය-කායධාතුය-ඵොඨ්ඨබ්බ ධාතුය-කාය විඤ්ඤාණ ධාතුය-මනො ධාතුය-ධම්ම ධාතුය-මනො විඤ්ඤාණ ධාතුය කියායි. ආනන්දය, මේ අටළොස් ධාතූන් යම්තැනක පටන්කොට දනීද, දකීද, ආනන්දය, මෙපමණකිනුදු මහණතෙමේ ධාතූන්හි දක්ෂයෙකැයි කීමට සුදුසුය.

6. "ස්වාමීනි, යම්සේ ධාතූන්හි දක්ෂ භික්ෂූවකැයි කීමට සුදුසු අනික් ක්‍රමයකුදු ඇත්තේද?" "ආනන්දය, ඇත්තේය. ආනන්දය, මේ ධාතූහු සදෙනෙක් වෙති. පඨවි ධාතුය-ආපො ධාතුය-වායො ධාතුය-තෙජෝ ධාතුය-ආකාස ධාතුය-විඤ්ඤාණ ධාතුය කියායි.

"ආනන්දය, මේ සය වැදෑරුම් ධාතූන් යම්තැනක පටන් කොට දනීද? දකීද? මෙපමණකිනුදු ආනන්දය, ධාතූන්හි දක්ෂවූ භික්ෂූවකැයි කීමට සුදුසුවෙයි."

7. "ස්වාමීනි, යම්සේ ධාතූන්හි දක්ෂවූ භික්ෂූවකැයි කීමට සුදුසු අනික් ක්‍රමයකුදු වන්නේද?" "ආනන්දය, වන්නේය. ආනන්දය, මේ ධාතූහු සය දෙනෙක් වෙති. සුඛ ධාතු-දුක්ඛ ධාතු-සොමනස්ස ධාතු, දොමනස්ස ධාතු, උපෙක්ඛා ධාතු, අවිජ්ජා ධාතු කියායි. ආනන්දය, මේ සය වැදෑරුම් ධාතූන් යම්තැනක පටන්කොට දනීද, දකීද, ආනන්දය, මෙපමණකිනුදු ධාතූන්හි දක්ෂවූ භික්ෂූවකැයි කීමට සුදුසුවෙයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

8. "ස්වාමීනි, යම්සේ ධාතුන්හි දක්ෂවූ භික්ෂුවකැයි කීමට සුදුසු අනික් ක්‍රමයකුදු ඇත්තේද?" "ඇත්තේය, ආනන්දය, මේ ධාතුහු සයදෙනෙක් වෙති. කාම ධාතු-නෙක්ඛම්ම ධාතු-ව්‍යාපාද ධාතු, අව්‍යාපාද ධාතු, විහෙසාධාතු, අවිහෙසා ධාතු කියායි. ආනන්දය, මේ ධාතුන් යම්තැනක පටන්කොට දනීද, දකීද, ආනන්දය, මෙපමණකිනුදු මහණතෙමේ ධාතුන්හි දක්ෂවූ භික්ෂුවකැයි කීමට සුදුසුවෙයි."

9. "ස්වාමීනි, යම්සේ ධාතුන්හි දක්ෂවූ භික්ෂුවකැයි කීමට සුදුසු අනික් ක්‍රමයකුදු ඇත්තේද?" "ආනන්දය, ඇත්තේය. මේ තුන් වැදෑරුම් ධාතුහු වෙත්. කාම ධාතුය, රූප ධාතුය, අරූප ධාතුය කියායි. ආනන්දය, මේ තුන් වැදෑරුම් ධාතූන් යම්තැනක පටන්කොට දනීද, දකීද, ආනන්දය, මෙපමණකිනුදු මහණතෙමේ ධාතුන්හි දක්ෂවූ භික්ෂුවකැයි කීමට සුදුසුවේය" යනුයි.

10. "ස්වාමීනි, යම්සේ ධාතූන්හි දක්ෂවූ භික්ෂුවකැයි කීමට සුදුසුවූ අනික් ආකාරයකුදු ඇත්තේද?" "ආනන්දය, ඇත්තේය. ආනන්දය, මේ ධාතූහු දෙදෙනෙක් වෙති. සංකත ධාතුය, අසංකත ධාතුය කියායි. ආනන්දය, මේ ධාතූන් දෙදෙන යම්තැනක පටන්කොට දනීද, දකීද, ආනන්දය, මෙපමණ කිනුදු මහණතෙමේ ධාතූන්හි දක්ෂවූ භික්ෂුවකැයි කීමට සුදුසු වෙයි.

11. "ස්වාමීනි, කොපමණකින් ආයතනයන්හි දක්ෂවූ භික්ෂුවකැයි කීමට සුදුසුද?" "ආනන්දය, මේ අධ්‍යාත්මික බාහිර ආයතනයෝ සදෙනෙක් වෙති. ඇසද, රූපයද, කණද, ශබ්දයද, නාසයද, ගන්ධයද, දිවද රසයද, කයද, ස්පර්ශයද, සිතද, ධර්මා රම්මණයෝද කියායි. ආනන්දය, මේ සවැදෑරුම්වූ අධ්‍යාත්මික බාහිර ආයතනයන් යම්තැනක පටන්කොට දනීද, දකීද, ආනන්දය, එපමණකින් ආයතනයන්හි දක්ෂවූ භික්ෂුවකැයි කීමට සුදුසුය.

12. "ස්වාමීනි, කොපමණකින් වනාහි පටිච්ච සමුප්පාදයෙහි දක්ෂවූ භික්ෂුවකැයි කීමට සුදුසුවේද?" "ආනන්දය, මේ ශාසනයෙහි මහණතෙමේ මෙසේ දැනගනීද මෙය ඇතිකල්හි

මෙය වේ. මොහුගේ ඉපදීමෙන් මෙය උපදී. මෙය නැතිකල්හි මෙය නොවේ මොහුගේ නිරුද්ධවීමෙන් මෙය නිරුද්ධ වේ. එනම් අවිද්‍යාවගේ හේතුවෙන් සංස්කාරයෝ වෙති. සංස්කාර හේතුවෙන් විඥ්ඥාණයවේ. විඥ්ඥාණ හේතුවෙන් නාමරූප වේ. නාමරූප හේතුවෙන් ෂඩායතන වේ. ෂඩායතන හේතුවෙන් ස්පර්ශය වේ. ස්පර්ශ හේතුවෙන් වේදනාව වේ. වෙදනා හේතුවෙන් තෘෂ්ණාව වේ. තෘෂ්ණා හේතුවෙන් දැඩිකොට ගැනීම වේ. දැඩිකොට ගැනීම් හේතුවෙන් භවයවේ. භව හේතුවෙන් ජාතියවේ. ජාති හේතුවෙන් ජරා මරණද සොක පරිදෙව දුක් දොම්නස් උපායාසයෝද හටගනිත්. මෙසේ මේ තනි දුක් සමූහයාගේ ඇතිවීමවේ.

"අවිද්‍යාව ඉතිරි නොකොට නිරුද්ධකිරීමෙන්ම සංස්කාර නිරොධයවේ. සංස්කාර නිරොධයෙන් විඥ්ඥාණනිරොධයවේ. විඥ්ඥාණ නිරොධයෙන් නාමරූප නිරොධයවේ. නාමරූප නිරොධයෙන් සළායතන නිරොධයවේ. සළායතන නිරොධයෙන් ඵස්ස නිරොධයවේ. ඵස්සනිරොධයෙන් වේදනා නිරොධයවේ. වේදනා නිරොධයෙන් තණ්හා නිරොධයවේ. තණ්හා නිරොධයෙන් උපාදාන නිරොධයවේ. උපාදාන නිරොධයෙන් භවනිරොධයවේ. භවනිරොධයෙන් ජාතිනිරොධයවේ. ජාති නිරොධයෙන් ජරා මරණ සොක පරිදේව දුක් දොම්නස් උපාදානයෝ නිරුද්ධවෙත්. මෙසේ තනි දුඃඛ සමූහයාගේම නිරොධය වේයයි (දැනගනීද) ආනන්දය, මෙතෙකින් වනාහි පටිච්චසමුප්පාදයෙහිවූ දක්ෂ භික්ෂුවකැයි කීමට සුදුසුවෙයි."

13. "ස්වාමීනි, කොපමණකින් වනාහි මහණ තෙමේ කාරණ අකාරණ දෙක්හි දක්ෂයෙකැයි කීමට සුදුසුවේද?" "ආනන්දය, මෙම ශාසනයෙහි මහණ තෙමේ යම්හෙයකින් මාර්ග දෘෂ්ටියෙන් යුත් පුද්ගලයෙක් වේද, (හෙතෙම) කිසියම් සංස්කාරයක් නිත්‍යවශයෙන් ගන්නේ නම් ඊට කරුණු නැතැයි එසේ කීමට අවකාශයක්ද නැතැයි දන්නේද, යම් හෙයකින් පෘථග්ජනයෙක් තෙම කිසියම් සංස්කාරයක් නිත්‍ය වශයෙන් ගන්නේනම් ඊට කරුණු ඇත, අවකාශ ඇත්තේ යයි දැනගනීද,

14. "යම්හෙයකින් මාර්ග දෘෂ්ටියෙන් යුත් පුද්ගලයෙක් තෙම කිසියම් සංස්කාරයක් සැප වශයෙන් ගන්නේ නම් ඊට කරුණු නැත. අවකාශ නැතැයි දැනගනීද, යම්හෙයකින් පෘථග්ජනතෙමේ කිසියම් සංස්කාරයක් සැප වශයෙන් ගන්නේනම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

15. "යම්හෙයකින් මාර්ග දෘෂ්ටියෙන් යුත් පුද්ගලතෙමේ කිසියම් ධර්මයක් ආත්ම වශයෙන් ගන්නේ නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනීද, යම්හෙයකින් පෘථග්ජන තෙමේ කිසියම් ධර්මයක් ආත්ම වශයෙන් ගන්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

16. "යම්හෙයකින් මාර්ග දෘෂ්ටියෙන් යුක්තවූ පුද්ගල තෙමේ මව ජීවිතයෙන් තොරකරන්නේ නම් ඊට කරුණු නැත අවකාශ නැතැයි දැනගනී, යම්හෙයකින් පෘථග්ජන තෙමේ මව ජීවිතයෙන් තොරකරන්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

"යම්හෙයකින් මාර්ග දෘෂ්ටියෙන් යුක්ත පුද්ගල තෙමේ පියා ජීවිතයෙන් තොරකරන්නේ නම් ඊට කරුණු නැත අවකාශ නැතැයි දැනගනීද, යම්හෙයකින් පෘථග්ජන තෙමේ පියා ජීවිතයෙන් තොරකරන්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

"යම්හෙයකින් මාර්ග දෘෂ්ටියෙන් යුක්ත පුද්ගල තෙමේ රහතුන් වහන්සේ ජීවිතයෙන් තොරකරන්නේ නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි මේ දැනගනීද, යම්හෙයකින් පෘථග්ජන තෙමේ රහතුන් වහන්සේ ජීවිතයෙන් තොර කරන්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

17. "යම්හෙයකින් මාර්ග දෘෂ්ටියෙන් යුත් පුද්ගලයෙක් තෙම (වධක චෙතනාවෙන්) දුෂ්ටවූ සිත් ඇත්තේ තථාගත ශරීරයෙහි ලේ සොලවන්නේනම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනීද, යම්හෙයකින් පෘථග්ජන තෙමේ (වධක චෙතනාවෙන්) දුෂ්ටවූයේ තථාගත ශරීරයෙහි ලේ සොලවන්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇත්තේ යයි දැනගනීද,

18. "යම්හෙයකින් මාර්ග දෘෂ්ටියෙන් යුත් පුද්ගලයෙක් තෙම සංඝයා භේදකරන්නේ නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනීද, යම්හෙයකින් පෘථග්ජන තෙමේ සංඝයා භේදකරන්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

"යම්හෙයකින් මාර්ග දෘෂ්ටියෙන් යුක්ත පුද්ගල තෙමේ (තථාගතයන් හැර) අනිකෙකු (තමාගේ) ශාස්තෘවරයායි කියන්නේ නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනීද, යම් හෙයකින් පෘථග්ජන තෙමේ අනිකෙකු ශාස්තෘවරයායයි කියන්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

19. "යම්හෙයකින් එක් ලෝකධාතුවක අර්හත්වූ සම්‍යක් සම්බුදුවරයන් වහන්සේලා දෙනමක් නොපසු නොපෙරටුව (එකවර) උපදින්නාහු නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි මේ කාරණය දැනගනීද,

"යම්යෙහකින් එක් ලෝකධාතුවක එකම අර්හත්වූ සම්‍යක් සම්බුදුවරයන් වහන්සේ නමක් උපදින්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

20. "යම්හෙයකින් එක ලෝකධාතුවක සක්විති රජවරු දෙදෙනෙක් නොපසු නොපෙරටුව (එකවිට) උපදින්නාහු නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනීද, යම්හෙයකින් එක් ලෝකධාතුවක එක් සක්විති රජකෙනෙක් උපදින්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

21. "යම්හෙයකින් ස්ත්‍රියක් තොමෝ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධ වන්නී නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනීද, යම්හෙයකින් පුරුෂයෙක් තෙම අර්හත්වූ සම්‍යක් සම්බුද්ධ වන්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

"යම්හෙයකින් ස්ත්‍රියක් තොමෝ සක්විති රජවන්නී නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනීද, යම්හෙයකින් පුරුෂයෙක් තෙම සක්විතිරජ වන්නේනම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

"යම්හෙයකින් ස්ත්‍රියක් තොමෝ ශක්‍රබව කරන්නී නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනීද, යම්හෙයකින් පුරුෂයෙක් තෙම ශක්‍රබව කරන්නේ නම් ඊට කරුණු ඇත අවකාශ ඇතැයි දැනගනීද,

"යම්හෙයකින් ස්ත්‍රියක් තොමෝ මාර බව කරන්නී නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනීද, යම්හෙයකින් පුරුෂයෙක්තෙම මාර බව කරන්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

"යම්හෙයකින් ස්ත්‍රියක් තොමෝ බ්‍රහ්මබව කරන්නී නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනීද, යම්හෙයකින් පුරුෂයෙක් තෙම බ්‍රහ්ම බව කරන්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

22. යම්හෙයකින් කාය දුශ්චරිතයාගේ ඉෂ්ටවූ කැමති වන්නාවූ, මනවඩන්නාවූ, විපාකයෙක් උපදින්නේ නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනීද, යම්හෙයකින් කාය දුශ්චරිතයාගේ අනිෂ්ටවූ අකාන්තවූ අමනාපවූ විපාකයෙක් උපදින්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

"යම්හෙයකින් වාග් දුශ්චරිතයාගේ ඉෂ්ටවූ, කැමැති වන්නාවූ, මනවඩන්නාවූ, විපාකයක් උපදින්නේ නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනීද, යම්හෙයකින් වාග් දුශ්චරිතයාගේ අනිෂ්ටවූ නොකැමැත්තාවූ අමනාපවූ විපාකයක් උපදින්නේනම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

"යම්හෙයකින් මනො දුශ්චරිතයාගේ ඉෂ්ටවූ කැමැති වන්නාවූ, මනාපවූ, විපාකයක් උපදින්නේ නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනී. යම්හෙයකින් මනො දුශ්චරිතයාගේ අනිෂ්ටවූ නොකැමැත්තාවූ අමනාපවූ විපාකයක් උපදින්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

23. "යම්හෙයකින් කාය සුචරිතයාගේ අනිෂ්ටවූ නොකැමැත්තාවූ, අමනාපවූ, විපාකයෙක් උපදින්නේ නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනී, යම්හෙයකින් කායසුචරිතයාගේ

ඉෂ්ටවූ කැමැත්තාවූ මනාපවූ විපාකයෙක් උපදින්නේනම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

**24.** යම්හෙයකින් වාග් සුචරිතයාගේ අනිෂ්ටවූ නො කැමැත්තාවූ අමනාපවූ, විපාකයක් උපදින්නේ නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනීද, යම්හෙයකින් වාග් සුචරිතයාගේ ඉෂ්ටවූ, කැමැත්තාවූ මනාපවූ, විපාකයක් උපදින්නේනම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

"යම්හෙයකින් මනො සුචරිතයාගේ අනිෂ්ටවූ නො කැමැත්තාවූ අමනාපවූ විපාකයෙක් උපදින්නේ නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනී. යම් හෙයකින් මනො සුචරිතයාගේ ඉෂ්ටවූ කැමැත්තාවූ මනාපවූ විපාකයෙක් උපදින්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

**25.** "යම්හෙයකින් කාය දුශ්චරිතයෙන් යුත් තැනැත්තේ ඒ හේතුවෙන් ශරීරය බිඳීමෙන් මරණින් මතු සුගතියයි කියනලද ස්වර්ගලොකයෙහි උපදින්නේනම් ඊට කරුණුනැත, අවකාශ නැතැයි දැනගනී. යම් හෙයකින් කාය දුශ්චරිතයෙන් යුත් තැනැත්තේ ඒ හේතුවෙන් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු අපායය, දුගතියය, විනිපාතයයි කියන ලද නිරයෙහි උපදින්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

**26.** යම්හෙයකින් වාග් දුශ්චරිතයෙන් යුක්තවූයේ ඒ හේතුවෙන් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතියයි කියන ලද ස්වර්ගලොකයෙහි උපදින්නේ නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනීද, යම්හෙයකින් වාග් දුශ්චරිතයෙන් යුත් තැනැත්තේ ඒ හේතුවෙන් කය බිඳීමෙන් මරණින් මතු අපාය, දුගතිය, විනිපාතයයි කියන ලද නිරයෙහි උපදින්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

"යම්හෙයකින් මනො දුශ්චරිතයෙන් යුක්තවූයේ ඒ හේතුවෙන් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතියයි කියන ලද ස්වර්ගලොකයෙහි උපදින්නේ නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනීද, යම්හෙයකින් මනො දුශ්චරිතයෙන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යුත් තැනැත්තේ ඒ හේතුවෙන් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු අපායය, දුගතියය, විනිපාතයයි කියන ලද නිරයෙහි උපදින්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද,

27. "යම්හෙයකින් කාය සුචරිතයෙන් යුත් තැනැත්තේ ඒ හේතුවෙන් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු අපායය, දුගතියය, විනිපාතයයි කියන ලද නිරයෙහි උපදින්නේ නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනී, යම් හෙයකින් කාය සුචරිතයෙන් යුත් තැනැත්තේ ඒ හේතුවෙන් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතියයි කියන ලද ස්වර්ගලොකයෙහි උපදින්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනී,

28. "යම්හෙයකින් වාග් සුචරිතයෙන් යුත් තැනැත්තේ ඒ හේතුවෙන් කය බිඳීමෙන් මරණින් මතු අපාය, දුගතිය, විනිපාතයයි කියන ලද නිරයෙහි උපදින්නේ නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනීද, යම්හෙයකින් වාග් සුචරිතයෙන් යුත් තැනැත්තේ ඒ හේතුවෙන් කය බිඳීමෙන් මරණින් මතු සුගතියයි කියන ලද ස්වර්ගලොකයෙහි උපදින්නේ නම් ඊට හේතු ඇත, අවකාශ ඇතැයි දැනගනීද, යම්හෙයකින් මනො සුචරිතයෙන් යුත් තැනැත්තේ ඒ හේතුවෙන් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු අපායය, දුගතියය, විනිපාතයයි කියනලද නිරයෙහි උපදින්නේ නම් ඊට කරුණු නැත, අවකාශ නැතැයි දැනගනීද,

29. "යම්හෙයකින් මනො සුචරිතයෙන් යුත් තැනැත්තේ ඒ හේතුවෙන් ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සුගතියයි කියන ලද ස්වර්ගලොකයෙහි උපදින්නේ නම් ඊට කරුණු ඇත, අවකාශ ඇතැයි දැනගනීද, ආනන්දය, මෙපමණකින් වනාහි මහණතෙමේ කරුණු නොකරුණු දෙක්හි දක්ෂයෙකැයි කීමට සුදුසුවේ."

30. මෙසේ වදාළකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේය. "ස්වාමීනි, ආශ්චර්‍ය්‍යයකි. ස්වාමීනි, අද්භූතයකි. ස්වාමීනි, මේ ධර්මක්‍රමය කුමක්ද?

"ආනන්දය, එසේ නම් ඔබ මේ ධර්මක්‍රමය බහුධාතුක ධර්මක්‍රමයයිද (සිත්හිලා) දරාගනුව. 'චතුපරිවට්ට' ධර්මක්‍රමයයිද, දරව. ධම්මාදාස ධර්මක්‍රමයයිද (ධර්මය නමැති කණ්ණාඩිය) දරව. 'අමතදුන්දුභි ධර්මක්‍රමය (අමෘතය නමැති බෙරය) යයිද දරව. 'අනුත්තර සංග්‍රාම විජය ධර්මක්‍රමය (උසස්ම යුද්ධයෙන් ජය ගැනීම) යයි' ද දරව." භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටුවිය.

**පස්වෙනි බහුධාතුක සූත්‍රය නිමි. (2-5)**

## 16. ඉසිගිලි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ඉසිගිලි පර්වතයෙහි වැඩ වසනසේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි භික්ෂූන්ට කථාකළසේක. "ස්වාමීනි"යී ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

2. "මහණෙනි, තෙපි මේ වේභාර පර්වතය දකිව්ද?" "එසේය ස්වාමීනි,"

මහණෙනි, මේ වේභාර පර්වතයටද (එම නාම ව්‍යවහාරයට පෙර) අනික් නමක්ම විය. අනික් ව්‍යවහාරයක්ම විය.

"මහණෙනි, තෙපි මේ පාණ්ඩව පර්වතය දකිව්ද?" "එසේය ස්වාමීනි,"

"මහණෙනි, මේ පාණ්ඩව පර්වතයටද පෙර අනික් නමක් විය. අනික් ව්‍යවහාරයක්ම විය.

"මහණෙනි, තෙපි මේ වෙපුල්ල පර්වතය දකිව්ද?" "එසේය ස්වාමීනි,"

"මහණෙනි, මේ වෙපුල්ල පර්වතයටද පෙර අනික් නමක් විය. අනික් ව්‍යවහාරයක්ම විය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මහණෙනි, තෙපි මේ ගිජ්ඣකූට පර්වතය දකිව්ද?" "එසේය ස්වාමීනි,"

"මහණෙනි, මේ ගිජ්ඣකූට පර්වතයටද පෙර අනික් නමක්ම විය. අනික් ව්‍යවහාරයක්ම විය.

3. "මහණෙනි, තෙපි මේ ඉසිගිලි පර්වතය දකිව්ද?" "එසේය ස්වාමීනි,"

"මහණෙනි, මේ ඉසිගිලි පර්වතයට වනාහි (මීට පෙරද) මෙම නමම විය. මේ ව්‍යවහාරයම විය.

3. "මහණෙනි, පෙරවූ දෙයක් කියමි. පන්සියයක් පසේ බුදු වරයෝ මේ ඉසිගිලි පර්වතයෙහි බොහෝ කාලයක් වැඩ විසූහ. මෙම පර්වතයට පැමිණෙන්නාවූ උන්වහන්සේලා දක්නා ලැබෙත්. පැමිණියාවූ උන්වහන්සේලා දක්නා නොලැබෙත්.

"මනුෂ්‍යයෝ ඒ කාරණය දැක 'මේ පර්වතය තෙම මේ ඍෂීන් ගිල ගන්නේයයි' කීහ. ඒ කාරණයෙන් 'ඉසිගිලි' ඉසිගිලි' යන නම පහළ විය.

4. "මහණෙනි, (ඒ) පසේ බුදුවරයන්ගේ නම් කියන්නෙමි. මහණෙනි, පසේ බුදුවරයන්ගේ නම් ප්‍රකාශ කරන්නෙමි. මහණෙනි, පසේ බුදුවරයන්ගේ නම් දෙශනා කරන්නෙමි. එය අසව්, මැනවින් මෙනෙහි කරව්. කියන්නෙමියි" වදාළසේක.

"එසේය ස්වාමීනි"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ.

5. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක.

"මහණෙනි, 'අරිට්ඨ' නම් පසේ බුදු තෙමේ මේ ඉසිගිලි පර්වතයෙහි බොහෝ කලක් විසූයේය. මහණෙනි, 'උපරිට්ඨ' නම් පසේ බුදු තෙමේ මේ ඉසිගිලි පර්වතයෙහි බොහෝ කලක් විසූයේය. මහණෙනි, 'තගරසිඛී' නම් පසේ බුදු තෙමේ මෙම ඉසිගිලි පර්වතයෙහි බොහෝ කලක් විසූයේය. මහණෙනි, 'යසස්සී' නම් පසේබුදුතෙමේ මෙම ඉසිගිලි පර්වතයෙහි

බොහෝ කලක් විසුයේය. මහණෙනි, ‘සුදස්සන’ නම් පසේ බුදුතෙමේ මෙම ඉසිගිලි පර්වතයෙහි බොහෝ කලක් විසුයේය.

6. “මහණෙනි, ‘පියදස්සී’ නම් පසේබුදුතෙමේ මෙම ඉසිගිලි පර්වතයෙහි බොහෝ කලක් විසුයේය. මහණෙනි, ‘ගන්ධාර’ නම් පසේබුදුතෙමේ මෙම ඉසිගිලි පර්වතයෙහි බොහෝ කලක් විසුයේය. මහණෙනි, ‘පිණ්ඩොල’ නම් පසේ බුදුතෙමේ මෙම ඉසිගිලි පර්වතයෙහි බොහෝ කලක් විසුයේය. මහණෙනි, ‘උපාසභ’ නම් පසේබුදුතෙමේ මෙම ඉසිගිලි පර්වතයෙහි බොහෝ කලක් විසුයේය. මහණෙනි, ‘නීත’ නම් පසේ බුදුතෙමේ මෙම ඉසිගිලි පර්වතයෙහි බොහෝ කලක් විසුයේය. මහණෙනි, ‘තථ’ නම් පසේබුදුතෙමේ මෙම ඉසිගිලි පර්වතයෙහි බොහෝ කලක් විසුයේය. මහණෙනි, ‘සුතවා’ නම් පසේබුදු තෙමේ මෙම ඉසිගිලි පර්වතයෙහි බොහෝ කලක් විසුයේය. මහණෙනි, ‘භාවිතත්ත’ නම් පසේබුදුතෙමේ මෙම ඉසිගිලි පර්වතයෙහි බොහෝ කලක් විසුයේය, යනුයි.

7. “සත්වයන් අතුරෙන් සාරවූ දුක් නැති කළාවූ තෘෂ්ණාව ක්ෂය කළාවූ යහපත් ප්‍රත්‍යෙකබොධියට පැමිණියාවූ ඒ කෙලෙස් හුල් උදුරා දැමූ මිනිසුන්ට උත්තමවූ පසේබුදුවරයන් වහන්සේලාගේ නම් මා විසින් කියනු ලැබේ. එය අසව්.

අරිට්ඨ නම් පසේබුදුය, උපරිට්ඨ නම් පසේබුදුය, තගරසිඛී නම්පසේබුදුය, යසස්සී නම් පසේබුදුය, සුදස්සන නම් පසේබුදුය, පියදස්සී නම් පසේබුදුය, ගන්ධාර නම් පසේබුදුය, පිණ්ඩොල නම් පසේබුදුය, උපාසභය නම් පසේබුදුය, නීත නම් පසේබුදුය, තථ නම් පසේබුදුය, සුතවා නම් පසේබුදුය, භාවිතත්ත නම් පසේබුදුය, සුම්භ නම් පසේබුදුය, සුභ නම් පසේබුදුය, වෙථුල නම් පසේබුදුය, අට්ඨම නම් පසේබුදුය, මෙඝ නම් පසේබුදුය, අනීඝ නම් පසේබුදුය, සුදාඨ නම් පසේබුදුය, හිංගුල නම් *පසේබුදුය, හිංගය නම් පසේබුදුය, යන මොවුහු මනානුභාව ඇති භව ගමන වැළකු පසේබුදුවරයෝ වෙති.

8. “චුල්ලජාලී මහාජාලී නම් පසේබුදුවරු දෙනමය, අට්ඨක නම් පසේබුදුය, කොසල නම් පසේබුදුය, සුබාහු නම් පසේබුදුය,

උපනෙමිස නම් පසේබුදුය, නෙමිස නම් පසේබුදුය, සන්තචිත්ත නම් පසේබුදුය, සච්ච නම් පසේබුදුය, තථ නම් පසේබුදුය, විරජ නම් පසේබුදුය, පණ්ඩිත නම් පසේබුදුය, කාල නම් පසේබුදුය, උපකාල නම් පසේබුදුය, විජිත නම් පසේබුදුය, ජිත නම් පසේබුදුය, අංග නම් පසේබුදුය, පංග නම් පසේබුදුය, ගුතිජ්ජිත නම් පසේබුදුය.

**9.** දුකට මුල්වූ ක්ලෙශ නැතිකළාවූ විපස්සී නම් පසේ බුදුය, මාරබල ජය ගත් අපරාජිත නම් පසේබුදුය, යන මුන් වහන්සේද, සත්ථා නම් පසේබුදුය, පවත්තා නම් පසේබුදුය, සරභංග නම් පසේබුදුය, ලොමහංස නම් පසේබුදුය, උච්චංගමාය නම් පසේබුදුය. අසිත නම් පසේබුදුය, අනාසව නම් පසේබුදුය, මනොමය නම් පසේබුදුය. මානච්ඡිද නම් පසේබුදුය, බන්ධුමා නම් පසේබුදුය, තදධිමුත්ත නම් පසේබුදුය, විමලනම් පසේබුදුය, කෙතුමා නම් පසේබුදුය, කෙතුම්බ රාග නම් පසේබුදුය, මාතංග නම් පසේබුදුය, අරිය නම් පසේබුදුය, අච්චුත නම් පසේබුදුය, අච්චුතගාම නම් පසේබුදුය, බ්‍යාමක නම් පසේබුදුය, සුමංගල නම් පසේබුදුය, දබ්බිල නම් පසේබුදුය, සුප්පතිඨිතනම් පසේබුදුය, අසය්හනම් පසේබුදුය, ඛෙමාභිරත නම් පසේබුදුය, සොරතනම් පසේබුදුය, දුරන්නය නම් පසේබුදුය, සංඝ නම් පසේබුදුය උච්චය නම් පසේබුදුය, සය්හ නම් පසේබුදුය, අනොමනික්කම නම් පසේබුදුය, යන මොවුහුද, ආනන්ද නම් පසේබුදුය, නන්ද නම් පසේබුදුය උපනන්ද නම් පසේ බුදුය, යන මේ එක නමින් සතර දෙන බැගින් දොළොස් නමක්ද, භාරද්වාජ නම් බුද්ධතෙමේද, බොධි නම් පසේබුදුය, මහානාම නම් පසේබුදුය, උත්තර නම් පසේබුදුය, කෙසි නම් පසේබුදුය, සිඛි නම් පසේබුදුය, සුන්දර නම් පසේබුදුය, භාරද්වාජ නම් පසේබුදුය, තිස්ස නම් පසේබුදුය, උපතිස්ස නම් පසේබුදුය, යන භව බැඳුම් සුන් කළ පසේබුදුවරයෝද, තෘෂ්ණාව ක්ෂය කළ උපසීදරී නම් පසේබුදුතෙමේද, සීදරී නම් පසේබුදුතෙමේද, වීතරාගීවූ මංගල නම් පසේබුදුරජතෙමේද, විය.

**10.** "දුකට මුල්වූ තෘෂ්ණාව සිඳි උසභ නම් පසේබුදු තෙමේද, ශාන්ත පදයට පැමිණි උපනීත නම් පසේබුදු තෙමේද, උපොසථ

නම් පසේබුදුය, සුන්දර නම් පසේ බුදුය, සච්චනාම නම් පසේබුදුය, ජෙත නම් පසේබුදුය, ජයන්ත නම් පසේබුදුය, පදුම නම් පසේබුදුය, උප්පල නම් පසේබුදුය, පදුමුත්තර නම් පසේබුදුය, රක්ඛිත නම් පසේබුදුය, පබ්බත නම් පසේබුදුය, මානත්ථද්ධ නම් පසේබුදුය, වීතරාග නම් පසේබුදුය, යන මොහුද, මැනවින් මිදුනු සිත් ඇති කණ්හ නම් පසේබුදු තෙමේද, යන භව ගමන වැළැක්වූ මහත් ආනුභාව ඇති සියළු කෙලෙස් බැඳුම් සිඳදැමූ මහර්ෂිවූ පිරිනිවණට පැමිණි මේ පසේබුදුවරයන් වහන්සේලාද, අන්‍යවූ අප්‍රමාණ පසේබුදුවරයන් වහන්සේලාද වඳිව්.”

**සයවැනි ඉසිගිලි සූත්‍රය නිමි. (2-6)**

---

## 17. මහා චත්තාරීසක සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩ වසනසේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි භික්ෂූන්ට කථාකළ සේක. ඒ භික්ෂූහු ‘ස්වාමීනි’යි භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. “මහණෙනි, තොපට නිදොස්වූ ප්‍රත්‍යය සහිතවූ පිරිවර සහිතවූ සම්මාසමාධිය (මාර්ගසමාධිය) දේශනා කරන්නෙමි. එය අසව්, මැනවින් මෙනෙහි කරව්, දෙශනා කරන්නෙමි”යි වදාළසේක. “එසේය ස්වාමීනි”යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

3. “මහණෙනි, නිදොස්වූ ප්‍රත්‍යය සහිතවූ පිරිවර සහිතවූ සම්මාසමාධිය කුමක්ද? එනම්, සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාය, සම්‍යක් වචනය, සම්‍යක් කර්මාන්තය, සම්‍යක් ආජීවය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් ස්මෘතිය යන මොහු වෙති.

"මහණෙනි, මේ අංග සතෙන් පිරිවරනලද චිත්තයාගේ යම් එකග්‍ග බවක් වේද, මහණෙනි, මෙය ප්‍රත්‍යය සහිතවූ පිරිවර සහිතවූ සම්මාසමාධියයි කියනු ලැබේ.

4. "මහණෙනි, ඒ අංග සත අතරෙන් සම්‍යක්දෘෂ්ටිය පෙරටුව යන්නේ වෙයි. මහණෙනි, සම්‍යක්දෘෂ්ටිය පෙරටුව යන්නේ කෙසේද? 'මිථ්‍යාදෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටිය යයි දැනගනීද, සම්‍යක්දෘෂ්ටිය සම්‍යක්දෘෂ්ටියයයි දැනගනීද, ඒ ඔහුගේ සම්‍යක් දෘෂ්ටිය වෙයි. මහණෙනි, මිථ්‍යාදෘෂ්ටිය නම් කවරීද? 'දුන් දැයෙහි විපාක නැත මහාදානයෙහි විපාක නැත. පූජා පැවැත්වීමෙහි විපාක නැත. කුශලා කුශලයන්ගේ විපාක නැත. මෙලෝ නැත. පරලෝ නැත. මවුට කරන යහපත්වූ හෝ අයහපත්වූ හෝ කටයුතුවල විපාක නැත. පියාට කරන යහපත්වූ හෝ අයහපත්වූ හෝ කටයුතුවල විපාක නැත. චුතව උපදින සත්වයෝ නැත. මෙලොවද පරලොවද තෙමේම විශෙෂ ඥානයෙන් දැන ප්‍රකාශ කරත්ද, මනාව පිළිපන් යහපත් තැනට පැමිණියාවූ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ (සර්වඥ බුදුවරු) නැත.' මහණෙනි, මේ වනාහි මිථ්‍යාදෘෂ්ටියයි.

5. "මහණෙනි, සම්‍යක්දෘෂ්ටිය කුමක්ද? මහණෙනි, මම සම්‍යක්දෘෂ්ටියද දෙපරිදිකොට කියමි. මහණෙනි, ආශ්‍රව සහිතවූ කුසලයන්ට අයත්වූ විපාකදෙන ස්වභාවය ඇත්තාවූ සම්‍යක්දෘෂ්ටියක් ඇත. මහණෙනි, නිදොස්වූ ආශ්‍රව රහිතවූ, ලොකෝත්තර මාර්ගාංගයක්වූ සම්‍යක් දෘෂ්ටියක් ඇත. මහණෙනි, ආශ්‍රව සහිතවූ කුශලයන්ට අයත්වූ විපාක දෙන ස්වභාවය ඇති සම්‍යක් දෘෂ්ටිතොමෝ කවරීද? 'දුන් දැයෙහි විපාක ඇත. මහාදානයෙහි විපාක ඇත. පුදපඬුරු යැවීමෙහි විපාක ඇත. කුශලා කුශලයන්ගේ විපාක ඇත. මෙලෝ ඇත. පරලෝ ඇත. මවුට කරන යහපත්වූ හෝ අයහපත්වූ කටයුතුවල විපාක ඇත. පියාට කරන යහපත්වූ හෝ අයහපත්වූ ක්‍රියාවල විපාක ඇත. චුතව උපදින සත්වයෝ ඇත. යම් කෙනෙක් මෙලොවද පරලොවද තෙමේම විශෙෂ ඥානයෙන් දැන ප්‍රකාශ කරද්ද, එබඳු මනාව පිළිපන් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ (සර්වඥ

බුදුවරු) ඇත.' මහණෙනි, මේ ආශ්‍රව සහිතවූ කුසලයන්ට අයත්වූ විපාක දෙන ස්වභාවය ඇත්තාවූ සම්‍යක් දෘෂ්ටියයි.

6. "මහණෙනි, නිදොස්වූ ආශ්‍රව රහිතවූ ලෝකොත්තර මාර්ගාංගයක්වූ සම්‍යක් දෘෂ්ටිය කවරීද? මහණෙනි, ආර්‍ය්‍යවූ චිත්තයෙන් ආශ්‍රවරහිත චිත්තයෙන් ආර්‍ය්‍යමාර්ගයෙන් යුක්තවූවහුගේ ආර්‍ය්‍ය මාර්ගය වඩන්නහුගේ යම් ප්‍රඥාවක් වන්නීද, ප්‍රඥෙන්ද්‍රියයක් වේද, ප්‍රඥාබලයක් වේද, ධම්මවිචය සම්බොජ්ඣංගයක් වේද, සම්‍යක් දෘෂ්ටියක් වේද, මාර්ගාංගයක් වේද, මහණෙනි, මේ නිදොස්වූ ආශ්‍රව රහිතවූ ලෝකොත්තරවූ මාර්ගාංගයක්වූ සම්‍යක් දෘෂ්ටියයි.

7. "යමෙක් මිථ්‍යාදෘෂ්ටිය පහකිරීමටත් සම්‍යක්දෘෂ්ටිය වැඩීමටත් වෑයම් කෙරේද, එය ඔහුගේ සම්‍යක් ව්‍යායාමයවේ. හෙතෙම සිහියෙන් යුක්තවූයේ මිථ්‍යාදෘෂ්ටිය දුරුකරයි. සිහියෙන් යුක්තවූයේ සම්‍යක් දෘෂ්ටියට පැමිණ වාසය කෙරෙයිද, එය ඔහුගේ සම්‍යක් ස්මෘතිය (යහපත් සිහිය) වේ. මෙසේ මේ ධර්මයෝ තිදෙන සම්‍යක්දෘෂ්ටිය අනුව ගමන්කරත්, අනුව පවතිත්.

"එනම්:- සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් ව්‍යායාමය, හා සම්‍යක් ස්මෘතියයි. මහණෙනි, එහි සම්‍යක් දෘෂ්ටිය පෙරටුව යන්නේ වේ. කවර සම්‍යක් දෘෂ්ටියක් පෙරටුව යන්නේවේද? මිථ්‍යා සංකල්පනය මිථ්‍යාසංකල්පනයයි දැනගනීද, සම්‍යක් සංකල්පනය සම්‍යක් සංකල්පනයයි දැනගනීද, එය ඔහුගේ සම්‍යක් දෘෂ්ටියවේ.

8. "මහණෙනි, මිථ්‍යා සංකල්පනය කුමක්ද? කාම සංකල්පය, ව්‍යාපාද සංකල්පය, විහිංසා සංකල්පය යන මෙය මහණෙනි, මිථ්‍යා සංකල්පය නම් වේ.

"මහණෙනි, සම්‍යක් සංකල්පය නම් කුමක්ද? මහණෙනි, මම සම්‍යක් සංකල්පයද දෙපරිදිකොට කියමි. මහණෙනි, ආශ්‍රව සහිතවූ කුසලයන්ට අයත්වූ විපාක දෙන්නාවූ සම්‍යක් සංකල්පයක් ඇත. මහණෙනි, නිදොස්වූ ආශ්‍රව රහිතවූ, ලෝකොත්තර මාර්ගාංගයක්වූ සම්‍යක් සංකල්පයක් ඇත.

"මහණෙනි, ආශ්‍රව සහිතවූ කුසලයන්ට අයත්වූ විපාක දෙන ස්වභාවය ඇත්තාවූ සම්‍යක් සංකල්පය කුමක්ද? නෛෂ්ක්‍රම්‍ය සංකල්පය, අව්‍යාපාද සංකල්පය, අවිහිංසා සංකල්පය යන මෙය මහණෙනි, ආශ්‍රව සහිතවූ කුසලයන්ට අයත්වූ විපාක දෙන ස්වභාවය ඇත්තාවූ සම්‍යක් සංකල්පයයි.

**9.** "මහණෙනි, නිදොස්වූ ආශ්‍රව රහිතවූ ලෝකෝත්තර මාර්ගාංගයක්වූ සම්‍යක් සංකල්පය කවරේද? මහණෙනි, නිදොස් සිත් ඇත්තහුගේ, ආශ්‍රව රහිත සිත් ඇත්තහුගේ, ආර්‍ය්‍ය මාර්ගයෙන් යුක්තවූවහුගේ, ආර්‍ය්‍ය මාර්ගය වඩන්නහුගේ යම් කල්පනාවක් වේද, විතර්කයක් වේද, සංකල්පයක් වේද, (එකඟව අරමුණට නැගීම) අර්පනාවක් වේද, (විශෙෂයෙන් අරමුණට නැගීම) ව්‍යර්පණාවක් වේද, චිත්තයාගේ අරමුණට නැංවීමක් වේද, වාක් සංස්කාරයක් වේද මහණෙනි, මෙය නිදොස්වූ ආශ්‍රව රහිතවූ ලෝකෝත්තර මාර්ගාංගයක්වූ සම්‍යක් සංකල්පයයි.

**10.** "හෙතෙම මිථ්‍යා සංකල්පය පහකිරීමටද, සම්‍යක් සංකල්පයට පැමිණීමටද වෑයම් කෙරේද, ඔහුගේ මේ සම්‍යක් ව්‍යායාමයවේ. හෙතෙම සිහියෙන් යුක්තවූයේ මිථ්‍යා සංකල්පය දුරුකෙරෙයි. සිහියෙන් යුක්තවූයේ සම්‍යක් සංකල්පයට පැමිණ වෙසෙයි. ඔහුගේ මේ සම්‍යක් සතිය වන්නීය. මෙසේ ඔහුගේ මේ ත්‍රිවිධ ධර්මයෝ (ලොකොත්තර) සම්‍යක් සංකල්පයට පිරිවර වෙත්. අනුව පවතිත්. එනම්, සම්මාදිට්ඨිය, සම්මාවායාමය, සම්මාසතිය යන තුනයි.

"මහණෙනි, ඔවුන් අතුරෙන් සම්‍යක් දෘෂ්ටිය පෙරටුව යන්නේ වේ. මහණෙනි, සම්‍යක් දෘෂ්ටිය කෙසේ පෙරටුව යන්නේවේද? මිථ්‍යාවචනය මිථ්‍යාවචනයයි දැනගනීද, සම්‍යක් වචනය සම්‍යක් වචනයයි දැනගනීද, ඔහුගේ ඕතොමෝ සම්‍යක් දෘෂ්ටිය වන්නීය.

**11.** "මහණෙනි, මිථ්‍යා වචනය නම් කවරේද? මුසාවාදය (බොරු කීම) පිසුණු වචනයය (කේලාම් කීම) පරුෂ වචනයය (රළුවචන කීම) සම්ඵප්‍රලාපයය (හිස්වචන කීම) යන මේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මහණෙනි, මිථ්‍යාවචනයයි. මහණෙනි, සම්‍යක් වචනය කවරේද? මහණෙනි, මම සම්‍යක් වචනයද දෙපරිදිකොට කියමි.

"මහණෙනි, ආශ්‍රව සහිතවූ කුශලපක්ෂයට අයත්වූ විපාක දෙන ස්වභාවය ඇත්තාවූ සම්‍යක් වචනයක්ද ඇත. මහණෙනි, නිදොස්වූ ආශ්‍රව රහිතවූ ලෝකෝත්තර මාර්ගාංගයක්වූ සම්‍යක් වචනයක්ද ඇත. මහණෙනි, ආශ්‍රව සහිතවූ කුශල පක්ෂයට ඇතුළත්වූ විපාක දෙන ස්වභාවය ඇත්තාවූ සම්‍යක් වචනය කුමක්ද? මුසාවාදයෙන් (බොරු කීමෙන්) වෙන්වීමය, පිසුණු (කේලාම්) වචනයෙන් වෙන්වීමය, පරුෂවචනයෙන් වෙන් වීමය, සම්පප්‍රලාප (හිස්වචන) යෙන් වෙන්වීම යන මෙය මහණෙනි, ආශ්‍රව සහිතවූ කුශල පක්ෂයෙහි ඇතුළත්වූ විපාක දෙන ස්වභාවය ඇත්තාවූ සම්‍යක් වචනයයි.

12. "මහණෙනි, නිදොස්වූ ආශ්‍රව රහිතවූ ලොකොත්තර මාර්ගාංගයක්වූ සම්‍යක් වචනය කුමක්ද? මහණෙනි, නිදොස්වූ සිත් ඇත්තහුගේ, ආශ්‍රව රහිත සිත් ඇත්තහුගේ, ආය්‍ය්‍යී මාර්ගයෙන් යුක්තවූවහුගේ ආය්‍ය්‍යීමාර්ගය වඩන්නහුගේ චතුර්විධ වාග් දුශ්චරිතයන්ගෙන් වෙන්වීමක් වේද, වැඩියක් වෙන්වීමක් වේද, ප්‍රතිපක්ෂලෙසම වෙන්වීමක් වේද, සම්පූර්ණයෙන් ඇත්වීමක් වේද, මහණෙනි, මෙය නිදොස්වූ ආශ්‍රව රහිතවූ ලොකොත්තර මාර්ගාංගයක්වූ සම්‍යක් වචනයයි. හෙතෙම මිථ්‍යාවචනය ප්‍රහාණය කිරීමට හා සම්‍යක් වචනය ඇතිකර ගැනීමට වෑයම් කෙරේ. එය ඔහුගේ සම්‍යක් ව්‍යායාමය වේ. හෙතෙම සිහියෙන් යුක්තව මිථ්‍යාවචනය දුරුකෙරේ. සිහියෙන් යුක්තව සම්‍යක් වචනයට පැමිණ වාසය කෙරේ. එය ඔහුගේ සම්‍යක් සිහියවෙයි. මෙසේ මොහුගේ මේ ධර්මයෝ තිදෙන සම්‍යක් වචනයට පිරිවර වෙත්. අනුව පවතිත්. එනම්ඃ සම්‍යක්දෘෂ්ටිය, සම්‍යක් සංකල්පනාව, සම්‍යක් ස්මෘතියද යන තුණයි.

"මහණෙනි, ඔවුන් අතුරෙන් සම්‍යක් දෘෂ්ටිය පෙරටු කොට යන්නේ වේ. මහණෙනි, සම්‍යක් දෘෂ්ටිය කෙසේ පෙරටු කොට යන්නේ වේද? මිථ්‍යා කර්මාන්තය මිථ්‍යාකර්මාන්තයයි

දැනගනීද, සම්‍යක් කර්මාන්තය සම්‍යක් කර්මාන්තයයි දැනගනීද, එය ඔහුගේ සම්‍යක් දෘෂ්ටියවේ.

13. "මහණෙනි, මිථ්‍යා කර්මාන්තය නම් කුමක්ද? ප්‍රාණඝාතය (සතුන් මැරීම) අදත්තාදානය (නොදුන් දෙය සොර සිතින් ගැනීම) කාම මිථ්‍යාචාරය (කාමයෙහි වරදවා හැසිරීම) යන මෙය මහණෙනි, මිථ්‍යා කර්මාන්තයයි.

"මහණෙනි, සම්‍යක් කර්මාන්තය කවරේද? මහණෙනි, මම සම්‍යක් කර්මාන්තයද දෙපරිදිකොට කියමි මහණෙනි, ආශ්‍රව සහිතවූ කුශල පක්ෂයට ඇතුළත්වූ විපාක දෙන ස්වභාවය ඇත්තාවූ සම්‍යක් කර්මාන්තයක්ද ඇත. නිදොස්වූ ආශ්‍රව රහිතවූ ලොකොත්තර මාර්ගාංගයක්වූ සම්‍යක් කර්මාන්තයක්ද ඇත.

"මහණෙනි, ආශ්‍රව සහිතවූ කුශලපක්ෂයට අයත්වූ විපාක දෙන ස්වභාවය ඇත්තාවූ සම්‍යක් කර්මාන්තය කුමක්ද? මහණෙනි, ප්‍රාණඝාතයෙන් වෙන්වීමක් ඇද්ද, අදත්තාදානයෙන් වෙන්වීමක් ඇද්ද, කාම මිථ්‍යාචාරයෙන් වෙන්වීමක් ඇද්ද, මහණෙනි, මෙය ආශ්‍රව සහිතවූ කුශල පක්ෂයට ඇතුළත්වූ විපාක දෙන ස්වභාවය ඇත්තාවූ සම්‍යක් කර්මාන්තයයි.

"මහණෙනි, නිදොස්වූ ආශ්‍රව රහිතවූ ලොකොත්තර මාර්ගාංගයක්වූ සම්‍යක් කර්මාන්තය කුමක්ද? මහණෙනි, නිදොස් සිත් ඇත්තහුගේ, ආශ්‍රව රහිත සිත් ඇත්තහුගේ, ආර්‍ය්‍ය මාර්ගයෙන් යුක්තවූවහුගේ, ආර්‍ය්‍යමාර්ගය වඩන්නහුගේ, ත්‍රිවිධ කාය දුශ්චරිතයන්ගෙන් වෙන්වීමක් වේද, වැඩියක් වෙන් වීමක් වේද, ප්‍රතිපක්ෂලෙසම වෙන්වීමක් වේද, සම්පූර්ණයෙන් ඇත්වේද, මහණෙනි, මෙය නිදොස්වූ ආශ්‍රව රහිතවූ ලොකොත්තර මාර්ගාංගයක්වූ සම්‍යක් කර්මාන්තයයි. හෙතෙම මිථ්‍යා කර්මාන්තයාගේ ප්‍රහාණය පිණිසද, සම්‍යක් කර්මාන්තයට පැමිණීමටද උත්සාහ කෙරේ. එය ඔහුගේ සම්‍යක් ව්‍යායාමය වේ. හෙතෙම සිහියෙන් යුක්තවූයේ මිථ්‍යා කර්මාන්තය දුරු කෙරෙයි. සිහියෙන් යුක්තවූයේ සම්‍යක් කර්මාන්තයට පැමිණ වාසය කෙරෙයි. එය ඔහුගේ සම්‍යක් සතියවේ. මෙසේ මොහුගේ

මේ ධර්මයෝ තිදෙන සම්‍යක් කර්මාන්තයට පිරිවර වෙත්. අනුව පවතිත්. එනම්ඃ සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය යන තුනයි.

"මහණෙනි, ඔවුන් අතුරෙන් සම්‍යක් දෘෂ්ටිය පෙරටු කොට යන්නේවේ. මහණෙනි, සම්‍යක් දෘෂ්ටිය කෙසේ පෙරටු කොට යන්නේ වේද? මිථ්‍යා ආජීවය, මිථ්‍යා ආජීවයයි දැන ගනීද, සම්‍යක් ආජීවය සම්‍යක් ආජීවයයි දැනගනීද, එය ඔහුගේ සම්‍යක් දෘෂ්ටියවේ. මහණෙනි, මිථ්‍යා ආජීවය කුමක්ද? ලාභ සත්කාරාදිය සඳහා ලෝකයා මවිත කරවීම (ලාභාදිය කැමැත්තෙන්) ගරු නම්බු දී කථා කිරීමට (ලාභ සත්කාර කැමැත්තෙන්) ඒවා දෙන ලෙස ඍජුව නොකියා අඟවා කීමය. (ලාභාදිය කැමැත්තෙන්) අනුන් ගුණ මැකීමය. (වඩා ලාභ ලබනු රිසියෙන් මෙතැනින් ලද දෙය එතනටද එතනින්ලද දෙය මෙතැනටද දීම් වශයෙන්) ලාභයෙන් ලාභය හැරගැනීමය යන මෙය මහණෙනි, මිථ්‍යා ආජීවයයි.

14. "මහණෙනි සම්‍යක් ආජීවය කුමක්ද? මහණෙනි, මම සම්‍යක් ආජීවයද දෙපරිදි කොට කියමි. මහණෙනි, ආශ්‍රව සහිතවූ කුශල පක්ෂයෙහි ඇතුළත්වූ විපාක දෙන ස්වභාවය ඇත්තාවූ සම්‍යක් ආජීවයක්ද ඇත. මහණෙනි, නිදොස්වූ ආශ්‍රව රහිතවූ ලොකොත්තර මාර්ගාංගයක්වූ සම්‍යක් ආජීවයක්ද ඇත. මහණෙනි, ආශ්‍රව සහිතවූ කුශල පක්ෂයෙහි ඇතුළත්වූ විපාක දෙන ස්වභාවය ඇත්තාවූ සම්‍යක් ආජීවය කවරේද? මහණෙනි, මේ ශාසනයෙහි ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ මිථ්‍යා ආජීවය (ජීවත්වීම සඳහා කරණ අධාර්මික කටයුතු) හැර සම්‍යක් ආජීවයෙන් දිවිපවත්වාද, මහණෙනි, මෙය ආශ්‍රව සහිතවූ කුශල පක්ෂයෙහි ඇතුළත්වූ විපාක දෙන ස්වභාවය ඇත්තාවූ සම්‍යක් ආජීවයයි.

"මහණෙනි, නිදොස්වූ ආශ්‍රව රහිතවූ ලොකොත්තර මාර්ගාංගයක්වූ සම්‍යක් ආජීවය කවරේද?

"මහණෙනි, නිදොස් සිත් ඇත්තහුගේ, ආශ්‍රව රහිත සිත් ඇත්තහුගේ, ආර්‍ය්‍ය මාර්ගයෙන් යුක්තවූවහුගේ, ආර්‍ය්‍ය මාර්ගය වඩන්නහුගේ මිථ්‍යා ආජීවයෙන් වෙන්වීමක් වේද, වැඩියක්ම

වෙන්වීමක් වේද, ප්‍රතිපක්ෂලෙස වෙන්වීමක් වේද, සම්පූර්ණයෙන් ඈත්වේද, මහණෙනි, මෙය නිදොස්වූ ආශ්‍රව රහිතවූ ලොකොත්තර මාර්ගාංගයක්වූ සම්‍යක් ආජීවයයි.

"හෙතෙම මිථ්‍යා ආජීවය පහකිරීමටද සම්‍යක් ආජීවයට පැමිණ විසීමටද, උත්සාහ කෙරෙයි. එය ඔහුගේ සම්‍යක් ව්‍යායාමය වේ. හෙතෙම සිහියෙන් යුක්තවූයේ මිථ්‍යා ආජීවය දුරුකරයි. සිහියෙන් යුක්තවූයේ සම්‍යක් ආජීවයට පැමිණ වෙසේ. එය ඔහුගේ සම්‍යක් සතිය වෙයි. මෙසේ ඔහුගේ මේ ධර්මයෝ තිදෙන සම්‍යක් ආජීවය පිරිවරා ගනිත්. අනුව පවතිත්. එනම්ඃ සම්‍යක් දෘෂ්ටිය, සම්‍යක් ව්‍යායාමය, සම්‍යක් සතිය යන තුණයි.

"මහණෙනි, ඔවුන් අතුරෙන් සම්‍යක් දෘෂ්ටිය පෙරටු කොට යන්නේ වේ. මහණෙනි, සම්‍යක් දෘෂ්ටිය කෙසේ පෙරටුකොට යන්නේද?

"මහණෙනි, සම්‍යක්දෘෂ්ටිය ඇත්තහුට සම්‍යක්සංකල්පය ඇත්තේ වෙයි. සම්‍යක් සංකල්පය ඇත්තහුට සම්‍යක් වචනය ඇත්තේ වෙයි. සම්‍යක් වචනය ඇත්තහුට සම්‍යක් කර්මාන්තය ඇත්තේ වෙයි. සම්‍යක් කර්මාන්තය ඇත්තහුට සම්‍යක් ආජීවය ඇත්තේ වෙයි. සම්‍යක් ආජීවය ඇත්තහුට සම්‍යක් ව්‍යායාමය ඇත්තේ වෙයි. සම්‍යක් ව්‍යායාමය ඇත්තහුට සම්‍යක් සිහිය ඇත්තේ වෙයි. සම්‍යක් සිහිය ඇත්තහුට සම්‍යක් සමාධිය ඇත්තේ වෙයි. සම්‍යක් සමාධිය ඇත්තහුට සම්‍යක් ඤාණය ඇත්තේ වෙයි. සම්‍යක් ඤාණය ඇත්තහුට සම්‍යක් විමුක්තිය ඇත්තේ වෙයි.

"මහණෙනි, මෙසේ අංග අටකින් යුක්තවූ ශෛක්‍ෂ ප්‍රතිපදාවත් අංගදශයකින් සමන්විතවූ රහත් පුද්ගලයාත්වේ.

"මහණෙනි, ඔවුන් අතුරෙන් සම්‍යක්දෘෂ්ටිය පෙරටුකොට යන්නේ වේ. "මහණෙනි, සම්‍යක් දෘෂ්ටිය පෙරටුකොට යන්නේ කෙසේද?

'මහණෙනි, සම්‍යක් දෘෂ්ටි ඇත්තහුගේ මිථ්‍යාදෘෂ්ටිය දිරාගියේ වෙයි. මිථ්‍යාදෘෂ්ටිය හේතුකොට ගෙන යම් නොයෙක්

ලාමක අකුශල ධර්මයෝ හටගනිද්ද, ඔහුගේ ඒ අකුශලයෝද දිරාගියාහුවෙත්. සම්‍යක් දෘෂ්ටිය හෙතුකොට ගෙන බොහෝ කුශල ධර්මයෝ වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙත්.

15. "මහණෙනි, සම්‍යක් සංකල්පනා ඇත්තහුගේ මිථ්‍යා සංකල්පය දිරාගියේ වෙයි. මිථ්‍යා සංකල්පය හේතුකොට ගෙණ යම් නොයෙක් අකුශල ධර්මයෝ හටගනිද්ද, ඔහුගේ ඒ අකුශල ධර්මයෝද දිරාගියාහු වෙත්. සම්‍යක් කල්පනාව හෙතුකොටගෙන බොහෝ කුශල ධර්මයෝ වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙත්.

"මහණෙනි, සම්‍යක් වචන ඇත්තහුගේ මිථ්‍යා වචන දිරාගියේ වෙයි. මිථ්‍යා වචන හේතුකොටගෙන යම් නොයෙක් ලාමක අකුශල ධර්මයෝ හටගනිද්ද, ඔහුගේ ඒ අකුශල ධර්මයෝ ද දිරාගියාහු වෙත්. සම්‍යක් වචනය හේතුකොට ගෙන බොහෝ කුශල ධර්මයෝ වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙත්.

"මහණෙනි, සම්‍යක් කර්මාන්ත ඇත්තහුගේ මිථ්‍යා කර්මාන්තය දිරාගියේ වෙයි. මිථ්‍යා කර්මාන්තය හේතුකොටගෙන යම් බොහෝවූ ලාමක අකුශල ධර්මයෝ හටගනිත් නම්, ඔහුගේ ඒ අකුශල ධර්මයෝද දිරාගියාහු වෙත්. සම්‍යක් කර්මාන්තය හේතුකොට ගෙන බොහෝ කුශල ධර්මයෝ වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙත්.

"මහණෙනි, සම්‍යක් ආජීවය ඇත්තහුගේ මිථ්‍යා ආජීවය දිරාගියේ වෙයි. මිථ්‍යා ආජීවය හේතුකොට ගෙන යම් බොහෝවූ ලාමක අකුශල ධර්මයෝ හටගනිත් නම් ඔහුගේ ඒ අකුශල ධර්මයෝද දිරාගියාහු වෙත්. සම්‍යක් ආජීවය හේතුකොට ගෙන බොහෝ කුශල ධර්මයෝ වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙත්.

"මහණෙනි, සම්‍යක් ව්‍යායාම ඇත්තහුගේ මිථ්‍යා ව්‍යායාමය දිරාගියේ වෙයි. මිථ්‍යා ව්‍යායාමය හේතුකොට ගෙන යම් බොහෝවූ ලාමක අකුශල ධර්මයෝ හටගනිත් නම් ඔහුගේ ඒ අකුශල ධර්මයෝද නැතිවෙත්. සම්‍යක් ව්‍යායාමය හේතුකොටගෙන බොහෝ කුශල ධර්මයෝ වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙත්.

"මහණෙනි, සම්‍යක් සතිය ඇත්තහුගේ මිථ්‍යා ආජීවය දිරාගියේ වෙයි. මිථ්‍යා සතිය හේතුකොටගෙන යම් බොහෝවූ ලාමක අකුශල ධර්මයෝ හටගනිත් නම්, ඔහුගේ ඒ අකුශල ධර්මයෝද දිරාගියාහු වෙත්. සම්‍යක් සතිය හේතුකොට ගෙන බොහෝ කුශල ධර්මයෝ වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙත්.

"මහණෙනි, සම්‍යක් සමාධිය ඇත්තහුගේ මිථ්‍යා සමාධිය දිරාගියේ වෙයි. මිථ්‍යා සමාධිය හේතුකොට ගෙන යම් බොහෝවූ ලාමක අකුශල ධර්මයෝ හටගනිත් නම්, ඔහුගේ ඒ අකුශල ධර්මයෝද දිරාගියාහු වෙත්. සම්‍යක් සමාධිය හේතුකොට ගෙන බොහෝ කුශල ධර්මයෝ වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙත්.

16. "මහණෙනි, සම්‍යක් ඥාන ඇත්තහුගේ මිථ්‍යා ඥානය දිරුයේවෙයි. මිථ්‍යාඥානය හේතුකොට ගෙන යම් බොහෝවූ ලාමක අකුශල ධර්මයෝ හටගනිත් නම්, ඔහුගේ ඒ අකුශල ධර්මයෝද දිරුවාහු වෙත්. සම්‍යක් ඥානය හේතුකොට ගෙන බොහෝ කුශල ධර්මයෝ වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙත්.

"මහණෙනි, සම්‍යක් විමුක්තියෙන් යුත් සිත් ඇත්තහුගේ මිථ්‍යා විමුක්තිය දිරුයේ වෙයි. මිථ්‍යා විමුක්තිය හේතුකොට ගෙන යම් නොයෙක් ලාමක අකුශල ධර්මයෝ හටගනිත් නම්, ඔහුගේ ඒ අකුශල ධර්මයෝද දිරුවාහු වෙත්. සම්‍යක් විමුක්තිය හේතුකොට ගෙන නොයෙක් කුශල ධර්මයෝ වැඩීමට සම්පූර්ණ බවට පැමිණෙත්.

17. "මහණෙනි, මෙසේ වනාහි ලෝකයෙහි කිසිදු ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් බඹෙකු විසින් හෝ අන්කිසිවෙකු විසින් හෝ, නොපැවැත්විය හැකි කුශල පක්ෂයෙහි ධර්ම විස්සෙක්ද, අකුශල පක්ෂයෙහි ධර්ම විස්සෙක් දැයි (සතළිස් දහම් ක්‍රම ඇතුළත්) මහා චත්තාරීසක ධම්මපරියායය පවත්වන ලදී.

"මහණෙනි, යම් කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මේ මහා චත්තාරීසක ධම්මපරියායය ගැරහිය යුත්තක ආක්‍රොශ

කළ යුත්තකැයි හඟින්නේ නම්, මෙලෙව්හිදීම ඔහුගේ කරුණු දශයකින් කරුණු සහිතවූ ඒ වාදානුවාදයෝ ගැරහිය යුතු බවට පැමිණෙත්. ඉදින් පින්වත් තෙමේ සම්‍යක් දෘෂ්ටියට ගරහයි නම් යම් ඒ මිථ්‍යා දෘෂ්ටි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත් නම්, ඔවුහු පින්වත්හුගේ පිදිය යුත්තෝය. ඔවුහු පින්වත්හුගේ ප්‍රශංසා කටයුත්තෝය.

18. "ඉදින් පින්වත් තෙමේ සම්‍යක් සංකල්පයට ගරහයි නම්, යම් මිථ්‍යා සංකල්පනා ඇති ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත් නම්, ඔවුහු පින්වත්හුගේ පිදිය යුත්තෝය. ඔව්හු පින්වත්හුගේ ප්‍රශංසාකට යුත්තෝය.

"ඉදින් පින්වත් තෙමේ සම්‍යක් වචනයට ගරහයි නම්, යම් ඒ මිථ්‍යා වචන ඇති ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත් නම්, ඔවුහු පින්වතාගේ පිදිය යුත්තෝ වෙති. ඔවුහු පින්වත්හුගේ ප්‍රශංසා කට යුත්තෝ වෙති.

"ඉදින් පින්වත් තෙමේ සම්‍යක් කර්මාන්තයට ගරහයි නම්, යම් මිථ්‍යා කර්මාන්ත ඇති ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත් නම්, ඔවුහු භවතාගේ පිදිය යුත්තෝ වෙත්. ඔවුහු භවතාගේ ප්‍රශංසා කටයුත්තෝ වෙත්.

"ඉදින් පින්වත් තෙමේ සම්‍යක් ආජීවයට ගරහයි නම්, මිථ්‍යා ආජීව ඇති යම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත් නම්, ඔවුහූ පින්වත්හුගේ පිදිය යුත්තෝ වෙත්. ඔවුහු භවතාගේ ප්‍රශංසා කටයුත්තෝ වෙති.

"ඉදින් පින්වත් තෙමේ සම්‍යක් ව්‍යායාමයට ගරහයි නම්, මිථ්‍යා ව්‍යායාමය ඇති යම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත් නම්, ඔවුහු පින්වතාගේ පිදිය යුත්තෝ වෙත්. ඔව්හු පින්වතාගේ ප්‍රශංසා කටයුත්තෝ වෙත්.

"ඉදින් පින්වත් තෙමේ සම්‍යක් සතියට ගරහයි නම්, මිථ්‍යා සතිය ඇති යම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත් නම්, ඔවුහු පින්වත්හුගේ පිදිය යුත්තෝ වෙත්. ඔවුහු පින්වතාගේ ප්‍රශංසා කටයුත්තෝ වෙත්.

"ඉදින් පින්වත් තෙමේ සම්‍යක් සමධියට ගරහයි නම්, මිථ්‍යා සමාධිය ඇති යම ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත් නම්, ඔවුහු පින්වතාගේ පිදිය යුත්තෝ වෙත්. ඔවුහු පින්වතාගේ ප්‍රශංසා කටයුත්තෝ වෙත්.

"ඉදින් පින්වත් තෙමේ සම්‍යක් ඥානයට ගරහයි නම්, මිථ්‍යා ඥානය ඇති යම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත් නම්, ඔවුහු පින්වතාගේ පිදිය යුත්තෝ වෙත්. ඔවුහු පින්වතාගේ ප්‍රශංසා කටයුත්තෝ වෙත්.

"ඉදින් පින්වත් තෙමේ සම්‍යක් විමුක්තියට ගරහයි නම්, මිථ්‍යා විමුක්තිය ඇති යම් ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත් නම්, ඔවුහු පින්වතාගේ පිදිය යුත්තෝ වෙත්. ඔව්හු පින්වතාගේ ප්‍රශංසා කටයුත්තෝ වෙත්.

**19.** "මහණෙනි, යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මේ මහා චත්තාරීසක ධම්මාපරියායය ගැරහිය යුත්තක, ආක්‍රොෂ කළ යුත්තෙකැයි හඟින්නේ නම්, මෙලෙව්හිදීම ඔහුගේ ඒ වාදානුවාදයෝ දස කරුණකින් කරුණු සහිතව ගැරහිය යුතු තැනට පැමිණෙත්.

"මහණෙනි, සත්වයන්ගේ සුද්ධියට හේතුවක් නැත යන අහේතු දෘෂ්ටිය ඇත්තාවූද, පවු කළත් පාපයක් නැත යන අකිරිය දෘෂ්ටිය ඇත්තාවූද, දීමෙහි විපාක නැත යනාදි නාස්තික දෘෂ්ටිය ඇත්තාවූද, යම් ඒ උක්කලා දනව් වැසි වස්සය, භඤ්ඤය, යන දෙදෙනද, මහා චත්තාරීසක ධම්ම පරියායය නොගැරහිය යුත්තක් කොට ආක්‍රොශ නොකළ යුත්තක් කොට සැළකුවාහුය. ඊට හේතු කවරේද? තමහට පැමිණෙන නින්දාව ඝට්ටනය උපවාදය යන මේවාට බියෙනි. භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනා කළ සේක. සතුටුවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්හ.

**සත්වෙනි මහා චත්තාරීසක සූත්‍රය නිමි. (2-7)**

---

# 18. ආනාපාන සති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ පූර්වාරාමයේ "මිගාර මාතු" නම් ලත් ප්‍රාසාදයෙහි බොහෝ ප්‍රසිද්ධ ප්‍රසිද්ධ ස්ථවිර ශ්‍රාවකයන් සමග වැඩ වෙසෙති. (එනම්,) ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්ද, ආයුෂ්මත් මහා මෞත්ගල්‍යායන ස්ථවිරයන්, ආයුෂ්මත් මහා කාශ්‍යප ස්ථවිරයන්ද, ආයුෂ්මත් මහා කාත්‍යායන ස්ථවිරයන්ද, ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන්ද, ආයුෂ්මත් මහා කප්පින ස්ථවිරයන්ද, ආයුෂ්මත් මහා චුන්ද ස්ථවිරයන්ද, ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ද, ආයුෂ්මත් රෙවතස්ථවිරයන්ද, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ද, අනිකුත් ප්‍රසිද්ධ ප්‍රසිද්ධ ස්ථවිර ශ්‍රාවකයන්ද, සමගය. එකල්හි වනාහි ස්ථවිර භික්ෂුහු අළුත මහණවූ භික්ෂූන්ට අවවාද කරති. අනුශාසනා කරති. ඇතැම් ස්ථවිර භික්ෂූහු, භික්ෂූන් දස නමකටද, අවවාද කරති, අනුශාසනා කරති. ඇතැම් ස්ථවිර භික්ෂූහු, භික්ෂූන් විසි නමකටද අවවාද කරති, අනුශාසනා කරති. ඇතැම් ස්ථවිර භික්ෂුහු, භික්ෂූන් තිස් නමකටද අවවාද කරති, අනුශාසනා කරති. ඇතැම් ස්ථවිර භික්ෂූහු, භික්ෂූන් හතලිස් නමකටද අවවාද කරති, අනුශාසනා කරති. ස්ථවිර භික්ෂූන් විසින් අවවාද කරනු ලබන්නාවූ අනුශාසනා කරනු ලබන්නාවූ ඒ අළුත මහණවූ භික්ෂුහුද සිල් පිරීම් ආදි පළමු විශෙෂයන්ට වඩා මහත්වූ කසිණ භාවනාදී විශෙෂයෙන් දැනගනිති. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ එදා පිරුනු සඳ ඇති පවාරණය කරන පසළොස්වක් පෝයදා රෑ භික්ෂු සංඝයා විසින් පිරිවරණ ලද්දේ එළිමහන් තන්හි වැඩ සිටි සේක.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණිම්භූතව තුෂ්ණිම්භූතව (හුන්) භික්ෂු සංඝයා බලා ඔවුන්ට කථා කළහ. "මහණෙනි, මේ ප්‍රතිපත්තියෙහි සතුටු වූයේ වෙමි. මහණෙනි, මේ ප්‍රතිපත්තියෙහි සතුටු සිතැත්තේ වෙමි. මහණෙනි, එබැවින් නොපැමිණි මාර්ග ඵලයට පැමිණීම පිණිස අවබෝධ නොකළ ධර්මයාගේ අවබෝධය පිණිස ප්‍රත්‍යක්ෂ නොකළ ධර්මය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස වීර්‍ය්‍ය කරව්. මම මේ සැවැත් නුවරම

කුමුදු පිපෙන්නාවූ වස් සාරමාසයේ අන්තිම මාසය වන ඉල් මාසය දක්වා නවතින්නෙමි.” භාග්‍යවතුන් වහන්සේ වනාහී ඒ සැවැත් නුවරම වස් සාරමාසයේ අන්තිම මාසයවූ කුමුදු පිපෙන්නාවූ ඉල් මාසය දක්වා වැඩසිටින සේකැයි ජනපදවාසී භික්ෂූහු ඇසුවාහුය. ඒ ජනපදවාසී භික්ෂූහුද බුදුන් දකින්නට සැවැත් නුවරට රැස්වෙති. ඒ ස්ථවිර භික්ෂූහුද අළුත් භික්ෂූන්ට වැඩියත් අවවාද කරත්. අනුශාසනා කරත්. ඇතැම් ස්ථවිර භික්ෂූහු භික්ෂූන් දස නමකටද අවවාද කරත්, අනුශාසනා කරත්. ඇතැම් ස්ථවිර භික්ෂූහු භික්ෂූන් විසි නමකටද අවවාද කරති, අනුශාසනා කරති. ඇතැම් ස්ථවිර භික්ෂූහු භික්ෂූන් තිස් නමකටද අවවාද කරති, අනුශාසනා කරති. ඇතැම් ස්ථවිර භික්ෂූහු භික්ෂූන් හතලිස් නමකටද අවවාද කරති, අනුශාසනා කරති. ස්ථවිර භික්ෂූන් විසින් අවවාද කරනු ලබන්නාවූ, අනුශාසනා කරනු ලබන්නාවූ ඒ අළුත් භික්ෂූහුද සිල්පිරීම් ආදී පළමු විශෙෂයන්ට වඩා කසිණ භාවනාදී විශෙෂයන් දැනගනිති. එකල්හි වනාහි භාග්‍යවතුන් වහන්සේ කුමුදු ඇත්තාවූ වස් සාරමාසයේ අන්තිම මාසයවූ පිරුණු සඳ ඇති ඉල්මස පසළොස්වක්දා රෑ භික්ෂු සංඝයා විසින් පිරිවරණ ලද්දේ එළිමහන් තන්හි වැඩ සිටි සේක.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භූතව තුෂ්ණීම්භූතව (හුන්) භික්ෂු සංඝයා බලා, ඔවුන්ට කථා කළහ. “මහණෙනි, මේ පිරිස කථා නැත්තේය. මහණෙනි, මේ පිරිස දෙඩුම් නැත්තේය. පිරිසිදුය, සාරයෙහි පිහිටියාය. මහණෙනි, මේ භික්ෂු සංඝතෙම එබඳු ස්වභාව ඇත්තේය. මහණෙනි, මේ පිරිස එබඳු ස්වභාව ඇත්තේය. මහණෙනි, යම්බඳු පිරිසක් පූජා ලැබීමට, ආගන්තුක සත්කාර ලැබීමට දානය ලැබීමට, වැඳුම් ලැබීමට, සුදුසු වේද ලෝකයාගේ අති උතුම් පිංකෙත වේද, මහණෙනි, මේ භික්ෂු සංඝතෙම එබඳු ස්වාභාව ඇත්තේය. මහණෙනි, මේ පිරිස එබඳු ස්වභාව ඇත්තේය. යම්බඳු පිරිසකට ස්වල්පයක් දුන්නේ බොහෝ (විපාක ඇත්තේ) වේද? බොහෝ දුන්නේ ඉතා බොහෝ (විපාක ඇත්තේ) වේද? මහණෙනි, මේ භික්ෂු සංඝතෙම එබඳු ස්වභාව ඇත්තේය.

4. "මහණෙනි, මේ පිරිස එබඳු ස්වභාව ඇත්තේය. යම්බඳු පිරිසක් ලෝකවාසීන්ට දැකීමට දුර්ලභවේද, මහණෙනි, මේ භික්ෂු සංඝතෙම එබඳු ස්වභාව ඇත්තේය. මහණෙනි, මේ පිරිස එබඳු ස්වරූප ඇත්තේය. යමබඳු පිරිසක් දැකීම සඳහා සේනාව බත් බැඳගන යොදුන් ගණනක් යාමට සුදුසුද, මහණෙනි, මේ භික්ෂු සංඝතෙම එබඳු ස්වභාව ඇත්තේය. මහණෙනි, මේ පිරිස එබඳු ස්වභාව ඇත්තේය. මහණෙනි, මේ භික්ෂු සංඝයා අතරෙහි (රාගාදී) ආශ්‍රව ක්ෂය කළාවූ වැස නිමකළ බ්‍රහ්මචරියාව ඇත්තාවූ, කළයුතු දේ කළාවූ, බහා තැබූ (කෙලෙස්) බර ඇත්තාවූ, තමාගේ අර්ථයට පැමිණියාවූ භව බැඳුම් සිඳදැමූ, මනාකොට දත්තාවූ, (කෙලෙස් වලින්) මිදුනාවූ රහතන් වහන්සේලාද සිටිති. මහණෙනි, මෙබඳුවූ භික්ෂූහුද මේ භික්ෂු සංඝයා අතරෙහි සිටිති. මහණෙනි, මේ භික්ෂු සංඝයා අතරෙහි පස්වැදෑරුම් ඔරම්භාගිය සංයොජනයන් නැති කිරීමෙන් (සුද්ධාවාසයෙහි) ඖපපාතිකව ඉපිද එහිම පිරිනිවන් පාන්නාවූ ඒ ලෝකයෙන් (නැවත) මේ ලෝකයට උප්පත්ති වශයෙන් නොඑන්නාවූ අනාගාමීහුද සිටිති. මහණෙනි, මෙබඳුවූ භික්ෂුහු භික්ෂූද මේ භික්ෂු සංඝයා අතරෙහි සිටිති.

5. "මහණෙනි, මේ භික්ෂු සංඝයා අතර සංයෝජන තුනක් නැති කිරීමෙන් රාගය, ද්වෙෂය සහ මෝහය තුනීවූ බැවින් එක් වරක්ම මේ ලෝකයට (උප්පත්ති වශයෙන්) අවුත් දුක් කෙළවරකරන සකෘදාගාමි පුද්ගලයෝද ඇත්තාහ. මහණෙනි, මෙබඳුවූ භික්ෂූහුද මේ භික්ෂූ සංඝයා අතර සිටිති. මහණෙනි, මේ භික්ෂූහු සංඝයා අතර සංයෝජන තුනක් නැති කිරීමෙන් නිරයට නොයන ස්වභාව ඇත්තාවූ, ඒකාන්තයෙන් නිවන් දකින්නාවූ, සෝවාන් වූවාහුද සිටිති,

6. "මහණෙනි, මෙබඳුවූ භික්ෂූහුද මේ භික්ෂූ සංඝයා අතර සිටිති. මහණෙනි, මේ භික්ෂූ සංඝයා අතර සතර සතිපට්ඨාන භාවනාවෙහි යෙදී වාසය කරන්නාවූ භික්ෂූහුද ඇත්තාහ. මහණෙනි, මෙබඳුවූ, භික්ෂූහුද මේ භික්ෂූ සංඝයා අතර සිටිති. මහණෙනි, මේ භික්ෂූන් අතර සතර සම්‍යක් ප්‍රධාන භාවනාවෙහි යෙදී වාසය කරන්නාවූ භික්ෂූහුද ඇත. මහණෙනි, භික්ෂූන්

අතර මෙබඳු භික්ෂූහුද වෙති. මහණෙනි, මේ භික්ෂු සංඝයා අතර සතර ඍද්ධිපාද භාවනාවෙහි යෙදී වාසය කරන්නාවූ භික්ෂූහුද ඇත්තාහ. මහණෙනි, මෙබඳුවූ භික්ෂුද මේ භික්ෂු සංඝයා අතර සිටිති. මහණෙනි, මේ භික්ෂු සංඝයා අතර පංචේන්ද්‍රිය භාවනාවෙහි යෙදී වාසය කරන්නාවූ භික්ෂුහුද වෙති. මහණෙනි, මෙබඳුවූ භික්ෂු සංඝයාද මේ භික්ෂූන් අතර සිටිති. මහණෙනි, මේ භික්ෂු සංඝයා අතර පංච බල භාවනාවෙහි යෙදී වසන්නාවූ භික්ෂූහුද ඇත. මහණෙනි, මෙබඳුවූ භික්ෂුහුද මේ භික්ෂූ සංඝයා අතර සිටිති. මහණෙනි, මේ භික්ෂු සංඝයා අතර සප්ත බෝධ්‍යංග භාවනාවෙහි යෙදී වාසය කරන භික්ෂුහුද ඇත්තාහුය. මහණෙනි, මෙබඳුවූ භික්ෂූහුද මේ භික්ෂු සංඝයා අතර සිටිති. මහණෙනි, මේ භික්ෂු සංඝයා අතර ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ග භාවනාවෙහි යෙදී වාසය කරන භික්ෂූහුද වෙති. මහණෙනි, මෙබඳුවූ භික්ෂුහුද මේ භික්ෂු සංඝයා අතර සිටිති. මහණෙනි, මේ භික්ෂු සංඝයා අතර මෛත්‍රී භාවනාවෙහි යෙදී වාසය කරන භික්ෂුහුද ඇත්තාහ. මහණෙනි, මේ භික්ෂූන් අතර මෙබඳු භික්ෂුහුද වෙති. මහණෙනි, මේ භික්ෂුන් අතර කරුණා භාවනාවෙහි යෙදී වාසය කරන භික්ෂූහුද ඇත්තාහ. මහණෙනි, මේ භික්ෂුන් අතර මෙබඳුවූ භික්ෂුහුද සිටිති. මහණෙනි, මේ භික්ෂු සංඝයා අතර මුදිත භාවනාවෙහි යෙදී වාසය කරන භික්ෂුහුද ඇත්තාහ. මහණෙනි, මෙබඳුවූ භික්ෂූහුද මේ භික්ෂු සංඝයා අතර සිටිති. මහණෙනි, මේ භික්ෂූ සංඝයා අතර උපෙක්ෂා භාවනාවෙහි යෙදී වාසය කරන භික්ෂූහුද ඇත්තාහ. මහණෙනි, මෙබඳුවූ භික්ෂූහුද මේ භික්ෂු සංඝයා අතර සිටිති. මහණෙනි, මේ භික්ෂු සංඝයා අතර අසුභ භාවනාවෙහි යෙදී වාසය කරන භික්ෂූහුද ඇත්තාහ. මහණෙනි, මේ භික්ෂු සංඝයා අතර මෙබඳුවූ භික්ෂුහුද සිටිති. මහණෙනි, මේ භික්ෂු සංඝයා අතර අනිත්‍ය සංඥා භාවනාවෙහි යෙදී වාසය කරන භික්ෂුහුද ඇත්තාහ. මහණෙනි, මෙබඳුවූ භික්ෂුහුද මේ භික්ෂු සංඝයා අතර සිටිති. මහණෙනි, මේ භික්ෂු සංඝයා අතර ආනාපාන සති භාවනාවෙහි යෙදී වාසය කරන්නාවූ භික්ෂූහුද ඇත්තාහ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

7. "මහණෙනි, වඩන ලද්දාවූ, පුරුදු කරන ලද්දාවූ ආනාපානසති භාවනාව මහත්ඵල මහානිසංස ඇත්තේ වෙයි. මහණෙනි, වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ ආනාපාන සතිය සතර සතිපට්ඨානය සම්පූර්ණ කරයි. වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ සතර සතිපට්ඨානයෝ සප්ත බෝද්ධ්‍යංගයන් සම්පූර්ණ කරති. වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ සප්ත බෝධ්‍යංගයෝ විජ්ජා විමුත්තිය සම්පූර්ණ කරති. මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ, කෙසේ පුරුදු කරන ලද්දාවූ, ආනාපාන සති භාවනාව මහත්ඵල මහානිසංස වේද? මහණෙනි, මේ ශාසනයෙහි වනයකට ගියාවූ හෝ, රුක් මුලකට ගියාවූ හෝ, විවේක ස්ථානයකට ගියාවූ හෝ, මහණතෙම පයඹුංක බැඳ (අරමිණිය ගොතා), කය කෙලින් තබා, සිහිය ඉදිරිපත්කොට තබාගෙන හිඳින්නේය. හෙතෙම සිහියෙන්ම හුස්ම ගනියි. සිහියෙන්ම හුස්ම පිටකරයි. දිගට හුස්ම ගන්නේ හෝ දිගට හුස්ම ගන්නෙමියි දන්නේය. දිගට හුස්ම පිටකරන්නේ හෝ දිගට හුස්ම පිටකරන්නෙමියි දන්නේය, කොටින් හුස්ම ගන්නේ හෝ කොටින් හුස්ම ගන්නෙමියි දන්නේය. කොටින් හුස්ම පිටකරන්නේ හෝ කොටින් හුස්ම පිටකරන්නෙමියි දන්නේය. හුස්ම ගැනීමේ මුල මැද අග යන සියල්ල දැනගනිමින් හුස්ම ගන්නෙමියි පුරුදු කරන්නේය. හුස්ම පිටකිරීමේ මුල මැද අග යන සියල්ල දැනගනිමින් හුස්ම පිටකරන්නෙමියි පුරුදු කරන්නේය. ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් හුස්ම ගන්නෙමියි පුරුදු කරන්නේය. ආශ්වාස ප්‍රශ්වාසයන් සංසිඳුවමින් හුස්ම පිටකරන්නෙමියි පුරුදු කරන්නේය. ප්‍රීතිය දැනගනිමින් හුස්ම ගන්නෙමියි පුරුදු කරන්නේය. ප්‍රීතිය දැනගනිමින් හුස්ම පිටකරන්නෙමියි පුරුදු කරන්නේය. සැපය දැනගනිමින් හුස්ම ගන්නෙමියි පුරුදු කරන්නේය. සැපය දැනගනිමින් හුසුම පිටකරන්නෙමියි පුරුදු කරන්නේය. චිත්තසංස්කාරය (වේදනා සංඥාවන්) දැනගනිමින් හුස්ම ගන්නෙමියි පුරුදු කරන්නේය. චිත්ත සංස්කාරය (වෙදනා සංඥා) විශෙෂයෙන් දැනගනිමින් හුස්ම පිටකරන්නෙමියි පුරුදු කරන්නේය. චිත්ත සංස්කාරය (වේදනා සංඥා) සංසිදුවන්නේ හුස්ම ගන්නෙමියි පුරුදු

කරන්නේය. චිත්ත සංස්කාරය සංසිඳුවන්නේ හුස්ම පිට කරන්නෙමියි පුරුදු කරන්නේය. සිත දැනගනිමින් හුස්ම ගන්නෙමියි පුරුදු කරන්නේය. හිත දැනගනිමින් හුස්ම පිටකරන්නෙමියි පුරුදු කරන්නේය. සිත සතුටු කරමින් හුස්ම ගන්නෙමියි පුරුදු කරන්නේය. සිත සතුටු කරමින් හුස්ම පිටකරන්නෙමියි පුරුදු කරන්නේය. සිත මනාකොට එකඟ කරමින් හුස්ම ගන්නෙමියි පුරුදු කරන්නේය. හිත මනාකොට එකඟ කරමින් හුස්ම පිටකරන්නෙමියි පුරුදු කරන්නේය. සිත කෙළෙසුන් කෙරෙන් මුදවමින් හුස්ම ගන්නෙමියි පුරුදු කරන්නේය. හිත කෙළෙසුන් කෙරෙන් මුදවමින් හුස්ම පිටකරන්නෙමියි පුරුදු කරන්නේය. අනිත්‍යය නැවත නැවත දකිමින් හුස්ම ගන්නෙමියි පුරුදු කරන්නේය. අනිත්‍යය නැවත නැවත දකිමින් හුස්ම පිට කරන්නෙමියි පුරුදු කරන්නේය. නොඇලීම (විරාගය) නැවත නැවත දකිමින් හුස්ම ගන්නෙමියි පුරුදු කරන්නේය. නොඇලීම (විරාගය) නැවත නැවත දකිමින් හුස්ම පිට කරන්නෙමියි පුරුදු කරන්නේය. නිරොධය නැවත නැවත දකිමින් හුස්ම ගන්නෙමියි පුරුදු කරන්නේය. නිරොධය නැවත නැවත දකිමින් හුස්ම පිටකරන්නෙමියි පුරුදු කරන්නේය. අත්හැර දැමීම (පටිනිස්සග්ගය) නැවත නැවත දකිමින් හුස්ම ගන්නෙමියි පුරුදු කරන්නේය. අත්හැරදැමීම (පටිනිස්සග්ගය) නැවත නැවත දකිමින් හුස්ම පිටකරන්නෙමියි පුරුදු කරන්නේය. මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ ආනාපාන සතිය වනාහි මහත්ඵල ඇත්තී මහානිසංස ඇත්තී වෙයි.

8. "මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ, කෙසේ පුරුදු කරන ලද්දාවූ, ආනාපාන සතිය සතර සතිපට්ඨානයන් සම්පූර්ණ කෙරේද? මහණෙනි, යම් කලක මහණතෙම දිගට හුස්ම ගන්නේ හෝ දිගට හුස්ම ගන්නෙමියි දනීද, දිගට හුස්ම පිටකරන්නේ හෝ දිගට හුස්ම පිටකරන්නෙමියි දනීද, කොටින් හුස්ම ගන්නේ හෝ කොටින් හුස්ම ගන්නෙමියි දනීද, කොටින් හුස්ම පිටකරන්නේ හෝ කොටින් හුස්ම පිට කරන්නෙමියි දනීද, සියලු ආශ්වාස ප්‍රශ්වාසකය දන්නේ හුස්ම පිටකරන්නෙමියි හික්මෙයිද, ආශ්වාස ප්‍රශ්වාසයන් තුනී කරමින් හුස්ම ගන්නෙමියි

හික්මෙයිද, ආශ්වාස ප්‍රශ්වාසයන් තුනී කරමින් හුස්ම පිටකරන්නෙමියි හික්මෙයිද, මහණෙනි, එකල කය අනුව බලන්නාවූ කෙළෙස් තවන වීර්‍ය්‍ය ඇත්තාවූ විමසන නුවණ ඇත්තාවූ, සිහිය ඇත්තාවූ මහණතෙම පඤ්චස්කන්ධය නමැති ලොකයෙහි ලොභය හා ද්වෙෂය දුරුකොට වාසය කරයි.

"මහණෙනි, 'මම මේ ආශ්වාස ප්‍රශ්වාස කාය කොට්ඨාසයන් අතුරෙන් එක්තරා කාය කොට්ඨාසයකැයි කියමි.' මහණෙනි, ඒ නිසා මේ ශාසනයෙහි මහණතෙම එකල්හි කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තවූ නුවණින් යුක්තවූ සිහියෙන් යුක්තවූ මහණ තෙමේ කයෙහි කය අනුව බලමින් පඤ්චස්කන්ධ ලොකයෙහි ලොභය හා ද්වෙෂය දුරුකොට වාසය කරයි.

**9.** "මහණෙනි, යම් කලක මහණතෙම ප්‍රීතිය දැන ගනිමින් හුස්ම ගන්නෙමියි හික්මෙයිද, ප්‍රීතිය දැනගනිමින් හුස්ම පිටකරන්නෙමියි හික්මෙයිද, සැපය දැනගනිමින් හුස්ම ගන්නෙමියි හික්මෙන්නේද, සැපය දැනගනිමින් හුස්ම පිට කරන්නෙමියි හික්මෙන්නේද, චිත්ත සංස්කාරය දැනගනිමින් හුස්ම ගන්නෙමියි හික්මෙන්නේද, චිත්තසංස්කාරය දැන ගනිමින් හුස්ම පිටකරන්නෙමියි හික්මෙන්නේද, චිත්ත සංස්කාරය සංසිඳුවමින් හුස්ම ගන්නෙමියි හික්මෙන්නේද, චිත්ත සංස්කාරය සංසිඳුවමින් හුස්ම පිටකරන්නෙමියි හික්මෙන්නේද, මහණෙනි, එකල වේදනාවන්හි වේදනාව අනුව බලන්නාවූ කෙළෙස් තවන වීර්‍ය්‍ය ඇත්තාවූ, නුවණ ඇත්තාවූ, සිහිය ඇත්තාවූ මහණතෙම් පඤ්චස්කන්ධ ලෝකයෙහි ලෝභය සහ දොසය දුරුකොට වාසය කරයි.

**10.** "මහණෙනි, යම් ආශ්වාස ප්‍රශ්වාසයන් මනාකොට මෙනෙහි කිරීමක් වෙයිද, මම එය වෙදනාවන් අතුරෙන් එක්තරා වෙදනාවකැයි කියමි. මහණෙනි, ඒ නිසා මේ ශාසනයෙහි මහණතෙම එකල්හි කෙළෙස් තවන උත්සාහ ඇත්තේ, නුවණ ඇත්තේ, සිහිය ඇත්තේ පඤ්චස්කන්ධ ලෝකයෙහි ලොභය සහ දොසය දුරුකොට වාසය කරයි. මහණෙනි, යම් කලක මහණ තෙම සිත දැනගනිමින් හුස්ම ගන්නෙමියි හික්මෙයිද,

සිත දැනගනිමින් හුස්ම පිටකරන්නෙමියි හික්මෙයිද, හිත සතුටු කරමින් හුස්ම ගන්නෙමියි හික්මෙයිද, හිත සතුටු කරමින් හුස්ම පිටකරන්නෙමියි හික්මෙයිද, හිත මනාකොට එකඟකරමින් හුස්ම ගන්නෙමියි හික්මෙයිද, හිත මනාකොට එකඟ කරමින් හුස්ම පිටකරන්නෙමියි හික්මෙයිද, හිත කෙළෙසුන් කෙරෙන් මුදවමින් හුස්ම ගන්නෙමියි හික්මෙයිද, හිත කෙළෙසුන් කෙරෙන් මුදවමින් හුස්ම පිටකරන්නෙමියි හික්මෙයිද, මහණෙනි, එකල සිතෙහි සිත අනුව බලන්නාවූ කෙළෙස් තවන වීර්‍ය්‍යය ඇත්තාවූ, නුවණ ඇත්තාවූ, සිහිය ඇත්තාවූ මහණතෙම පඤ්චස්කන්ධ ලෝකයෙහි ලෝභය සහ දොසය දුරුකොට වාසය කරයි. මහණෙනි, මම සිහි මුලාවූ නුවණ නැත්තාහට ආනාපාන සති භාවනාව නොකියමි.

"මහණෙනි, ඒ නිසා මේ ශාසනයෙහි මහණ තෙම එකල්හි සිතෙහි සිත අනුව බලමින් කෙළෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ, නුවණ ඇත්තේ, සිහිය ඇත්තේ, පඤ්චස්කන්ධ ලෝකයෙහි ලෝභය සහ දෝසය දුරුකොට වාසය කරයි.

11. 'මහණෙනි, යම් කලක මහණතෙම අනිත්‍යය නැවත නැවත දකිමින් හුස්ම ගන්නෙමියි හික්මෙයිද, අනිත්‍යය නැවත නැවත කියමින් හුස්ම පිට කෙරෙමියි හික්මෙයිද, නොඇලීම (විරාගය) නැවත නැවත කියමින් හුස්ම ගන්නෙමියි හික්මෙයිද, නොඇලීම (විරාගය) නැවත නැවත දකිමින් හුස්ම පිටකරන්නෙමියි හික්මෙයිද, නැතිවීම (නිරෝධය) නැවත නැවත දකිමින් හුස්ම ගන්නෙමියි හික්මෙයිද, නැතිවීම (නිරෝධය) නැවත නැවත දකිමින් හුස්ම පිටකරන්නෙමියි හික්මෙයිද අත්හැර දැමීම (පටි නිස්සග්ගය) නැවත නැවත දකිමින් හුස්ම ගන්නෙමියි හික්මෙයිද, අත්හැර දැමීම (පටිනිස්සග්ගය) නැවත නැවත දක්නේ හුස්ම පිටකරන්නෙමියි හික්මෙයිද, මහණෙනි, එකල ධර්මයන්හි ධර්මය අනුව බලන්නාවූ, කෙළෙස් තවන වීර්‍ය්‍යය ඇත්තාවූ, නුවණ ඇත්තාවූ, සිහිය ඇත්තාවූ, මහණ තෙම පඤ්චස්කන්ධ ලොකයෙහි ලෝභය සහ දොසය දුරු කොට වාසය කරයි හෙතෙම ලෝභ දොසයන්ගේ යම් ඒ පහකිරීමක්

වේද, එය නුවණින් දැක මනාකොට මධ්‍යස්ථවේ. මහණෙනි, ඒ නිසා මේ ශාසනයෙහි මහණතෙම එකල්හි ධර්මයන්හි ධර්මය අනුව දකිමින් කෙළෙස් තවන වීර්‍ය්‍යී ඇත්තේ, නුවණ ඇත්තේ, සිහිය ඇත්තේ, පඤ්චස්කන්ධයෙහි ලෝභය සහ දොසය දුරුකොට වාසය කරයි. මහණෙනි, මෙසේ වඩන ලද්දාවූ, මෙසේ පුරුදු කරන ලද්දාවූ ආනාපානසතිය වානාහි සතර සතිපට්ඨානයන් සම්පූර්ණ කරයි.

12. "මහණෙනි, කෙසේ වඩන ලද්දාවූ කෙසේ පුරුදු කරන ලද්දාවූ සතර සතිපට්ඨානයෝ සප්ත බොජ්ඣංගයන් සම්පූර්ණ කෙරෙත්ද? මහණෙනි, යම් කලක මහණ තෙම කයෙහි කය අනුව බලමින් කෙළෙස් තවන වීර්‍ය්‍යී ඇත්තේ, නුවණ ඇත්තේ, සිහිය ඇත්තේ, පඤ්චස්කන්ධ ලොකයෙහි ලෝභය සහ දොසය දුරුකොට වාසයකරයි. එකල ඔහුට මුළා නොවූ එළඹසිටි සිහිය ඇත්තේවෙයි. මහණෙනි; යම් කලක මහණහට මුළා නොවූ එළඹසිටි සිහිය ඇත්තේ වෙයිද; එකල්හි භික්ෂුව විසින් සතිසම්බොඣංගය පටන්ගන්නා ලද්දේවේ. එකල්හි භික්ෂුතෙමේ සතිසම්බොජ්ඣංගය වඩයි. එකල්හි භික්ෂුවගේ සතිසම්බොජ්ඣංගය සම්පූර්ණ වීමට පැමිණෙයි. එසේ සිහියෙන් යුක්තව කරන්නාවූ හෙතෙම ඒ ධර්මය නුවණින් සොයයි. පරීක්ෂාකරයි. විමසීමට පැමිණෙයි.

13. "මහණෙනි, යම් කලක එසේ සිහියෙන් වාසය කරන්නාවූ මහණතෙම ඒ ධර්මය නුවණින් සොයයිද, පරීක්ෂා කරයිද; විමසීමට පැමිණෙයිද, එකල්හි භික්ෂුව විසින් ධම්ම විචය සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේවේ. එකල මහණතෙම ධම්ම විචය සම්බොජ්ඣංගය වඩයි. එකල මහණහුගේ ධම්ම විචය සම්බොජ්ඣංගය භාවනාව සම්පූර්ණබවට පැමිණෙයි ඒ ධර්මය නුවණින් සොයන්නාවූ පරීක්ෂාකරන්නාවූ විමසීමට පැමිණෙන්නාවූ ඒ මහණහුගේ නොපසුබස්නා වීර්‍ය්‍යය පටන්ගන්නා ලද්දේවෙයි. එකල භික්ෂුව විසින් වීරිය සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේවෙයි. එකල්හි මහණ තෙම විරිය සම්බොජ්ඣංගය වඩයි. එකල මහණහුගේ

විරිය සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. පටන්ගන්නාලද විරිය ඇත්තාහට ආමිස රහිතවූ ප්‍රීතිය උපදවයි.

14 "මහණෙනි; යම් කලක පටන්ගන්නා ලද වීර්‍ය්‍ය ඇත්තාවූ මහණහට නිරාමිසප්‍රීතිය උපදියිද, එකල්හි මහණහු විසින් පීති සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල මහණතෙම පීතිසම්බොජ්ඣංගය වඩයි. එකල මහණහුගේ ප්‍රීතිසම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. ප්‍රීති සිත ඇත්තාහුගේ කයද සංසිඳෙයි. සිතද සංසිඳෙයි.

15. "මහණෙනි, යම් කලක ප්‍රීති සිත් ඇති මහණහුගේ කය සංසිඳෙයිද, සිත සංසිඳෙයිද, එකල්හි මහණහු විසින් පස්සද්ධි සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල මහණතෙම පස්සද්ධිබොජ්ඣංගය වඩයි. එකල මහණහුගේ පස්සද්ධිබොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. සංසිඳුනු කයහුගේ සිත එකඟවේ.

16. "මහණෙනි, යම් කලක සංසිඳුනුවූ කය ඇති මහණහුගේ සිත එකඟ වේද, එකල මහණහු විසින් සමාධි සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල මහණ තෙම සමාධි සම්බොජකඩංගය වඩයි. එකල මහණහුගේ සමාධි සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. එසේ එකඟවූ සිත් ඇත්තාවූ ඒ මහණතෙම එකල මධ්‍යස්ථ වූයේ වෙයි.

17. "මහණෙනි, යම් කලක එසේ එකඟවූ සිත් ඇති මහණතෙම මනාකොට මධ්‍යස්ථ වූයේ වේද, එකල මහණහු විසින් උපෙක්ඛා සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල මහණතෙම උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයි. එකල මහණහුගේ උපෙක්ඛා සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. මහණෙනි, යම් කලක මහණතෙම වේදනාවෙන්හි වේදනාවන් අනුව බලමින් කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ, නුවණ ඇත්තේ, සිහිය ඇත්තේ, පඤ්චස්කන්ධ ලෝකයෙහි ලොභය සහ දොසය දුරුකොට වාසය කරයි, එකල්හි ඒ මහණහට නොමුළා සිහිය එළඹසිටියේ වෙයි. මහණෙනි, යම් කලක

මහණහට නොමුළා සිහිය එළඹසිටියේ වේද, එකල මහණහු විසින් සතිසම්බොජ්ඣංගය පටන් ගන්නා ලද්දේ වෙයි. එකල මහණතෙම සතිසම්බොජ්ඣංගය වඩයි. එකල මහණහුගේ සතිසම්බොජ්ඣ භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි, එසේ සිහියෙන් වාසය කරන්නාවූ ඒ මහණතෙම ඒ ධර්මය නුවණින් සොයයි. පරීක්ෂා කරයි. විමසීමට පැමිණෙයි.

18 "මහණෙනි, එසේ සිහිය ඇතිව වාසය කරන්නාවූ මහණතෙම එකල්හි ඒ ධර්මය සොයයිද, පරීක්ෂා කරයිද විමසීමට පැමිණෙයිද, එකල්හි මහණහු විසින් ධම්මවිචය සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල්හි ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ ධම්මවිචය සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. ඒ ධර්මය නුවණින් සොයන්නාවූ; පරීක්ෂා කරන්නාවූ, විමසීමට පැමිණෙන්නාවූ, ඒ මහණහු විසින් නොපසුබස්නා වීර්‍ය්‍යය පටන්ගන්නා ලද්දේ වෙයි. මහණෙනි, යම් කලක ඒ ධර්මය නුවණින් සොයන්නාවූ, පරීක්ෂා කරන්නාවූ, විමසීමට පැමිණෙන්නාවූ, මහණහු විසින් නොපසුබස්නා, වීර්‍ය්‍යය පටන්ගන්නා ලද්දේ වේද, එකල්හි මහණහු විසින් විරිය සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල්හි මහණතෙම විරිය සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ විරිය සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. පටන්ගන්නාලද වීර්‍ය්‍යය ඇත්තාහට නිරාමිස ප්‍රීතිය උපදී. මහණෙනි, යම් කලක පටන්ගන්නාලද වීර්‍ය්‍යය ඇත්තාවූ මහණහට නිරාමිස ප්‍රීතිය උපදීද, එකල්හි මහණහු විසින් පීතිසම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල්හි මහණතෙම පීතිසම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ පීතිසම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. පිනාගිය හිතැත්තහුගේ කයද සංසිඳෙයි. සිතද සංසිඳෙයි.

19. "මහණෙනි, එකල මහණහු විසින් පස්සද්ධි සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල මහණ තෙම පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ පස්සද්ධි

සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. සංසිඳුනු කය ඇත්තහුගේ සිත එකඟවේ. මහණෙනි, යම් කලක සංසිඳුනු කය ඇති මහණහුගේ සිත එකඟවේද, එකල්හි මහණහු විසින් සමාධි සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල මහණතෙම සමාධි සම්බොජ්ඣංගය වඩයි. එකල මහණහුගේ සමාධි සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. ඔහු විසින් එසේ එකඟවූ සිත මනාකොට මද්ධ්‍යස්ථ කරන ලද්දේ වෙයි. එකල මහණහු විසින් උපෙක්ඛා සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල්හි මහණතෙම උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ උපෙක්ඛා සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි.

**20.** "මහණෙනි, යම් කලක මහණතෙම සිතෙහි සිත අනුව බලමින් කෙලෙස් තවන වීය්‍ර්‍ය ඇත්තේ, නුවණ ඇත්තේ, සිහිය ඇත්තේ, ලෝභය සහ දොසය දුරුකොට වාසය කරයි, එකල්හි ඒ මහණහට නොමුළා සිහිය එළඹ සිටියේ වෙයි. මහණෙනි, යම් කලක මහණහට නොමුළා සිහිය එළඹසිටියේ වේද, එකල මහණහු විසින් සති සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල මහණ තෙම සති සම්බොජ්ඣංගය වඩයි. එකල මහණහුගේ සති සම්බොජ්ඣ භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. එසේ සිහියෙන් වාසය කරන්නාවූ ඒ මහණතෙම ඒ ධර්මය නුවණින් සොයයි පරීක්ෂා කරයි. විමසීමට පැමිණෙයි.

**21.** "මහණෙනි, එසේ සිහිය ඇතිව වාසය කරන්නාවූ මහණතෙම එකල්හි ඒ ධර්මය සොයයිද, පරීක්ෂා කරයිද, විමසීමට පැමිණෙයිද, එකල්හි මහණහු විසින් ධම්මවිචය සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල්හි ධම්ම විචය සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ ධම්මවිචය සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. ඒ ධර්මය නුවණින් සොයන්නාවූ, පරීක්ෂා කරන්නාවූ, විමසීමට පැමිණෙන්නාවූ ඒ මහණහු විසින් නොපසුබස්නා වීය්‍ර්‍යය පටන්ගන්නා ලද්දේ වෙයි. මහණෙනි, යම් කලක ඒ ධර්මය නුවණින් සොයන්නාවූ, පරීක්ෂා කරන්නාවූ, විමසීමට

පැමිණෙන්නාවූ, මහණහු විසින් නොපසුබස්නා වීය්‍ය්‍යීය පටන්ගන්නා ලද්දේ වේද, එකල්හි මහණහු විසින් විරිය සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල්හි මහණ තෙම විරිය සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ විරිය සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. පටන්ගන්නාලද වීය්‍ය්‍යීය ඇත්තාහට නිරාමිස ප්‍රීතිය උපදී. මහණෙනි, යම් කලක පටන්ගන්නාලද වීය්‍ය්‍යීය ඇත්තාවූ මහණහට නිරාමිස ප්‍රීතිය උපදීද, එකල්හි මහණහු විසින් පීති සම්බොජඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල්හි මහණතෙම පීති සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ පීති සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. පිනාගිය හිතැත්තහුගේ කයද සංසිඳෙයි. සිතද සංසිඳෙයි.

22. "මහණෙනි, එකල මහණහු විසින් පස්සද්ධි සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල මහණ තෙම පස්සද්ධි සම්බොජඣංගය වඩයි. එකල්හි මහණහුගේ පස්සද්ධි සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. සංසිඳුනු කය ඇත්තහුගේ සිත එකඟවේ, මහණෙනි, යම් කලක සංසිඳුනු කය ඇති මහණහුගේ සිත එකඟවේද, එකල්හි මහණහු විසින් සමාධි සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල මහණතෙම සමාධි සම්බොජ්ඣංගය වඩයි. එකල මහණහුගේ සමාධි සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. ඔහු විසින් එසේ එකඟවූ සිත මනාකොට මධ්‍යස්ථ කරන ලද්දේ වෙයි. එකල මහණහු විසින් උපෙක්ඛා සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල්හි මහණතෙම උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ උපෙක්ඛා සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි.

23 "ධර්මයන්හි ධර්මය අනුව බලන්නේ, කෙලෙස් තවන වීය්‍ය්‍යී ඇත්තේ, නුවණ ඇත්තේ, සිහිය ඇත්තේ, පඤ්චස්කන්ධ ලොකයෙහි ලොභය සහ දොසය දුරුකොට වාසය කරයිද, එකල්හි ඒ මහණහට නොමුළාවූ සිහිය එළඹ සිටියේ වෙයි. මහණෙනි, යම් කලක මහණහට නොමුලා සිහිය එළඹසිටියේ

වේද, එකල මහණහු විසින් සතිසම්බොජ්ඣංගය පටන් ගන්නා ලද්දේ වෙයි. එකල මහණතෙම සතිසම්බොජ්ඣංගය වඩයි. එකල මහණහුගේ සති සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. එසේ සිහියෙන් යුක්තව වාසය කරන්නාවූ ඒ මහණතෙම ධර්මය නුවණින් සොයයි. පරීක්ෂා කරයි. විමසීමට පැමිණෙයි.

24. "මහණෙනි, එසේ සිහිය ඇතිව වාසය කරන්නාවූ මහණතෙම එකල්හි ඒ ධර්මය සොයයිද, පරීක්ෂා කරයිද, විමසීමට පැමිණෙයිද, එකල්හි මහණහු විසින් ධම්මවිචය සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල්හි මහණ තෙම ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ ධම්මවිචය සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. ඒ ධර්මය නුවණින් සොයන්නාවූ පරීක්ෂා කරන්නාවූ, විමසීමට පැමිණෙන්නාවූ, ඒ මහණහු විසින් නොපසුබස්නා වීර්‍ය්‍යය පටන්ගන්නා ලද්දේ වෙයි. මහණෙනි, යම් කලක ඒ වීර්‍ය්‍යය නුවණින් සොයන්නාවූ, පරීක්ෂා කරන්නාවූ, විමසීමට පැමිණෙන්නාවූ, මහණහුගේ නොපසුබස්නා වීර්‍ය්‍යය පටන් ගන්නා ලද්දේ වේද, එකල්හි මහණහු විසින් විරිය සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල්හි මහණතෙම විරිය සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ විරිය සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. පටන් ගන්නාලද වීර්‍ය්‍යය ඇත්තාහට කාමාශාවන්ගෙන් වෙන්වූ (නිරාමිස) ප්‍රීතිය උපදී.

25. "මහණෙනි, යම් කලක පටන්ගන්නාලද වීර්‍ය්‍යය ඇත්තාවූ මහණහට කාමාශාවන්ගෙන් වෙන්වූ (නිරාමිස) ප්‍රීතිය උපදීද, එකල්හි මහණහු විසින් පීති සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල්හි මහණතෙම පීති සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ පීතිසම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. පිනාගිය හිතැත්තාගේ කයද සංසිඳෙයි. සිතද සංසිඳෙයි. මහණෙනි, එකල මහණහු විසින් පස්සද්ධි සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි.

එකල මහණතෙම පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ පස්සද්ධි සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. සංසිඳුනු කය ඇත්තහුගේ සිත එකඟවේ. මහණෙනි, යම් කලක සංසිඳුනු කය ඇති මහණහුගේ සිත එකඟවේද, එකල මහණහු විසින් සමාධි සම්බොජ්ඣංගය පටන්ගන්නා ලද්දේ වෙයි. එකල මහණතෙම සමාධි සම්බොජ්ඣංගය වඩයි. එකල මහණහුගේ සමාධි සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි ඒ මහණතෙම එසේ එකඟවූ සිත මනාකොට මධ්‍යස්ථ කරන්නේ වෙයි. එකල මහණහු විසින් උපෙක්ඛා සම්බොජ්ඣංගය පටන් ගන්නා ලද්දේ වෙයි. එකල්හි මහණතෙම උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයි. එකල්හි මහණහුගේ උපෙක්ඛා සම්බොජ්ඣංග භාවනාව සම්පූර්ණ බවට පැමිණෙයි. මහණෙනි, මෙසේ වඩනලද, මෙසේ පුරුදු කරනලද සතර සතිපට්ඨානයෝ සප්තබොජ්ඣංගයන් සම්පූර්ණ කරත්.

**26.** "මහණෙනි, කෙසේ වඩනලද කෙසේ පුරුදු කරන ලද සප්තබොජ්ඣංගයෝ විජ්ජා විමුත්තිය සම්පූර්ණ කෙරෙත්ද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය, ඇසුරු කළාවූ, නොඇලීම ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවණට නැමුවාවූ සති සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළාවූ, නොඇලීම ඇසුරු කළාවූ, නැතිවීම ඇසුරු කළාවූ, නිවණට පැමුණුනාවූ, ධම්මවිචය සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළාවූ, නොඇලීම ඇසුරු කළාවූ, නැතිවීම ඇසුරු කළාවූ, නිවනට පැමුණුනාවූ, විරිය සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළාවූ, නොඇලීම ඇසුරු කළාවූ, නැතිවීම ඇසුරු කළාවූ, නිවනට පැමුණුනාවූ පීති සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම විවේකය ඇසුරු කළාවූ, නොඇලීම ඇසුරු කළාවූ, නැතිවීම ඇසුරු කළාවූ, නිවනට පැමුණුනාවූ පස්සද්ධි සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මේ ශාසනයෙහි

මහණතෙම විවේකය ඇසුරු කළාවූ, නොඇලීම ඇසුරු කළාවූ, නැතිවීම ඇසුරු කළාවූ, නිවනට පැමුණුනාවූ, සමාධි සම්බොජ්ඣංගය වඩයිද, මහණෙනි, මේ ශාසනයෙහි මහණ තෙම විවේකය ඇසුරු කළාවූ, නොඇලීම ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවනට නැමුවාවූ, උපෙක්ඛා සම්බොජ්ඣංගය වඩයි. මහණෙනි, මෙසේ වඩනලද, මෙසේ පුරුදු කරනලද, සප්තබොජ්ඣංගයෝ විජ්ජා විමුත්තිය (අර්හත්ඵලය හා නිර්වාණය) සම්පූර්ණ කරති. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ.

**අටවන ආනාපාන සති සූත්‍රය නිමි. (2-8)**

---

## 19. කායගතා සති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වෙසෙති. එකල්හි සවස් වරුවෙහි පිණ්ඩපාතයේ යාමෙන් වැළකුණාවූ, උපස්ථාන සාලාවෙහි (ආගන්තුකාදීන්ට සත්කාරකරන ශාලාවෙහි) රැස්වී වැඩහුන්නාවූ, බොහෝ භික්ෂූන් අතරෙහි මේ අතුරු කථාව ඇතිවීය. '(දතයුතු සියල්ල) දන්නාවූ (දැක්ක යුතු සියල්ල) දක්නාවූ, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් යම් වඩන ලද්දාවූ, පුරුදු කරන ලද්දාවූ, කායගතා සතියක් මහත්ඵල ඇත්තීයයි මහානිසංස ඇත්තී යයි වදාරණ ලද්දේද, ඇවැත්නි, එය ආශ්චර්‍ය්‍යයකි, ඇවැත්නි, එය පුදුමයකි, යනුයි. ඒ භික්ෂූන්ගේ, මේ අතුරු කථාව අවසාන නොවූයේ වේද, එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි ඵලසමාපත්තියෙන් නැගී සිටියේ (ආගන්තුකාදීන්ට) සත්කාර කරන ශාලාව යම් තැනෙක්හිද, එතැන්හි වැඩිසේක. වැඩ පනවන ලද ආසනයෙහි වැඩහුන් සේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථාකළහ.

"මහණෙනි, දැන් වනාහි කිනම් කථාවකින් යුක්තව හුන්නාහුද? ඔබලාගේ කිනම් අතුරු කථාවක් අවසන් නොවූයේ දැයි" ඇසූහ.

2. "ස්වාමීනි, මෙහි සවස් වරුවෙහි පිණ්ඩපාතයේ යෑමෙන් වැලකුනාවූ, උපස්ථාන ශාලාවෙහි රැස්වී හුන්නාවූ; අප අතරෙහි මේ අතුරු කථාව ඇතිවිය. 'දන්නාවූ දක්නාවූ, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ විසින් වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ, යම් මේ කායගතා සතියත් මහත්ඵල ඇත්තීයයි මහානිසංස ඇත්තීයයි වදාරණ ලද්දේ වේද, ඇවැත්නි, එය ආශ්චර්‍ය්‍යය, ඇවැත්නි, එය පුදුමය' ස්වාමීනි, අපේ මේ කථාව අවසන් නොවූයේ විය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ වැඩිසේකැයි" කීහ.

3. "මහණෙනි, කෙසේ වඩන ලද, කෙසේ පුරුදු කරන ලද කායගතා සතිය මහත්ඵල වන්නීද, මහානිසංස වන්නීද, මහණෙනි, මේ ශාසනයෙහි වනයකට ගියාවූ හෝ රුක් මුලකට ගියාවූ හෝ, හිස් ගෙයකට ගියාවූ හෝ මහණතෙම අරමිණියා ගොතා, ඇඟ කෙළින් තබා සිහිය ඉදිරිපත්කොට තබාගෙන හිඳින්නේය. හෙතෙම සිහියෙන්ම හුස්ම ගනී. සිහියෙන්ම හුස්ම පිටකරයි. දිගට හුස්ම ගන්නේ හෝ දිගට හුස්ම ගන්නෙමියි දැනගනියි. දිගට හුස්ම පිටකරන්නේ හෝ දිගට හුස්ම පිටකරන්නෙමියි දැනගනියි. කොටින් හුස්ම ගන්නේ හෝ කොටින් හුස්ම ගන්නෙමියි දැනගනියි. කොටින් හුස්ම පිටකරන්නේ හෝ කොටින් හුස්ම පිටකරන්නෙමියි දැනගනියි. සියලු ආශ්වාස ප්‍රශ්වාස කය දැනගනිමින් හුස්ම ගන්නෙමියි හික්මෙයි. සියලු ආශ්වාස ප්‍රශ්වාස කය දැනගනිමින් හුස්ම පිටකරන්නෙමියි හික්මෙයි. ආශ්වාස ප්‍රශ්වාසයන් තුනිකරමින් හුස්ම ගන්නෙමියි හික්මෙයි. ආශ්වාස ප්‍රශ්වාසයන් තුනීකරමින් හුස්ම පිටකරන්නෙමියි හික්මෙයි. මෙසේ අප්‍රමාදව කෙළෙස් තවන වීරිය ඇතිව නිවන කරා යවනලද සිතැතිව වාසය කරන්නාවූ, ඒ මහණහුගේ යම් ඒ පඤ්චකාමය ඇසුරුකොට පවත්නාවූ ඊට දුවන කල්පනාවෝ වෙත්ද, ඔව්හු දුරුවෙත්.

ඔවුන්ගේ දුරුවීමෙන් තමා තුළම සිත රඳා සිටියි, නැවතී හිඳියි, එකඟවෙයි. මනාකොට පිහිටයි. මහණෙනි, මෙසේද මහණතෙම කායගතා සතිය වඩයි.

4. 'මහණෙනි, නැවතද මහණතෙම යන්නේ හෝ යන්නෙමියි දැනගනියි. සිටියේ හෝ සිටින්නෙමියි දැන ගනියි. හුන්නේ හෝ හුන්නෙමියි දැනගනියි. සැතපෙන්නේ හෝ සැතපෙන්නෙමියි දැන ගනියි. යම් මේ ලෙසකින් වනාහි ඒ මහණහුගේ කය පිහිටුවන ලද්දේ වෙයිද, ඒ ඒ ලෙසින් ඔහු දැනගනියි. මෙසේ නොපමාවූ, කෙළෙස් තවන වීරිය ඇත්තාවූ, නිවන කරා යවනලද සිතැතිව වාසය කරන්නාවූ, ඒ මහණහුගේ යම් ඒ පඤ්චකාමය ඇසුරුකොට පවත්නාවූ ඊට දුවන කල්පනාවෝ (වෙත්ද) ඔව්හු දුරුවෙත්. ඔවුන්ගේ තමා තුළම සිත රඳා සිටියි, නැවතී හිඳියි. එකඟ වෙයි. මනාකොට පිහිටයි. මහණෙනි, මෙසේද මහණතෙම කායගතා සතිය වඩයි.

5. "මහණෙනි, නැවතද මහණතෙම ඉදිරියට යාමෙහිද ආපසු ඊමෙහිද නුවණින් මනාකොට දැන කරන්නේ වෙයි. ඉදිරිය බැලීමෙහිද අවට බැලීමෙහිද නුවණින් මනාකොට දැන කරන්නේ වෙයි. අත් පා හැකිලීමෙහිද දිගු කිරීමෙහිද නුවණින් මනාකොට දැන කරන්නේ වෙයි. පාත්‍රා, දෙපට සිවුරු, තනිපොට සිවුරු, දැරීමෙහිද නුවණින් මනාකොට දැන කරන්නේ වෙයි. කෑමෙහිද, බීමෙහිද, අවුලුපත් කෑමෙහිද, රස විඳීමෙහිද, නුවණින් මනාකොට දැන කරන්නේ වෙයි. මළමුත්‍ර පහකිරීමෙහිද නුවණින් මනා කොට දැන කරන්නේ වෙයි. යාමෙහිද, සිටීමෙහිද, හිඳීමෙහිද, නිදීමෙහිද, නිදිමැරීමෙහිද, කථාකිරීමෙහිද, කථා නොකිරීමෙහිද නුවණින් මනාකොට දැනකරන්නේ වෙයි. මෙසේ නොපමාව කෙළෙස් තවන වීරිය ඇතිව, නිවන කරා යවන ලද සිතැතිව වාසය කරන්නාවූ, ඒ මහණහුගේ යම් පඤ්ච කාමය ඇසුරුකොට පවත්නාවූ, ඊට දුවන කල්පනාවෝ වෙත්ද, ඔව්හු දුරුවෙත්. ඔවුන්ගේ දුරු වීමෙන් තමා තුළම සිත රඳා සිටියි, නැවතී හිඳියි, එකඟවෙයි, මනාකොට පිහිටයි. මහණෙනි, මෙසේද කායගතා සතිය වඩයි.

6. "මහණෙනි, නැවතද මහණතෙම පාද තලයෙන් උඩ හිසකේ මුදුනෙන් යට හම කෙළවරකොට ඇති නානාවිධ අසූචියෙන් පිරුණාවූ, මේ කයම නුවණින් බලයි. මේ කයෙහි කෙස්, ලොම්, නිය, දත්, සම, නහර, ඇට, ඇටමිදුලු, වකුගඩුව, හෘදයමාංශය, අක්මාව, දළබුව, බඩදිව, පෙණහල්ල, බඩවැල, අතුණුබහණ, නොදිරූ ආහාරමළ, හිස්මොළය, පිත, සෙම, සැරව, ලේ, ඩහදිය, මේදතෙල, කඳුලු, වුරුණු තෙල, කෙළ, සොටු, සඳමිදුලු සහ මූත්‍ර ඇත්තේය, (කියායි.) මහණෙනි, නොයෙක් ආකාරවූ ධාන්‍යයන්ගෙන් මුව දක්වා පුරවන ලද, උඩ යට දෙපැත්තෙන් කටවල් දෙකක් ඇති මල්ලක් වේද? කිනම් ධාන්‍යවලින් (පුරවන ලද මල්ලක්) ද යත්:- හැල්වී, මාවී, මුං, මෑ, තල සහ සහල් (යන මේ ධාන්‍ය වලිනි.) ඇස් ඇති පුරුෂයෙක් ඒ ධාන්‍ය පිරූ මල්ල ලිහා, මේ හැල්ය, මේ මාවීය, මේ මුංය, මේ මෑය, මේ තලය, මේ සහල් යයි යම්සේ මෙනෙහි කරන්නේ වේද, එපරිද්දෙන්ම මහණෙනි, (මහණතෙම) පාද තලයෙන් උඩ හිසකේ මුදුනෙන් යට හම කෙළවරකොට ඇති, නානාවිධ අසුචියෙන් පිරුණාවූ, මේ කයම නුවණින් බලයි. මේ කයෙහි කෙස්, ලොම්, නිය, දත්, සම, නහර, ඇට, ඇටමිදුලු, වකුගඩුව, හෘදය මාංශය, අක්මාව, දළබුව, බඩදිව, පෙණහල්ල, බඩවැල, අතුණු බහණ, නොදිරූ ආහාර, මළ, හිස්මොළය, පිත, සෙම, සැරව, ලේ, ඩහදිය, මේදතෙල, කඳුලු, වුරුණු තෙල්, කෙළ, සොටු, සඳමිදුලු, සහ මූත්‍ර ඇත්තේය. (කියයි.) මෙසේ නොපමාව කෙළෙස් තවන වීරිය ඇතිව, නිවන කරා යවන ලද සිතැතිව වාසය කරන්නාවූ ඒ මහණහුගේ යම් ඒ පඤ්චකාමය ඇසුරුකොට පවත්නාවූ ඊට දුවන කල්පනාවෝ වෙත්ද, ඔව්හු දුරුවෙත්. ඔවුන්ගේ දුරුවීමෙන් තමා තුළම සිත රඳාසිටියි. නැවතී හිඳියි. එකඟවෙයි. මනාකොට පිහිටයි. මහණෙනි, මෙසේද මහණතෙම කායගතා සතිය වඩයි.

7. "මහණෙනි, නැවතද මහණතෙම යම් ඉදිරියව්වකින් සිටියාවූ යම් ආකාරයකින් තබනලද්දාවූ, මේ කයම ධාතු වශයෙන් නුවණින් සිහි කරන්නේය. (කෙසේද) මේ කයෙහි

“පඨවි” ධාතුව ඇත්තේය. ආපෝධාතුව ඇත්තේය. තේජෝ ධාතුව ඇත්තේය. වායෝ ධාතුව ඇත්තේය. (කියයි.) මහණෙනි, යම්සේ දක්ෂවූ ගවයන් මරන්නෙක් හෝ ගවයන් මරවන්නෙකගේ අතවැසියෙක් හෝ ගවයකු මරා සතර මං සන්ධියක කොටස් වශයෙන් වෙන් වෙන්කොට බෙදා උන්නේ වේද, මහණෙනි, එමෙන් මහණතෙම යම් ඉරියව්වකින් සිටියාවූ යම් ආකාරයකින් තබන ලද්දාවූ මේ කයම ධාතුවශයෙන් සිහි කරන්නේය. මේ කයෙහි පඨවි ධාතුව ඇත්තේය. ආපෝ ධාතුව ඇත්තේය. තේජෝ ධාතුව ඇත්තේය. වායෝ ධාතුව ඇත්තේය. (කියායි) මෙසේ නොපමාව කෙළෙස් තවන වීරිය ඇතිව, නිවන කරා යවන ලද සිතැතිව වාසය කරන්නාවූ ඒ මහණහුගේ යම් ඒ පඤ්චකාමය ඇසුරුකොට පවත්නාවූ ඊට දුවන කල්පනාවෝ වෙත්ද, ඔව්හු දුරුවෙත්. ඔවුන්ගේ දුරුවීමෙන් තමා තුළම සිත රඳා සිටියි. නැවතී හිඳියි. එකඟවෙයි. මනාකොට පිහිටයි. මහණෙනි, මෙසේද මහණතෙම කායගතා සතිය වඩයි.

8. “මහණෙනි, නැවතද මහණතෙම මැරී එක් දවසක් ගියාවූ හෝ දෙදවසක් ගියාවූ හෝ තුන් දවසක් ගියාවූ හෝ ඉදිමුණාවූ, නිල්වූ, සැරව වැගිරෙන්නාවූ අමුසොහොනෙහි දමනලද ශරීරයක් යම්සේ දක්නේද, ඒ මහණතෙම මේ කය ඒ හා සමාන කර බලන්නේය. (කෙසේද) මේ කයද, මෙබඳු ස්වභාව ඇත්තේය. මේ ස්වභාවයට පැමිණෙන්නේය. මේ ස්වභාව නොයික්ම සිටියේය. (කියයි) මෙසේ නොපමාව කෙළෙස් තවන වීරිය ඇතිව, නිවන කරා යවන ලද සිතැතිව වාසය කරන්නාවූ, ඒ මහණහුගේ යම් ඒ පඤ්චකාමය ඇසුරු කළාවූ ඊට දුවන කල්පනාවෝ වෙත්ද, ඔව්හු දුරුවෙත්. ඔවුන්ගේ දුරුවීමෙන් තමා තුළම සිත රැඳී සිටියි, නැවතී හිඳියි, එකඟවෙයි, මොනවට පිහිටයි. මහණෙනි, මෙසේ මහණතෙම කායගතා සතිය වඩයි.

9. “මහණෙනි, නැවතද මහණතෙම කපුටන් විසින් කනු ලබන්නාවූ හෝ උකුස්සන් විසින් කනු ලබන්නාවූ හෝ ගිජුලිහිණියන් විසින් කනු ලබන්නාවූ හෝ බල්ලන් විසින් කනු

ලබන්නාවූ හෝ හිවලුන් විසින් කනු ලබන්නාවූ හෝ නොයෙක ප්‍රාණීන් විසින් කනු ලබන්නාවූ හෝ ශරීරයක් යම්සේ දක්නේද, ඒ මහණතෙම මේ මළ කයම තම කය හා සමාන කරන්නේය. (කෙසේද) මෙ කයද, මෙබඳු ස්වභාවය ඇත්තේය. මෙබඳු ස්වභාවයට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාව නොයික්ම සිටින්නේය. (කියායි) මෙසේ නොපමාව කෙළෙස් තවන වීරිය ඇතිව නිවන කරා යවන ලද සිතැතිව වාසය කරන්නාවූ ඒ මහණහුගේ යම් පඤ්චකාමය ඇසුරු කළාවූ ඊට දුවන කල්පනාවෝ (වෙත්ද) ඔව්හු දුරුවෙත්. ඔවුන්ගේ දුරුවීමෙන් තමා තුළම සිත රැඳී සිටි. නැවතී හිඳියි. එකඟ වෙයි. මනාකොට පිහිටයි. මහණෙනි, මෙසේද මහණතෙම කායගතා සතිය වඩයි.

10. "මහණෙනි, නැවතද මහණතෙම ලේ මස් සහිතවූ නහර වැලින් බැඳුනාවූ ඇටසැකිල්ලක්ද මස් නැති ලේ තැවරුණු, නහරින් බැඳුනු ඇටසැකිල්ලක්ද මස් ලේ පහවූ නහර වලින් බැඳුනු, ඇටසැකිල්ලක්ද (නහර) සම්බන්ධයෙන් වෙන්වූ, එක දිසාවක පා ඇටද එක් දිසාවක කෙණ්ඩා ඇටද එක් දිසාවක කලවා ඇටද, එක් දිසාවක කටි ඇටද, එක් දිසාවක පිටකටුද, එක් දිසාවක හිස් කබලද ඇත්තාවූ, දිශා අනු දිසාවන්හි විසුරුණු ඇට කැබලි ඇත්තාවූ, අමු සොහොනෙහි දමන ලද ශරීරයක් යම්සේ දක්නේද, ඒ මහණතෙම මේ මළ කයම තම කය හා සමාන කරන්නේය. (කෙසේද) මේ කයද මෙබඳු ස්වභාව ඇත්තේය. මෙබඳු ස්වභාවයට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාව නොයික්ම සිටියේය. (කියායි). මෙසේ නොපමාව කෙළෙස් තවන වීරිය ඇතිව නිවන කරා යවන ලද සිතැතිව, වාසය කරන්නාවූ ඒ මහණහුගේ යම් ඒ පඤ්චකාමය ඇසුරු කළාවූ ඊට දුවන කල්පනාවෝ (වෙත්ද) ඔව්හු දුරුවෙත්. ඔවුන්ගේ දුරුවීමෙන් තමා තුළම සිත රැඳී සිටියි. නැවතී හිඳියි. එකඟ වෙයි. මනාකොට පිහිටයි. මහණෙනි, මෙසේද මහණතෙම කායගතා සතිය වඩයි.

11. "මහණෙනි, නැවතද මහණතෙම හක්ගෙඩියක් පාටට සමාන ස්වභාව ඇති සුදුවූ ඇට ඇත්තාවූ, ඇට ගොඩක්වූ,

අවුරුදු ගණනක් ඉකුත්වූ, පිළිකුල්වූ, සුණුවූ ඇට ඇත්තාවූද අමුසොහොනෙහි දමන ලද ශරීරයක් යම්සේ දක්නේද ඒ මහණතෙම මේ මළ කයම තම කය හා සමාන කරන්නේය. (කෙසේද) මේ කයද මෙබඳු ස්වභාව ඇත්තේය මෙබඳු ස්වභාවයට පැමිණෙන්නේය. මෙබඳු ස්වභාව නොයික්ම සිටියේය. (කියායි.) මෙසේ නොපමාව, කෙළෙස් තවන වීර්‍ය්‍යී ඇතිව, නිවන කරා යවන ලද සිතැතිව, වාසය කරන්නාවූ ඒ මහණහුගේ යම් ඒ පඤ්චකාමය ඇසුරුකළාවූ ඊට දුවන කල්පනාවෝ (වෙත්ද) ඔව්හු දුරුවෙත්. ඔවුන්ගේ දුරුවීමෙන් තමා තුළම සිත රැඳී සිටියි. නැවතී හිඳියි. එකඟ වෙයි. මොනවට පිහිටයි. මහණෙනි, මෙසේද මහණතෙම කායගතා සිහිය වඩයි.

12. "මහණෙනි, නැවතද මහණතෙම කාමයන්ගෙන් වෙන්ව, අකුශල ධර්මයන්ගෙන් වෙන්ව, විතර්ක සහිත විචාර සහිත, විවේකයෙන් උපන් ප්‍රීතිය සහ සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි. ඒ මහණතෙම මේ කයම විවේකයෙන් උපන් ප්‍රීතියෙන් සහ සැපයෙන් තෙමයි, වගුරුවයි, පුරවයි, පතුරුවයි, ඔහුගේ මුළු කයේ විවේකයෙන් උපන් ප්‍රීතිය සහ සැපය නොපැතුරුණු කිසි තැනෙක් නොවන්නේය. මහණෙනි, යම්සේ දක්ෂ නහවන්නෙක් හෝ නහවන්නෙකුගේ අතවැසියෙක් හෝ ලෝහ තලියෙහි නහන කල්ක බහා දියෙන් තෙම තෙමා මිශ්‍රකොට හනන්නේය. ඔහුගේ ඒ නාන සුණු පිඩ තෙතමනේ යුක්තවූයේ, තෙතමනෙන් බැඳුණේ ඇතුළත සහ පිටත පැතිරෙන ලද්දේ වේද, නොවැගිරෙන්නේ වේද, එසේම මහණෙනි, මහණතෙම මේ කයම විවේකයෙන් උපන් ප්‍රීතියෙන් සහ සැපයෙන් තෙත් කරයි, වගුරුවයි, පුරවයි, පතුරුවයි, ඔහුගේ මුළු කයේ විවේකයෙන් උපන් ප්‍රීතිය සහ සැපය නොපැතුරුණු කිසි තැනක් නොවන්නේය. මෙසේ නොපමාව කෙළෙස් තවන වීර්‍ය්‍යී ඇතිව නිවන කරා යවන ලද සිතැතිව වාසය කරන්නාවූ ඒ මහණහුගේ යම් ඒ පඤ්චකාමය ඇසුරු කළාවූ ඊට දුවන කල්පනාවෝ ආශාවෝ වෙත්ද, ඒවා දුරු වෙත්. ඔවුන්ගේ දුරුවීමෙන් තමා තුළම සිත බැඳී සිටියි. නැවතී හිඳියි. එකඟ

වෙයි. මනාව පිහිටයි, මහණෙනි, මෙසේද මහණතෙම කායගතා සිහිය වඩයි.

13. 'මහණෙනි, නැවතද මහණතෙම විතර්ක විචාරයන්ගේ සංසිඳුවීමෙන් ඇතුළත පහදන්නාවූ, සිත එකඟ කරන්නාවූ විතර්ක රහිත, විචාර රහිත, සමාධියෙන් උපන් ප්‍රීතිය සහ සැපය ඇති දෙවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයි. ඒ මහණතෙම මේ කයම සමාධියෙන් උපන් ප්‍රීතියෙන් හා සැපයෙන් තෙමයි, වගුරුවයි, පුරවයි, පතුරුවයි. ඔහුගේ මුළු කයෙහි සමාධියෙන් උපන් ප්‍රීතිය සහ සැපය නොපැතුරුණු කිසි තැනක් නොවන්නේය.

මහණෙනි, ජලයෙන් පිරුණාවූ විලක්වේද, ඒ නැගෙන හිර දිසාවෙන්ද, ජලමාර්ගයක් නොවන්නේද, බස්නාහිර දිසාවෙන්ද, ජලමාර්ගයක් නොවන්නේද, උතුරු දිසාවෙන්ද ජල මාර්ගයක් නොවන්නේද, දකුණු දිසාවෙන්ද ජලමාර්ගයක් නොවන්නේද, වැස්සද කලින් කල මනාකොට වසින්නේවේද, ඉක්බිති ඒ දිය විලෙන්ම සිහිල් ජල ධාරාවන් මතුවී ඒ දිය විලම සිහිල් ජලයෙන් තෙමෙන්නේද, වගුරුවන්නේද, පුර වන්නේද, පතුරුවන්නේද, ඒ සියලු දිය විලේ සිහිල් දියෙන් නොපැතුරුණු කිසිතැනක් නැත්තේද මහණෙනි, එපරිද්දෙන් මහණ තෙම මේ කය සමාධියෙන් හටගත් ප්‍රීතියෙන් හා සැපයෙන් තෙමයි වගුරුවයි, පුරවයි, පතුරුවයි. ඔහුගේ මුළු කයෙහි ප්‍රීතියෙන් හා සැපයෙන් නොපැතුරුණාවූ කිසි තැනක් නැත්තේය. මෙසේ නොපමාව කෙළෙස් තවන වීර්‍ය්‍ය ඇතිව, නිවනකරා යවනලද සිතැතිව වාසය කරන්නාවූ ඒ මහණහුගේ යම් ඒ පඤ්චකාමය ඇසුරු කළාවූ ඊට දුවන කල්පනාවෝ වෙත්ද, ඒවා ඔව්හු දුරුවෙත්. ඔවුන්ගේ දුරු වීමෙන් තමා තුළම සිත රැඳී සිටියි. නැවතී හිඳියි, එකඟ වෙයි, මනාකොට පිහිටයි. මහණෙනි, මෙසේද මහණ තෙම කය අනුව ගියාවූ සිහිය වඩයි.

14. "මහණෙනි, නැවතද මහණතෙම ප්‍රීතියද ඉක්මවීමෙන් උපෙක්ෂාවෙන් යුක්තව සිහියෙන් යුක්තව නුවණින් යුක්තව

වාසය කරයි. කයින් සැපයද විඳියි. ආය්‍ර්‍යයෝ යම් ධ්‍යානයක් උපෙක්ෂාවෙන් යුක්ත වූයේ සිහියෙන් යුක්තවූයේ සැපවිහරණ ඇත්තේයයි කියත්ද, ඒ තුන්වන ධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම මේ කයම ප්‍රීතිය රහිත සැපයෙන් තෙමෙන්නේය. වගුරුවන්නේය, පුරවන්නේය. පතුරු වන්නේය. ඔහුගේ මුළු කයේ ප්‍රීතිය රහිත සැපය නොපැතුරුණු කිසිම තැනක් නොවෙයි. මහණෙනි, යම්සේ මානෙල් විලක හෝ පියුම් විලක හෝ හෙළ පියුම් විලක හෝ දියෙහි හටගත්, දියෙහි වැඩුණු, දිය අනුව උස්වූ ඇතුලෙහි ගිලී වැඩෙන්නාවූ, කිසියම් උපුල් හෝ පියුම් හෝ හෙළ පියුම් හෝ (වෙත්ද) ඒවා අගසිට මුල දක්වාත් මුල සිට අග දක්වාත් සිසිල් දියෙන් තෙමුණාහූ, වැගුරුණාහු, පිරුණාහු, පැතුරුනාහු වෙත්ද. ඒ සියලු උපුල්වල හෝ පියුම්වල හෝ හෙළ පියුම් වල හෝ සිසිල් දිය නොපැතුරුණු කිසිම තැනක් නොවන්නේය. මහණෙනි, එසේම මහණතෙම මෙම කයම ප්‍රීතිය රහිත සැපයෙන් තෙමයි, වගුරයි, පුරවයි, පතුරුවයි. ඔහුගේ මුළු කයේ ප්‍රීතිය රහිත සැපය නොපැතුරුණු කිසි තැනක් නොවෙයි. මෙසේ නොපමාව කෙලෙස් තවන වීය්‍ර්‍ය ඇතිව, නිවණ කරා යවනලද සිතැතිව වාසය කරන්නාවූ ඒ මහණහුගේ යම් ඒ පඤ්චකාමය ඇසුරු කළාවූ ඊට දුවන්නාවූ කල්පනාවෝ වෙත්ද, ඒවා දුරු වෙත්. ඔවුන්ගේ දුරු වීමෙන් තමා තුළම සිත රැඳී සිටියි, නැවතී හිඳියි, එකඟ වෙයි, මනා කොට පිහිටයි. මහණෙනි, මෙසේද මහණ තෙම කය අනුව ගියාවූ සිහිය වඩයි.

15. "මහණෙනි, නැවත මහණ තෙම සැපයද නැති කිරීමෙන් දුකද නැති කිරීමෙන් පළමුවම සොම්නස් දොම්නස් දෙක අතුරුදන් කිරීමෙන් දුක් නැත්තාවූද, සැප නැත්තාවූද උපෙක්ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසුදු බැව් ඇති, සතර වන ධ්‍යානයට පැමිණ වාසය කරයි. ඒ මහණතෙම මේ කයම පිරිසිදුවූ, හාත්පස පිරිසිදුවූ සිතින් පතුරුවා හුන්නේ වෙයි. ඔහුගේ මුළු කයේ පිරිසිදුවූ හාත්පස පිරිසිදුවූ, සිත නොපැතුරුණු කිසි තැනක් නොවන්නේය. මහණෙනි, යම් පුරුෂයෙක් සුදු රෙද්දකින්

හිස සහිතව පොරොවාගෙන හුන්නේ වේද, ඔහුගේ මුළු කයේ සුදුරෙද්ද නොපැතුරුණු කිසි තැනක් නැත්තේ වේද, මහණෙනි, එසේම මෙතෙම මෙම කයම පිරිසිදුවූ, හාත්පස පිරිසිදුවූ, සිතින් පතුරුවා හුන්ගේ මුළු කයේ පිරිසිදුවූ, හාත්පස පිරිසිදුවූ, සිත නොපැතුරුණු කිසිතැනක් නොවෙයි. මෙසේ නොපමාව, කෙළෙස් තවන වීරිය ඇතිව නිවන කරා යවන ලද සිතැතිව, වාසය කරන්නාවූ, ඒ මහණහුගේ යම් ඒ පඤ්චකාමය ඇසුරු කළාවූ ඊට දුවන කල්පනාවෝ වෙත්ද, ඔව්හු දුරුවෙත්. ඔවුන්ගේ දුරුවීමෙන් තමා තුළම සිත රැඳී සිටියි නැවතී හිඳියි, එකඟ වෙයි. මනා කොට පිහිටයි. මහණෙනි, මෙසේද මහණතෙම කය අනුව ගියාවූ සිහිය වඩයි.

මහණෙනි, යම් කිසිවෙකු විසින් කය අනුව ගියාවූ සිහිය වඩන ලද්දීද, පුරුදු කරන ලද්දීද, ඔහුගේ ඒ කය අනුව ගියාවූ සිහියට අෂ්ට විද්‍යාවට අයත් කුශල ධර්මයෝ නම් ඒ සියල්ල ඇතුලත් වෙත්.

**16.** "මහණෙනි, යම්සේ යමෙකු විසින් ආපො කසිණ සමාපත්තියෙන් හෝ දිබ්බචක්ඛුඥානයෙන් හෝ මහා සමුද්‍රය ස්පර්ශ කරන ලද්දේද, ඒ මහා සමුද්‍රය කරා ගමන් කරන්නාවූ යම්කිසි කුඩා ගංගාවෝ වෙත් නම් ඒ සියල්ල ඒ මහමූදට ඇතුලත් වෙත්. මහණෙනි, එසේම කිසිවෙකු විසින් කායගතා සතිය වඩන ලද්දීද, පුරුදු කරන ලද්දීද, ඔහුගේ ඒ කායගතා සතියෙහි යම් ඒ අෂ්ට විද්‍යාවට අයත් කුශල ධර්මයෝ වෙත් නම් ඒ සියල්ල ඇතුළත් වන්නාහුය. මහණෙනි, යම්කිසිවෙකු විසින් කායගතා සතිය නොවඩන ලද්දීද, පුරුදු නොකරන ලද්දීද, මාරතෙමේ ඔහුගේ සිදුරු දකියි. මාරතෙමේ ඔහුගේ කෙළෙස් ඉපදීම පිණිස පවත්නා හේතු දකියි. මහණෙනි, යම්සේ පුරුෂයෙක් බරවූ ගලක් තෙත්වූ මැටි ගොඩක හෙලන්නේය මහණෙනි, කුමක් සිතව්ද ඒ බර ගල ඇතුල් වීමට තෙත මැටි ගොඩේසිදුරක් ලබන්නේද?" "එසේය. ස්වාමීනි, ලබන්නේය." "මහණෙනි, එසේම යමෙකු විසින් කායගතා සතිය නොවඩන ලද්දීද, පුරුදු නොකරන ලද්දීද, මාර තෙමේ ඔහුකරා ඇතුළත්

වීමට ඔහුගේ සිදුරු ලබන්නේය. මාර තෙමේ ඔහුගේ කෙලස් ඉපදීමට හේතු දකින්නේය.

17. "මහණෙනි, වේලුනු දරලීයක් වෙයි. ඉක්බිති පුරුෂයෙක් ගිනිගානා දණ්ඩක් ගෙන 'ගිනි උපදවන්නෙමි, උණුසුම පහළ කරන්නෙමි'යි එන්නේය. මහණෙනි, කුමක් සිතව්ද, ඒ පුරුෂයා මේ වියලි දරලීය ගිනිගානා දණ්ඩ ගෙන පිරිමදින්නේය. ගිනි නිපදවන්නේද? උණුසුම පහළ කරන්නේද?" "එසේය. ස්වාමීනි," "මහණෙනි, එසේම යමෙකු විසින් කායගතා සතිය නොවඩන ලද්දේද, පුරුදු නොකරන ලද්දීද, මාරතෙම ඔහුගේ සිදුරු දකියි, මාරතෙම ඔහුගේ කෙළෙස් ඉපදීමට හේතු දකියි.

"මහණෙනි, යම්සේ දිය නැත්තාවූ, හිස්වූ, ආධාරයෙහි (දරණුයෙහි) තබන ලද්දාවූ, මහදිය සැලියක් (වේද) ඉක්බිති පුරුෂයෙක් දිය බරක් ගෙන එන්නේය. මහණෙනි, කුමක් සිතව්ද, ඒ පුරුෂයා ජලය වත්කිරීමට ලබන්නේද?" 'එසේය ස්වාමීනි," මහණෙනි, යම්කිසිවෙකු විසින් කායගතා සතිය නොවඩන ලද්දීද, පුරුදු කරන ලද්දීද, මාරතෙමේ ඔහුගේ සිදුරු දකියි. ඔහුගේ කෙළෙස් ඉපදීමට හේතු දකියි.

18. "මහණෙනි, යම්කිසිවෙකු විසින් කායගතා සතිය වඩන ලද්දීද, පුරුදු කරන ලද්දීද, මාරතෙම ඔහුගේ සිදුරු නොදකියි. මාර තෙම ඔහුගේ කෙළෙස් ඉපදීමට හේතු නොදකියි. මහණෙනි, යම්සේ පුරුෂයෙක් සැහැල්ලුවූ නූල් ගුලියක් සියල්ල අරටුවෙන් නිමවූ, දොර පලුවක් උඩ දමන්නේද මහණෙනි, කුමක් සිතව්ද, ඒ සැහැල්ලුවූ නූල් ගුලිය සියල්ල අරටුවෙන් නිමවූ දොරපලුයෙහි සිදුරක් ලබන්නේද?" "ස්වාමීනි, එය නොවේමය." "මහණෙනි, එසේම යම්කිසිවෙකු විසින් කායගතා සතිය වඩනලද්දීද, පුරුදු කරන ලද්දීද, ඒ මහණෙකුගේ සිදුරක් මාරයා නොලබයි. ඔහුගේ කෙලෙස් ඉපදීමට හේතුවක් මාරයා නොදකියි.

19. "මහණෙනි, යම්සේ තෙත්වූ අමු ලීයක් ඇත්තේය. ඉක්බිති පුරුෂයෙක් ගිනිගානා දණ්ඩක් ගෙන ගිනි

නිපදවන්නෙමි. උණුසුම් පහළ කරන්නෙමියි එන්නේය. මහණෙනි, කුමක් සිතම්ද, ඒ පුරුෂයා මේ තෙත්වූ අමුලීය ගිනි ගානා දණ්ඩ ගෙන පිරිමැදීමෙන් ගිනි නිපද වන්නේද? උණුසුම පහළ කරන්නේද?" "ස්වාමීනි, එය නොවේ." "මහණෙනි, මෙසේම යම් කිසිවෙකු විසින් කායගතා සතිය වඩන ලද්දීද, ඒ මහණහුගේ සිදුරක් මාරයා නොලබයි. ඔහුගේ කෙලෙස් ඉපදීමට හේතුවක් මාරයා නොදකින්නේය.

"මහණෙනි, යම්සේ දිය පිරුණාවූ, ගැට්ට ලඟට පිරුණාවූ කපුටකු විසින් බිය හැකි තරමට පිරුණාවූ ආධාරයෙහි (දරණුයෙහි) තබන ලද්දාවූ මහ දිය සැළියක් (වේද) ඉක්බිති පුරුෂයෙක් දිය බරක් ගෙන එන්නේය. මහණෙනි, කුමක් සිතව්ද, ඒ පුරුෂයා දිය වත් කිරීමට ලබන්නේද?" "ස්වාමීනි, එය නොවේ" "මහණෙනි, මෙසේම යම් කිසිවෙකු විසින් කායගතා සතිය වඩන ලද්දීද, ඔහුගේ සිදුරක් මාරයා නොලබයි. ඔහුගේ කෙලෙස් ඉපදීමට හේතුවක් මාරයා නොලබයි.

**20.** "මහණෙනි, යම් කිසිවෙකු විසින් කායගතා සතිය වඩනා ලද්දීද, බහුල කරන ලද්දීද, හෙතෙම නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කළයුතු යම් යම් ධර්මයක් වේද, එය නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස සිත නමයි. ඒ ඒ තන්හි කරුණු ඇති ඇති කල්හි ප්‍රත්‍යක්ෂ කිරීමට පැමිණෙයි. ඇති ඇති කල්හි ප්‍රත්‍යක්ෂ කිරීමට පැමිණෙයි. මහණෙනි යම්සේ පිරුණාවූ, දිය ගැට්ට ළඟට ඇත්තාවූ, කපුටකු විසින් බිය හැකි තරම් පිරුණාවූ, ආධාරයෙහි (දරුණුයෙහි තබන ලද්දාවූ, දිය සැළියක් (වේද) ඒ මේ සැළිය බලවත් පුරුෂයෙක් යම් යම් තැනකින් තමන්ගේ දිය එන්නේද?"

"එසේය, ස්වාමීනි,"

"මහණෙනි, එසේම යම් කිසිවෙකු විසින් කායගතා සතිය වඩන ලද්දීද, පුරුදු කරන ලද්දීද, හෙතෙම නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කළයුතු යම් යම් ධර්මයක් වේද (එය) නුවණින් දැන

ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස සිත නමයි. ඒ ඒ තන්හි කරුණු ඇති ඇති කල්හි ප්‍රත්‍යක්ෂ බවට පැමිණෙයි.

"මහණෙනි, යම් බැම්මක් බඳින ලද, පිරුණාවූ ගැට්ට ලඟට දිය පිරුණාවූ කපුටකු විසින් බිය හැකි තරමට පිරුණාවූ, සමභූමියෙහිවූ, හතරැස් පොකුණක් වේද, බලවත් පුරුෂයෙක් ඒ මේ පොකුණේ යම් යම් පැත්තකින් බැම්ම බිඳින්නේ දිය එන්නේද?"

"එසේය, ස්වාමීනි,"

"මහණෙනි, එසේය යම් කිසිවෙකු විසින් කායගතා සතිය වඩන ලද්දීද, බහුල කරන ලද්දීද, හෙතෙම නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කළයුතු යම් යම් ධර්මයක් වේද, (එය) නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස සිත නමයි. ඒ ඒ තන්හි කරුණු ඇති ඇති කල්හි ප්‍රත්‍යක්ෂ බවට පැමිණෙයි.

"මහණෙනි, යම්සේ සතර මංසන්ධියක යහපත් තැනක කෙවිට පහත හෙළන ලද අශ්වයන් යෙදූ උතුම් රියක් (වේද) ඒ රථයට දක්ෂවූ අසුන් හික්මවන්නාවූ රියැදුරෙක් නැඟී වමතින් සම්පටිය ගෙන දකුණතින් කෙවිට ගෙන යම් කිසි කැමති තැනකට පදවන්නේද, මහණෙනි, එසේම යම් කිසිවෙකු විසින් කායගතා සතිය වඩන ලද්දීද, බහුල කරන ලද්දීද, හෙතෙම නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කළයුතු යම් යම් ධර්මයක් වේද (එය) නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස සිත නමයි. ඒ ඒ තන්හිදී කරුණු ඇති ඇති කල්හි ප්‍රත්‍යක්ෂ බවට පැමිණෙයි.

21. "මහණෙනි, සේවනය කරන ලද්දාවූ වඩන ලද්දාවූ පුරුදු කරන ලද්දාවූ, යානාවක් මෙන් කරන ලද්දාවූ, පිහිටක් බවට පමුණුවන ලද්දාවූ, නැවත නැවත කරන ලද්දාවූ, පුරුදුකරන ලද්දාවූ, මනාකොට වීයඝීකරන ලද්දාවූ, කායගතා සතියෙහි මේ ආනිසංස දසයක් කැමතිවිය යුත්තාහ. කවර දසයක්ද යත්? (කුශල ධර්මයන්හි) නොඇලීමද, (කම් සැපයෙහි) ඇල්මද මැඩපැවත්වන්නේ වෙයි. ඒ (කුශල ධර්මයන්හි)

නොඇලීම නොඉවසයි. උපන් (කුශල ධර්මයන්හි) නො ඇල්ම මැඩ වාසයකරයි. භයානක අරමුණු මැඩපවත්වන්නේ වෙයි. ඒ භයානක අරමුණු නොඉවසයි. උපන් භයානක අරමුණු මැඩ වාසය කරයි. ශීතයාගේද, උෂ්ණයාගේද, සාගින්නේද, පිපාසයාගේද, මැස්සන්ගේද, මදුරුවන්ගේද, වාතයේද, අවු රශ්මියේද, සර්පයන්ගේද ස්පර්ශය ඉවසන්නේ වෙයි. නොමනාසේ කියන ලද, නපුරුකොට කියනලද, වචන ඉවසන්නේ වෙයි. උපන්නාවූ, දුක්වූ, තියුණුවූ, කුරිරුවූ, කටුකවූ, නොමිහිරිවූ, අමනාපවූ, දිවි නසන්නාවූ, ශරීර වේදනාව ඉවසන්නෙක් වෙයි.

"පිරිසිදු සිතෙහි හටගත්තාවූ, මේ ආත්මයෙහි සැප වාසය ඇත්තාවූ, (රූපාවචර) ධ්‍යාන සතර කැමතිසේ ලබන්නේ, පහසුවෙන් ලබන්නේ, අමාරුවක් නැතිව ලබන්නේ, නොයෙක් අයුරින් යුත් ඍධිවිධි අනුභව කරයි. (විදියි.) (කෙසේද) එකෙක්ව බොහෝසේ වෙයි. බොහෝසේව එකෙක් වෙයි. ප්‍රකට බවටද, මුවහ බවටද අහසෙහි මෙන් බිත්තිය විනිවිද ගෙනද, පවුර විනිවිද ගෙනද, පර්වතය විනිවිද ගෙනද, නොහැපෙමින් යයි. දියෙහි මෙන් පොළොවෙහිද කිමිදීම් මතුවීම් කරයි. පොළොවෙහි මෙන් දියෙහි, දිය නොබිඳ ගමන් කරයි. පක්ෂියෙකු මෙන් අහසෙහිද, අරමිණියා ගොතා හිඳගෙන යයි. මෙසේ මහත් ඍද්ධි ඇති, මෙසේ මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙන අතින් අතගායි, පිරිමදියි. බඹලොවතෙක් ශරීරයෙන් වසඟ බව පවත්වයි. පිරිසිදුවූ, මිනිස් කණ ඉක්ම පැවැත්තාවූ දිව කණින් දිව්‍යමයවූද, මනුෂ්‍යමයවූද, දුරවූද, ළඟවූද දෙවැදෑරුම් ශබ්දයන් අසයි.

"අන්‍ය සත්වයින්ගේ, අන්‍ය පුද්ගලයින්ගේ, සිත තම සිතින් පිරිසිඳ දනියි. (කෙසේද) රාග සහිත සිත රාග සහිත සිතයයි දනියි. රාග රහිත සිත රාග රහිත සිත යයි දනියි. ද්වෙෂ සහිත සිත ද්වෙෂ සහිත සිතයයි දනියි. ද්වෙෂ රහිත සිත ද්වෙෂ රහිත සිතයයි දනියි. මෝහ සහිත සිත මෝහ සහිත සිතයයි දනියි.

මෝහ රහිත සිත මෝහ රහිත සිත යයි දනියි. හැකුලුනු සිත හැකුලුනු සිතයයි දනියි. මහත් බවට ගිය සිත මහත් බවට ගිය සිතයයි දනියි. මහත් බවට නොගිය සිත මහත් බවට නොගිය සිතයයි දනියි. (ලෞකික සිත්අතුරෙන්) උසස්වූ සිත (ලෞකික සිත් අතුරෙන්) උසස්වූ සිතයයි දැන ගනියි. (ලෞකික සිත් අතුරෙන්) උසස් නොවූ සිත (ලෞකික සිත් අතුරෙන්) උසස් නොවූ සිතයයි දැන ගනියි. සමාධි ගතවූ සිත සමාධිගතවූ සිත යයි දැනගනියි. සමාධිගත නොවූ සිත සමාධිගත නොවූ සිතයයි දැනගනියි. (කෙළෙසුන් කෙරෙන්) මිදුනු සිත (කෙළෙසුන් කෙරෙන්) මිදුනු සිතයයි දැනගනියි. (කෙළෙසුන් කෙරෙන්) නොමිදුනු සිත (කෙළෙසුන් කෙරෙන්) නොමිදුනු සිතයයි දැන ගනියි. නන්වැදෑරුම්වූ පෙර විසූ තැන් සිහිකරයි.

22. "ඒ කවරේදයත්:- එක් ජාතියක්ද, ජාති දෙකක්ද ජාති තුනක්ද, ජාති හතරක්ද, ජාති පහක්ද, ජාති දහයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් ජාතිලක්ෂ ගණන්ද, අසවල් තැන වූයෙම් මෙබඳු නම් ඇත්තේ, මෙබඳු ගොත්‍ර ඇත්තේ, මෙබඳු වර්ණ ඇත්තේ, මෙබඳු ආහාර ඇත්තේ, මෙබඳු සැප දුක් විඳින්නේ, මෙබඳු ආයුෂ කෙළවරකොට ඇත්තේවීමි. මම එයින් චුත වූයෙමි. අසවල් තැන උපනිමි. එහිද මෙබඳු නම් ඇත්තේවීමි. මෙබඳු ගොත්‍ර ඇත්තේ වීමි. මෙබඳු වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තේ වීමි. මෙබඳු සැප දුක් වින්දේ වීමි. මෙබඳු ආයුෂ කෙළවරකොට ඇත්තේ වීමි. ඒ මම එයින් චුත වූයෙම් මෙහි උපන්නෙමි. මෙසේ ආකාර සහිතව, දැක්වීම් සහිතව නානා ප්‍රකාරවූ, පෙර විසූ ආත්ම සිහිකරයි. පිරිසිදුවූ මිනිසත් බව ඉක්මෙව්වාවූ, දිව ඇසින් බලන්නේ මැරෙන්නාවූද, උපදින්නාවූද, හීනවූද, උසස්වූද, යහපත් වර්ණ ඇත්තාවූද, දුර්වර්ණවූද, යහපත් ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද, කම්වූ පරිදි මිය පරලොව යන්නාවූද, සත්වයන් දැනගනියි.

23. "කෙළෙස් (ආශ්‍රව) නැති කිරීමෙන් ආශ්‍රව රහිතවූ සමාධියෙන් මිදීමත් ප්‍රඥාවෙන් මිදීමත්, මේ ජාතියේදීම විශෙෂ නුවණින් දැන, ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරයි. මහණෙනි, සේවනය කරන ලද්දාවූ, වඩන ලද්දාවූ, බොහෝ කරන ලද්දාවූ, යානාවක් මෙන් කරන ලද්දාවූ, පිහිටක් කරන ලද්දාවූ, නැවත නැවත කරන ලද්දාවූ, පුරුදු කරන ලද්දාවූ, වීයඹ් කරන ලද්දාවූ, කායගතා සතියෙහි මේ ආනිසංසයෝ දස දෙන කැමතිවිය යුත්තාහ." මෙය භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. සතුටු සිතැති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටුවූහ.

**නවවන කායගතා සූත්‍රයයි. (2-9)**

---

## 20. සංඛාරුප්පත්ති සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ, අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසය කරති. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි, කියා භික්ෂූන්ට ආමන්ත්‍රණය කළහ. ඒ භික්ෂූහු 'භාග්‍යවතුන් වහන්සේ යැයි' උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. "මහණෙනි, (මම) තොපට සංස්කාරයන්ගේ ඇතිවීම දේශනා කරන්නෙමි. එය අසව්, මනාකොට මෙනෙහි කරව්. කියන්නෙමි." "එසේය ස්වාමීනියි" ඒ භික්ෂූහු උත්තර දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

2. "මහණෙනි, මේ ශාසනයෙහි මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැත භාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්ත වූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඔහුට මම මේ ශරීරය බිඳීමෙන් මරණින් පසු ක්ෂත්‍රිය මහාසාරයන් හා එක්වීමට (උප්පත්ති

වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳයයි සිත් වන්නේය. හෙතෙම ඒ සිත තබයිද ඒ සිත පිහිටුවයිද ඒ සිත වඩයිද, මෙසේ වඩන ලද මෙසේ පුරුදු කරනලද ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ එහි ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය මේ ප්‍රතිපදාව එහි ඉපදීම පිණිස පවතී.

3. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැත භාවයෙන් යුක්තවූයේ වෙයිද ත්‍යාගයෙන් යුක්ත වූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඒ මහණහට ශරීරය බිඳීමෙන් මරණින් පසු මම බ්‍රාහ්මණ මහාසාරයන් එක්වීමට පැමිණෙන්නෙම් නම් ඉතා හොඳයයි සිතන්නේද ඒ සිත තබන්නේද ඒ සිත පිහිටුවයිද ඒ සිත වඩයිද මෙසේ වඩනලද මෙසේ පුරුදු කරන ලද ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ එහි ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය මේ ප්‍රතිපදාව එහි ඉපදීම පිණිස පවතී.

4. "මහණෙනි, නැවතද මහණතෙමේ ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ සීලයෙන් යුක්තවූයේ ත්‍යාගයෙන් යුක්තවූයේ බහුශ්‍රැතයෙන් යුක්තවූයේ ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඔහුට මම ශරීරය බිඳීමෙන් මරණින් මතු ගෘහපති මහාසාර කුලයෙහි උපදින්නෙම් නම් හොඳයයි සිත්වන්නේය. හෙතෙම ඒ සිත තබයිද ඒ සිත පිහිටුවයිද ඒ සිත වඩයිද මෙසේ වඩන ලද මෙසේ පුරුදු කරන ලද ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ ගෘහපති මහාසාර කුලයෙහි ඉපදීම පිණිස ඒ මහණහට හේතුවෙත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, ඒ ගෘහපති මහාසාර කුලයෙහි ඉපදීම පිණිස පවතියි.

5. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ ශීලයෙන් යුක්තවූයේ බහුශ්‍රැත භාවයෙන් යුක්තවූයේ ත්‍යාගයෙන් යුක්තවූයේ ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඔහු විසින් චාතුර්මහාරාජික දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය, වර්ණ ඇත්තෝය, බොහෝ සැප ඇත්තෝයයි අසන ලද්දේ වෙයි. ඔහුට මම කය බිඳීමෙන් මරණින් පසු චාතුර්මහාරාජික දෙවියන්

හා එක්වීමට පැමිණෙම් නම්, ඉතා හොඳයයි සිත් වන්නේය. හෙතෙම ඒ සිත තබයිද ඒ සිත පිහිටුවයිද ඒ සිත වඩයිද මෙසේ වඩනලද, මෙසේ පුරුදු කරනලද ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදී ධර්මයෝ ඒ දෙව්ලොව ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව ඒ දෙව්ලොව ඉපදීම පිණිස පවතියි.

**6.** "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ ශීලයෙන් යුක්තවූයේ බහුශ්‍රැත භාවයෙන් යුක්තවූයේ ත්‍යාගයෙන් යුක්තවූයේ ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද ඔහු විසින් තව්තිසාවෙහි දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය, වර්ණ ඇත්තෝය, බොහෝ සැප ඇත්තෝයයි අසන ලද්දේ වෙයි. ඔහුට මම කය බිඳීමෙන් මරණින් පසු මම තව්තිසා දෙවියන් හා එක්වීමට පැමිණෙම් නම් ඉතා හොඳයයි සිතෙන්නේය. හෙතෙම ඒ සිත තබයි නම් ඒ සිත පිහිටුවයි නම් ඒ සිත වඩයි නම් මෙසේ වඩන ලද මෙසේ පුරුදු කරන ලද, ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදී ධර්මයෝ ඒ දෙව්ලොව ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව ඒ දෙව්ලොව ඉපදීම පිණිස පවතියි.

**7.** "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැත භාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, යාමයෙහි දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය, වර්ණ ඇත්තෝය, බොහෝ සැප ඇත්තෝයයි අසනලද්දේ වෙයි. ඔහුට මම කය බිඳීමෙන් මරණින් පසු මම යාම දෙවියන් හා එක්වීමට පැමිණෙම් නම් ඉතා හොඳයයි සිතෙන්නේය. හෙතෙම ඒ සිත තබයි නම් ඒ සිත පිහිටුවයි නම් ඒ සිත වඩයි නම් මෙසේ වඩන ලද මෙසේ පුරුදුකරන ලද ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදී ධර්මයෝ ඒ දෙව් ලොව ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, ඒ දෙව්ලොව ඉපදීම පිණිස පවතියි.

**8.** "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැත භාවයෙන්

යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්ත වූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඔහු විසින් තුසිත දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය, වර්ණ ඇත්තෝය, බොහෝ සැප ඇත්තෝයයි අසනලද්දේ වෙයි. ඔහුට මම කය බිඳීමෙන් මරණින් පසු මම තුසිත දෙවියන් හා එක්වීමට පැමිණෙම් නම් ඉතා හොඳයයි සිතෙන්නේය. හෙතෙම ඒ සිත තබයි නම් ඒ සිත පිහිටුවයි නම් ඒ සිත වඩයි නම් මෙසේ වඩන ලද මෙසේ පුරුදු කරනලද ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදී ධර්මයෝ ඒ දෙව්ලොව ඉපදීම පිණිස පවතිත්. මහණෙනි මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, ඒ දෙව්ලොව ඉපදීම පිණිස පවතියි.

9. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැත භාවයෙන් යුක්ත වූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඔහු විසින් නිර්මාණරතියෙහි දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය, වර්ණ ඇත්තෝය, බොහෝ සැප ඇත්තෝයයි අසනලද්දේ වෙයි. ඔහුට මම කය බිඳීමෙන් මරණින් පසු මම නිර්මාණ රතියෙහි දෙවියන් හා එක්වීමට පැමිණෙයි නම් ඉතා හොඳයයි සිතෙන්නේය. හෙතෙම ඒ සිත තබයි නම් ඒ සිත පිහිටුවයි නම් ඒ සිත වඩයි නම් මෙසේ වඩනලද මෙසේ පුරුදු කරනලද ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ ඒ දෙව්ලොව ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, ඒ දෙව්ලොව ඉපදීම පිණිස පවතියි.

10. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැත භාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඔහු විසින් පරනිර්මිත වසවර්තියෙහි දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය, වර්ණ ඇත්තෝය, බොහෝ සැප ඇත්තෝයයි අසන ලද්දේ වෙයි. ඔහුට මම කය බිඳීමෙන් මරණින් පසු පරනිර්මිත වසවර්ති දෙවියන් හා එක්වීමට පැමිණෙම් නම් ඉතා හොඳයයි සිත්වන්නේය. හෙතෙම ඒ සිත තබයි නම් ඒ සිත පිහිටුවයි නම් ඒ සිත වඩයි නම් මෙසේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වඩනලද, මෙසේ පුරුදු කරනලද, ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදී ධර්මයෝ ඒ දෙව්ලොව ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව ඒ දෙව්ලොව ඉපදීම පිණිස පවතියි.

11. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේවෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැත භාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේවෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඔහු විසින් සහස්සනම් බ්‍රහ්මතෙම දීර්ඝායුෂ ඇත්තේය. වර්ණ ඇත්තේය. බොහෝ සැප ඇත්තේයයි අසන ලද්දේවෙයි. මහණෙනි, සහස්ස නම් බ්‍රහ්මතෙම දහසක් ලෝක ධාතුව ආලෝකය පතුරුවා ප්‍රකටකොට වාසය කරයි. එහි උපන් යම් සත්වයෝ වෙත්ද, ඔවුන්ද ආලෝකය පතුරුවා ප්‍රකට කොට වාසය කරයි. මහණෙනි, ඇස් ඇති පුරුෂයෙක් එක් අතැඹුලක් (අතට ගත් නෙල්ලි ගෙඩියක්) සිතා බලන්නේ යම්සේද, එසේම මහණෙනි, සහස්ස නම් බ්‍රහ්ම තෙම දහසක් ලෝක ධාතුව ආලොකය ප්‍රකට කොට වාසය කරයි. එහි උපන් යම් සත්වයෝ වෙත්ද, ඔවුන්ද ආලොකය පතුරුවා, ප්‍රකටකොට වාසය කරයි. ඒ මහණහට මම කය බිඳීමෙන් මරණින් පසු සහස්ස නම් බ්‍රහ්මයා හා එක්වීමට පැමිණෙම් නම් ඉතා හොඳයයි සිත් වන්නේය. හෙතෙම ඒ සිත තබයි, ඒ සිත පිහිටුවයි. ඒ සිත වඩයි. මෙසේ වඩන ලද මෙසේ පුරුදු කරන ලද ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදී ධර්මයෝ එහි ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය මේ ප්‍රතිපදාව එහි ඉපදීම පිණිස පවතියි.

12. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැත භාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඔහු විසින් ද්විසහස්ස නම් බ්‍රහ්මතෙම දීර්ඝායුෂ ඇත්තේය, වර්ණ ඇත්තේය, බොහෝ සැප ඇත්තේයයි ඒ මහණහු විසින් අසන ලද්දේ වෙයි. මහණෙනි, ද්විසහස්ස නම් බ්‍රහ්මතෙම දෙදාහක් ලෝක ධාතුව ආලෝකයෙන් පතුරුවා ප්‍රකටව දැන වාසය කරයි. මහණෙනි, ඇස් ඇති පුරුෂයෙක් (අතටගත් නෙල්ලිගෙඩි දෙකක්) සිතා බලන්නේ යම්සේද, එසේම

මහණෙනි, ද්විසහස්ස නම් බ්‍රහ්මතෙම දෙදහසක් ලෝකධාතුව ආලෝකයෙන් පතුරුවා ප්‍රකටව දැන වාසය කරයි. ඒ මහණහට මේ අදහස ඇතිවෙයි. කය බිඳීමෙන් මරණින් පසු, මම ද්විසහස්ස නම් බ්‍රහ්මයාගේ සමාගමයට (උප්පත්ති වශයෙන්) පැමිනෙම් නම් ඉතා හොඳය කියායි. හෙතෙම ඒ සිත තබයි, ඒ සිත පිහිටුවයි, ඒ සිත වඩයි, මෙසේ වඩන ලද මෙසේ පුරුදු කරන ලද, ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ එහි ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය මේ ප්‍රතිපදාව එහි ඉපදීම පිණිස පවතියි.

13. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැතයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද ඔහු විසින් තිසහස්ස බ්‍රහ්මතෙම දීර්ඝායුෂ ඇත්තේය, වර්ණ ඇත්තේය, බොහෝ සැප ඇත්තේයයි ඒ මහණහු විසින් අසන ලද්දේ වෙයි. මහණෙනි, තිසහස්ස නම් බ්‍රහ්මතෙම තුන්දාහක් ලෝකධාතුව ආලෝකයෙන් පතුරුවා, ප්‍රකටව දැන වාසය කරයි. මහණෙනි, ඇස් ඇති පුරුෂයෙක් (අතටගත් නෙල්ලිගෙඩි තුනක්) සිතා බලන්නේ යම්සේද, එසේම මහණෙනි, තිසහස්ස නම් බ්‍රහ්මතෙම තුන් දහසක් ලෝකධාතුව ආලෝකයෙන් පතුරුවා, ප්‍රකටකොට දැන වාසය කරයි. ඒ මහණහට මේ සිත ඇතිවෙයි. කය බිඳීමෙන් මරණින් පසු මම තිහස්ස නම් බ්‍රහ්මයාගේ සමාගමයට (උප්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි. හෙතෙම ඒ සිත තබයි, ඒ සිත පිහිටුවයි, ඒ සිත වඩයි. මෙසේ වඩනලද මෙසේ පුරුදු කරන ලද ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ එහි ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය. මේ ප්‍රතිපදාව එහි ඉපදීම පිණිස පවතියි.

14. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැත භාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන්

යුක්තවූයේ වෙයිද, ඔහු විසින් චතුසහස්ස නම් බ්‍රහ්මතෙම දීර්ඝායුෂ ඇත්තේය, වර්ණ ඇත්තේය, බොහෝ සැප ඇත්තේයයි අසනලද්දේ වෙයි. මහණෙනි, චතුසහස්ස නම් බ්‍රහ්මතෙම හාරදාහක් ලෝකධාතුව ආලෝකයෙන් පතුරුවා, ප්‍රකටකොට දැන වාසය කරයි. මහණෙනි, ඇස් ඇති පුරුෂයෙක් (අතට ගත් නෙල්ලිගෙඩි සතරක්) බලන්නේ යම්සේද, එසේම මහණෙනි, චතුසහස්ස නම් බ්‍රහ්මතෙම හාරදාහක් ලෝකධාතුව ආලෝකයෙන් පතුරුවා, ප්‍රකට කොට දැන වාසය කරයි. ඒ මහණහට මේ සිත ඇතිවෙයි. කය බිඳීමෙන් මරණින් පසු මම චතු සහස්ස නම් බ්‍රහ්මයාගේ සමාගමයට (උප්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි. හෙතෙම ඒ සිත තබයි, ඒ සිත පිහිටුවයි, ඒ සිත වඩයි, මෙසේ වඩන ලද මෙසේ පුරුදු කරන ලද ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදී ධර්මයෝ එහි ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, එහි ඉපදීම පිණිස පවතියි.

15. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැත භාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඔහු විසින් පඤ්චසහස්ස නම් බ්‍රහ්මතෙම පන්දාහක් ලෝකධාතුව ආලොකය පතුරුවා, ප්‍රකටකොට වාසය කරයි. එහි උපන් යම් සත්වයෝ වෙත්ද, ඔවුන්ගේ ආලොකය පතුරුවා ප්‍රකට කොට වාසය කරයි. මහණෙනි, යම්සේ ඇස් ඇති පුරුෂයෙක් (අතට ගත් නෙල්ලිගෙඩි පහක්) බලන්නේද, මහණෙනි, එමෙන් පඤ්චසහස්ස නම් බ්‍රහ්මතෙම පන්දාහක් ලෝක ධාතුව ආලොකයෙන් පතුරුවා ප්‍රකටකොට දැන වාසය කරයි. එහි උපන් යම් සත්වයෝ වෙත්ද, ඔවුන්ද ආලොකයෙන් පතුරුවා, ප්‍රකටව දැන වාසය කරයි. ඒ මහණහට මෙසේ අදහස් වෙයි. කය බිඳීමෙන් මරණින් පසු මම පඤ්චසහස්ස නම් බ්‍රහ්මයාගේ සමාගමයට (උත්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි. හෙතෙම ඒ සිත තබයිද, ඒ සිත පිහිටුවයිද, ඒ සිත වඩයිද, මෙසේ වඩනලද මෙසේ පුරුදු කරනලද මෙසේ

වඩනලද ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදී ධර්මයෝ එහි ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව එහි ඉපදීම පිණිස පවතියි.

16. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැත භාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද ඔහු විසින් දසසහස්ස නම් බ්‍රහ්මතෙම දීර්ඝායුෂ ඇත්තේය. වර්ණ ඇත්තේය, බොහෝ සැප ඇත්තේයයි අසනලද්දේ වෙයි. මහණෙනි, දසසහස්ස නම් බ්‍රහ්මතෙම දසසහසක් ලෝකධාතුව ආලොකයෙන් පතුරුවා, ප්‍රකටව දැන වාසය කරයි. එහි උපන් යම් සත්වයෝ වෙත්ද, ඔවුන්ද ආලොකය පතුරුවා, ප්‍රකටව දැන වාසය කරයි. මහණෙනි, යහපත් ජාති ඇත්තාවූ හුලස් අටක් ඇත්තාවූ, මනාසේ මට්ටම් කරන ලද්දාවූ, රතු කසාවන් කම්බිලියෙහි තබන ලද්දාවූ, වෛඩූර්‍ය්‍ය මැණිකක් යම්සේ බබලයිද, ආලෝකය පතුරුවයිද, දිලිසෙයිද, එසේම මහණෙනි, දසසහස්ස නම් බ්‍රහ්මතෙම දසසහසක් ලෝකධාතුව ආලොකයෙන් පතුරුවා, ප්‍රකටකොට දැන වාසය කරයි. එහි උපන් යම් සත්වයෝ වෙත් නම් ඔවුන්ද ආලොකයෙන් පතුරුවා ප්‍රකටව දැන වාසය කරයි. ඒ මහණහට මෙසේ අදහස් වෙයි. කය බිඳීමෙන් මරණින් පසු මම දසසහස්ස නම් බ්‍රහ්මයාගේ සමාගමයට (උත්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි. හෙතෙම ඒ සිත තබයි. ඒ සිත පිහිටුවයි. ඒ සිත වඩයි. මෙසේ වඩනලද මෙසේ පුරුදු කරනලද ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදී ධර්මයෝ එහි ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, එහි ඉපදීම පිණිස පවතියි.

17. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැත භාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද ඔහු විසින් සතසහස්ස නම් බ්‍රහ්මතෙම දීර්ඝායුෂ ඇත්තේය, වර්ණ ඇත්තේය, බොහෝ සැප ඇත්තේයයි

අසන ලද්දේ වෙයි. මහණෙනි, සතසහස්ස නම් බ්‍රහ්මතෙම ලක්ෂයක් ලෝකධාතුව ආලොකයෙන් පතුරුවා, ප්‍රකටව දැන වාසය කරයි. මහණෙනි, එහි උපන් යම් සත්වයෝ වෙත්ද, ඔවුන්ද ආලොකයෙන් පතුරුවා, ප්‍රකටව දැන වාසය කරයි. මහණෙනි, දක්ෂ ලෝකරුවකු විසින් කෝවෙහි (ලා) අතිදක්ෂ ලෙස ශුද්ධකරන ලද, රතු කසාවන් කම්බිලියෙහි බහා තබනලද, දඹරන් කාසියක් යම්සේ බබලයිද, ආලෝකය පතුරුවයිද, දිළිසෙයිද, එසේම මහණෙනි, සතසහස්ස නම් බ්‍රහ්මතෙම ලක්ෂයක් ලෝක ධාතුව ආලොකයෙන් පතුරුවා, ප්‍රකට කොට දැන වාසය කරයි, එහි උපන් යම් සත්වයෝ වෙත්ද, ඔවුන්ද ආලෝකයෙන් පතුරුවා, ප්‍රකට කොට දැන වාසය කරයි. ඒ මහණහට මේ අදහස ඇතිවෙයි. කය බිඳීමෙන් මරණින් පසු මම සතසහස්ස නම් බ්‍රහ්මයාගේ සමාගමයට (උත්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි. හෙතෙම ඒ සිත තබයිද, ඒ සිත පිහිටුවයිද, ඒ සිත වඩයිද, මෙසේ වඩනලද මෙසේ පුරුදු කරනලද ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ එහි ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව එහි ඉපදීම පිණිස පවතියි.

18. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැත භාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඔහු විසින් ආභ දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය. වර්ණ ඇත්තෝය. බොහෝ සැප ඇත්තෝයයි අසන ලද්දේ වෙයි. ඒ මහණහට මේ සිත ඇති වෙයි. කය බිඳීමෙන්, මරණින් පසු, මම ආභ දෙවියන්ගේ සමාගමයට (උත්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි. හෙතෙම ඒ සිත තබයි. ඒ සිත පිහිටුවයි. ඒ සිත වඩයි. මෙසේ වඩනලද, මෙසේ පුරුදු කරනලද, ඒ ප්‍රාර්ථනා සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතියි.

19. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැත භාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඒ භික්ෂුව විසින් පරිත්තාභ දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය, වර්ණ ඇත්තෝයැ බොහෝ සැප ඇත්තෝයයි අසනලද්දේ වෙයි. ඒ මහණහට මේ සිත ඇතිවෙයි. කය බිඳීමෙන්, මරණින් පසු, මම පරිත්තාභ දෙවියන්ගේ සමාගමයට (උත්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි, හෙතෙම ඒ සිත තබයි. ඒ සිත පිහිටුවයි. ඒ සිත වඩයි. මෙසේ වඩනලද, මෙසේ පුරුදු කරනලද ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතියි.

20. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැත භාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඒ භික්ෂුව විසින් අප්පමාණාභ දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය. වර්ණ ඇත්තෝය. බොහෝ සැප ඇත්තෝයයි අසන ලද්දේ වෙයි. ඒ මහණහට මේ සිත ඇතිවෙයි. කය බිඳීමෙන්, මරණින් පසු, මම අප්පමාණාභ දෙවියන්ගේ සමාගමයට (උත්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි. හෙතෙම ඒ සිත තබයි. ඒ සිත පිහිටුවයි. ඒ සිත වඩයි. මෙසේ වඩනලද, මෙසේ පුරුදු කරනලද, ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතියි.

21. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැත භාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඒ භික්ෂුව විසින් ආභස්සර දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය, වර්ණ ඇත්තෝය, බොහෝ සැප ඇත්තෝයයි අසන

ලද්දේ වෙයි. ඒ මහණහට මේ අදහස ඇති වෙයි. කය බිඳීමෙන්, මරණින් පසු, මම ආභස්සර දෙවියන්ගේ සමාගමයට (උත්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි. හෙතෙම ඒ සිත තබයි. ඒ සිත පිහිටුවයි. ඒ සිත වඩයි. මෙසේ වඩනලද, මෙසේ පුරුදු කරනලද, ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතියි.

22. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැත භාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයි ඒ භික්ෂුව විසින් පරිත්තසුභ දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය වර්ණ ඇත්තෝය, බොහෝ සැප ඇත්තෝයයි අසන ලද්දේ වෙයි. ඒ මහණහට මේ සිත ඇතිවෙයි. කය බිඳීමෙන්, මරණින් පසු, මම පරිත්තසුභ දෙවියන්ගේ සමාගමයට (උත්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි. හෙතෙම ඒ සිත තබයි. ඒ සිත පිහිටුවයි. ඒ සිත වඩයි. මෙසේ වඩනලද, මෙසේ පුරුදු කරනලද, ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතියි.

23. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැත භාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඒ භික්ෂුව විසින් අප්පමාණ සුභ දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය, වර්ණ ඇත්තෝය, බොහෝ සැප ඇත්තෝයයි අසනලද්දේ වෙයි. ඒ මහණහට මේ සිත ඇතිවෙයි. කය බිඳීමෙන්, මරණින් පසු, මම අප්පමාණ සුභ දෙවියන්ගේ සමාගමයට (උත්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි. හෙතෙම ඒ සිත තබයි. ඒ සිත පිහිටුවයි, ඒ සිත වඩයි. මෙසේ වඩනලද මෙසේ පුරුදු කරනලද ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතිත්.

මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතිත්.

24. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැතභාවයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඒ භික්ෂුව විසින් සුභකිණ්ණ දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය, වර්ණ ඇත්තෝය, බොහෝ සැප ඇත්තෝයයි අසන ලද්දේ වෙයි. ඒ මහණහට සිත ඇති වෙයි. කය බිඳීමෙන්, මරණින් පසු, මම සුභකිණ්ණ දෙවියන්ගේ සමාගමයට (උත්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි. හෙතෙම ඒ සිත තබයි. ඒ සිත පිහිටුවයි. ඒ සිත වඩයි. මෙසේ වඩනලද, මෙසේ පුරුදු කරනලද, ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතියි.

25. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැතභාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයි. ඒ භික්ෂුව විසින් වේහප්ඵල දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය. වර්ණ ඇත්තෝය. බොහෝ සැප ඇත්තෝයයි අසන ලද්දේ වෙයි. ඒ මහණහට මේ සිත ඇති වෙයි. කය බිඳීමෙන්, මරණින් පසු, මම වේහප්ඵල දෙවියන්ගේ සමාගමයට (උත්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි. හෙතෙම ඒ සිත තබයි. ඒ සිත පිහිටුවයි. ඒ සිත වඩයි. මෙසේ වඩනලද, මෙසේ පුරුදු කරනලද, ඒ ප්‍රාර්ථනා සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතියි.

26. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැතභාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඒ භික්ෂුව විසින් අවිහ දෙවියෝ දීර්ඝායුෂ

ඇත්තෝය. වර්ණ ඇත්තෝය. බොහෝ සැප ඇත්තෝයයි අසන ලද්දේ වෙයි. ඒ මහණහට මේ සිත ඇතිවෙයි. කය බිඳීමෙන්, මරණින් පසු, මම අවිහ දෙවියන්ගේ සමාගමයට (උත්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි. හෙතෙම ඒ සිත තබයි. ඒ සිත පිහිටුවයි. ඒ සිත වඩයි. මෙසේ වඩනලද, මෙසේ පුරුදු කරනලද ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතියි.

27. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැතභාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඒ භික්ෂුව විසින් අතප්ප දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය. වර්ණ ඇත්තෝය. බොහෝ සැප ඇත්තෝයයි අසන ලද්දේ වෙයි. ඒ මහණහට මේ සිත ඇති වෙයි. කය බිඳීමෙන්, මරණින් පසු, මම අතප්ප දෙවියන්ගේ සමාගමයට (උත්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතාහොඳය කියායි. හෙතෙම ඒ සිත තබයි. ඒ සිත පිහිටුවයි. ඒ සිත වඩයි. මෙසේ වඩනලද, මෙසේ පුරුදු කරනලද, ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධා ධර්මයෝ ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතියි.

28. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැතභාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඒ භික්ෂුව විසින් සුදස්ස දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය. වර්ණ ඇත්තෝය බොහෝ සැප ඇත්තෝයයි අසන ලද්දේ වෙයි. ඒ මහණහට මේ සිත ඇති වෙයි. කය බිඳීමෙන්, මරණින් පසු, මම සුදස්ස දෙවියන්ගේ සමාගමයට (උත්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි හෙතෙම ඒ සිත තබයි. ඒ සිත පිහිටුවයි. ඒ සිත වඩයි. මෙසේ වඩනලද,

මෙසේ පුරුදු කරනලද, ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතියි.

29. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැතභාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඒ භික්ෂුව විසින් සුදස්සී දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය. වර්ණ ඇත්තෝය. බොහෝ සැප ඇත්තෝයයි අසන ලද්දේ වෙයි. ඒ මහණහට මේ සිත ඇති වෙයි. කය බිඳීමෙන්, මරණින් පසු, මම සුදස්සී දෙවියන්ගේ සමාගමයට (උත්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි. හෙතෙම ඒ සිත තබයි. ඒ සිත පිහිටුවයි. ඒ සිත වඩයි. මෙසේ වඩනලද, මෙසේ පුරුදු කරනලද, ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතියි.

30. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැතභාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඒ භික්ෂුව විසින් අකනිට්ඨා දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය. වර්ණ ඇත්තෝය. බොහෝ සැප ඇත්තෝයයි අසන ලද්දේ වෙයි. ඒ මහණහට මේ සිත ඇති වෙයි. කය බිඳීමෙන්, මරණින් පසු, මම අකනිට්ඨා දෙවියන්ගේ සමාගමයට (උත්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි. හෙතෙම ඒ සිත තබයි. ඒ සිත පිහිටුවයි. ඒ සිත වඩයි. මෙසේ වඩනලද, මෙසේ පුරුදු කරනලද, ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතියි.

31. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැතභාවයෙන්

යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඒ භික්ෂුව විසින් ආකාසානඤ්චායතනයෙහි උපන් දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය, වර්ණ ඇත්තෝය, බොහෝ සැප ඇත්තෝයයි අසන ලද්දේ වෙයි. ඒ මහණහට මේ සිත ඇතිවෙයි. කය බිඳීමෙන්, මරණින් පසු, ආකාසානඤ්චායතනයෙහි උපන් දෙවියන්ගේ සමාගමයට (උත්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි. හෙතෙම ඒ සිත තබයි. ඒ සිත පිහිටුවයි ඒ සිත වඩයි. මෙසේ වඩන ලද, මෙසේ පුරුදු කරනලද, ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රඥාව, ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතියි.

32. "මහණෙනි, නැවතද මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ වෙයිද, ශීලයෙන් යුක්තවූයේ වෙයිද, බහුශ්‍රැතභාවයෙන් යුක්තවූයේ වෙයිද, ත්‍යාගයෙන් යුක්තවූයේ වෙයිද, ප්‍රඥාවෙන් යුක්තවූයේ වෙයිද, ඒ භික්ෂුව විසින් විඤ්ඤාණඤ්චායතනයෙහි උපන් දෙවියෝ දීර්ඝායුෂ ඇත්තෝය. වර්ණ ඇත්තෝය. බොහෝ සැප ඇත්තෝයයි අසන ලද්දේ වෙයි. ඒ මහණහට මේ සිත ඇතිවෙයි. කය බිඳීමෙන්, මරණින් පසු, මම විඤ්ඤාණඤ්චායතනයෙහි උපන් දෙවියන්ගේ සමාගමයට (උත්පත්ති වශයෙන්) පැමිණෙම් නම් ඉතා හොඳය කියායි' හෙතෙම ඒ සිත තබයි. ඒ සිත පිහිටුවයි. ඒ සිත වඩයි. මෙසේ වඩනලද, මෙසේ පුරුදු කරනලද, ඒ ප්‍රාර්ථනාව සහිත ශ්‍රද්ධාදි ධර්මයෝ ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතිත්. මහණෙනි, මේ මාර්ගය, මේ ප්‍රතිපදාව, ඒ දෙවියන් අතර ඉපදීම පිණිස පවතියි.

33 "ඒ මහණහට මේ අදහස ඇතිවෙයි. මම ආශ්‍රව (කෙළෙස්) නැතිකිරීමෙන් ආශ්‍රව රහිතවූ, අර්හත්ඵල සමාධියත්, අර්හත් ඵල ප්‍රඥාවත් මේ ආත්මයේදී තමාම විසිතුරු නුවණින් දැන, ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරන්නේ නම් ඉතා හොඳය කියායි. ඒ මහණතෙම ආශ්‍රවයන් නැතිකිරීමෙන් ආශ්‍රව

රහිතවූ අර්හත්ඵල සමාධිය හා අර්හත්ඵල ප්‍රඥාවද මේ ආත්මයේදීම තම විසිතුරු නුවණින් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කරයි. මහණෙනි, මේ මහණතෙම වනාහි කිසි තැනක නූපදියි. කොහිවත් නූපදියි.” භාග්‍යවතුන් වහන්සේ මේ දෙශනාව වදාළසේක. සතුටු සිතැති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටුවූහ.

**දසවන සංඛාරුප්පත්ති සූත්‍රය නිමි (2-10)**

---

අනුපද සූත්‍රය, ඡබ්බිසෝධන සූත්‍රය, සප්පුරිස සූත්‍රය, සේවිතබ්බාසේවිතබ්බ සූතය, බහුධාතුක සූත්‍රය, ඉසිගිලි සූත්‍රය, මහාචත්තාරීසක සූත්‍රය, ආනාපානසති සූත්‍රය, කායගතාසති සූත්‍රය සහ සංඛාරුප්පත්ති සූත්‍රය යන සූත්‍ර දසයකින් යුක්තවූ

**දෙවෙනි අනුපද වර්ගයයි.**

---

## 21. චූල සුඤ්ඤත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අසල මිගාරමාතු පාසාද නම් ලත් පූර්වාරාමයෙහි වැඩ වාසය කරන සේක. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි ඵලසමවතින් නැගී සිටියේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසක හුන්නේය. එකත් පසක හුන්නාවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේය.

“භාග්‍යවතුන් වහන්ස, එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයන්හි නාගරක නම් ශාක්‍යයන්ගේ නියම්ගම යම් තැනෙක්හිද එහි වැඩ වාසය කරණසේක. ස්වාමීනි, එහිදී මවිසින් භාග්‍යවතුන් වහන්සේගෙන් ‘ආනන්දය මම දැන් වනාහි සූන්‍යතා විහරණයෙන් බහුලව වාසය කරමි’ යන මෙය අසන ලදී.

පිළිගන්නා ලදී. කිමෙක්ද ස්වාමීනි, එය මා විසින් මනා කොට අසන ලද්දක්ද? මනාකොට ඉගෙන ගන්නා ලද්දක්ද? මනාකොට මෙනෙහි කරන ලද්දක්ද? මනාකොට දරණ ලද්දක්ද?

2. "ආනන්දය, නුඹ විසින් මෙය ඒකාන්තයෙන් මනා කොට අසන ලද්දේය. මනාකොට ඉගෙන ගන්නා ලද්දේය. මනාකොට මෙනෙහි කරණ ලද්දේය. මනාකොට දරණ ලද්දේය. ආනන්දය මම පෙරද දැන් ද සූන්‍යතා විහරණයෙන් බහුලව වාසය කරමි. මේ මිගාරමාතු ප්‍රාසාදය යම්සේ ඇත් ගව අස් වෙළඹුන්ගෙන් සූන්‍යද, රන්රිදියෙන් සූන්‍යද, ස්ත්‍රී පුරුෂයන් රැස්ව සිටීමෙන් සූන්‍යද, භික්ෂු සංඝයා නිසා පවත්නා යම් මේ අසූන්‍යත්වයක් වේද, ඒ එකම අසූන්‍යත්වය ඇත්තේය. ආනන්දය, එපරිද්දෙන්ම මහණතෙම ගමය යන හැඟීම මෙනෙහි නොකොට මිනිසුන්ය යන හැඟීම මෙනෙහි නොකොට අරණ්‍යය යන එකම හැඟීම මෙනෙහි කෙරේද, ඔහුගේ සිත අරණ්‍ය යන හැඟීමෙහි බැසගනී, පහදී, මනාව පිහිටයි, ස්ථිරව පිහිටයි. හෙතෙම මෙසේ දැනගනී. ගමය යන හැඟීම නිසා ඇතිවන යම් කෙලෙස් දැවිලි වෙත්නම්, ඔව්හු මේ අරණ්‍ය යන හැඟීමෙහි නැත. මිනිසුන්ය යන හැඟීම නිසා ඇතිවන යම් කෙලෙස් දැවිලිවන්නාහුනම් ඔව්හු මේ අරණ්‍ය යන හැඟීමෙහි නැත. එකම අරණ්‍ය යන හැඟීම නිසා යම් මේ කෙලෙස් දැවිල්ලක් ඇත්නම් එපමණක්ම ඇත්තේය. හෙතෙම ගමය යන හැඟීමෙන් වන්නාවූ කෙලෙස් දැවිල්ලෙන් සූන්‍යයයි දැනගනියි. මිනිසුන්ය යන හැඟීමෙන් වන්නාවූ කෙලෙස් දැවිල්ලෙන් සූන්‍යයයි දැනගනියි. අරණ්‍ය සංඥාව නිසා පවත්නාවූ යම් එකම කෙලෙස් දැවිලි මාත්‍රයක්ම ඇත්තේයයි. දැනගනියි. මෙසේ යම්කිසි කෙලෙස් දැවිල්ලක් නැත්නම් එයින් එය සූන්‍යයයි නුවණැසින් දකී. යම්කිසි කෙලෙස් දැවිල්ලක් වේනම් ඒ ශාන්තවූ ක්ලේශ දරථයම ඇත්තේයයි දැනගනී. ආනන්දය, ඔහුට මෙසේ විද්‍යමානවූ වෙනස් නොවූ පිරිසිදුවූ මේ සූන්‍යත්වය ඇතිවෙයි.

3. "ආනන්දය, නැවතද මහණතෙම මිනිසුන් යන හැඟීම මෙනෙහි නොකොට අරණ්‍යය යන හැඟීම මෙනෙහි නොකොට

පඨවි (පොළොව) යන එකම හැඟීම මෙනෙහි කෙරේද, ඔහුගේ සිත පොළොව යන හැඟීමෙහි බැසගනී, පහදී, පිහිටයි. ස්ථිරව පිහිටයි. ආනන්දය, යම්සේ, වෘෂභ හමක් (එනම් ගවයෙකුගේ හමක්) සිය ගණන් උලින් දිගහැර මොනවට රැලිරහිත කරන ලද්දේද ආනන්දය එපරිද්දෙන්ම මහණතෙම මේ පොළොවෙහි යම් උස්පහත් තැන්වේද, ගංගා කඳු හෙල් සහිතවේද, කණු කටු සහිතවේද, පර්වතයන්ගෙන් විසමද ඒ සියල්ල මෙනෙහි නොකොට එකම පොළොව යන හැඟීම මෙනෙහි කෙරේද, ඔහුගේ සිත පොළොව යන හැඟීමෙහි බැසගනී, පහදී, සිටී, ස්ථිරව පිහිටයි, හෙතෙම මෙසේ දැනගනී. මනුෂ්‍ය සංඥාව නිසාවූ යම් ක්ලේශ දැවිලි වන්නාහු නම්, ඔව්හු මේ පොළොවෙහි නැත. අරණ්‍යය යන හැඟීම නිසා පවත්නාවූ යම් ක්ලේශ දැවිල්ලක් ඇත්නම් එයද මේ පොළොවෙහි නැත. පොළොව යන හැඟීම නිසා පවත්නා එකම ක්ලේශ දරථ මාත්‍රයක්ම ඇත්තේය. හෙතෙම මේ සංඥාව මනුෂ්‍ය සංඥාවෙන් සූන්‍යයයි දැනගනී මේ සංඥාව අරණ්‍ය සංඥාවෙන් සූන්‍යයයි දැනගනී. පෘථිවි සංඥාව නිසා පවත්නාවූ යම් එකම අසූන්‍යත්වයක් වේනම් එයම ඇත්තේයයි දැනගනී. මෙසේ එහි කෙලෙස් දැවිල්ලක් නොවේ නම් එයින් එය සූන්‍යයයි දකී. යම් කිසි කෙලෙස් දැවීම් මාත්‍රයක් එහි ඉතිරි වේනම් එය ශාන්තයයි දැනගනී. ආනන්දය, ඔහුට මෙසේ විද්‍යමානවූ වෙනස් නොවූ පිරිසිදු මේ සූන්‍යතාවය ඇතිවෙයි.

4. "ආනන්දය, නැවතද මහණතෙම අරණ්‍ය සංඥාව මෙනෙහි නොකොට පෘථිවි සංඥාව මෙනෙහි නොකොට එකම ආකාසානඤ්චායතන සංඥාව මෙනෙහි කෙරේද, ඔහුගේ සිත ආකාසානඤ්චායතන සංඥාවෙහි බැසගනී, පහදී, පිහිටයි, ස්ථිරව පිහිටයි. හෙතෙම මෙසේ දැනගනී, අරණ්‍ය සංඥාව නිසාවූ යම් කෙලෙස් දැවිලි වන්නාහු නම් ඔව්හු ආකාසානඤ්චායතනයෙහි නැත. පෘථිවි සංඥාව නිසාවූ යම් කෙලෙස් දැවිලි වන්නාහු නම් ඔව්හු ආකාසානඤ්චායතනයෙහි නැත. එකම ආකාසානඤ්චායතන සංඥාව නිසා පවත්නාවූ

යම් ක්ලේශ දැවිලි මාත්‍රයක් ඇත්තේ නම් එයම ඇත්තේය. හෙතෙම මේ සංඥාව අරණ්‍ය සංඥාවෙන් සූන්‍යයයි දැනගනී. මේ සංඥාව පෘථිවි සංඥාවෙන් සූන්‍යයයි දැනගනී. යම් මේ ආකාසානඤ්චායතනය නිසාවූ එකම අසූන්‍ය තාවයක්වේ නම් එයම ඇත්තේය. මෙසේ එහි යම් කෙලෙස් දැවීම් මාත්‍රයක් නොවේ නම් එයින් එය සූන්‍යයයි නුවණැසින් දකී. යම්කිසි දරථ මාත්‍රයක් එහි ඉතිරි වේනම් එය ශාන්තයයි දැනගනී. ආනන්දය, ඔහුට මෙසේ විද්‍යමානවූ වෙනස් නොවූ පිරිසිදුවූ සූන්‍යතාවය, ඇතිවෙයි.

**5.** "ආනන්දය, නැවතද මහණතෙම පෘථිවි සංඥාව මෙනෙහි නොකොට ආකාසානඤ්චායතන සංඥාව මෙනෙහි නොකොට එකම විඤ්ඤාණඤ්චායතන සංඥාව මෙනෙහි කෙරේද, ඔහුගේ සිත විඤ්ඤාණඤ්චායතන සංඥාවෙහි බැස ගනී, පහදී, පිහිටයි, ස්ථිරව පිහිටයි. හෙතෙම මෙසේ දැන ගනී. කෙසේද පෘථිවි සංඥාව නිසාවූ යම්කිසි කෙලෙස් දැවිලි වන්නාහු නම් ඔව්හු මේ විඤ්ඤාණඤ්චායතනයෙහි නැත. ආකාසානඤ්චායතන සංඥාව නිසාවූ යම්කිසි කෙලෙස් දැවිලි වන්නාහු නම් ඔව්හුද මේ විඤ්ඤානඤ්චායතනයෙහි නැත. එකම විඤ්ඤාණඤ්චායතන සංඥාව නිසා පවත්නා යම් කෙලෙස් දැවීම් මාත්‍රයක් ඇත්නම් එයම ඇත්තේය. හෙතෙම මේ සංඥාව පෘථිවි සංඥාවෙන් සූන්‍යයයි දැනගනී. මේ සංඥාව ආකාසානඤ්චායතන සංඥාවෙන් සූන්‍යයයි දැනගනී. විඤ්ඤාණඤ්චායතන සංඥාව නිසා පවත්නා යම් එකම අසූන්‍යත්වයක් වේනම් එයම ඇත්තේය. මෙසේ එහි යම් කෙලෙස් දැවිල්ලක් නොවේ නම් එයින් එය සූන්‍යයයි නුවණැසින් දකී. යම්කිසි කෙලෙස් දැවීම් මාත්‍රයක් ඉතිරි වේනම් එය ශාන්තයයි දැනගනී. ආනන්දය, ඔහුට මෙසේ විද්‍යමානවූ, වෙනස් නොවූ, පිරිසිදුවූ සූන්‍යතාවය ඇතිවෙයි.

**6.** "ආනන්දය, නැවත මහණතෙම ආකාසානඤ්චායතන සංඥාව මෙනෙහි නොකොට, විඤ්ඤාණඤ්චායතන සංඥාව මෙනෙහි නොකොට එකක්වූ ආකිඤ්චඤ්ඤායතන සංඥාව

මෙනෙහි කෙරේද, ඔහුගේ සිත ආකිඤ්චඤ්ඤායතන සංඥාවෙහි බැසගනී, පහදී, පිහිටයි, ස්ථිරව පිහිටයි. හෙතෙම මෙසේ දැනගනී. ආකාසානඤ්චායතන සංඥාව නිසාවූ යම් කෙලෙස් දැවිලි වන්නාහු නම් ඔව්හු මේ ආකිඤ්චඤ්ඤායතනයෙහි නැත. විඤ්ඤාණඤ්චායතන සංඥාව නිසාවූ කෙලෙස් දැවිලි වන්නාහු නම් ඔව්හු මේ ආකිඤ්චඤ්ඤායතනයෙහි නැත. එකම ආකිඤ්චඤ්ඤායතන සංඥාව නිසාවූ යම් කෙලෙස් දැවීමක් වේනම් එබඳු කෙලෙස් දැවීම් මාත්‍රයක් ඇත්තේය කියායි. හෙතෙම මේ සංඥාව ආකාසානඤ්චායතන සංඥාවෙන් සූන්‍යයයි දැනගනී. මේ සංඥාව විඤ්ඤාණඤ්චායතන සංඥාවෙන් සූන්‍යයයි දැනගනී. ආකිඤ්චඤ්ඤායතන සංඥාව නිසා පවත්නා යම් එකම අසූන්‍යත්වයක් වේ නම් ඒ අසූන්‍යතාවයම ඇත්තේයයි දැනගනී. මෙසේ එහි යම් කෙලෙස් දාහයක් නොවේ නම් එයින් එය සූන්‍යයයි නුවණැසින් දකී. යම් ක්ලේශ දාහයක් එහි ඉතිරි වේනම් එය ශාන්තයයි දැනගනී. ආනන්දය, ඔහුට මෙසේ විද්‍යමානවූ වෙනස් නොවූ පිරිසිදුවූ සූන්‍යතාවය ඇතිවෙයි.

7. "ආනන්දය, නැවතද මහණතෙම විඤ්ඤාණඤ්චායතන සංඥාව මෙනෙහි නොකොට ආකිඤ්චඤ්ඤායතන සංඥාව මෙනෙහි නොකොට එකක්වූ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥාව මෙනෙහි කෙරේද, ඔහුගේ සිත නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥාවෙහි බැසගනී, පහදී, පිහිටයි, ස්ථිරව පිහිටයි හෙතෙම මෙසේ දැනගනී. විඤ්ඤාණඤ්චායතන සංඥාව නිසාවූ යම් ක්ලේශ දැවිලි වන්නාහු නම් ඔව්හු නේවසඤ්ඤානාසඤ්ඤායතන යෙහි නැත. ආකිඤ්චඤ්ඤායතන සංඥාව නිසාවූ යම් ක්ලේශ දැවිලි වන්නාහු නම් ඔව්හුද මේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි නැත. එකක්වූ නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥාව නිසා පවත්නා යම් කෙලෙස් දැවිල්ලක් ඇත්නම් එයම ඇත්තේය කියායි. හෙතෙම මේ සංඥාව විඤ්ඤාණඤ්චායතන සංඥාවෙන් සූන්‍යයයි දැනගනී. මේ සංඥාව ආකිඤ්චඤ්ඤායතන

සංඥාවෙන් සූන්‍යයයි දැනගනී. නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥාව නිසා පවත්නා යම් එකම අසූන්‍යත්වයක් වේනම් ඒ අසූන්‍යත්වය පමණක් ඇත්තේය. මෙසේ එහි යම් කෙලෙස් දැවීමක් නොවේ නම් එයින් එය සූන්‍යයයි නුවණැසින් දකී. යම් කෙලෙස් දැවීමක් එහි ඉතිරි වේ නම් එය ශාන්තයයි දැනගනී. ආනන්දය, ඔහුට මෙසේ විද්‍යමානවූ වෙනස් නොවූ පිරිසිදුවූ සූන්‍යතාවය ඇතිවෙයි.

8. "ආනන්දය, නැවතද මහණතෙම ආකිඤ්චඤ්ඤායතන සංඥාව මෙනෙහි නොකොට නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥාව මෙනෙහි නොකොට එකක්වූ විදර්ශනා චිත්ත සමාධි සංඥාව මෙනෙහි කෙරේද, ඔහුගේ සිත විදර්ශනා චිත්ත සමාධියෙහි බැසගනී, පහදියි, පිහිටයි, ස්ථිරව සිටියි. හෙතෙම මෙසේ දැනගනී. ආකිඤ්චඤ්ඤායතන සංඥාව නිසාවූ යම් ක්ලේශ දාහයෝ වන්නාහු නම් ඒ ක්ලේශ දාහයෝ මේ විදර්ශනා චිත්ත සමාධියෙහි නැත. ජීවිතෙන්ද්‍රියය නිසා පවත්නා ෂඩායතනයෙන් යුක්තවූ සතරමහාභූතයන්ගෙන් හටගත් මේ කය නිසා පවත්නාවූ යම් දැවිලි වෙත් නම් එබඳු දැවීම් මාත්‍රයක්ම ඇත්තේය කියායි. හෙතෙම මේ සංඥාව ආකිඤ්චඤ්ඤායතන සංඥාවෙන් සූන්‍යයයි දැනගනී. මේ සංඥාව නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥාවෙන් සූන්‍යයයි දැනගනී. යම් මේ ජීවිතෙන්ද්‍රියය නිසා පවත්නා ෂඩායතනයෙන් යුත් මේ කය නිසාවූ යම් එකම අසූන්‍යතාවයක් වේ නම් එබඳු අසූන්‍යතාවයක්ම ඇත්තේය. මෙසේ එහි යම් ක්ලේශ දැවීම් මාත්‍රයක් නොවේ නම් එයින් එය සූන්‍යයයි දකී. යම් දැවීම් මාත්‍රයක් වනාහි එහි ඉතිරි වේනම් එය ශාන්තයයි දැනගනී. ආනන්දය, ඔහුට මෙසේ විද්‍යමානවූ වෙනස් නොවූ පිරිසිදුවූ සූන්‍යතාවය ඇතිවෙයි.

9. "ආනන්දය, නැවතද මහණතෙම ආකිඤ්චඤ්ඤායතන සංඥාව මෙනෙහි නොකොට නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥාව මෙනෙහි නොකොට එකක්වූ විදර්ශනා චිත්ත සමාධිය

මෙනෙහි කෙරේද, ඔහුගේ සිත විදර්ශනා චිත්ත සමාධියෙහි බැසගනී, පහදියි, පිහිටයි, ස්ථිරව පිහිටයි. හෙතෙම මෙසේ දැනගනී. මේ විදර්ශනා චිත්ත සමාධිය ප්‍රත්‍යය කරණකොට හටගන්නා ලද්දේය. සිතින් උපදින ලද්දේය. ප්‍රත්‍යයෙන් හටගන්නාලද සිතින් උපදිනලද යම් කිසිවක් වේනම් එය අනිත්‍යය. නිරුද්ධවන ස්වභාව ඇත්තේයයි දැන ගනී. මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ඔහුගේ සිත කාමාශ්‍රවයෙන්ද මිදෙයි භවාශ්‍රවයෙන්ද සිත මිදෙයි. අවිද්‍යාශ්‍රවයෙන්ද සිත මිදෙයි. මිදුනු කල්හි මිදුනේයයි දැනගැනීම ඇතිවෙයි. උත්පත්තිය ක්ෂයවිය. බඹසර (බ්‍රහ්මචර්‍ය්‍යාව) වැස නිමවන ලදී. කටයුතු සියල්ල නිමකරණ ලදී. මින්පසු කළයුතු කිසිවක් නැතැයි දැනගනී. හෙතෙම මෙසේ දැනගනී. කාමාශ්‍රවයන් නිසාවූ යම් ක්ලේශ දාහයෝ වන්නාහු නම් ඔව්හු මේ ආර්‍ය්‍ය මාර්ගයෙහි හා ඵලයෙහි නැත. භවාශ්‍රවයන් නිසාවූ යම් ක්ලෙශ දාහයෝ වන්නාහු නම් ඔව්හුද මෙහි නැත. අවිද්‍යාශ්‍රවය නිසාවූ යම් ක්ලෙශ දාහයෝ වන්නාහු නම් ඔව්හුද මෙහි නැත. ජීවිතෙන්ද්‍රියය නිසා පවත්නා ෂඩායතනයෙන් යුත් මේ කය නිසාවූ යම් දැවීම් මාත්‍රයක් වේ නම් ඒ දැවීම් මාත්‍රයම ඇත්තේය. හෙතෙම මේ සංඥාව කාමාශ්‍රවයෙන් සූන්‍යයයිද දැනගනී. මේ සංඥාව භවාශ්‍රවයෙන් සූන්‍යයයිද දැනගනී. මේ සංඥාව අවිද්‍යාශ්‍රවයෙන් සූන්‍යයයිද දැන ගනී. ජීවිතේන්ද්‍රියය නිසා පවත්නා ෂඩායතනයෙන් යුත් මේ කය නිසාවූ යම් එකම අසූන්‍යත්වයක් වේද, ඒ අසූන්‍යත්වයම ඇත්තේයයි දැනගන මෙසේ යමක් එහි නැති නම් එයින් එය සූන්‍යයයි දකී. එහි යමක් ඉතිරි නම් එය ශාන්තයයි දැනගනී. ආනන්දය, ඔහුට මෙසේ විද්‍යමානවූ වෙනස් නොවූ පිරිසිදුවූ සියල්ලට ශ්‍රෙෂ්ඨවූ සූන්‍යතාවය ඇතිවෙයි.

**10.** "ආනන්දය, ඉකුත් කාලයෙහි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ පිරිසිදුවූ සියල්ලට ශ්‍රෙෂ්ඨවූ, ඵලසමාපත්තියට පැමිණ වාසය කළාහු නම් ඒ සියල්ලෝ මේ පිරිසිදු ඉතා උතුම් ඵලසමාපත්තියට පැමිණ වාසය කළාහුය. ආනන්දය, මතු කාලයෙහි යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ පිරිසිදුවූ,

ඉතා උතුම්වූ පල සමවතට පැමිණ වාසය කරන්නාහු නම් ඒ සියල්ලෝම පිරිසිදුවූ, ඉතා උතුම්වූ, මේ ඵල සමවතට පැමිණ වාසය කරන්නාහුය. ආනන්දය, දැන් මේ කාලයෙහි යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ පිරිසිදු, අතිඋතුම් ඵලසමවතට පැමිණ වාසය කරත්නම් ඒ සියල්ලෝම මේ පිරිසිදු ඉතා උතුම් ඵලසමවතට පැමිණ වාසය කරති. ආනන්දය, එහෙයින් මෙහිදී පිරිසිදුවූ, ඉතා උතුම් පලසමවතට පැමිණ වාසය කරන්නෙමුයි. ආනන්දය, මෙසේ තොප විසින් හික්මිය යුතුයි.”

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිතැති ආනන්ද ස්ථවිරයන් වහන්සේ දෙශනාව සතුටින් පිළිගත්තෝය.

**පළමුවෙනි චූල සුඤ්ඤත සූත්‍රය නිමි. (3-1)**

---

## 22. මහා සුඤ්ඤත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයන්හි, කිඹුල්වත් පුරයේ නිග්‍රොධාරාමයෙහි වැඩ වසන සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ, පා සිවුරු ගෙන කිඹුල්වත් පුරයට පිඬු පිණිස වැඩිසේක. කිඹුල්වත් පුරයෙහි පිඬු පිණිස හැසිර, බතින් පසු පිණ්ඩපාතයෙන් වැළකුණේ “කාලඛෙමක” නම් ශාක්‍යයාගේ විහාරය යම්තැනකද, එහි දවල් කාලයෙහි විසීම පිණිස වැඩිසේක. ඒ කාලයෙහි “කාලඛේමක ශාක්‍යයාගේ විහාරයෙහි පනවන ලද බොහෝ අසුන් වූහ. භාග්‍යවතුන් වහන්සේ කාලඛේමක ශාක්‍යයාගේ විහාරයෙහි පනවන ලද බොහෝ අසුන් දුටහ. දැක, භාග්‍යවතුන් වහන්සේට මේ අදහස විය. “කාලඛේමක” ශාක්‍යයාගේ විහාරයෙහි බොහෝ සෙනසුන් පනවන ලද්දාහුය. එහි බොහෝ භික්ෂූහු වාසය කෙරෙත්ය’යි කියායි.

2. එසමයෙහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ බොහෝ භික්ෂූන් සමග "ඝටා" නම් ශාක්‍යයාගේ විහාරයෙහි සිවුරු මැසීම කරයි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි පලසමවතින් නැගිට "ඝටා" නම් ශාක්‍යයාගේ විහාරය යම් තැනකද එහි වැඩිසේක. වැඩ පනවන ලද ආසනයෙහි වැඩහුන්සේක. වැඩහිඳ භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට කථාකළසේක. "ආනන්දය, 'කාලඛේමක" ශාක්‍යයාගේ විහාරයෙහි බොහෝ සෙනසුන් පනවන ලද්දාහුය. මෙහි බොහෝ භික්ෂුහු වාසය කරද්දැයි ඇසූහ.

"ස්වාමීනි, කාලඛේමක නම් ශාක්‍යයාගේ විහාරයෙහි බොහෝ සෙනසුන් පනවන ලද්දාහුය. මෙහි බොහෝ භික්ෂූහු වාසය කරත්. ස්වාමීනි, අපගේ සිවුරු මසන කාලය වේයයි කීය."

3. "ආනන්දය, බොහෝ දෙනා සමග එක්ව විසීමට සතුටු එක්ව විසීමට කැමති එක්ව විසීමෙහි යෙදුණු නොයෙක් දෙනා සමග එක්ව විසීමෙහි ඇළුණු එක්ව විසීමට කැමති එක්ව විසීමට සතුටු මහණතෙමේ නොහොබනේය. බොහෝ දෙනා සමග එක්ව විසීමට සතුටු එක්ව විසීමෙහි ඇළුණු එක්ව විසීමෙහි යෙදුණු නොයෙක් දෙනා සමග එක්ව විසීමෙහි ඇළුණු එක්ව විසීමෙහි කැමති මහණතෙමේ යම් ඒ කාමයෙන් නික්මීමේ සැපයක් වේද, කාමයෙන් වෙන්වීමේ සැපයක්වේද, රාගාදීන්ගේ සංසිඳීම පිණිස පවත්නා සැපයක් වේද, මාර්ගාවබෝධය පිණිස පවත්නා සැපයක් වේද, ඒ සැපය කැමතිසේ ලබන්නෙක් නිදුකින් ලබන්නෙක් මහත්සේ ලබන්නෙක් වන්නේය යන මෙය සිදු වීමට කරුණු නැත.

4. "ආනන්දය, යම් ඒ භික්ෂුවක් හුදකලාවූයේ සමූහයාගෙන් වෙන්ව වාසය කෙරේද, ඒ භික්ෂුව විසින් මෙය කැමති වියයුතුයි. එනම් යම් ඒ කාමයෙන් නික්මීමේ සැපයක් වේද, කාමයෙන් වෙන්වීමේ සැපයක් වේද, රාගාදීන්ගේ සංසිඳීම පිණිස පවත්නා සැපයක් වේද, මාර්ගාවබෝධය පිණිස පවත්නා සැපයක් වේද,

ඒ සැපය කැමතිසේ ලබන්නෙක් නිදුකින් ලබන්නෙක් මහත්සේ ලබන්නෙක් වන්නේය යන මේ කරුණ සිදුවන්නේය. ආනන්දය, ඒ භික්ෂුව ඒකාන්තයෙන් බොහෝදෙනා සමග එක්ව විසීමට කැමති වූයේ එක්ව විසීමෙහි ඇළුනේ එක්ව විසීමෙහි යෙදුනේ නොයෙක් දෙනා සමග එක්ව විසීමෙහි කැමති වූයේ එක්ව විසීමෙහි ඇළුනේ එක්ව විසීමෙහි යෙදුනේ වේද, හෙතෙම මනාපවූ කලෙක කෙලෙසුන්ගෙන් මිදුනු රූපාරූපාවචර චිත්ත සමාධියට හෝ ක්ලේශයන්ගෙන් කුපිත කළ නොහැකි ඒකාන්තයෙන් ක්ලේශයන්ගෙන් මිදීමට හෝ පැමිණ වාසය කරන්නේය යන මීට කරුණු නැත.

**5.** "ආනන්දය, යම් ඒ භික්ෂුවක් හුදකලාව සමූහයාගෙන් වෙන්ව වාසය කෙරේ නම් ඔහු විසින් මෙය කැමති විය' යුතුයි. එනම් මනාපවූ කලෙක කෙලෙසුන්ගෙන් මිදුනු රූපාරූපාවචර චිත්ත සමාධියට හෝ කෙලෙසුන්ගෙන් කුපිත කළ නොහැකි ඒකාන්තයෙන් කෙලෙසුන්ගෙන් මිදීමට හෝ පැමිණ වාසය කරන්නේය යන මීට කරුණු ඇත්තේය, ආනන්දය, යම්කිසි රූපයක රාග වශයෙන් ඇළුනේද, යම් රූපයක වෙසෙසින් ඇළුනේද, ඒ රූපයාගේ නැති වීමෙන් වෙනස් වීමෙන් ශෝකය, වැළපීමය, දුක්ය, දොම්නස්ය දැඩි ආයාසය, යන මොව්හු නූපදින්නාහු නම් එබඳු එක් රූපයකුදු මම නොදක්නෙමි.

**6.** "ආනන්දය, රූපාදි සියලු නිමිති මෙනෙහි නොකරන්නාවූ සුඤ්ඤත ඵල සමාපත්ති (අර්හත් ඵල සමාපත්ති) අරමුණට පැමිණ වාසය කෙරේය යන යමක් වේ නම් ඒ මේ විහරණය තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලදී. ආනන්දය, මේ විහරණයෙන් යුක්තව වාසය කරණ ඒ තථාගත භාග්‍යවතුන් වහන්සේ කරා භික්ෂූහුද, භික්ෂුණීහුද, උපාසකයෝද, උපාසිකාවෝද, රජවරුද, රජමහඇමතිහුද, තීර්ථකයෝද, තීර්ථක ශ්‍රාවකයෝද, පැමිණෙන්නාහුය. ආනන්දය, තථාගතයන් වහන්සේ ඒ පිරිස මැද සිටියේ නිර්වාණයට නැමුණු නිර්වාණයට අවනතවූ නිර්වාණයට බරවූ ක්ලේශයන්ගෙන් වෙන්වූ,

හික්මීමෙහි ඇළුනු, සිතින් යුක්තව මුළුමනින් කෙලෙසුන්ට කරුණුවූ ධර්මයන්ගෙන් වෙන්ව පිරිස පිටත් කරන්නාවූ කථාවක්ම කරන්නේවෙයි. ආනන්දය, එහෙයින් මෙහිදී මහණතෙමේද සුඤ්ඤත ඵල සමාපත්ති අරමුණට පැමිණ වාසය කරන්නෙමියි කැමති වන්නේ නම් ආනන්දය, ඒ භික්ෂුව විසින් භාවනා රම්මණයෙහිම සිත මොනවට තැබිය යුතුයි. මොනවට පිහිටුවා ගත යුතුයි. එකඟකළ යුතුයි. එක අරමුණක පිහිටුවා ගත යුතුයි.

7. "ආනන්දය, භික්ෂුතෙම කෙසේ නම් සිත භාවනා අරමුණෙහිම තබාද? පිහිටුවයිද? එකඟ කරයිද? එක අරමුණක පිහිටුවයිද? ආනන්දය, මේ ශාසනයෙහි භික්ෂුතෙම කාමයන්ගෙන් වෙන්ව, අකුශල ධර්මයන්ගෙන් වෙන්ව, විතර්ක සහිතවූ, විචාර සහිතවූ, විවේකයෙන් හටගත් ප්‍රීති සැප ඇති, ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයිද, විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් තමාතුළ පැහැදීම ඇති කරන්නාවූ චිත්තයාගේ එකඟ බව ඇති කරන්නාවූ විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීති සැප ඇති, ද්වීතිය ධ්‍යානයට පැමිණ වාසයකරයිද, ප්‍රීතියගේද නොඇල්මෙන් උපෙක්ෂා ඇත්තේ, සිහි ඇත්තේ, නුවණ ඇත්තේ, සැපයද කයින් විඳියි. ඒ යම් ධ්‍යානයක් ආයර්‍ය්‍යයෝ උපෙක්ෂා ඇත්තේ, සිහි ඇත්තේ, සැප විහරණ ඇත්තේයයි වර්ණනා කරත්නම්, ඒ තෘතිය ධ්‍යානයට පැමිණ වාසය කරයිද, සැපය දුරු කිරීමෙන්ද, දුක්ඛය දුරු කිරීමෙන්ද, පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැසීමෙන් දුක් නැත්තාවූද, සැප නැත්තාවූද, උපෙක්ෂා ස්මෘති දෙදෙනාගේ පිරිසිදු බැව් ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයිද,

"ආනන්දය, භික්ෂුතෙම මෙසේ භාවනාරම්මණයෙහි සිත තබයි, පිහිටුවයි, සමාධිය උපදවයි. හෙතෙම තම ස්කන්ධයන්ගේ සූන්‍යතාවය මෙනෙහි කෙරෙයි. තම ස්කන්ධයන්ගේ සූන්‍යතාවය මෙනෙහි කරන්නාවූ ඔහුට තමා පිළිබඳ සූන්‍යතාවයේ සිත

නොබැස ගනී. නොපහදී. නොසිටී. මනාව නොපිහිටයි. ආනන්දය, එසේ ඇති කල්හි මහණ තෙමේ මෙසේ දැනගනියි, තම ස්කන්ධයන්ගේ සූන්‍යතාවය මෙනෙහි කරණ මාගේ සිත තමා පිළිබඳ සූන්‍යතාවයේ නොබැසගනී. නොපහදී. නොසිටී. ස්ථිරව නොපිහිටායයි දැනගනී. මෙහිදී කර්මස්ථානය සම්පූර්ණ නොවන බවද දැනගනී. හෙතෙම අන්‍යයන්ගේ ස්කන්ධ පිළිබඳ සූන්‍යතාවය මෙනෙහි කෙරේ. හෙතෙම තමාගේද අන්‍යයන්ගේද ස්කන්ධයන් පිළිබඳ සූන්‍යතාවය මෙනෙහි කෙරෙයි. අරූප සමාපත්තිය මෙනෙහි කෙරෙයි. අරූප සමාපත්තිය මෙනෙහි කරන්නාවූ ඔහුගේ සිත අරූප සමාපත්තියෙහි බැස නොගනී. නොපහදී. නොසිටී. ස්ථිරව නොපිහිටයි.

8. "ආනන්දය, එසේ ඇතිකල්හි, මහණතෙම මෙසේ දැනගනී. 'අරූපසමාපත්තිය මෙනෙහි කරන මාගේ සිත අරූප සමාපත්තියෙහි නොබැසගනී. 'නොපහදී. නොසිටී. ස්ථිරව නොපිහිටයි, කියායි. මෙහි කර්මස්ථානය සම්පූර්ණ නොවන බව දැනගන්නේය. ආනන්දය, ඒ භික්ෂුව විසින් ඒ පළමු සමාධි නිමිත්තෙහි තම ස්කන්ධයන් පිළිබඳ සිත තැබිය යුතුයි, පිහිටුවාගත යුතුයි, එකඟ කළයුතුයි, සමාධිය ඉපදවිය යුතුයි. හෙතෙම තම ස්කන්ධයන් පිළිබඳ සූන්‍යත්වය මෙනෙහි කෙරෙයි. තම ස්කන්ධයන් පිළිබඳ සූන්‍යත්වය මෙනෙහි කරන්නාවූ ඔහුගේ සිත තම ස්කන්ධයන් පිළිබඳ සූන්‍යතාවයේ බැසගනී. පහදියි, ස්ථිරව සිටියි.

9. "ආනන්දය, එසේ ඇති කල්හි, මහණතෙම මෙසේ දැනගනී. 'තම ස්කන්ධයන් පිළිබඳ සූන්‍යත්වය මෙනෙහි කරන්නාවූ මාගේ සිත තම ස්කන්ධයන් පිළිබඳ සූන්‍යත්වයෙහි බැසගනී, පහදී, සිටී, ස්ථිරව පිහිටයි,' කියායි. මෙසේ එහි කර්මස්ථානය සම්පූර්ණ නොවේයයි දැනගනී. හෙතෙම අන්‍යයන්ගේ ස්කන්ධ පිළිබඳ සූන්‍යතාවය මෙනෙහි කෙරෙයි. හෙතෙම තමාගේද අන්‍යයන්ගේද ස්කන්ධයන් පිළිබඳ සූන්‍යත්වය මෙනෙහි කෙරෙයි. හෙතෙම අරූප සමාපත්තිය

මෙනෙහි කෙරෙයි. අරූප සමාපත්තිය මෙනෙහි කරන්නාවූ ඔහුගේ සිත අරූප සමාපත්තියෙහි බැසගනී, පහදී, සිටී, ස්ථිරව පිහිටයි "ආනන්දය, මෙසේ ඇති කල්හි මහණතෙම මෙසේ දැනගනී. 'අරූප සමාපත්තිය මෙනෙහි කරණ මාගේ සිත අරූපසමාපත්තියෙහි බැසගනියි, පහදී, සිටී, ස්ථිරව පිහිටයි,' කියායි. මෙසේ මෙහිදී කර්මස්ථානය සම්පූර්ණ නොවේයයි දැනගනී.

10. "ආනන්දය, මේ සමථ විදර්ශනා විහරණයෙන් වාසය කරණ ඒ භික්ෂුවගේ සිත ඉදින් සක්මනට නැමෙයි නම් හෙතෙම සක්මන් කරයි. මෙසේ සක්මන් කරන ඔහුට අභිධ්‍යා දොම්නස් යන ලාමක අකුශලධර්ම පහළ නොවන්නාහුය. එහිදී මෙසේ ඒ කර්මස්ථානය සම්පූර්ණයයි දැනගනියි. ආනන්දය, මේ සමථ විදර්ශනා විහරණයෙන් යුක්තව වාසය කරණ භික්ෂුවගේ සිත ඉදින් සිටීමට නැමෙයි නම් හෙතෙම සිටී. මෙසේ සිටින ඔහුට අභිධ්‍යා දොම්නස් යන ලාමක අකුශල ධර්ම පහළ නොවන්නාහුය. මෙසේ එහිදී කර්මස්ථානය සම්පූර්ණයයි දැන ගනියි. ආනන්දය, මේ විහරණයෙන් යුක්තව වාසය කරන ඒ භික්ෂුවගේ සිත ඉදින් හිඳීම පිණිස නැමෙයි නම් හෙතෙම හිඳියි. මෙසේ හිඳින ඔහුට අභිධ්‍යා දොම්නස් යන ලාමක අකුශල ධර්මයෝ පහළ නොවන්නාහුය. මෙසේ එහිදී කර්ම ස්ථානය සම්පූර්ණයයි දැනගනී. ආනන්දය, මේ විහරණයෙන් වාසය කරන භික්ෂුවගේ සිත ඉදින් නිදීමට නැමෙයි නම් හෙතෙම නිදයි. මෙසේ සයනය කරන ඔහුට අභිධ්‍යා දොම්නස් යන ලාමක අකුශල ධර්ම පහළ නොවන්නාහුය. මෙසේ එහිදී කර්මස්ථානය සම්පූර්ණයයි දැනගනී

11. "ආනන්දය, මේ විහරණයෙන් යුක්තව වාසයකරන ඒ භික්ෂුවගේ සිත ඉදින් කථාවට නැමෙයි නම් හෙතෙමේ යම් කථාවක් ලාමකද, ග්‍රාම්‍යද, පෘථග්ජනයන්ට අයත්ද, අනාර්‍ය්‍යද අනර්ථයෙන් යුක්තද, කලකිරීම පිණිස නොපවතීද, නොඇල්ම පිණිස පවතීද, නිරෝධය පිණිස නොපවතීද, කෙලෙස් සංසිඳීම පිණිස නොපවතීද, විශෙෂ දැනීම පිණිස නොපවතීද, සම්‍යක්

අවබොධය පිණිස නොපවතීද නිර්වාණය පිණිස නොපවතීද, එනම්ඃ රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය, මහ ඇමතියන් පිළිබඳ කථාය, සේනා පිළිබඳ කථාය, භය පිළිබඳ කථාය, යුද්ධ පිළිබඳ කථාය, ආහාර පිළිබඳ කථාය, පානවර්ග පිළිබඳ කථාය, වස්ත්‍ර පිළිබඳ කථාය සයන පිළිබඳ කථාය, මල්මාලා පිළිබඳ කථාය, සුවඳ පිළිබඳ කථාය, නෑයන් පිළිබඳ කථාය, යාන පිළිබඳ කථාය, ගම් පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය, නගර පිළිබඳ කථාය, ජනපද පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, පුරුෂයන් පිළිබඳ කථාය, සුරා පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය, තොටුපලවල් පිළිබඳ කථාය, පෙර මළගියවුන් පිළිබඳ කථාය, නානත්වය පිළිබඳ කථාය, ලෝකය පිළිබඳ කථාය, (ලොකය මැවීම) මුහුද පිළිබඳ කථාය, ශාස්වත උච්ඡෙද පිළිබඳ කථාය, මෙසේ මෙබඳු කථා නොකරන්නෙමියි පිළිපදියි. මෙසේ එහි කර්මස්ථානය සම්පූර්ණ වීයයි දැනගනී.

12. "ආනන්දය, යම් ඒ කථාවක් කෙලෙස් කපා හරින්නීද, සිත විනිශ්චය කිරීමට සුදුසුද, ඒකාන්තයෙන් කලකිරීම පිණිස, විරාගය පිණිස, නිරෝධය පිණිස, කෙලෙස් සංසිඳවීම පිණිස, විශෙෂ දැනීම පිණිස, සත්‍යාවබෝධය පිණිස, නිර්වාණය පිණිස පවතීද, එනම්:- මද දෙයින් සතුටුවීම පිළිබඳ කථාය, ලද පමණින් සතුටුවීම පිළිබඳ කථාය, විවේකය පිළිබඳ කථාය බොහෝදෙනා එකතු නොවීම පිළිබඳ කථාය, පටන්ගන්නා ලද වීර්‍ය්‍යය පිළිබඳ කථාය, ශීලය පිළිබඳ කථාය, සමාධිය පිළිබඳ කථාය, ප්‍රඥාව පිළිබඳ කථාය, විමුක්තිය පිළිබඳ කථාය, විමුක්ති ඥානදර්ශනය පිළිබඳ කථාය, යන මොහුය. මෙසේ මෙබඳුවූ කථා කරන්නෙමිය සිත නැමෙයි. මෙසේ එහි කර්මස්ථානය සම්පූර්ණයයි දැනගනී.

13. "ආනන්දය, මේ විහරණයෙන් යුක්තව වාසයකරන ඒ භික්ෂුවගේ සිත ඉදින් විතර්කයට නැමෙයි නම් හෙතෙම ලාමකවූ පෘථග්ජනයන්ට අයත්වූ පිළිබඳවූ ආර්‍ය්‍යයන්ට අයත් නොවූ අනර්ථ සහිතවූ යම් මේ විතර්කයෝ වෙත් නම් (ඔව්හු) කලකිරීම් පිණිස නොපවතිත්ද, නොඇල්ම පිණිස නොපවතිත්ද, නිරෝධය පිණිස

නොපවතිත්ද, සංසිඳීම පිණිස නොපවතිත්ද, විශෙෂ දැනීම පිණිස නොපවතිත්ද, අවබෝධය පිණිස නොපවතිත්ද, නිර්වාණය පිණිස නොපවතිත්ද, ඒ නම් කාමවිතර්කය, ව්‍යාපාද විතර්කය, විහිංසා විතර්කයයි යන මොහුයි. මෙසේ මෙබඳු විතර්කයන් කල්පනා නොකරන්නේනෙමියි පිළිදියි මෙසේ එහිදී කර්මස්ථානය සම්පූර්ණයයි දැනගනී. "ආනන්දය, යම් මේ විතර්කයෝ පිරිසිදු වූවාහුද නෛර්‍යාණික වූවාහුද ඒ කරන්නහු මොනවට දුක් ක්ෂයකිරීම පිණිස පමුණුවන්නාහුද එනම්:- නෛෂ්ක්‍රම්‍ය විතර්කය අව්‍යාපාද විතර්කය, අවිහිංසා විතර්කය යන මොහුයි. මෙසේ මෙබඳු විතර්කයන් කල්පනා කරන්නෙමියි සිත නැමෙයි. මෙසේ එහි කර්මස්ථානය සම්පූර්ණයයි දැනගනී.

14. "ආනන්දය, මේ කාමගුණ පසකි. ඒ පස කවරහුද? චක්ෂුර්විඥානයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කැමතිවන්නාවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්ත ඇල්ම ඇතිකරන්නාවූ රූපයෙන්ද, ශ්‍රොත විඥානයෙන් දතයුතුවූ, ඉෂ්ටටවූ, කමනීයවූ, මනවඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමයෙන් යුක්ත ඇල්ම ඇතිකරන්නාවූ ශබ්දයෙන්ද, ඝ්‍රාණ විඥානයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කමනීයවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමයෙන් යුක්ත ඇල්ම ඇතිකරන්නාවූ ගන්ධයෝද, ජිව්හා විඥානයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කමනීයවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කාමයෙන් යුක්ත ඇල්ම ඇතිකරන්නාවූ රසයෝද, කාය විඥානයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්ත ඇල්ම ඇතිකරන්නාවූ ස්පර්ශයෝද යන මොහු ආනන්දය, මේ පඤ්චකාම ගුණයෝ වෙති.

15. "භික්ෂුව විසින් යම් අරමුණක උපදින්නාවූ ස්වකීය චිත්තය නිතර ප්‍රත්‍යවෙක්ෂා කටයුතුයි. කෙසේද? මේ පඤ්ච කාම ගුණ අතුරෙන්, එක්තරා එක්තරා, අරමුණක සිත හැසිරීමක් ඇතිවේද? එබන්දක් මට ඇත්තේද කියායි. ආනන්දය, ඉදින් භික්ෂුතෙම ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ නම් පඤ්චකාම ගුණයන්

අතුරෙන් එක්තරා, එක්තරා අරමුණක සිත හැසිරීමක් ඇතිවේද, එබන්දක් මට ඇත්තේයයි දැනගනීද. ආනන්දය, එසේ ඇති කල්හි මහණතෙම මෙසේ දැනගනී. ආනන්දය, එසේ ඇති කල්හි මහණතෙම මෙසේ දැනගනී. මේ පඤ්චකාම ගුණයන්හි යම්කිසි ඡන්දරාගයක් වේද, ඒ ඡන්දරාගය මා විසින් පහ නොකර ලද්දේය කියායි. මෙසේ එහි කර්මස්ථානය සම්පූර්ණ නැතැයි දැනගනී. ආනන්දය, ඉදින් වනාහි මහණතෙම ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ මෙ පඤ්චකාම ගුණයන් අතුරෙන් එක්තරා, එක්තරා අරමුණක චිත්තය හැසිරීමක් නොවේ යයි දැනගනීද, ආනන්දය, මෙසේ ඇතිකල්හි මහණතෙම මෙසේ දැනගනී. මේ පඤ්චකාම ගුණයන්හි යම් ඡන්දරාගයක් වේනම් මා විසින් එය පහකරනලදී කියායි. එහි කර්මස්ථානය සම්පූර්ණ යයි දැනගනී.

**16.** "ආනන්දය, භික්ෂුව විසින් යම් තැනක ඇතිවීම නැතිවීම නැවත නැවත දකිමින් වාසය කටයුතුද එබඳු මේ උපාදානස්කන්ධ පසකි. රූපය මෙසේය, රූපයාගේ පහළවීම මෙසේය, රූපයාගේ විනාශය මෙසේය, වේදනාව මෙසේය, වේදනාවගේ හටගැන්ම මෙසේය, වේදනාවගේ විනාශය මෙසේය, සංඥාව මෙසේය, සංඥාවගේ හටගැන්ම මෙසේය, සංඥාවේ විනාශය මෙසේය, සංස්කාර මෙසේය, සංස්කාරයන්ගේ හටගැන්ම මෙසේය, සංස්කාරයන්ගේ විනාශය මෙසේය, විඥානය මෙසේය, විඥානයාගේ හටගැන්ම මෙසේය, විඥානයාගේ විනාශය මෙසේයයි මේ උපාදාන ස්කන්ධ පසේ ඇතිවීම සහ නැතිවීම නැවත නැවත දකිමින් වාසය කරන ඔහුට උපාදාන ස්කන්ධ පසෙහි මම වෙමි යන යම් හැඟීමක් වේද, එය ප්‍රහීණ වෙයි. ආනන්දය, මෙසේ ඇතිකල්හි භික්ෂුතෙම මෙසේ දැනගනී. මේ උපාදානස්කන්ධ පසේ යම් මමය යන හැඟීමක් වේනම් එය මට ප්‍රහීනයයි යනුවෙනි. මෙසේ එහි කර්මස්ථානය සම්පූර්ණයයි දැනගනී. ආනන්දය, නුඹට ඒ මේ ධර්මයෝ ඒකාන්තයෙන් කුශල් වශයෙන් පැමිණියාහ, කෙලෙස් රහිතයහ, ලෝකෝත්තරයහ. මාරයා විසින් නොබැසගන්නා ලදහ.

17. "ආනන්දය, ඒ කුමකැයි හඟින්නෙහිද, කවර අර්ථයක් දක්නා ශ්‍රාවකතෙම වළකනලද නමුත් ශාස්තෘන් වහන්සේ අනුව යන්නට සුදුසු වේද?"

"ස්වාමීනි, ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල්කොට ඇත්තෝ නොවෙත්ද, භාග්‍යවතුන් වහන්සේ වෙතින් පැමිණීම ඇත්තෝ නොවෙත්ද, භාග්‍යවතුන් වහන්සේ පිළිසරණකොට ඇත්තෝ නොවෙත්ද, මේ වචනයේ අර්ථය භාග්‍යවතුන් වහන්සේම ප්‍රකාශ කරනසේක්වා. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරාගන්නාහුය."

18. "ආනන්දය, යම් මේ සූත්‍රධර්මයක් වේද, ගාථා ධර්මයක් වේද, විස්තර ධර්මයක් වේද, ඒ සඳහා ශ්‍රාවකතෙමේ ශාස්තෘන් වහන්සේ අනුව යන්නට නුසුදුසුය. ඊට හේතු කවරේද? ආනන්දය, තොප විසින් බොහෝ කාලයක් මුලුල්ලෙහි ධර්මය අසන ලද්දාහුද, දරණ ලද්දාහුද, වචනයෙන් පුරුදු කරණ ලද්දාහුද, සිතින් සලකා බලන ලද්දාහුද, නුවණැසින් අවබෝධ කරණ ලද්දාහුද, එහෙත් ආනන්දය, යම් මේ කථාවක් කෙළෙසුන් කපාහරින්නීද සිත විනිශ්චය කිරීමට සුදුසුද ඒකාන්තයෙන් කලකිරීම පිණිස, විරාගය පිණිස, නිරොධය පිණිස, ක්ලෙශයන්ගේ සංසිඳීම පිණිස, විශෙෂ දැනීම පිණිස, සත්‍යාවබෝධය පිණිස, නිර්වාණය පිණිස පවතීද. එනම්:- මද දෙයින් සතුටුවීම පිළිබඳ කථාය, ලද පමණින් සතුටුවීම පිළිබඳ කථාය, විවේකය පිළිබඳ කථාය, බොහෝදෙනා එකතුවීම පිළිබඳ කථාය, වීරියාරම්භය පිළිබඳ කථාය, සීලය පිළිබඳ කථාය, සමාධිය පිළිබඳ කථාය, ප්‍රඥාව පිළිබඳ කථාය, විමුක්තිය පිළිබඳ කථාය, විමුක්තිඥාන දර්ශනය පිළිබඳ කථාය යන මොවුහුයි. ආනන්දය, මෙබඳු කථා හේතුකොටගෙණ ශ්‍රාවකතෙම වළක්වනලද නමුත් ශාස්තෘන් වහන්සේ අනුව යන්නට සුදුසුය.

19. "ආනන්දය, එසේ ඇති කල්හි ආචාර්‍ය්‍යයා පිළිබඳ උපද්‍රව ඇතිවෙයි. එසේ ඇති කල්හි අතවැසියා පිළිබඳ උපද්‍රව ඇතිවෙයි. එසේ ඇතිකල්හි බ්‍රහ්මචර්‍ය්‍යාව පිළිබඳ උපද්‍රව ඇතිවෙයි.

"ආනන්දය, ආචාර්‍ය්‍යයා පිළිබඳ උපද්‍රවය කෙසේ වේද? ආනන්දය, මේ ලෝකයෙහි බාහිර ශාස්තෘවරයෙක් ජනගහණ නොවූ අරණ්‍ය සේනාසයක්, රුක් මුලක්, පර්වතයක්, කඳුරැලියක්, පර්වත ගුහාවක්, සොහොනක්, දුර වනසෙනසුනක්, එලිමහන් තැනක්, පිදුරුබිස්සක් සේවනය කරන්නේද, එසේ වෙන්ව වාසය කරණ ඔහු වෙත බ්‍රාහ්මණ ගෘහපතියෝද, නියම්ගම් වැසියෝද, ජනපද වාසීහුද පැමිණෙත්. පැමුණුනාවූ බ්‍රාහ්මණ ගෘහපතියන් කෙරෙහිද, නියම්ගම් වැසියන් කෙරෙහිද, දනව් වැස්සන් කෙරෙහිද, හෙතෙම මුළාවෙයි. තෘෂ්ණා වශයෙන් කැමති වෙයි. දැඩි ඇල්මට පැමිණෙයි. ප්‍රත්‍ය බහුල බවට පෙරළෙයි. මේ තෙමේ අනතුරට පත් ආචාර්‍ය්‍ය තෙමේයයි කියනු ලැබේ. කෙලෙසීම ඇතිකරණ, නැවත ඉපදීම ඇතිකරණ, විඩා ඇතිකරණ, දුක් විපාක ඇති, මත්තෙහි ජරා මරණ ඇතිවන, ලාමක අකුශල ධර්මයෝ ආචාර්‍ය්‍ය උපද්‍රවයෙන් යුත් ඔහු මැරූහ. ආනන්දය මෙසේ ආචාර්‍ය්‍ය උපද්‍රවය වෙයි.

**20.** "ආනන්දය, අතවැසි උපද්‍රවය කෙසේ වේද? ආනන්දය, ඒ ශාස්තෘවරයාගේ ශ්‍රාවකතෙම ඒ ශාස්තෘවරයාට අනුව විවේකය වඩන්නේ ජනගහණ නොවූ අරණ්‍ය සේනාසනයක් රුක් මුලක්, පර්වතයක්, කඳුරැලියක්, පර්වත ගුහාවක්, සොහොනක්, දුර වන සෙනසුනක්, එලිමහන් තැනක්, පිදුරු බිස්සක් සෙවුනේද, එසේ විවේකව වාසය කරන ඔහු කරා බ්‍රාහ්මණ ගෘහපතියෝද, නියම්ගම් වැසියෝද, ජනපද වාසීහුද පැමිණෙත්. හෙතෙම බ්‍රාහ්මණ ගෘහපතියන්ද, නියම්ගම් වැසියන්ද, දනව් වැසියන්ද, පැමිණි කල්හි මුලාවෙයි. ආශාවෙන් කැමති වෙයි. දැඩි ඇල්මට පැමිණෙයි. ප්‍රත්‍ය බහුල බවට පෙරළෙයි. ආනන්දය, මෙතෙම උවදුරට පැමිණි අතවැසියායයි කියනු ලැබේ. කෙලෙසීම ඇතිකරණ, නැවත ඉපදීම ඇතිකරණ, දුක් විපාක ඇති, මතු ජාති ජරා මරණ ඇතිවන, ලාමක අකුශල ධර්මයෝ අතවැසි උවදුරෙන් යුත් ඔහු මැරූහ. ආනන්දය, මෙසේ අතවැසි උපද්‍රවය වෙයි.

**21.** ආනන්දය, බ්‍රහ්මචාරී උපද්‍රවය කෙසේ වේද? ආනන්දය, මේ ලෝකයෙහි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ අෂ්ට විද්‍යා පසළොස්

චරණ ධර්මයන්ගෙන් යුත්, මනා ගති ඇති, තුන්ලොව දත්, නිරුත්තර, දමනය කළයුතු පුරුෂයන් දමනය කරන්නාවූ, දෙව්මිනිසුන්ට අනුශාසකවූ, චතුරාර්‍ය්‍ය සත්‍යය අවබෝධ කළ භාග්‍යවත් තථාගත තෙමේ පහළ වෙයි. ඒ තථාගතතෙමේ ජනගහණය නැති සෙනසුනක් අරණ්‍යයක්, ගස්මුලක්, පර්වතයක්, කඳුරැලියක්, පර්වතගුහාවක් සොහොනක්, දුර වන සෙනසුනක්, එලිමහන් තැනක්, පිදුරු බිස්සක් සේවනය කරයි. එසේ විවෙකව වාසය කරණ තථාගතයන්වෙත බමුණු ගැහැවියෝද, නියම්ගම් වැසියෝද දනම් වැසියෝද පැමිණෙත්. තථාගතතෙමේ බමුණු ගැහැවියන්ද, නියම්ගම් වැසියන්ද, දනව් වැසියන්ද පැමිණි කල්හි මුළා නොවෙයි. තෘෂ්ණා වශයෙන් කැමති නොවෙයි. දැඩි ඇල්මට නොපැමිණෙත්. ප්‍රත්‍ය බහුලත්වයට නොපෙරළෙයි.

"ආනන්දය, ශාස්තෘන් වහන්සේගේ ශ්‍රාවකතෙම ඒ ශාස්තෘන් වහන්සේට අනුව විවේකය වඩන්නේ, ජනගහණය නැති සෙනසුනක්, අරණ්‍යයක්, ගස්මුලක්, පර්වතයක් කඳුරැලියක්, පර්වතගුහාවක්, සොහොනක්, දුර වනසෙනසුනක්, එළිමහන් තැනක්, පිදුරු බිස්සක් සේවනය කරයි. එසේ විවේකව වාසය කරන ඔහු වෙතට බ්‍රාහ්මණ ගෘහපතියෝද, නියම්ගම් වැසියෝද, දනව් වැස්සෝද පැමිණෙත්. හෙතෙමේ බ්‍රාහ්මණ ගෘහපතියන්ද, නියම්ගම් වැසියන්ද, දනව් වැසියන්ද පැමිණි කල්හි මූළාවෙයි. තෘෂ්ණා වශයෙන් කැමති වෙයි. දැඩි ඇල්මට පැමිණෙයි. ප්‍රත්‍ය බහුල බවට පෙරළෙයි.

"ආනන්දය, මෙතෙමේ උවදුරට පත් බ්‍රහ්මචර්‍ය්‍යාව ඇත්තේයයි කියනු ලැබේ, කෙලෙසීම ඇතිකරණ, නැවත නැවත ඉපදීම් ඇතිකරණ, විඩා ඇතිකරණ, දුක් විපාක ඇති, මතු ජාති ජරා මරණ ඇතිවන, ලාමක අකුශල ධර්මයෝ බ්‍රහ්මචාරී උපද්‍රවයෙන් යුත් ඔහු මැරූහ. ආනන්දය, බ්‍රහ්මචාරී උපද්‍රවය මෙසේ වෙයි.

**22.** "ආනන්දය, එහි යම් මේ ආචාර්‍ය්‍ය උපද්‍රවයක් වේද යම් අන්තෙවාසික උපද්‍රවයක් වේද, මේ බ්‍රහ්මචාරී උපද්‍රවය ඔවුනට

වඩා අතිශයින් දුක් විපාක ඇත්තේද, අතිශයින් විපාක ඇත්තේද වෙයි. තවද නිරයෙහි ඉපදීම පිණිස පවතී. ආනන්දය, එහෙයින් මා මිත්‍රභාවයෙන් ආශ්‍රය කරව්. සතුරුකමින් ආශ්‍රය නොකරව්. එය තොපට බොහෝ කලක් හිත පිණිස, සැප පිණිස වන්නේය.

23. "ආනන්දය, කෙසේ නම් ශ්‍රාවකයෝ ශාස්තෘන් වහන්සේ සතුරුකමින් ඇසුරු කෙරෙත්ද? මිත්‍රභාවයෙන් ඇසුරු නොකෙරෙත්ද? ආනන්දය, මේ ශාසනයෙහි ශාස්තෘන් වහන්සේ අනුකම්පා ඇතුව, හිතවත්ව, මෙය තොපට හිත පිණිසය, මෙය තොපට සැප පිණිසයයි අනුකම්පාවෙන් ශ්‍රාවකයන්ට දහම් දෙසයි. උන්වහන්සේගේ කීම ශ්‍රාවකයෝ ඇසීමට කැමති නොවෙත්. කන් යොමු නොකෙරෙත්. දැනීම පිණිස සිත නොපිහිටුවත්. ශාස්තෘ ශාසනයෙන් බැහැරව පවතිත්. ආනන්දය, මෙසේ වනාහි ශ්‍රාවකයෝ ශාස්තෘන් වහන්සේට සතුරුව හැසිරෙත්. මිත්‍රත්වයෙන් ඇසුරු නොකරත්.

24. "ආනන්දය, කෙසේ නම් ශ්‍රාවකයෝ ශාස්තෘන් වහන්සේ මිත්‍රත්වයෙන් ඇසුරු කරත්ද? සතුරුකමින් ඇසුරු නොකෙරෙත්ද? ආනන්දය, මේ ශාසනයෙහි ශාස්තෘන් වහන්සේ අනුකම්පා ඇතියේ හිතවත්ව මේ තොපට හිත පිණිස, සැප පිණිස යයි අනුකම්පාවෙන් ශ්‍රාවකයන්හට දහම් දෙසයි. උන්වහන්සේගේ ශ්‍රාවකයෝ එය අසනු කැමති වෙති. කන් යොමත්. දැනීම සඳහා සිත පිහිටුවත්. ශාස්තෘ ශාසනයෙන් ඉවත් නොව පවතිත්. ආනන්දය, මෙසේ වනාහි ශ්‍රාවකයෝ ශාස්තෘන්වහන්සේ මිත්‍රත්වයෙන් ඇසුරු කෙරෙත්. සතුරුකමින් ඇසුරු නොකරත්. ඒ නිසා මිත්‍රත්වයෙන් මා ආශ්‍රය කරව්. සතුරුකමින් ආශ්‍රය නොකරව්. එය තොපට බොහෝ කලක් හිත පිණිස, සැප පිණිස පවත්නේය. ආනන්දය, කුඹල්කරු තෙම බිඳේය යන භයින් මනාව නොපිළිස්සුණු භාජන වහ වහා ඉවතට ගන්නාක් මෙන් මම ක්‍රියා නොකරන්නෙමි. ආනන්දය, මම නිග්‍රහ කොට කොට, දොෂයන් හැර හැර, නැවත නැවත අවවාද කරන්නෙමි. එකල තොපට යමක් හරය නම් එය පිහිටවන්නේය.

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළසේක. සතුටුවූ සිතැති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තේය.

**දෙවෙනි මහා සුඤ්ඤත සූත්‍රය නිමි. (3-2)**

---

## 23. ආශ්චර්‍ය්‍ය ධර්ම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ජේතවන නම් අනේපිඬු මහසිටුහුගේ ආරාමයෙහි වැඩ වාසය කරණසේක. එකල්හි සවස්වරුවෙහි පිණ්ඩපාතයෙන් වැළකුණු උපස්ථාන ශාලාවෙහි රැස්ව හුන් බොහෝ භික්ෂූන්ගේ මේ අතුරු කථාව ඇතිවිය. 'ඇවැත්නි, තථාගතයන් වහන්සේ මහත් ඍද්ධි ඇති බව, මහත් ආනුභාව ඇති බව ආශ්චර්‍ය්‍යය, පුදුමය. අතීතයෙහි පිරිනිවියාවූ සිඳිනලද තෘෂ්ණා, මාන, දෘෂ්ටි, ප්‍රපඤ්ච ඇති, සිඳිනලද කුසලාකුසල කර්ම වෘත්ත ඇති, කෙළවර කළ කුසලාකුසල කර්මයන් ඇති, සියලු විපාක වෘත්ත සංඛ්‍යාත දුක් ඉක්මවූ බුදුවරයන් තථාගතයන් වහන්සේ දැනගත්සේක. ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු ජාති ඇත්තෝ වූහයිද, ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු නම් ඇත්තෝ වූහයිද, ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු ගොත්‍ර ඇත්තෝ වූහයිද, ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු සිල් ඇත්තෝ වූහයිද, ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු සමාධි ඇත්තෝ වූහයිද, ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු ප්‍රඥා ඇත්තෝ වූහයිද, ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු විහරණ ඇත්තෝ වූහයිද, ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙසේ ක්ලෙශයන්ගෙන් මිදුණෝ වූහයිද කියායි.

2. "මෙසේ කී කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඒ භික්ෂූන්ට "ඇවැත්නි, තථාගතයන් වහන්සේලා ආශ්චර්‍ය්‍යයද වෙත්. ආශ්චර්‍ය්‍ය ධර්මයන්ගෙන් යුක්තද වෙත්.

ඇවැත්නි, තථාගතයන් වහන්සේලා අද්භූතද වෙත්. අද්භූත ධර්මයන්ගෙන්ද යුක්ත වෙත්යයි” කීහ.

ඒ භික්ෂූන්ගේ මේ අතුරු කථාව වනාහි නොනිමියේ වෙයි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවස් කාලයෙහි පලසමවතින් නැඟීසිටියේ උපස්ථාන ශාලාව යම් තැනකද එහි පැමිණිසේක. පැමිණ, පනවනලද අස්නෙහි වැඩහුන් සේක. වැඩහිඳ, භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා වදාළසේක. “මහණෙනි, මෙහි දැන් කිනම් කථාවකින් යුක්තවූවහුද? තොපගේ කවර නම් කථාවක් නොනිමියේදැ”යි ඇසූහ.

3. “ස්වාමීනි, මෙහි සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුණු උපස්ථාන ශාලාවෙහි රැස්වූ අපගේ මේ අතුරු කථාව විය. එනම්: ‘ඇවැත්නි, තථාගතයන් වහන්සේගේ මහත් ඍද්ධි ඇති බව, මහත් ආනුභාව ඇති බව, ආශ්චර්‍ය්‍යය, අද්භූතය. අතීතයේදී පිරිනිවියාවූ, සිඳිනලද තෘෂ්ණා, මාන, දෘෂ්ටි, ප්‍රපඤ්ච ඇත්තාවූ, කෙළවර කළ කුශලාකුශල කර්ම වෘත්ත ඇත්තාවූ, විපාක වෘත්ත සංඛ්‍යාත සියලු දුක් ඉක්මවූ, බුදුවරයෝ වෙත්ද, උන්වහන්සේලා අප තථාගතයන් වහන්සේ දැනගත් සේක. (කෙසේද?) ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු ජාති ඇත්තෝ වූහයිද, ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු නම් ඇත්තෝ වූහයිද, ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු ගොත්‍ර ඇත්තෝ වූහයිද, ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු සිල් ඇත්තෝ වූහයිද, ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු සාමධි ඇත්තෝ වූහයිද, ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු ප්‍රඥා ඇත්තෝ වූහයිද, ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු විහරණ ඇත්තෝ වූහයිද, ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙසේ ක්ලෙශයන්ගෙන් මිදුණෝ වූහයිද කියායි. ස්වාමීනි, මෙසේ කී කල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අපට “ඇවැත්නි, තථාගතවරයෝ ආශ්චර්‍ය්‍යය. ආශ්චර්‍ය්‍යය ධර්මයන්ගෙන් යුක්තද වෙත්. ඇවැත්නි, තථාගතයෝ අද්භූතය, අද්භූත ධර්මයන්ගෙන්ද යුක්ත වෙත්යයි’ කීහ, “ස්වාමීනි, අපගේ මේ අතුරු කථාව නොනිමියේය. එවිට

භාග්‍යවතුන් වහන්සේ වැඩිසේකැයි” කීහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් ඇමතූසේක.”

4. “එසේනම් ආනන්දය, නුඹට මෙහිදී තථාගතයන් වහන්සේගේ ආශ්චර්‍ය්‍යය අද්භූත ධර්මයෝ බෙහෙවින් වැටහෙත්වා.”

“භාග්‍යවතුන් වහන්ස,

‘ආනන්දය, බොධිසත්ව තෙමේ සිහි නුවණින් යෙදී තුසිත දෙවියන් කෙරෙහි උපන්නේය’ යන මෙය භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසනලදී. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පිළිගන්නාලදී.

“ස්වාමීනි, සිහිනුවණ දෙකින් යුක්තව බෝසත් තෙම තුසිත දෙව්ලොව උපන්නේය යන මෙය භාග්‍යවතුන් වහන්සේගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි මම දරමි.”

“ස්වාමීනි, මෙය භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසන ලදි. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙන් පිළිගන්නා ලදී.

“ආනන්දය, බෝසත් තෙම ආයු ඇතිතාක් තුසිත ලෝකයෙහි සිටියේය”යි කියායි.

“ස්වාමීනි, බෝසත්තෙම ආයු ඇතිතාක් තුසිත ලෝකයෙහි සිටියේය යන මෙය භාග්‍යවතුන් වහන්සේගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙකැයි මම දරමි.”

5. “ස්වාමීනි, මෙය භාග්‍යවතුන් වහන්සේගෙන් අසන ලදී. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා පිළිගන්නා ලදී. “ආනන්දය, සිහිනුවණ දෙකින් යුක්තව බෝසත්තෙම තුසිත ලෝකයෙන් චුතව මව්කුස පිළිසිඳ ගත්තේය” යනුයි.

“ස්වාමීනි, සිහිනුවණ දෙකින් යුක්තව බෝසත්තෙම තුසිත ලෝකයෙන් චුතව මව්කුස පිළිසිඳ ගත්තේය යන මෙය භාග්‍යවතුන් වහන්සේගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙකැයි මම දරමි,”

**6.** "ස්වාමීනි, මෙය භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසන ලදී. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා පිළිගන්නා ලදී.

"ආනන්දය, බෝසත්තෙම යම්කලෙක තුසිත ලෝකයෙන් චුතව මවුකුස පිළිසිඳ ගත්තේද එකල දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලෝකයෙහි දෙව් මිනිසුන් සහිත මහණ බමුණන් සහිත ප්‍රජාව කෙරෙහි අප්‍රමාණවූ, මහත් වූ, ආලොකයක් දෙවියන්ගේ දෙවානුභාවය ඉක්මවා පහළවෙයි. යම් තැනක මෙසේ මහත් ඍද්ධි ඇති මෙසේ මහත් ආනුභාව ඇති මේ සඳ හිරු දෙදෙන ආලොකයෙන් එළිය කරන්නට නොපොහොසත් නොවැසුනු, අඳුරු ඇති, ඝනවූ අඳුරු ඇති යම් ඒ ලෝකන්තරික නිරයක් වේද, එහිද අප්‍රමාණවූ උළාර ආලොකයක් දෙවියන්ගේ දෙවානුභාවයත් ඉක්මවා ලොකයෙහි පහළවෙයි. එහි යම් සත්වයෝ උපන්නාහුද, ඔව්හුද ඒ එළියෙන් ඔවුනොවුන් මෙහි උපද සිටින තවත් සත්වයෝ ඇතැයි හැඳින ගනිත්.

"මේ දස දහසක් ලොකධාතුව හාත්පසින් කම්පා වෙයි. අතිශයින් කම්පාවෙයි, වෙවුලායයි. මහත්වූ ආලෝකයක් ලෝකයෙහි දෙවියන්ගේ දෙවානුභාවයත් ඉක්මවා පහළ වෙයි" යනුයි

"ස්වාමීනි, බෝධිසත්වයන් වහන්සේ යම් කලක තුසිත දෙව්ලොවින් චුතව, මවුකුස පිළිසිඳ ගත්තේද, එකල දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත ලොකයෙහි දෙව්මිනිසුන් සහිත, මහණ බමුණන් සහිත, ප්‍රජාව කෙරෙහි අප්‍රමාණ වූ, මහත්වූ, ආලෝකයක් දෙවියන්ගේ දේවානුභාවය ඉක්මවා පහළ වෙයිද; නොවැසුණු අඳුරු ඇති, ඝනවූ අඳුරු ඇති, යම් ඒ ලෝකන්තරික නම් අපායක්වේද, යම් තැනක මෙසේ මහත් ඍද්ධි ඇති, මෙසේ මහත් අනුභාව ඇති මේ සඳහිරු දෙදෙන ආලෝකයෙන් එළිය කරන්නට නොපොහොසත්ද, එහිද අප්‍රමාණවූ, උළාර ආලෝකයක් දෙවියන්ගේ දේවානුභාවය ඉක්මවා ලෝකයෙහි පහළවෙයිද, එහි යම් සත්වයෝ උපන්නාහුද ඔව්හුද ඒ එළියෙන් ඔවුනොවුන් හැඳින ගනිත්. මෙහි උපන්

තවත් සත්වයෝ වෙත්යයි කියායි. මේ දසදහසක් ලෝකධාතුව හාත්පසින් කම්පාවෙයි. අතිශයින් කම්පාවෙයි. වෙවුලයි. මහත්වූ එළියක් දෙවියන්ගේ දේවානුභාවයන් ඉක්මවා ලෝකයෙහි පහළ වෙයි යන යමක්වේද, මෙයද භාග්‍යවතුන් වහන්සේගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙකැයි මම දරමි."

7. "ස්වාමීනි, මෙය භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසන ලදී. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා පිළිගන්නා ලදී.

"ආනන්දය, යම් කලෙක බෝසත්තෙම මවුකුසට බැස ගත්තේ වේද, එකල ඒ බෝසතුනුත් බෝසත් මවත් මිනිසෙක් හෝ අමනුෂ්‍යයෙක් හෝ කිසිවෙක් නොපෙළාවායි දෙවියන් සතර දෙනෙක් ඔහුට ආරක්ෂාව පිණිස සිව්දිග එළඹ සිටිති" යනුයි.

"ස්වාමීනි, බෝධිසත්වයන් වහන්සේ යම් කලක මවුකුසට බැසගත්තේ වේද, (එකල) ඒ බෝසතුන්ද බෝසත් මවද කිසියම් මනුෂ්‍යයෙක් හෝ අමනුෂ්‍යයෙක් හෝ නොපෙළාවායි, දෙවියන් සතර දෙනෙක් ඔහු රැකීම පිණිස සිව්දිග එළඹ සිටිති යන යමක් වේද, මෙයද භාග්‍යවතුන් වහන්සේගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි මම දරමි."

8. "ස්වාමීනි, මෙය භාග්‍යවතුන් වහන්සේ ගෙන් අසන ලදී. භාග්‍යවතුන් වහන්සේ ගෙන් අසා පිළිගන්නා ලදී."

"ආනන්දය, යම් කලෙක බෝසත්තෙම මව් කුසට බැසගත්තේද, (එතැන් පටන්) බෝසත් මව ස්වභාවයෙන් සිල්වත් වන්නීය. ප්‍රාණඝාතයෙන් වෙන් වන්නීය. නොදුන් දෙය ගැන්මෙන් තොර වන්නීය. වරදවා කාමයෙහි හැසිරීමෙන් තොර වන්නීය. බොරු කීමෙන් තොර වන්නීය. රහමෙර පානයෙන් තොර වන්නීය" කියායි.

"ස්වාමීනි, යම් කලෙක බෝධිසත්වයන් වහන්සේ මව් කුසට බැසගත්තේ වේද, (එකල්හි) බෝසත්මව ප්‍රකෘතියෙන් සිල්වත් වන්නීය. ප්‍රාණඝාතයෙන් වෙන් වන්නීය. නොදුන් දෙය

ගැන්මෙන් වෙන් වන්නීය. කාමයෙහි වරදවා හැසිරීමෙන් වෙන් වන්නීය. බොරුකීමෙන් වෙන් වන්නීය. රහමෙර පානයෙන් වෙන් වන්නීය, යන යමක් වේද, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ මේද ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි මම දරමි.

**9.** "ස්වාමීනි, මෙය භාග්‍යවතුන් වහන්සේ ගෙන් අසන ලදී. භාග්‍යවතුන් වහන්සේ ගෙන් අසා පිළිගන්නා ලදී."

"ආනන්දය, යම් කලෙක බොසත් තෙම මව් කුසට බැසගත්තේද, (එතැන් පටන්) බෝසත් මවට පුරුෂයන් කෙරෙහි කාමයෙන් යුත් සිතක් නූපදී. රාගසිතින් කිසිවකුට බෝසත් මව වෙත එළඹිය නොහැක යනුයි."

"ස්වාමීනි, යම් කලෙක බෝධිසත්වයන් වහන්සේ මව් කුසට බැසගත්තේ වේද, (එකල) බෝසත් මවට පුරුෂයන් කෙරෙහි කාමයෙන් යුත් සිතක් නූපදී. රාග සිතින් කිසිවෙකුට බෝසත් මව වෙත එළඹිය නොහැක, යන යමක් වේද, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ මේද ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි මම දරමි.

**10.** "ස්වාමීනි, මෙය භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසනලදී. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා පිළිගන්නාලදී."

"ආනන්දය, යම් කලෙක බෝසත් තෙම මව් කුසට බැසගත්තේ වේද, බෝසත් මව පස්කම් ගුණ බොහෝ කොට ලබන්නියක් වෙයි. පස්කම් ගුණයෙන් යුක්තවූ සමන්විතවූ ඕ තොමෝ සතුටු වෙයි. (යනුයි)"

"ස්වාමීනි, යම් කලෙක බෝධිසත්වයන් වහන්සේ මව් කුසට බැස්සේ වේද, (එකල) බෝසත් මව පස්කම් ගුණ ලබන්නියක් වන්නීය. ඒ මව පස්කම් ගුණයෙන් යුක්ත වන්නීය. සම්පූර්ණ වන්නීය. පිරිවරන්නීය, යන යමක් වේද, ස්වාමීනි, මෙයද භාග්‍යවතුන් වහන්සේගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි මම දරමි.

**11.** "ස්වාමීනි, මෙය භාග්‍යවතුන් වහන්සේගෙන් අසන ලදී. භාග්‍යවතුන් වහන්සේ ගෙන් අසා පිළිගන්නා ලදී.

"ආනන්දය, යම් කලෙක බෝසත්තෙම මවු කුසට බැසගත්තේ වේද, (එතැන්පටන්) බෝසත් මවට කිසි ආබාධයක් නොඋපදී. බෝසත් මව සැප ඇත්තියක් වන්නීය. ක්ලාන්ත නොවූ කය ඇත්තියක් වන්නීය. බෝසත් මව කුසතුළ සිටින නොපිරිහුනු ඉන්ද්‍රිය ඇති සියලු අංග ප්‍රත්‍යංගයන්ගෙන් යුත් බෝසතුන් දකී. ආනන්දය, යහපත්වූ ජාතිමත්, පැති අටක් ඇති, හොඳට පිරියම් කළ, වෛඩූර්‍ය්‍ය මාණික්‍යය යම් සේද එය නිල් පාට හෝ කහ පාට හෝ ලේපාට හෝ සුදුපාට හෝ පඬුපාට හෝ නූලකින් අවුනන ලද්දේ නම් එය ඇස් ඇති පුරුෂයෙක් අතට ගෙණ විමසා බලන්නේ මෙය වනාහි යහපත් ජාතිමත්, අටැස් ඇති, හොඳට පිරියම් කරණලද වෙරළු මිණෙකි. එහි නිල් හෝ කහ හෝ රතු හෝ සුදු හෝ පඬුවන් හෝ නූලක් අවුනන ලද්දේයයි යම්සේ දක්නේද ආනන්දය, එපරිද්දෙන්ම යම් කලෙක බෝසත් තෙම මවු කුසට බැසගත්තේ වේද, බෝසත් මවට කිසිත් ආබාධයක් නොවෙයි. බෝසත් මව ක්ලාන්ත නොව සැප ඇත්තියක් වෙයි. බෝසත් මව කුසතුළ සිටින සියලු අඟපසඟින් යුත් නොපිරිහුනු ඉඳුරන් ඇති බෝසතුන් දකී යනුය."

"ස්වාමීනි, යම් කලක බෝධිසත්වයන් වහන්සේ මව් කුසට බැසගත්තේ වේද, (එකල) බෝසත් මවට කිසි ආබාධයක් නූපදී. බෝසත් මව සැපැත්තියක් වන්නීය. ක්ලාන්ත නොවූ කය ඇත්තියක් වන්නීය. බෝසත් මව කුසතුළසිටින නොපිරිහුණු ඉන්ද්‍රිය ඇති සියලු අඟපසඟින් යුත් බෝසත්හු දකී. ස්වාමීනි, යහපත්වූ, ජාතිමත්, පැති අටක් ඇති, හොඳට පිරියම් කළ, වෙරළුමිණියක් වේද එය නිල්පාට හෝ, කහ පාට හෝ ලේපාට හෝ සුදුපාට හෝ, පඬු පාට හෝ, නූලකින් අවුණන ලද්දේද, එය ඇස් ඇති පුරුෂයෙක් අතට ගෙන විමසා බලන්නේ යහපත්, ජාතිමත්, අටැස් ඇති හොඳට පිරියම් කරනලද එහි නිල් හෝ කහ හෝ, ලේ හෝ, සුදු හෝ, පඬුවන් හෝ, නූලක් අමුණන ලද්දේ යම්සේ දකීද, ස්වාමීනි, එපරිද්දෙන්ම යම් කලෙක බෝධිසත්වයන් වහන්සේ මවු කුසට බැසගත්තේ වේද, එකල, බෝසත් මවට කිසිත් ආබාධයක් නොවෙයි. බෝසත් මව

ක්ලාන්ත නොවූ සැපැත්තියක් වන්නීය, බෝසත් මව, කුස තුළ සිටින සියලු අඟපසඟින් යුත්, නොපිරිහුනු ඉඳුරන් ඇති, බෝසත්හු දකී, යන යමක් වේද, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ මෙයද ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙකැයි මම දරමි.

12. "ස්වාමීනි, මෙය භාග්‍යවතුන් වහන්සේගෙන් අසන ලදී. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා පිළිගන්නා ලදී.

"ආනන්දය, බෝසතුන් ඉපදී සත් දවසකදී බෝසත් මව කලුරිය කෙරෙයි. කළුරිය කොට තුසිත දිව්‍යලොකයෙහි උපදී යනුයි."

"ස්වාමීනි, බෝසතුන් ඉපද සත් දවසකදී, බෝසත් මව කලුරිය කරන්නීය. කළුරිය කොට තුසිත දිව්‍ය ලෝකයෙහි උපදින්නීය යන යමක් වේද, ස්වාමීනි, මෙයද භාග්‍යවතුන් වහන්සේගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙකැයි මම දරමි."

13. 'ස්වාමීනි, මෙයද භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙන් අසනලදී. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා පිළිගන්නා ලදී"

"ආනන්දය, අන් ස්ත්‍රීහු නවමසක් හෝ දසමසක් දරු ගැබ කුසින් උසුලා යම්සේ වදත්ද බෝසත් මව එසේ නොවදන්නීමය. බෝසත් මව දසමසක්ම බෝසත්හු කුසින් උසුලා සිට වදන්නීය යනුයි."

'ස්වාමීනි, අන් ස්ත්‍රීහු නවමසක් හෝ දසමසක් හෝ දරු ගැබ කුසින් උසුලා යම්සේ වදත්ද, බෝසත් මව එසේ නොවදන්නීය, බෝසත් මව දසමසක් බෝසත්හු කුසින් උසුලා ප්‍රසූත කරන්නීය. යන යමක් වේද ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ මෙයද ආශ්චර්‍ය්‍ය, අද්භූත ධර්මයකැයි දරමි.

14. "ස්වාමීනි, මෙය භාග්‍යවතුන් වහන්සේ ගෙන් අසන ලදී. භාග්‍යවතුන් වහන්සේ ගෙන් අසා පිළිගන්නා ලදී."

"ආනන්දය, යම් කලෙක වනාහි අන් ස්ත්‍රීහු හිඳ හෝ නිදා වදත්. බෝසත් මව බෝසතුන් එසේ නොවදයි. බෝසත් මව බෝසත්හු සිටගෙනම වදයි" යනුයි.

"ස්වාමීනි, යම් කලෙක වනාහි අන් ස්ත්‍රීහු හිඳ හෝ නිදා වදත්. බෝසත් මව බෝසත්හු එසේ නොවදන්නීය. බෝසත් මව බෝසත්හු සිටගෙනම වදන්නීය යන යමක් වේද, ස්වාමීන් වහන්ස, මෙයද භාග්‍යවතුන් වහන්සේගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙකැයි මම දරමි."

15. "ස්වාමීනි, මෙය භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසන ලදී. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා පිළිගන්නා ලදී."

"ආනන්දය, යම් කලෙක බෝසත් තෙම මව් කුසින් නික්මේද, දෙවියෝ ඔහු පළමු කොට පිළිගනිත්. පසුව මනුෂ්‍යයෝ පිළිගනිති යනුයි."

'ස්වාමීනි, යම් කලෙක බෝසත්තෙම මවුකුසින් නික්මේද (එකල) දෙවියෝ ඔහු පළමු කොට පිළිගනිත්. පසුව මනුෂ්‍යයෝ පිළිගනිති යන යමක් වේද, ස්වාමීනි, මෙයද භාග්‍යවතුන් වහන්සේගේ ආශ්චර්‍ය්‍ය, අද්භූත ධර්මයෙකැයි මම දරමි.

16. "ස්වාමීනි, මෙයද භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසනලදී. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා පිළිගන්නා ලදී.

"ආනන්දය, යම් කලෙක බෝසත් තෙම මව් කුසින් නික්මේද, බෝසත් තෙම බිමට පැමිණීමට පළමුව දිව්‍ය පුත්‍රයන් සතර දෙනෙක් ඔහු පිළිගෙණ 'දේවියනි, සතුටු වුව මැනව. ඔබට මහේශාක්‍ය පුතෙක් උපන්නේයයි' මව ඉදිරියෙහි තබත් යනුයි."

ස්වාමීනි, මෙයද භාග්‍යවතුන් වහන්සේගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙකැයි මම දරමි."

17. "ස්වාමීනි, මෙය භාග්‍යවතුන් වහන්සේ වෙතින් අසනලදී. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා පිළිගන්නා ලදී."

"ආනන්දය, යම් කලෙක බෝසත්තෙම මවුකුසින් නික්මේද, (එකල) ජලධාරා දෙකක් අහසින් පහළවෙයි. එකක් සීත ජලයය, එකක් උණුදියය. යමකින් බෝසතුන්ට හා බෝසත් මවට වතුරෙන් කළයුත්තක් කෙරේද, එබඳු උදක ධාරා දෙකකි යනුයි."

"ස්වාමීනි, යම් කලෙක බෝසත්තෙම මව්කුසින් නික්මේද (එකල) ජලධාරා දෙකක් අහසින් පහළවෙයි. එකක් සීත ජලය, එකක් උෂ්ණ ජලය, යමකින් බෝසතුන්ට හා බෝසත් මවට දිය කිස කෙරෙත්ද, එබඳුවූ ජලධාරා දෙකකි යන යමක් වේද, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ මෙයද ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙකැයි මම දරමි."

18. "ස්වාමීනි, මෙය භාග්‍යවතුන් වහන්සේගෙන් අසනලදී. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා පිළිගන්නාලදී."

"ආනන්දය, උපන් කෙණෙහි බෝසත්තෙම සමවූ පාදයෙන් පොළොවෙහි පිහිටා සේසත දරන කල්හි උතුරුදිගට මුහුණලා සත් පියවරක් යයි. සියලු දිශාවන් බලයි. ලොකයාට මම අග්‍ර වෙමි. ලොකයාට මම ශ්‍රේෂ්ඨ වෙමි. ලොකයාට මම ජ්‍යෙෂ්ඨ වෙමි. මේ මගේ අන්තිම ඉපදීමයි. නැවත උත්පත්තියක් නැත යන වචනය කියන්නේය යනුයි."

"ස්වාමීනි, උපන් කෙණෙහි බෝසත්තෙම සම පයින් පොළොවෙහි පිහිටා උතුරුදිග බලා සත් පියවරක් යයි (දිව්‍ය) සේසත දරණ කල්හි සියලු දිශාවන් බලයි. ලෝකයාට මම අග්‍ර වෙමි. ලෝකයාට මම ශ්‍රේෂ්ඨ වෙමි. ලෝකයාට මම ජ්‍යෙෂ්ඨ වෙමි. මේ මාගේ අන්තිම උත්පත්තියයි. නැවත උත්පත්තියක් නැත යන නිර්භීත වචනය කියන්නේය යන යමක් වේද, ස්වාමීනි, මෙයද භාග්‍යවතුන් වහන්සේගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙකැයි මම දරමි.

19. "ස්වාමීනි, මෙය භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙන් අසනලදී. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා පිළිගන්නා ලදී."

"ආනන්දය, යම් කලෙක බෝසත් තෙම මවුකුසින් නික්මේද, එකල්හි දෙවියන් සහිත, මරුන් සහිත, බ්‍රහ්මයන් සහිත, ලෝකයෙහි දෙව්මිනිසුන් සහිත, මහණ බමුණන් සහිත ප්‍රජාව කෙරෙහි දෙවියන්ගේ දෙවානුභාවය ඉක්මවා ලෝකයෙහි අප්‍රමාණවූ, මහත්වූ, ආලොකයක් පහළවෙයි. නිතර විවෘතවූ,

නොවැසුනු අඳුරු ඇති, ඝනවූ අඳුරු ඇති, යම් ඒ ලොකන්තරික නිරයක් වේද, යම් තැනක මෙසේ මහත් ඍද්ධි ඇති, මෙසේ මහත් ආනුභාව ඇති, මේ සඳ හිරු දෙදෙන ආලෝකයෙන් එලිය කරන්නට නොපොහොසත්ද, එහිද අප්‍රමාණ උළාර ආලෝකයක් දෙවියන්ගේ දෙවානුභාවයත් ඉක්මවා ලෝකයෙහි පහළවෙයි. එහි යම් සත්වයෝ උපන්නාහුද ඔව්හුද ඒ ආලෝකයෙන් ඔවුනොවුන් මෙහි උපන් අන්‍ය සත්වයෝත් ඇතැයි හැඳිනගනිත්. මේ දසදහසක් ලොකධාතුව හාත්පසින් කම්පා වෙයි, අතිශයින් කම්පාවෙයි වෙවුලායයි, මහත්වූ එලියක් දෙවියන්ගේ දෙවානුභාවය ඉක්මවා පහළවෙයි යනුයි."

"ස්වාමීනි, යම් කලක බෝසත්තෙම මව්කුසින් නික්මේද එකල්හි දෙවියන් සහිත, මරුන් සහිත, බ්‍රහ්මයා සහිත ලෝකයෙහි දෙව්මිනිසුන් සහිත, මහණ බමුණන් සහිත, ප්‍රජාව කෙරෙහි දෙවියන්ගේ දෙවානුභාවය ඉක්මවා ලෝකයෙහි අප්‍රමාණවූ, මහත්වූ, ආලෝකයක් පහළවෙයි. නිතර විවෘතවූ, නොවැසුනු අඳුරු ඇති, ඝනවූ අඳුරු ඇති, යම් ඒ ලොකන්තරික නම් නිරයක්වේද, යම් තැනක මෙසේ මහත් ඍද්ධි ඇති, මෙසේ මහත් ආනුභාව ඇති, මේ සඳ හිරු දෙදෙන ආලෝකයෙන් එළිය කරන්නට අපොහොසත්ද, එහිද අප්‍රමාණවූ, උළාරවූ එළියක් දෙවියන්ගේ දෙවානුභාවය ඉක්මවා ලෝකයෙහි පහළ වෙයි. එහි යම් සත්වයෝ උපන්නාහුද, ඔව්හුද ඒ ආලෝකයෙන් මෙහි උපන් අන්‍ය සත්වයෝත් ඇතැයි ඔවුනොවුන් හැඳිනගනිති. මේ දසදහසක් ලෝකධාතුව හාත්පසින් කම්පාවෙයි, වෙවුලයි. මහත්වූ එළියක් දෙවියන්ගේ දේවානුභාවය ඉක්මවා පහළවෙයි යන යමක් වේද, ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ මෙයද ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙකැයි මම දරමි."

**20.** "ආනන්දය, එහෙයින් නුඹ මෙහිදී තථාගතයන් වහන්සේගේ මේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයද දරාගනුව. ආනන්දය, මෙහි තථාගතයන් වහන්සේට දැනුවත්වම වේදනා උපදිත්. දැනුවත්වම දරා පවතිත්. දැනුවත්වම විනාශයට යත්. දැනුවත්වම

සංඥාවෝ උපදිත්. දැනුවත්වම විතර්කයෝ උපදිත්. දැනුවත්වම දරා පවතිත්. දැනුවත්වම විනාශයට යත්. ආනන්දය, නුඹ මෙයද තථාගතයන් වහන්සේගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙකැයි දරව."

"ස්වාමීනි, යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේට දැනුවත්වම වේදනා උපදිත්ද, දැනුවත්වම දරා පවතිත්ද, දැනුවත්මව විනාශයට යත්ද, දැනුවත්වම සංඥා උපදිත්ද දැනුවත්වම විතර්ක උපදිත්ද, දැනුවත්වම දරා පවතිත්ද, දැනුවත්වම විනාශයට යත්ද, ස්වාමීනි, මෙයද භාග්‍යවතුන් වහන්සේගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙකැයි දරමි."

"ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ මෙය ප්‍රකාශ කළේය. ශාස්තෘන් වහන්සේ (එය) අනුදන්නා ලද්දේ විය. සතුටුවූ ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්වහන්සේගේ ඒ දෙශනය සතුටින් පිළිගත්හ.

**තෙවන ආශ්චර්‍ය්‍ය ධර්ම සූත්‍රය නිමි (3-3)**

## 24. බක්කුල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙමේ රජගහ නුවර සමීපයෙහිවූ, කලන්දකනිවාප නම්වූ වෙලුවනාරාමයෙහි වැඩ වෙසෙයි. එකල්හි, ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙමේ පැරණි ගිහි යහලුවෙක්වූ අචේල කාශ්‍යපතෙම ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන් යම් තැනකද, එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන් සමග සතුටුවිය. සතුටුවියයුතු සිහිකටයුතු කථා කොට නිමවා, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ අචේල කාශ්‍යපතෙම ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන් ගෙන් මෙසේ ඇසීය.

2. "ඇවැත්, බක්කුලය, මහණවී කොපමණ කල් වෙහිද?"

"ඇවැත්නි, පැවිදිවූ මට අවුරුදු අසූවකි."

"ඇවැත් බක්කුලය, මේ අසූ වයස් කාලයෙහි ඔබ විසින් කීවරක් මෙවුන්දම් සෙවුනා ලදද?"

"ඇවැත්, කාශ්‍යපය, මගෙන් 'ඇවැත්නි, බක්කුලය, ඔබ විසින් මේ අසූ වයස් පමණ කාලය ඇතුළත, කී වරක් මෙවුන්දම් සෙවුනා ලදැයි මෙසේ නොඇසිය යුතුයි. ඇවැත් කාශ්‍යපය, මගෙන් මෙසේ ඇසිය යුතුය. කෙසේද? 'ඇවැත් බක්කුලය, මේ අසූ වයස් කාලයෙහි ඔබට කී වරක් කාම සංඥාව පහළ වූයේදැයි ඇසිය යුතුය."

"ඇවැත්, බක්කුලය, මේ අසූ වයස් කාලය තුළ කී වරක් ඔබට කාම සංඥාව උපන්නේද?"

"ඇවැත්, කාශ්‍යපය, පැවිදිවූ මට අවුරුදු අසූවකි. ඒ කාලය තුළ කාම සංඥාව උපන් බවක් නොදනිමි."

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම වස් අසූවක් කාලය තුළ කාම සංඥාවක් උපන් බවක් නොදනී නම් ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ මෙයද ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු."

3. "ඇවැත්නි, පැවිදිව අසූ වයස් ඇති මට ව්‍යාපාද සංඥාවක් විහිංසා සංඥාවක් උපන් බවක්ද මම නොදනිමි."

"යම් හෙයකින් අසූවයස් ඇති ආයුෂ්මත් බක්කුල ස්ථවිර තෙම ඒ කාලය තුළ යම් ව්‍යාපාද සංඥාවක් විහිංසා සංඥාවක් උපන් බවක් නොදනී නම්, මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙකැයි අපි දරමු."

4. "ඇවැත්නි, පැවිදිව අසූ වයස් ඇති මට කාම විතර්කයක් උපන් බවක් නොදනිමි." "යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම වස් අසූවකින් යම් කාම විතර්කයක් උපන් බවක් නොදනී නම් මෙයද ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙකැයි අපි දරමු."

5. "ඇවැත්නි, පැවිදිව අසූ වයස් ඇති මට ව්‍යාපාද විතර්කයක් විහිංසා විතර්කයක් උපන් බවක් නොදනිමි.

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම වස් අසූවකින් යම් ව්‍යාපාද විතර්කයක් විහිංසා විතර්කයක් උපන් බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු."

**6.** "ඇවැත්නි, පැවිදිව අසූ වර්ෂයක්වූ මා විසින් ගෘහපති චීවරයක් ඉසුලූ බවක් නොම දනිමි."

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම වස් අසූවකින් යම් ගෘහපති චීවරයක් නොදැරී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු."

**7.** "ඇවැත්නි, පැවිදිව අසූ වයස් ඇති මා විසින් ආයුධයකින් සිවුරක් කැපූ බවක් නොදනිමි."

"යම්හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම වස් අසූවකින් ආයුධයකින් සිවුරක් කැපූ බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු.

**8.** "ඇවැත්නි, පැවිදිව අසූ වයස් ඇති මා විසින් ඉදිකටුවෙන් සිවුරක් මැහූ බවක් නොම දනිමි."

"යම්හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම වස් අසූවකින් ඉදිකටුවෙන් සිවුරක් මැහූ බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු."

**9.** "ඇවැත්නි, පැවිදිව අසූ වයස්වූ මා විසින් පඬුවලින් සිවුරක් පෙවූ බවක් නොම දනිමි."

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම වස් අසූවකින් පඬුවලින් සිවුරක් පෙවූ බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු."

**10** "ඇවැත්නි, පැවිදිව අසූ වයස් ඇති මම කඨිනයෙහි සිවුරක් මැහූ බවක් නොදනිමි."

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම වස් අසූවකින් කඨිනයෙහි සිවුරක් මැහූ බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු."

11. "ඇවැත්නි, පැවිදිව අසූ වයස් ඇති මම සමාන බ්‍රහ්මචර්‍ය්‍යාව ඇත්තවුන්ගේ චීවර කර්මයෙහි යෙදුන බවක් නොම දනිමි"

"යම්හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම වස් අසූවකින් සමාන බ්‍රහ්මචර්‍ය්‍යාව ඇත්තවුන්ගේ චීවර කර්මයෙහි යෙදුනු බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු.

12. "ඇවැත්නි, පැවිදිව අසූවයස්වූ මා විසින් ආරාධනයක් ඉවසූ බවක් නොම දනිමි."

"යම්හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම වස් අසූවකින් ආරාධනයක් ඉවසූ බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු.'

13 "ඇවැත්නි, පැවිදිව අසූ වයස්වූ මට මෙබඳු සිතක් උපන් බවක් නොදනිමි. 'කිසිවෙක් මට ආරාධනය කරන්නේ නම් ඉතා යෙහෙකැයි' කියායි."

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම අසූවසකින් කිසිවෙක් මට ආරාධනයක් කරන්නේ නම් යහපතැයි සිතක් උපන් බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු."

14. "ඇවැත්නි, පැවිදිව අසූ වයස් ඇති මම ගම තුළ හුන් බවක් නොම දනිමි."

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම අසූ වසකින් ගමෙහි හුන් බවක් නොදනී නම් ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ මෙයද ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු."

15. "ඇවැත්නි, පැවිදිව අසූ වයස්වූ මට ගමෙහි අනුභව කළ බවක් නොදනිමි."

"යම් හෙයකින් අසූ වයස් ඇති ආයුෂ්මත් බක්කුල ස්ථවිර තෙම ගමෙහි අනුභව කළ බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු."

16. "ඇවැත්නි, පැවිදිව අසූ වයස්වූ මට කුඩා සලකුණු වශයෙන් ස්ත්‍රියකගේ නිමිති ගත් බවක් නොම දනිමි."

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම අසූ වසකින් කුඩා සලකුණු වශයෙන් නිමිති ගත් බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු."

17. "ඇවැත්නි, පැවිදිව අසූ වයස් ඇති මම මාගමකට යටත් පිරිසෙයින් සතර පද ගාථාවකින් වත් දහම් දෙසූ බවක් නොදනිමි."

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම ස්ත්‍රියකට යටත්පිරිසෙයින් සතර පද ගාථාවකින්වත් දහම් දෙසූ බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු."

18. "ඇවැත්නි, පැවිදිවූ අසූ වයස් ඇති මා විසින් භික්ෂුණී ආශ්‍රමයකට පැමිණි බවක් නොදනිමි.

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම අසූ වසකින් භික්ෂුණී ආශ්‍රමයකට පැමිණි බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු."

19. "ඇවැත්නි, පැවිදිව අසූ වයස් ඇති මම භික්ෂුණියකට දහම් දෙසූ බවක් නොදනිමි.

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙමේ පැවිදිව අසූ වයස්වද භික්ෂුණියකට දහම් දෙසූ බවක් නොදනී නම්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍යයි අද්භූත ධර්මයකැයි අපි දරමු.”

**20.** “ඇවැත්නි, පැවිදිව අසූවයස්වූ මම භික්මෙන්නියකට (සික්ඛාමානාවකට) දහම් දෙසූ බවක් නොදනිමි.”

“යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම අසූ වසෙකින් භික්මෙන්නියකට දහම් දෙසූ බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍යයි, අද්භූත ධර්මයකැයි අපි දරමු.”

**21.** “ඇවැත්නි, පැවිදිව අසූවයස්වූ මම සාමණේරියකට දහම් දෙසූ බවක් නොදනිමි.”

“යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම අසූ වසකින් සාමණේරියකට දහම් දෙසූ බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍යයි අද්භූත ධර්මයකැයි අපි දරමු.”

**22.** “ඇවැත්නි, පැවිදිව අසූවයස්වූ මම (කෙනෙකු) පැවිදි කළ බවක් නොදනිමි.”

“යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම අසූ වසකින් (කෙනෙකු) පැවිදි කළ බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍යයි, අද්භූත ධර්මයකැයි අපි දරමු.”

**23.** “ඇවැත්නි, පැවිදිව අසූවයස්වූ මා විසින් (කෙනෙකු) උපසම්පදා කළ බවක් නොදනිමි.”

“යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම අසූ වසකින් (කෙනෙකු) උපසම්පදා කළ බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍යයි, අද්භූත ධර්මයකැයි අපි දරමු.”

**24.** “ඇවැත්නි, පැවිදිව අසූවයස්වූ මම (කෙනකුට) නිසදුන් දුන් බවක් නොදනිමි.”

“යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම අසූ වසකින් (කෙනකුට) නිසදුන් බවක් නොදනියි නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍යයි, අද්භූත ධර්මයකැයි අපි දරමු.”

**25.** "ඇවැත්නි, පැවිදිව අසූ වයස්වූ මම සාමණේරයකු ලවා උපස්ථාන කරවාගත් බවක් නොදනිමි."

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම අසූ වසකින් සාමණේරයකු ලවා උපස්ථාන කරවාගත් බවක් නොදනියි නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු."

**26.** "ඇවැත්නි, පැවිදිව අසූවයස් ඇති මම ගිහිහල් ගෙයි නෑ බවක් නොදනිමි."

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම අසූ වසකින් ගිහිහල් ගෙයි නෑ බවක් නොදනියි නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෙකැයි අපි දරමු."

**27.** "ඇවැත්නි, පැවිදිව අසූවයස් ඇති මම ඇඟ ගානා සුනු ගා නෑ බවක් නොදනිමි."

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම අසූවසකින් ඇඟ ගානා සුණු ගා නෑ බවක් නොදනියි නම් මෙයද බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍ය, අද්භූත ධර්මයකැයි අපි දරමු."

**28.** "ඇවැත්නි, පැවිදිව අසූවයස් ඇති මම සමාන බ්‍රහ්මචර්‍ය්‍යාව ඇත්තවුන් අත් පා මෙහෙවරෙහි යෙදූ බවක් නොදනිමි."

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිර තෙම අසූ වසකින් සමාන බඹසර ඇත්තවුන් අත් පා මෙහෙවරෙහි යෙදූ බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු."

**29.** ඇවැත්නි, පැවිදිව අසූවයස්වූ මට අන්තිම වසයෙන් දෙනකගෙන් එක් කිරිබින්දුවක් දෝනා කලක් පමණවත් ආබාධයක් උපන් බවක් නොදනිමි."

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම අසූ වසකින් අන්තිම වශයෙන් දෙනකගෙන් එක් කිරි බින්දුවක් දෝනා කලක්

පමණ ආබාධයක් ඇතිවූ බවක් නොදනියි නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍යයී, අද්භූත ධර්මයකැයි අපි දරමු.

**30.** "ඇවැත්නි, අසූ වයස් ඇති මම අන්තිම වශයෙන් අරළු කැබැල්ලක් පමණවත් බෙහෙතක් පරිහරණය කළ බවක් නොදනිමි."

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිර තෙම අසූ වසකින් අන්තිම වශයෙන් අරළු කැබැල්ලක් පමණවත් බෙහෙතක් පරිහරණය කළ බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍යයී, අද්භූත ධර්මයකැයි අපි දරමු."

**31.** "ඇවැත්නි, පැවිදිව අසූවයස්වූ මම හේත්තුවන පුවරුවක හේත්තුවූ බවක් නොදනිමි."

යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම අසූ වසකින් හේත්තුවන පුවරුවක හාන්සිවූ බවක් නොදනියි නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍යයී, අද්භූත ධර්මයකැයි අපි දරමු.

**32.** "ඇවැත්නි, පැවිදිව අසූවයස් ඇති මම සයනය කළ බවක් නොදනිමි."

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම අසූවසකින් සයනය කළ බවක් නොදනීනම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍යයී, අද්භූත ධර්මයකැයි අපිදරමු."

**33.** "ඇවැත්නි, පැවිදිව අසූවයස් ඇති මම ග්‍රාමාන්ත සේනාසනයක වස් වුසූ බවක් නොදනිමි."

"යම් හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම අසූ වසකින් ග්‍රාමාන්ත සේනාසනයක වස්වැසූ බවක් නොදනී නම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍යයී, අද්භූත ධර්මයකැයි අපි දරමු."

**34.** ඇවැත්නි, මම කෙලෙස් සහිතව සත්දවසක් පමණක් රටවැසියාගේ පිණ්ඩපාතය අනුභව කෙළෙමි. ඉක්බිති අටවෙනිදා අර්හත්වය පහළවිය."

"යම්හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම කෙලෙස් සහිතව රටවැසියාගේ පිණ්ඩපාතය සත්දවසක්ම අනුභව කෙළේ නම් අටවෙනිදා අර්හත්වය පහළවීනම් මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු.'

**35.** අචෙල කාශ්‍යප තෙම "ඇවැත්නි, බක්කුලය, මම මේ ශාසනයෙහි පැවිදිබව ලබන්නෙමි. උපසම්පදාව ලබන්නෙමියි" කීය.

"අචෙල කාශ්‍යපතෙම මේ ශාසනයෙහි පැවිදි බව ලැබීය, උපසම්පදාවද ලැබීය. ආයුෂ්මත් කාශ්‍යපතෙමේ උපසපන්වී නොබෝකල් ඇත්තේ හුදකලාවූයේ ජනයාගෙන් වෙන්වූයේ පමානොවූයේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ දුරුකරනලද කාය ජීවිත ආශා ඇතිව වාසයකරන්නේ නොබෝකලකින්ම කුලපුත්‍රයෝ යමක් පිණිස මනාකොට ගිහිගෙයින් නික්ම අනගාරික ශාසනයෙහි පැවිදිවෙත්ද, බ්‍රහ්මචර්‍ය්‍යය කෙළවර කොට ඇති, ඒ උතුම් අර්හත්වය මේ ආත්මභාවයෙහිම තෙමේම විශෙෂ නුවණින් දැන ප්‍රත්‍යක්ෂකොට, ඊට පැමිණ වාසය කළේය. උත්පත්තිය ක්ෂය විය. බ්‍රහ්මචරියාවෙහි හැසිර නිමවන ලදී. කළයුත්ත කරන ලදී. මෙයින් පසු කළයුතු අනෙකක් නැතැයි දැනගත්තේය. ආයුෂ්මත් කාශ්‍යපතෙම රහතුන්ගෙන් එක්තරා කෙනෙක් විය.

**36.** "ඉක්බිති ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම අන්කලෙක යතුර ගෙන විහාරයෙන් විහාරයට ගොස් "ආයුෂ්මත්වරුනි, නික්මෙව්, ආයුෂ්මත්වරුනි, නික්මෙව්, අද මාගේ පිරිනිවීම වන්නේයයි" කීය.

"යම්හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම යතුර ගෙන විහාරයෙන් විහාරයට ගොස් ආයුෂ්මත්වරුනි, නික්මෙව් ආයුෂ්මත්වරුනි, නික්මෙව්, අද මාගේ පිරිනිවීම වන්නේයයි කීයේද, මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"ඉක්බිති ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙමේ සංඝයා මැද හිඳගෙනම පිරිනිවීයේය. "යම්හෙයකින් ආයුෂ්මත් බක්කුල ස්ථවිරතෙම සංඝයා මැද හිඳගෙනම පිරිනිවියේද, මෙයද ආයුෂ්මත් බක්කුල ස්ථවිරයන්ගේ ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයකැයි අපි දරමු."

සතර වැනි බක්කුල සූත්‍රයයි. (3-4)

---

## 25. දන්තභූමි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි කලන්දක නිවාපනම්වූ වේලුවනාරාමයෙහි වැඩවාසය කරණසේක එකල්හි 'අචිරවත' නම් සාමණේර තෙම අරඤ්ඤකුටිකා නම් සෙනසුනෙහි වෙසෙයි. එකල්හි ජයසේන නම් රාජ කුමාර තෙම සක්මන් කිරීම සඳහා ඇවිදින ගමන් අචිරවත සාමණේර තෙමේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ අචිරවත සාමණේරයන් හා සමග සතුටු විය. සතුටු විය යුතු සිහිකටයුතු කථා කොට නිමවා එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන් ජයසේන රාජකුමාරතෙම අචිරවත සාමණේරයන්ට මෙය කීය.

2. 'පින්වත් අග්ගිවෙස්සනය, මේ සස්නෙහි භික්ෂුතෙම අප්‍රමාදව කෙළෙස් තවන වීර්‍ය්‍ය ඇතිව කාය ජීවිත පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරමින් ධ්‍යාන සමාපත්ති ලබන්නේය", යන මෙය මා විසින් අසනලදී.

"එසෙය, රාජකුමාරය, එසේය, රාජකුමාරය, මේ ශාසනයෙහි භික්ෂුතෙම අප්‍රමාදව කාය ජීවිත පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නේ ධ්‍යාන සමාපත්ති ලබන්නේයයි" කීය.

"පින්වත් අග්ගිවෙස්සනතෙම ඇසූ පරිදි, උගත් පරිදි, ඒ ධර්මය දෙශනා කරන්නේ නම් මැනවැයි" කීය.

"රාජකුමාරය, නුඹට ඇසූ පරිදි, උගත් පරිදි, ධර්මය දෙශනා කරන්නට නොහැකිවෙමි. රාජකුමාරය, මම දැන් ඇසූ පරිදි, උගත් පරිදි; ධර්මය දෙසන්නෙම් නම් නුඹද මගේ දෙශනාවේ අර්ථය දැන නොගන්නෙහි නම් එය මට ක්ලාන්ත බවක් වන්නේය. එය මට වෙහෙසක් වන්නේය."

3. "පින්වත් අග්ගිවෙස්සනතෙම අසනලද පරිදි, උගත් පරිදි, මට ඒ ධර්මය දෙශනා කළ මැනව. මම පින්වත් අග්ගිවෙස්සනගේ දෙශනාවේ අර්ථය ඒකාන්තයෙන් දැන ගන්නෙමියි කීය."

"රාජකුමාරය, නුඹට මම ඇසූ පරිදි, උගත් පරිදි, ධර්මය දෙශනා කරන්නෙමි. ඉදින් නුඹ දෙශනාවේ අර්ථය දැනගන්නෙහි නම් එය යහපති. නුඹ මාගේ දෙශනාවේ අර්ථය දැන නොගන්නෙහි නම් නොදන්නාකමෙහිම සිටිය යුතුය. එහිදී මාගෙන් මත්තෙහි නැවත නො අසව."

"පින්වත් අග්ගිවෙස්සනතෙම මට ඇසූසේ උගත්සේ ධර්මය දෙශනා කෙරේවා. ඉදින් මම පින්වත් අග්ගිවෙස්සනගේ දෙශනාවේ අර්ථය දැනගන්නෙම් නම් එය යහපති. ඉදින් මම පින්වත් අග්ගිවෙස්සනගේ දෙශනාවේ අර්ථය නොදැනගන්නෙම් නම් නොදන්නා කමෙහිම සිටින්නෙමි. එහිදී මම පින්වත් අග්ගිවෙස්සනගෙන් මත්තෙහි නොඅසන්නෙමි."

4. ඉක්බිති අචිරවත සාමණෙරතෙම ජයසේන රාජකුමාරයාහට ඇසූසේ උගත්සේ දහම් දෙසීය. එසේ දෙසූ කල්හි ජයසේන රාජකුමාරතෙම අචිරවත සාමණේරයන්ට "පින්වත් අග්ගිවෙස්සනය, මහණතෙම අප්‍රමාද වූයේ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇත්තේ කාය ජීවිත පරිත්‍යාගයෙන් යුක්තව වාසය කරන්නේ ධ්‍යාන සමාපත්ති ලබන්නේය. යන යමක් වේ නම් එය නොවියහැක. වීමට අවකාශ නැතැයි' කීය. ඉක්බිති ජයසේන රාජකුමාරතෙම අචිරවත සාමණෙරයන්ට එය නොවියහැකි බවත් ඊට අවකාශ නැති බවත් දන්වා හුනස්නෙන් නැගිට ගියේය.

5. ඉක්බිති අචිරවත සාමණේරතෙම ජයසේන රාජකුමාරයා ගිය නොබෝ වේලාවකින් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පැත්තක හුන්නේය. එක් පැත්තක හුන් අචිරවත සාමණේරතෙම ජයසේන රාජකුමාරයා සමග යම් පමණ කථාවක් වීනම් ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට සැල කළේය. එසේ සැලකළ කල්හි භාග්‍යවතුන් වහන්සේ අචිරවත සාමණේරයන්හට මෙය වදාළසේක.

"අග්ගිවෙස්සනය, කාමයෙන් වෙන්ව දතයුතු කාමයෙන් වෙන්ව දැක්කයුතු කාමයෙන් වෙන්ව පැමිණිය යුතු කාමයෙන් වෙන්ව ප්‍රත්‍යක්ෂ කටයුතු යම් ඒ ධර්මයක් වේනම් ඒ ධර්මය කොයින් ලබන්නේද? කාමයෙහි ගැලී වාසය කරන්නාවූ කාමයන් පරිභොග කරන්නාවූ කාම විතර්කයන් විසින් කරනු ලබන්නාවූ කාම දාහයෙන් දැවෙන්නාවූ කාමයන් සෙවීමෙහි උත්සාහවත්වූ ජයසේන රාජකුමාරතෙම එය දැනගන්නේය, දක්නේය, ප්‍රත්‍යක්ෂ කරන්නේය යන මීට කරුණු ඇත්තේ නොවේ.

6. "අග්ගිවෙස්සනය, හොඳට දැමුණු, හොඳට හික්මුනු, ඇත්නාම්බන් දෙදෙනෙක් හෝ අශ්ව නාම්බන් දෙදෙනෙක් හෝ ගොන් නාම්බන් දෙදෙනෙක් හෝ වෙත්ද, එසේම නොදැමුනු, නොහික්මුනු, ඇත්නාම්බන් දෙදෙනෙක් හෝ අශ්ව නාම්බන් දෙදෙනෙක් හෝ ගොන් නාම්බන් දෙදෙනෙක් හෝ වෙත්ද, අග්ගිවෙස්සනය, ඔවුන් අතුරෙන් හොඳහැටි දැමුනු, හොඳහැටි හික්මුනු, ඇත් නාම්බන් දෙදෙනම අශ්ව නාම්බන් දෙදෙනම ගොන් නාම්බන් දෙදෙනම හික්මුණවුන්ගේ ගමනින් යන්නාහුද, හික්මුණවුන් යන තැනට යන්නාහුද?"

"එසේය, ස්වාමීනි,"

'යම් ඒ නොදැමුණු නොහික්මුණු ඇත් නාම්බන් දෙදෙනෙක් හෝ අශ්ව නාම්බන් දෙදෙනෙක් හෝ ගොන් නාම්බන් දෙදෙනෙක් හෝ වෙත්ද, ඒ නොදැමුණාවූ නොහික්මුණාවූ ඔව්හු,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඒ දැමුණු හික්මුණු ඇතුන් දෙදෙන අශ්වයන් දෙදෙන ගොනුන් දෙදෙන මෙන් හික්මුණු ගමනින් යන්නාහුද? හික්මුණවුන් යන තැනට යන්නාහුද?'

"ස්වාමීනි, එසේ නොවන්නේය."

7. "අග්ගිවෙස්සනය, එසේම යම් ධර්මයක් කාමයෙන් වෙන්ව දැනගත යුතුද, කාමයෙන් වෙන්ව දැක්ක යුතුද, කාමයෙන් වෙන්ව පැමිණිය යුතුද, කාමයෙන් වෙන්ව ප්‍රත්‍යක්ෂ කටයුතුද, ඒ ධර්මය කාමයෙහි ගැලී වාසය කරන්නාවූ කාමයන් අනුභව කරන්නාවූ කාම විතර්කයන් විසින් කරනු ලබන්නාවූ කාමදාහයෙන් දැවෙනු ලබන්නාවූ කාමයන් සෙවීමෙහි යෙදී වාසය කරන්නාවූ ජයසේන රාජකුමාරතෙම දැන ගන්නේය, දකින්නේය, ප්‍රත්‍යක්ෂ කරන්නේය යන මීට කරුණු නැත.

8. "අග්ගිවෙස්සනය, යම්සේ ගමකට හෝ නියම් ගමකට නුදුරෙහි මහා පර්වතයක් වේද, යහලුවෝ දෙදෙනෙක් ඒ ගමින් හෝ නියම්ගමින් හෝ නික්ම අතින් අත ගැන්මෙන් ඒ පර්වතය යම් තැනකද, එහි පැමිණෙන්නාහුය. පැමිණ එක් යහලුවෙක් යට පර්වත පාදයෙහි සිටින්නේය. එක් යහලුවෙක් පර්වතය මුදුනට නගින්නේය. යට පර්වත පාදයෙහි සිටි යහලුවා පර්වත මුදුනෙහි සිටි යහලුවාට මෙසේ කියන්නේය. "යහලුව, නුඹ පර්වත මුදුනෙහි සිටියේ යම් කිසිවක් දක්නෙහිද?

හෙතෙම මෙසේ කියන්නේය. "මිත්‍රය, පර්වත මුදුනෙහි සිටි මම ආරාමයන් පිළිබඳ රමණීයත්වයද වනයන් පිළිබඳ රමණීයත්වයද බිම් පිළිබඳ රමණීයත්වයද පොකුණු පිළිබඳ රමණීයත්වයද දකිමි."

හෙතෙම මෙසේ කියන්නේය. "මිත්‍රය, පර්වත මුදුනෙහි සිටි නුඹ ආරාමයන් පිළිබඳ රමණීයත්වය, වනයන් පිළිබඳ රමණීයත්වය, බිම් පිළිබඳ රමණීයත්වය, පොකුණු පිළිබඳ රමණීයත්වය, යන යමක් දක්නෙහිය යන මීට කරුණු නැත. අවකාශ නැත" යනුයි.

**9.** "පර්වත මුදුනෙහි සිටි යහලුවා පර්වතයෙන් බැස ඒ යහලුවා අතින් ගෙන පර්වත මුදුනට නංවා මොහොතක් අස් වසා මෙසේ කියන්නේය. "මිත්‍රය, පර්වත මුදුනෙහි සිටියාවූ නුඹ යම්කිසිවක් දක්නෙහිද?

හෙතෙම මෙසේ කියන්නේය. "මිත්‍රය, පර්වත මුදුනෙහි සිටියාවූ මම ආරාම පිළිබඳ රමණීයත්වය, වන පිළිබඳ රමණීයත්වය, භූමි පිළිබඳ රමණීයත්වය, පොකුණු පිළිබඳ රමණීයත්වය දකිමි."

හෙතෙම මෙසේ කියන්නේය. "මිත්‍රය, දැන් නුඹ විසින් පර්වත මුදුනෙහි සිටි නුඹ ආරාම පිළිබඳ රමණීයත්වය, වන පිළිබඳ රමණීයත්වය, භූමි පිළිබඳ රමණීයත්වය, පොකුණු පිළිබඳ රමණීයත්වය, යන යමක් දක්නෙහි නම් ඊට කරුණු නැතැයි අවකාශ නැතැයි යම් වචනයක් කියන ලද නම් අපි එය දැන් එසේම පිළිගනිමුද? පර්වත මුදුනෙහි සිටි මම ආරාම පිළිබඳ රමණීයත්වය, වන පිළිබඳ රමණීයත්වය, භූමි පිළිබඳ රමණීයත්වය, පොකුණු පිළිබඳ රමණීයත්වය දකිමි. යන යම් වචනයක් කියන ලද නම් එය එසේ පිළිගනිමුද?" කියායි.

"හෙතෙම යහලුව, මම වනාහි මේ මහා පර්වතයෙන් ආවරණය කරන ලද්දෙම් දැකියයුතු දේ නොදැක්කෙමියි කියන්නේය."

**10.** "අග්ගිවෙස්සනය, එපරිද්දෙන්ම ජයසේන කුමාර තෙම මීටද වඩා අතිශයින් මහත්වූ අවිද්‍යා ස්කන්ධයෙන් ආවරණයකරන ලද්දේය, වලක්වන ලද්දේය, වසන ලද්දේය. හාත්පසින් වසන ලද්දේය. හෙතෙම ඒකාන්තයෙන් දතයුතුවූ කාමයෙන් වෙන්ව දැක්කයුතුවූ, පැමිණිය යුතුවූ, කාමයෙන් වෙන්ව ප්‍රත්‍යක්ෂ කළයුතුවූ, ධ්‍යාන සමාපත්තියක් වේනම්, කාමයෙහි ගැලුනාවූ, කාමයන් අනුභව කරන්නාවූ, කාම විතර්ක විසින් කරනුලබන්නාවූ, කාම දාහයෙන් දවනු ලබන්නාවූ, කාමයන් සෙවීමෙහි යෙදුනාවූ, ඒ ජයසේන රාජකුමාර තෙම එය දැනගන්නේ හෝ දක්නේ හෝ ප්‍රත්‍යක්ෂ කරන්නේ හෝ වේය

යන මීට කරුණු නැත. අග්ගිවෙස්සනය, ඉදින් ඒ ජයසේන රාජකුමාරයාහට මේ උපමා දෙක ප්‍රකාශකළේ නම්, ජයසේන රාජකුමාර තෙම නුඹට පහදින්නේය, පැහැදුනේ නුඹට පැහැදුනු ආකාරයක් දක්වන්නේය යනු පුදුමයක් නොවේ.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ගැන මෙන් මා ගැන පුදුමයක් නැත්තාවූ පෙර නොඇසූ මේ උපමා ජයසේන රාජකුමාරයා හට කෙසේ නම් වැටහෙන්නාහුද?"

11. "අග්ගිවෙස්සනය, යම්සේ ඔටුණු පැළඳි ක්ෂත්‍රිය රජෙක් නාගවනිකයකු (හස්ති ශිල්පයෙහි දක්ෂයකු) කැඳවයිද, යහලු නාගවනිකය, මෙහි එව. රජුගේ ඇතුපිට නැගී ඇතුන් ඇති වනයට පැමිණ වල් ඇතකු සොයා රජ ඇතාගේ බෙල්ලෙහි බඳුව' කියායි. අග්ගිවෙස්සනය, 'දේවයන් වහන්ස, එසේයයි කියා,' නාගවනිකතෙම ඔටුණු පැළඳි ක්ෂත්‍රිය රජුට උත්තරදී, රජුගේ ඇතුපිට නැගී ඇත්වනයට පැමිණ වල් ඇතකු දැක, රජ ඇතාගේ බෙල්ලෙහි බඳී. රජුගේ ඇතා ඒ වල් ඇතා එළිමහනට ගෙන යයි. අග්ගිවෙස්සනය, මෙපමණකින්ම වල් ඇතා එළිමහනට පැමිණියේ වෙයි. අග්ගිවෙස්සනය, එවිට ඒ වල් ඇතා ඒ කැලයෙහිම ඇලුණේ වෙයි.

"ඒ නාගවනිකතෙම ඔටුණු පැළඳි ක්ෂත්‍රිය රජුට 'දේවයන් වහන්ස, වල් ඇතා එළිමහනකට ගෙනාවේයයි; කියන්නේය.

"ඔටුණු පළන් ක්ෂත්‍රිය රජතෙම ඇතුන් හික්මවන්නකු කැඳවන්නේය. 'යහළුව, ඇතුන් හික්මවන්නෙහි මෙහි එව. වල් ඇතුන්ගේ ගතිගුණ මර්දනය පිණිස, වල් ඇතුන්ගේ ශබ්ද වචන මර්දනය පිණිස, වල් ඇතුන්ගේ දාහ ගති ක්ලාන්ත ගති දැවීම් ගති මර්දනය වීම පිණිස, ගමෙහි ඇලීම පිණිස, මනුෂ්‍යයන් කැමති කරවන ස්වභාවයන්හි පිහිටුවීම පිණිස, වල් ඇතා දමනය කරව' කියායි.

"අග්ගිවෙස්සනය, හත්ථිදමකයා' දේවයන්වහන්ස, එසේයයි කියා' ඔටුණු පලන් ක්ෂත්‍රිය රජුට උත්තරදී, මහත් කණුවක්

පොළොවෙහි සිටුවා වල් ඇතාගේ ස්වභාවය මැඩීම පිණිස, වල් ඇතාගේ ශබ්ද අදහස් මර්දනය පිණිස, වල් ඇතාගේ දාහ ක්ලාන්තගති මැඩීම පිණිස, ගමෙහි ඇලීම පිණිස, මිනිසුන් කැමැති ස්වභාවයන්හි පිහිටුවීම පිණිස, වල් ඇතාගේ බෙල්ලෙන් බඳී. ඒ මේ ඇතුන් දමනයකරන්නා ප්‍රියවූ, කණට සැපවූ, ප්‍රේමණීයවූ, හදවත පිනවන්නාවූ, පුරවැසියන්ට සුදුසුවූ, බොහෝදෙනාට කැමැතිවූ, බොහෝ දෙනාට මනාපවූ, යම් ඒ වචන වේද, එබඳු වචනවලින් කථාකරයි.

12. "අග්ගිවෙස්සනය, යම්හෙයකින් වනාහි වල්ඇතා ඇතුන් හික්මවන්නා විසින් ප්‍රියවූ, කණට සැපවූ, ප්‍රේමණීයවූ, හදවත පිණවන්නාවූ, පුරවැසියන්ට සුදුසුවූ, බොහෝදෙනාට කැමැතිවූ, බොහෝදෙනාට මනාපවූ, යම් වචන වෙත්ද, එබඳු වචන කියනු ලබන්නේ වචන අසනු කැමති වෙයි. ඇහුන්කන් දෙයි. වචනය දැනගැනීමට සිත එළවයි. ඇතුන් හික්මවන්නා ඔහුට මත්තෙහි කෑ යුතු තණ හා දියද නැවත නැවත දෙයි. අග්ගිවෙස්සනය, යම්හෙයකින් වල් ඇතුන් දමනය කරන්නාගේ තණ හා දිය පිළිගනීද, එහිදී ඇතුන් දමනය කරන්නාට මෙසේ අදහස් වෙයි. 'රජුගේ හස්තිරාජයා දැන් ජීවත්වන්නේය' කියායි. ඇතුන් දමනය කරන්නා මත්තෙහි 'එම්බා හස්තිය, ඉදිරියට යව, එම්බා හස්තිය, පස්සට එවයි' හික්මවයි. අග්ගිවෙස්සනය, යම් හෙයකින් රජුගේ හස්තියා ඇතුන් දමනය කරන්නාගේ ගැණීම් සහ බිම තැබීම් පිළිබඳ වචන කරන්නේ වේ ද, අවවාදයට අනුව ක්‍රියා කෙරේද, ඒ මේ ඇතුන් දමනය කරන්නා මත්තෙහිත් 'එම්බා හස්තිය, නැගිටුව, එම්බා හස්තිය, සිඳුවයි' හික්මවයි.

13. "අග්ගිවෙස්සනය, යම්හෙයකින් රජුගේ ඇතා ඇතුන් දමනය කරන්නාගේ නැගිටුවීමෙහි හා හිඳුවීමෙහි වචන කරන්නේද අවවාදය කරන්නේද, ඇතුන් දමනය කරන්නා මත්තෙහිත් නොසෙල්ලී සිටිමට පුරුදු කිරීම කරවයි. මහත් පුවරුවක් සොඬෙහි බඳී. ඇතුන්ගේ පාවලට අනින කටුව ගත් අත් ඇති පුරුෂ තෙම බෙල්ල මත්තේ හුන්නේ වෙයි. තෝමර

ගත් අත් ඇති පුරුෂයෝ හාත්පස පිරිවරා සිටිත්. ඇතුන් දමනය කරන්නාද දික්වූ තෝමර යෂ්ටිය ගෙන ඉදිරියෙහි සිටියේ වෙයි. හෙතෙම නොසෙල්වෙන හික්මීම හික්මවනු ලබන්නේ පෙර පා නොසොලවයි, පසු පා නොසොලවයි, කයේ ඉදිරිපස නොසොලවයි, පසු කය නොසොලවයි, හිස නොසොලවයි, කන් නොසොලවයි, දළ නොසොලවයි, නගුට නොසොලවයි, සොඬ නොසොලවයි ඒ රජුගේ ඇතා අඩයටි පහර ඉවසන්නේ වෙයි, කඩු පහර ඉවසන්නේ වෙයි, ඊ පහර ඉවසන්නේ වෙයි, සතුරන්ගේ අවි පහර ඉවසන්නේ වෙයි, බෙර පණාබෙර වස්දඬු සක් දෙණ්ඩිම යන මොවුන්ගේ නාද ඉවසන්නේ හික්මවන ලද සියලු වංක දොෂ ඇත්තේ පහකරණ ලද කසට ඇත්තේ රජුන්ට සුදුසු වෙයි. රජුන් විසින් පරිභෝග කටයුතුද, වෙයි. රජහුගේ අංගයක්ය යන සංඛ්‍යාවට පැමිණෙයි.

14. "අග්ගිවෙස්සනය, එපරිද්දෙන්ම අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ, විජ්ජාචරණ සම්පන්නවූ, යහපත් ගති ඇත්තාවූ සියලු ලෝකයන් දන්නාවූ, ශ්‍රෙෂ්ඨවූ, දමනය කළයුතු පුරුෂයන් දමනය කිරීමෙහි දක්ෂවූ, දෙවිමිනිසුන්ට ගුරුවූ, චතුරාර්‍ය්‍යසත්‍යය අවබෝධ කළාවූ, තථාගතයන් වහන්සේ මේ ලෝකයෙහි උපදින සේක. ඒ තථාගතයන් වහන්සේ දෙවියන් සහිතවූ, මරුන් සහිතවූ, බඹුන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, දෙවිමිනිසුන් සහිතවූ, මේ ලෝකය ස්වකීය විශෙෂ ඥානයෙන් දැන, ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කරන සේක.

ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ මැද යහපත්වූ, අවසානය යහපත්වූ, අර්ථ සහිතවූ, දස වැදෑරුම් අක්ෂර සම්පත්තියෙන් යුක්තවූ, සියලු ආකාරයෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ ශාසන බ්‍රහ්මචරියාව ප්‍රකාශ කරන සේක. ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයිද, ඔහු ඒ ධර්මය අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කරයි. ඔහු ඒ ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ මෙසේ සලකන්නේය. 'ගිහි ගෙයි විසීම අවහිර

සහිතය. කෙලෙස් දූවිලි උපදින තැනකි. මහණකම වනාහි කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය. ගිහි ගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ හක් ගෙඩියක් වැනි මෙම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්නට නොහැක්කේය. මම කෙස් හෝ දැලිරැවුළු කපාදමා, සිවුරු හැඳ, ගිහිගෙන් නික්ම සස්නෙහි මහණවන්නෙම් නම් ඉතා යහපතැයි, කියායි. ඔහු පසු කාලයක ස්වල්පවූ හෝ බොහෝවූ හෝ සම්පත් හැර ස්වල්පවූ හෝ බොහෝවූ නෑ පිරිස්හැර, කෙස් දැළිරැවුළු කපාදමා, සිවුරු හැඳ, ගිහිගෙන් නික්ම අනගාරිය සංඛ්‍යාත ශාසනයෙහි පැවිදි වෙයි. අග්ගිවෙස්සනය, ආයර්‍ය්‍යශ්‍රාවක තෙම මෙපමණකින්ම එළිමහන් තැනට පැමිණියේ වෙයි.

15. "අග්ගිවෙස්සනය, යම් මේ පඤ්චකාම ගුණයක් වේද මේ දිව්‍ය මනුෂ්‍යයෝ ඒ පඤ්චකාමයෙහි ගැලී වසන්නෝය. ඔහු තථාගත තෙම මත්තෙහි හික්මවයි. 'මහණ, මෙහි එව. සිල්වත් වෙව. ප්‍රාතිමොක්ෂ සංවර සීලයෙන් සංවරව, ආචාර ගෝචර දෙකින් යුක්තව, සුළු වරදෙහිත් භය දක්නාසුලුව, ශික්ෂාපද දැඩිකොට සමාදන්ව වාසය කරව' කියායි. අග්ගිවෙස්සනය, යම් හෙයකින් ආයර්‍ය්‍යශ්‍රාවක තෙම සිල්වත් වේද, ප්‍රාතිමොක්ෂ සංවර ශීලයෙන් සංවරව, ආචාර ගෝචර දෙකින් යුක්තව, සුළු වරදෙහි පවා භය දක්නාසුලුව වාසය කෙරේද, ශික්ෂාපද දැඩිකොට සමාදන්ව හික්මේද, ඔහු තථාගත තෙම මත්තෙහිත් හික්මවයි.

16. "මහණ, නුඹ එව. ඉන්ද්‍රියයන්හි වසනලද දොර ඇත්තෙකු වෙව. ඇසින් රූපයක් දැක නිමිති නොගනුව. කුඩා සළකුණු වශයෙන් නොගනුව.' යම් හෙයකින් චක්ෂුරින්ද්‍රියය සංවර නොකොට වාසය කරණ මොහුට ලොභ දොෂයයි කියන ලද ලාමක අකුශල ධර්ම වැදගන්නාහුද, එය සංවරය පිණිස පිළිපදුව. චක්ෂුරින්ද්‍රියය සංවර කරව. චක්ෂුරින්ද්‍රියය සංවර කිරීමට පැමිණෙව. "කණින් ශබ්දයක් අසා එය නිමිති වශයෙන්

නොගනුව. නැවත නැවත මතක්වන සේ අල්ලා නොගනුව. යමක් හේතුකොටගෙන ශ්‍රොතෙන්ද්‍රිය සංවර නොකොට වසන්නහුට ලෝභ ද්වෙෂ යන ලාමක අකුශල ධර්මයෝ වැදගන්නාහුද, ඒ ශ්‍රොතෙන්ද්‍රියයේ සංවරය පිණිස පිළිපදුව. ශ්‍රොතෙන්ද්‍රියය රකුව. ශ්‍රොතෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව.

"නාසයෙන් ගඳක් ආඝ්‍රාණයකොට එය නිමිතිවශයෙන් නොගනුව. නැවත නැවත මතක් වනසේ අල්ලා නොගනුව. යමක් හේතුකොටගෙන ඝ්‍රාණෙන්ද්‍රියය සංවර නොකර වසන්නහුට ලෝභ ද්වෙෂ යන ලාමක අකුශල ධර්මයෝ වැදගත්තාහුද, ඒ ඝ්‍රාණෙන්ද්‍රියයේ සංවරය පිණිස පිළිපදුව. ඝාණෙන්ද්‍රියය රකුව. ඝාණෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව.

"දිවෙන් රසවිඳ එය නිමිති වශයෙන් නොගනුව. නැවත නැවත මතක්වන සේ අල්ලා නොගනුව. යමක් හේතුකොට ගෙන, ජිව්හෙන්ද්‍රියය සංවර නොකර වසන්නහුට ලෝභ ද්වෙෂ යන ලාමක අකුශලධර්මයෝ වැදගන්නාහුද, ඒ ජිව්හෙන්ද්‍රියයේ සංවරය පිණිස පිළිපදුව. ජිව්හෙන්ද්‍රියය රකුව. ජිව්හෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව.

"කයින් ස්පර්ශයක් ස්පර්ශකොට එය නිමිති වශයෙන් නොගනුව. නැවත නැවත මතක් නොවන සේ අල්ලා නොගනුව. යමක් හේතුකොටගෙන කායෙන්ද්‍රියය සංවර නොකර වසන්නහුට ලෝභ ද්වෙෂ යන ලාමක අකුශල ධර්මයෝ වැදගන්නාහුද, ඒ කායෙන්ද්‍රියයේ සංවරය පිණිස පිළිපදුව. කායේන්ද්‍රිය රකුව. කායෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව.

"සිතින් ධර්මාරමුණක් දැන නිමිති නොගනුව. කුඩා සලකුණු වශයෙන් නොගනුව. යමක් හේතුකොටගෙන මනින්ද්‍රිය සංවර නොකොට වාසයකරණ මොහුට ලොභ දොස සංඛ්‍යාත ලාමක අකුසල ධර්මයෝ උපදින්නාහුද, එය සංවරය පිණිස පිළිපදුව. මනින්ද්‍රියය රකුව. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙව' යනුවෙනි.

17. "අග්ගිවෙස්සනය, යම් හෙයකින් වනාහි ආයර්‍ය ශ්‍රාවකතෙම ඉන්ද්‍රියයන්හි වසනලද දොර ඇත්තේ වේද, තථාගතතෙම ඔහු මත්තෙහි හික්මවයි. 'මහණ, නුඹ එව. භොජනයෙහි පමණ දන්නෙක් වෙව. නුවණින් සලකා බලා ආහාර ගනුව. (කෙසේද?) ක්‍රීඩා පිණිස නොවෙයි මදය පිණිස නොවෙයි. ශරීරය සැරසීම පිණිස නොවෙයි. අලංකාරය පිණිස නොවෙයි. මේ කයේ පැවැත්ම යැපීම පිණිසමය. විහිංසාවෙන් වැළකීම පිණිසය. බ්‍රහ්මචයර්‍යයට අනුග්‍රහය පිණිසය. පරණ බඩගිනි වේදනාවද වළක්වමි අලුත් වේදනාවද නොඋපදවන්නෙමි. මාගේ ජීවිත යාත්‍රාවද නිවරද බවද පහසු විහරණයෙන් වන්නේය' කියායි.

18. "අග්ගිවෙස්සනය, යම් හෙයකින් වනාහි ආයර්‍ය ශ්‍රාවකතෙම භෝජනයෙහි 'පමණ දන්නේවේද, තථාගත තෙම ඔහු මත්තෙහිත් හික්මවයි. මහණ, නුඹ එව. නිදිවර්ජිත කිරීමෙහි යෙදී වාසය කරව. දවල් කාලයෙහි සක්මනින් හා හිඳීමෙන්ද සිත වසන්නාවූ ක්ලෙශ ධර්මයන් ගෙන් සිත පිරිසිදු කරව. රාත්‍රියෙහි ප්‍රථම යාමයෙහි සක්මනින් හා හිඳීමෙන් සිත පිරිසිදු කරව. රාත්‍රියෙහි මධ්‍යම යාමයෙහි දකුණු පයෙන් වම් පය මදක් ඈත්කොට තබා සිහි නුවණින් යුක්තව නැගිටිමි යන සංඥාව මෙනෙහිකොට දකුණු ඇලයෙන් සිංහසෙය්‍යාව කරව. රාත්‍රි අන්තිම යාමයෙහි නැගිට සක්මනින් හා හිඳීමෙන් ක්ලෙශ ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරවයි' කියායි.

19. "අග්ගිවෙස්සනය, යම් හෙයකින් වනාහි ආයර්‍ය ශ්‍රාවකතෙම නිදි වර්ජිත කිරීමෙහි යෙදුනේ වේද, තථාගත තෙම ඔහු මත්තෙහිත් හික්මවයි. 'මහණ, නුඹ එව. සිහියෙන් හා නුවණින් යුක්තව වාසය කරව. ඉදිරියට යාමෙහි සහ ආපසු යාමෙහි නුවණින් යුක්ත වූවෙක් වෙව. ඉදිරි බැලීමෙහි හා හැරී බැලීමෙහි නුවණින් යුක්තවූවෙක් වෙව. අත පය හැකිලීමෙන් හා දිගහැරීමෙහි මනාකොට දැන කරන්නෙක් වෙව. සඟළ සිවුරු පාත්‍ර සිවුරු දැරීමෙහි මනා කොට දැන කරන්නෙක්

වෙව. අනුභාවයෙහි, පීමෙහි, කෑමෙහි රස විඳීමෙහි මනාකොට දැන කරන්නෙක් වෙව. මළමුත්‍ර කිරීමෙහි මනාකොට දැන කරන්නෙක් වෙව. යාමෙහි සිටීමෙහි, හිඳීමෙහි, නිදීමෙහි, නිදිවර්ජිතයෙහි, කීමෙහි, නිශ්ශබ්ද වීමෙහි මනාකොට දැන කරන්නෙක් වෙව' යනුවෙනි.

**20.** "අග්ගිවෙස්සනය, යම් හෙයකින් වනාහි ආර්‍ය්‍ය ශ්‍රාවකතෙම සිහි නුවණ දෙකින් යුක්තවූයේ වේද, තථාගත තෙම ඔහු මත්තෙහිත් හික්මවයි. 'මහණ, නුඹ එව. අරණ්‍ය සේනාසනයක්, රුක් මුලක්, පර්වතයක්, කඳුරැලියක්, පර්වත ගුහාවක්, සොහොනක්, දුර වන සෙනසුනක්, එලිමහන් තැනක්, පිදුරු බිස්සක් යන ජනගහණය නැති සෙනසුනක් භජනය කරව යනුවෙනි. හෙතෙම අරණ්‍ය සෙනසුනක්, රුක් මුලක්, පර්වතයක්, කඳුරැලියක්, පර්වතගුහාවක්, සොහොනක්, දුර වන සෙනසුනක්, එලිමහන් තැනක්, පිදුරු බිස්සක් යන ජනගහණය නැති සෙනසුනක් සෙවුනේ වේද, හෙතෙම බතින් පසු, පිණ්ඩපාතයෙන් වැළකුණේ පලක් බැඳ කය කෙළින් තබා සිහිය එළවා හිඳී. හෙතෙම ස්කන්ධ ලෝකයෙහි දැඩි ලෝභය දුරුකොට, පහවූ ලෝබය ඇති සිතින් යුක්තව වාසය කෙරෙයි. ලෝබයෙන් සිත පිරිසිදු කෙරෙයි. ව්‍යාපාද දොසය දුරුකොට සියලු සත්වයන් කෙරෙහි හිතානුකම්පා ඇතිව මෛත්‍රී සහගත සිතින් වාසය කරයි. ව්‍යාපාද දොෂයෙන් සිත පිරිසිදු කෙරෙයි.

**21.** "ථිනමිද්ධය දුරුකොට පහවූ ථිනමිද්ධ ඇත්තේ ආලෝක සංඥාව ඇතිව, සිහි ඇතිව, යහපත් ප්‍රඥා ඇතිව වාසය කෙරෙයි. ථිනමිද්ධයෙන් සිත පිරිසිදු කෙරෙයි. උද්ධච්ච කුක්කුච්චය දුරුකොට වික්ෂිප්ත නොවී ඇතුළත සංසිඳුනු සිත් ඇතිව වාසය කෙරෙයි. උද්ධච්ච කුක්කුච්චයෙන් සිත පිරිසිදු කරයි. විචිකිච්ඡාව හැර පහවූ විචිකිච්ඡා ඇත්තේ කුසලධර්මයන්හි කෙසේ කෙසේදැයි යන සැක නැතිව වාසය කෙරෙයි. විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරෙයි. හෙතෙම ප්‍රඥාව දුර්වල කරණ සිත කිලුටු කරන්නාවූ මේ පඤ්චනීවරණ ධර්මයන් දුරුකොට කෙලෙස්

තවන වීර්‍ය්‍යය ඇත්තේ නුවණින් යුක්ත ව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලොභ දොසයන් හික්මවා කයෙහි කය නැවත නැවත බලමින් වාසය කරයි.

22. "වේදනාවන්හි වේදනාවන් නැවත බලන්නේ කෙළෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, නුවණින් යුක්තව, සිහියෙන් යුක්තව, ස්කන්ධ ලොකයෙහි ලොභ දොසයන් දුරු කොට වාසය කරයි.

සිතෙහි සිත නැවත නැවත බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් යුක්තව, නුවණින් යුක්තව, සිහියෙන් යුක්තව, ස්කන්ධ ලොකයෙහි ලොභ දොසයන් දුරුකොට වාසය කරයි.

ධර්මයන්හි ධර්මයන් අනුව නැවත නැවත බලන්නේ කෙලෙස් තවන වීර්‍ය්‍යය ඇත්තේ නුවණින් යුක්තව සිහියෙන් යුක්තව ස්කන්ධ ලෝකයෙහි ලොභ දොසයන් හික්මවා වාසය කෙරෙයි.

"අග්ගිවෙස්සනය, යම්සේ ඇතුන් දමනය කරන්නෙක් මහත් කණුවක් පොළොවෙහි සිටුවා වල් ඇතුන්ගේ ස්වභාවය මැඩීම පිණිස, ශබ්ද අදහස් මැඩීම පිණිස, වල් ඇතුන්ගේ විඩා ක්ලාන්ත ගති මැඩීම පිණිස, ගමෙහි ඇලීම පිණිස, මනුෂ්‍යයන් කැමති කරවන ස්වභාවයන්හි පිහිටුවීම පිණිස, වල් ඇතාගේ බෙල්ලෙන් බඳී. අග්ගිවෙස්සනය, එපරිද්දෙන්ම මේ සතර සතිපට්ඨානයෝ ගිහිගෙය ඇසුරු කොට පවත්නා ස්වභාවයන් මැඩීම පිණිස, ගිහිගෙය ඇසුරු කළ වචන අදහස් මැඩීම පිණිස, ගිහිගෙය ඇසුරු කළ දාහ, ක්ලාන්ත, දැවිලි මැඩීම පිණිස සත්‍ය මාර්ගයට පැමිණීම පිණිස, නිවන් අවබෝධ කිරීම පිණිස, ආර්‍ය්‍ය ශ්‍රාවකයාගේ සිත බැඳ තබන්නාවූ අරමුණු වෙති.

23. "තථාගතතෙම ඔහු මත්තෙහි හික්මවයි. 'මහණ, නුඹ එව. කයෙහි කය නැවත නැවත දක්නාසුලුව වාසය කරව. කාමයෙන් යුක්ත විතර්ක කල්පනා නොකරව. වේදනාවන්හි වේදනාවන් නැවත නැවත බලමින් වාසය කරව, කාමයෙන් යුක්ත විතර්ක කල්පනා නොකරව. සිතෙහි සිත නැවත නැවත බලමින් වාසය කරව. කාමයෙන් යුක්ත විතර්ක කල්පනා

නොකරව. ධර්මයෙහි නැවත නැවත බලමින් වාසය කරව. කාමයෙන් යුත් විතර්ක කල්පනා නොකරව යනුවෙනි. හෙතෙම විතර්ක විචාර දෙදෙනාගේ සංසිඳුවීමෙන් ඇතුළත පැහැදීම ඇති, චිත්තයාගේ එකග බව ඇති, විතර්ක රහිත, විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීති සැප ඇති ද්‍විතියජ්ඣානයට පැමිණ වාසය කරයි. ප්‍රීතිය ඉක්ම වීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කරයි. සිහියෙන් යුක්තවූයේ කයින් සැපවිඳියි. යම් ධ්‍යානයක් උපෙක්ෂා ඇත්තේ, සිහියෙන් යුක්තවූයේ, සැප විහරණ ඇත්තේයයි ආර්‍ය්‍යයෝ කියත්ද ඒ තතියජ්ඣානයට පැමිණ වාසය කරයි. සැපයද නැති කිරීමෙන්, දුකද නැති කිරීමෙන්, කල් ඇතිවම සොම්නස් දොම්නස් දෙක අතුරුදන් කිරීමෙන්, දුක් නැත්තාවූ, සැප නැත්තාවූ, උපෙක්ෂාවෙන් හටගත්. සිහිය පිළිබඳ පිරිසිදු බැව් ඇති, චතුත්ථජ්ඣානයට පැමිණ වාසය කෙරෙයි. හෙතෙම මෙසේ සිත එකගවූ කල්හි, පිරිසිදුවූ කල්හි, හාත්පස පිරිසිදුවූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, කෙලෙස් දුරුවූ කල්හි, මෘදුවූ කල්හි, වැඩට සුදුසුව සිටි කල්හි, කම්පා නොවන ස්වභාවයට පැමිණි කල්හි, පෙරවිසූ තැන් සිහි කිරීමේ නුවණ ලැබීම පිණිස සිත නමයි. මහණතෙම නන් වැදෑරුම්වූ, පෙර විසූ කඳපිළිවෙළ සිහිකෙරෙයි. එනම් එක් ජාතියක්ද ජාති දෙකක්ද ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දශයක්ද, ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත (විනාශවන) කල්පයන්ද, නොයෙක් විවර්ත (හැදෙන) කල්පයන්ද, නොයෙක් සංවර්ත, විවර්ත කල්පයන්ද, අසවල් තැන උපන්නෙමි. එහි මෙනම් ඇත්තේ වීමි. මෙබඳු ගෝත්‍ර ඇත්තේ වීමි. මෙබඳු වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තේ වීමි. මෙබඳු දුක්සැප වින්දෙමි. ඒ මම එයින් චුතව, අසවල් තැන උපන්නෙමි. එතැන්හිද මෙසේ නම් ඇත්තේ වීමි. මෙබඳු ගෝත්‍ර ඇත්තේ වීමි. මෙබඳු ශරීර වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තෙක් වීමි. මෙබඳු සැපදුක් විඳින්නෙක් වීමි. මෙබඳු ආයුෂ ඇත්තෙක් වීමි. ඒ මම එතැනින් චුතව මේ මනුෂ්‍ය

භාවයෙහි උපන්නෙමියි. මෙසේ ආකාර සහිතව උදෙසීම් සහිතව නන් වැදෑරුම් පෙර විසූ කඳ පිළිවෙළ සිහි කෙරෙයි.

24. "හෙතෙම මෙසේ සිත සමාධිගතවූ කල්හි, පිරිසිදුවූ කල්හි, හාත්පස පිරිසිදුවූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, කෙලෙස් දුරුවූ කල්හි, මෘදුවූ කල්හි, වැඩට සුදුසුව සිටි කල්හි කම්පා නොවන ස්වභාවයට පැමිණි කල්හි, සත්වයන්ගේ ච්‍යුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත නමයි. හෙතෙම පිරිසිදුවූ මිනිස් ඇස ඉක්ම පැවැත්තාවූ දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, පහත්වූද, උසස්වූද, හොඳ ස්වභාව ඇත්තාවූද, නරක ස්වභාව ඇත්තාවූද, මනාගති ඇත්තාවූද, නරක ගති ඇත්තාවූද, සත්වයන් දකී. ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්ත වූවාහු, වාක් දුශ්චරිතයෙන් යුක්ත වූවාහු, මනො දුශ්චරිතයෙන් යුක්ත වූවාහු, ආර්‍ය්‍යයන්ට දොස් කීවාහු, මිථ්‍යා දෘෂ්ටි ඇත්තාහු, මිථ්‍යා දෘෂ්ටි ක්‍රියා සමාදන් වූවාහු වෙත්. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ, නපුරු ගති ඇති යටිකුරුව වැටෙන නරකයෙහි උපන්නාහුයයිද, මේ පින්වත් සත්වයෝ වනාහි කාය සුචරිතයෙන් යුක්ත වූවාහු, වාක් සුචරිතයෙන් යුක්ත වූවාහු, මනෝ සුචරිතයෙන් යුක්ත වූවාහු ආර්‍ය්‍යයන්ට දොස් නොකීවාහු, සම්‍යක් දෘෂ්ටි ඇත්තාහු, සම්‍යක් දෘෂ්ටි කර්‍මම සමාදන් වූවාහුවෙත්. (එහෙයින්) ඔවූහු කය බිඳීමෙන් මරණින් මතු, ස්වර්ග ලෝකයෙහි උපන්නාහුයයි මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවා සිටි දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, ලාමකවූද, ප්‍රණීතවූද, මනා වර්‍ණ ඇත්තාවූද, මනා වර්‍ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, යහපත් ගති නැත්තාවූද, කර්‍මානුරූපව පැමිණි සත්වයන්යයි දැනගනී.

25. "හෙතෙම මෙසේ සිත සමාධිගතවූ කල්හි, පිරිසිදුවූ කල්හි, හාත්පස පිරිසිදුවූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, කෙලෙස් දුරුවූ කල්හි, මෘදුවූ කල්හි, වැඩට සුදුසුව සිටි කල්හි, කම්පා රහිතවූ කල්හි, කෙලෙස් නැති කිරීම පිණිස සිත නමයි.

හෙතෙම මේ දුකයයි ඇතිසේ දැනගනී. මේ දුකට හේතුවයි ඇතිසේ දැනගනී. මේ දුක නැතිකිරීම යයි ඇතිසේ දැනගනී. මේ දුක නැති කරන මාර්ගයයි ඇතිසේ දැනගනී. මේ කෙලෙස්යයි ඇතිසේ දැනගනී, මේ කෙළෙස්වලට හේතුයයි ඇතිසේ දැනගනී, මේ කෙළෙස් නැති කිරීම යයි ඇතිසේ දැනගනී. මෙසේ දත්තාවූ මෙසේ දක්නාවූ ඔහුගේ සිත කාමාශ්‍රයෙන්ද මිදෙයි. භවාශ්‍රවයෙන්ද මිදෙයි. අවිද්‍යාශ්‍රවයෙන්ද මිදෙයි. මිදුන කල්හි මිදුනේයයි දැන ගැන්ම ඇතිවෙයි. උත්පත්තිය නැතිවූවා වෙයි. බ්‍රහ්මචරියාවෙහි හැසිර නිමවනලදී. කළ යුත්ත කරණලදී. මෙයින් මත්තෙහි කළයුතු කිසිවක් නැතැයි දැනගනී. ඒ මහණ තෙම ශීත ඉවසන්නේ වෙයි, බඩගිනි ඉවසන්නේ වෙයි, උෂ්ණය ඉවසන්නේ වෙයි, පිපාසය ඉවසන්නේ වෙයි, මැසිමදුරු සර්පයන්ගේ දෂ්ට කිරීම් ඉවසන්නේ වෙයි, නපුරු කොට කියනලද නපුරු කොට එන ලද වචන ඉවසන්නේ වෙයි. දුක්වූ තියුණුවූ කෘෘරවූ කටුකවූ නොසැපවූ නොසතුටුවූ ප්‍රාණය දුරු කරන්නාවූ උපන් ශරීරික වේදනා ඉවසන්නේ වෙයි. හික්මවනලද සියලු රාග දෝස මෝහ, ඇත්තේ, පහකරණලද කෙලෙස් කසට ඇත්තේ, දුරසිට ගෙනවුත් පිදීමට සුදුසුවූ තුටු පඬුරු පිදීමට සුදුසුවූ පින් පල අදහා පිදීමට සුදුසුවූ ඇඳිලිබැඳ නමස්කාරයට සුදුසුවූ ලෝකයාගේ ඉතා උතුම් පින්කෙත වන්නේය.

**26.** "අග්ගිවෙස්සනය, මහලුව රජුගේ ඇතා නොදැමුණෙක්ව නොහික්මුණෙක්ව කලුරිය කෙරේද, රජුගේ මහලු ඇතා නොදැමුණු මරණයෙන් කලුරිය කෙළේය, යන සංඛ්‍යාවට පැමිණෙයි, අග්ගිවෙස්සනය, රජුගේ මධ්‍යම වයසෙහි සිටි ඇතාද, ඉදින් නොදැමී, නොහික්මී, කළුරිය කෙරේද, රජුගේ මධ්‍යම වයසේ සිටි ඇතා නොදැමුණු මරණයෙන් කළුරිය කෙළේය යන සඞ්ඛ්‍යාවට පැමිණෙයි. අග්ගිවෙස්සනය, රජුගේ තරුණවූ ඇතාද නොදැමුණෙක්ව නොහික්මුණෙක්ව කළුරිය කෙරේද, රජුගේ තරුණ ඇතා නොදැමුණු මරණයෙන් කලුරිය කෙළේය යන සඞ්ඛ්‍යාවට පැමිණෙයි. අග්ගිවෙස්සනය,

එපරිද්දෙන්ම ස්ථවිර භික්ෂුතෙමේද රහත් නොවී කලුරිය කෙරේද, ස්ථවිර භික්ෂුතෙම නොදැමුණු මරණයෙන් කලුරිය කෙළේය යන සඞ්ඛ්‍යාවට පැමිණෙයි. අග්ගිවෙස්සනය, මධ්‍යම භික්ෂුවද රහත් නොවී කළුරිය කෙරේද, නොදැමුණු මරණයෙන් මධ්‍යම භික්ෂුව කළුරිය කෙළේය යන සඞ්ඛ්‍යාවට පැමිණෙයි. අග්ගිවෙස්සනය, නවක භික්ෂූවද රහත් නොවී කලුරිය කෙරේද, නවක භික්ෂුව නොදැමුණු මරණයෙන් කලුරිය කෙළේය යන සඞ්ඛ්‍යාවට පැමිණෙයි.

27. "අග්ගිවෙස්සනය, රජුගේ මහළු ඇතාද හොඳට දැමුණෙක්ව හොඳට හික්මුණෙක්ව කළුරිය කෙරේද, රජුගේ මහලු ඇතා දැමුණු මරණයෙන් මළේය යන සඞ්ඛ්‍යාවට පැමිණෙයි. අග්ගිවෙස්සනය, රජුගේ මධ්‍යම වයසෙහි සිටි ඇතාද හොඳට දැමුණෙක්ව, හොඳට හික්මුණෙක්ව, කළුරිය කෙරේද, රජුගේ මධ්‍යම වයසෙහි සිටි ඇතා දැමුණුමරණයෙන් මළේය යන සඞ්ඛ්‍යාවට පැමිණෙයි. අග්ගිවෙස්සනය, රජුගේ තරුණ ඇතාද හොඳහැටි දැමුණෙක්ව හික්මුණෙක්ව කලුරිය කෙරේද, රජුගේ තරුණ ඇතා දැමුණු මරණයෙන් මළේය යන සඞ්ඛ්‍යාවට පැමිණෙයි. අග්ගිවෙස්සනය, එපරිද්දෙන්ම ස්ථවිර භික්ෂූ තෙමේද, රහත් කළුරිය කෙරේනම්, ස්ථවිර භික්ෂුතෙම දැමුණු මරණයෙන් කලුරිය කෙළේය යන සඞ්ඛ්‍යාවට පැමිණෙයි. අග්ගිවෙස්සනය, මධ්‍යම භික්ෂූ තෙමේද, රහත්ව කළුරිය කෙරේ නම්, මධ්‍යම භික්ෂුව දැමුණු මරණයෙන් කලුරිය කෙළේය, යන සඞ්ඛ්‍යාවට පැමිණෙයි. අග්ගිවෙස්සනය, නවක භික්ෂු තෙමේද රහත්ව කලුරිය කෙරේ නම්, නවක භික්ෂු තෙම දැමුණු මරණයෙන් කලුරිය කෙළේය යන සඞ්ඛ්‍යාවට පැමිණෙයි."

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළසේක. සතුටු සිතැති අචිරවත සාමණේර තෙම භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්තේය.

**පස්වෙනි දන්තභූමි සූත්‍රය නිමි. (3-5)**

## 26. භූමිජ සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම්වූ වෙළුවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි ආයුෂ්මත් භූමිජ ස්ථවිරයන් වහන්සේ උදයකාලයෙහි හැඳ පාත්‍රා සිවුරු ගෙන ජයසේන රාජකුමාරයාගේ ගෘහය යම්තැනකද එහි පැමිණියේය. පැමිණ පනවනලද ආසනයෙහි හිඳ ගත්තේය. ඉක්බිති ජයසේන රාජකුමාරතෙම ආයුෂ්මත් භූමිජ ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් භූමිජ ස්ථවිරයන් සමග සතුටුවිය. සතුටුවිය යුතු කථාකොට නිමවා එක්පසක හිඳ ගත්තේය. එක්පසක හිඳ ගත්තාවූ ජයසේන රාජකුමාරතෙම ආයුෂ්මත් භූමිජ ස්ථවිරයන්ගෙන් මෙසේ ඇසීය. "පින්වත් භූමිජ ස්ථවිරයෙනි, මෙවැනි වාද ඇති මෙවැනි දෘෂ්ටි ඇති මහණ බමුණෝ ඇත්තාහ.

ඉදින් කැමැත්තෙන් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන්නේ නම් එසේත් ඵලයට නොපැමිණිය හැකිය. ඉදින් අකමැත්තෙන් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙන්නේ නම් එසේත් ඵලයට පැමිණිය නොහැකිය. ඉදින් කැමැත්තෙන්ද අකමැත්තෙන්ද බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් එසේත් ඵලයට පැමිණිය නොහැකිය. ඉදින් නොකැමැත්තෙන්ද, නොකැමැති නොවීමෙන්ද බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් එසේත් ඵලයට පැමිණිය නොහැකිය යන, (වාදයෝයි.)

"මේ කාරණයෙහි පින්වත් භූමිජ ස්ථවිරයන්ගේ ශාස්තෘ තෙමේ කිනම් වාද ඇත්තෙක්ද? කුමක් කියන්නෙක්ද?"

2. "රාජකුමාරය, මා විසින් මේ කාරණය භාග්‍යවතුන් වහන්සේගෙන් අසා නැත. භාග්‍යවතුන් වහන්සේගෙන් පිළිගෙන නැත. එහෙත් භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ ප්‍රකාශ කිරීමට කරුණු ඇත. 'ඉදින් කැමැත්තෙනුදු නුනුවණින් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් පලක් නොලැබිය හැකිය. ඉදින් නොකැමැත්තෙනුදු නුනුවණින් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පලක් නොලැබිය හැකිය. ඉදින් කැමැත්තෙනුදු නොකැමැත්තෙනුදු නුනුවණින් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් පලක් නොලැබිය හැකිය. ඉදින් නොකැමැත්තෙනුත් නොකැමැත්තෙන් නොවීමෙනුත් නුනුවණින් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් පලක් නොලැබිය හැකිය.'

'ඉදින් කැමැත්තෙනුදු නුවණින් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් පලක් ලැබිය හැකිය. ඉදින් නොකැමැත්තෙනුදු නුවණින් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් පලක් ලැබිය හැකිය. ඉදින් කැමැත්තෙනුදු නොකැමැත්තෙනුදු නුවණින් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් පලක් ලැබිය හැකිය. ඉදින් නොකැමත්තෙනුදු නොකැමැත්තෙන් නොවීමෙනුදු නුවණින් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් පලක් ලැබිය හැකිය යනුවෙනි.

"රාජකුමාරය, මෙය මා විසින් භාග්‍යවතුන් වහන්සේ ගෙන් අසා නැත. භාග්‍යවතුන් වහන්සේගෙන් පිළිගෙන නැත. එහෙත් උන්වහන්සේ විසින් මේ ආකාරයෙන් දෙශනා කිරීමට කරුණු ඇත්තේයයි කීය.

3. "ඉදින් පින්වත් භූමිජ ස්ථවිරයන්ගේ ශාස්තෲ තෙමේ මෙවැනි වාද ඇත්තෙක් මෙසේ කියන්නෙක් වෙයි නම් ඒකාන්තයෙන් පින්වත් භූමිජ ස්ථවිරයන්ගේ ශාස්තෲතෙමේ බොහෝවූ සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ මුදුනෙහි සිටින්නෙකැයි කියා ජයසේන රාජකුමාර තෙමේ ආයුෂ්මත් භූමිජ ස්ථවිරයන් තමාට පිළියෙල කළ බතින් වැළඳවීය.

"ඉක්බිති ආයුෂ්මත් භූමිජ ස්ථවිරතෙමේ සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුණේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එහි ගියේය. ගොස් භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසක හිඳ ගත්තේය. පසක හිඳගත් ආයුෂ්මත් භූමිජ ස්ථවිරයන්වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ සැලකෙළේය. "ස්වාමීනි, මම පෙරවරු කාලයෙහි හැඳ පාත්‍ර සිවුරුගෙන ජයසේන රාජකුමාරයාගේ ගෘහය යම් තැනකද එහි ගියෙමි. ගොස් පැනවූ ආසනයෙහි හිඳ ගතිමි. ස්වාමීනි, ඉක්බිති ජයසේන

රාජකුමාරතෙම මම යම් තැනකද එහි පැමිණියේය. පැමිණ මා සමග සතුටුවිය. සතුටුවිය යුතු සිහිකටයුතු කථාකොට නිමවා එක් පසක හිඳගත්තේය. එක් පසක හිඳගත් හෙතෙමේ මට මෙසේ කීය.

4. "පින්වත් භූමිජ ස්ථවිරයෙනි, මෙබඳු වාද ඇත්තාවූ මෙබඳු දෘෂ්ටි ඇත්තාවූ ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ. කෙසේද? 'ඉදින් කැමැත්තෙනුදු බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් පලක් ලබනු නොහැකිය. ඉදින් නොකැමැත්තෙනුදු බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් පලක් ලබනු නොහැකිය. ඉදින් කැමැත්තෙනුදු නොකැමැත්තෙනුදු බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් පලක් ලබනු නොහැකිය ඉදින් නොකැමැත්තෙනුදු නොකැමැති නොවීමෙනුදු බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් පලක් ලබනු නොහැකිය' යනුය. මේ කාරණයෙහි ආයුෂ්මත් භූමිජ ස්ථවිරයන්ගේ ශාස්තෘතෙම කිනම් වාද ඇත්තෙක්ද? කුමක් කියන්නෙක්ද? යනුය."

5. "ස්වාමීනි, මෙසේ කියන ලද කල්හි, මම ජයසේන රාජ කුමාරයාට මෙසේ කීයෙමි.

"රාජ කුමාරය, මා විසින් මේ කාරණය භාග්‍යවතුන් වහන්සේගෙන් අසා නැත. භාග්‍යවතුන් වහන්සේගෙන් පිළිගෙන නැත. එහෙත් භාග්‍යවතුන් වහන්සේ විසින් මෙහිලා මෙසේ ප්‍රකාශ කිරීමට කරුණු ඇත්තේය. කෙසේද? 'ඉදින් කැමැත්තෙනුදු නුනුවණින් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් පලක් නැත්තේය. ඉදින් නොකැමැත්තෙනුදු නුනුවණින් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් පලක් නැත්තේය. ඉදින් කැමැත්තෙනුදු නොකැමැත්තෙනුදු නුනුවණින් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් පලක් නැත්තේය. ඉදින් නොකැමැත්තෙනුදු නොකැමැති නොවීමෙනුදු නුවණින් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් පලක් නැත්තේය.

'ඉදින් කැමැත්තෙනුදු නුවණින් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් පලක් ලැබිය හැකිය. නොකැමැත්තෙනුදු නුවණින් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයිනම් පලක් ලැබිය හැකිය. ඉදින්

කැමැත්තෙනුදු නොකැමැත්තෙනුදු නුවණින් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් පලක් ලැබිය හැකිය. ඉදින් නොකැමැත්තෙනුදු නොකැමැති නොවීමෙනුදු නුවණින් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙයි නම් පලක් ලැබිය හැකිය යනුවෙනි.

6. "ස්වාමීනි, මෙසේ කීකල්හි මම ජයසේන රාජකුමාරයාට මෙසේ කීයෙමි. "මෙය මා විසින් භාග්‍යවතුන් වහන්සේගෙන් අසා නැත. භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙන් පිළිගෙන නැත. එහෙත් භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ ප්‍රකාශ කිරීමට කරුණු ඇතැයි" කීයෙමි. එකල්හි ජයසේන රාජ කුමාර තෙමේ "ඉදින් පින්වත් භූමිජ ස්ථවිරයන්ගේ ශාස්තෘ තෙමේ මෙවැනි වාද ඇත්තෙක් මෙසේ කියන්නෙක් නම් පින්වත් භූමිජ ස්ථවිරයන්ගේ ශාස්තෘ තෙම බොහෝවූ සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගේ මුදුනෙහි සිටියේයයි කීයේය.

"ස්වාමීනි, කිමෙක්ද මෙසේ අසන ලද්දේ මෙසේ ප්‍රකාශ කළාවූ මම භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද්දක් කියන්නෙක් වෙම්ද භාග්‍යවතුන් වහන්සේට අසත්‍යයෙන් දොස් නොකියන්නෙක් වෙම්ද ධර්මයට අනුකූලව ප්‍රකාශ කෙරෙම්ද කිසි කරුණු සහිතවූ වාදයකින් හෝ අනුවාදයකින්, හෝ ගැරහිය යුතු බවට නොපැමිණේද?"

7. "භූමිජය, ඒකාන්තයෙන් තෙපි මෙසේ අසන ලදුව මෙසේ ප්‍රකාශ කරන්නේ භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද්දක්ම කියන්නෙක් වූවහුය. භාග්‍යවතුන් වහන්සේට අසත්‍යයෙන් දොස් කියන්නෙක් නොවූවහුය. ධර්මයට අනුකූලවූවක්ම ප්‍රකාශ කළාහුය. කිසි කරුණු සහිත වාදයකින් හෝ අනුවාදයකින් ගැරහිය යුතු බව නොපැමිණෙන්නේය.

"භූමිජය, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාවූ, මිථ්‍යාකල්පනා ඇත්තාවූ මිථ්‍යා කර්මාන්ත ඇත්තාවූ මිථ්‍යා වචන ඇත්තාවූ මිථ්‍යා ජීවිකා ඇත්තාවූ මිථ්‍යා ව්‍යායාම ඇත්තාවූ මිථ්‍යා සති ඇත්තාවූ මිථ්‍යා සමාධි ඇත්තාවූ යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් වෙත්ද ඔව්හු ඉදින් කැමැත්තෙනුදු බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත් නම් පලක්

ලබනු නොහැකිය ඉදින් අකමැත්තෙන් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත් නම් පලක් ලැබිය නොහැකිය. ඉදින් කැමැත්තෙනුදු අකමැත්තෙනුදු බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත් නම් පලක් ලැබිය නොහැකිය. ඉදින් අකමැත්තෙනුදු අකමැති නොවීමෙනුදු බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත් නම් පලක් ලබනු නොහැකිය.”

8. “භූමිජය, යම්සේ තෙලෙන් ප්‍රයෝජන ඇති තෙල් සොයන්නාවූ, තෙල් සොයමින් ඇවිදින්නාවූ පුරුෂයෙක් වැලිගෙන ඔරුවක දමා, ජලයෙන් තෙමා මිරිකන්නේය. ඉදින් වැලි ඔරුවෙහි දමා ජලයෙන් තෙම තෙමා කැමැත්තෙන් මිරිකන්නේ නම් තෙල් ලැබීමට නොහැකිය. වැලි ඔරුවෙහි දමා වතුරෙන් තෙම තෙමා ඉදින් නොකැමැත්තෙන් මිරිකන්නේ නම් තෙල් නොලැබිය හැකිය. ඉදින් වැලි ඔරුවෙහි දමා වතුරෙන් තෙම තෙමා කැමැත්තෙන්ද නොකැමැත්තෙන්ද මිරිකන්නේ නම් තෙල් නොලැබිය හැකිය. ඉදින් වැලි ඔරුවෙහි දමා වතුරෙන් තෙම තෙමා නොකැමැත්තෙන්ද නොකැමැති නොවීමෙන්ද මිරිකන්නේ නම් තෙල් ලැබීමට නොහැකිය. භූමිජය, ඊට හේතු කවරේද? නුනුවණින් කරන උත්සාහයක් වන හෙයිනි.

“භූමිජය, එපරිද්දෙන්ම මිසදිටුවූ, මිථ්‍යා කල්පනා ඇත්තාවූ, මිථ්‍යා වචන ඇත්තාවූ, මිථ්‍යා කර්මාන්ත ඇත්තාවූ, මිථ්‍යා ජීවිකා ඇත්තාවූ, මිථ්‍යා ව්‍යායාම ඇත්තාවූ, මිථ්‍යා සති ඇත්තාවූ මිථ්‍යා සමාධි ඇත්තාවූ, යම්කිසි මහණ බමුණෝ වෙත්ද, ඔව්හු ඉදින් කැමැත්තෙන්ද බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙත්නම් එයිනුදු පලක් ලැබීමට නොහැකිය. ඉදින් නොකැමැත්තෙන් බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙත් නම් එයිනුදු පලක් ලැබිය නොහැකිය. ඉදින් කැමැත්තෙන්ද, නොකැමැත්තෙන්ද බ්‍රහ්මචරියාවෙහි හැසිරෙත්ද, එයිනුදු පලක් ලැබිය නොහැකිය. ඉදින් නොකැමැත්තෙන්ද, නොකැමැති නොවීමෙන්ද, බ්‍රහ්මචරියාවෙහි හැසිරෙත් නම් එයිනුදු පලක් ලැබිය නොහැකිය. ඊට හේතු කවරේද? භූමිජය, නුනුවණින් පලක් ලැබීමට උත්සාහ කිරීමක් වන හෙයිනි.

**9.** "භූමිජය, කිරෙන් ප්‍රයෝජන ඇති, කිරි සොයන කිරි සෙවීමෙහි හැසිරෙන, පුරුෂයෙක් යම්සේ වසුපැටියකු ඇති දෙනගේ අඟින් කිරි දොවන්නේය. ඉදින් කැමැත්තෙන් වසුපැටියකු ඇති දෙනගේ අඟින් කිරි දොවන්නේ නම් කිරි ලැබිය නොහැකිය. ඉදින් නොකැමැත්තෙන් වසුපැටියා ඇති දෙනගේ ඇඟෙන් කිරි දොවන්නේ නම් කිරි නොලැබිය හැකිය. ඉදින් කැමැත්තෙන්ද නොකැමැත්තෙන්ද වසුපැටියා ඇති දෙනගේ අඟෙන් කිරි දොවන්නේ නම් කිරි නොලැබිය හැකිය. ඉදින් නොකැමැත්තෙන්ද නොකැමැති නොවීමෙන්ද වසුපැටියා ඇති දෙනගේ අඟින් කිරි දොවන්නේ නම් කිරි නොලැබිය හැකිය. ඊට හේතු කවරේද? නුනුවණින් කරන කිරි ලැබීමේ උත්සාහයක් වන හෙයිනි. එසේම භූමිජය, මිථ්‍යාදෘෂ්ටිඇත්තාවූද, මිථ්‍යාකල්පනා ඇත්තාවූද, මිථ්‍යා වචන ඇත්තාවූද, මිථ්‍යා කර්මාන්ත ඇත්තාවූද, මිථ්‍යා ආජීව ඇත්තාවූද, මිථ්‍යා ව්‍යායාම ඇත්තාවූද, මිථ්‍යා සති ඇත්තාවූද, මිථ්‍යා සමාධි ඇත්තාවූද, යම්කිසි මහණ බමුණෝ වෙත්ද, ඔව්හු ඉදින් කැමැත්තෙන් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත් නම් පලක් ලැබිය නොහැකිය. ඉදින් නොකැමැත්තෙන් බ්‍රහ්මචරියාවෙහි හැසිරෙත් නම් පලක් ලැබිය නොහැකිය. ඉදින් කැමැත්තෙන්ද නොකැමැත්තෙන්ද බ්‍රහ්මචරියාවෙහි හැසිරෙත් නම් පලක් ලැබිය නොහැකිය. ඉදින් නොකැමැත්තෙන්ද නොකැමැති නොවීමෙන්ද බ්‍රහ්මචරියාවෙහි හැසිරෙත් නම් පලක් ලැබිය නොහැකිය. ඊටහේතු කවරේද? නුනුවණින් කරන උත්සාහයක් වන හෙයිනි.

**10.** "භූමිජය, වෙඬරුවලින් ප්‍රයෝජන ඇති, වෙඬරු සොයන, වෙඬරු සෙවීමෙහි හැසිරෙණ, පුරුෂයෙක් යම්සේ කලයක දිය වත්කොට දණ්ඩෙන් කලතන්නේය. ඉදින් නො කැමැත්තෙන් කලයෙහි දිය වත්කොට දණ්ඩෙන් කලතන්නේ නම් වෙඬරු ලැබීමට නොහැකිය. ඉදින් නොකැමැත්තෙන් කලයෙහි වතුර දමා දණ්ඩෙන් කලතන්නේ නම් වෙඬරුනොලැබිය හැකිය. ඉදින් කැමැත්තෙන්ද නොකැමැත්තෙන්ද කලයෙහි වතුර දමා කලතන්නේ නම්

වෙඬරු නොලැබිය හැකිය. ඉදින් නොකැමැත්තෙන්ද නොකැමැතිනොවීමෙන්ද කලයෙහි වතුර දමා කලතන්නේ නම් වෙඬරු නොලැබිය හැකිය. එපරිද්දෙන්ම මිථ්‍යාදෘෂ්ටි ඇත්තාවූ, මිථ්‍යා කල්පනා ඇත්තාවූ, මිථ්‍යා වචන ඇත්තාවූ, මිථ්‍යා කර්මාන්ත ඇත්තාවූ, මිථ්‍යා ආජීව ඇත්තාවූ, මිථ්‍යා ව්‍යායාම් ඇත්තාවූ, මිථ්‍යා සති ඇත්තාවූ, මිථ්‍යා සමාධි ඇත්තාවූ මහණ බමුණෝ වෙත්ද ඔව්හු ඉදින් කැමැත්තෙන් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත් නම් පල ලැබිය නොහැකිය. ඉදින් අකැමැත්තෙන් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත් නම් පල ලැබිය නොහැකිය. ඉදින් කැමැත්තෙන්ද නොකැමැත්තෙන්ද බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත් නම් පල ලැබිය නොහැකිය. ඉදින් නොකැමැත්තෙන්ද නොකැමැති නොවීමෙන්ද බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත් නම් පල ලැබිය නොහැකිය. ඊට හේතු කවරේද? නුනුවණින් උත්සාහ කිරීමක් වන හෙයිනි.

11. භූමිජය, යම්සේ ගින්නෙන් ප්‍රයෝජන ඇත්තාවූ ගිනි සොයන්නාවූ, ගිනි සොයමින් ඇවිදින්නාවූ, පුරුෂයෙක් ගිනිගානා දණ්ඩක් වශයෙන් තෙත්වූ අමු ලීයක් ගෙන මදින්නේය. ඉදින් කැමැත්තෙන් තෙත්වූ අමු ලීයක් මදින්නේ නම් ගිනි ඉපදවිය නොහැකිය. ඉදින් නොකැමැත්තෙන් තෙත්වූ අමු ලීය මදින්නේ නම් ගිනි ඉපද විය නොහැකිය. ඉදින් කැමැත්තෙන්ද නොකැමැත්තෙන්ද තෙත්වූ අමු ලීයක් මදින්නේ නම් ගිනි ඉපද විය නොහැකිය. ඉදින් නොකැමැත්තෙන්ද නොකැමැති නොවී මෙන්ද තෙත්වූ අමු ලීයක් මදින්නේ නම් ගිනි ඉපදවිය නොහැකිය. ඊට හේතු කවරේද? නුනුවණින් කරන උත්සාහයක් වන හෙයිනි. එපරිද්දෙන්ම භූමිජය, මිථ්‍යා දෘෂ්ටි ඇත්තාවූ, මිථ්‍ය කල්පනා ඇත්තාවූ, මිථ්‍යා වචන ඇත්තාවූ, මිථ්‍යාකර්මාන්ත ඇත්තාවූ, මිථ්‍යා ආජීව ඇත්තාවූ, මිථ්‍යා ව්‍යායාම ඇත්තාවූ, මිථ්‍යා සති ඇත්තාවූ, මිථ්‍යා සමාධි ඇත්තාවූ යම් ඒ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත්ද, ඔව්හු කැමැත්තෙන්ද බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත් නම් පලක් ලැබිය නොහැකිය. ඉදින්

නොකැමැත්තෙන් බ්‍රහ්ම චර්‍ය්‍යාවෙහි හැසිරෙත් නම් පලක් ලැබිය නොහැකිය. ඉදින් කැමැත්තෙන්ද නොකැමැත්තෙන්ද බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත් නම් පලක් ලැබිය නොහැකිය. ඉදින් නොකැමැත්තෙන්ද නොකැමැති නොවීමෙන්ද බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත් නම් පලක් ලැබිය නොහැකිය. ඊට හේතු කවරේද? භූමිජය, නුනුවණින් කරන උත්සාහයක් වන හෙයිනි.

12. "භූමිජය, තෙලින් ප්‍රයෝජන ඇති, තෙල් සොයන, තෙල් සෙවීමෙහි හැසිරෙන පුරුෂයෙක්, තල පිටි ඔරුවක දමා, දියෙන් පොඟව පොඟවා මිරිකන්නේය. ඉදින් කැමැත්තෙන් තල පිටි ඔරුවෙහි දමා දියෙන් පොඟව පොඟවා මිරිකන්නේ නම් තෙල් ලැබීමට සුදුසුය. ඉදින් නොකැමැත්තෙන් තලපිටි ඔරුවෙහි දමා, දියෙන් තෙම තෙමා මිරිකන්නේ නම් තෙල් ලැබීමට සුදුසුය. ඉදින් කැමැත්තෙන්ද නොකැමැත්තෙන්ද තලපිටි ඔරුවෙහි දමා දියෙන් තෙම තෙමා මිරිකන්නේ නම් තෙල් ලැබීමට සුදුසුය. ඉදින් නොකැමැත්තෙන්ද නොකැමැති නොවීමෙන්ද තලපිටි ඔරුවෙහි දමා දියෙන් පොඟව පොඟවා මිරිකන්නේ නම් තෙල් ලැබීමට සුදුසුය. ඊට හේතු කවරේද? භූමිජය එය තෙල් ලැබීමට කරුණුවන හෙයිනි. භූමිජය, එපරිද්දෙන්ම සම්‍යක් දෘෂ්ටි ඇති, සම්‍යක් සංකල්පනා ඇති, සම්‍යක් වචන ඇති, සම්‍යක් කර්මාන්ත ඇති, සම්‍යක් ආජීව ඇති, සම්‍යක් ව්‍යායාම ඇති, සම්‍යක් සති ඇති, සම්‍යක් සමාධි ඇති යම්කිසි ශ්‍රමණ බ්‍රාහ්මණයෝ වෙත්ද, ඔව්හු ඉදින් කැමැත්තෙන්ද, බ්‍රහ්මචරියාවෙහි හැසිරෙත් නම් පල ලැබීමට සුදුසුය. ඉදින් නොකැමැත්තෙන් බ්‍රහ්මචරියාවෙහි හැසිරෙත් නම් පල ලැබීමට සුදුසුය. ඉදින් කැමැත්තෙන්ද නොකැමැත්තෙන්ද බ්‍රහ්මචරියාවෙහි හැසිරෙත් නම් ඵල ලැබීමට සුදුසුය. ඉදින් නොකැමැත්තෙන්ද නොකැමැති නොවීමෙන්ද, බ්‍රහ්මචරියාවෙහි හැසිරෙත් නම් පල ලැබීමට සුදුසුය. ඊට හේතු කවරේද? භූමිජය, නුවණින් උත්සාහ කිරීමක් වන හෙයිනි.

13. "භූමිජය, කිරෙන් ප්‍රයෝජන ඇති, කිරි සොයන, කිරි සෙවීමෙහි හැසිරෙන පුරුෂයෙක් වසුපැටවා ඇති දෙනගේ

බුරුල්ලෙන් කිරි දොවන්නේය. ඉදින් කැමැත්තෙන් පැටියා ඇති දෙනගේ බුරුල්ලෙන් කිරි දොවන්නේ නම් කිරි ලැබීමට සුදුසුය. ඉදින් නොකැමැත්තෙන්ද පැටියා ඇති දෙනගේ බුරුල්ලෙන් කිරි දොවයි නම් කිරි ලැබීමට සුදුසුය. ඉදින් කැමැත්තෙන්ද නොකැමැත්තෙන්ද පැටියා ඇති දෙනගේ බුරුල්ලෙන් කිරි දොවයි නම් කිරි ලැබීමට සුදුසුය. ඉදින් නොකැමැත්තෙන්ද නොකැමැති නොවීමෙන්ද, පැටියා ඇති දෙනගේ බුරුල්ලෙන් කිරි දොවන්නේ නම් කිරි ලැබීමට සුදුසුය. "ඊට හේතු කවරේද? භූමිජය, නුවණින් කරන ලද උත්සාහයක් වන හෙයිනි.

"භූමිජය, එපරිද්දෙන්ම සම්‍යක් දෘෂ්ටි ඇති, සම්‍යක් සංකල්පනා ඇති, සම්‍යක් වචන ඇති, සම්‍යක් කර්මාන්ත ඇති, සම්‍යක් ආජීව ඇති, සම්‍යක් ව්‍යායාම ඇති, සම්‍යක් ස්මෘති ඇති, සම්‍යක් සමාධි ඇති යම්කිසි ශ්‍රමණබ්‍රාහ්මණයෝ වෙත්ද, ඔව්හු ඉදින් කැමැත්තෙන් බ්‍රහ්මචරියාවෙහි හැසිරෙත්ද, ඵල ලැබීමට සුදුසුය. ඉදින් නොකැමැත්තෙන් බ්‍රහ්මචරියාවෙහි හැසිරෙත්ද, පල ලැබීමට සුදුසුය. ඉදින් කැමැත්තෙන්ද නොකැමැත්තෙන්ද බ්‍රහ්මචරියාවෙහි හැසිරෙත්ද, පල ලැබීමට සුදුසුය. ඉදින් නොකැමැත්තෙන්ද නොකැමැති නොවීමෙන්ද බ්‍රහ්මචරියාවෙහි හැසිරෙත් නම් ඵල ලැබීමට සුදුසුය. භූමිජය, ඊට හේතු කවරේද? නුවණින් කරන ලද උත්සාහයන් වන හෙයිනි.

14. 'භූමිජය, වෙඬරු වලින් ප්‍රයෝජන ඇති, වෙඬරු සොයන, වෙඬරු සෙවීමෙහි හැසිරෙන පුරුෂයෙක් කලයක දී වත්කොට දණ්ඩෙන් කලතන්නේද, ඉදින් කැමැත්තෙන් කලයක දී වත්කොට දණ්ඩෙන් කලතන්නේද, එය වෙඬරු ලැබීමට සුදුසුය. ඉදින් කැමැත්තෙන්ද නොකැමැත්තෙන්ද කලයක දී වත්කොට දණ්ඩෙන් කලතන්නේද එය වෙඬරු ලැබීමට සුදුසුය. "ඉදින් නොකැමැත්තෙන්ද නොකැමැති නොවී මෙන්ද කලයක දී වත්කොට දණ්ඩකින් කලතන්නේද, වෙඬරු ලැබීමට සුදුසුය. ඊට හේතු කවරේද? භූමිජය, එය වෙඬරු ලැබීමට හේතුවන හෙයිනි.

"භූමිජය, එපරිද්දෙන් සම්‍යක් දෘෂ්ටි ඇති, සම්‍යක් සංකල්පනා ඇති, සම්‍යක් වචන ඇති, සම්‍යක් කර්මාන්ත ඇති, සම්‍යක් ආජීව ඇති, සම්‍යක් ව්‍යායාම ඇති, සම්‍යක් ස්මෘති ඇති, සම්‍යක් සමාධි ඇති යම්කිසි මහණ බමුණෝ වෙත්ද, ඔව්හු ඉදින් කැමැත්තෙන් බ්‍රහ්මචරියාවෙහි හැසිරෙත් නම් ඵල ලැබීමට සුදුසුය. ඉදින් නොකැමැත්තෙන් බ්‍රහ්මචරියාවෙහි හැසිරෙත් නම් පල ලැබීමට සුදුසුය. ඉදින් කැමැත්තෙන්ද නොකැමැත්තෙන්ද බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙත්ද, පල ලැබීමට සුදුසුය. ඉදින් නොකැමැත්තෙන්ද නොකැමැති නොවීමෙන්ද බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙත් නම් පල ලැබීමට සුදුසුය. භූමිජය, ඊට හේතු කවරේද? නුවණින් කරනලද උත්සාහයක් වනහෙයිනි.

15. "භූමිජය, ගින්නෙන් ප්‍රයොජන ඇති, ගිනි සොයන, ගිනි සෙවීමෙහි හැසිරෙන, පුරුෂයෙක් තෙම වියලි ලීයකින් කරනලද, ගිනිගානා දණ්ඩක් ගෙන යම්සේ එකට මදින්නේය. ඉදින් කැමැත්තෙන්ද, වියලි ලීයකින් කරණ ලද ගිනිගානා දණ්ඩක් ගෙන මදින්නේද, ගිනි ලැබීමට සුදුසුය. ඉදින් නොකැමැත්තෙන්ද වියලි ලීයකින් කරන ලද ගිනිගානා දණ්ඩක් ගෙන එකට මැදීමෙන් ගිනි ලැබීමට සුදුසුය. ඉදින් කැමැත්තෙන්ද නොකැමැත්තෙන්ද වියලි ලීයකින් කරණ ලද ගිනිගානා දණ්ඩක් ගෙන මදින්නේද ගිනි ලැබීමට සුදුසුය. ඉදින් නොකැමැත්තෙන්ද නොකැමැති නොවීමෙන්ද වියලි ලීයකින් කරණ ලද ගිනිගානා දණ්ඩක් ගෙන එකට මදින්නේද, ගිනි ලැබීමට සුදුසුය. ඊට හේතු කවරේද? භූමිජය, ගිනි ලැබීමට එය හේතුවන හෙයිනි.

16. "භූමිජය, එපරිද්දෙන්ම සම්‍යක් දෘෂ්ටි ඇති, සම්‍යක් සංකල්පනා ඇති, සම්‍යක් වචන ඇති, සම්‍යක් කර්මාන්ත ඇති, සම්‍යක් ආජීව ඇති, සම්‍යක් ව්‍යායාම ඇති, සම්‍යක් ස්මෘති ඇති, සම්‍යක් සමාධි ඇති යම්කිසි ශ්‍රමණබ්‍රාහ්මණයෝ වෙත්ද, ඔව්හු ඉදින් කැමැත්තෙන්ද බ්‍රහ්මචරියාවෙහි හැසිරෙත් නම් ඵල ලැබීමට සුදුසුය. ඉදින් නොකැමැත්තෙන්ද බ්‍රහ්ම චරියාවෙහි හැසිරෙත් නම් ඵල ලැබීමට සුදුසුය. ඉදින් කැමැත්තෙන්ද අකැමැත්තෙන්ද බ්‍රහ්මචරියාවෙහි හැසිරෙත් නම් ඵල ලැබීමට

සුදුසුය. ඉදින් නොකැමැත්තෙන්ද නොකැමැති නොවීමෙන්ද බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි හැසිරෙත් නම් ඵල ලැබීමට සුදුසුය. ඊට හේතු කවරේද? භූමිජය, නුවණින් කරන ලද උත්සාහයක් වන හෙයිනි.

17. "භූමිජය, ඉදින් ජයසේන රාජකුමාරයාහට මේ උපමා සතර වැටහෙන්නාහු නම්, ජයසේන රාජකුමාර තෙම නුඹට පහදින්නේය. පැහැදුනු ආකාරයක් දක්වන්නේය යනු ආශ්චර්‍ය්‍යයක් නොවේ. ස්වාමීනි, ජයසේන රාජකුමාරයා හට මාගෙන් භාග්‍යවතුන් වහන්සේ වදාළාක් මෙන් පෙර නොඇසූවිරූ මේ උපමා සතර ප්‍රකාශ නොවූවාහු නම් එය ආශ්චර්‍ය්‍යයක් නොවේ."

භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය වදාළසේක. සතුටු සිතැති ආයුෂ්මත් භූමිජ ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්තේය.

**සවෙනි භූමිජ සූත්‍රය නිමි (3-6)**